පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# අංගුත්තර නිකාය

# 1

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලොක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුද්ධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය්‍ය ආර්‍ය්‍යරත්න පේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අංගුත්තර නිකාය

# 1

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**අංගුත්තර නිකාය** 1

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත් යොමු

කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2013 ජූනි

# සංඥාපනය

සූත්‍ර පිටකයේ හතරවෙනි නිකාය වූ අංගුත්තර නිකාය නිපාත එකොළහකින් යුක්තයි. එක අංගයකින් යුත් ධර්ම පළමුවෙනි නිපාතයෙහිද අංග දෙකකින් යුත් ධර්ම දෙවෙනි නිපාතයෙහිද යනාදී වශයෙන් ඒ ඒ නිපාත වෙන්කර තිබේ. පළමුවන සඞ්ගායනාවේදී මේ නිකාය ආරක්ෂා කිරීමට භාරවූයේ අනුරුද්ධ මහ රහතුන්වහන්සේටය. මේ නිකායේ සූත්‍ර 9557 ක් ඇතුළත් කර තිබේ. මේ පොතට අංගුත්තර නිකායේ නිපාත 3 ක් අන්තර්ගත කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයසිරත්න වේරරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයසිරත්න වේරරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, ඩී. එන්. ඒ. මුදලිගේ මහතාද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

26 - 8 - 55

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.  http://pitaka.lk

*x*

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත click කරන්න, නැතිනම් වම් පස bookmarks තීරුව භාවිතා කරන්න.

# පටුන


| | | පිට |
|---|---|---|
| ඒක නිපාතය | | 1 |
| 1. | රූපාදී වර්ගය | 1 |
| 2. | නීවරණප්පහාණ වර්ගය | 3 |
| 3. | අකම්මනීය වර්ගය | 6 |
| 4. | අදන්ත වර්ගය | 8 |
| 5. | පණිහිත වර්ගය | 10 |
| 6. | අච්ඡරා සංඝාත වර්ගය | 14 |
| 7. | විරියාරම්භ වර්ගය | 16 |
| 8. | කළ්‍යාණ මිත්ත වර්ගය | 18 |
| 9. | ප්‍රමාද වර්ගය | 21 |
| 10. | චතුකොටිකය වර්ගය | 23 |
| 11. | අධර්මවාදී වර්ගය | 30 |
| 12. | අධර්ම වර්ගය | 31 |
| 13. | ආනාපත්ති වර්ගය (i) | 32 |
| | ආනාපත්ති වර්ගය (ii) | 33 |
| 14. | එකපුග්ගල වර්ගය | 34 |
| 15. | එතදග්‍ර පාලිය 1 වෙනි වර්ගය | 37 |
| | 2 වෙනි වර්ගය | 38 |
| | 3 වෙනි වර්ගය | 39 |
| | 4 වෙනි වර්ගය | 40 |
| | 5 වෙනි වර්ගය | 42 |
| | 6 වෙනි වර්ගය | 43 |
| | 7 වෙනි වර්ගය | 44 |
| 16. | අට්ඨාන වර්ගය | 45 |
| 17. | එකධර්ම වර්ගය | 53 |
| 18. | බීජ වර්ගය | 54 |
| 19. | මක්ඛලී වර්ගය | 57 |


මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

20. අප්පමත්තක වර්ගය 61
21. පාසාදකරධර්ම 67
22. ඒකධම්මධ්‍යාන 68
දුක නිපාතය 86
පළමුවැනි පණ්ණාසකය 86
1. කම්මකාරණ වර්ගය 86
2. අධිකරණ වර්ගය 92
3. බාල වර්ගය 103
4. සමචිත්ත වර්ගය 107
5. පිරිස් වර්ගය 119
දෙවැනි පණ්ණාසකය 128
6. පුද්ගල වර්ගය 128
7. සුඛ වර්ගය 133
8. සනිමිත්ත වර්ගය 135
9. ධර්ම වර්ගය 137
10. බාල වර්ගය 138
තුන්වැනි පණ්ණාසකය 141
11. ආසා වර්ගය 141
12. ආයාචන වර්ගය 143
13. දාන වර්ගය 147
14. සන්ථාර වර්ගය 149
15. සමාපත්ති වර්ගය 151
16. ක්‍රොධ වර්ගය 153
17. විනයපෙය්‍යාල හෙවත් ශික්ෂාපද වර්ගය 164
තික නිපාතය 223
පළමුවැනි පණ්ණාසකය 223
1. බාල වර්ගය 223
2. රථකාර වර්ගය 228
3. පුග්ගල වර්ගය 244
4. දේවදූත වර්ගය 261
5. චූල වර්ගය 284

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දෙවැනි පණ්ණාසකය 290
6. බ්‍රාහ්මණ වර්ගය 290
7. මහා වර්ගය 314
8. ආනන්ද වර්ගය 363
9. සමණ වර්ගය 380
10. ලෝණඵල වර්ගය 395
තුන්වැනි පණ්ණාසකය 416
11. සම්බොධි වර්ගය 416
12. ආපායික වර්ගය 425
13. භාරංඩු (හෝ) කුසිනාරා වර්ගය 435
14. යොධාජීව වර්ගය 447
15. මංගල වර්ගය 456
16. අචෙලක වර්ගය 461
17. කම්මපථ පෙයියාල වර්ගය 464
18. රාග පෙයියාල වර්ගය 465

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අංගුත්තර නිකාය.

"නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස."

## ඒක නිපාතය.

## 1. රූප වර්ගය.

### 1. ඉත්ථිරූප පරියාදාන සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි, ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේකៈ-

"මහණෙනි, යම්සේ ස්ත්‍රීරූපය පුරුෂයාගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එබඳුවූ අනික් එකම රූපයකුදු මම නොම දකිමි. මහණෙනි, ස්ත්‍රීරූපය පුරුෂයාගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී"

### 2. ඉත්ථිසද්ද පරියාදාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ ස්ත්‍රියගේ ශබ්දය පුරුෂයාගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එසේවූ අනික් එකම ශබ්දයකුදු මම නොම දකිමි. මහණෙනි, ස්ත්‍රියගේ ශබ්දය පුරුෂයාගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී"

### 3. ඉත්ථිගන්ධ පරියාදාන සූත්‍රය.

'මහණෙනි, යම්සේ ස්ත්‍රියගේ ගන්ධය පුරුෂයාගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එසේවූ අනික් එකම

ගන්ධයකුදු මම නොම දකිමි. මහණෙනි, ස්ත්‍රී ගන්ධය පුරුෂයාගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී.

## 4. ඉත්ථිරස පරියාදාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ ස්ත්‍රියගේ රසය පුරුෂයාගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එසේවූ අනික් එකම රසයකුදු මම නොම දකිමි. මහණෙනි, ස්ත්‍රී රසය පුරුෂයාගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී.

## 5. ඉත්ථිපොට්ඨබ්බ පරියාදාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ ස්ත්‍රියගේ ස්පර්ශය පුරුෂයාගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එසේවූ අනික් එකම ස්පර්ශයකුදු මම නොම දකිමි. මහණෙනි, ස්ත්‍රියගේ ස්පර්ශය පුරුෂයාගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී."

## 6. පුරුෂ රූප පරියාදාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ පුරුෂයාගේ රූපය ස්ත්‍රියගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එසේවූ අනික් එකම රූපයකුදු මම නො දකිමි. මහණෙනි, පුරුෂ රූපය ස්ත්‍රියගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී."

## 7. පුරිසසද්ද පරියාදාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ පුරුෂයාගේ හඬ ස්ත්‍රියගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එසේවූ අනික් එකම ශබ්දයකුදු මම නොම දකිමි. මහණෙනි, පුරුෂ ශබ්දය ස්ත්‍රියගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී."

## 8. පුරිසගන්ධ පරියාදාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ පුරුෂයාගේ ගන්ධය ස්ත්‍රියගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එසේවූ අනික් එකම ගඳකුදු මම නොම දකිමි. මහණෙනි, පුරුෂ ගන්ධය ස්ත්‍රියගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 9. පුරිස රස පරියාදාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ පුරුෂයාගේ රසය ස්ත්‍රියගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද මහණෙනි, එසේවූ අනික් එකම රසයකුදු මම නොම දකිමි. මහණෙනි, පුරුෂරසය ස්ත්‍රියගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී."

## 10. පුරිසපොට්ඨබ්බ පරියාදාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ පුරුෂයාගේ ස්පර්ශය ස්ත්‍රියගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එසේවූ අනික් එකම ස්පර්ශයකුදු මම නොම දකිමි. මහණෙනි, පුරුෂයාගේ ස්පර්ශය ස්ත්‍රියගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී."

(පළමුවන වර්ගය නිමි)

---

# 2. නීවරණ වර්ගය.

## 1. කාමච්ඡන්දුප්පාද සූත්‍රය.

"මහණෙනි, යම් සුභ නිමිත්තක් (රාගය ඇති කරණ අරමුණක්) නිසා නූපන් කාම ආශාව උපදීද, උපන්නාවූ කාම ආශාව නැවත නැවත ඉපදීම හා විශාලලෙස රැස්වීම වන්නේද, මහණෙනි, එබඳුවූ අනික් එකම කරුණකුදු මම නොමදකිමි. මහණෙනි, රාගය ඇතිකරණ අරමුණ නුවණින් මෙනෙහි කරන්නා තුළ නූපන් කාමආශාවක් උපදී, උපන්නාවූ කාමආශාවෙහි බහුලභාවය හා විශාල භාවයත් ඇතිවන්නේය."

## 2. ව්‍යාපාදුප්පාද සූත්‍රය.

"මහණෙනි, සිතෙහි නුරුස්නා බව ඇතිකරණ යම් අරමුණක් නිසා නූපන් ක්‍රෝධය උපදී ද, උපන්නාවූ ක්‍රොධයෙහි නැවත නැවත ඉපදීම හා විසාලලෙස රැස්වීම ඇති වන්නේද, මහණෙනි, එබඳුවූ අනික් එකම කරුණකුදු මම නොමදකිමි. මහණෙනි, සිතෙහි නුරුස්නා බව ඇතිකරණ අරමුණ අනුවණින්

වැරදිලෙස මෙනෙහිකරන්නා තුළ (කලින්) නූපන් ආශාවත් උපදී, උපන්නාවූ ආශාවත් බහුලභාවයට හා විපුලභාවයට පැමිණේ"

## 3. ථීනමිද්ධුප්පාද සූත්‍රය.

"මහණෙනි, යම්සේ කුශලධර්මයන්හි නොඇලීම, අලස බව, ඇඟමැලිකැඩීම, බත්මත, සිතෙහි හැකුළුණු බව යන මේ කරුණු නිසා නූපන් ථීනමිද්ධය (සිතෙහි අලස බව හා කයෙහි අලස බව) උපදී ද, උපන්නාවූ ථීනමිද්ධයෙහි බහුලභාවය විපුලභාවය ඇතිවන්නේ ද, මහණෙනි, එබඳු වූ අනික් එකම කරුණකුදු මම නොමදකිමි. මහණෙනි, මැලි සිත් ඇත්තා කෙරෙහි නූපන් ථීනමිද්ධයත් උපදී, උපන්නාවූ ථීනමිද්ධයෙහි බහුලභාවය හා විපුලභාවයත් ඇතිවන්නේය."

## 4. උද්ධච්චකුක්කුච්චුප්පාද සූත්‍රය

"මහණෙනි, යම්සේ සිත්හි නොසංසිඳුනු බව නිසා නූපන් උද්ධච්චකුක්කුච්චය උපදී ද, උපන් උද්ධච්චකුක්කුච්චය හෝ බහුලභාවයට හා විපුලභාවයට පැමිණේද, මහණෙනි, එබඳුවූ අනික් එකම කරුණකුදු මම නොමදකිමි. නොසන්සුන් සිත් ඇත්තා තුළ නූපන් උද්ධච්චකුක්කුච්චයත් උපදී, උපන් උද්ධච්චකුක්කුච්චයත් බහුලභාවයට හා විපුලභාවයට පැමිණේ."

## 5. විචිකිච්ඡුප්පාද සූත්‍රය.

"මහණෙනි, යම්සේ අයෝනිසෝමනසිකාරය (නුවණින් මෙනෙහිකිරීම) නිසා නූපන් විචිකිච්ඡාව (සැකය) හෝ උපදී ද, උපන් විචිකිච්ඡාව හෝ බහුලභාවයට හා විපුලභාවයට පැමිණේද, මහණෙනි, එබඳුවූ අනික් එකම කරුණකුදු මම නොමදකිමි. නුවණින් මෙනෙහි කිරීම ඇත්තා තුළ නූපන් විචිකිච්ඡාවත් උපදී, උපන් විචිකිච්ඡාවත් බහුලභාවයට හා විපුලභාවයට පැමිණේ."

## 6. කාමච්ඡන්දප්පහාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ අසුභනිමිත්තක් (රාගය තුනී කරණ අරමුණක්) නිසා නූපන් කාමච්ඡන්දය (පඤ්චකාමයන් කෙරෙහි ආසාව) හෝ නූපදී ද, උපන් කාමච්ඡන්දය හෝ විනාසයට යේද, මහණෙනි, එබඳුවූ අනික් එකම කරුණකුදු මම නොමදකිමි අසුභ නිමිත්ත නුවණින් මෙනෙහිකරන්නා තුළ (පෙර) නූපන් කාමච්ඡන්දයත් නූපදන්නේය, උපන් කාමච්ඡන්දයත් විනාසයට යන්නේය."

## 7. ව්‍යාපාදප්පහාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ මෛත්‍රීසහගතව මිදුනු සිත නිසා නූපන් ක්‍රොධය හෝ නූපදීද, උපන්නාවූ ක්‍රෝධය හෝ විනාසයට යේද, මහණෙනි, එබඳුවූ අනික් එකම කරුණකුදු මම නොමදකිමි. මෛත්‍රීසහගතව මිදුනු සිත නුවණින් මෙනෙහි කරන්නා තුළ නූපන් ක්‍රෝධයත් නූපදන්නේය, උපන් ක්‍රෝධයත් විනාසයට යන්නේය"

## 8. ථීනමිද්ධප්පහාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ ප්‍රථමාරම්භ වීර්‍ය්‍යය, කුසීතභාවයෙන් තොරවූ ඊට වඩා බලවත් වීර්‍ය්‍යය, මතු මත්තෙහි සම්පතට පමුණුවමින් උපදනා ඊටත් වඩා බලවත්වූ වීර්‍ය්‍යය නිසා නූපන් ථීනමිද්ධය හෝ නූපදීද, උපන් ථීනමිද්ධය හෝ විනාසයට යේද මහණෙනි, එබඳුවූ අනික් එකම කරුණකුදු මම නොමදකිමි. මහණෙනි, පරිපූර්ණ වූද අල්වාගන්නාලද්දාවූද වීර්‍ය්‍යය ඇත්තා තුළ නූපන් ථීනමිද්ධයත් නූපදී, උපන් ථීනමිද්ධයත් විනාසයට යයි."

## 9. උද්ධච්චකුක්කුච්චප්පහාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ සිතෙහි සංසිඳවීම නිසා නූපන් උද්ධච්චකුක්කුච්චය හෝ නූපදීද, උපන් උද්ධච්චකුක්කුච්චය

හෝ විනාසයටයේද, මහණෙනි, එබඳුවූ අනික් එකම කරුණ කුදු මම නොම දකිමි. මහණෙනි, සන්හුන් සිත් ඇත්තා තුළ නූපන් උද්ධච්චකුක්කුච්චයත් නූපදී, උපන් උද්ධච්චකුක්කුච්චයත් විනාසයට යයි."

## 10. විචිකිච්ඡප්පහාන සූත්‍රය.

"මහණෙනි, යම්සේ (යෝනිසෝමනසිකාරය) නුවණින් මෙනෙහිකිරීම නිසා නූපන් සැකය හෝ නූපදීද, උපන් සැකය හෝ විනාසයටයේද, මහණෙනි, එබඳුවූ අනික් එකම කාරණයකුදු මම නොම දකිමි. මහණෙනි, නුවණින් මෙනෙහි කිරීම ඇත්තා තුළ නූපන් සැකයත් නූපදී, උපන් සැකයත් විනාසයට යයි"

(දෙවෙනි වර්ගය නිමි)

---

# 3. අකම්මනීය වර්ගය.

## 1. අකම්මනීය සූත්‍රය.

"මහණෙනි, යම්සේ නොවඩනලද සිත කර්මයට යෝග්‍ය නොවේද, එබඳුවූ අනික් එකම කරුණකුදු මම නොමදකිමි. මහණෙනි, සිත නොවඩන ලද්දේ කර්මයට යොග්‍ය නොවේ."

## 2. කම්මනීය සූත්‍රය.

"මහණෙනි, යම්සේ වඩනලද සිත කර්මයට යොග්‍ය වේද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත වඩනලද්දේ කටයුත්තට යොග්‍යවේ."

## 3. මහානත්ථ සූත්‍රය.

"මහණෙනි, යම්සේ නොවඩන ලද සිත මහත්වූ අනර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දකිමි. මහණෙනි, සිත නොවඩන ලද්දේ මහත්වූ අනර්ථය පිණිස පවතී.”

## 4. මහත්ථ සූත්‍රය.

“මහණෙනි, යම්සේ සිත වඩනලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත වඩනලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතී.”

## 5. අපාතුභූත සූත්‍රය.

“මහණෙනි, යම්සේ සිත නොවඩන ලද්දේ සංසාරයෙන් වෙන්වීම පිණිස පහළ නොවූයේ මහත්වූ අනර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත නොවඩන ලද්දේ පහළ නොවන ලද්දේ මහත් අනර්ථය පිණිස පවතී.”

## 6. පාතුභූත සූත්‍රය.

“මහණෙනි, යම්සේ සිත වඩන ලද්දේ සංසාරයෙන් වෙන්වීම පිණිස පහළවන ලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතීද එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත වඩන ලද්දේ සංසාරයෙන් වෙන්වීම පිණිස පහළවන ලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතී.”

## 7. අබහුලීකත සූත්‍රය.

“මහණෙනි, යම්සේ සිත නොවඩන ලද්දේ, පුරුදු නොකරණ ලද්දේ මහත්වූ අනර්ථය පිණිස පවතීද, එබඳු වූ අනික් එකම ස්වභාවයකුදු මම නොමදකිමි. මහණෙනි, සිත නොවඩන ලද්දේ නැවත නැවත පුරුදු නොකරණ ලද්දේ මහත් අනර්ථය පිණිස පවතී.”

## 8. බහුලීකත සූත්‍රය.

8. “මහණෙනි, යම්සේ සිත වඩන ලද්දේ පුරුදු කරණ ලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතීද, එබඳු වූ අනික් එකම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ස්වභාවයකුදු මම නොමදකිමි. මහණෙනි, සිතවඩන ලද්දේ පුරුදු කරණ ලද්දේමහත් අර්ථය පිණිස පවතී.”

### 9. දුක්ඛාවහචිත්ත සූත්‍රය.

9. “මහණෙනි, යම්සේ සිත නොවඩන ලද්දේ පුරුදු නොකරණ ලද්දේ දුක් (පමුණුවන්නේ) වේද, එබඳු වූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත නොවඩන ලද්දේ පුරුදු නොකරණ ලද්දේ දුක් පමුණුවන්නේ වේ.”

### 10. සුඛාවහචිත්ත සූත්‍රය.

10. “මහණෙනි, යම්සේ සිත වඩන ලද්දේ පුරුදු කරණ ලද්දේ සැප පමුණුවන්නේ වේද, එබඳු වූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත වඩන ලද්දේ පුරුදු කරණ ලද්දේ සැප පමුණුවන්නේ වේ.”

(තුන්වන වර්ගය නිමි)

---

## 4. අදන්ත නොහොත් දන්ත වර්ගය.

### 1. අදන්තචිත්ත සූත්‍රය.

1. “මහණෙනි, යම්සේ සිත දමනය නොකරණ ලද්දේ මහත් අනර්ථය පිණිස පවතීද, එබඳු වූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත දමනය නොකරණ ලද්දේ මහත්වූ අනර්ථය පිණිස පවතී.”

### 2. දන්තචිත්ත සූත්‍රය

2. “මහණෙනි, යම්සේ සිත දමනය කරණ ලද්දේ මහත් අර්ථය පිණිස පවතීද, එබඳු වූ අනික් එකම ස්වභාවයකුදු මම නොමදකිමි. මහණෙනි, සිත දමනය කරණ ලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතී.”

## 3. අගුත්තචිත්ත සූත්‍රය.

3. "මහණෙනි, යම්සේ සිත ගොපනය නොකරණ ලද්දේ (සිහියෙන් රැක බලා නොගන්නා ලද්දේ) මහත්වූ අනර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත ගොපනය නොකරණ ලද්දේ මහත්වූ අනර්ථය පිණිස පවතී."

## 4. ගුත්තචිත්ත සූත්‍රය.

4. "මහණෙනි, යම්සේ සිත ගොපනය කරණ ලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත ගොපනය කරණ ලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතී."

## 5. අරක්ඛිතචිත්ත සූත්‍රය.

5. "මහණෙනි, යම්සේ සිත නොරක්නා ලද්දේ මහත්වූ අනර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු නොම දකිමි. මහණෙනි, සිත නොරක්නා ලද්දේ මහත්වූ අනර්ථය පිණිස පවතී."

## 6. රක්ඛිචිත්ත සූත්‍රය.

6. "මහණෙනි, යම්සේ සිත රක්නා ලද්දේ මහත් අර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත රක්නා ලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතී."

## 7. අසංවුතචිත්ත සූත්‍රය.

7. "මහණෙනි, යම්සේ සිත (ආරක්ෂා) නොකරණ ලද්දේ මහත් අනර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවය කුදු මම නොම දකිමි. මහණෙනි, සිත ආරක්ෂා නොකරණ ලද්දේ මහත්වූ අනර්ථය පිණිස පවතී."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 8. සංවුතචිත්ත සූත්‍රය.

8. "මහණෙනි, යම්සේ සිත ආරක්ෂා කරණ ලද්දේ මහත් අර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවය කුදු මම නොම දකිමි මහණෙනි, සිත සංවරණය කරණ ලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතී,

## 9. අදන්තාදි සූත්‍රය.

9. "මහණෙනි, යම්සේ සිත දමනය නොකරණ ලද්දේ, ගොපනය නොකරණ ලද්දේ, නොරක්නා ලද්දේ, සංවරණය නොකරණ ලද්දේ, මහත් අනර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොමදකිමි. මහණෙනි, සිත දමනය නොකරණ ලද්දේ, ගොපනය නොකරණ ලද්දේ, නොරක්නා ලද්දේ, සංවරණය නොකරණ ලද්දේ මහත්වූ අනර්ථය පිණිස පවතී."

## 10. දන්තාදි සූත්‍රය.

10. "මහණෙනි, යම්සේ සිත දමනය කරණ ලද්දේ ගොපනය කරණ ලද්දේ, රක්නා ලද්දේ, සංවරණය කරණ ලද්දේ, මහත්වූ අර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත දමනය කරණ ලද්දේ, ගොපනය කරණ ලද්දේ, රක්නා ලද්දේ, සංවරණය කරණ ලද්දේ මහත්වූ අර්ථය පිණිස පවතී."

(සතරවන වර්ගය නිමි.)

---

# 5. පණිහිත (නොහොත් අච්ඡන්න) වර්ගය.

## 1. මිච්ඡාපණිහිතචිත්ත සූත්‍රය.

1. "මහණෙනි, ඇල්වී නණ්ඩුවක් හෝ යවවී නණ්ඩුවක් හෝ වරදවා (තුඩ යටිකුරුකොට, නො ඇණෙනසේ) තබන

ලදුව අතින් හෝ පයින් හෝ මඩනා ලද්දේ අත හෝ පය හෝ බිඳෙන්නේය. ලේ හෝ උපදවන්නේයයි ඒ කාරණය විද්‍යාමාන නොවේ. මක්නිසාදයත්, මහණෙනි, නණ්ඩුව (නො ඇණෙන ලෙස) වරදවා තබන ලද හෙයිනි.

"මහණෙනි, ඒ පරිද්දෙන් ම ඒකාන්තයෙන් යම් භික්ෂුවක් වරදවා තබන ලද සිතින් අවිද්‍යාව බිඳින්නේය. විද්‍යාව උපදවන්නේය. නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන්නේයයි' (කියතොත්) ඒ කාරණය ඇත්තක් නොවේ. මක්නිසාදයත්, මහණෙනි, සිත වරදවා යොදනලද හෙයිනි.

## 2. සම්මාපණිහිත සූත්‍රය.

"මහණෙනි, ඇල්වී නණ්ඩුවක් හෝ යව වී නණ්ඩුවක් හෝ තබන ලදුව අතින් හෝ පයින් හෝ මඩනා ලද්දේ අත හෝ පය හෝ බිඳෙන්නේය, ලේ හෝ උපදවන්නේය යන කාරණය සත්‍යයක් වන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, නණ්ඩුව මනා කොට තබන ලද හෙයිනි.

"මහණෙනි, ඒ පරිද්දෙන් ම ඒකාන්තයෙන් යම් මහණෙක් තෙම මනා කොට තබන ලද සිතින් 'මහා අවිද්‍යාව බිඳින්නේය, විද්‍යාව උපදවන්නේය, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන්නේයයි' ඒ කාරණය ඇත්තක් වන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, ඔහුගේ සිත මනා කොට පිහිටුවන ලද හෙයිනි."

## 3. පදුට්ඨචිත්ත සූත්‍රය.

"මහණෙනි, මේ ලෝකයෙහි ඉතා දූෂිතවූ ඇතැම් පුද්ගලයෙකුගේ සිත මම මාගේ සිතින් මෙසේ පිරිසිඳ දනිමි මෙසමයෙහි මේ පුද්ගලයා ඉදින් කලුරිය කෙළේ නම්, (අතින්) ගෙණ එන ලද්දක් බහා තබන්නාක් මෙන් හෙතෙම නරකයෙහි උපදනේය. මක්නිසාද යත්, ඔහුගේ සිත ඉතා දූෂිතවූ හෙයිනි.

"මහණෙනි, සිත බොහෝසේ කෙලසීම හේතු කොට ගෙණ ද මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ ශරීරයාගේ භෙදයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මරණින් මතු අපාය නම්වූ, දුගති නම්වූ, විනිපාත නම්වූ නරකයෙහි උපදිත්.”

## 4. පසන්නචිත්ත සූත්‍රය.

“මහණෙනි, මේ ලෝකයෙහි ප්‍රසන්න වූ සිත් ඇති ඇතැම් පුද්ගලයෙකුගේ සිත මම මාගේ සිතින් මෙසේ පිරිසිඳ දනිමි. ඉදින් මෙසමයෙහි මේ පුද්ගලතෙම කාලක්‍රියා කෙළේ නම්, ගෙණ එන ලද්දක් යම්සේ බහා තබනු ලැබේද, එසේම මෙතෙම ස්වර්ගයෙහි පිහිටියෙක් වේය කියායි. ඊට හේතු කවරේද? මහණෙනි, ඔහුගේ සිත ප්‍රසන්න හෙයිනි. මහණෙනි, සිතෙහි පැහැදීම හේතුකොටගෙණ ද, මේ ලෝකයෙහි සමහර සත්ත්වයෝ මෙසේ ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු සුගති නම්වූ, ලෝකයෙහි උපදිත්.”

## 5. ආවිලචිත්ත සූත්‍රය

“මහණෙනි, නොපැහැදුනාවූ, කැළඹුණු, කලල්වූ, මඩවූ, යම් දියවිලක් වේද, ඇස් ඇති පුරුෂයෙක් තෙම ඉවුරෙහි සිටියේ විලෙහි ඔබමොබ හැසිරෙන්නාවූද, නැවතී සිටින්නාවූද, සිප්පිබෙල්ලන්ද, හා සක්බෙල්ලන්ද, කැට හා කැබිලිතිද මත්ස්‍ය සමූහයාද නොදක්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, ජලය නොපැහැදුනු බවයි.

“මහණෙනි, එපරිද්දෙන් ම ඒකාන්තයෙන් යම් භික්ෂුවක් තෙම නොපැහැදුනාවූ සිතින් යුක්තව ආත්මාර්ථය හෝ දැන ගන්නේය, පරාර්ථය හෝ දැනගන්නේය. උභයාර්ථය හෝ දැනගන්නේය. මනුෂ්‍යධර්මයෙන් මත්තෙහි වූ ආයර්‍යභාව කරණයට (අර්හත් බවසැලසීමට) සමර්ථවූ ඥානදර්ශනවිෂයෙක් හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේයයි (කියතොත්) ඒ කාරණය විද්‍යමාන නොවේ. ඊට හේතු කවරේද? මහණෙනි, (ඔහුගේ) සිත නොපැහැදුනු බවයි.”

## 6 අනාවිලචිත්ත සූත්‍රය.

"මහණෙනි, පිරිසිදුවූ, අතිශයින් ප්‍රසන්නවූ, නො කැළඹුනාවූ යම් දියවිලක් වේද, ඇස් ඇති පුරුෂයෙක් තෙම ඒ විල ඉවුරෙහි සිටියේ විලෙහි ඔබමොබ හැසිරෙන්නාවූද, නැවතී සිටින්නාවූද, සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන්ද කැට කැබිලිතිද මත්ස්‍ය සමූහයාද දක්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, ජලය පැහැදුනු බවයි.

"මහණෙනි, එපරිද්දෙන්ම ඒකාන්තයෙන් යම් මහණෙක් තෙම පැහැදුනාවූ සිතින් යුක්තව ආත්මාර්ථය හෝ දැනගන්නේය, පරාර්ථය හෝ දැනගන්නේය, උභයාර්ථය හෝ දැන ගන්නේය, මනුෂ්‍යධර්මයෙන් මත්තෙහි වූ ආයර්‍යභාවය කරණයට (අර්හත්බව සැලසීමට) සමර්ථවූ ඥානදර්ශන විශෙෂයක් හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේයයි (කියතොත්) ඒ කාරණය විද්‍යමාන වේ. ඊට හේතු කවරේද? මහණෙනි, (ඔහුගේ) චිත්තය පැහැදුනු බවයි."

## 7. මුදුචිත්ත (අථවා පන්දන) සූත්‍රය

"මහණෙනි, යම් කිසි වෘක්ෂ වර්ගයෝ වෙත්ද, ඔවුන් අතුරෙන් මෘදු බැවින් හා කටයුත්තකට සුදුසු බැවින් කොළොම් ගස යම්සේ අග්‍රයයි කියනු ලැබේද, මහණෙනි එපරිද්දෙන්ම වඩනලද, නැවත නැවත පුරුදු කරණ ලද සිත හා, සමාන මෘදුබව හා කටයුත්තට සුදුසු බව ඇති අනික් එකම ස්වභාවයකුදු මම නොමදකිමි මහණෙනි' වඩන ලද නැවත නැවත පුරුදුකරණලද සිත මෘදුවද වේ, කටයුත්තට සුදුසුද වේ."

## 8. ලහුපරිවත්ත සූත්‍රය.

"මහණෙනි, යම්සේ සිත වහා ඉපිද වහා නැසෙන ස්වභාවද එබඳුවූ අනික් එකම ස්වභාවයකුදු මම නොම දකිමි. මහණෙනි, සිත කොතරම් වහා ඉපිද වහා නස්නා ස්වභාවද යත්, ඊට උපමාවකුදු පහසු නොවේ."

## 9. උපක්කිලිට්ඨචිත්ත සූත්‍රය.

'මහණෙනි, මේ සිත පැහැ විහිදුවන්නේය. එය වනාහි ආගන්තුකවූ (රාගාදි) උපක්ලෙශයන් විසින් කිලිටි කරණ ලද්දේය.

## 10. විප්පමුත්තචිත්ත සූත්‍රය.

"මහණෙනි, මේ සිත වනාහි ආගන්තුකවූ (රාගාදි) උපක්ලෙශයන් ගෙන් හාත්පසින් මිදුනේය.

(පස්වන වර්ගය නිමි.)

---

# 6. අච්ඡරාසංඝාත වර්ගය.

## 1. අස්සුතවා සූත්‍රය.

"මහණෙනි, මේ සිත ඉක්මනින් ආගන්තුකවූ (පසුව උපදිනා) රාගාදි කෙලෙසුන් විසින් කිලිටිකරණ ලද්දේය. ඒ සිත ධර්මය අසා පුරුදු නැති පෘථග්ජන තෙම තත්වූ පරිද්දෙන් නොදනී. එහෙයින් ධර්මය අසා පුරුදු නැති පෘථග්ජනයාහට සිතෙහි වැඩීමක් නැතැයි කියමි"

## 2. සුතවා සූත්‍රය

"මහණෙනි, මේ සිත පැහැවිහිදුවන්නේය. ඉක්මනින් ආගන්තුකවූ රාගාදි කෙලෙසුන්ගෙන් මිදුනේය. ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සිත (ඇතිසැටියෙන්) දනී. එහෙයින් ඇසූපිරූතැන් ඇති ආර්‍ය්‍යශ්‍රාවකයාහට සිතෙහි වැඩීමක් ඇතැයි කියමි."

## 3. මෙත්තාසෙවන සූත්‍රය

මහණෙනි, ඉදින් යම් භික්ෂුවක් තෙම ඇසුරු සතක් ගසන පමණ කාලයකුදු මෛත්‍රී චිත්තය පුරුදු කෙරේද මහණෙනි, ඒ භික්ෂුතෙම හිස් නොවූ ධ්‍යාන ඇත්තේ ශාස්තෘන් වහන්සේගේ ඉගැන්වීම පිළිපදිමින් අවවාදය මනාකොට රකිමින් වාසය කෙරෙයි. රටවැසියාගෙන් ලත් පිණ්ඩපාතය නිරර්ථක

නොවනසේ අනුභව කෙරේයයි ද කියනු ලැබේ. යමෙක් ඒ මෙත් සිත බහුල කෙරෙත්නම් (එහි අනුසස්) කියනුම කවරේද?"

## 4. මෙත්තාභාවනා සූත්‍රය.

"මහණෙනි, ඉදින් යම් මහණෙක් තෙම අසුරක් ගසන පමණ කාලයකුදු මෛත්‍රී චිත්තය වඩාද, මහණෙනි, ඒ මහණතෙම හිස් නොවූ ධ්‍යාන ඇත්තේ ශාස්තෲන් වහන්සේගේ ඉගැන්වීම පිළිපදිමින් ශාස්තෲන් වහන්සේගේ අවවාදය රකිමින් රටවැස්සන්ගේ පිණ්ඩපාතය නිරර්ථක නොවනසේ අනුභව කෙරේයයි ද කියනු ලැබේ. යම් කෙනෙක් ඒ සිත බහුල වශයෙන් වඩත්නම් (එහි අනුසස්) කියනුම කවරේද?

## 5. මෙත්තාමනසිකාර සූත්‍රය.

"මහණෙනි, ඉදින් යම් මහණෙක් තෙම අසුරක් ගසන පමණ කාලයකුදු මෛත්‍රී චිත්තය මෙනෙහි කෙරේද, ඒ මහණතෙමේ හිස් නොවූ ධ්‍යාන ඇත්තේ ශාස්තෲන්වහන්සේගේ ඉගැන්වීම පිළිපදිමින් ශාස්තෲන්වහන්සේගේ අවවාදය පිළිපදිමින් රටවැස්සන්ගේ පිණ්ඩපාතය නිරර්ථක නොවනසේ අනුභව කෙරේයි කියනු ලැබේ. යම් කෙනෙක් ඒ සිත බහුල කෙරෙත් නම් (එහි අනුසස් කියනු ම කවරේද?"

## 6. අකුසලභාගිය සූත්‍රය

"මහණෙනි, අකුසල් වූ, අකුසල් භජනය කරන්නාවූ අකුශලපක්ෂයෙහිවූ, යම්කිසි ධර්ම කෙනෙක් වෙත් ද ඒ සියලු ධර්මයෝ සිත පෙරටු කොට ඇත්තාහ. සිත ඒ ධර්මයන්ට පළමුකොට උපදී. අකුශල ධර්මයෝ සිත අනුව ම උපදිත්.

## 7. කුසලභාගිය සූත්‍රය.

"මහණෙනි, කුසල්වූ, කුසල් භජනය කරන්නාවූ කුශලපක්ෂයෙහිවූ, යම්කිසි ධර්මකෙනෙක් වෙත්ද, ඒ සියලු ධර්මයෝ සිත පෙරටුකොට ඇත්තාහ. සිත ඒ ධර්මයන්ට පළමු කොට උපදී කුශලධර්මයෝ ඒ අනුව ම උපදිත්."

## 8. පමාද සූත්‍රය.

"මහණෙනි, යම් ප්‍රමාදයක් කරණ කොටගෙණ නූපන්නාවූ අකුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ කුශලධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, එබඳුවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, ප්‍රමාදීවූ පුද්ගලයා තුළ (පෙර) නූපන් අකුශලධර්මයෝ උපදිත්. උපන්නාවූ කුශලධර්මයෝ පිරිහෙත්."

## 9. අප්පමාද සූත්‍රය.

"මහණෙනි, යම් අප්‍රමාදයක් කරණකොටගෙණ නූපන්නාවූ කුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ කුශලධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ බඳුවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, අප්‍රමාදිවූ තැනැත්තා තුළ නූපන් කුශල ධර්මයෝ උපදිත්. උපන්නාවූ අකුශල ධර්මයෝ පිරිහෙත්."

## 10. කොසජ්ජ සූත්‍රය.

"මහණෙනි, යම් අලසබවක් කරණ කොටගෙණ නූපන්නාවූ අකුශල ධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ කුශල ධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ බඳුවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි මහණෙනි, අලසයා තුළ නූපන් අකුශල ධර්මයෝත් උපදිත්. උපන්නාවූ කුශල ධර්මයෝත් පිරිහෙත්."

(සවෙනි වර්ගය නිමි)

---

# 7. විරියාරම්භ වර්ගය

**1. විරියාරම්භ සූත්‍රය** - "මහණෙනි, යම් සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයක් හේතුකොටගෙණ නූපන් කුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ අකුශල ධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තා තුළ නූපන් කුශලධර්මයෝත් උපදිත් උපන්නාවූ අකුශලධර්මයෝත් පිරිහෙත්."

**2. මහිච්ඡ සූත්‍රය** - "මහණෙනි, යම් දැඩි ලෝබකමක් හේතුකොටගෙණ නූපන් අකුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කුශල ධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ දැඩි ලෝබකම වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, දැඩිලෝබ පුද්ගලයා තුළ පෙර නූපන් අකුශලධර්මයෝත් උපදිත්. උපන්නාවූ කුශලධර්මයෝත් පිරිහෙත්."

3. **අප්පිච්ඡ සූත්‍රය** - "මහණෙනි, යම් අලෝභිබවක් හේතුකොටගෙණ නූපන් කුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ අකුශලධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ අලෝභිබව වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, අලොභිවූ තැනැත්තා තුළ නූපන් කුශලධර්මයෝත් උපදිත්, උපන්නාවූ අකුශලධර්මයෝත් පිරිහෙත්."

4. **අසන්තුට්ඨ සූත්‍රය** - "මහණෙනි, යම් ලද දෙයින් සතුටු නොවන බවක් හේතුකොටගෙණ පෙර නූපන් අකුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ කුශල ධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ ලද දෙයින් සතුටු නොවන බව වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, ලදදෙයින් සතුටු නොවන්නාවූ පුද්ගලයා තුළ නූපන් අකුශලධර්මයෝත් උපදිත්. උපන්නාවූ කුශලධර්මයෝත් පිරිහෙත්."

5. **සන්තුට්ඨ සූත්‍රය.** - "මහණෙනි, යම් ලදදෙයින් සතුටුවීමක් හේතුකොටගෙණ නූපන් කුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ අකුශල ධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ ලදදෙයින් සතුටුවීම වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, ලදදෙයින් සතුටු වන්නා තුළ නූපන් කුශලධර්මයෝත් උපදිත්. උපන්නාවූ අකුශලධර්මයෝත් පිරිහෙත්."

6. **අයොනිසොමනසිකාර සූත්‍රය**- "මහණෙනි, යම් අනුවණින් වරදවා මෙනෙහි කිරීමක් හේතුකොටගෙණ නූපන් අකුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ කුශල ධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, අනුවණින් මෙනෙහි කරන්නා තුළ නූපන් අකුශල ධර්මයෝත් උපදිත්. උපන්නාවූ කුශලධර්මයෝත් පිරිහෙත්.

**7. යොනිසොමනසිකාර සූත්‍රය-** "මහණෙනි, යම් නුවණින් මෙනෙහිකිරීමක් හේතුකොටගෙණ නූපන් කුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ අකුශලධර්මයෝත් පිරිහෙත්ද මහණෙනි, මේ වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොමදකිමි. මහණෙනි, නුවණින් මෙනෙහිකරන්නා තුළ නූපන් කුශලධර්මයෝත් උපදිත්. උපන්නාවූ අකුශල ධර්මයෝත් පිරිහෙත්."

**8. අසම්පජඤ්ඤ සූත්‍රය-** "මහණෙනි, යම් සම්‍යක්ප්‍රඥා රහිත භාවයක් මෝහයක් හේතුකොටගෙණ නූපන් අකුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ කුශල ධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොමදකිමි. මහණෙනි, මනා නුවණ නැත්තා තුළ නූපන් අකුශල ධර්මයෝත් උපදිත්. උපන්නාවූ කුශලධර්මයෝත් පිරිහෙත්."

**9. සම්පජඤ්ඤ සූත්‍රය-** 'මහණෙනි, යම් ප්‍රඥාඇතිබවක් හේතු කොටගෙණ නූපන් කුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ අකුශලධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, මනා ප්‍රඥා ඇත්තාතුළ නූපන් කුශලධර්මයෝත් උපදිත්. උපන්නාවූ අකුශල ධර්මයෝත් පිරිහෙත්."

**10. පාපමිත්ත සූත්‍රය-** "මහණෙනි, යම් පාපමිත්‍රයන් ඇති බවක් හේතුකොටගෙණ නූපන් අකුශල ධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ කුශල ධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ වැනිවූ අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, පාපමිත්‍රයන් ඇත්තාතුළ නූපන් අකුශල ධර්මයෝත් උපදිත්. උපන්නාවූ කුශලධර්මයෝත් පිරිහෙත්."

(සත් වන වර්ගය නිමි.)

---

## 8. කල්‍යාණමිත්‍ර වර්ගය.

**1. කල්‍යාණමිත්ත සූත්‍රය-** "මහණෙනි, යම් කල්‍යාණ මිත්‍රතාවක් (යහපත් මිතුරන් ඇතිබවක්) හේතුකොටගෙණ නූපන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ අකුශල ධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි මේ වැනිවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, කල්‍යාණමිත්‍රයන් ඇත්තාහට නූපන්නාවූ කුශලධර්මයෝත් උපදිත්, උපන්නාවූ අකුශල ධර්මයෝත් පිරිහෙත්."

**2. අකුසලානුයොග සූත්‍රය**- "මහණෙනි, යම් අකුශල ධර්මයන්හි යෙදීමක් හා කුශලධර්මයන්හි නොයෙදීමක් නිසා නූපන් අකුශලධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ කුශලධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මෙ වැනිවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, අකුශලධර්මයන්හි යෙදීමෙන්ද කුශලධර්මයන්හි නොයෙදීමෙන්ද, නූපන් අකුශල ධර්මයෝත් උපදිත්, උපන්නාවූ කුශලධර්මයෝත් පිරිහෙත්."

**3. කුසලානුයොග සූත්‍රය**- "මහණෙනි, යම් කුශල ධර්මයන්හි යෙදීමක් හා අකුශලධර්මයන්හි නොයෙදීමක් නිසා නූපන් කුශලධර්මයෝත් උපදිත් ද, උපන් අකුශලධර්මයෝත් පිරිහෙත්ද, මහණෙනි, මේ වැනිවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, කුශලධර්මයන්හි යෙදීමෙන් හා අකුශල ධර්මයන්හි නොයෙදීමෙන් (පෙර) නූපන් කුශල ධර්මයෝත් උපදිත්, උපන්නාවූ අකුශල ධර්මයෝත් පිරිහෙත්.

**4. බොජ්ඣංගඅනුප්පාද සූත්‍රය**- "මහණෙනි, යම් අනුවණින් මෙනෙහි කිරීමක් කරණකොටගෙණ නූපන් බොජ්ඣංගධර්මයෝ (ඥානයට කරුණුවන ධර්මයෝත්) නූපදිත්ද, උපන්නාවූ බොජ්ඣංගධර්මයෝත් සම්පූර්ණභාවයට නොයෙත් ද, මහණෙනි, මේ වැනිවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, අනුවණින් මෙනෙහි කරන්නා තුළ නූපන් බොජ්ඣංග ධර්මයෝත් නූපදිත්, උපන්නාවූ බොජ්ඣංග ධර්මයෝත් වැඩීමට සම්පූර්ණ බවට නොයෙත්."

**5. බොජ්ඣංගුප්පාද සූත්‍රය**- "මහණෙනි, යම් නුවණින් මෙනෙහිකිරීමක් කරණකොට ගෙණ නූපන් බොජ්ඣංග ධර්මයෝත් උපදිත්ද, උපන්නාවූ බොජ්ඣංගධර්මයෝත්

වැඩීමෙන් සම්පූර්ණභාවයට යෙත්ද, මහණෙනි, මේ වැනිවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නාවූ බොජ්ඣංග ධර්මයෝත් උපදිත්. උපන්නාවූ බොජ්ඣංගධර්මයෝත් වැඩීමෙන් සම්පූර්ණවීමට යෙත්."

**6. ඤාතිපරිහානි සූත්‍රය**- "මහණෙනි, නෑයන්ගේ යම් පිරිහීමක් වේද, මේ පිරිහීම සුලුවේ. මහණෙනි, ප්‍රඥාවගේ යම් පිරිහීමක් වේද, පිරිහීම් අතුරින් මේ ප්‍රඥාවගේ පිරිහීම ලාමකය.

**7. ඤාතිවුද්ධි සූත්‍රය**- "මහණෙනි, නෑයන්ගේ යම් වැඩීමක් දියුණුවක් වේද, ඒ මේ වැඩීම සුලුවේ. මහණෙනි, ප්‍රඥාවගේ යම් වැඩීමක් වේද, වැඩීම් අතුරෙන් මේ ප්‍රඥා වැඩීම ශ්‍රෙෂ්ඨවේ

"මහණෙනි, එහෙයින් මේ කාරණයෙහි මෙසේ හික්මිය යුතුයි. (කෙසේදයත්) 'අපි ප්‍රඥා වැඩීමෙන් වැඩෙන්නෙමුයි' කියායි. මහණෙනි, තොප විසින් වනාහි මෙසේ හික්මිය යුතුයි"

**8. භොගපරිහානි සූත්‍රය**- "මහණෙනි, යම් සම්පත් පිරිහීමක් වේද, ඒ මේ පිරිහීම සුලුවේ. මහණෙනි, පිරිහීම් අතුරෙන් ප්‍රඥාවගේ යම් පිරිහීමක් වේද මෙය පිරිහීම් අතුරෙන් ලාමක වන්නේය."

**9. භෝගවුද්ධි සූත්‍රය**- "මහණෙනි, සම්පත්තියෙන් යම් වැඩීමක් වේද, ඒ මේ වැඩීම සුලුවේ. මහණෙනි, වැඩීම් අතුරෙන් යම් ප්‍රඥාවැඩීමක්වේද, ඒ මේ වැඩීම අග්‍රය. මහණෙනි එහෙයින් මෙහිලා තොප විසින් මෙසේ හික්මිය යුතුයි. 'ප්‍රඥාව වැඩීමෙන් වැඩෙන්නෙමුයි' කියායි මහණෙනි, තොප විසින් මෙසේම හික්මිය යුතුයි."

10. යසොපරිහානි සූත්‍රය - "මහණෙනි, යසසෙහි (කීර්තියෙහි හා පිරිවරෙහි) යම් පිරිහීමක්වේද, ඒ පිරිහීම සුලුවේ. මහණෙනි, ප්‍රඥාවෙහි යම් පිරිහීමක් වේද, පිරිහීම් අතුරෙන් ඒ ලාමකය."

**(අට වෙනි වර්ගය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 9. ප්‍රමාද වර්ගය

1. **යසොවුද්ධි සූත්‍රය**- "මහණෙනි, යසසෙහි (කීර්තියෙහි හා පිරිවරෙහි) යම් වැඩීමක් වේද, ඒ මේ වැඩීම සුලුවේ. මහණෙනි, වැඩීම් අතුරෙන් ප්‍රඥාවගේ යම් වැඩීමක් වේද මේ අග්‍රයි. මහණෙනි, එහෙයින් මෙහිදී මෙසේ හික්මිය යුතුයි. 'ප්‍රඥාව වැඩීමෙන් වැඩෙන්නෙමුයි' කියායි. මහණෙනි, තොප විසින් වනාහි මෙසේම හික්මිය යුතුය."

2. **පමාද සූත්‍රය**- "මහණෙනි, යම්සේ ප්‍රමාදය මහත්වූ අනර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි මහණෙනි, ප්‍රමාදය මහත්වූ අනර්ථය පිණිස පවතී."

3. **අප්පමාද සූත්‍රය**- "මහණෙනි, යම්සේ අප්‍රමාදය මහත්වූ අර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, අප්‍රමාදය මහත්වූ අර්ථය පිණිස පවතී."

4. **කොසජ්ජ සූත්‍රය**- "මහණෙනි, යම්සේ අලසකම මහත්වූ අනර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, අලසකම මහත්වූ අනර්ථය පිණිස පවතී."

5. **විරියාරම්භ සූත්‍රය**- "මහණෙනි, යම්සේ සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යය මහත්වූ අර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යය මහත්වූ අර්ථය පිණිස පවතී."

6. **මහිච්ඡ සූත්‍රය**- "මහණෙනි, යම්සේ මහාලෝභී බව මහත්වූ අනර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, මහාලෝභී බව මහත්වූ අනර්ථය පිණිස පවතී."

7. **අප්පිච්ඡ සූත්‍රය**- 'මහණෙනි, යම්සේ අලෝභී බව මහත්වූ අර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, අලෝභී බව මහත්වූ අර්ථය පිණිස පවතී."

**8. අසන්තුට්ඨී සූත්‍රය**- "මහණෙනි, යම්සේ ලද දෙයින් සතුටු නොවන බව මහත් අනර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, මේ ලද දෙයින් සතුටු නොවන බව මහත්වූ අනර්ථය පිණිස පවතී."

**9. සන්තුට්ඨී සූත්‍රය**- "මහණෙනි, යම්සේ ලදදෙයන් සතුටුවීම මහත්වූ අර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, මේ ලදදෙයින් සතුටුවීම මහත්වූ අර්ථය පිණිස පවතී."

**10. අයොනිසොමනසිකාර සූත්‍රය**- "මහණෙනි, යම්සේ අනුවණින් මෙනෙහිකිරීම මහත් අනර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොමදකිමි. මහණෙනි, අනුවණින් මෙනෙහිකිරීම මහත්වූ අනර්ථය පිණිස පවතී."

**11. යොනිසොමනසිකාර සූත්‍රය**- "මහණෙනි, යම්සේ නුවණින් මෙනෙහි කිරීම මහත්වූ අර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, නුවණින් මෙනෙහි කිරීම මහත්වූ අර්ථය පිණිස පවතී."

**12. අසම්පජඤ්ඤ සූත්‍රය**- "මහණෙනි, යම්සේ සම්‍යක් ප්‍රඥා නැති බව මහත් අනර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි මහණෙනි, සම්‍යක්ප්‍රඥාව නැති බව මහත් අනර්ථය පිණිස පවතී."

**13. සම්පජඤ්ඤ සූත්‍රය**- "මහණෙනි, යම්සේ සම්‍යක්ප්‍රඥා ඇති බව මහත් අර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, සම්‍යක්ප්‍රඥා ඇති බව මහත් අර්ථය පිණිස පවතී."

**14. පාපමිත්ත සූත්‍රය**- "මහණෙනි, යම්සේ පාප මිතුරන් ඇති බව මහත් අනර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, පාපමිතුරන් ඇති බව මහත් අනර්ථය පිණිස පවතී."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

15. **කල්‍යාණමිත්ත සූත්‍රය**- "මහණෙනි, යම්සේ යහපත් මිතුරන් ඇති බව මහත් අර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, යහපත් මිතුරන් ඇති බව මහත්වූ අර්ථය පිණිස පවතී."

16. **අකුසලානුයොග සූත්‍රය**- "මහණෙනි, යම්සේ අකුශල ධර්මයන්හි යෙදීම හා කුසල ධර්මයන්හි නොයෙදීම මහත්වූ අනර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ අකුසල ධර්ම අනුයොගය හා කුශලධර්ම අනනු යොගය බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, අකුශල ධර්මයන්ගේ අනුයොගයද කුශල ධර්මයන්ගේ අනනුයොගයද, මහත් අනර්ථය පිණිස පවතී."

17. **කුසලානුයොග සූත්‍රය**- "මහණෙනි, යම්සේ කුශලධර්මයන්හි යෙදීම හා අකුශලධර්මයන්හි නොයෙදීම මහත්වූ අර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ බඳුවූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, කුශල ධර්ම අනුයොගයද හා අකුශල ධර්මය අනනුයොගයද, මහත්වූ අර්ථය පිණිස පවතී."

**(නවවෙනි වර්ගය නිමි.)**

---

## 10. චතුකොටික වර්ගය.

1. **පමාද සූත්‍රය**:- "මහණෙනි, අද්ධ්‍යාත්මිකවූ (ස්වකීය සන්තානයෙහි පිහිටි) කරුණු පිළිබඳව සලකනවිට

2. "මහණෙනි, යම්සේ ප්‍රමාදය මහත් අනර්ථයට හේතුවේද,

3. "මහණෙනි, ඒ බඳුවූ අනික් එක කරුණකුදු මම නොම දකිමි.

4. "මහණෙනි, ප්‍රමාදය මහත්වූ අනර්ථය පිණිප පවතී"

2. **අප්පමාද සූත්‍රය**:- 1. "මහණෙනි, අද්ධ්‍යාත්මිකවූ කරුණු පිළිබඳව සලකනවිට

2. "මහණෙනි, යම්සේ අප්‍රමාදය මහත් අර්ථයට හේතුවේද,

3. "මහණෙනි, ඒ අප්‍රමාදය බඳුවූ අන් එක කරුණකුදු මම නොම දකිමි.

4. "මහණෙනි, අප්‍රමාදය මහත්වූ අර්ථය පිණිස පවතී'

3-12. (මේ සූත්‍රවල 1. 3 ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

3. කොසජ්ජ සූත්‍රයː- 2. මහණෙනි, යම්සේ කුසීත භාවය මහත්වූ අනර්ථය පිණිස පවතීද,

4. "මහණෙනි, කුසීතභාවය මහත්වූ අනර්ථය පිණිස පවතී."

4. **වීරියාරම්භ සූත්‍රයː-** 2. මහණෙනි, වීයර්‍යාරම්භය මහත්වූ අර්ථය පිණිස පවතීද,

4. 'මහණෙනි, වීයර්‍යාරම්භය මහත්වූ අර්ථය පිණිස පවතී"

5. **මහිච්ඡතා සූත්‍රයː-** මහණෙනි, දැඩි ලෝභී බව මහත්වූ අනර්ථය පිණිස පවතීද,

4. "මහණෙනි, දැඩිලෝභි බව මහත් අනර්ථය පිණිස පවතී."

6. **අප්පිච්ඡතා සූත්‍රයː-** මහණෙනි, අලෝභී බව මහත් අර්ථය පිණිස පවතීද,

4. "මහණෙනි, අලෝභි බව මහත් අර්ථය පිණිස පවතී."

7. අසන්තුට්ඨිතා සූත්‍රයː- මහණෙනි, ලද දෙයින් සතුටු නොවන බව මහත් අනර්ථය පිණිස පවතීද,

4. "මහණෙනි, ලද දෙයින් සතුටු නොවන බව මහත් අනර්ථය පිණිස පවතී."

8. **සන්තුට්ඨිතා සූත්‍රයː-** ලද දෙයින් සතුටු වන බව මහත් අර්ථය පිණිස පවතීද,

4. "මහණෙනි, ලද දෙයින් සතුටුවන බව මහත් අර්ථය පිණිස පවතී."

**9. අයොනිසොමනසිකාර සූත්‍රයඃ-** මහණෙනි, අයෝනිසෝමනසිකාරය මහත් අනර්ථය පිණිස පවතීද,

4. "මහණෙනි, ඇතිදේ ඇති සැටි නොදැකීම මහත් අනර්ථය පිණිස පවතී."

**10. යොනිසොමනසිකාර සූත්‍රයඃ-** මහණෙනි, යෝනිසෝමනසිකාරය මහත් අර්ථය පිණිස පවතීද,

4. මහණෙනි, ඇතිදේ ඇතිසැටි දැකීම මහත් අර්ථය පිණිස පවතී."

**11. අසම්පජඤ්ඤ සූත්‍රයඃ-** මහණෙනි, මනාප්‍රඥා නැති බව මහත් අනර්ථය පිණිස පවතීද,

4. මහණෙනි, මනාප්‍රඥා නැතිබව මහත් අනර්ථය පිණිස පවතී."

**12. සම්පජඤ්ඤ සූත්‍රයඃ-** මහණෙනි, මනාප්‍රඥා ඇති බව මහත් අර්ථය පිණිස පවතීද,

4. "මහණෙනි, මනාප්‍රඥා ඇතිබව මහත් අර්ථය පිණිස පවතී."

**13. පාපමිත්ත සූත්‍රයඃ-** "මහණෙනි, බාහිර කරුණු පිළිබඳව සලකනවිට යම්සේ පාපමිත්‍රතාව මහත්වූ අනර්ථය පිණිස පවතීද, එබඳු අනික් එක ධර්මයකුදු මහණෙනි, මම නොම දකිමි. මහණෙනි, පාපමිත්‍රතාව මහත්වූ අනර්ථය පිණිස පවතී"

**14. කල්‍යාණමිත්ත සූත්‍රයඃ-** "මහණෙනි, බාහිර කරුණු පිළිබඳව සලකනවිට යම්සේ කල්‍යාණ මිත්‍රතාව (යහපත් මිතුරන් ඇති බව) මහත්වූ අර්ථය පිණිස පවතීද, එබඳු අනික් එක ධර්මයකුදු මහණෙනි, මම නොම දකිමි. මහණෙනි, කල්‍යාණමිත්‍රතාව මහත්වූ අර්ථය පිණිස පවතී."

**15. අකුශලානුයොග සූත්‍රයඃ-** "මහණෙනි, අද්ධ්‍යාත්මික වූ කරුණු වශයෙන් සලකනවිට යම්සේ අකුශලයන්හි යෙදීම හා

කුසලයන්හි නොයෙදීම මහත්වූ අනර්ථය පිණිස පවතීද, මහණෙනි, එබඳුවූ අන් එක කාරණයකුදු මම නොම දකිමි. මහණෙනි, අකුශලධර්මයන්හි යෙදීම හා කුශල ධර්මයන්හි නොයෙදීම මහත්වූ අනර්ථය පිණිස පවතී.”

**16. කුසලානුයොග සූත්‍රයඃ-** “මහණෙනි, අද්ධ්‍යාත්මික වූ කරුණු වසයෙන් සලකනවිට යම්සේ කුසලයන්හි යෙදීම හා අකුසලයන්හි නොයෙදීම මහත් අර්ථය පිණිස පවතීද, එබඳුවූ අනික් එක කාරණයකුදු මහණෙනි. මම නොම දකිමි. මහණෙනි, කුශලධර්මයන්හි යෙදීමද අකුශලධර්මයන්හි නොයෙදීමද මහත්වූ අර්ථය පිණිස පවතී.’

**17. සද්ධම්මන්තරධාන පමාද සූත්‍රයඃ-** “මහණෙනි, යම්සේ ප්‍රමාදය සද්ධර්මයාගේ විනාසය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතීද, ඒ බඳු අනික් එක කාරණයකුදු මහණෙනි, මම නොම දකිමි. මහණෙනි, ප්‍රමාදය සද්ධර්මයාගේ විනාසය පිණිසද අතුරුදන්වීම පිණිසද පවතී.”

**18. ii සද්ධම්මට්ඨිති අප්පමාද සූත්‍රයඃ-** 1. “මහණෙනි, යම්සේ අප්‍රමාද බව සද්ධර්මයාගේ පැවැත්ම පිණිසත් නොවිනාසය පිණිසත් අතුරුදන් නොවීම පිණිසත් පවතීද,

2. “මහණෙනි, ඒ බඳුවූ අනික් එක කාරණයකුදු මම නොම දකිමි.

3. “මහණෙනි, අප්‍රමාදබව සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද නොවිනාසය පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතී.”

**19. සද්ධම්මන්තරධාන කොසජ්ජ සූත්‍රයඃ-** 1 “මහණෙනි, යම්සේ කුසීතභාවය, සද්ධර්මයාගේ විනාසය පිණිසත්, අතුරුදන්වීම පිණිසත් පවතීද,

2. (මේ ඡෙදය සූත්‍ර 19-32 දක්වා මේ වර්ගයේ 18 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි)

3. “මහණෙනි, කුසීතභාවය සද්ධර්මයාගේ විනාසය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතී.”

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**20. සද්ධම්මට්ඨිති විරියාරම්භ සූත්‍රයː-** 1. "මහණෙනි, යම්සේ සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යය සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද, විනාස නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතීද,

3. "මහණෙනි, සම්‍යක් ප්‍රධානවීර්‍ය්‍යය සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද, විනාස නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතී."

**21. සද්ධම්මන්තරධානමභිච්ඡතා සූත්‍රයː-** 1. "මහණෙනි, යම්සේ දැඩිලෝභීබව සද්ධර්මයාගේ විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතීද,

3. "මහණෙනි, දැඩිලෝභි බව සද්ධර්මයාගේ විනාසය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතී."

**22. සද්ධම්මට්ඨිති සූත්‍රයː-** 1. "මහණෙනි, යම්සේ අලෝභිබව සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතීද,

3. "මහණෙනි, අලෝභිබව සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද, විනාශ නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතී."

**23. සද්ධම්මන්තරධාන අසන්තුට්ඨිතා සූත්‍රයː-**

"මහණෙනි, යම්සේ ලද දෙයින් සතුටු නොවන බව සද්ධර්මයාගේ විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතීද,

3. "මහණෙනි, ලද දෙයින් සතුටු නොවන බව සද්ධර්මයාගේ විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතී,

**24. සද්ධම්මට්ඨිති සන්තුට්ඨිතා සූත්‍රයː-** 1 "මහණෙනි, යම්සේ ලද දෙයින් සතුටුවන බව සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතීද?

3. "මහණෙනි, ලද දෙයින් සතුටු වන බව සද්ධර්මයාගේ පැවත්ම පිණිසද විනාශ නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතී,

**25. සද්ධම්මන්තරධාන අයෝනිසෝමනසිකාර සූත්‍රයඃ-**

1. මහණෙනි, යම්සේ අනුවණින් මෙනෙහි කිරීම සද්ධර්මයාගේ විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතීද?

3. මහණෙනි, අනුවණින් මෙනෙහි කිරීම සද්ධර්මයාගේ විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතී”

**26. සද්ධම්මට්ඨිතියෝනිසෝමනසිකාර සූත්‍රයඃ-**

1. “මහණෙනි, යම්සේ නුවණින් මෙනෙහි කිරීම සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද, අතුරුදන්නොවීම පිණිසත් පවතීද?

3. “මහණෙනි, නුවණින් මෙනෙහි කිරීම සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද, අතුරුදන් නොවීම පිණිසත් පවතී”

**27. සද්ධම්මන්තර අසම්පජඤ්ඤ සූත්‍රයඃ-** 1 “මහණෙනි, යම්සේ මුළාබව සද්ධර්මයාගේ විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතීද

3. “මහණෙනි, මුළාබව සද්ධර්මයාගේ විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතී”

**28. සද්ධම්මට්ඨිතිසම්පජඤ්ඤ සූත්‍රයඃ-** 1 “මහණෙනි, යම්සේ මනා ප්‍රඥා ඇතිබව සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතීද,

3. “මහණෙනි, මනා ප්‍රඥා ඇතිබව සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද අතුරුදන්නොවීම පිණිසද පවතී.”

**29. සද්ධම්මරන්තරධාන පාපමිත්තතා සූත්‍රයඃ-**

1. “මහණෙනි, එසේම පාපමිත්‍රතාව සද්ධර්මයාගේ විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතීද,

3. ‘මහණෙනි, පාපමිත්‍රතාව සද්ධර්මයාගේ විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතී.”

**30. සද්ධම්මට්ඨිති කල්‍යාණමිත්තතා සූත්‍රයː-**

1. "මහණෙනි, එසේම යහපත් මිතුරන් ඇතිබව සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද, අතුරුදන් නොවීම පිණිසද පවතීද?

3. "මහණෙනි, යහපත් මිතුරන් ඇතිබව සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතී."

**31. සද්ධම්මන්තරධාන අකුසලානුයොග සූත්‍රයː-**

1. මහණෙනි, එසේම අකුශලධර්මයන්ගි යෙදීම හා කුශල ධර්මයන්හි නොයෙදීම යන මේ කරුණු හෙවත් (ස්වභාවයෝ සද්ධර්මයාගේ (හෙවත් ශාසනයාගේ) විනාශය පිණිසද අතුරුදන්වීම පිණිසද පවතීද,

3. "මහණෙනි, අකුශලධර්මයන්හි යෙදීම හා කුශලධර්මයන්හි නොයෙදීම යන මේ කරුණු හෙවත් (ස්වභාවයෝ) සද්ධර්මයාගේ (හෙවත් ශාසනයාගේ) විනාශය පිණිසත් අතුරුදන්වීම පිණිසත් පවතී."

**32. සද්ධම්මට්ඨිති කුසලානුයෝග සූත්‍රයː-** 1. " මහණෙනි, එසේම කුශලධර්මයන්හි නැවත නැවත යෙදීම හා අකුශල ධර්මයන්හි එසේ නොයෙදීම යන මේ කරුණු හෙවත් ස්වභාවයෝ සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතීද,

3. "මහණෙනි, කුශලධර්මයන්හි නැවත නැවත යෙදීම හා අකුශල ධර්මයන්හි එසේ නොයෙදීම යන මේ කරුණු හෙවත් ස්වභාවයෝ සද්ධර්මයාගේ පැවැත්ම පිණිසද විනාශ නොවීම පිණිසද අතුරුදන් නොවීම පිණිසද පවතී."

**(දසවෙනි වර්ගය නිමි.)**

---

# 11. අධර්මාදි වර්ගය.

1. **සද්ධම්මන්රධාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් අධර්මය ධර්මයයි ප්‍රකාශ කෙරෙත්ද,

2. "මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නොසැප පිණිස, බොහෝ දෙනාට අනර්ථය පිණිස, දෙව් මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නාහු වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ අකුශල්ද රැස්කෙරෙත්. ඒ භික්ෂූහු ම මේ ශාසනය අතුරුදහන් කෙරෙත්."

(මේ වර්ගයේ සෑම සූත්‍රවලම 2 ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

2. **අධම්මදීපන සූත්‍රය**- 1. "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ධර්මය අධර්මයයි ප්‍රකාශකරත්ද,

3. **අවිනයදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් අවිනය විනයයි ප්‍රකාශකෙරෙත්ද,

4. **විනයභාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් විනය අවිනයයි ප්‍රකාශ කරත්ද,

5. **අභාසිතදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් නොවදාරණලද්ද ප්‍රකාශ නොකරණලද්ද තථාගතයන් විසින් කියනලද්දේය ප්‍රකාශ කරණ ලද්දේයයි දක්වත්ද,

6. **භාසිතභාසිත සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂුකෙනෙක් තථාගතයන් විසින් කියනලද්ද ප්‍රකාශකරණ ලද්ද තථාගතයන් විසින් නොකියන ලද්දේය ප්‍රකාශ නොකරණලද්දේයයි දක්වත්ද,

7. **අනාචිණ්ණදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් පුරුදු නොකරණලද්ද තථාගතයන් විසින් පුරුදු කරණලද්දේයයි දක්වත්ද,

8. **ආචිණ්ණභාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් පුරුදු කරණ ලද්ද තථාගතයන් විසින් පුරුදු නොකරණලද්දේයයි දක්වත්ද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9. අප්පඤ්ඤත්තදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් නොපණවනලද්ද තථාගතයන් විසින් පනවනලද්දේයයි දක්වත්ද,

**10. පඤ්ඤත්තදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් පනවන ලද්ද තථාගතයන් විසින් නොපනවන ලද්දේයයි ප්‍රකාශකෙරෙත්ද,

(අධර්මවාදි එකොළොස්වන වර්ගය නිමි)

---

## 12. අධර්ම වර්ගය

**1. අධම්මභාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් අධර්මය අධර්මයයි දක්වත්ද,

2. "මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස බොහෝ දෙනාට යහපත පිණිස දෙව් මිනිසුන්ට හිත පිණිස සැප පිණිස පිළිපන්නාහු වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු බොහෝවූ පිණක්ද රැස් කෙරෙත්. ඒ භික්ෂූහු ම මේ ශාසනය පිහිටුවත්.'

(මේ වර්ගයේ සෑම සූත්‍රවලම 2 ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2 ඡේදය මෙනි)

**2. ධම්මදීපන සූත්‍රය**- 1. 'මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ධර්මය ධර්මයයි දක්වත්ද,

**3. අවිනයභාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් අවිනය අවිනයයි දක්වත්ද,

**4. විනයදීපන සූත්‍රය**- 'මහණෙනි, යම් භික්ෂුකෙනෙක් විනය විනයයි දක්වත්ද,

**5. අභාසිතභාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් නොකියනලද්ද ප්‍රකාශ නොකරණ ලද්ද තථාගතයන් විසින් නොකියන ලද්දේය ප්‍රකාශ නොකරණ ලද්දේයයි දක්වත්ද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**6. භාසිතදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂුකෙනෙක් තථාගතයන් විසින් කියනලද්ද ප්‍රකාශකරණ ලද්ද තථාගතයන් විසින් කියනලද්දේය ප්‍රකාශ කරණලද්දේයයි දක්වත්ද,

**7. අණාචිණ්ණභාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් පුරුදු නොකරණලද්ද තථාගතයන් විසින් පුරුදු නොකරණලද්දේයයි දක්වත්ද,

**8. ආචිණ්ණදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් පුරුදුකරණ ලද්ද තථාගතයන් විසින් පුරුදු කරණලද්දේයයි දක්වත්ද,

**9. "අපඤ්ඤත්ත භාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් නොපනවන ලද්ද තථාගතයන් විසින් නොපනවන ලද්දේයයි දක්වත්ද,

**10. පඤ්ඤත්තදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් තථාගතයන් විසින් පනවන ලද්ද තථාගතයන් විසින් පනවන ලද්දේයයි දක්වත්ද.

(දොළොස්වන වර්ගය නිමි.)

## 13. අනාපත්ති වර්ගය. (i)

මේ වර්ගයේ සෑම සූත්‍රවලම 2 ඡේදය 11 වෙනි අධර්මවාදි වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2 ඡේදය මෙනි.

**1. අනාපත්තිදීපන සූත්‍රය**- 1 "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ඇවැත් නොවූ (නිවරදවූ) දේ ඇවත (වරද) යයි දක්වත්ද,

**2. ආපත්තිභාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ඇවැත්වූ දේ ඇවැත් නොවේයයි දක්වත්ද

**3. ලහුකාපත්ති ගරුකරණ සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් සැහැල්ලු ඇවත ගරු ඇවතයයි දක්වත්ද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

**4. ගරුකාපත්ති ලහුකරණ සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ගරු ඇවත ලුහු ඇවතයයි දක්වත්ද,

**5. දුට්ඨුල්ලභාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් දොෂබහුල වූ ඇවත දොෂ බහුල නොවූ ඇවත යයි දක්වත්ද

**6. අදුට්ඨුල්ලදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් (දුකුළා නොවූ ඇවත දුකුළා ඇවතයයි දක්වත්ද

**7. සාවසෙසභාපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් සාවසෙසාපත්තිය (ඉතුරුවූ ඇවත) අනවසෙසාපත්තියයි (ඉතුරු නුවූ ඇවත) යයි දක්වත්ද,

**8. අනවසෙසදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් අනවසෙසාපත්තිය සාවසෙසාපත්තියයි දක්වත්ද

**9. සප්පටිකම්මභාපන සූත්‍රය**- "ප්‍රතිකර්ම සහිත පිළියම් කළ හැකි ඇවත ප්‍රතිකර්ම රහිත ඇවතයයි දක්වත්ද,

**10. අප්පටිකම්මදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ප්‍රතිකර්ම රහිත ඇවත ප්‍රතිකර්ම සහිත (පිළියම් කළ නොහැකි) ඇවතයයි දක්වත්ද,

**(අනාපත්ති වර්ගය නිමි)**

---

## 13. අනාපත්ති වර්ගය. (ii)

(මේ වර්ගයේ සූත්‍රවල 2 ඡෙදය 12 වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

**1. අනාපත්තිදීපන සූත්‍රය**- 1. "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ඇවැත් නොවූදේ ඇවත නුවූයයි දක්වත්ද,

**2. ආපත්තිදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ඇවැත්වූදේ ඇවැත් වූදේයයි දක්වත්ද

**3. ලහුකාපත්තිදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ලඝු ඇවත ලඝු ඇවතයයි දක්වත්ද,

**4. ගරුකාපත්ති දීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ගරු ඇවත ගරු ඇවතයයි දක්වත්ද,

**5. දුට්ඨුල්ලාපත්ති දීපන සූත්‍රය**- යම් භික්ෂු කෙනෙක් දොෂ බහුලවූ ඇවත දොෂ බහුලවූ ඇවතයයි දක්වත්ද,

**6. අදුට්ඨුල්ලාපත්තිදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂුකෙනෙක් දොෂ බහුලනුවූ ඇවත දොෂ බහුලනුවූ ඇවත යයි දක්වත්ද,

**7. සාවසෙසාපත්තිදීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් සාවසෙසාපත්තිය (ඉතුරුවූ ඇවත) සාවසෙසා පත්තියයි දක්වත්ද,

**8. අනවසෙසාපත්ති දීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් අනවසෙසාපත්තිය (ඉතුරුනුවූ ඇවත) අනවසෙසාපතති ඉතුරුනුවූ ඇවතයයි දක්වත්ද,

**9. සප්පටිකම්මාපත්ති දීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ප්‍රතිකර්ම (පිළියම් කළහැකි ඇවත) පිළියම් කළහැකි ඇවතයයි දක්වත්ද,

**10. අප්පටිකම්මාපත්ති දීපන සූත්‍රය**- "මහණෙනි, යම් භික්ෂු කෙනෙක් ප්‍රතිකර්ම රහිත ඇවත ප්‍රතිකර්ම රහිත ඇවතයයි දක්වත්ද,

**(තෙළෙස්වන වර්ගය නිමි.)**

---

## 14. එකපුග්ගල වර්ගය.

**1. සම්මාසම්බුද්ධ සූත්‍රය**- "මහණෙනි, එකම පුද්ගලයෙක් තෙම ලොකයෙහි උපදනේ බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙවිමිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස උපදී. කවරනම් අසහාය පුද්ගලයෙක්ද? තථාගත (නම්වූ) අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේය. මහණෙනි, මේ අසහාය

පුද්ගලතෙම වනාහි ලොකයෙහි උපදනේ බොහෝදෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙවිමිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස උපදී."

2. **දුල්ලභපුග්ගල සූත්‍රය**- "මහණෙනි, ලොකයෙහි එකම පුද්ගලයෙකුගේ පහළවීම දුර්ලභය. කවර එකම පුද්ගලයෙකුගේද? තථාගතවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන්ගේය. මහණෙනි, මේ අසහාය පුද්ගලයාගේ ලොව පහළ වීම වනාහි දුර්ලභය."

3. **අච්ඡරිය මනුස්ස සූත්‍රය**- 'මහණෙනි, ලොකයෙහි එකම පුද්ගලයෙක් උපදනේ ආශ්චර්‍ය්‍ය මනුෂ්‍යයෙක්ව උපදී. කවර එකම පුද්ගලයෙක් ද? තථාගතවූ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේය. මහණෙනි, ලොකයෙහි මේ අසහාය පුද්ගල තෙම වනාහි උපදින්නේ ආශ්චර්‍ය්‍ය මනුෂ්‍යයෙක්ව උපදී."

4. **අනුතප්ප සූත්‍රය**- "මහණෙනි, එකම පුද්ගලයෙකුගේ කාලක්‍රියාව බොහෝ දෙනාට තැවිලි උපද වන්නීය. කවර එකම පුද්ගලයෙකුගේද යත්; තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේය. මහණෙනි, මේ අසහාය පුද්ගලයාගේ කාලක්‍රියාව බොහෝ දෙනාට තැවිලි උපදවන්නීය.

5. **අප්පටි පුග්ගල සූත්‍රය**- "මහණෙනි, තමහට සරිලන දෙවැන්නකු නැතිවූ සමානයකු නැතිවූ, සම කරනට දෙයක් නැතිවූ ආත්මභාවයෙන් සමානයකු නැතිවූ, තමාගේ ධර්මයෙහි අඩුපාඩු ප්‍රකාශ කිරීමට කිසිවකු නැතිවූ, ('මම බුදුවෙමි"යි ප්‍රතිඥා දෙන්නට සමර්ථවූ අන් කිසිවකු නැතිවූ, (සියලු පුද්ගලයන් හා අසමානවූ) අසම නම්ලද බුදුවරයන්ට සමානවූ, දෙව්මිනිසුන් අතුරෙන් අග්‍රවූ, එක පුද්ගලයෙක් ලෝකයේ උපදනේය. කවර එකම පුද්ගලයෙක්ද යත්; තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේය. මහණෙනි, තමාට සම දෙවැනියකු නැති, සහායයකු නැති, ප්‍රතිමායෙන් සමානයෙකු නැති, අප්‍රති සමවූ, ප්‍රතිභාගවීමට සුදුස්සකු නැති, අප්‍රතිපුද්ගලවූ, අසමවූ, අසමසමවූ මේ අසහාය පුද්ගල තෙම වනාහි දෙපා ඇත්තවුන්ට අග්‍රව උපදී.

**6. ධම්මපාතුභාව සූත්‍රය-** "මහණෙනි, එකම පුද්ගලයෙකුගේ පහළවීමෙන් මහත්වූ (ප්‍රඥා) චක්ෂුසයාගේ පහළවීම වේ. මහත්වූ (ප්‍රඥා) ආලොකයාගේ පහළවීම වේ, මහත්වූ (ප්‍රඥා) දීප්තියකගේ පහළවීම වේ. සවැදෑරුම් අනුත්තරිය ධර්මයන්ගේ පහළවීම වේ, සිවුපිළිසිඹියාවන්ගේ ප්‍රත්‍යක්ෂ කිරීම වේ. නොයෙක් ධාතූන්ගේ ප්‍රතිවෙධය වේ. නානාප්‍රකාර ස්වභාවය දැනගැනීම ඇති වේ. මාර්ගඵලඥානය හා ඒ සමග යෙදුනු අවශෙෂ ධර්මයන්ගේ හා අර්හත් ඵලයාගේ ප්‍රත්‍යක්ෂකිරීම වේ. සොවාන් ඵලයාගේ ප්‍රත්‍යක්ෂකිරීම වේ. සකෘදාගාමී ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම වේ. අනාගාමී ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම වේ. අර්හත් ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම වේ."

**2.** "කවර එකම පුද්ගලයෙකුගේද යත්? තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේය. මහණෙනි, මේ අසහාය පුද්ගලයාගේ පහළවීමෙන් මහත්වූ (ප්‍රඥා) චක්ෂුසයාගේ පහළවීම වේ. මහත්වූ ප්‍රඥාලොකයාගේ පහළවීම වේ. මහත්වූ ප්‍රඥාභාවයාගේ පහළවීම වේ. ෂඩ්විධ අනුත්තරිය ධර්මයන්ගේ පහළවීම වේ. චතුර්විධ ප්‍රතිසම්භිදා ධර්මයන්ගේ පහළවීම වේ. නොයෙක් ධාතූන්ගේම ප්‍රතිවේධය වේ. ඒ නානා ස්වභාවයන්ගේ ප්‍රතිවෙධය වේ. විද්‍යාවිමුක්ති ඵලයන්ගේ ප්‍රත්‍යක්ෂ කිරීමවේ. ශ්‍රොතාපත්ති ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීමවේ. සකෘදාගාමි ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම වේ. අනාගාමි ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම වේ. අර්හත් ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම වේ.

**7. සාරිපුත්තධම්මචක්ක සූත්‍රය-** "මහණෙනි, යමෙක් තෙම තථාගතයන් වහන්සේ විසින් පවත්වනලද නිරුත්තරවූ ධර්මචක්‍රය මනා කොට (ඒ අනුවම) පවත්වාද, මහණෙනි, (එසේ කිරීමෙහි) මේ ශාරිපුත්‍රස්ථවිරයන් බඳුවූ අනෙක් එක පුද්ගලයෙකුදු මම (නුවණැසින්) නොම දකිමි. මහණෙනි, ශාරිපුත්‍රස්ථවිර තෙමේ තථාගතයන් විසින් පවත්වන ලද ශ්‍රෙෂ්ඨ වූ ධර්මචක්‍රය මනා කොට ඒ අනුවම පවත්වයි.

**(එකපුද්ගල වර්ගය නිමි.)**

---

# 15. එතදග්ග පාලිය (a) මහණෙහු.

1. **අඤ්ඤාකොණ්ඩඤ්ඤ එතදග්ග සූත්‍රය-** 'මහණෙනි, යම් මේ අඤ්ඤා කොණ්ඩඤ්ඤ නම් ස්ථවිර නමක් වේද, මේ තෙම චිරරාත්‍රි දන්නාවූ (ඉකුත්කළ බොහෝ කල් ඇති) මාගේ ශ්‍රාවක වූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

2. **සාරිපුත්ත එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මහත් ප්‍රඥා ඇත්තවුන් අතුරෙන් මේ ශාරිපුත්‍රස්ථවිර තෙම අග්‍රයි.

3. **මහාමොග්ගල්ලාන එතදග්ග සූත්‍රය-** "මහණෙනි, ඍද්ධි ඇත්තවුන් අතුරෙන් මේ මහා මෞද්ගල්‍යාන ස්ථවිර තෙම අග්‍රයි.

4. **මහාකස්සප එතදග්ග සූත්‍රය-** "මහණෙනි, ධූතවාද ඇත්තාවූ (ධූතංගධාරීවූ) භික්ෂූන් අතුරෙන් මේ මහා කාශ්‍යප ස්ථවිර තෙම අග්‍රයි.

5. **අනුරුද්ධ එතදග්ග සූත්‍රය-** "මහණෙනි, දිවැස් ඇත්තවුන් අතුරෙන් මේ අනුරුද්ධ ස්ථවිර තෙම අග්‍රයි.

6. **භද්දිය කාළිගොධායපුත්ත එතදග්ග සූත්‍රය-** "මහණෙනි, උසස් කුල ඇත්තවුන් අතුරෙන් කාළිගොධා නම් බැමිණියගේ පුත්‍රවූ මේ භද්දිය ස්ථවිර තෙම අග්‍රයි.

7. **ලකුණ්ටක භද්දිය එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මධුර ස්වර (මිහිරි හඬ) ඇත්තාවූ භික්ෂූන් අතුරෙන් මේ ලකුණ්ටක භද්දිය ස්ථවිර තෙම අග්‍රයි.

8. **පිණ්ඩොලභාරද්වාජ එතදග්ග සූත්‍රය-** "මහණෙනි, සිංහනාද (අභීතනාද) කරන්නාවූ භික්ෂූන් අතුරෙන් මේ පිණ්ඩොල භාරද්වාජ ස්ථවිර තෙම අග්‍රයි.

9. **පුණ්ණමන්තානීපුත්ත එතදග්ග සූත්‍රය-** "මහණෙනි, ධර්මකථිකවූ ශ්‍රාවකයන් අතුරෙන් මේ මන්තානි බැමිණියගේ පුත්‍රවූ මේ පුණ්ණ නම් ස්ථවිර තෙම අග්‍රයි.

10. **මහා කච්චාන එතදග්ග සූත්‍රය-** "මහණෙනි, සංක්ෂෙපයෙන් කියනලද ධර්මයාගේ අර්ථය විස්තර වශයෙන්

විභාග කරන්නාවූ භික්ෂූන් අතුරෙන් මේ මහාකච්චාන ස්ථවිර තෙම අග්‍රයි.

(ප්‍රථම වර්ගය නිමි.)

---

## 2 වෙනි වර්ගය.

11. **චුල්ලපන්ථක එතදග්ග සූත්‍රය**- "යම් මේ චුල්ලපන්ථක නම් ස්ථවිර නමක් වේද, මනොමය ශරීරයන් උපදවන්නාවූ මාගේ ශ්‍රාවකවූ භික්ෂූන් අතුරෙන් මෙතෙම අග්‍රයි.

12. **චුල්ලපන්ථක චෙතොවට්ට එතදග්ග සූත්‍රය**- "මේ චුල්ලපන්ථක ස්ථවිර තෙම රූපාවචරධ්‍යානලාභීන් අතුරෙන් අග්‍රයි.

13. **මහාපන්ථක එතදග්ග සූත්‍රය**- "මේ මහාපන්ථක ස්ථවිර තෙම අරූපාවචරධ්‍යානලාභීන් අතුරෙන් අග්‍රයි.

14. **සුභූති එතදග්ග සූත්‍රය**- "මේ සුභූති ස්ථවිර තෙම රාගාදි කෙලෙසුන් කෙරෙන් තොරවූ වාසය ඇති භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

15. **සුභූති දක්ඛිණෙය්‍ය එතදග්ග සූත්‍රය**- "මේ සුභූති නම් ස්ථවිර තෙම දක්ෂිණාවට සුදුසු වූවන් අතුරෙන් අග්‍රයි.

16. **රෙවත ඛදිරවනිය එතදග්ග සූත්‍රය**- "මේ කිහිරිවන වාසී රෙවත ස්ථවිර තෙම වනයෙහි වසන භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

17. **කඞ්ඛාරෙවත එතදග්ග සූත්‍රය**- "මේ කඞ්ඛාරෙවත නම් ස්ථවිර තෙම ධ්‍යානයෙහි ඇලී වසන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි

18. **සොණකොලිවීස එතදග්ග සූත්‍රය**- "මේ කොලිවීස ගොත්‍ර ඇති සොණ ස්ථවිර තෙම පටන්ගෙණ සම්පූර්ණකරණ ලද වීර්‍ය්‍යය ඇති ශ්‍රාවකයන් අතුරෙන් අග්‍රයි.

19. **සොණකුටිකණ්ණ එතදග්ග සූතය**- "(කෙළක් අගනා කන්පළඳනා ඇති හෙයින්) කුටිකණ්ණයයි කියන ලද සොණ

නම් මේ ස්ථවිර තෙම යහපත් වචන කියන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**20. සීවලි එතදග්ග සූත්‍රය**- "මේ සීවලී ස්ථවිර තෙම ප්‍රත්‍යලාභීවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**21. වක්කලි එතදග්ග සූත්‍රය**- "මේ වක්කලී නම් ස්ථවිර තෙම බලවත් ශ්‍රද්ධා ඇත්තාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**(දෙවෙනි වර්ගය නිමි)**

---

**22. රාහුල එතදග්ග සූත්‍රය**- "මහණෙනි, "මහණෙනි, යම් මේ රාහුල නම් ස්ථවිරනමක් වේද ශික්ෂාකාමීවූ මාගේ ශ්‍රාවකවූ භික්ෂූන් අතුරෙන් මෙතෙම අග්‍රයි.

**23. රට්ඨපාල එතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ රට්ඨපාල ස්ථවිර තෙම ශ්‍රද්ධායෙන් පැවිදිවූවන් අතුරෙන් අග්‍රයි.

**24. කුණ්ඩධාන එතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ කුණ්ඩධාන ස්ථවිර තෙම සියල්ලන්ට පළමුව සළකා ගන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි

**25. වඞ්ගීස එතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ වඞ්ගීස ස්ථවිර තෙම සම්පූර්ණවූ වැටහීම් ඇත්තාවූ නොහොත් වහා වැටහෙන නුවණැත්තාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**26. උපසෙන වංගන්තපුත්ත එතදග්ග සූත්‍රය**- " මහණෙනි, මේ වංගන්ත බමුණාගේ පුත්‍රවූ උපසෙන ස්ථවිර තෙම සියල්ලන් පහදවන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**27. දබ්බමල්ලපුත්ත එතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ මල්ලරාජ පුත්‍රවූ දබ්බ නම් ස්ථවිර තෙම සෙනසුන් පනවන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**28. පිළින්දිවච්ඡ එතදග්ග සූත්‍රය**- මහණෙනි, මේ පිළින්දිගොත්‍රයෙහි උපන් වච්ඡ නම්වූ හෙවත් පිළින්දිවච්ඡ ස්ථවිර තෙම දෙවියන්ට ප්‍රිය මනාපවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**29. බාහිය දාරුචීරිය එතදග්ග සූත්‍රය-** "මහණෙනි, (දැව පතුරෙන් කළ වැහැරි දැරූ නිසා) දාරුචීරියයි කියන ලද බාහිය නම්වූ මේ ස්ථවිර තෙම වහාලත් අරහත් ඵලාවබොධය ඇති භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**30. කුමාරකස්සප එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ කුමාරකාශ්‍යප ස්ථවිර තෙම විසිතුරු කොට බණ කියන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**31.** මහාකොට්ඨිත එතදග්ග සූත්‍රය- "මහණෙනි, මේ මහාකොට්ඨිත ස්ථවිර තෙම සිවු පිළිසිඹියාවට පත් භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**තුන්වෙනි වර්ගයයි.**

---

**32. බහුස්සුත ආනන්ද එතදග්ග සූත්‍රය-** "මහණෙනි, යම් මේ ආනන්ද නම් ස්ථවිර නමක් වේද, බහුශ්‍රැතවූ (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) මාගේ ශ්‍රාවකවූ භික්ෂූන් අතුරෙන් මෙතෙම අග්‍රයි.

**33. සතිමන්ත ආනන්ද එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ ආනන්ද නම් ස්ථවිර තෙම (ඇසූපිරූ දේ දරාගන්නා සිහි ඇති) ශ්‍රාවකයන් අතුරෙන් අග්‍රයි.

**34. ගතිමන්ත ආනන්ද එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ ආනන්ද නම් ස්ථවිර තෙම ඥාණගති ඇති භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**35. ධිතිමන්ත ආනන්ද එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ ආනන්ද ස්ථවිර තෙම (බුද්ධ වචනය දැරීමාදියෙහි) වීර්‍ය්‍යය ඇත්තාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**36. උපට්ඨාක ආනන්ද එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ ආනන්ද ස්ථවිර තෙම බුද්ධොපස්ථායකවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**37. උරුවෙල කස්සප එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ උරුවෙල කාශ්‍යප ස්ථවිර තෙම මහත් පිරිවර ඇත්තාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**38. කාලුදායි එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ කාලුදායි ස්ථවිර තෙම කුලයන් පහදවන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**39. බක්කුල එතදග්ග සූත්‍රය-** "මහණෙනි, බක්කුල ස්ථවිර තෙම නීරෝගීවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි

**40. සොභිත එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ සොභිත ස්ථවිර තෙම පූර්වෙනිවාසය (පෙර විසූ කඳපිළිවෙළ) සිහි කරන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**41. උපාලි එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ උපාලි ස්ථවිර තෙම විනයධරවූවන් අතුරෙන් අග්‍රයි.

**42. නන්දක එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ නන්දක ස්ථවිර තෙම භික්ෂුණීන්ට අවවාද කරන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**43. නන්ද එතදග්ග සූත්‍රය-** "මහණෙනි, නන්ද නම් ස්ථවිර තෙම ඉන්ද්‍රියයන් කෙරෙහි වසනලද දොර ඇත්තාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**44. මහාකප්පින එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ මහා කප්පින නම් ස්ථවිර තෙම භික්ෂූන්ට අවවාද කරන්නාවූ ශ්‍රාවකයන් අතුරෙන් අග්‍රයි.

**45. සාගත එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ සාගත ස්ථවිර තෙම තෙජොධාතු සමාපත්තියට සමවදින්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**46. රාධ එතදග්ග සූත්‍රය-** 'මහණෙනි, මේ රාධ ස්ථවිර තෙම දම්දෙසුම් වැටහීමට හේතුවූ නුවණ ඇති භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**47. මොඝරාජ එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ මොඝරාජ නම් ස්ථවිර තෙම රූක්ෂ (රළු) සිවුරු දරන්නාවූ භික්ෂූන් අතුරෙන් අග්‍රයි.

**සතරවෙනි වර්ගයයි.**

---

## 15. ඒතදග්ග පාලිය (මෙහෙනිවරු)

1. **මහාපජාපතී ගොතමී ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, යම් මේ මහාප්‍රජාපතී ගොතමී නම් ස්ථවිරියක් වේද, චිර රාත්‍රි (ඉකුත්කළ බොහෝ කල් දන්නාවූ මාගේ ශ්‍රාවිකා භික්ෂුණීන් අතුරෙන් ඕතොමෝ අග්‍රයි.

2. **ඛෙමා ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ ඛෙමා භික්ෂුණී තොමෝ මහා ප්‍රඥා ඇති භික්ෂුණීන් අතුරෙන් අග්‍රයි.

3. **උප්පලවණ්ණා ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ උප්පලවණ්ණා භික්ෂුණිය ඍද්ධිමත්වූ ශ්‍රාවිකාවන් අතුරෙන් අග්‍රයි.

4. **පටාචාරා ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ පටාචාර නම් භික්ෂුණිය විනයධරවූ ශ්‍රාවිකාවන් අතුරෙන් අග්‍රයි.

5. **ධම්මදින්නා ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ ධම්මදින්නා ස්ථවිරී තොමෝ ධර්මකථිකවූ ශ්‍රාවිකාවන් අතුරෙන් අග්‍රයි

6. **නන්දා ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ නන්දා නම් භික්ෂුණිය ධ්‍යානයෙහි ඇලුනාවූ ශ්‍රාවිකාවන් අතුරෙන් අග්‍රයි.

7. **සොණා ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ සොණා නම් භික්ෂුණිය පවත්නාලද පරිපූර්ණ වීර්‍ය්‍යය ඇති භික්ෂුණීන් අතුරෙන් අග්‍රයි.

8. **සකුලා ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ සකුලා නම් භික්ෂුණිය දිවැස් ඇත්තාවූ භික්ෂුණීන් අතුරෙන් අග්‍රයි.

9. **භද්දාකුණ්ඩලකෙසා ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ (කුණ්ඩලවූ හෙවත් වක්‍ර කෙහෙ ඇති) කුණ්ඩලකෙසා භික්ෂුණිය වහා පැමිණෙන ලද අභිඥා අවබොධ ඇති මාගේ භික්ෂුණීන් අතුරෙන් අග්‍රයි.

10. **භද්දාකාපිලානී ඒතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ භද්දා කාපිලානී නම්වූ භික්ෂුණිය පූර්වෙනිවාසය (පෙරවිසූ කඳපිළිවෙළ) සිහි කරන්නාවූ භික්ෂුණීන් අතුරෙන් අග්‍රයි.

**11. භද්දාකච්චානා එතදග්ග සූත්‍රය-** මහණෙනි, මේ භද්දා කච්චානා නම්වූ භික්ෂුණිය මහත්වූ අභිඥාවන්ට පැමිණියාවූ භික්ෂුණීන් අතුරෙන් අග්‍රයි.

**12. කිසාගොතමී එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ කිසා ගොතමී නම් භික්ෂුණිය රළුසිවුරු දරන්නාවූ භික්ෂුණීන් අතුරෙන් අග්‍රයි.

**13. සිගාලමාතා එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ සිගාලමාතා භික්ෂුණිය බලවත් ශ්‍රද්ධා ඇත්තාවූ භික්ෂුණීන් අතුරෙන් අග්‍රයි.

**පස්වෙනි වර්ගයයි.**

---

## (c) උපාසකවරු

**1. තපස්සු භල්ලිකා එතදග්ග සූත්‍රය-** "මහණෙනි, යම් මේ තපස්සුය භල්ලිකය යන වෙළෙඳ දෙබෑ කෙනෙක් වෙත්ද, පළමු සරණගියාවූ මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙන් මොහු තුමූ අග්‍රයි.

**2. සුදත්ත (අනාථ පිණ්ඩික) එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ (අසරණයන්ට අහර දෙන බැවින්) අනාථ පිණ්ඩික නම් ඇති සුදත්ත නම් ගෘහපති තෙම දානයෙහි ඇලුනාවූ උපාසකයන් අතුරෙන් අග්‍රයි.

**3. චිත්ත එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ මච්ඡිකා සණ්ඩ නුවරවාසී චිත්ත නම් ගෘහපති තෙම ධර්මකථිකවූ උපාසකයන් අතුරෙන් අග්‍රයි.

**4. හත්ථක ආලවක එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ හත්ථක නම් ඇති ආලවක නම්වූ කුමාර තෙම සිවු සඟරාවකින් පිරිසට සංග්‍රහ කරණ උපාසකයන් අතුරෙන් අග්‍රයි.

**5. මහානාම සක්ක එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ මහානාම නම් ශාක්‍ය තෙම ප්‍රණීත දේ දෙන්නාවූ උපාසකයන් අතුරෙන් අග්‍රයි.

**6. උග්ග ගහපති වෙසාලික එතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ විශාලා මහනුවර වාසීවූ ඒ උග්ග නම් ගෘහපතියා මනාප දේ දෙන්නාවූ උපාසකයන් අතුරෙන් අග්‍රයි.

**7. උගගත එතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ උග්ගත නම් ගෘහපතියා සංඝයාට උපස්ථාන කරන්නාවූ උපාසකයන් අතුරෙන් අග්‍රයි.

**8. සූර අම්බට්ඨ එතදග්ග සූත්‍රය**- "මහණෙනි මේ සූර අම්බට්ඨ උපාසක තෙම අචල ප්‍රසාදයෙන් යුක්තවූ උපාසකයන් අතුරෙන් අග්‍රයි.

**9. ජීවක කොමාරභච්ච එතදග්ග සූත්‍රය**- "මහණෙනි, කොමාරභච්ච නම් ඇති මේ ජීවක උපාසක තෙම පුද්ගලයන්ගේ ප්‍රසාදය දිනාගත් මාගේ ශ්‍රාවකවූ උපාසකයන් අතුරෙන් අග්‍රයි.

**10. නකුලපිතා එතදග්ග**- "මහණෙනි, මේ නකුල පිතා නම් ගෘහපතියා විශ්වාස කටයුතු දේ කියන්නාවූ උපාසකයන් අතුරෙන් අග්‍රයි.

---

**සයවෙනි වර්ගයයි.**

## (d) උපාසිකාවරු

**1. සුජාතා එතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ සෙනානී කෙළෙඹියාගේ දියණියවූ සුජාතා නම් උපාසිකාවක් වේද, ඕතොමෝ පළමුකොට සරණගියාවූ මාගේ ශ්‍රාවිකා උපාසිකාවන් අතුරෙන් අග්‍රයි.

**2. විසාඛා එතදග්ග සූත්‍රය**- "මහණෙනි, (මිගාර සිටුහු විසින් මවූ තනතුරෙහි පිහිටවූ හෙයින්) මිගාරමාතා නම් ඇති මේ විසාඛා උපාසිකාව දානයෙහි ඇලුනාවූ උපාසිකාවන් අතුරෙන් අග්‍රයි.

**3. ඛුජ්ජුත්තරා එතදග්ග සූත්‍රය**- "මහණෙනි, මේ ඛුජ්ජුත්තරා උපාසිකාව බහුශ්‍රැතවූ උපාසිකාවන් අතුරෙන් අග්‍රයි

**4. සාමාවතී එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ සාමාවතී උපාසිකාව මෙත් සිත් පතුරුවා වසන උපාසිකාවන් අතුරෙන් අග්‍රයි.

**5. උත්තරා නන්දමාතා එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ නන්ද ගේ මව්වූ උත්තරා නම් උපාසිකා තොමෝ ධ්‍යානයෙහි ඇලුනාවූ උපාසිකාවන් අතුරෙන් අග්‍රයි.

**6. සුප්පවාසා කොලියධීතා එතදග්ග සූත්‍රය-** 'මහණෙනි, මේ කෝලිය රාජගේ දුවවූ සුප්පවාසා උපාසිකා තොමෝ ප්‍රණීත දේ දෙන්නාවූ උපාසිකාවන් අතුරෙන් අග්‍රයි.

**7. සුප්පියා එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ සුප්පියා උපාසිකාව ගිලනුන්ට උපස්ථාන කරන්නාවූ උපාසිකාවන් අතුරෙන් අග්‍රයි

**8. කාතියානී එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ කාතියානී නම් උපාසිකාව නොසෙල්වෙන සැදැහැති උපාසිකාවන් අතුරෙන් අග්‍රයි.

**9. නකුලමාතා එතදග්ග සූත්‍රය-** "මහණෙනි, මේ නකුලමාතාවූ ගෘහිණිය විශ්වාසකටයුතු කථා කියන්නාවූ උපාසිකාවන් අතුරෙන් අග්‍රයි.

**10. කාළී කුරරඝරිකා එතදග්ග සූත්‍රය-** "මහණෙනි, කුරරඝර නගරවාසීවූ මේ කාළී නම් උපාසිකාව බුදුගුණ අනුන් වෙතින් ඇසීමෙන්ම උපන් ප්‍රසාදයෙන් යුක්තවූ මාගේ ශ්‍රාවිකා උපාසිකාවන් අතුරෙන් අග්‍රයි.

---

සත්වෙනි වර්ගයයි.

## 16. අට්ඨාන වර්ගය

**1. නිච්චතුපගමන සූත්‍රය-** "මහණෙනි, මාර්ග දෘෂ්ටියෙන් යුක්තවූ, (සෝවාන්වූ) පුද්ගලයෙක් යම් හේතුවක් නිසා කිසි සංස්කාරයක් නිත්‍ය වශයෙන් ගන්නේය යන මේ කාරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

හේතු රහිතයි. ප්‍රත්‍ය රහිතයි. මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් විද්‍යමාන වේ (එනම්) පෘථග්ජන පුද්ගලයෙක් යම් හේතුවක් නිසා කිසි සංස්කාරයක් නිත්‍ය වශයෙන් ගන්නේය. මේ කාරණය විද්‍යමාන වේ"

2. **සුඛතූපගමන සූත්‍රය**- "මහණෙනි, මාර්ගදෘෂ්ටියෙන් යුක්තවූ (සෝවාන්වූ) පුද්ගලයෙක් යම් හේතුවක් නිසා කිසි සංස්කාරයක් සැප වශයෙන් ගන්නේය, යන මේ කාරණය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි එවැනි දෙයක් විද්‍යමාන නොවේ. මහණෙනි, මෙබඳු දෙයක් නම් විද්‍යමාන වේ. (එනම්) යම් හෙයකින් පෘථග්ජන පුද්ගලයෙක් කිසි සංස්කාරයක් සැප වශයෙන් ගන්නේය, යන මේ කාරණය නම් විද්‍යමාන වේ."

3. **අත්තතූපගමන සූත්‍රය**- "මහණෙනි, මාර්ගදෘෂ්ටියෙන් යුක්තවූ (සෝවාන්වූ) පුද්ගලයෙක් තෙම කිසි ධර්මයක් ආත්ම වශයෙන් ගන්නේය. යන මේ කාරණය හේතු රහිතයි. ප්‍රත්‍ය රහිතයි. එවැනි දෙයක් විද්‍යමාන නොවේ "මහණෙනි, මේ කාරණය නම් විද්‍යමාන වේ. (එනම්) යම් හෙයකින් පෘථග්ජනයෙක් කිසි ධර්මයක් ආත්ම වශයෙන් ගන්නේය, යන මේ කාරණය නම් විද්‍යමාන වේ"

4. **මාතුජීවිත සූත්‍රය**- "මහණෙනි, මාර්ගදෘෂ්ටියෙන් යුක්තවූ (සෝවාන්වූ) පුද්ගලයෙක් යම් හේතුවක් නිසා වැදූ මව ජීවිතයෙන් තොර කරන්නේය. යන මේ කාරණය හේතු රහිත වේ, ඒ ප්‍රත්‍යය රහිතයි. එබඳු දෙයක් දක්නට නැත. මහණෙනි, මෙබඳු දෙයක් නම් විද්‍යමානවේ. (එනම්) පෘථග්ජන තෙම යම් හෙයකින් මව ජීවිතයෙන් තොර කරන්නේය, යන මේ කාරණය නම් විද්‍යමාන වේ."

5. **පිතුජීවිත සූත්‍රය**- "මහණෙනි, මාර්ගදෘෂ්ටියෙන් යුක්තවූ (සෝවාන්වූ) පුද්ගලයෙක් යම් හේතුවක් නිසා ස්වකීය පියා ජීවිතයෙන් තොර කරන්නේය, යන මේ කාරණය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. මෙබඳු දෙයක් දක්නට නොලැබේ. මහණෙනි, මෙවැනි දෙයක් නම් දක්නට ලැබේ. (එනම්) යම් හේතුවක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

පටුන



නිසා පෘථග්ජනයෙක් ස්වකීය පියා ජීවිතයෙන් තොර කරන්නේය, යන මේ කාරණය නම් විද්‍යමාන වේ.”

**6. අරහත්තජීවිත සූත්‍රය-** “මහණෙනි, මාර්ගදෘෂ්ටියෙන් සම්පූර්ණවූ (සෝවාන්වූ) පුද්ගලයෙක් තෙම යම් හේතුවක් නිසා රහත් කෙනෙකුන් ජීවිතයෙන් තොර කරන්නේය, යන මෙය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. එවැනි කාරණයක් විද්‍යමාන නොවේ. මහණෙනි, මෙබඳු දෙයක් නම් දක්නට ලැබේ. (එනම්) යම් හේතුවක් නිසා පෘථග්ජනයෙක් රහත් කෙනෙකුන් ජීවිතයෙන් තොර කරන්නේය, යන මේ දේ නම් විද්‍යමාන වේ.”

**7. ලොහිතුප්පාද සූත්‍රය-** “මහණෙනි, මාර්ගදෘෂ්ටියෙන් සම්පූර්ණවූ (සෝවාන්වූ) පුද්ගලයෙක් යම් හේතුවක් නිසා තථාගතයන් වහන්සේගේ ශරීරයෙන් දූෂ්‍යවූ සිතින් ලේ උපදවන්නේය, යන මේ කාරණය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. එබඳු දෙයක් විද්‍යමාන නොවේ. මහණෙනි, මෙබඳු දෙයක් නම් දක්නට ලැබේ. (එනම්) යම් හේතුවක් නිසා පෘථග්ජනයෙක් තථාගතයන් වහන්සේගේ ශරීරයෙන් දූෂ්‍යවූ සිතින් යුක්තව ලේ උපදවන්නේය, යන මේ කාරණය නම් විද්‍යමානවේ.”

**8 සංඝභෙද සූත්‍රය-** “මහණෙනි, මාර්ගදෘෂ්ටියෙන් සම්පූර්ණවූ (සෝවාන්වූ) පුද්ගලයෙක් තෙම යම් හේතුවක් නිසා සංඝයා භේද කරන්නේය යන මේ කාරණය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. එබඳු දෙයක් විද්‍යමාන නොවේ මහණෙනි, මෙබඳු දෙයක් නම් විද්‍යමාන වේ (එනම්) යම් හෙයකින් පෘථග්ජනයෙක් සංඝයා බිඳුවන්නේය, යන මේ කාරණය නම් දක්නට ලැබේ.”

**9. අඤ්ඤසත්ථාරුද්දෙස සූත්‍රය-** “මහණෙනි, මාර්ගදෘෂ්ටියෙන් සම්පූර්ණවූ (සෝවාන්) පුද්ගලයෙක් යම් හෙයකින් අන්‍ය ශාස්තෘවරයෙක් අදහන්නේය, යන මේ කාරණය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. එබඳු දෙයක් විද්‍යමාන නොවේ. මහණෙනි, මෙබඳු දෙයක් නම් දක්නට ලැබේ. (එනම්) යම් හෙයකින් පෘථග්ජනයෙක් අන්‍ය ශාස්තෘවරයෙකු විශ්වාස කරන්නේය, යන මේ කාරණය නම් විද්‍යමාන වේ.”

**10. එකසම්මාසම්බුද්ධ සූත්‍රය**- "මහණෙනි, එක ලොක ධාතුවෙක්හි අර්හත්වූ සම්‍යක් සම්බුදුවරයන් වහන්සේලා දෙනමක් පෙර නොව පසු නොව (එකවර) උපදින්නාහුය. යන මේ කාරණයක් වේද ඒ හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. ඒ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, මෙබඳු දෙයක් නම් ඇත්තේය. (එනම්) යම් හෙයකින් එක ලොකධාතුවෙක්හි අර්හත්වූ එකම සම්බුදුවරයෙක් උපදනේය යන මේ කාරණය වනාහි විද්‍යමානවේ."

**11. එකචක්කවත්ති සූත්‍රය.** "මහණෙනි, එක ලොක ධාතුවෙක්හි සක්විති රජවරු දෙදෙනෙක් පෙර නොව පසු නොව (එකවර) උපදනාහුය යන මේ කාරණයක් වේද ඒ හේතුරහිතයි. ප්‍රත්‍යය රහිතයි. මේ කාරණය විද්‍යමානනොවේ. මහණෙනි, මෙබඳු දෙයක් නම් ඇත්තේය. (එනම්) එක ලොකධාතුවෙක්හි එකම සක්විති රජෙක් උපදනේය යන මේ කාරණයක් වේද ඒ වනාහි විද්‍යමානවේ."

**12. පුරිසසම්මාසම්බොධි සූත්‍රය.** "මහණෙනි, ස්ත්‍රියක් තොම අර්හත්වූ සම්‍යක් සම්බුදුවරයෙක් වේය යන මේ කාරණයක් වේද, ඒ හේතුරහිතයයි. ප්‍රත්‍යය රහිතයි ඒ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් විද්‍යමාන වේ (එනම්) යම්හෙයකින් පුරුෂයෙක් අර්හත්වූ සම්‍යක් සම්බුදුවරයෙක් වේද, මේ කාරණය නම් විද්‍යමානවේ.

**13. පුරිස චක්කවත්ති සූත්‍රය.** "මහණෙනි, ස්ත්‍රියක් තොම සක්විති රජෙක් වේය යන මේ කාරණය හේතුරහිතයි. ප්‍රත්‍යය රහිතයි. ඒ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් දක්නට ලැබේ. (එනම්) යම්හෙයකින් පුරුෂයෙක් සක්විතිරජ වේද මේ කාරණය නම් විද්‍යමානවේ."

**14. පුරිසසක්කත්ත සූත්‍රය**- "මහණෙනි, ස්ත්‍රියක් තොම ශක්‍ර ආත්මය ලබන්නීය යන මේ කාරණය හේතු රහිතයි ප්‍රත්‍යය රහිතයි. ඒ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් දක්නට ලැබේ. (එනම්) යම් හෙයකින් පුරුෂයෙක් ශක්‍රආත්මය ලබන්නේය. මේ කාරණය නම් විද්‍යමාන වේ."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

15. **පුරිසමාරත්ත සූත්‍රය**- "මහණෙනි, ස්ත්‍රියක් තොම මාර ආත්මය ලබන්නීය යන මේ කාරණය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. ඒ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් දක්නට ලැබේ. (එනම්) යම්හෙයකින් පුරුෂයෙක් මාර ආත්මය ලබන්නීය. මේ කාරණය නම් විද්‍යමාන වේ."

16. **පුරිසබ්‍රහ්මත්ත සූත්‍රය**- "මහණෙනි, ස්ත්‍රියක්තොම බ්‍රහ්ම ආත්මය ලබන්නීය. යන මේ කාරණය හේතු රහිතයි ප්‍රත්‍යය රහිතයි. ඒ කාරණය විද්‍යමාන නොවේ. "මහණෙනි, මේ කාරණය නම් දක්නටලැබේ (එනම්) යම් හෙයකින් පුරුෂයෙක් බ්‍රහ්ම ආත්මය ලබන්නීය, යන මේ කාරණය නම් විද්‍යමානවේ"

17. **කායදුච්චරිතවිපාක සූත්‍රය**- "මහණෙනි, කාය දුශ්චරිතයෙන් ප්‍රියවූ, සිත්කළුවූ, මනවඩන්නාවූ විපාකයක් උපදනේයයි නම් කරුණක් වේද ඒ හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. එබඳු දෙයක් සිදුනොවන්නේය. මහණෙනි, මේ කාරණය නම් සිදුවේ (එනම්) යම්හෙයකින් කායදුශ්චරිතයාගේ අප්‍රිය වූ, අකාන්තවූ අමනාපවූ විපාකයක් උපදනේය. යන මේ කාරණය නම් සිදුවන්නේය."

18. **වචීදුච්චරිතවිපාක සූත්‍රය**- "මහණෙනි, වචී (වචන) දුශ්චරිතයෙන් ප්‍රියවූ, සිත්කලුවූ, මනවඩන්නාවූ විපාකයක් උපදනේයයි යම් කරුණක්වේද ඒ හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. එබඳු දෙයක් සිදුනොවන්නේය. මහණෙනි මේ කාරණය නම් සිදුවේ. (එනම්) යම්හෙයකින් වචී (වචන) දුශ්චරිතයාගේ අප්‍රියවූ, අකාන්තවූ අමනාපවූ විපාකයක් උපදනේය යන මේ කාරණය නම් සිදුවන්නේය."

19. "මහණෙනි, මනෝ (හිතේ) දුශ්චරිතයෙන් ප්‍රියවූ, සිත්කලුවූ, මනවඩන්නාවූ විපාකයක් උපදනේයයි යම් කරුණක් වේද ඒ හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. එබඳු දෙයක් සිදුනොවන්නේය මහණෙනි, මේ කාරණය නම් සිදුවේ. (එනම්) යම්හෙයකින් මනෝ (හිතේ) දුශ්චරිතයාගේ අප්‍රියවූ, අකාන්තවූ අමනාපවූ විපාකයක් උපදනේය යන මේ කාරණය නම් සිදුවන්නේය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**20. කායසුචරිතවිපාක සූත්‍රය.** "මහණෙනි යම්හෙයකින් කාය සුචරිතයාගේ අනිෂ්ටවූ, අප්‍රියවූ, අමනාපවූ, විපාකයක් උපදනේය යන මෙය හේතු රහිතයි ප්‍රත්‍යය රහිතයි. එවැනි කාරණයක් විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් විද්‍යමානවේ (එනම් යම්හෙයකින් කාය සුචරිතයාගේ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, විපාකයක් උපදනේය යන මේ කාරණය නම් විද්‍යමානවේ."

**21. වචීසුචරිතවිපාක සූත්‍රය** "මහණෙනි, යම්හෙයකින් වචී (වචන) සුචරිතයාගේ අනිෂ්ටවූ අප්‍රියවූ, අමනාපවූ විපාකයක් උපදනේය යන මෙය හේතු රහිතයි ප්‍රත්‍යය රහිතයි. එවැනි කාරණයක් විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් විද්‍යමානවේ (එනම්) යම්හෙයකින් වචී (වචන) සුචරිතයාගේ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ විපාකයක් උපදනේය යන මේ කාරණය නම් විද්‍යමානවේ"

**22. මනොසුචරිත විපාක සූත්‍රය.** "මහණෙනි, යම් හෙයකින් මනෝ (හිතේ) සුචරිතයාගේ අනිෂ්ටවූ, අප්‍රියවූ අමනාපවූ විපාකයක් උපදනේය යන මෙය හේතු රහිතයි ප්‍රත්‍යය රහිතයි එවැනි කාරණයක් විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් විද්‍යමානවේ. (එනම්) යම්හෙයකින් මනෝ (හිතේ) සුචරිතයාගේ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ විපාකයක් උපදනේය යන මේ කාරණය නම් විද්‍යමානවේ."

**23. කායදුච්චරිතසමංගී සූත්‍රය.** "මහණෙනි, යම් හෙයකින් කායදුශ්චරිතයෙන් යුත් පුද්ගලතෙම එය හේතුකොටගෙන, එය ප්‍රත්‍යයකොට ගෙන ශරීරය බිඳී යාමෙන් පසු මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලෝකයෙහි උපදින්නේය යන මෙය හේතුරහිතයි ප්‍රත්‍යය රහිතයි. එවැනි කාරණයක් විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් දක්නට ලැබේ. (එනම්) යම්හෙයකින් කායදුශ්චරිතයෙන් යුත් පුද්ගල තෙම එය හේතුකොටගෙන, එය ප්‍රත්‍යය කොටගෙන, ශරීරයාගේ භේදයෙන් පසු මරණින් මත්තෙහි සැපයෙන් තොරවූ නපුරු

ගති ඇති විකාරව වැටෙන්නාවූ නරකයෙහි උපදින්නේය යන මේ කාරණයනම් විද්‍යමානවේ."

**24. වචීදුච්චරිතසමංගී සූත්‍රය.** "මහණෙනි, යම් හෙයකින් වචී (වචන) දුශ්චරිතයෙන් යුත් පුද්ගලතෙම එය හේතුකොටගෙන, එය ප්‍රත්‍යයකොටගෙන ශරීරය බිඳීයාමෙන් පසු මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලෝකයෙහි උපදින්නේය යන මෙය හේතුරහිතයි ප්‍රත්‍යය රහිතයි. එවැනි කාරණයක් විද්‍යමාන නොවේ. මහණෙනි, මේ කාරණය නම් දක්නට ලැබේ (එනම්) යම්හෙයකින් වචී (වචන) දුශ්චරිතයෙන් යුත් පුද්ගලතෙම එය හේතුකොටගෙන, එය ප්‍රත්‍යයකොටගෙන, ශරීරයාගේ භෙදයෙන් පසු මරණින් මත්තෙහි සැපයෙන් තොරවූ නපුරු ගති ඇති, විකාරව වැටෙන්නාවූ නරකයෙහි උපදින්නේය යන මේ කාරණය නම් විද්‍යමාන වේ."

**25. මනොදුච්චරිතසමංගී සූත්‍රය.** "මහණෙනි, යම් හෙයකින් මනෝ (හිතේ) දුශ්චරිතයෙන් යුත් පුද්ගලතෙම එය හේතුකොටගෙන, එය ප්‍රත්‍යය කොටගෙන ශරීරය බිඳීයාමෙන් පසු මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයෙහි උපදින්නේය යන මෙය හේතු රහිතයි ප්‍රත්‍යය රහිතයි. එවැනි කාරණයක් විද්‍යමාන නොවේ මහණෙනි, මේ කාරණය නම් දක්නට ලැබේ (එනම්) යම්හෙයකින් මනෝ (හිතේ) දුශ්චරිතයෙන් යුත් පුද්ගල තෙම එය හේතුකොට ගෙන, එය ප්‍රත්‍යය කොටගෙන ශරීරයාගේ භෙදයෙන් පසු මරණින් මත්තෙහි සැපයෙන් තොරවූ නපුරු ගතිඇති, විකාරව වැටෙන්නාවූ නරකයෙහි උපදින්නේය යන මේ කාරණය නම් විද්‍යමාන වේ."

**26. කායසුචරිතසමංගී සූත්‍රය-** "මහණෙනි, යම් හෙයකින් කාය සුචරිතයෙන් යුක්තවූ පුද්ගල තෙම එය මූලකාරණා (හේතු) කොටගෙන, එය ප්‍රත්‍යය කොටගෙන ශරීරයාගේ භෙදයෙන් පසු මරණින් මත්තෙහි සැපයෙන් පහවූ, දුර්ගති ඇති, විකාරව වැටෙන්නාවූ නරකයෙහි උපදින්නේය යන මේ කාරණය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි දක්නට නැත. මහණෙනි, මේ කාරණය

නම් දක්නට ලැබේ (එනම්) මහණෙනි, යම් හෙයකින් කාය සුචරිතයෙන් යුක්තවූ පුද්ගල තෙම එය හේතුකොට ගෙන, එය ප්‍රත්‍ය කොටගෙන, ශරීරයාගේ භෙදයෙන් පසු මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලෝකයෙහි උපදින්නේය යන මේ කාරණය නම් විද්‍යමානවේ”

**27. වචීසුචරිතසමංගී සූත්‍රය**- ‘මහණෙනි, යම්හෙයකින් වචී (වචන) සුචරිතයෙන් යුක්තවූ පුද්ගලතෙම එය මූලකාරණා (හේතු) කොටගෙන, එය ප්‍රත්‍යය කොටගෙන ශරීරයාගේ භෙදයෙන් පසු මරණින් මත්තෙහි සැපයෙන් පහවූ, දුර්ගති ඇති, විකාරව වැටෙන්නාවූ නරකයෙහි උපදින්නේය යන මේ කාරණය හේතු රහිතයි. ප්‍රත්‍යය රහිතයි. දක්නට නැත. මහණෙනි, මේ කාරණය නම් දක්නට ලැබේ. (එනම්) මහණෙනි, යම්හෙයකින් වචී (වචන) සුචරිතයෙන් යුක්තවූ පුද්ගලතෙම එය හේතුකොටගෙන, එය ප්‍රත්‍යය කොට ගෙන ශරීරයාගේ භෙදයෙන් පසු මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලොකයෙහි උපදින්නේය යන මේ කාරණය නම් විද්‍යමානවේ.”

**28. මනොසුචරිතසමංගී සූත්‍රය**- “මහණෙනි, යම් හෙයකින් මනො (හිතේ) සුචරිතයෙන් යුක්තවූ පුද්ගලතෙම එය හේතුකොටගෙන, එය ප්‍රත්‍යයකොට ගෙන ශරීරයාගේ භේදයෙන් පසු මරණින් මත්තෙහි සැපයෙන් පහවූ, දුර්ගති ඇති, විකාරව වැටෙන්නාවූ නරකයෙහි උපදින්නේය. යන මෙය හේතුරහිතයයි. ප්‍රත්‍යය රහිතයි. මේ කාරණය නම් විද්‍යමානවේ (එනම්) යම්හෙයකින් මනොසුචරිතයෙන් යුක්තවූ පුද්ගලතෙම එය හේතුකොටගෙන එය ප්‍රත්‍යයකොට ගෙන ශරීරයාගේ භෙදයෙන් පසු, මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලෝකයෙහි උපදින්නේය යන මේ කාරණය නම් විද්‍යමානවේ.”

**අට්ඨාන වර්ගය නිමි.**

---

# 17. එකධර්ම වර්ගය.

**1. බුද්ධානුස්සති සූත්‍රය:-** "මහණෙනි, එක් ධර්මයක් වඩන ලද්දේ, නැවත නැවත පුරුදුකරන ලද්දේ ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිස සසර නොඇලීම පිණිස, රාගාදීන්ගේ නැතිවීම පිණිස, ක්ලේශයන්ගේ සංසිඳීම පිණිස විශිෂ්ට ඥානය පිණිස, චතුරාර්‍ය්‍යසත්‍යය අවබෝධය පිණිස, නිර්වාණය අත්පත් කිරීම පිණිස පවතී.

2. "කවර නම් එකම ධර්මයක්ද? බුද්ධානුස්මෘතිය (බුදුගුණ සිහිකිරීම) යි.

3. "මහණෙනි, මේ එකම ධර්මය වඩනලද්දේ, බහුල වශයෙන් (පුරුදු) කරන ලද්දේ, ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිස, සසර නොඇලීම පිණිස, රාගාදීන්ගේ නැතිවීම පිණිස, ක්ලෙශයන්ගේ සංසිඳීම පිණිස, විශිෂ්ට ඥානය පිණිස චතුරාර්‍ය්‍යසත්‍ය අවබෝධය පිණිස, නිර්වාණය අත්පත් කිරීම පිණිස පවතී"

2-10. (මේ වර්ගයේ 2-10 සූත්‍රවල 1. 3. ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1. 3. ඡේද මෙන් වෙත්.)

**2. ධම්මානුස්සති සූත්‍රය:-** කවරනම් එකම ධර්මයක්ද? ධර්මානුස්මෘතියයි

**3. සංඝානුස්සති සූත්‍රය:-** කවරනම් එකම ධර්මයක්ද? සංඝානුස්මෘතියයි.

**4. සීලානුස්සති සූත්‍රය:-** කවරනම් එකම ධර්මයක්ද? සීලානුස්මෘතියයි (ශීලයෙහි ගුණ සිහිකිරීමයි)

**5. චාගානුස්සති සූත්‍රය:-** කවරනම් එකම ධර්මයක්ද? දීමෙහි ගුණ සිහිකිරීමයි.

**6. දෙවතානුස්සති සූත්‍රය:-** කවරනම් එකම ධර්මයක්ද? දෙවියන් සාක්ෂිකොට ගුණධර්ම සිහිකිරීමයි

**7. ආනාපානසති සූත්‍රය:-** කවරනම් එකම ධර්මයක්ද? ආශ්වාස ප්‍රශ්වාස නිමිතිකොට ඇති සිහියයි.

**8. මරණසති සූත්‍රය**:- කවරනම් එකම ධර්මයක්ද? මරණය ගැන සිහිකිරීමයි.

**9. කායගතාසති සූත්‍රය**:- කවරනම් එකම ධර්මයක්ද? ශරීරයේ පිළිකුල් බව ගැන සිහිකිරීමයි.

**10. උපසමානුස්සති සූත්‍රය**:- කවරනම් එකම ධර්මයක්ද? දුක් සංසිඳීම අරමුණුකොට ඇති සිහියයි.

ප්‍රථම වර්ගයයි.

---

## 18. බීජ වර්ගය.

**1. පඨම මිච්ඡාදිට්ඨි සූත්‍රය**:- "මහණෙනි, යම් මිථ්‍යා දෘෂ්ටියක් (වැරදි දැකීමක්) කරණකොටගෙන නූපන්නාවූ අකුශල ධර්මයෝත් උපදිද්ද. උපන්නාවූ අකුශල ධර්මයන්ගේත් වැඩීම හා විශාලවීම ඇතිවේද,

2. මහණෙනි, ඒ බඳුවූ අන්‍ය එක ස්වභාවයකුදු මම නොමදකිමි.

3. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයාහට පෙර නූපන්නාවූ අකුශල ධර්මයෝත් උපදිත්. උපන්නාවූ අකුශල ධර්මයෝත් වැඩීමට හා විශාලත්වයට පැමිණෙත්."

(මේ වර්ගයේ 2-8 සූත්‍රවල 2 ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි)

**2. පඨමසම්මාදිට්ඨි සූත්‍රය**:- 1. "මහණෙනි, යම් සම්‍යක් දෘෂ්ටියක් නිවැරදිසේ දැනීමක් කරනකොටගෙන නූපන්නාවූ කුශලධර්මයෝත් උපදිද්ද. උපන්නාවූ කුශලධර්මයෝත් වැඩීමට හා විශාලත්වයට පැමිණෙත්ද,

3. "මහණෙනි, සම්‍යක්දෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයාහට පෙර නූපන්නාවූ කුශලධර්මයෝත් උපදිත්. උපන්නාවූ කුශල ධර්මයෝත් වැඩීමට හා විශාලත්වයට පැමිණෙත්."

**3. දුතිය මිච්ඡාදිට්ඨි සූත්‍රයː-** 1. "මහණෙනි, යම් මිථ්‍යා දෘෂ්ටියක් කරණකොටගෙන පෙර නූපන් කුශලධර්මයෝත් නූපදිද්ද, උපන් කුශලධර්මයෝත් පිරිහෙත්ද?

3. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයාහට පෙර නූපන් කුශලධර්මයෝත් නූපදිත්. උපන් අකුශල ධර්මයෝත් පිරිහෙත්."

**4. දුතිය සම්මාදිට්ඨි සූත්‍රයː-** 1. "මහණෙනි, යම් සම්‍යක් දෘෂ්ටියක් කරණකොටගෙන පෙර නූපන් අකුශලධර්මයෝත් නූපදිද්ද, උපන්නාවූ අකුශල ධර්මයෝත් පිරිහෙත්ද,

3. "මහණෙනි, සම්‍යක්දෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයාහට පෙර නූපන් අකුශල ධර්මයෝත් නූපදිත්. උපන් අකුශල ධර්මයෝත් පිරිහෙත්.

**5. අයොනිසොමනසිකාර සූත්‍රයː-** 1. "මහණෙනි, යම් වැරදිසේ මෙනෙහි කිරීමක් කරණකොටගෙන පෙර නූපන් වැරදි දැකීම උපදීද, උපන් මිථ්‍යාදෘෂ්ටිය මහත්සේ වැඩේද,

3. "මහණෙනි, වැරදිසේ මෙනෙහි කරන්නාහට පෙර නූපන්නාවූ මිථ්‍යාදෘෂ්ටියත් උපදී, උපන්නාවූ මිථ්‍යාදෘෂ්ටියත් මහත්සේ වැඩේ."

**6. යොනිසොමනසිකාර සූත්‍රයː-** 1. "මහණෙනි, යම් නුවණින් මෙනෙහි කිරීමක් කරණකොටගෙන පෙර නූපන් සම්‍යක්දෘෂ්ටියත් උපදීද, උපන් සම්‍යක්දෘෂ්ටියත් වැඩේද,

3. "මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාහට පෙර නූපන් සම්‍යග්දෘෂ්ටියත් උපදී, උපන් සම්‍යග්දෘෂ්ටියත් මහත් සේ වැඩේ."

**7. නිරයුප්පත්ති සූත්‍රයː-** 1. "මහණෙනි, යම් මිථ්‍යා දෘෂ්ටියක් (වැරදි දැකීමක්) නිසා සත්වයෝ ශරීරය බිඳීයාමෙන් පසු මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති විකාරව වැටෙන්නාවූ නරකයෙහි උපදිත්ද,

3. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූ සත්වයෝ ශරීරය බිඳීමෙන් පසු මරණින් මත්තෙහි අපාය නම්වූ, දුගති නම් වූ විකාරව වැටෙන විනිපාත නම් වූ නරකයෙහි උපදිත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**8. සග්ගුප්පත්ති සූත්‍රය:-** 1. "මහණෙනි, යම් සම්‍යක් දෘෂ්ටියක් (යහපත් දැකීමක්) නිසා සත්වයෝ ශරීරය බිඳීමෙන් පසු මරණින් මත්තෙහි සුගති නම්වූ, ස්වර්ග ලෝකයෙහි උපදිත්ද,

3. "මහණෙනි, සම්‍යග්දෘෂ්ටියෙන් යුක්තවූ සත්ත්වයෝ ශරීරය බිඳීමෙන් පසු මරණින් මත්තෙහි සුගති නම් වූ ස්වර්ග ලෝකයෙහි උපදිත්."

**9. පාපකබීජ සූත්‍රය:-** "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත වූ පුරුෂ පුද්ගලයා විසින් යම්බඳුවූ කායකර්මයක් තමාගේ දෘෂ්ටියට එකඟවනසේ සම්පූර්ණ කරණු ලැබේද, මනාකොට ගන්නා ලැබේද, යම්බඳුවූ වාග්කර්මයක් තමාගේ දෘෂ්ටියට එකඟවනසේ සම්පූර්ණකරණු ලැබේද, මනාකොට ගන්නාලැබේද, යම්බඳුවූ මනඃකර්මයක් ස්වකීය දෘෂ්ටිය වූ පරිද්දෙන්ම සම්පූර්ණ කරණු ලැබේද, මනාකොට ගන්නා ලැබේද යම්බඳුවූ චෙතනාවක් තමාගේ දෘෂ්ටිය එකඟ වනසේ සම්පූර්ණ කරණු ලැබේද, මනාකොට ගන්නා ලැබේද, යම්බඳුවූ ප්‍රාර්ථනාවක් තමාගේ දෘෂ්ටියට එකඟ වනසේ සම්පූර්ණ කරණු ලැබේද, මනාකොට ගන්නා ලැබේද, යම්බඳුවූ අධිෂ්ඨානයක් තමාගේදෘෂ්ටියට එකඟවන සේ සම්පූර්ණකරණු ලැබේද, මනාකොට ගන්නාලැබේද, යම්බඳුවූ (එස්සාදි) සංස්කාරයක් දෘෂ්ටියවූ පරිදි සම්පූර්ණ කරණු ලැබේද, සමාදන්වනු ලැබේද, ඒ සියලු ධර්මයෝ අයහපත පිණිස, නොකැමැති බැව් පිණිස, අමනාපය පිණිස අවැඩ පිණීස දුක් පිණිස පවතිත්. ඊට හේතු කවරේද? මහණෙනි යම්හෙයකින් දෘෂ්ටිය ලාමක වේද (එහෙයිනි).

2. 'මහණෙනි, කොසඹ ඇටයක් හෝ තිත්ත වැටකොලු ඇටයක් හෝ තිත්ත ලබු ඇටයක් හෝ තෙත් වූ පොළවෙහි සිටවන ලද්දේ, යම්බඳුවූ පෘථිවි රසයකුත් ඇදගණීද, යම්බඳු ආපෝ රසයකුත් ඇදගණීද, ඒ සියලු රසය තිත්තභාවය පිණිස කටුකභාවය පිණීස, අමධුර භාවය පිණිස පවතී. ඊට හේතු කවරේද? මහණෙනි, බීජය (ඇටය) ලාමක වේද එහෙයිනි.

3. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යොදාගතයුතුයි.

**10. භද්දකබීජ සූත්‍රය**- "මහණෙනි, සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තවූ පුරුෂ පුද්ගලයා විසින් යම්බඳුවූ කායකර්මයක් දෘෂ්ටියට එකඟවන පරිද්දෙන් සම්පූර්ණකරනු ලැබේද, මනාකොට ගන්නා ලැබේද, යම්බඳුවූ වාක්කර්මයක් දෘෂ්ටියට එකඟවන පරිද්දෙන් සම්පූර්ණ කරනු ලැබේද, මනාකොට ගන්නා ලැබේද, යම්බඳුවූ මනඃකර්මයක් දෘෂ්ටියවූ පරිද්දෙන් සම්පූර්ණකරණු ලැබේද, මනාකොට ගන්නා ලැබේද, යම්බඳුවූ චේතනාවක් දෘෂ්ටියට එකඟවන පරිද්දෙන් සම්පූර්ණ කරනු ලැබේද, මනාකොට ගන්නා ලැබේද යම්බඳු ප්‍රාර්ථනාවක් දෘෂ්ටියට එකඟවන පරිද්දෙන් සම්පූර්ණකරණු ලැබේද, මනාකොට ගන්නා ලැබේද, යම්බඳු අධිෂ්ඨානයක් දෘෂ්ටියට එකඟවන පරිද්දෙන් සම්පූර්ණකරනු ලැබේද, මනාකොට ගන්නා ලැබේද යම්බඳු සංස්කාරයක් දෘෂ්ටියවූ පරිද්දෙන් සම්පූර්ණකරණු ලැබේද, සමාදන්වනු ලැබේද, ඒ සියලු ධර්මයෝ යහපත පිණිස කැමැතිබව පිණිස මනාපය පිණිස හිත පිණිස සැප පිණිස පවතිත්. ඊට හේතු කවරේද? මහණෙනි යම්හෙයකින් දෘෂ්ටිය යහපත් වේද (එහෙයිනි)

2. මහණෙනි යම්සේ වනාහි උක් (බීජයක්) කරටියක් හෝ ඇල්වී බීජයක් හෝ මිදි බීජයක් හෝ තෙත්වූ පොළොවෙහි සිටවන ලද්දේ යම් පෘථුවි රසයකුත් ඇදගණීද යම් අපෝරසයකුත් ඇදගණීද, ඒ සියල්ල මිහිරි බැව් පිණිස රස බැව් පිණිස හාත්පසින් රස වැගිරීම පිණිස පවතී.

ඊට හේතු කවරේද? මහණෙනි බීජය යහපත් හෙයිනි.

3. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යොදාගතයුතුයි.)

දෙවෙනි වර්ගයයි.

---

## 19. මක්ඛලී වර්ගය

**1. මිච්ඡාදිට්ඨි සූත්‍රය**:- "මහණෙනි, ලොකයෙහි උපදනාවූ එකම පුද්ගලයෙක් බොහෝ දෙනාට අයහපත පිණිස, බොහෝ

දෙනාට නොසැප පිණිස, බොහෝ ජනයාට අනර්ථය පිණිස, දෙව් මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස උපදී.

"කවර නම් එකම පුද්ගලයෙක්ද?

2. "විපරීත දර්ශන ඇති මිථ්‍යාදෘෂ්ටික තැනැත්තේය. හෙතෙම මහාජනයා දශ කුශලකර්මපථ නම් සද්ධර්මයෙන්) උදුරා දශ අකුශලකර්මපථ නම් අසද්ධර්මයෙහි පිහිටුවයි.

3. "මහණෙනි, මේ එකම පුද්ගල තෙම ලොව උපදින්නේ බොහෝ දෙනාට අහිත පිණිස, බොහෝ දෙනාට නොසැප පිණිස, බොහෝ දෙනාට අනර්ථය පිණිස, දෙව් මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස උපදී.

2. **සම්මාදිට්ඨි සූත්‍රය:-** "මහණෙනි, ලොව උපදනාවූ එකම පුද්ගලයෙක් බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස බොහෝ ජනයාට අර්ථය පිණිස, දෙව් මිනිසුන්ට හිත පිණිස, සැප පිණිස උපදී.

"කවර නම් එකම පුද්ගලයෙක්ද?

2. "විපරීත දර්ශන නැති සම්‍යග්දෘෂ්ටික තැනැත්තේය. හෙතෙම මහාජනයා දශ අකුශලකර්මපථ නම් අසද්ධර්මයෙන් උදුරා, දශකුශලකර්මපථ නම් සද්ධර්මයෙහි පිහිටුවයි.

3. "මහණෙනි, මේ එකම පුද්ගල තෙම ලොව උපදින්නේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස බොහෝ ජනයාට අර්ථය පිණිස, දෙව්මිනිසුන්ට හිත පිණිස, සැප පිණිස උපදී.

3. **මහාසාවජ්ජ සූත්‍රය:-** "මහණෙනි, යම්සේ මිථ්‍යාදෘෂ්ටිය මහත් වරද සහිත වේද,

2. "මහණෙනි, මේ බඳුවූ අනික් එක ස්වභාවයකුදු මම නොම දකිමි.

3. "මහණෙනි, මහත් දොෂයන් අතරෙන් මිථ්‍යාදෘෂ්ටිය ඉතා මහත් දොෂ ඇත්තීය."

4. **මක්ඛලී සූත්‍රය**:- "මහණෙනි, යම්සේ මක්ඛලී නම් තුච්ඡ පුරුෂයා බොහෝ දෙනාට අහිත පිණිස, බොහෝ දෙනාට නොසැප පිණිස, බොහෝ ජනයාට අනර්ථය පිණිස, දෙව්මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස පිළිපන්නේ වේද, මහණෙනි, ඒ මේ බඳුවූ අනික් එක පුද්ගලයෙකුදු මම නොම දකිමි.

2. "මහණෙනි, යම්සේ ගංමුවදොරෙක්හි වූ කෙමනක් බොහෝ මත්ස්‍යයන්ට අහිත පිණිස දුක් පිණිස, අනර්ථය පිණිස, විනාශය පිණිස, අටවනු ලබන්නේ වේද, "මහණෙනි, එපරිද්දෙන්ම මක්ඛලී නම් තුච්ඡ පුරුෂයා බොහෝ සත්වයන්ට අහිත පිණිස, දුක් පිණිස, අනර්ථය පිණිස, විනාශය පිණිස මිනිස් කෙමනකැයි සිතමි."

5. **දුරක්ඛාත සූත්‍රය**:- "මහණෙනි, නපුරුකොට ප්‍රකාශ කරණ ලද්දාවූ ධර්මවිනය ඇති ශාසනයෙක්හි යම් පුද්ගලයෙක් (යම් ප්‍රතිපත්තියක්) සමාදන් කරවයිද, යම් අතවැසියකු ලවාත් සමාදන් කරවයිද, යම් ඒ අතවැසි තෙමේද සමාදන් කරවන ලද්දේ ඔහුගේ වචනය පිළිගෙන ඒ වචනය පිණිස පිළිපදීද, ඒ සියල්ලෝ බොහෝ අකුසල් රැස් කෙරෙත්. ඊට හේතු කවරේද? මහණෙනි, ඒ ධර්මය නපුරුකොට ප්‍රකාශ කරණ ලද හෙයිනි."

6. **ස්වක්ඛාත සූත්‍රය**:- "මහණෙනි, මනාකොට ප්‍රකාශ කරණලද ධර්මවිනය ඇති ශාසනයෙක්හි යම් පුද්ගලයෙක් (යම් ප්‍රතිපත්තියක්) සමාදන් කරවයිද, යම් අතවැසියකු ලවාත් සමාදන් කරවයිද, යම් ඒ අතවැසි තෙමේද සමාදන් කරවන ලද්දේ ඔහුගේ වචනය පිළිගෙන ඒ පිණිස පිළිපදීද, ඒ සියල්ලෝ බොහෝ කුසල් රැස් කෙරෙත්. ඊට හේතු කවරේද? මහණෙනි, ධර්මය මනාකොට ප්‍රකාශ කරණ ලද හෙයිනි."

7. **දායකෙනමත්තාජානිතබ්බ සූත්‍රය**- "මහණෙනි, වරදවා ප්‍රකාශ කරණ ලද්දාවූ ධර්මවිනය ඇති ශාසනයෙහි දායකයා විසින් (දෙන දෙයෙහි) පමණ දතයුතුයි (පිළිගන්නහු) විසින් දතයුතු නොවෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, ධර්මය (වරදවා) ප්‍රකාශ කරණලද හෙයිනි."

8. **පටිග්ගාහකෙන මත්තාජානිතබ්බ සූත්‍රය**:- "මහණෙනි, මනාකොට ප්‍රකාශකරණලද ධර්මවිනයඇති ශාසනයෙහි ප්‍රතිග්‍රාහකයා විසින් පමණ දතයුතුයි දායකයා විසින් දතයුතු නොවෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, ධර්මය මනාකොට ප්‍රකාශ කරණ ලද හෙයිනි."

9. **දුක්ඛවිහාරී සූත්‍රය**:- "මහණෙනි, වරදවා ප්‍රකාශ කරණලද ධර්මවිනය ඇති ශාසනයෙහි යම් පුද්ගලයෙක් පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තේ වේද, හෙතෙම දුකින් වෙසෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, ධර්මය වරදවා ප්‍රකාශ කරණ ලද හෙයිනි."

10. **කුසීතදුක්ඛවිහරණ සූත්‍රය**:- "මහණෙනි, මනාකොට ප්‍රකාශ කරණලද ධර්මවිනය ඇති ශාසනයෙක්හි යම් පුද්ගලයෙක් කුසීත වේද, හෙතෙම දුකින් වෙසෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, ධර්මය මනා කොට ප්‍රකාශ කරණ ලද හෙයිනි."

11. **කුසීතසුඛවිහරණ සූත්‍රය**:- "මහණෙනි, වරදවා ප්‍රකාශ කරණලද ධර්මවිනය ඇති ශාසනයෙක්හි යම් පුද්ගලයෙක් කුසීත වේද, හෙතෙම සැපසේ වාසය කරයි. ඊට හේතු කවරේද? මහණෙනි, ධර්මය වරදවා ප්‍රකාශ කරණ ලද හෙයිනි."

12. **ආරද්ධවිරිය සූත්‍රය**:- "මහණෙනි, මනාකොට ප්‍රකාශ කරණලද ධර්මවිනය ඇති ශාසනයෙක්හි යම් පුද්ගලයෙක් පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තේ වේද, හෙතෙම සැපසේ වාසය කරයි. ඊට හේතු කවරේද? මහණෙනි, ධර්මය මනාකොට ප්‍රකාශ කරණලද හෙයිනි."

13. **ගූථොපම සූත්‍රය**:- "මහණෙනි, යම්සේ ස්වල්ප මාත්‍රවූ අසුචිය වුවද දුගඳ වේද,

2. "මහණෙනි, එපරිද්දෙන්ම ස්වල්පමාත්‍රයකුදු භවයෙහි ඉපදීම වර්ණනා නොකරමි."

[14-17 සූත්‍රවල 2 ඡේදය මේ වර්ගයේ 13 සූත්‍රයේ 2 ඡේදය මෙනි.]

14 **මුත්තොපම සූත්‍රය**- "මහණෙනි, යම්සේ ස්වල්ප මාත්‍ර මූත්‍රය වුවද දුගඳ වේද,

15. **බෙලොපම සූත්‍රය**- "මහණෙනි, යම්සේ ස්වල්පමාත්‍ර කෙල වුවද දුගඳ වේද,

16. **පුබ්බොපම සූත්‍රය**- "මහණෙනි, යම්සේ ස්වල්පමාත්‍ර සැරව වුවද දුගඳ වේද,

17. **ලොහිතොපම සූත්‍රය**- "මහණෙනි, යම්සේ ස්වල්පමාත්‍ර ලේ වුවද දුගඳ වේද,

**(තුන්වෙනි වර්ගය නිමි.)**

---

## 20. අප්පමත්තක වර්ගය.

1. **ඵලජාප්පක සූත්‍රයඃ**- 1. "මහණෙනි, යම්සේ මේ ජම්බුද්වීපයෙහි ආරාමයන්ගෙන් සිත්කළු තැන්ද, වනයන්ගෙන් සිත්කළු තැන්ද, භූමිප්‍රදෙශයන්ගෙන් සිත්කළු තැන්ද පොකුණුවලින් යුත් සිත්කළු තැන්ද, ස්වල්පමාත්‍ර වේද, එතකුදු වුවත් යම් ඒ උස්මිටි තැන්ද, ගංගා නිසා පහසුවෙන් නොපැමිණියහැකි තැන්ද, කණු කටු පිහිටි තැන්ද, පර්වතයන් ගෙන් විෂමවූ ස්ථානද යන මේ ස්ථානයෝම ඉතා බොහෝ වෙත්ද?

2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් ගොඩ උපන්නෝ වෙත්ද, ඒ සත්වයෝ ස්වල්පවෙත්. වැලිදු යම් සත්ව කෙනෙක් දියෙහි උපන්නෝ වෙත්ද, මේ සත්වයෝම ඉතා බොහෝ වෙත්.

3. "මහණෙනි, එහෙයින් මේ පිළිබඳව මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) අර්ථරසය (චතුර්විධ ශ්‍රාමණ්‍ය ඵලය) ද ධර්මරසය (චතුර්විධ මාර්ගය) ද, විමුක්තිරසය (නිර්වාණය) ද ලබන්නෝ වන්නෙමුයි' කියායි. මහණෙනි, තොප විසින් මෙසේම හික්මිය යුතුයි.

(2-15 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ ඡෙද මෙන් වෙති.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2. අඤ්ඤත්‍ර මනුස්ස සූත්‍රය:-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් මනුෂ්‍යයන් විෂයෙහි උපදිත්ද, ඒ සත්වයෝ ස්වල්ප වෙත්. යලිදු යම් සත්වකෙනෙක් මනුෂ්‍යයන් ගෙන් වෙන්ව උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

**3. පච්චන්තිමජාත සූත්‍රය:-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් මධ්‍යජනපදයන්හි (දඹදිව මධ්‍ය දෙශයෙහි) උපදිත්ද, ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේද වුවත් යම් සත්වකෙනෙක් අප්‍රකටවූ මිලෙච්ඡයන් අතර ප්‍රත්‍යන්ත ජනපදයන්හි උපදිත්ද, මේ සත්වයෝම ඉතා බොහෝ වෙත්.

**4. දුප්පඤ්ඤ සූත්‍රය:-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් ප්‍රඥාව ඇත්තාහු වෙත්ද, මුළානොවූවාහු වෙත්ද, කෙළතොළු නොවූවාහු වෙත්ද, යහපත් අයහපත් ප්‍රකාශයන්හි අර්ථයන් දැනගැනීමට සමර්ථවූවාහු වෙත්ද ඒ සත්වයෝ ස්වල්ප වෙත්. වැලිදු යම් සත්වකෙනෙක් ප්‍රඥා නැත්තාහු වෙත්ද, (මෝහයෙන් මුළාවූයේ වෙත්ද, කෙලතොල්ලෝවෙත්ද, සුභාෂිත දුර්භාෂිතයන්හි අර්ථයන් දැනගැනීමට අසමර්ථ වූවාහු වෙත්ද, මේ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

**5. අවිජ්ජාගත සූත්‍රය:-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් ආර්‍යයන්ට ඇති ප්‍රඥා චක්ෂුසින් යුක්ත වූවාහු වෙත්ද, ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් අවිද්‍යාන්ධකාරයෙන් යුක්තවූවාහු අතිශයින් මුළා වූවාහු වෙත්ද, මේ සත්වයෝම ඉතා බොහෝ වෙත්.

**6. තථාගත දස්සන සූත්‍රය:-** 2. "මහණෙනි, එසේම යම් සත්වකෙනෙක් තථාගතයන් වහන්සේ දක්නට ලබත්ද ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේ නමුදු යම් සත්වකෙනෙක් තථාගතයන් වහන්සේ දක්නට නොලබත්ද මේ සත්වයෝම ඉතා බොහෝ වෙත්.

**7. ධම්මසවණ සූත්‍රය:-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම සම් සත්වකෙනෙක් තථාගතයන් වහන්සේ විසින් දෙසනලද ධර්මවිනය ශ්‍රවණය කරන්ට ලබත්ද ඒ සත්වයෝ ස්වල්පවෙත් වැලිදු යම් සත්වකෙනෙක් තථාගතයන් වහන්සේ විසින් දෙසන

ලද ධර්මවිනය ශ්‍රවණයට නොලබත්ද, මේ සත්වයෝම ඉතා බොහෝ වෙත්.

8. **ධම්මධාරණ සූත්‍රය:-** 2 "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් ධර්මය අසා (සිතෙහි) දරත්ද ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේ නමුදු යම් සත්වකෙනෙක් ධර්මය අසා සිතෙහි නොරදත්ද මේ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

9. **අත්ථුපපරික්ඛා සූත්‍රය:-** 2. මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් ධාරණය කරණලද්දාවූ ධර්මයන්ගේ අර්ථය පරීක්ෂා කෙරෙත්ද, ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේ නමුදු යම් සත්ව කෙනෙක් ධාරණය කරනලද්දාවූ ධර්මයන්ගේ අර්ථය පරීක්ෂා නොකෙරෙත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

10. **ධම්මානුධම්ම සූත්‍රය:-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් අර්ථය දැන, ධර්මය දැන, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපදිත්ද, ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේ නමුදු යම් සත්වකෙනෙක් අර්ථයනොදැන, ධර්මයනොදැන ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිනොපදිත්ද, මේ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

11. **සංවෙජනීයට්ඨාන සූත්‍රය:-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් කලකිරියයුතු කාරණයන්හි කලකිරෙත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් සංවෙග කටයුතු කාරණයන්හි සංවෙග නූපදවත්ද, මේ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

12. **සංවිග්ගප්පදහන සූත්‍රය:-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්ව කෙනෙක් සංවේගයට පැමිණියාහු නුවණින් (සම්‍යක් ප්‍රධාන) වීර්‍ය්‍යය කෙරෙත්ද, ඒ සත්වයෝ ස්වල්පවෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් සංවේගයට පැමිණියාහු (කළකිරුණාහු) නුවණින් (සම්‍යක්ප්‍රධාන) වීර්‍ය්‍යය නොකෙරෙත්ද, මේ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

13. **වවස්සග්ගාරම්මණ සූත්‍රය:-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් නිර්වාණය අරමුණුකොට චිත්තය

සම්බන්ධවූ සමාධිය ලබත්ද, චිත්තය සම්බන්ධවූ එකග බව ලබත්ද, ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේ නමුත් යම් සත්ව කෙනෙක් නිර්වානය අරමුණුකොට සිතේ සමාධිය නොලබත්ද, සිතේ එකඟබව නොලබත්ද, මේ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

**14. අන්නග්ගරසග්ගලාභී සූත්‍රයː-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් උතුම් ආහාර හා උතුම් රසයන් ලැබීම් ඇත්තෝ වෙත්ද, ඒ සත්වයෝ ස්වල්පවෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් උතුම් ආහාර හා උතුම් රසයන් නොලබන්නාහු උඤ්ඡාචරිය යයි කියනලද වන මුල ඵලයෙන් හෝ කබලක් ගෙන සිඟා ලත් දෙයින් හෝ යැපෙත්ද, මේ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

**15. රසස්සලාභී සූත්‍රයː-** 2. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් අර්ථරසය (හෙවත් සෝවාන්ඵලය ආදී චතුර්විධ ශ්‍රාමණ්‍යඵලය) ද, ධර්ම රසය (හෙවත් සතරමග) ද, විමුක්ති රසය (හෙවත් නිර්වාණය) ද ලබන්නහු වෙත්ද, ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේ නමුත් අර්ථරසයද, ධර්ම රසයද, විමුක්ති රසයද නොලබන්නාහු වෙත්ද, මේ සත්වයෝම ඉතා බොහෝ වෙත්.

3 "මහණෙනි, එහෙයින් මේ පිළිබඳව මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) අර්ථරසය (චතුර්විධ ශ්‍රාමණ්‍යඵලය) ද, ධර්මරසය (චතුර්විධ මාර්ගය) ද, විමුක්ති රසය (නිර්වාණය) ද, ලබන්නෝ වන්නෙමුයි' කියායි. මහණෙනි, තොප විසින් මෙසේම හික්මිය යුතුයි.

**16. මනුස්ස මනුස්සුප්පත්ති සූත්‍රයː-** "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් මනුෂ්‍ය යොනියෙන් චුත වූවාහු මනුෂ්‍යයන් අතුරෙහි නැවත උපදිත්ද, ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් මනුෂ්‍යයෝනියෙන් චුතවූවාහු නරකයෙහි උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්."

**17. මනුස්ස දෙවුප්පත්ති සූත්‍රයː-** "යම් සත්ව කෙනෙක් මනුෂ්‍ය යෝනියෙන් චුතවූවාහු දෙවියන් විෂයෙහි උපදිද්ද ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එසේ නමුත් යම් සත්ව කෙනෙක්

තිරිසන්යෝනියෙහි උපදිත්ද, ප්‍රෙත නිකායෙහි උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්"

**18. 2. දෙව දෙවුප්පත්ති සූත්‍රයඃ-** "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් මනුෂ්‍ය යෝනියෙන් චුතවූවාහු දෙවියන් විෂයෙහි උපදිත්ද, ඒ සත්වයෝ ස්වල්පවෙත්. එසේ නමුත් යම් සත්ව කෙනෙක් මනුෂ්‍යයෝනියෙන් චුත වූවාහු නරකයෙහි උපදිත්ද මේ සත්වයෝම ඉතා බොහෝ වෙත්. තිරිසන් යෝනියෙහි උපදිත්ද, ප්‍රෙත විෂය (ලොක) යෙහි උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්."

**19. 2. දෙව මනුසුප්පත්ති සූත්‍රයඃ-** "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් දෙවයොනියෙන් චුතවූවාහු දෙව ලොකයෙහි උපදිත්ද ඒ සත්වයෝ ස්වල්පවෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් දෙවලෝකයෙන් චුත වූවාහු නරකයෙහි උපදිත්ද, ඒ සත්වයෝම ඉතා බොහෝ වෙත්. තිරිසන් යොනියෙහි උපදිත්ද, ප්‍රෙතවිෂයෙහි උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්.'

**20. දෙව මනුස්සුප්පති සූත්‍රයඃ- 2** "මහණෙනි, එපරිද්දෙන්ම යම්සත්වකෙනෙක් දෙවලොකයෙන් චුතවූවාහු මනුෂ්‍ය විෂයෙහි උපදිත්ද ඒ සත්වයෝ ස්වල්පවෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් දෙව ලොකයෙන් චුතවූවාහු නරකයෙහි උපදිත්ද ඒ සත්වයෝ ඉතා බොහෝවෙත්. තිරිසන් යෝනියෙහි උපදිත්ද, ප්‍රෙතවිෂයෙහි උපදිත්ද ඒ සත්වයෝම බොහෝ වෙත්."

**21. නිරය මනුස්සුප්පති සූත්‍රයඃ-** "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් නරකයෙන් චුතවූවාහු මනුෂ්‍ය ලොකයෙහි උපදිත්ද, ඒ සත්වයෝ ස්වල්පවෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් නරකයෙන් චුතවූවාහු නරකයෙහිම උපදිත්ද, ඒ සත්වයෝ බොහෝවෙත්. තිරිසන්යොනියෙහි උපදිත්ද ප්‍රෙත විෂයෙහි උපදිත්ද ඒ සත්වයෝම බොහෝ වෙත්."

**22. නිරයදෙවුප්පත්ති සූත්‍රයඃ-** "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් නරකයෙන් චුතවූවාහු දෙවලොකයෙහි උපදිත්ද ඒ සත්වයෝ ස්වල්පවෙත්. එසේ නමුත් යම්

සත්වකෙනෙක් නරකයෙන් චුතවූවාහු නරකයෙහිම උපදිත්ද ඒ සත්වයෝ ඉතා බොහෝවෙත්. තිරිසන් යොනියෙහි උපදිත්ද ප්‍රෙත විෂයෙහි උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්.”

**22. තිරච්ඡාන මනුස්සුප්පත්ති සූත්‍රය**:- “මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් තිරිසන් යොනියෙන් චුතවූවාහු මනුෂ්‍යලොකයෙහි උපදිත්ද, ඒ සත්වයෝ ස්වල්පවූවාහු වෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් තිරිසන් යොනියෙන් චුතවූවාහු නරකයෙහිම උපදිත්ද ඒ සත්වයෝ බොහෝවෙත්. තිරිසන් යෝනියෙහි උපදිත්ද ප්‍රෙත විෂයෙහි උපදිත්ද ඒ සත්වයෝම බොහෝ වෙත්.”

**23. තිරච්ඡාන දෙවුප්පත්ති සූත්‍රය**:- “මහණෙනි, එසේම යම් සත්වකෙනෙක් තිරිසන් යෝනියෙන් චුතවූවාහු දෙවලොකයෙහි උපදිත්ද ඒ සත්වයෝ ස්වල්ප වෙත්. එහෙත් තිරිසන් යෝනියෙන් සැව නිරයෙහි යම් සත්වකෙනෙක් උපදිත්ද තිරිසන් යෝනියෙහි උපදිත්ද ප්‍රෙත ලොකයෙහි උපදිත්ද ඔවුහුම බොහෝ වෙත්.”

**24. පෙතමනුස්සුප්පත්ති සූත්‍රය**:- “මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් ප්‍රෙත විෂයෙන් චුතවූවාහු මනුෂ්‍ය ලොකයෙහි උපදිත්ද’ ඒ සත්වයෝ ස්වල්පවූවාහු වෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් ප්‍රෙතවිෂයෙන් චුතවූවාහු නරකයෙහි උපදිත්ද, තිරිසන් යොනියෙහි උපදිත්ද, ප්‍රෙත විෂයෙහි උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්.”

**25. පෙත දෙවුප්පත්ති සූත්‍රය**:- “මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් ප්‍රෙතවිෂයෙන් චුතවූවාහු දෙවලොකයෙහි උපදිත්ද, ඒ සත්වයෝ ස්වල්වූවාහු වෙත්. එසේ නමුත් යම් සත්වකෙනෙක් ප්‍රෙතවිෂයෙන් චුතවූවාහු නරකයෙහිම උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්, තිරිසන් යොනියෙහි උපදිත්ද ප්‍රෙත විෂයෙහි උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්.”

**සතරවැනි වර්ගය නිමි.**

---

## 21. පසාදකරධර්ම වර්ගය

1. ආරඤ්ඤකත්ත සූත්‍රය- 1. "මහණෙනි, යම් මේ වනවාසික භාවයක් වේද, 2. මෙය ලාභයන් අතුරෙන් මෙය ඒකාන්ත ලාභයකි.' (මේ 2 ඡේදය 16 සූත්‍රය දක්වා එකතු කරන්න.)

2. පිණ්ඩපාති සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ පිණ්ඩපාතික භාවයක් වේද,

3. පංසුකූලික සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ පංසුකූලික භාවයක් වේද,

4. තෙචීවරිකත්ත සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ තෙචීවරික භාවයක් වේද,

5. ධම්මකථිකත්ත සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ ධර්ම කථික භාවයක් වේද,

6. විනයධරත්ත සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ විනයධර භාවයක් වේද,

7. බාහුසච්ච සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ බහුශ්‍රැත භාවයක් වේද,

8. ථාවරෙය්‍ය සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ ස්ථවිර භාවයක් වේද,

9. ආකප්පසම්පදා සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ (සිවුරු ගැනීම් ආදී යහපත්) ආකල්ප සම්පත්තියක් වේද,

10. පරිවාරසම්පදා සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ (යහපත්) පිරිවර ඇති බවක් වේද,

11. මහාපරිවාරතා සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ මහත් පිරිවර ඇති බවක් වේද,

12. කොලපුත්තියතා සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ කුලපුත්‍රභාවයක් වේද,

13. වණ්ණපොක්ඛරතා සූත්‍රයඃ- "මහණෙනි, යම් මේ වර්ණ (ශරීර) සෞන්දර්‍යයෙන් සමන්විතභාවයක් වේද.

**14. කලයාණ වාක්කරණතා සූත්‍රයඃ-** "මහණෙනි, යම් මේ (යහපත්) වචන ඇති බවක් වේද,

**15. අප්පිච්ඡතා සූත්‍රයඃ-** "මහණෙනි, යම් මේ අල්පෙච්ඡ භාවයක් වේද,

**16. අප්පාබාධතා සූත්‍රයඃ-** "මහණෙනි, යම් මේ නිරෝගි භාවයක් වේද, මෙය ලාභයන් අතුරෙන් ඒකාන්ත ලාභයයි"

---

## 22. එකධර්මද්ධ්‍යාන වර්ගය

**1. පඨමජ්ඣාන අච්ඡරාසංඝාතා සූත්‍රය-** 1. "මහණෙනි, ඉදින් මහණතෙම අසුර ගසන කලක් පමණවත්

2 "ප්‍රථමධ්‍යානය වඩාද?

3. "මහණෙනි මේ මහණතෙම හිස් නොවූ ධ්‍යාන ඇතිව වාසය කරයි. හෙතෙම ශාස්තෲන් වහන්සේගේ අනුශාසනාව කරන්නේ, අවවාදය පිළිපදින්නේ, රටවාසීන් විසින් දෙනු ලබන පිණ්ඩ භෝජනය (ප්‍රයෝජන ඇතිවනසේ) අනුභව කෙරේයයිද කියනු ලැබේ. යම් කෙනෙක් ඒ බහුල වශයෙන් කෙරෙත් නම් (එහි අනුසස්) කියනුම කවරේද?"

(2-239 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 3 වෙනි ඡෙද මෙනි)

**2. දුතියජ්ඣාන අච්ඡරා සංඝාත සූත්‍රයඃ-** "2 ද්විතීයද්ධ්‍යාන සමාපත්තිය වඩයිද,

**3. තතියජ්ඣාන අච්ඡරා සංඝාත සූත්‍රයඃ-** "2 තෘතීය ධ්‍යානය වඩයිද,

**4. චතුත්ථජ්ඣාන අච්ඡරා සංඝාත සූත්‍රයඃ-** "2 චතුර්ථ ධ්‍යානය වඩයිද,

**5. මෙත්තා චෙතො විමුත්ති සූත්‍රයඃ-** "2 මෛත්‍රී සහගත චිත්ත විමුක්තිය වඩයිද,

**6. කරුණා චෙතො විමුත්ති සූත්‍රය:-** "2 කරුණා සහගත චෙතො විමුක්තිය වඩයිද,

**7. මුදිතා චෙතො විමුත්ති සූත්‍රය:-** "2 මුදිතා සහගත චෙතො විමුක්තිය වඩයිද,

**8. උපෙක්ඛා චෙතො විමුත්ති සූත්‍රය:-** "2 උපෙක්ෂා සහගත චෙතො විමුක්තිය වඩයිද,

**9-12. 2** "කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇත්තේ, සම්‍යක් ප්‍රඥාව ඇත්තේ ස්මෘතිමත්වූයේ, ලොකයෙහි තෘෂ්ණාව හා (ක්‍රොධය සමග පවත්නා) දොම්නසද යන මේ පාප ධර්මයන් සංසිඳුවාද, කයෙහි ඇති කෙශාදි අශුභයන් කය අනුව බලමින් වාසය කෙරේද,

**10. වෙදනානුපස්සී සූත්‍රය:-** "2 වෙදනාවන් කෙරෙහි වෙදනාවන් අනුව බලමින් වාසය කෙරේද,

**11. චිත්තානුපස්සී සූත්‍රය:-** "2 සිත කෙරෙහි සිත අනුව බලමින් වාසය කෙරේද,

**12. ධම්මානුපස්සී සූත්‍රය:-** "2 ධර්මයන් කෙරෙහි ඒ ධර්මය අනුව බලමින් වාසය කෙරේද,

**13. පඨමසම්මප්පධාන සූත්‍රය:-** "2 නූපන්නාවූ ලාමකවූ අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස යහපත්වූ කැමැත්ත උපදවාද, වෑයම් කෙරේද, වීය්‍ය්‍ය කෙරේද, සිත ඔසවාද, (සම්‍යක්) ප්‍රධාන වීය්‍ය්‍ය කෙරේද,

**14. දුතිය සම්මප්පධාන සූත්‍රය:-** "2 උපන්නාවූ ලාමක අකුශල ධර්මයන්ගේ නො ඉපදීම පිණිස කුසලච්ඡන්දය උපදවාද, ව්‍යායාම කෙරේද, වීය්‍ය්‍ය කෙරේද, සිත ඔසවාද (සම්‍යක්) ප්‍රධාන වීය්‍ය්‍ය කෙරේද,

**15. තතිය සම්මප්පධාන සූත්‍රය-** "2 නූපන්නාවූ කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස (යහපත් කැමැත්ත) උපදවාද, උත්සාහ කෙරේද, වීය්‍ය්‍ය කෙරේද, (එයින්) සිත ඔසවාද, (සම්‍යක්) ප්‍රධාන වීය්‍ය්‍ය කෙරේද,

**16. චතුත්ථසම්මප්පධාන සූත්‍රය-** "2 උපන්නාවූ කුසල ධර්මයන්ගේ (පැවැත්ම) පිණිස, විනාශනොවීම පිණිස, බහුල භාවය පිණිස, විපුලභාවය පිණිස, වැඩීමෙන් සම්පූර්ණත්වය (ඇතිවන) පිණිස, කුශලච්ඡන්දය උපදවයිද, ව්‍යායාම කෙරේද, වීර්‍ය්‍යයකෙරේද (එයින්) සිත ඔසවාද, ප්‍රධාන වීර්‍ය්‍යය කෙරේද,

**17. ඡන්දිද්ධිපාද අච්ඡරාසංඝාත සූත්‍රය-** "2 කුසල් කරනු කැමැත්ත නිසා ලබන ලද සමාධිය හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩාද,

**18. විරියිද්ධිපාද අච්ඡරාසංඝාත සූත්‍රයඃ-** "2 වීර්‍ය්‍යසමාධිය හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ ඍද්ධිපාද වඩාද,

**19. චිත්තිද්ධිපාද අච්ඡරාසංඝාත සූත්‍රයඃ-** "2 චිත්තසමාධිය හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ ඍද්ධිපාද වඩාද,

**20 වීමංසිද්ධිපාද අච්ඡරා සංඝාත සූත්‍රයඃ-** "2 වීමංසාව (විචාරණ ප්‍රඥාව) අධිපතිකොට පැවති සමාධිය හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ ඍද්ධිපාද වඩාද,

**21. සද්ධින්ද්‍රිය අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සතින්ද්‍රිය වඩාද,

**22. විරියින්ද්‍රිය අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 විරියින්ද්‍රිය වඩාද,

**23. සතින්ද්‍රිය අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සතින්ද්‍රිය වඩාද,

**24. සමාධින්ද්‍රිය අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සමාධින්ද්‍රියවඩාද,

**25. පඤ්ඤින්ද්‍රිය අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 ප්‍රඥෙන්ද්‍රියවඩාද,

**26. සද්ධාබල අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 ශ්‍රද්ධා බලය වඩාද,

**27. වීරියබල අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 වීර්‍ය්‍ය බලය වඩාද,

**28. සතිබල අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සති (නුමුළාවූ සිහි) බලය වඩාද,

**29. සමාධිබල අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සමාධි බලය වඩාද,

**30. පඤ්ඤාබල අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 ප්‍රඥාබලය වඩාද,

**31. සති සම්බොජ්ඣංගසූත්‍රය-** "2 ස්මෘතිසම්බොද්ධ්‍යංගය (සත්‍යාවබොධයට හේතුවන එළඹසිටි සිහිය) වඩාද,

**32. ධම්මවිචය සම්බොජ්ඣංග සූත්‍රය-** "2 ධර්මවිචය සම්බොජ්ඣංගය (සත්‍යාවබොධය පිණිස ප්‍රඥා ධර්මයන්ගේ සෙවීම) වඩාද,

**33. විරිය සම්බොජ්ඣංග සූත්‍රය-** "2 විරිය සම්බොජ්ඣංගය (සත්‍යාවබොධය) පිණිස ශූරභාවය වඩාද,

**34. පීති සම්බොජ්ඣංග සූත්‍රය-** "2 ප්‍රීති සම්බොජ්ඣංගය (සත්‍යාවබොධය පිණිස කය සිත පිණවීම) වඩාද,

**35. පස්සද්ධි සම්බොජ්ඣංග සූත්‍රය-** "2 ප්‍රශ්‍රබ්ධි සම්බොජ්ඣංගය (සත්‍යාවබොධය පිණිස කය හා සිතෙහි ක්ලෙශදාහය සංසිඳවීම) වඩාද,

**36. සමාධි සම්බොජ්ඣංග සූත්‍රය-** "2 සමාධිසම්බොධ්‍යංගය (සත්‍යාවබොධය පිණිස කය හා සිත මනාකොට පිහිටුවීම) වඩාද,

**37. උපෙක්ඛා සම්බොජ්ඣංග සූත්‍රය-** "2 උපෙක්ෂා සම්බොද්ධ්‍යංගය (සත්‍යාවබොධය පිණිස ඉෂ්ටානිෂ්ටයන් කෙරෙහි මද්ධ්‍යස්ථතාව) වඩාද,

**38. සම්මාදිට්ඨි අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සම්‍යක් දෘෂ්ටිය වඩාද,

**39. සම්මාසංකප්ප අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සම්‍යක් සංකල්පය (යහපත්සේ කල්පනාව) වඩාද,

**40. සම්මාවාචා අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සම්‍යක් වචනය වඩාද,

**41. සම්මා කම්මන්ත අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සම්‍යක් කර්මාන්තය වඩාද,

**42. සම්මා ආජීව අච්ඡරා සංඝාත සූත්‍රය-** "2 සම්‍යක් ආජීවය (යහපත් දිවිපැවැත්ම) වඩාද,

**43. සම්මාවායාම අච්ඡරා සංඝාත සූත්‍රය**- "2 සම්‍යක් ව්‍යායාමය වඩාද,

**44. සම්මා සති අච්ඡරා සංඝාත සූත්‍රය**- "2 සම්‍යක් සතිය වඩාද,

**45. සම්මා සමාධි අච්ඡරා සංඝාත සූත්‍රය**- "2 සම්‍යක් සමාධිය වඩාද,

**46. පඨම අභිභායතන සූත්‍රය**- "2 (ස්වකීය රූපයෙහි රූපයන් ඇත යන සංඥා ඇත්තේ පිටත්හිවූ නොවැඩුනාවූ යහපත් වර්ණ හා දුර්වර්ණ ඇත්තාවූ රූපයන් දකීද, ඒ රූපයන් මැඩපවත්වා ධ්‍යානය උපන් බව දනිමි දකිමියි මෙසේ සංඥා ඇත්තේ වේද,

**47. දුතිය අභිභායතන සූත්‍රය**- "2 ස්වකීය රූපයෙහි රූපයන් ඇත යන සංඥා නැත්තේ පිටත්හිවූ අප්‍රමාණවූ (වැඩීමෙන් මහත්වූ) යහපත් වර්ණ හා දුර්වර්ණ ඇත්තාවූ රූපයන් දකීද, ඒ රූපයන් මැඩපවත්වා ධ්‍යානය උපන් බව දනිමි, දකිමියි මෙසේ සංඥා ඇත්තේ වේද,

**48. තතිය අභිභායතන සූත්‍රය**- "2 ස්වකීය රූපයෙහි රූපයන් ඇත යන සංඥා නැත්තේ (අරූපධ්‍යාන හෙවත් අරූප සංඥා ඇත්තේ) පිටත්හිවූ නොවැඩුනාවූ යහපත් වර්ණ හා දුර්වර්ණ ඇත්තාවූ රූපයන් දකීද, ඒ රූපයන් (මැඩපවත්වා ධ්‍යානය උපන්බව දනිමි, දකිමියි මෙසේ සංඥා ඇත්තේ වේද,

**49. චතුර්ථ අභිභායතන සූත්‍රය**- "2 ස්වකීය රූපයෙහි අරූපයන් ඇත යන සංඥා ඇත්තේ පිටත්හිවූ වැඩීමෙන් මහත්වූ යහපත් වර්ණ හා දුර්වර්ණ ඇත්තාවූ රූපයන් දකීද, ඒ රූපයන් මැඩපවත්වා ධ්‍යානය උපන්බව දනිමි, දකිමියි යන මෙබඳු සංඥා ඇත්තේ වේද,

**50. පඤ්චම අභිභායතන සූත්‍රය**- "2 ස්වකීය රූපයෙහි රූපයන් ඇත යන සංඥා නැත්තේ පිටත්හිවූ නිල්වූ නීලවර්ණ ඇත්තාවූ නීලවර්ණ දැක්විය හැක්කාවූ නීලාවභාස (නීලකාන්තිය) ඇත්තාවූ රූපයන් දකීද, ඒ රූපයන් මැඩපවත්වා ධ්‍යානය උපන්බව දනිමි, දකිමියි යන මෙබඳු සංඥා ඇත්තේ වේද,

**51. ජට්ඨම අභිභායතන සූත්‍රය**- "2 ස්වකීය රූපයෙහි රූපයන් ඇත යන සංඥා නැත්තේ පිටත්හිවූ රන්වන් පැහැය ඇති, රන්වන්පාට ඇත්තාවූ, එකහෙලා පීතවර්ණවූ දැකුම් ඇත්තාවූ පීතවර්ණාවභාෂ (පීතකාන්ති) ඇත්තාවූ රූපයන් දකීද, ඒ රූපයන් අභිභවනය කොට (මැඩපවත්වා ධ්‍යානය උපන්බව) දනිමි. දකිමියි යන මෙබඳු සංඥා ඇත්තේ වේද,

**52. සත්තම අභිභායතන සූත්‍රය**- "2 ස්වකීය රූපයෙහි රූපයන් ඇත යන සංඥා නැත්තේ පිටත්හිවූ ලෙහෙවන්වූ, රතුපාට ඇති එකහෙලා රත්පාට දැකුම් ඇති, රතුකාන්ති ඇති රූපයන් දකීද, ඒ රූපයන් මැඩපවත්වා ධ්‍යානය උපන් බව දනිමි, දකිමියි යන මෙබඳු සංඥා ඇත්තේ වේද,

**53. අට්ඨම අභිභායතන සූත්‍රය**- "2 ස්වකීය රූපයෙහි අරූපයන් ඇත යන සංඥා ඇත්තේ පිටත්හිවූ සුදුවූ, සුදුපැහැ ඇති, එකහෙලා සුදුපැහැ දැකුම් ඇති සුදුපාට කාන්ති ඇති රූපයන් දකීද, ඒ රූපයන් මැඩපවත්වා ධ්‍යානය උපන් බව දනිමි, දකිමියි යන මෙබඳු සංඥා ඇත්තේ වේද, රූපාවචර ධ්‍යාන ඇත්තේ (පිටත උපන්) රූපයන් දකීද,

**54. සුභාධිමුත්ත සූත්‍රය**- "2 ස්වකීය රූපයෙහි රූපයන් ඇත යන සංඥා නැත්තේ පිටත්හිවූ රූපයන් දකීද, සුභයයි කියාම නිශ්චයකිරීම් ඇත්තේ වේද,

**55. ආකාසාණඤ්චායතන සූත්‍රය**- "2 සර්වප්‍රකාරයෙන් රූපයන් ඇතැයි යන සංඥාවන් මනාසේ බැහැරලීමෙන්, ක්‍රොධ සංඥාවන් නැසීමෙන්, නොයෙක් ස්වභාවික සංඥාවන් මෙනෙහි නොකිරීමෙන්, අහස අනන්තයයි ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කෙරේද,

**56. විඤ්ඤාණඤ්චායතන සූත්‍රය**- "2 සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතන සමාපත්තිය මනාසේ ඉක්මවා විඥානය අනන්තයයි විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කෙරේද,

**57. ආකිඤ්චඤ්ඤායතන සූත්‍රය**- "2 සර්වප්‍රකාරයෙන් විඤ්ඤානඤ්චායතන සමාපත්තිය මනාසේ ඉක්මවා ඒ පිළිබඳ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කිසි පිළිබොධයක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කෙරේද

**58. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සූත්‍රය-** "2 සර්වප්‍රකාරයෙන් අකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතන (විඤ්ඤාණය ඇත්තේද නැත්තේදැයි කියන පමණවූ) සමාපත්තියට පැමිණ වාසය කෙරේද,

**59. සඤ්ඤාවේදයිත නිරෝධ සූත්‍රය-** "2 සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා (චිත්ත චෛතසිකයන්ගේ නොහොත් සංඥා වේදනාවන්ගේ නොපැවැත්මවූ) සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට පැමිණ වාසය කෙරේද

**60. පඨවි කසිණ සූත්‍රයඃ-** "2 පෘථිවි කසිණය වඩාද,

**61. ආපො කසිණ සූත්‍රයඃ-** "2 ආපොකසිණය වඩාද,

**62. තෙජො කසිණ සූත්‍රයඃ-** "2 තෙජොකසිණය වඩාද,

**63. වායො කසිණ සූත්‍රයඃ-** "2 වායොකසිණය වඩාද,

**64. නීල කසිණ සූත්‍රයඃ-** "2 නීලකසිණය වඩාද,

**65. පීත කසිණ සූත්‍රයඃ-** "2 පීත (රන්වන් පැහැති) කසිණය වඩාද,

**66.** ලොහිත කසිණ සූත්‍රයඃ- "2 ලොහිත (ලෙහෙවන් පැහැති) කසිණය වඩාද,

**67. ඔදාත කසිණ සූත්‍රයඃ-** "2 ඔදාත (සුදුපැහැති) කසිණය වඩාද,

**68. ආකාස කසිණ සූත්‍රයඃ-** "2 ආකාස කසිණය වඩාද,

**69. විඤ්ඤාණ කසිණ සූත්‍රයඃ-** "2 විඤ්ඤාණකසිණය වඩාද,

**69. (A)** ආලොක **කසිණ සූත්‍රයඃ-** "2 ආලොක කසිණය වඩාද

**70. අසුභසඤ්ඤා සූත්‍රයඃ-** "2 අසුභ සංඥාව වඩාද,

**71. මරණසඤ්ඤා සූත්‍රයː-** "2 මරණසඤ්ඤාව වඩාද,

**72. පටිකකූලසඤ්ඤා සූත්‍රයː-** "2 ආහාරයෙහි පිළිකුල් සඤ්ඤාව වඩාද,

**73. අනභිරතසඤ්ඤා සූත්‍රයː-** "2 නොඇලීම් සංඥාව (කලකිරීම) වඩාද,

**74. අනිච්චසඤ්ඤා සූත්‍රයː-** "2 (පඤ්චස්කන්ධය) අනිත්‍යය යන සංඥාව වඩාද,

**75. දුක්ඛසඤ්ඤා සූත්‍රයː-** "2 අනිත්‍යවූ ස්කන්ධපඤ්චකයෙහි දුක යන සංඥාව වඩාද,

**76. අනත්තසඤ්ඤා සූත්‍රයː-** "2 දුක්වූ ස්කන්ධ පඤ්චකයෙහි අනාත්ම සංඥාව වඩාද,

**77. පහාණසඤ්ඤා සූත්‍රයː-** "2 ප්‍රහාණ සංඥාව වඩාද,

**78. විරාගසඤ්ඤා සූත්‍රයː-** "2 විරාග සංඥාව වඩාද,

**79. නිරොධසඤ්ඤා සූත්‍රයː-** "2 නිර්වාණය අරමුණුකොට උපන් නිරොධසඤ්ඤාව වඩාද,

**80. පඨමජ්ඣාන අනිච්ච සඤ්ඤා සූත්‍රයː-** "2 අනිත්‍ය සංඥාව වඩාද,

**81. පඨමජ්ඣාන අනත්ත සූත්‍රයː-** "2 අනාත්මයක් නැතැයි යන සංඥාව වඩාද,

**82. පඨමජ්ඣාන මරණ සඤ්ඤා සූත්‍රයː-** "2 මරණ සංඥාව වඩාද,

**83. පඨමජ්ඣාන පටික්කූල සඤ්ඤා සූත්‍රයː-** "ආහාරයෙහි පිළිකුල් සංඥාව වඩාද,

**84. පඨමජ්ඣාන අනභිරත සඤ්ඤා සූත්‍රයː-** "සියලු ලොකයෙහි කලකිරීම් සංඥාව වඩාද,

**85. පඨමජ්ඣාන අට්ඨික සඤ්ඤා සූත්‍රයː-** "(ශරීරය) ඇටසැකිල්ලෙක යන දෘෂ්ඨික සංඥාව වඩාද,

**86. පඨමජ්ඣාන පුළවක සඤ්ඤා සූත්‍රය:-** "(පණුවන් ගෙන් මිශ්‍රය යන) පුළවක සංඥාව වඩාද,

**87. පඨමජ්ඣාන විනීලක සඤ්ඤා සූත්‍රය:-** "(මළ පසු විශෙෂයෙන් නිල්වගිය ශරීරය අරමුණුකොට උපන්) විනීලක සංඥාව වඩාද,

**88. පඨමජ්ඣාන විච්ඡිද්දක සඤ්ඤා සූත්‍රය:-** "(මළ පසු විශෙෂයෙන් හටගත් සිදුරු ඇති සිරුර අරමුණුකොට උපන්) විච්ඡිද්‍රක සංඥාව වඩාද,

**89. පඨමජ්ඣාන උද්ධුමාතක සඤ්ඤා සූත්‍රය:-** "(මළ පසු ඉදිමී ගිය ශරීරය අරමුණුකොට උපන්) උද්ධුමාතක සංඥාව වඩාද,

**90. පඨමජ්ඣාන බුද්ධානුස්සති සූත්‍රය:-** "බුදුගුණ අරමුණු කොට උපන් සිහිය වඩාද,

**91. පඨමජ්ඣාන ධම්මානුස්සති සූත්‍රය:-** "දහම් ගුණ අරමුණුකොට උපන් සිහිය වඩාද,

**92. පඨමජ්ඣාන සංඝානුස්සති සූත්‍රය:-** "සඟ ගුණ අරමුණු කොට උපන් සිහිය වඩාද,

**93. පඨමජ්ඣාන සීලානුස්සති සූත්‍රය:-** "ශීල ගුණය අරමුණුකොට උපන් සිහිය වඩාද,

**94. පඨමජ්ඣාන චාගානුස්සති සූත්‍රය:-** "ත්‍යාග ගුණය අරමුණුකොට උපන් සිහිය වඩාද,

**95. පඨමජ්ඣාන දෙවතානුස්සති සූත්‍රය:-** "දෙවතාවන් සාක්ෂි ස්ථානයෙහි තබා තමන්ගේ ශ්‍රද්ධාදී ගුණයන් අරමුණු කොට උපන් සිහිය වඩාද,

**96. පඨමජ්ඣාන ආණාපාණසති සූත්‍රය-** "ආශ්වාස ප්‍රශ්වාසය අරමුණුකොට උපන් සිහිය වඩාද,

**97. පඨමජ්ඣාන මරණසති සූත්‍රය:-** "මරණය අරමුණු කොට උපන් සිහිය වඩාද,

**98. පඨමජ්ඣාන කායගතාසති සූත්‍රය:-** "කෙසාදී කාය කොට්ඨාශයන් අරමුණුකොට උපන් සිහිය වඩාද,

**99. පඨමජ්ඣාන උපසමානුස්සති සූත්‍රයඃ-** " කෙලෙසුන් සංසිඳීම අරමුණුකොට උපන් සිහිය වඩාද,

**100. පඨමජ්ඣාන සද්ධින්ද්‍රිය සූත්‍රයඃ-** "ප්‍රථමධ්‍යානය සමග පැවැත්තාවූ ශ්‍රද්ධෙන්ද්‍රිය වඩාද,

**101. පඨමජ්ඣාන විරියින්ද්‍රිය සූත්‍රයඃ-** "වීර්‍යෙන්ද්‍රිය වඩාද,

**102. පඨමජ්ඣාන සතින්ද්‍රිය සූත්‍රයඃ-** "සතින්ද්‍රිය වඩාද

**103. පඨමජ්ඣාන සමාධින්ද්‍රිය සූත්‍රයඃ-** "සමාධින්ද්‍රිය වඩාද

**104. පඨමජ්ඣාන පඤ්ඤින්ද්‍රිය සූත්‍රයඃ-** "පඤ්ඤින්ද්‍රිය වඩාද,

**105. පඨමජ්ඣාන සද්ධාබල සූත්‍රයඃ-** "ශ්‍රද්ධාබලය වඩාද,

**106. පඨමජ්ඣාන විරියබල සූත්‍රයඃ-** "වීර්‍යබලය වඩාද,

**107. පඨමජ්ඣාන සතිබල සූත්‍රයඃ-** "ස්මෘතිබලය වඩාද,

**108. පඨමජ්ඣාන සමාධිබල සූත්‍රයඃ-** "සමාධිබලය වඩාද,

**109. පඨමජ්ඣාන පඤ්ඤාබල සූත්‍රයඃ-** "ප්‍රඥාබලය වඩාද,

**110. දුතියජ්ඣාන අනිච්චසඤ්ඤා සූත්‍රයඃ-** "ද්විතීය ධ්‍යානය සමග පැවැත්තාවූ,

**111. දුතියජ්ඣාන අනත්ත සඤ්ඤා සූත්‍රයඃ-** "තෘතීය ධ්‍යානය සමග පැවැත්තාවූ,

**112-139. යථාපඨමජ්ඣානෙ යාව පඤ්ඤාබල සූත්‍රයඃ-** "යොජෙ තබ්බං චතුර්ථධ්‍යානය සමග පැවැත්තාවූ

113. මෛත්‍රිය සමග පැවැත්තාවූ

114. කරුණාව සමග පැවැත්තාවූ

115. මුදිතාව සමග පැවැත්තාවූ

116. උපෙක්ෂාව සමග පැවැත්තාවූ

117. ශ්‍රද්ධෙන්ද්‍රිය වඩාද,

118. වීර්‍යෙන්ද්‍රිය වඩාද,

119. සතින්ද්‍රිය වඩාද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

120. සමාධින්ද්‍රිය වඩාද,

121. පඤ්ඤින්ද්‍රිය වඩාද,

122. ශ්‍රද්ධා බලය වඩාද,

123. වීර්‍ය්‍ය බලය වඩාද,

124. ස්මෘති බලය වඩාද,

125. සමාධි බලය වඩාද,

126. ප්‍රඥාබලය වඩාද,

**240. සමුද්දන්තොගාධ සූත්‍රයః-** "මහණෙනි, යම්කිසිවෙකුගේ සිතින් මහා සමුද්‍රය තෙම ස්පර්ශකරණ ලද්දේ වේද ඔහුගේ සිතට සමුද්‍රය කරා ගලායන්නාවූ යම්කිසි කුඩා නදීහු වෙත්නම් ඔවුහු ඇතුළත් වෙතිද, මහණෙනි, එපරිද්දෙන්ම යම්කිසිවෙකු විසින් කායගතානුස්මෘතිය වඩන ලදද බහුල වශයෙන් කරණලදද ඔහුගේ ඒ භාවනාවට විද්‍යාව භජනය කරන්නාවූ (එහි කොටස්වූ) යම්කිසි කුශලධර්මයෝ වෙත් නම් ඔවුහුද ඇතුළත් වෙති"

**241. මහා සංවෙග සූත්‍රයః-** "මහණෙනි, එක ධර්මයක් තෙම (භාවනා වශයෙන්) වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ මහත්වූ සංවෙගය (විදර්ශනාව) පිණිස පවතී, මහත්වූ අර්ථය (සතරමාර්ගඥානය) පිණිස පවතී, මහත්වූ යොගක්ෂෙමය (නිර්වාණය) පිණිස පවතී, ස්මෘතිය හා ඥානය (සිහිනුවණ) පිණිස පවතී, දිව්‍යචක්ෂුරභිඥාන ප්‍රතිලාභය පිණිස පවතී, මේ ආත්මභාවයෙහි සැප විහරණය පිණිස පවතී, විද්‍යාවිමුක්තීන්ගේ පල පසක් කිරීම (අර්හත්වය) පිණිස පවතී, ඒ කවර නම් එකධර්මයක්ද? කායගතානුස්මෘතියයි.

**242. මහත්ථ සංවත්තන සූත්‍රයః-** "මහණෙනි, මේ එකම ධර්මය වනාහි (භාවනා වශයෙන්) වඩන ලද්දේ බහුලවශයෙන් කරණ ලද්දේ මහත්වූ සංවේගය (විදර්ශනාව පිණිස පවතී, මහත්වූ අර්ථය (මාර්ගඥානය) පිණිස පවතී,

**243. මහා යොගක්ඛෙම සූත්‍රයః-** "මහත්වූ යොගක්ෂෙමය (නිර්වාණය) පිණිස පවතී,

පටුන



**244. සතිසම්පධඤ්ඤ සූත්‍රයඃ-** "ස්මෘතිසම්ප්‍රජන්‍යය පිණිස පවතී,

**245. ඤාණදස්සන පටිලාභ සූත්‍රයඃ-** "ඥානදර්ශන ප්‍රති ලාභය පිණිස පවතී,

**246. දිට්ඨධම්ම සුඛවිහරණ සූත්‍රයඃ-** "දිට්ඨධම්ම සුඛ විහරණය පිණිස පවතී,

**247. විජ්ජා විමුත්ති ඵලසච්ඡිකිරිය සූත්‍රයඃ-** "විද්‍යාවිමුක්තීන්ගේ පල පසක් කිරීම පිණිස පවතී."

**248. කායචිත්ත පස්සම්භන සූත්‍රයඃ-** "මහණෙනි, එක ධර්මයෙක් වැඩූ කල්හි බහුල වශයෙන් කළ කල්හි කයද සංසිඳේ, සිතද සංසිඳේ. විතර්ක විචාරයෝද සංසිඳෙත්. (විද්‍යාව හා සම්බන්ධවූ) විද්‍යාභාගීය සියලු ධර්මයෝ භාවනාවෙන් සම්පූර්ණ බවට පැමිණෙත්. කවර නම් එකම ධර්මයක්ද? කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය වනාහි වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි කයද සංසිඳෙයි. සිතද සංසිඳෙයි, විතර්ක විචාරයෝද සංසිඳෙත්. (අෂ්ට) විද්‍යාව භජනය කරන්නාවූ සියලුම ධර්මයෝ භාවනාවෙන් සම්පූර්ණ බවට පැමිණෙත්."

**249. අනුප්පන්නාකුසල සූත්‍රයඃ-** 1. "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරණ ලද කල්හි නූපන්නාවූ අකුසල ධර්මයෝද නූපදිත්, උපන්නාවූ කුසල ධර්මයෝද නැසෙත්.

2. 'කවර නම් එකම ධර්මයෙක්ද? කායගතා සතියයි. මහණෙනි, මේ එකම ධර්මය වනාහි වැඩූ කල්හි බහුලවශයෙන් පුරුදු කළ කල්හි නූපන්නාවූ අකුශල ධර්මයෝද නූපදිත්, උපන්නාවූ අකුශල ධර්මයෝද නැසෙත්."

**250. අනුප්පන්න කුසල සූත්‍රයඃ-** "මහණෙනි, එකම ධර්මයෙක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරණ ලද කල්හි නූපන්නාවූ කුශල ධර්මයෝද උපදිත්, උපන්නාවූ කුශල ධර්මයෝද බහුලභාවය පිණිස විපුලභාවය පිණිස පවතිත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "කවර නම් එකම ධර්මයෙක්ද? කායගතාසතියයි. මහණෙනි, මේ එකම ධර්මය වනාහි වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි නූපන්නාවූ කුසල ධර්මයෝත් උපදිත්, උපන්නාවූ කුසල ධර්මයෝද බහුල භාවයට විපුල භාවයට පැමිණෙත්."

**251. අවිජ්ජා පහාණ සූත්‍රයː-** "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි අවිද්‍යාව නැසේ.

2. "කවර නම් එකම ධර්මයක්ද, කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය වනාහි වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි අවිද්‍යාව නැසේ. විද්‍යාව උපදී, මමය මාගේය යන මානය නැසේ. අනුසයෝ මුල්සිඳී නැසීමට පැමිණෙත්. සංයෝජනයෝ විනාශ වෙත්"

**252. විජ්ජුප්පාද සූත්‍රයː-** "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි විද්‍යාව උපදී.

2. "කවර නම් එකම ධර්මයක්ද කායගතානුස්මෘතියයි මහණෙනි, මේ එකම ධර්මය වනාහි වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරණ ලද කල්හි විද්‍යාව උපදී."

**253. මාන පහාණ සූත්‍රය-** "මහණෙනි එකම ධර්මයක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි මමය මාගේය යන මානය නැසේ.

2. "කවර නම් එකම ධර්මයක්ද කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය වනාහි වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදුකරන ලද කල්හි මමය මාගේය යන මානය නැසේ."

**254. අනුසය සමුග්ඝාත සූත්‍රයː-** "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි රාගාදි අනුසයෝ මුල්සිඳී නැසීමට පැමිණෙත්.

2. "කවර නම් එකම ධර්මයක්ද කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය වනාහි වඩන ලද කල්හි බහුල

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වශයෙන් පුරුදු කරන ලද කල්හි රාගාදි අනුසයෝ මුල්සිඳී නැසීමට පැමිණෙත්."

**255. සඤ්ඤෝජන පහාණ සූත්‍රයඃ-** "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි සංයෝජනයෝ විනාශවෙත්.

2. 'කවර නම් එකම ධර්මයක්ද කායගතානුස්මෘතියයි මහණෙනි, මේ එකම ධර්මය වනාහි වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි සංයෝජනයෝ විනාශ වෙත්."

**256. පඤ්ඤාපභෙද සූත්‍රයඃ-** "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද්දේ බහුලවශයෙන් පුරුදු කරන ලද්දේ ප්‍රඥාප්‍රභෙදය (ප්‍රඥා විශෙෂයන් දැනගැනීම) පිණිස පවතී

2. "කවර නම් එකම ධර්මයෙක්ද? කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරන ලද්දේ ප්‍රඥාප්‍රභේදය පිණිස පවතී."

**257. අනුපාදා පරිනිබ්බාණ සූත්‍රයඃ-** "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරන ලද්දේ අනුපාද පරිනිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතී

2. "කවරනම් එකම ධර්මයෙක්ද? කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරන ලද්දේ අනුපාද පරිනිර්වාණය පිණිස පවතී"

**258. අනෙකධාතු පටිවෙධ සූත්‍රයඃ-** "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි නොයෙක් ධාතූන්ගේ ලක්ෂණ දැනගැන්මවේ. එම ධාතූන්ගේ නානා ස්වභාවයන්හි ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතූන්ගේ ප්‍රභේදගත ඥානයවේ. කවර නම් එකම ධර්මයෙක්ද? කායගතානුස්මෘතියයි මහණෙනි, මේ එකම ධර්මය වනාහි වඩනලද කල්හි බහුලවශයෙන් පුරුදු කරන ලද කල්හි ධාතූන්ගේ ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතූන්ගේ නානා ස්වභාවයෙන් ලක්ෂණ දැන ගැන්ම වේ. එම ධාතූන්ගේ ප්‍රභෙද ඥානය වේ"

**259. නානාධාතු පටිවෙධ සූත්‍රය:-** "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි නොයෙක් ධාතුන්ගේ ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතුන්ගේ නානා ස්වභාවයන්හි ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතුන්ගේ ප්‍රභෙදගත ඥානය වේ. කවර නම් එකම ධර්මයෙක්ද? කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය වනාහි වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරණ ලද කල්හි ධාතුන්ගේ ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතුන්ගේ නානා ස්වභාවයෙන් ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතුන්ගේ ප්‍රභේද ඥානය වේ"

**260. අනෙකධාතු පටිසම්භිදා සූත්‍රය:-** "මහණෙනි, එක ධර්මයක් වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි නොයෙක් ධාතුන්ගේ ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතුන්ගේ නානා ස්වභාවයන්හි ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතුන්ගේ ප්‍රභෙදගත ඥානයවේ. කවර නම් එකම ධර්මයක්ද? කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය වනාහි වඩන ලද කල්හි බහුල වශයෙන් පුරුදු කරන ලද කල්හි ධාතුන්ගේ ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතුන්ගේ නානා ස්වභාවයෙන් ලක්ෂණ දැනගැන්ම වේ. එම ධාතුන්ගේ ප්‍රභෙද ඥාන වේ.

**261-264. සොතාපත්තිඵල සූත්‍රය:-** "මහණෙනි, එකම ධර්මයක් වඩන ලද්දේ බහුලවශයෙන් පුරුදු කරන ලද්දේ ශ්‍රොතාපත්ති ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වේ. සකෘදාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වේ. අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වේ. අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වේ. කවර නම් එකම ධර්මයෙක්ද? කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය වඩන ලද්දේ බහුලවශයෙන් පුරුදු කරන ලද්දේ ශ්‍රොතාපත්තිඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතී. සකෘදාගාමිඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතී, අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතී, අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතී"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**265-280. පඤ්ඤාපටිලාභ සූත්‍රය:-** "මහණෙනි, එකම ධර්මයක් තෙම වඩන ලද්දේ බහුලවශයෙන් පුරුදු කරනලද්දේ ප්‍රඥාව ලැබීම පිණිස පවතී. ප්‍රඥාවෘද්ධිය පිණිස පවතී. ප්‍රඥාවෙහි විශාලත්වය පිණිස පවතී. මහත් ප්‍රඥාව ඇති බැව් පිණිස විශාල ප්‍රඥා භාවය පිණිස පවතී, විපුල ප්‍රාඥ භාවය පිණිස පවතී, ගම්භීර ප්‍රාඥ භාවය පිණිස පවතී, අසාමන්ත (අනභිභවනීය) ඥානය ඇති බැව් පිණිස පවතී, භූරි ප්‍රාඥ භාවය පිණිස පවතී, ප්‍රඥා බාහුල්‍යය පිණිස පවතී, සීඝ්‍ර (වහ වහා පවත්නා ප්‍රාඥභාවය පිණිස පවතී, ලඝු (යුහුසුලුවූ) ප්‍රාඥ භාවය පිණිස පවතී, හාසු (තුෂ්ටිබහුල) ප්‍රාඥභාවය පිණිස පවතී, (වහා අවබොධය ලබන) ජවන ප්‍රඥාව ඇති බැව් පිණිස පවතී, තීක්ෂණ ප්‍රඥාභාවය පිණිස පවතී, (කලකිරුණු ස්වභාව ඇති ප්‍රාඥ භාවය පිණිස පවතී.

2. "කවර නම් එකම ධර්මයක්ද? කායගතානුස්මෘතියයි. මහණෙනි, මේ එකම ධර්මය තෙම වඩනලද්දේ බහුලවශයෙන් පුරුදු කරන ලද්දේ ප්‍රඥාප්‍රතිලාභය පිණිස පවතී, ප්‍රඥාවෘද්ධිය පිණිස පවතී, ප්‍රඥාවෙහි විශාලත්වය පිණිස පවතී. මහා ප්‍රඥාව ඇති බැව් පිණිස පවතී, විශාල ප්‍රාඥභාවය පිණිස පවතී. විපුල ප්‍රාඥභාවය පිණිස පවතී, ගම්භීර ප්‍රාඥභාවය පිණිස පවතී, අසාමන්ත ඥානය ඇති බැව් පිණිස පවතී, භූරිප්‍රාඥ භාවය පිණිස පවතී, ප්‍රඥා බාහුල්‍යය පිණිස පවතී, සීඝ්‍ර ප්‍රාඥභාවය පිණිස පවතී, ජවන ප්‍රඥාව ඇති බැව් පිණිස පවතී, තීක්ෂණ ප්‍රාඥභාවය පිණිස පවතී, නිර්වෙධික ප්‍රාඥභාවය පිණිස පවතී."

**281. අමතාපරිභුඤ්ජන සූත්‍රය:-** "මහණෙනි, යමෙක් තුමූ කායගතාසතිය පරිභොග නොකෙරෙත්ද, ඔහු නිර්වාණය (අවබොධකිරීම් වශයෙන්) නොවළඳත්."

**282. අමත පරිභුඤ්ජන සූත්‍රය:-** "මහණෙනි, යමෙක් තුමූ කායගතාසතිය (භාවනා වශයෙන්) පරිභොග කෙරෙත්ද ඔහු නිර්වාණය වළඳත්."

**283. අපරිභුත්තාමත සූත්‍රය:-** "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය පරිභොග නොකරන ලදද, ඔවුන් විසින් නිර්වාණය පරිභොග නොකරණ ලද්දේ වේ.

**284. පරිභුත්තාමත සූත්‍රයඃ-** "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය පරිභොග කරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය පරිභොග කරණ ලද්දේ වේ."

**285. පරිහීනාමත සූත්‍රයඃ-** "මහණෙනි, යම් කෙනෙකුන්ගේ කායගතාසතිය පිරිහුණිද ඔවුන්ගේ නිර්වාණය පිරිහුණේය"

**286. අපරිහීනාමත සූත්‍රය-** "මහණෙනි, යම් කෙනෙකුන්ගේ කායගතාසතිය නොපිරිහුණිද ඔවුන්ගේ නිර්වාණය නොපිරිහුණේය"

**287. විරද්ධාමත සූත්‍රය-** "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතාසතිය අවබොධ නොකරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය අවබොධ නොකරණ ලද්දේ වේ."

**288. අවිරද්ධාමත සූත්‍රය-** "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතාසතිය සම්පූර්ණකරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය සම්පූර්ණ කරණ ලද්දේ වේ."

**289. අමතපමාද සූත්‍රය-** "මහණෙනි, යමෙක් තුමූ කායගතානුස්මෘතිය ප්‍රමාද කළාහුද ඔහු තුමූ නිර්වාණය ප්‍රමාද කළාහුය"

**290. අමතාප්පමාද සූත්‍රය-** "මහණෙනි, යමෙක් තුමූ කායගතාසතිය ප්‍රමාද නොකළාහුද, ඔහු තුමූ නිර්වාණය ප්‍රමාද නොකළාහුය."

**291. පමුට්ඨාමත සූත්‍රය-** "මහණෙනි, යම්කෙනෙකුන් විසින් කායගතානුස්මෘති භාවනාව මතක නැති කරන ලදද, ඔවුන් විසින් නිර්වාණය මතක නැති කරණ ලද්දේ වේ."

**292. අප්පමුට්ඨාමත සූත්‍රය-** "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘති භාවනාව මතක නැති නොකරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය මතක නැති නොකරණ ලද්දේ වේ."

**293. අනාසෙවිතාමත සූත්‍රය-** "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය ආසෙවනය නොකරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය ආසෙවනය නොකරණ ලද්දේවේ.

**294. ආසෙවිතාමත සූත්‍රය**- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය සෙවනය කරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය සෙවනය කරණ ලද්දේ වේ."

**295. අභාවිතාමත සූත්‍රය**- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය නොවඩන ලදද, ඔවුන් විසින් නිර්වාණය නොවඩන ලද්දේ වේ"

**296. භාවිතාමත සූත්‍රයඃ**- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය වඩන ලදද, ඔවුන් විසින් නිර්වාණය වඩන ලද්දේ වේ."

**297. අබහුලීකතාමත සූත්‍රයඃ**- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය බහුල වශයෙන් නොකරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය බහුලවශයෙන් පුරුදුනොකරණ ලද්දේ වේ."

**298. බහුලීකතාමත සූත්‍රයඃ**- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය බහුල වශයෙන් පුරුදුකරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ වේ."

**299. අනභිඤ්ඤාතාමත සූත්‍රයඃ**- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය (විශෙෂ ඥානයෙන්) දැන නොගන්නා ලදද ඔවුන් විසින් නිර්වාණය (විශෙෂ ඥානයෙන්) දැන නොගන්නා ලද්දේ වේ."

**300. අභිඤ්ඤාතාමත සූත්‍රයඃ**- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘතිය (විශෙෂයෙන්) දැනගන්නා ලදද, ඔවුන් විසින් නිර්වාණය විශෙෂයෙන් දැනගන්නා ලද්දේ වේ."

**301. අපරිඤ්ඤාතාමත සූත්‍රයඃ**- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘති භාවනාව පිරිසිඳ දැන නොගන්නා ලදද, ඔවුන් විසින් නිර්වාණය පිරිසිඳ දැන නොගන්නා ලද්දේ වේ.

**302. පරිඤ්ඤාතාමත සූත්‍රයඃ**- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතානුස්මෘති භාවනාව පිරිසිඳ දැනගන්නා ලදද, ඔවුන් විසින් නිර්වාණය පිරිසිඳ දැනගන්නා ලද්දේ වේ."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

303. අසච්ඡිකතාමත සූත්‍රයː- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතාසතිය ප්‍රත්‍යක්ෂ නොකරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දේ වේ."

304. සච්ඡිකතාමත සූත්‍රයː- "මහණෙනි, යම් කෙනෙකුන් විසින් කායගතාසතිය ප්‍රත්‍යක්ෂ කරණ ලදද, ඔවුන් විසින් නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේ වේ.",

එකකනිපාතයෙහි සූත්‍ර දහස සමාප්තයි.

---

# දුක නිපාතය.

## පළමුවෙනි පණ්ණාසකය.

## 1. කම්මකාරණ වර්ගය.

### 1. වජ්ජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී, එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එකල්හි භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, මේ දෙදෙන දොෂ (අපරාධ) යෝ වෙත්. කවර දෙදෙනෙක්ද යත්, මේ ආත්මයෙහි උපදින විපාක ඇති (දෘෂ්ටධර්මික) දොෂයද පරලෙව්හි උපදින විපාක ඇති (සම්පරායික) දොෂයද (යන දෙකයි) මහණෙනි, දෘෂ්ටධර්මික දොෂය කවරේද?

3. "මහණෙනි, මෙලොව රජවරු (නිලධාරීහු) අපරාධකාරීවූ සොරෙකු අල්වාගෙන නොයෙක් කම්කටුළු කරවත්නම් (එබඳු සොරා) ඇතැමෙක් දකී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "(රාජපුරුෂයෝ ඔහුට) කසවලින්ද තළත්, වේවැල් වලින්ද තළත්, මුගුරුවලින්ද තළත්, (ඔහුගේ) අතද සිඳිත්, පයද කපත්, අත්පාද සිඳිත්, කණද කපත්, නාසයද කපත්, කන් නාසා දෙකමද කපත්, හිස්කබල උපුටා රත්වූ යගුළි හිස තුළ බහාලීමද කරත්, හිස (හක්ගෙඩියක්) මෙන් මුඩුකිරීමද කරත්. මුඛය විවෘතකොට ඇතුළෙහි පහන් දැල්වීමද කරත්. මුලු සිරුර තෙල් රෙදිවලින් වෙලා ගිනි දැල්වීමද කරත්, අතෙහි තෙල් රෙදි වෙළා ඒ පහනක් මෙන් දැල්වීමද කරත්, බෙල්ල පටන් ගොප් ඇටය දක්වා හම උපුටා යොතින් බැඳ ඇදීමද කරත්, බෙල්ල පටන් කටිය දක්වාද කටිය පටන් ගොප් මස දක්වාද සමඋගුළුවා වැහැරී සිවුරක් සේ පැළඳවීමද කරත්, දෙ දණ දෙ වැලමිටිවල යකඩ වලලු දමා යවුලෙන් බිම සිටුවා ගින්නෙන් පිරිවරාලීමද කරත්, දෙපස මුවැති බිලියෙන් ගසා සම් නහර උපුටාලීමද කරත්, මුලු සිරුර කහවණු පමණට කැපීමද කරත්, සිරුර ආයුධයෙන් කපා ඒ ඒ තන්හි කොස්සෙන් කාරම් ඉසීමද කරත්, භූමියෙහි තබා කන් සිදුරෙහි යවුල් ගසා කරකැවීමද කරත්, සිවි සම් නොසිඳෙනසේ දාගලින් ඇට සුණුකොට ශරීරය පිදුරු වැටියක් මෙන් තළා දැමීමද කරත්. රත්වූ තෙලෙන්ද සිරුර ඉසිත්, බල්ලන් ලවාද කවත්, ජීවත්ව සිටියදී හුළෙහි හිඳුවත්, කඩුවෙන්ද හිස සිඳිත්.

5. "මේ කම්කටොලු දක්නා තැනැත්තාහට මෙබඳු සිතක් වෙයි.

"ලාමකවූ (පාප) කර්මයන්ගේ හේතුවෙන්

(මේ ඡේදයේ ඉතුරු කොටස මේ සූත්‍රයේ 3. 4. වෙනි ඡේද මෙනි)

(මෙහි මේ සූත්‍රයේ 3, 4 ඡේද යෙදිය යුතුයි)

'මමද මෙබඳුවූ පාපකර්මයක් කරන්නේ නම් මා ද රජවරු ගෙණ මෙබඳු වූ නානාප්‍රකාරවූ කම්කටුළු කරවන්නාහුය.

(මෙහි මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය යෙදිය යුතුයි.)

"හෙතෙම මේ ආත්මයෙහි විපාක දෙන දොෂයට බියවූයේ අනුන්ගේ බඩු පැහැර ගනිමින් නොහැසිරෙයි. මහණෙනි, මේ මේ ආත්මයෙහි විපාක ඇති දොෂයයි කියනු ලැබේ.

6. "මහණෙනි, පරලොව විපාක ඇත්තාවූ දොෂය කවරේද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් මෙසේ නුවණින් සලකා බලයි. (කෙසේද) 'කාය දුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි පරලෙව්හි වේ. වාග්දුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි පරලෙව්හි වේ. මනොදුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි පරලෙව්හි වේ. මම වනාහි කයින් දුශ්චරිත කරන්නෙම්නම් වචනයෙන් දුශ්චරිත කරන්නෙම් නම් සිතින් දුශ්චරිත කරන්නෙම් නම්, යම් හෙයකින් මම ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරු ගතිඇත්තාවූ විකාරව වැටෙන්නාවූ නරකයෙහි නූපදින්නෙම් නම් එසේ වීමට කිනම් කාරණයක් ඇද්ද, හෙතෙම (මෙසේ) සලකා පරලෙව්හි විපාක ඇති දොෂය ගැන බියපත්වූයේ කාය දුශ්චරිතය හැර කායසුචරිතය වඩයි, වාග්දුශ්චරිතය හැර වාක්සුචරිතය වඩයි. මනොදුශ්චරිතය හැර මනොසුචරිතය වඩයි. පිරිසිදුවූ ආත්මයක් පරිහරණය කෙරෙයි.

7. "මහණෙනි, මේ පරලෙව්හි විපාක ඇති දොෂයයි කියනු ලැබේ. මහණෙනි, මේ දෙක වනාහි දොෂයෝ වෙත්. මහණෙනි, එහෙයින් මේ කාරණයෙහිදී තොප විසින් මෙසේ හික්මිය යුතුයි. මේ ආත්මභාවයෙහි විපාක ඇත්තාවූ දොෂයට බියවන්නෙමු. පරලොවෙහි විපාක ඇත්තාවූ දොෂයට බිය වන්නෙමු. වරදට බියවන ස්වභාව ඇත්තෝ වරදෙහි බිය දක්නා ස්වභාවය ඇත්තෝ වන්නෙමු' යි (කියායි.)

8. "මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි මහණෙනි, වරදෙහි බියවනසුළුවූ, වරදෙහි බිය දක්නාසුලුවූ තැනැත්තෝ සියලු වරදින් මිදෙත් යන මේ කාරණය අවශ්‍යයෙන් සිදුවිය යුත්තෙකි

2. **පධාන සූත්‍රයː-** "මහණෙනි, ලොව ලබාගැනීමට දුෂ්කරවූ මේ වීර්‍ය්‍යයෝ දෙදෙනෙක් වෙත්. ඒ කවර දෙදෙනෙක්ද යත්, ගිහිගෙයි වාසය කරන්නාවූ ගිහියන් විසින් සිවුරු, පිණ්ඩපාත, සෙනසුන් (වාසස්ථාන), ගිලන්පස, බෙහෙත් පිරිකර යන මේ පසය සපයාගනු පිණිස යම් වීර්‍ය්‍යයක් වේනම් (එයද), ගිහිගෙයින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදි වූවන්ගේ සියලු ආශාවන්ගේ බැහැරලීමයයි කියනලද නිර්වාණය පිණිස යම් වීර්‍ය්‍යයකුත් වේ නම් එයද (යන මේ දෙකයි.)

3. "මහණෙනි, ලොව මේ වීර්‍ය්‍ය දෙක වනාහි ලබාගැනීමට දුෂ්කර වෙත්. මහණෙනි, මේ වීර්‍ය්‍ය දෙක අතුරෙන් යම් මේ සියලු ආසාවන්ගේ දුරලීම පිණිස වීර්‍ය්‍යයක් වේද, මෙය අග්‍රයි. මහණෙනි, එහෙයින් මේ කරුණෙහිදී මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) (ස්කන්ධාදී) සියලු ආසාවන්ගේ බැහැරලීම පිණිස වීර්‍ය්‍ය කරන්නෙමු (යි කියායි). මහණෙනි, තොප විසින් මෙසේම හික්මිය යුතුයි."

3. **තපනීය සූත්‍රයː-** "මහණෙනි, (සිත්) තැවීම කරන්නා වූ මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. ඒ දෙදෙන කවරහුදයත්, මහණෙනි, මෙලොව ඇතැමෙකු විසින් කාය දුශ්චරිතය කරණ ලද්දේවේද, කාය සුචරිතය නොකරණ ලද්දේවේද, වාග්දුශ්චරිතය කරණලද්දේ වේද, වාක්සුචරිතය නොකරණ ලද්දේවේද, මනො දුශ්චරිතය කරණ ලද්දේ වේද, මනො සුචරිතය නොකරණ ලද්දේ වේද, හෙතෙම 'මා විසින් කාය දුශ්චරිතය කරණ ලද්දේය'යි තැවෙයි. 'කාය සුචරිතය මවිසින් නොකරණ ලද්දේය'යි තැවෙයි, 'වාග් දුශ්චරිතය මවිසින් කරන ලද්දේය'යි තැවෙයි, 'වාක් සුචරිතය මවිසින් නොකරණ ලද්දේය'යි තැවෙයි. මනො දුශ්චරිතය කරණ ලද්දේය'යි තැවෙයි 'මනො සුචරිතය නොකරණ ලද්දේය'යි තැවෙයි. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙන වනාහි තැවීම කරන්නෝය."

4. **අතපනීය සූත්‍රයː-** "මහණෙනි, (සිත්) තැවීම් නො කරන්නාවූ මේධර්මයෝ දෙදෙනෙක්වෙත්, කවර දෙදෙනෙක්ද යත් මහණෙනි, මෙලොව ඇතැමෙක් විසින් කායසුචරිතය කරණ ලද්දේ වේද, කාය-දුශ්චරිතය නොකරණ ලද්දේවේද, වාක්සුචරිතය කරණ ලද්දේ වේද, වාග්දුශ්චරිතය නොකරණ ලද්දේ වේද, මනො සුචරිතය කරණ ලද්දේ වේද, මනො දුශ්චරිතය නොකරණ ලද්දේ වේද, හෙතෙම 'මවිසින් කාය සුචරිතය කරණ ලද්දේය'යි නොතැවෙයි. 'මවිසින් කාය

දුශ්චරිතය නොකරණ ලද්දේය'යි නොතැවෙයි. 'මවිසින් වාක් සුචරිතය කරණ ලද්දේය'යි නොතැවෙයි 'මවිසින් වාක් දුශ්චරිතය නොකරණ ලද්දේය'යි නොතැවෙයි. 'මවිසින් මනො සුචරිතය කරණ ලද්දේය'යි නොතැවෙයි. 'මවිසින් මනොදුශ්චරිතය නොකරණලද්දේය'යි නොතැවෙයි. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙන වනාහි තැවීම් නොකරන්නෝ වෙත්."

5. **උපඤ්ඤාත සූත්‍රයඃ**- 1. "මහණෙනි, මම ධර්මයන් දෙදෙනෙක් අවබොධ කෙළෙමි. කුශල ධර්මයන්හි යම් නොසතුටු බවක් වේද, පව් නැසීමට කරනු ලබන වීර්‍ය්‍යයෙහි යම් නොපසුබස්නා බවෙක් වේද මහණෙනි, මම නොපසුබස්නා වීර්‍ය්‍ය ඇත්තේ වීර්‍ය්‍ය කරමි. (කෙසේද?)

2. "ඒකාන්තයෙන් ශරීරයෙහි සමද නහරද ඇටද ඉතිරි වේවා! මස් හා ලේ වියලේවා! පුරුෂ ශක්තියෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන්, පුරුෂ පරාක්‍රමයෙන් යමකට පැමිණිය යුතුද, ඊට නොපැමිණ වීර්‍ය්‍යයාගේ තැවීමක් නොවන්නේය.

3. "මහණෙනි, එසේ වූ මා විසින් සම්‍යක් සම්බොධිය අප්‍රමාදය නිසා අවබොධ කරණ ලද්දීය. නිරුත්තරවූ යොගක්ෂෙම සංඛ්‍යාත නිර්වාණය අප්‍රමාදයෙන් අවබොධකරණ ලද්දේය.

4. මහණෙනි, ඒකාන්තයෙන් සිරුරෙහි සමද නහරද ඇටද ඉතිරිවේවා! මස් හා ලේ වියලේවා! පුරුෂ ශක්තියෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂ පරාක්‍රමයෙන් යම් ගුණ සමූහයකට පැමිණිය යුතුද, ඊට නොපැමිණ වීර්‍ය්‍යයාගේ තැවීමක් නොවන්නේය' (යිද කියා).

5. "ඉදින් තෙපිද නොපසුබස්නා වීර්‍ය්‍යය කරන්නහු නම්, මහණෙනි, කුලපුත්‍රයෝ යම් ප්‍රයෝජනයක් ලබනු පිණිස මනාකොටම ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදි වෙත්ද, තෙපිත් (මග) බඹසර කෙළවරකොට ඇති උත්තරීතරවූ ඒ (අර්හත්වය) නොබෝ කලකින්ම මේ ආත්ම භාවයෙහිම තෙපිම විශිෂ්ට ඥානයෙන් දැන, ප්‍රත්‍යක්ෂකොට ගෙණ ඊට පැමිණ වාසය කරන්නාහුය. මහණෙනි, එහෙයින්

මේ කරුණෙහි ලා (තොප විසින්) මෙසේ හික්මිය යුතුයි (කෙසේද?) ඒකාන්තයෙන් ශරීරයෙහි සමද, නහරද, ඇටද, ඉතිරිවේවා! මස් හා ලේ වියලේවා! පුරුෂ ශක්තියෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් යමකට පැමිණියයුතුද, ඊට නොපැමිණ වීර්‍ය්‍යයාගේ නැවැත්ම නොවන්නේය (යි සිතා) නොපසුබස්නා වීර්‍ය්‍යය කරන්නෙමුය'යි කියායි. මහණෙනි, තොප විසින් මෙසේම හික්මිය යුතුයි"

**6. සඤ්ඤොජනීය සූත්‍රයː-** 1. "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, සංයෝජනයන්ට ප්‍රත්‍යයවූ (ඉපදීමට හේතුවූ), ධර්මයන් කෙරෙහි යම්බඳුවූ පස් කම් රස විඳීම් වශයෙන් දක්නා ස්වභාවක් වේද, සංයෝජනයන්ට ප්‍රත්‍යයවූ ධර්මයන් කෙරෙහි යම්බඳුවූ (කළකිරීම්) උකටලීම් වශයෙන් දක්නා ස්වභාවක් වේද (යන මේ දෙදෙනයි).

2. "මහණෙනි, සංයෝජනයන්ට ප්‍රත්‍යවූ ධර්මයන් පස් කම් රස විඳීම වශයෙන් දක්නා ස්වභාවය ඇතිව වාසය කරණ තැනැත්තේ රාගය දුරුනොකරයි. ද්වෙෂය දුරුනොකරයි. මොහය දුරුනොකරයි. රාගය දුරු නොකොට, ද්වෙෂය දුරු නොකොට, මොහය දුරුනොකොට ජාතියෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද සොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුක්ඛයන් ගෙන්ද, චෛතසික දුඃඛයන්ගෙන්ද දැඩි ආයාසයන්ගෙන්ද නොමිදෙයි. (හෙතෙම) සසර දුකින් නොමිදේ යයි කියමි.

3. "මහණෙනි, සංයෝජනයන්ට ප්‍රත්‍යවූ ධර්මයන් නිර්වෙද වශයෙන් දක්නා සුලුව වාසය කරණ තැනැත්තේ රාගය දුරුකරයි. ද්වෙෂය දුරුකරයි, මොහය දුරුකරයි, රාගය දුරුකොට, ද්වෙෂය දුරුකොට, මොහය දුරුකොට, ජාතියෙන්ද ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීම්වලින්ද, කායික දුඃඛයන් ගෙන්ද, චෛතසික දුඃඛයන් ගෙන්ද, දැඩි ආයාසයන් ගෙන්ද මිදෙයි. (හෙතෙම) සසර දුකින් මිදේයයිද කියමි. මහණෙනි, මෙසේ වූ ධර්මයෝ දෙදෙනෙක් වෙත්."

**7. කණ්හ සූත්‍රයː-** "මහණෙනි, කළුවූ අකුසල්වූ මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර නම් දෙදෙනෙක්ද යත්, (පව් කිරීමෙහි)

ලජ්ජාරහිත භාවයද, (පව් කිරීමෙහි) බිය නොවන බවද වෙත්. මහණෙනි, මේ ධර්මදෙක කළුවූ ධර්මයෝයි.”

8. **සුක්ක සූත්‍රයඃ-** “මහණෙනි, සුදුවූ, කුසල්වූ මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර නම් දෙදෙනෙක්ද යත් (පව් කිරීමෙහි) ලජ්ජාවද, (පව් කිරීමෙහි) බියද, යන දෙදෙනයි). මහණෙනි, මේ ධර්ම දෙක සුදුවූ ධර්මයෝ වෙත්.”

9. **චරියා සූත්‍රයඃ-** “මහණෙනි, මේ සුදුවූ කුසල් ධර්මයෝ දෙදෙන ලොව පාලනය කරත්. කවර දෙදෙනෙක්ද? ලජ්ජාවද බියද (යන දෙකයි). මහණෙනි, මේ සුදුවූ කුසල ධර්ම දෙක ලොව පාලනය නොකරන්නාහු නම් මෙහි වැදූ මව කියා හෝ කුඩාමව කියා හෝ නැන්දනිය කියා හෝ ගුරුවරයාගේ භාර්‍යාව කියා හෝ ගරු කටයුත්තන්ගේ භාර්‍යාවය කියා හෝ නොපෙණෙන්නේය. ලෝ වැසි තෙම එළුවන්, බැටළුවන්, මෙන්ද, කුකුළන්, ඌරන් මෙන්ද, බලු හිවලුන් මෙන්ද, සංකරයට පැමිණෙන්නේය. මහණෙනි, යම් හෙයකින් මේ සුදුවූ කුසල් ධර්ම දෙක ලොකයා පාලනය කෙරෙත්ද, එහෙයින් මව කියා හෝ කුඩා මව කියා හෝ නැන්දනිය කියා හෝ ගුරුවරයාගේ භාර්‍යාව කියා හෝ ගරු කටයුත්තන්ගේ භාර්‍යාව කියා හෝ හැඟීමක් ඇති වන්නේය.”

10. වස්සූපනායික සූත්‍රයඃ- “මහණෙනි, මේ වස් එළඹීම් දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, පෙරවස් එළඹීමද, පසුවස් එළඹීමද යන දෙකයි, මහණෙනි, මේ දෙක වස්එළඹීම් වෙති”

**(පළමුවෙනි කම්මකාරණ වර්ගය නිමි)**

---

## 2 අධිකරණ වර්ගය.

1. **සෙබබල සූත්‍රයඃ-** “මහණෙනි, මේ බලයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, පරීක්ෂාකිරීමේ බලයද භාවනා බලයද යන දෙකයි.

2. "මහණෙනි, පරීක්ෂා කිරීමේ බලය කවරේද? මහණෙනි, මෙලොව ඇතැමෙක් මෙසේ පරීක්ෂා කරයි. (කෙසේද?) කාය දුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි මේ ආත්මභාවයෙහිද පරලොවෙහිද වේ. වාග්දුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි මේ ආත්මභාවයෙහිද පරලොවෙහිද වේ. මනොදුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි මේ ආත්මභාවයෙහිද, පරලෙව්හිද වේය කියායි. හෙතෙම මෙසේ නුවණින් සලකා බලා කාය දුශ්චරිතය හැර කාය සුචරිතය වඩයි. වාග්දුශ්චරිතය හැර වාග්සුචරිතය වඩයි. මනොදුශ්චරිතය හැර මනො සුචරිතය වඩයි. පිරිසිදුවූ ආත්ම භාවයක් පරිහරණය කෙරෙයි. (රකියි). මහණෙනි මේ පරීක්ෂා කිරීමේ බලයයි කියනුලැබේ.

3. "මහණෙනි, භාවනා බලය කවරේද? මහණෙනි, මේ බල දෙක අතුරෙන් යම් මේ භාවනා බලයක්වේද, මේ බලය (අර්හත්වයට නොපැමිණ සෝවාන් ආදී මාර්ගයන්හි හැසිරෙන) ශෛක්ෂයන් සම්බන්ධ ඥානබලය වේ. මහණෙනි, හෙතෙම ශෛක්ෂ බලය නිසා රාගය දුරුකරයි, ද්වෙෂය දුරුකරයි. මොහය දුරුකරයි. රාගය දුරුකොට, ද්වෙෂය දුරුකොට, මොහය දුරුකොට යමක් අකුසල්වේද එය නොකෙරෙයි. යමක් පව් වේද එය සෙවනය නොකෙරෙයි. මහණෙනි, මේ භාවනා බලයයි කියනු ලැබේ. මහණෙනි, මොහු දෙදෙන වනාහි භාවනා බලයෝ වෙති."

2. **බොජ්ඣංගබල සූත්‍රයː-** "මහණෙනි, මේ බලයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්දයත්, පරීක්ෂාකිරීමේ බලයද, භාවනා බලයද යන දෙදෙනයි.

2. "මහණෙනි, පරීක්ෂාකිරීමේ බලය කවරේද? මහණෙනි, මෙලොව ඇතැමෙක් මෙසේ පරීක්ෂා කරයි. (කෙසේද?) කාය දුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි මේ ආත්මභාවයෙහි ද පරලොවෙහිද වේ. වාග්දුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි මේ ආත්මයෙහිද පරලොවෙහිද වේ. මනොදුශ්චරිතයාගේ ලාමකවූ විපාකය තෙම මේ ආත්මභාවයෙහිද, පරලෙව්හිද වේය කියායි. හෙතෙම මෙසේ නුවණින් සලකා බලා කායදුශ්චරිතය

හැර කාය සුචරිතය වඩයි. වාග්දුශ්චරිතය හැර වාග්සුචරිතය වඩයි. මනො දුශ්චරිතය හැර මනොසුචරිතය වඩයි. පිරිසිදුවූ ආත්මභාවයක් පරිහරණය කෙරෙයි. (රකියි) මහණෙනි, මේ පරීක්ෂාකිරීමේ බලයයි කියනු ලැබේ.

3. "මහණෙනි, භාවනාබලය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකයන් ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ දුක්ඛනිරොධය ඇසුරුකළාවූ කෙලෙසුන් නැසීම හා නිවන් අරමුණට පැමිණීම ඇත්තාවූ ස්මෘති සම්බොද්ධ්‍යාංගය වඩයි. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකයන් ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, දුක්ඛනිරොධය ඇසුරුකළාවූ කෙලෙසුන් නැසීම හා නිවන් අරමුණට පැමිණීම ඇත්තාවූ ධර්මවිචය සම්බොද්ධ්‍යාංගය වඩයි. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකයන් ඇසුරුකළාවූ, විරාගය ඇසුරු කළාවූ, දුක්ඛනිරොධය ඇසුරු කළාවූ කෙලෙසුන් නැසීම හා නිවන් අරමුණට පැමිණීම ඇත්තාවූ වීර්‍ය්‍යය සම්බොද්ධ්‍යාංගය වඩයි, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකයන් ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, දුක්ඛනිරොධය ඇසුරුකළාවූ කෙලෙසුන් නැසීම හා නිවන් අරමුණට පැමිණීම ඇත්තාවූ ප්‍රීති සම්බොද්ධ්‍යාංගය වඩයි. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකයන් ඇසුරු කළාවූ, විරාගය ඇසුරුකළාවූ දුක්ඛනිරොධය ඇසුරුකළාවූ කෙලෙසුන් නැසීම හා නිවන් අරමුණට පැමිණීම ඇත්තාවූ පස්සද්ධි සම්බොද්ධ්‍යාංගය වඩයි, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකයන් ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ දුක්ඛනිරොධය ඇසුරුකළාවූ කෙලෙසුන් නැසීම හා නිවන් අරමුණට පැමිණීම ඇත්තාවූ සමාධි සම්බොද්ධ්‍යාංගය වඩයි. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකයන් ඇසුරු කළාවූ, විරාගය ඇසුරුකළාවූ, දුක්ඛනිරොධය ඇසුරුකළාවූ, කෙලෙසුන් නැසීම හා නිවන් අරමුණට පැමිණීම ඇත්තාවූ උපෙක්ෂා සම්බොද්ධ්‍යාංගය වඩයි. මහණෙනි, මේ භාවනා බලයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, මොහු වනාහි බලයෝ දෙදෙන වෙත්.

3. **ඣානබල සූත්‍රයඃ-** "මහණෙනි, මේ බලයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්ඃ පරීක්ෂාකිරීමේ බලයද භාවනා බලයද යන දෙදෙනයි.

2. "මහණෙනි, පරීක්ෂා කිරීමේ බලය කවරේද? මහණෙනි, මෙලොව ඇතැමෙක් මෙසේ පරීක්ෂා කරයි. (කෙසේද?) කායදුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි මේ ආත්මභාවයෙහිද පරලොවෙහිද වේ. වාග්දුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි මේ ආත්මභාවයෙහිද පරලොවෙහිද වේ. මනොදුශ්චරිතයාගේ ලාමකවූ විපාකය වනාහි මේ ආත්මභාවයෙහිද පරලොවෙහිද වේය කියායි. හෙතෙම මෙසේ නුවණින් සලකා බලා කායදුශ්චරිතය හැර කාය සුචරිතය වඩයි. වාග් දුශ්චරිතය හැර වාග්සුචරිතය වඩයි. මනොදුශ්චරිතය හැර මනොසුචරිතය වඩයි. පිරිසිදුවූ ආත්මභාවයක් පරිහරණය කරයි (රකියි). මහණෙනි, මේ පරීක්ෂාකිරීමේ බලයයි කියනු ලැබේ.

3. "මහණෙනි, භාවනාබලය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක (කල්පනාකිරීම) සහිතවූ, විචාර (අරමුණෙහි සිත හැසිරවීම) සහිතවූ විවේකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් ස්වකීය සන්තානයෙහි මනාකොට පැහැදීම ඇති චිත්තයාගේ එකට පහළවීම් (එකඟ බැව්) ඇති විතර්ක රහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැප ඇති ද්විතීයද්ධ්‍යානයට පැමිණ වාසයකරයි ප්‍රීතියෙහි නො ඇලීමෙන් උපෙක්ෂා ඇත්තෙක්ව වාසයකරයි. සිහි ඇත්තේ, මනා නුවණ ඇත්තේ සැපයද කයින් විඳී. (බුද්ධාදි) ආර්‍ය්‍යයෝ (එහි වසන්නා) උපෙක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැප විහරණ ඇත්තේයයි කියත්ද ඒ තෘතීයධ්‍යාන සමාපත්තියට එළඹ වාසය කෙරෙයි (කායික) සුඛ ප්‍රහාණයෙන් (දුරුකිරීමෙන්) ද, දුඃඛ ප්‍රහාණයෙන්ද පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ බැහැරලීමෙන් දුක් නැත්තාවූ සැප

නැත්තාවූ උපෙක්ෂා ස්මෘති දෙදෙනගේ පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යාන සම්පත්තියට එළඹ වාසයකෙරෙයි. මහණෙනි, මේ භාවනා බලයයි කියනු ලැබේ. මහණෙනි, මොහු බලයෝ දෙදෙන වෙති"

4. **ධම්මදෙසනා සූත්‍රය**- "මහණෙනි, තථාගතයන්ගේ මේ ධර්මදෙශනාවෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්: සංක්ෂෙප වශයෙන් කරණ දෙශනාවය, විස්තර වශයෙන් කරණ දෙශනාවය යන දෙදෙනයි. මහණෙනි, මේ දෙදෙන වනාහි තථාගතයන්ගේ ධර්මදෙශනාවෝයි."

5. **අධිකරණ සූත්‍රය**:- "මහණෙනි, (විවාදාදි) අධිකරණයන් අතුරෙන් යම් අධිකරණයෙක්හි ඇවතට පැමිණි භික්ෂුතෙමේද චොදක භික්ෂු තෙමේද මනාකොට තමාම (තමන්ගේ දොෂය) පරීක්ෂා නොකෙරෙත්ද, මහණෙනි, ඒ අධිකරණයෙහිලා මෙය අවශ්‍යයෙන් වියයුතුයි. (එනම්) ඒ අධිකරණය දීර්ඝ භාවයට නපුරු බවට, කර්කශ භාවයට පැමිණෙන්නේය, භික්ෂූහු තුමූද සැපසේ වාසය නොකරන්නාහුය (යන මේ වසයෙනි).

2. "මහණෙනි, යම් අධිකරණයෙක්හි ඇවතට පැමිණි භික්ෂු තෙමේද චොදක භික්ෂු තෙමේද මනාකොට තුමූම තමන් පරීක්ෂා කෙරෙත්ද, මහණෙනි, ඒ අධිකරණය දීර්ඝ භාවයට කෲරභාවයට කර්කශ භාවයට නොපැමිණෙන්නේය, භික්ෂූහු තුමූද සැපසේ වාසයකරන්නාහු යන මේ කාරණය අවශ්‍යයෙන් වන්නේය.

3. "මහණෙනි, ඇවතට පැමිණියාවූ භික්ෂුතෙමේ කෙසේ නම් තෙමේම තමන්ගේ දොෂය පරීක්ෂාකෙරේද? වරදට පැමිණි මහණ තෙමේ මෙසේ පරීක්ෂා කෙරෙයි: 'මම වනාහි කායද්වාරයෙන් කිසියම් ලෙශමාත්‍රවූ ඇවතකට පැමිණියෙම්ද, කායද්වාරයෙන් කිසියම් ලෙශමාත්‍රවූ අකුශලයකට පැමිණෙන්නාවූ මා ඒ (චොදක) භික්ෂුතෙම දුටුවේය. (ඉදින්) මම කාය ද්වාරයෙන් කිසියම් ලෙශ මාත්‍රවූ අකුශලයකට නොපැමිණියේනම් ඒ මහණතෙම කායද්වාරයෙන් කිසියම් ලෙශමාත්‍රවූ අකුශලයකට නොපැමිණියේ නම් ඒ මහණතෙම

කායද්වාරයෙන් කිසියම් ලෙශමාත්‍රවූ අකුශලයකට පැමිණෙන්නාවූ මා නොදක්නේය. යම් හෙයකින් වනාහි මම කායද්වාරයෙන් කිසියම් ස්වල්ප මාත්‍රවූ ඇවතකට පැමිණියෙම්ද, එහෙයින්ම ඒ මහණතෙම කයින් කිසියම් ස්වල්ප මාත්‍රවූ අකුශලයකට පැමිණෙන්නාවූ මා දුටුයේය. ඒ භික්ෂුතෙම කයින් කිසියම් ලෙශමාත්‍රවූ ඇවතකට පැමිණෙන්නාවූ මා දැක නොසතුටු සිත් ඇත්තේ විය. නොසතුටු සිත් ඇත්තේම ඒ මහණතෙම නොසතුටු සිතින් යුත් වචන මට කීවේය. ඒ භික්ෂුව විසින් නොසතුටු සිතින් යුත් වචන කියන ලද්දාවූ මම නොසතුටු සිත් ඇත්තේ වීමි. නොසතුටු සිත් ඇත්තේම අනුන්ට කීයෙමි. මෙසේ ඒ අධිකරණයෙහිවූ අපරාධය තෙම මාම මැඩගෙණ ඉක්මවා ගියේය. (කෙසේදයත්) තීරුව ගෙවිය යුතු තැන පසුකොට තීරුව නොගෙවා ගෙණගිය භාණ්ඩයක් නිසා තීරුව දියයුතු අය (තමා කළ) ඒ අපරාධයෙන් මඩිනු ලබන්නාක් මෙනි.”

4. “මහණෙනි, මෙසේ ඇවතටද පැමිණියාවූ මහණ තෙම මනාකොට තෙමේම තමන් පරීක්ෂා කෙරෙයි. මහණෙනි, චෝදක භික්ෂු තෙමේ මනාකොට තෙමේම තමන් කෙසේ නම් පරීක්ෂා කෙරේද? මහණෙනි, මේ ශාසනයෙහි චොදක භික්ෂු තෙමේ මෙසේ පරීක්ෂා කෙරෙයි (කෙසේද?) වරදකළ මේ භික්ෂු තෙම වනාහි කායද්වාරයෙන් කිසියම් ලෙශමාත්‍රවූ අකුශලයකට පැමිණියේය. කයින් කිසියම් ලෙශමාත්‍රවූ අකුශලයකට පැමිණෙන්නාවූ ඒ මේ මහණ (මම) දුටුයෙමි. මේ මහණ තෙම කයින් කිසියම් ලෙශමාත්‍රවූ අකුසලයකට ඉදින් නොපැමිණියේ නම් කයින් කිසියම් ලෙශමාත්‍රවූ අකුසලයකට පැමිණෙන්නාවූ මේ මහණ (මම) නොදක්නෙමි යම් හෙයකින් වනාහි මේ මහණතෙම කයින් කිසියම් ලෙශමාත්‍රවූ අකුසලයකට පැමිණියේද එහෙයින්ම කයින් කිසියම් ලෙශමාත්‍රවූ අකුසලයකට පැමිණෙන්නාවූ මේ මහණ (මම) දුටුයෙමි. කයින් කිසියම් ලෙශමාත්‍රවූ අකුසලයකට පැමිණෙන්නාවූ මේ මහණ දැක (මම) ද නොසතුටු සිත් ඇත්තේවීමි. නොසතුටු සිත් ඇත්තේම මම මේ මහණහුට නොසතුටු සිතින් යුත් වචන කීයෙමි. මේ

මහණතෙම විසින් නොසතුටු තෙපුල් කියන ලද්දේම නොසතුටු සිත් ඇත්තෙක් වූයේය. නොසතුටු සිත් ඇත්තේම අනුන්ට කීයේය. මෙසේ භාණ්ඩයක් නිසා (වරදට පැමිණි) සුංවත් දෙන්නෙකු මැඩගෙණ (තමා කළ අපරාධය) යන්නාක් මෙන් මා කළ දෙයෙහි දොෂය මා ම මැඩගෙණ සිටියේය' කියායි.

5. "මහණෙනි, මෙසේ චොදක භික්ෂු තෙම (වනාහි) තමාම තමන් ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි.

"මහණෙනි, යම් අධිකරණයෙක්හි ඇවතට පැමිණි (ඇවැත්) භික්ෂුතෙමේද චොදක භික්ෂුතෙමේද මනාකොට තමාම තමන් ප්‍රත්‍යවෙක්ෂා නොකරත්ද, මහණෙනි, ඒ අධිකරණය දිර්ඝභාවයට, රළුබස් ඇතිබවට, අතින් පයින් පහරදීම් ආදියට පැමිණෙන්නේයයිද භික්ෂූ තුමුත් සැපසේ වාසය නොකරන්නාහුයයිද අවශ්‍යයෙන් බලාපොරොත්තු විය යුතුයි. මහණෙනි, යම් අධිකරණයෙක්හි ඇවතට පැමිණි භික්ෂුතෙමේද චොදක භික්ෂු තෙමේද මනාකොට තුමූම තමන් ප්‍රත්‍යවෙක්ෂා කෙරෙත්ද, මහණෙනි, ඒ අධිකරණය දීර්ඝ භාවයට රළුබස් ඇති බවට අත් පා ආදියෙන් පහරදීම ආදි කර්කශ භාවයට නොපැමිණෙන්නේයයිද භික්ෂූහුත් සැපසේ වාසය කරන්නාහුයයිද අවශ්‍යයෙන් බලාපොරොත්තු විය යුතුයි"

6. **අධම්ම චරියා සූත්‍රය** 1. එකල්හි (නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ) එක්තරා බ්‍රාහ්මණයෙක් තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි එළඹීයේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූයේය, සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ (සතුටුසාමීචි) කථාව ඉවරකොට එකත්පසෙක හුන්නාවූ ඒ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකෙළේය.

2. "භවත් ගෞතමයන් වහන්ස, මෙලොව යමක් හෙතුකොටගෙණ ඇතැම් සත්ත්වයෝ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි අපාය නම්වූ විනිපාත නම්වූ නරකයෙහි උපදිත් නම් ඒ හේතුව කවරේද; ඒ ප්‍රත්‍යය කවරේද?"

3. බ්‍රාහ්මණය, අධර්මචර්‍ය්‍යාව හෙතුකොටගෙණ මෙසේ මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ ශරීරයාගේ භෙදයෙන්

පටුන



මරණින් මත්තෙහි අපාය නම්වූ දුගති නම්වූ විනිපාත නම්වූ නරකයෙහි උපදිත්."

4. "භවත් ගෞතමයන් වහන්ස, එසේනම් යමක් හේතු කොටගෙණ මෙලොව ඇතැම් සත්ත්වයෝ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාතවූ ස්වර්ගලොකයෙහි උපදිත් නම් ඒ හේතු කවරේද, ඒ ප්‍රත්‍යය කවරේද?"

5. "බ්‍රාහ්මණය, ධර්මචර්‍ය්‍යා නම් සමචර්‍ය්‍යාව හේතු කොටගෙණ මෙසේ මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සුගති නම් ස්වර්ග ලොකයෙහි උපදිත්"

6. "භවත් ගෞතමයන් වහන්ස, (නුඹවහන්සේගේ දෙශනාව) ඉතා යහපති, භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, යටිකුරුකොට තබනලද්දක් යම්සේ උඩුකුරුකොට තබන්නේද, වසන ලද්දක් යම්සේ එළිදරව් කරන්නේද, මංමුළාවූවෙකුට යම්සේ මාර්ගය කියන්නේද, ඇස් ඇත්තාහු රූපයන් දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් යම්සේ ඔසවන්නේද එපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරණලද්දේය. මේ මම් භවත් ගෞතමයන් වහන්සේද ධර්මයද භික්ෂු සංඝයාද සරණයෙමි. භවත් ගෞතම තෙමේ අද පටන් දිවිහිමි කොට සරණ ගියාවූ උපාසකයෙකු කොට මා දරණසේක්වා"

7. **ජාණුස්සොණි සූත්‍රයː-** 1. එකල්හි ජානුස්සොණි බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ (සතුටු සාමිචි) කථාව ඉවරකොට එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ඒ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකෙළේය.

2. (මේ ඡෙදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

3. "බ්‍රාහ්මණය, කරණලද බැවින්ද, නොකරණලද බැවින්ද මෙසේ මෙලොව ඇතැම් සත්ත්වයෝ ශරීරයාගේ භේදයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මරණින් මත්තෙහි අපාය නම්වූ, දුර්ගති නම්වූ, විනිපාත නම්වූ නරකයෙහි උපදිත්"

**4.** (මේ ඡේදය මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

**5.** "බ්‍රාහ්මණය, කරණලද බැවින්ද නොකරණලද බැවින්ද, මෙසේ මෙලොව ඇතැම් සත්වයෝ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සුගති නම්වූ ස්වර්ගලොකයෙහි උපදිත්"

**6.** "භවත් ගෞතමයන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණ ලද්දාවූ, විස්තර වශයෙන් අර්ථය විභාග නොකරණ ලද්දාවූ මේ ධර්මයාගේ අර්ථය විස්තර වශයෙන් මම නොදනිමි. භවත් ගෞතමයන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණ ලද්දාවූ විස්තර වශයෙන් අර්ථය විභාග නොකරණලද්දාවූ මේ ධර්මයාගේ අර්ථය විස්තර වශයෙන් යම්සේ මම දැනගනිම්ද ඒ භවත් ගෞතමතෙම මට ධර්මය දෙශනා කරණසේක් නම් ඒ ඉතා මැනව."

**7.** "බ්‍රාහ්මණය, එසේවීනම් අසව, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමි" ජානුස්සොණි බ්‍රාහ්මණ තෙමේ "පින්වතුන් වහන්ස, එසේ යහපතැ"යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්නේය. භාග්‍යවත් තෙමේ මේ වදාළසේක.

**8.** "බ්‍රාහ්මණය, මෙලොව ඇතැමෙකු විසින් කාය දුශ්චරිතය කරණ ලද්දේ වේද, කායදුශ්චරිතය නොකරණ ලද්දේ වේද, වාග් දුශ්චරිතය කරණලද්දේ වේද, වාග් දුශ්චරිතය නොකරණ ලද්දේ වේද, මනොදුශ්චරිතය කරණ ලද්දේ වේද, මනොදුශ්චරිතය නොකරණ ලද්දේ වේද, බ්‍රාහ්මණය, මෙසේ වනාහි කළ බැවින්ද නොකළ බැවින්ද මෙසේ මෙලොව ඇතැම් සත්වයෝ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි අපාය නම්වූ, දුර්ගති නම්වූ, විනිපාත නම්වූ නිරයෙහි උපදිත්. බ්‍රාහ්මණය, මෙලොව ඇතැමෙකු විසින් කායසුචරිතය කරණ ලද්දේ වේද, කාය දුශ්චරිතය නොකරණලද්දේ වේද, වාග්සුචරිතය කරණ ලද්දේ වේද, වාග්දුශ්චරිතය නොකරණ ලද්දේ වේද, මනොසුචරිතය කරණ ලද්දේ වේද, මනොදුශ්චරිතය නොකරණ

ලද්දේ වේද බ්‍රාහ්මණය, එපරිද්දෙන් කරන ලද හෙයින්ද නොකරන ලද හෙයින්ද මෙසේ මෙලොව ඇතැම් සත්ත්වයෝ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සුගති නම්වූ, ස්වර්ග නම්වූ ලොකයෙහි උපදිත්.”

9. (මේ ඡෙදය මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

8. **ආනන්දපඤ්හ සූත්‍රයඃ-** 1 ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවත් බුදුරජ යම් තැනෙක්හිද එහි එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වනාකොට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළසේක. “ආනන්දය, කායදුශ්චරිතයද වාග්දුශ්චරිතයද මනොදුශ්චරිතයද එකාන්තයෙන් නොකටයුතුයයි මම කියමි”

2. “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ කායදුශ්චරිතයද වාග්දුශ්චරිතයද මනොදුශ්චරිතයද එකාන්තයෙන් නොකටයුතුයයි ප්‍රකාශකරණ ලද්දේද, නොකටයුතුවූ ඒ කරණු ලබන කල්හි කිනම් දොෂයෙක් අවශ්‍යයෙන් ඇති වන්නේද?”

3. “ආනන්දය, මා විසින් යම් මේ කායදුශ්චරිතයද වාග් දුශ්චරිතයද මනොදුශ්චරිතයද ඒකාන්තයෙන් නොකට යුතුයයි ප්‍රකාශකරණ ලද්දේද, නොකටයුතුවූ එය කරණු ලබන කල්හි මේ ආදීනවය අවශ්‍යයෙන් ඇතිවිය යුතුයි. (කුමක්ද?) තෙමේද තමන්ට දොෂ කියයි. දැන නින්දා කරත්. (තමන් පිළිබඳ) ලාමකවූ කීර්තිශබ්දයක් වෙසෙසින් උස්ව පැනනඟී, සිහිමුළාව මැරෙයි. ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි අපාය නම්වූ, දුර්ගති නම්වූ, විනිපාත නම් වූ නරකයෙහි උපදී ආනන්දය, මවිසින් යම් මේ කායදුශ්චරිතයද වාග් දුශ්චරිතයද, මනොදුශ්චරිතයද ඒකාන්තයෙන් නොකටයුතුයයි ප්‍රකාශ කරණ ලද්දේද, එය කරණු ලබන කල්හි මේ දොෂය තෙම අවශ්‍යයෙන් විය යුතුයි.

“ආනන්දය, මම කායසුචරිතයද වාග්සුචරිතයද මනො සුචරිතයද ඒකාන්තයෙන් කටයුතුයයි කියමි”

4. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ කාය සුචරිතයද, වාග් සුචරිතයද, මනො සුචරිතයද, ඒකාන්තයෙන් කටයුතුයයි ප්‍රකාශකරණ ලද්දේද, කටයුතුවූ එය කරණු ලබන කල්හි කවර ආනිසංසයක් බලාපොරොත්තුවිය යුතුද"?

5. "ආනන්දය, මවිසින් යම් මේ කායසුචරිතයද, වාග්සුචරිතයද මනොසුචරිතයද, ඒකාන්තයෙන් කටයුතුයයි ප්‍රකාශකරණ ලද්දේද, කටයුතුවූ එය කරණුලබන කල්හි මේ ආනිසංසය බලාපොරොත්තුවිය යුතුයි. (කුමක්ද?) තෙමේද තමන්ට දොස් නොකියයි නුවණැත්තෝ දැන ප්‍රශංසා කෙරෙත්. යහපත්වූ කීර්තිශබ්දයක් වෙසෙසින් උස්ව පැනනගී. සිහි මුළාබවක් නැතිව කළුරිය කෙරෙයි, ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදී, ආනන්දය, මවිසින් යම් මේ කායසුචරිතයද වාග්සුචරිතයද, මනො සුචරිතයද ඒකාන්තයෙන් කටයුතුයයි ප්‍රකාශකරණ ලද්දේද, කටයුතුවූ එය කරණු ලබන කල්හි මේ ආනිසංසය බලාපොරොත්තු වියයුතුයි."

9. **අකුසලප්පහාන සූත්‍රය:-** "මහණෙනි, අකුසලය දුරුකරව්. මහණෙනි, අකුසලය දුරුකිරීමට හැක්කේය. මහණෙනි, ඉදින් අකුශලය දුරුකරන්ට නොහැකිවන්නේ නම්, 'මහණෙනි, අකුසලය දුරුකරව්' යයි මම මෙසේ නොකියමි. මහණෙනි, යම්හෙයකින් වනාහි අකුසලය දුරුකරන්ට හැකිවන්නේද එහෙයින්ම 'මහණෙනි, අකුසලය දුරුකරව්' යයි මම මෙසේ කියමි. මහණෙනි, මේ අකුසලයද දුරුකරන ලද්දේ අහිත පිණිස, දුක් පිණිස පවත්නේ නම් 'මහණෙනි, අකුසලය දුරුකරව්' යයි මම මෙසේ නොකියන්නෙමි මහණෙනි, යම් හෙයකින් අකුසලය හිත පිණිස, සැප පිණිස පවතීද, එහෙයින්ම 'මහණෙනි, අකුසලය දුරුකරව්' යයි මම මෙසේ කියමි"

10. **කුසලභාව සූත්‍රය:-** "මහණෙනි, කුසලය වඩව්, මහණෙනි, කුසලය වඩන්නට හැක්කේය. මහණෙනි, ඉදින් කුසලය වඩන්නට නොහැකිවන්නේ නම් 'මහණෙනි, කුසලය වඩව්' යයි මම මෙසේ නොකියන්නෙමි. මහණෙනි, යම්හෙයකින්

වනාහි කුසලය වඩන්නට හැක්කේද, එහෙයින්ම 'මහණෙනි, කුසලය වඩව් යයි මම මෙසේ කියමි. මහණෙනි, මේ කුසලයද වඩන ලද්දේ අවැඩ පිණිස, දුක් පිණිස පවත්නේ නම්, 'මහණෙනි, කුසලය වඩව්' යයි මම නොකියන්නෙමි. මහණෙනි, යම්හෙයකින් වනාහි කුසලය වඩනලද්දේ වැඩ පිණිස සැප පිණිස පවතීද, එහෙයින්ම 'මහණෙනි, කුසලය වඩව්' යයි මම මෙසේ කියමි."

11. **සම්මොස සූත්‍රයඃ-** "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් සද්ධර්මයාගේ විනාශය පිණිස අතුරුදන්වීම පිණිස පවතිත්. කවර දෙදෙනෙක්ද යත්ඃ වරදවා ගන්නාලද පාලි පදයද වරදවා පමුණුවනලද්දාවූ අර්ථයද, මහණෙනි, පිළිවෙළ වරදවා ගන්නාලද්දාවූ පදව්‍යඤ්ජනයාගේ අර්ථයද දුකසේ දැනගත යුතුය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනවනාහි සද්ධර්මශාසනයාගේ විනාශය පිණිස, අතුරුදන්වීම පිණිස, පවතිත්"

12. **අසම්මොස සූත්‍රය-** "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් ධර්මයාගේ චිරස්ථිතිය පිණිස, අවිනාශය පිණිස, අතුරුදන්නොවීම පිණිස පවතිත්. කවර දෙදෙනෙක්ද යත්ඃ පිළිවෙළ නොයික්මවා දෙශනා පාලියද, පරිපාටිය නොපෙරළා ගන්නා ලද අර්ථයද යන දෙදෙනයි. මහණෙනි මනාකොට ගන්නා ලද්දාවූ පදව්‍යඤ්ජනයාගේ අර්ථයද මනාකොට දතහැකිවේ. මේ ධර්මයෝ දෙදෙන වනාහි ශාසනයාගේ චිරස්ථිය පිණිස අවි නාශය පිණිස අතුරුදන් නොවීම පිණිස පවතිත්."

(දෙවෙනි අධිකරණ වර්ගය නිමි.)

---

## 3. බාල වර්ගය

1. **බාලඅම්මය සූත්‍රයඃ-** "මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්ඃ යමෙක් දොෂය

දොෂ වශයෙන් නොදකීද, යමෙක් වරද දෙසන්නාහුගේ දොෂය දහම්වූ පරිද්දෙන් නොපිළිගණීද මහණෙනි, මේ දෙදෙන වනාහි බාලයෝ වෙත්."

**2. පණ්ඩිත සූත්‍රයः-** "මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්ः යමෙක් දොෂය දොෂ වශයෙන් දකීද, යමෙක් වරද දෙසන්නහුගේ දොෂය දහම්වූ පරිද්දෙන් පිළිගණීද මහණෙනි, මේ දෙදෙන වනාහි පණ්ඩිතයෝ වෙත්"

**3. දුට්ඨ සූත්‍රයः-** "මහණෙනි, මේ දෙදෙනෙක් තථාගතයන් වහන්සේට අසත්‍යයෙන් දොස් නගත්. කවර දෙදෙනෙක්ද යත්ः අභ්‍යන්තරයෙහි පිහිටි දොස් ඇත්තාවූ ද්වෙෂයෙන් දූෂිතවූ පුද්ගලතෙමද, නොමනාව ගන්නාලද බැවින් (නුවණ නැති) සැදැහැවත් පුද්ගල තෙමේද යන දෙදෙනයි. මහණෙනි, මේ දෙදෙන වනාහි තථාගතයන් වහන්සේට අසත්‍යයෙන් දොස් නගත්."

**4. භාසිත සූත්‍රයः-** "මහණෙනි, මේ දෙදෙනෙක් තථාගතයන් වහන්සේට අසත්‍යයෙන් දොස් නගත්. කවර දෙදෙනෙක්ද යත් යමෙක් තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්ද, ප්‍රකාශ නොකරණලද්ද තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්දේය, ප්‍රකාශකරණ ලද්දේයයි කියාද, යමෙක් තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්ද, ප්‍රකාශකරන ලද්ද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේය, ප්‍රකාශ නොකරණ ලද්දේයයි කියාද, මහණෙනි, මොහු දෙදෙන වනාහි තථාගතයන් වහන්සේට අසත්‍යයෙන් දොස් නගත්."

**5. අනබ්භාවික්ඛණ සූත්‍රයः-** "මහණෙනි, මෙ දෙදෙනෙක් තථාගතයන්වහන්සේට අසභ්‍යයෙන් දොස් නොකියත්. කවර දෙදෙනෙක්දයත්ः යමෙක් තථාගතයන් වහන්සේ විසින් නොවදාරණලද්ද, ප්‍රකාශ නොකරණලද්ද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේය, ප්‍රකාශ නොකරණ ලද්දේයයි කියාද, යමෙක් තථාගතයන් වහන්සේ විසින් වදාරණලද්ද ප්‍රකාශ කරනලද්ද තථාගතයන් වහන්සේ විසින් වදාරණලද්දේය,

ප්‍රකාශකරණ ලද්දේයයි කියාද, මහණෙනි, මෙ දෙදෙන වනාහි තථාගතයන් වහන්සේට අසත්‍යයෙන් දොස් නොකියත්."

6. **නෙයත්ථ සූත්‍රයː-** "මහණෙනි, මේ දෙදෙනෙක් තථාගතයන් වහන්සේට අසත්‍යයෙන් දොස් කියත්. කවර දෙදෙනෙක්ද යත්; යමෙක් විස්තර කළයුතු අර්ථය ඇති සූත්‍රාන්තය පමුණුවන ලද්දාවූ අර්ථ විස්තර ඇති සූත්‍රාන්තයයි ප්‍රකාශ කෙරේද, යමෙක් අර්ථය ඇති විස්තර කියා දෙනලද සූත්‍රාන්තය විස්තර කළ යුතු අර්ථය ඇති සූත්‍රාන්තයයි ප්‍රකාශ කෙරේද, මහණෙනි, මේ දෙදෙන වනාහි තථාගතයන් වහන්සේට අසත්‍යයෙන් දොස් කියත්."

7. **නීතත්ථ සූත්‍රයː-** "මහණෙනි, මේ දෙදෙනෙක් තුමූ තථාගතයන් වහන්සේට අසත්‍යයෙන් දොස් නොකියත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් විස්තර කළයුතු අර්ථ ඇති සූත්‍රාන්තය විස්තර කියාදෙනලද සූත්‍රාන්තයයි දක්වයිද, යමෙක් විස්තර කරණලද සූත්‍රාන්තය විස්තර කළයුතු අර්ථය ඇති සූත්‍රාන්තයයි දක්වයිද, මහණෙනි, මේ දෙදෙන වනාහි තථාගතයන් වහන්සේට අසත්‍යයෙන් දොස් නොකියත්."

8. **පටිච්ඡන්න කම්මන්ත සූත්‍රයː-** "මහණෙනි, වැසුණාවූ හෙවත් පාප කර්ම ඇත්තහු විසින් ගති දෙකක් අතුරෙන් එක්තරා ගතියක් බලාපොරොත්තු විය යුතුයි. (එනම්) නරකය හා තිරිසන් යොනිය (යන දෙකින් එකකි."

9. **අපටිච්ඡන්න කම්මන්ත සූත්‍රයː-** "මහණෙනි, (නොවැසුණාවූ) හෙවත් කුශලධර්ම ඇත්තහු විසින් ගති දෙකක් අතුරෙන් එක්තරා ගතියක් බලාපොරොත්තු විය යුතුයි. දෙව ගතිය හා මනුෂ්‍ය ගතිය (යන දෙකින් එකකි.)"

10. **මිච්ඡාදිට්ඨික සූත්‍රයː-** "මහණෙනි, මිසදිටු ගත්තහු විසින් ගති දෙකක් අතුරෙන් එක්තරා ගතියක් බලාපොරොත්තු විය යුතුයි. නරකය හෝ තිරිසන් යොනිය හෝ (යන දෙකින් එකකි.)"

11. **සම්මාදිට්ඨික සූත්‍රයː-** මහණෙනි, සම්‍යක්දෘෂ්ටිකයා විසින් ගති දෙකක් අතුරෙන් එක්තරා ගතියක් බලාපොරොත්තු වියයුතුයි. දෙවගතිය හා මානුසික ගතිය (යන දෙකින් එකකි)"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

12. **දුස්සීලපටිග්ගහන සූත්‍රයඃ-** "මහණෙනි, දුශ්ශීල පුද්ගලයා පිළිගන්නාවූ (ස්ථාන) දෙකක් වෙත්. (එනම්,) නරකය හා තිරිසන් යොනිය."

13. **සීලපටිග්ගහන සූත්‍රයඃ-** "මහණෙනි, සිල්වත් පුද්ගලයා පිළිගන්නාවූ (ස්ථාන) දෙකක් වෙත්. දෙව්ලොව හා මිනිස් ලොවය."

14. **අරඤ්ඤ සූත්‍රයඃ-** "මහණෙනි, මම කරුණු දෙකක් බලමින් ආරණ්‍ය සෙනාසනයන්ද මනුෂ්‍ය වාසයෙන් තොරවූ තැන්හි සෙනාසනයන්ද ගම්වලින් ඉතා දුරින් පිහිටි සෙනාසනයන්ද සෙවනය කරමි. කවර කරුණු දෙකක්ද යත්, මගේම මෙලොව සැප විහරණය හා පසුව ඇතිවෙන ජන සමූහයාහට අනුකම්පාවය."

15. **විජ්ජාභාගිය සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් (මාර්ගඥානය නම්) විද්‍යාව භජනය කරන්නෝ වෙත්. කවර දෙදෙනෙක්ද යත්, සමථය නම් හිතේ එකඟ භාවයද, විදර්ශනාව යයි කියනලද සංස්කාර ඥානයද යන දෙදෙනයි. මහණෙනි, සමථය වඩනලද්දේ කවර අර්ථයක් සම්පාදනය කරයිද? චිත්තය වැඩෙයි. (මාර්ග) චිත්තය වඩනලද්දේ කවර අර්ථයක් සලසාද? යම් රාගයක්හි ඇලේද, ඒ රාගය පහවෙයි.

2. "මහණෙනි, විදර්ශනාව වඩනලද්දේ කවර අර්ථයක් සම්පාදනය කෙරේද? ප්‍රඥාව (මාර්ග ප්‍රඥාව) වැඩෙයි. ප්‍රඥාව වඩනලද්දේ කවර අර්ථයක් සිද්ධ කෙරේද? යම් අවිද්‍යාවක් වේද එය ප්‍රහීණවෙයි. මහණෙනි, රාගයෙන් කිලුටු කරණලද්දාවූ සිතද (කෙලෙසුන් කෙරෙන්) නොමිදෙයි. අවිද්‍යාවෙන් කිලුටු කරණලද්දාවූ ප්‍රඥාවද නොවැඩෙයි. මහණෙනි, මෙසේ වනාහි රාගයෙහි නොඇලීමෙන් චිත්ත විමුක්තියද (ඵලසමාධියද), අවිද්‍යා විරාගයෙන් ප්‍රඥාවිමුක්තියද ඇතිවේ"

**(තුන්වැනි බාලවර්ගය නිමි)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 4. සමචිත්ත වර්ගය.

1. **භූමි සූත්‍රය:-** "මහණෙනි, අසත්පුරුෂ භූමියද සත් පුරුෂ භූමියද තොපට දෙශනා කරන්නෙමි ඒ අසව්, මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි."

"එසේය ස්වාමීනි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, අසත්පුරුෂ භූමිය කවරේද? මහණෙනි, අසත්පුරුෂ තෙම කළ උපකාර නොදන්නේ වෙයි. කළගුණ ප්‍රකට කොට නොදන්නේ වෙයි. මහණෙනි, යම් මේ කළගුණ නොසැලකීමක් වේද, කළගුණ නොසැලකීම් භාවයක් වේද මේ කාරණය අසත්පුරුෂයන් විසින් වර්ණනා කරණ ලද්දේය. මහණෙනි, යම් මේ කළගුණ නොසැලකීමක්වේද, කළගුණ නොසැළකීම් භාවයක් වේද, මේ කාරණය සම්පූර්ණයෙන් අසත්පුරුෂ භූමි නම් වේ.

3. "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි කළ උපකාර දන්නේ වෙයි. කළගුණ ප්‍රකටසේ දන්නේ වෙයි. යම් මේ කළගුණ දන්නා බවක්, ප්‍රකටසේ දන්නා බවක් වේද, මේ කාරණය සත්පුරුෂයන් විසින් වර්ණනා කරණ ලද්දේය. මහණෙනි, යම් මේ කළගුණ දන්නා භාවයක් වේද, කළගුණ ප්‍රකටසේ දන්නා භාවයක් වේද, සම්පූර්ණයෙන් මේ කාරණය සත්පුරුෂ භූමි නම්වේ."

2. **සුප්පතිකාර සූත්‍රය:-** "මහණෙනි, දෙදෙනෙකුන්හට සුදුසුසේ කළගුණ සැළකීම නොකළහැකියයි මම කියමි. කවර දෙදෙනෙකුන්ටද යත්, තමන් දාකළ මවටද ජනක පියාටද වෙත්.

2. "මහණෙනි, වර්ෂ සියයක් ආයු ඇත්තාවූ වර්ෂ සියයක් ජීවත්වන්නාවූ (පුතෙක්) එක් අංශයකින් මව පොෂණය කරන්නේද එක් අංශයකින් පියා පොෂණය කරන්නේද, හෙතෙම ඔවුන්ගේ ඇඟ ඉලීමෙන්, පිරිමැදීමෙන් නැවීමෙන්, අත්පා මැඩීම කිරීමෙන් ඔවුන්ට උපස්ථාන කෙරේද, එකී දෙමවුපියෝ එහිම හුන්නාහු මලමූත්‍ර පහ කෙරෙත්ද, මහණෙනි, (එපමණකිනුදු) මවුපිය දෙදෙනාට උපකාර කරණ ලද්දේ හෝ නොවේමය.

3. "මහණෙනි, යම් පුත්‍රයෙක් මව්පිය දෙදෙනා බොහෝ සප්තවිධ රත්නයන් ඇත්තාවූ මේ මහා පෘථුවියෙහි ඉසුරු බව හා අධිපති බව ඇත්තාවූ චක්‍රවර්ති රාජ්‍යයෙහි පිහිටු වන්නේද (එපමණකිනිදු මහණෙනි, මවුපිය දෙදෙනාට උපකාර කරණ ලද්දේ හෝ කළගුණ සලකන ලද්දේ හෝ නොවේමය ඊට හේතු කවරේද? මහණෙනි, මවුපිය දෙදෙනා පුත්‍රයන්ට බොහෝ උපකාර ඇත්තෝය, ඔවුන් වර්ධනය කරන්නෝය, පොෂණය කරන්නෝය, මේ ලෝකය දක්වන්නෝය එහෙයිනි."

3. **කිංවාදි සූත්‍රය**:- 1. ඉක්බිති එක්තරා බ්‍රාහ්මණයෙක් තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය, පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු සාමීචි කථාකොට එක් පසෙක උන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකෙළේය.

2. "භවත් ගෞතම තෙමේ කිනම් ලබ්ධි ඇත්තේද? කිනම් ප්‍රතිපත්තියක් ප්‍රකාශ කරන්නේද?"

"බ්‍රාහ්මණය, මම ක්‍රියාවාදී වෙමි. අක්‍රියාවාදීද වෙමි."

3. "භවත් ගෞතම තෙමේ කෙසේ නම් ක්‍රියාවාදීත් වේද, අක්‍රියාවාදීත් වේද?"

"බ්‍රාහ්මණය, මම වනාහි කායදුශ්චරිතයාගේද වාග්දුශ්චරිතයාගේද මනොදුශ්චරිතයාගේද නොකටයුතු බව කියමි. නොයෙක් ආකාර ලාමකවූ අකුශලධර්මයන් නොකට යුතු බව කියමි. බ්‍රාහ්මණය, මම වනාහි කායසුචරිතයාගේද වාක්සුචරිතයාගේද මනොසුචරිතයාගේද කිරීම කියමි. තුන්වැදෑරුම් වූ කුශලධර්මයන් කිරීම කියමි. බ්‍රාහ්මණය, මෙසේ මම වනාහි ක්‍රියාවාදීත් වෙමි, අක්‍රියාවාදීත් වෙමි."

4. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති. භවත් ගෞතම තෙමේ අද පටන් දිවිහිම්කොට සරණගියාවූ උපාසකයෙක් කොට මා දරණසේක්වා. (දැන වදාරණසේක්වා.)"

4. **දක්ඛිණෙය්‍ය සූත්‍රය:-** ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තෙනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ අනාථපිණ්ඩික ගෘහපති තෙම භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකෙළේය.

2. "ස්වාමීනි, ලොව සැදැහැවතුන්ගේ දන් ලැබීමට සුදුස්සෝ කීදෙනෙක් වෙත්ද? කොතැන්හි හෙවත් කවර පුද්ගලයෙකුට දන්දිය යුතුද?"

"ගෘහපතිය, දෙදෙනෙක් වනාහි ලොව දක්ෂිණාර්හයෝ වෙත් (එනම්) ශෛක්ෂපුද්ගලතෙමේද (සිල්වත් පෘථග්ජනයා සහ සෝවාන් පුද්ගලයා පටන් අර්හත් මාර්ගය පිළිපන් පුද්ගලයා) අශෛක්ෂ රහත් පුද්ගලතෙමේද (යන දෙදෙනයි). ගෘහපතිය, මේ දෙදෙන වනාහි දන්දීමට සුදුස්සෝය. තවද මේ පුද්ගලයන් කෙරෙහි දානය දියයුතුයි"

3. භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළසේක. සුගතවූ ශාස්තෘන්වහන්සේ මෙසේ වදාරා නැවත මේ ගාථාවද වදාළසේක.

> "මෙලොව (සප්තවිධ) ශෛක්ෂපුද්ගල තෙමේද අශෛක්ෂ පුද්ගලතෙමේද දන්දෙන්නවුන්ගේ දන් පිළිගැණීමට සුදුස්සෝ වෙත්. ඔවුහු කයින්ද වචනයෙන්ද නැවත සිතින්ද ඍජුවූවෝය. දන්දෙන්නවුන්ට ඔවුහු පින් කෙතයි එහි දෙනලද්ද මහත් ඵල වේ"

5. **සාරිපුත්ත සඤ්ඤොජන සූත්‍රය:-** 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහි වසන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම සැවැත්නුවර සමීපයෙහිවූ පූර්වාරාමයෙහි මිගාරමාතු නම්වූ (විශාඛා) උපාසිකාව විසින් කරවා පිළිගන්වනලද ප්‍රසාදයෙහි වැඩවාසය කෙරෙයි. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම "ඇවැත්නි, මහණෙනි" කියා භික්ෂූන් ඇමතුයේය. ඒ භික්ෂූහු තුමූ "ඇවැත්නි" කියා ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ට පිළිතුරු දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙම මෙසේ ප්‍රකාශ කෙළේය.

**2.** "ඇවැත්නි, අධ්‍යාත්ම සංයොජන ඇති පුද්ගලයාද (අද්ධ්‍යාත්ම නම් කාමභවයෙහි ඡන්දරාගය ඇත්තාවූ පුද්ගයා ද) බහිද්ධා සංයෝජන ඇති පුද්ගලයාද (බහිද්ධානම් රූපාරූප භවයන්හි ඡන්දරාගය ඇත්තාවූ පුද්ගලයාද) ප්‍රකාශකරන්නෙමි ඒ ශ්‍රවණය කරව්. මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි." ඒ භික්ෂූහු තුමූ "එසේය, පින්වතුන් වහන්සැ" යි ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන්ට පිළිතුරු දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙම මෙසේ වදාළේය: "ඇවැත්නි, අද්ධ්‍යාත්ම සංයෝජන ඇත්තාවූ පුද්ගලතෙම කවරේද?

**3.** "ඇවැත්නි, මේ සාසනයෙහි මහණතෙම සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂසංවර ශීලයෙන් යුක්තවූයේ, ආචාර ගොචර දෙකින් යුක්තවූයේ, ස්වල්පමාත්‍රවූ අකුශල ධර්මයන්හි බිය දක්නා සුලුව වාසය කෙරේද, ශික්ෂා පදයන් සමාදන්ව එහි හික්මේද,

**4.** "හෙතෙම ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි එක්තරා දිව්‍යනිකායෙක්හි උපදී. හෙතෙම එයින් චුතවූයේ යටට බස්නා ස්වභාව වූයේ, මේ මනුෂ්‍යාත්මභාවයට එන්නේ වේ. ඇවැත්නි මේ වනාහි අද්ධ්‍යාත්මික (ඔරම්භාගිය) සංයෝජනයෙන් (බැඳීමෙන්) යුක්තවූ යටට බස්නා සුලුවූ, මේ මනුෂ්‍යාත්මභාවයට එන්නාවූ පුද්ගලතෙමේයයි කියනු ලැබේ.

**5.** "ඇවැත්නි, බහිද්ධාසංයෝජනයෙන් (බැඳුමෙන්) යුක්තවූ පුද්ගලතෙමේ කවරේද?

(මෙහි මේ සූත්‍රයේ 3 වෙනි ඡෙදය යොදන්න.)

**6,** "හෙතෙම එක්තරා ශාන්තවූ චිත්තවිමුක්තියකට පැමිණ වාසය කෙරෙයි. හෙතෙම ශරීරයාගේ භෙදයෙන් පසු මරණින් මත්තෙහි එක්තරා දිව්‍ය නිකායෙක උපදී. හෙතෙම එයින් චුතවූයේ, පහළට නොබස්නා ස්වභාවවූයේ, මේ මිනිස් බවට නොඑන්නේ වේ. ඇවැත්නි, මේ වනාහි පහතට නොබස්නා ස්වභාවවූ මේ මිනිස් බවට නොඑන්නාවූ බාහිර සංයෝජනයෙන් යුක්තවූ පුද්ගලතෙමේයයි කියනුලැබේ

(මෙහි මේ සූත්‍රයේ 4 වෙනි ඡෙදය යොදන්න)

7. හෙතෙම කාමයන්හිම කලකිරීම පිණිස, නොඇලීම පිණිස, විනාශය පිණිස පිළිපන්නේවේ. හෙතෙම (තුන්) භවයන්හිම කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, විනාශය පිණිසද පිළිපන්නේවේ. හෙතෙම තෘෂ්ණාව ක්ෂයකිරීම පිණිස පිළිපන්නේ වේ. හෙතෙම ලොභය ක්ෂයකිරීම පිණිස පිළිපන්නේවේ. හෙතෙම ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි එක්තරා දිව්‍ය නිකායෙක්හි උපදී. හෙතෙම එයින් චුතවූයේ, අනාගාමි වූයේ, මේ මිනිසත් බවට නොඑන්නේ වේ. ඇවැත්නි, මේ වනාහි පහතට කාමභවයට) නොබස්නා ස්වභාව වූ, මේ මිනිසත් බවට නොඑන්නාවූ බාහිර සංයෝජනයෙන් යුක්තවූ, පුද්ගලතෙමේ යයි කියනු ලැබේ."

8. ඉක්බිත්තෙන් සමසිත් ඇත්තාවූ බොහෝවූ දෙවතාවෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක සිටියාහුය. එක්පසෙක සිටියාවූ මේ දෙවතාවෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළකළාහුය.

9. "ස්වාමීනි, මේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම පූර්වාරාමයෙහි මිගාරමාතෘප්‍රාසාදයෙහි භික්ෂූන්ට අද්ධ්‍යාත්ම සංයෝජනය ඇති පුද්ගලයාද බහිද්ධාසංයොජනය ඇති පුද්ගලයාද දේශනා කෙරෙයි. ස්වාමීනි, (එහිවූ) පිරිස්තොමෝ සතුටුසිත් ඇත්තීය. ස්වාමීනි, භාග්‍යවත් තෙමෙ අනුකම්පා කොට ආයුෂ්මත්වූ ශාරිපුත්‍ර ස්ථවිරතෙම යම්තැනෙක්හිද එතැන්හි පැමිණෙනසේක් නම් ඒ මැනව."

10. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භාවයෙන් ඉවසූ සේක. ඉක්බිත්තෙන් භාග්‍යවත් තෙමේ යම්සේ ශක්තිමත් පුරුෂයෙක් වූකලී හකුළුවන ලද්දාවූ අතක් දිගුකරන්නේ හෝ වේද, දිගුකරණ ලද්දාවූ අතක් හකුළුවන්නේ හෝ වේද, එපරිද්දෙන්ම ජේතවනාරාම විහාරයෙහි අතුරුදන්වූයේ පූර්වාරාමයෙහි මිගාරමාතෘප්‍රාසාදයෙහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් ඉදිරියෙහි පහළවූසේක. භාග්‍යවතුන් වහන්සේ පනවනලද අසුන්හි වැඩහුන්සේක. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේද භාග්‍යවතුන්

වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

11. "ශාරිපුත්‍රය, මෙහි සමාන සිත් ඇත්තාවූ බොහෝ දෙවතාවෝ මම යම් තැනෙක්හිද එතැන්හි පැමිණියාහුය. පැමිණ මා වැඳ එකත්පසෙක සිටියාහුය. ශාරිපුත්‍රය, එක් පසෙක සිටියාවූ ඒ දේවතාවෝ මට මෙසේ කීවාහුය. 'ස්වාමීනි, මේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම පූර්වාරාමයෙහි මිගාරමාතෘප්‍රාසාදයෙහි භික්ෂූන්ට අද්ධ්‍යාත්මසංයොජනයෙන් යුත් පුද්ගලයාද බහිද්ධාසංයොජනයෙන් යුත් පුද්ගලයාද දෙශනා කෙරෙයි. ස්වාමීනි, පිරිස්තොම තුටුපහටු සිත් ඇත්තීය. ස්වාමීනි, භාග්‍යවත්තෙමේ අනුකම්පාකොට ආයුෂ්මත්වූ ශාරිපුත්‍ර ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතැනට එළඹෙන සේක්වා, ශාරිපුත්‍රය, ඒ දෙවතාවෝ වනාහි දසදෙනෙක්වද, විසිදෙනෙක්වද, තිස්දෙනෙක්වද, සතළිස්දෙනෙක්වද, පණසදෙනෙක්වද, සැටදෙනෙක්වද, පිරිස් වශයෙන් රැස්ව ඉදිකටු තුඩක් හෙළන පමණ තන්හි සිටිත්. නමුත් එකිනෙකා නොපෙළෙත්.

12. "ශාරිපුත්‍රය, ඉදින් තොපට මේ කරුණු ගැන මෙබඳු සිතක් ඇතිවිය හැකියි. යම්හෙයකින් ඒ දේවතාවෝ දසදෙනෙක්වද, විසිදෙනෙක්වද, තිස්දෙනෙක්වද, හතළිස්දෙනෙක්වද, පනස්දෙනෙක්වද, සැටදෙනෙක්වද ඉදිකටු තුඩක් හෙළන පමණ තන්හිත් සිටිත්ද, එහෙත් එකිනෙකා නොපෙළෙත්ද, ඒකාන්තයෙන් එපරිද්දෙන් ඒ දෙවතාවන් විසින් (ඒ සමාපත්ති) සිත වඩනලද්දේ එහි (ඔවුන්ගේ දෙව ලොකයෙහිය) කියායි ශාරිපුත්‍රය, මේ කාරණය එසේ නොසැලකිය යුතුය. (මක්නිසාදයත්,) යම් හෙයකින් ඒ දෙවතාවෝ දසදෙනෙක්වද, විසිදෙනෙක්වද, තිස්දෙනෙක්වද, සතළිස්දෙනෙක්වද, පනස්දෙනෙක්වද, සැටදෙනෙක්වද ඉදිකටු තුඩක් හෙළන පමණ තන්හිත් සිටිත්ද, එහෙත් එකිනෙකා නොපෙළෙත්ද, ශාරිපුත්‍රය. ඒ දේවතාවන් විසින් එසේකිරීමට හැකිවනසේ (සමාපත්ති) සිතක් වඩනලද්දේ මේ ලොකයෙහිම නොහොත් මේ ශාසනයෙහිමය.

13. "ශාරිපුත්‍රය, එහෙයින් මේ කරුණෙහි මෙසේ හික්මිය යුතුයි, (කෙසේද?) 'සන්සුන් ඉඳුරන් ඇත්තෝ, සන්සුන් සිත් ඇත්තෝ වන්නෙමු'යි (කියායි). ශාරිපුත්‍රය, තොප විසින් හික්මියයුතු මෙසේමය. ශාරිපුත්‍රය, සන්හුන් ඉඳුරන් ඇත්තාවූ සන්සුන් සිත් ඇත්තාවූ තොපගේ කාය කර්මය ශාන්තවන්නේමය වාක්කර්මය ශාන්ත වන්නේමය, මනො කර්මය ශාන්තවන්නේමය. ශරිපුත්‍රය, 'සමාන බඹසර ඇත්තන් කෙරෙහි ශාන්තවූම කය සිත දෙකින් කරණ පූජාව පමුණුවන්නෙමු'යි තොප විසින් මෙසේම හික්මියයුතුයි. යමෙක් තුමූ මේ ධර්මදෙශනාව නොඇසුවාහුද ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ පිරිහුණාහුම වෙත්."

6. ආරාමදණ්ඩ සූත්‍රයː- 1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් මහාකච්ඡාන ස්ථවිරතෙම චරණ නම් නුවර කද්දම නම් විල්තෙර වාසය කරයි. එකල්හි වනාහි ආරාමදණ්ඩ නම් බ්‍රාහ්මණතෙම ආයුෂ්මත් මහාකච්චාන ස්ථවිරයන් වෙත පැමිණ සතුටුසාමීචි කථාකොට එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නවූ ඒ ආරාමදණ්ඩ බමුණු මහා කච්චාන ස්ථවිරයන්ට මේ කරුණ සැළකළේය.

2. "භවත් කච්චානයෙනි යමක් හේතුකොටගෙන ක්ෂත්‍රියයෝත් ක්ෂත්‍රියන් සමග විවාද කෙරෙත්ද, බ්‍රාහ්මණයෝත් බ්‍රාහ්මණයන් සමග විවාද කෙරෙත්ද ගෘහපතියෝත් ගෘහපතියන් සමග විවාද කෙරෙත්ද ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?

"බ්‍රාහ්මණය, කාමරාගයෙහි ඇතුල්වීමය, කාමරාගයෙන් බැඳීමය, කාමරාගයෙහි ගිජුවීමය, කාමරාගයෙන් සිත වැළඳ ගැන්මය, කාමරාගයෙහි ගැලීමය යන මේ හේතුකොටගෙණ ක්ෂත්‍රියයෝත් ක්ෂත්‍රියයන් සමග විවාද කෙරෙති. බමුණෝත් බමුණන් සමග විවාද කෙරෙති. ගහපතියෝත් ගහපතියන් සමග විවාද කෙරෙති"

3. "භවත් කච්චානයෙනි, යමක් හේතුකොටගෙන ශ්‍රමණයෝත් ශ්‍රමණයන් සමග විවාද කෙරෙත්ද, ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'බ්‍රාහ්මණය, දෘෂ්ටිරාගයෙහි ඇතුල්වීමය, දෘෂ්ටිරාගයෙන් බැඳීමය, දෘෂ්ටිරාගයෙන් ගිජුවීමය, දෘෂ්ටිරාගයෙන් සිත වැළඳගැන්මය, දෘෂ්ටිරාගයෙහි ගැලීසිටීමය යන මේ හේතුකොටගෙන ශ්‍රමණයෝත් ශ්‍රමණයන් සමග විවාද කෙරෙත්."

4. "භවත් කච්චානයෙනි, මෙම කාමරාගයෙහි ඇතුල් වීමය, කාමරාගයෙන් බැඳීමය, කාමරාගයෙහි ගිජුවීමය, කාම රාගයෙන් සිත වැළඳගැන්මය, කාමරාගයෙහි ගැලීමය යන මේ දේ ඉක්මෙව්වාවූ කිසිවෙක් ඇද්ද? මෙම දෘෂ්ටිරාගයෙන් ඇතුල්වීමය, දෘෂ්ටිරාගයෙන් බැඳීමය, දෘෂ්ටිරාගයෙන් ගිජුවීමය, දෘෂ්ටිරාගයෙන් සිත වැළඳගැන්මය දෘෂ්ටිරාගයෙහි ගැලී සිටීමය යන මේ දේ ඉක්මෙව්වාවූ කිසිවෙක් ඇද්ද?"

"බ්‍රාහ්මණය, කාමරාගයෙහි ඇතුල්වීමය, කාමරාගයෙන් බැඳීමය, කාමරාගයෙ ගිජුවීමය, කාමරාගයෙන් සිත වැළඳ ගැන්මය, කාමරාගයෙහි ගැලීමය යන මේ දේ ඉක්මෙව්වාවූද, මෙම දෘෂ්ටිරාගයෙහි ඇතුල්වීමය, බැඳීමය, ගිජුවීමය, සිත වැළඳගැන්මය, ගැලීමය යන මේ දේ ඉක්මෙව්වාවූද කිසිවෙක් ලෝකයෙහි ඇත්තේය"

5. "භවත් කච්චානයෙනි, මේ කාමරාගයෙහි ඇතුල් වීමය, බැඳීමය, ගිජුවීමය, සිත වැළඳගැන්මය ගැලීමය යන මේ දේ ඉක්මෙව්වාවූද මෙම දෘෂ්ටිරාගයෙහි ඇතුල්වීමය, බැඳීමය, ගිජුවීමය, සිත වැළඳගැන්මය, ගැලීමය යන මේ දේ ඉක්මෙව්වාවූද යම් කිසිවෙක් ලොව ඇත්නම් හෙතෙම කවරේද?"

"බ්‍රාහ්මණය, පූර්වදිශා ජනපදයන්හි සැවැත් නම් නුවරෙක් ඇත. අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ එහි දැන් වාසය කරණසේක. බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි මේ කාමරාගයෙහි ඇතුල්වීමය, බැඳීමය, ගිජුවීමය, සිත වැළඳගැන්මය, ගැලීමය යන මේ දේ ඉක්මගියේය මේ දෘෂ්ටිරාගයෙහි ඇතුල්වීමය, බැඳීමය ගිජුවීමය, සිත වැළඳගැන්මය, ගැලීමය යන මේ දේද ඉක්ම ගියසේක.

මෙසේ කී කල්හි ආරාමදණ්ඩ නම් බ්‍රාහ්මණතෙම හුනස්නෙන් නැගිටපියා උතුරුසළුව එකස්කොට දකුණු දණමඩල බිමගසා භාග්‍යවතුන් වහන්සේ යම් දිශාවෙක්හිද ඒ දිශාවට වැඳ නමස්කාරකොට (ඇඳිලිබැඳ) (මෙසේ) ප්‍රීතිවාක්‍යය පහළ කෙළේය. (කෙසේද යත්,) "යම් ඒ භාග්‍යවතුන් වහන්සේ කෙනෙක් මේ කාමරාගයෙහි ඇතුල්වීමය. ගිජුවීමය, බැඳීමය, සිත වැළඳගැන්මය, ගැලීමය, මේ දෘෂ්ටිරාගයෙහි ඇතුල්වීමය. බැඳීමය, ගිජුවීමය, සිත වැළඳගැන්මය, ගැලීමය යන මේ දේ ඉක්මගියසේක්ද, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාරවේවා

ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාරවේවා.

ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා.

"භවත් කාත්‍යායනයෙනි, භවත් කාත්‍යායනයෙනි, ඉතාම යහපත. භවත් කාත්‍යායනයෙනි, මුව යටිකුරුවකොට තබන ලද්දක් යම්සේ මුව උඩුකුරු කොට තබන්නේද, වසනලද්දක් යම්සේ විවෘත කරන්නේද, මංමුළාවූවෙකුට යම්සේ මාර්ගය කියන්නේද, ඇස් ඇත්තාහු රූපයන් දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් යම්සේ දල්වන්නේද, එපරිද්දෙන්ම භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ විසින් නොයෙක්ක්‍රමයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, මේ මම භවත් ගෞතමයන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද සරණයෙමි. භවත් කාත්‍යායන ස්ථවිර තෙමේ අද පටන් දිවිහිම්කොට සරණගියාවූ උපාසකයෙකු කොට මා දරණසේක්වායි.

**1. මධුරා සූත්‍රයඃ-** එක් සමයෙක්හි ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරතෙම මධුරා නම් නුවර ගුන්දා වනයෙහි වාසය කෙරෙයි. එකල්හි කණ්ඩරායන නම් බ්‍රාහ්මණ තෙමේ මහා කාත්‍යායන ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ එකත්පස්ව උන්නේය. එකත්පසෙක උන්නාවූ කණ්ඩරායණ

බ්‍රාහ්මණතෙම ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවීරයන්ට මෙසේ සැලකෙළේය.

2. "භවත් කාත්‍යායනයෙනි, මවිසින් මෙසේ අසන ලද්දේය. (කෙසේද යත්:) 'මහා කාත්‍යායන ශ්‍රමණතෙමේ (ජරාවෙන්) ජීර්ණවූ ජාතිමහල්ලකවූ, දීර්ඝ කාලයක් ඉක්මුණාවූ පශ්චිම වයසට පිළිවෙලින් පැමිණියාවූ බ්‍රාහ්මණයන් නොවඳියි, දැක හුනස්නෙන්ද නැඟීනොසිටියි, ආසනයෙන්ද, නොපවරයි' (කියායි). භවත් කාත්‍යායනයෙනි, ඒ මේ කරුණු එසේමය.

භවත් කාත්‍යායනයෝ (ජරාවෙන්) ජීර්ණවූ, වයොවෘද්ධවූ, ජාතිමහල්ලකවූ දීර්ඝ කාලයක් ඉක්මුණාවූ පශ්චිම වයසට පිළිවෙලින් පැමිණියාවූ බ්‍රාහ්මණයන් නොවඳියි, දැක හුනස්නෙන්ද නැඟී නොසිටියි, ආසනයෙන්ද, නොපවරත්ද, "භවත් කාත්‍යායනයෙනි, ඒ මේ කාරණය නුසුදුසුමය."

3. "බ්‍රාහ්මණය, (දතයුතු සියලු දේ) දන්නාවූ, (සියල්ල) දක්නාවූ, අර්හත්වූ, සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණලද්දාවූ වෘද්ධයෙන් වන කාරණයද තරුණයෙක් වන කාරණයද ඇත. බ්‍රාහ්මණය, ඉදින් අසූවයස් ඇත්තාවූ හෝ අනූවයස් ඇත්තාවූ හෝ උත්පත්තියෙන් අවුරුදු සියයක් ඇත්තාවූ හෝ වෘද්ධයක්වේද, එහෙත් හෙතෙමේ කාමයන් පරිභොග කෙරේද, ද්විවිධවූ කාමයන් මධ්‍යයෙහි වාසය කෙරේද, කාමදැවිල්ලෙන් හාත්පසින් දැවේද, කාම විතර්කයන් විසින් කනු (පෙළනු) ලැබේද, නොයෙක් කාමයන් සෙවීමෙහි උත්සාහවත් වේද, එසේ ඇතිකල්හි හෙතෙම බාලය වෘද්ධ නැත, යන කොටසට යෙයි (බාලයයි) සලකනු ලැබේ)

4. "බ්‍රාහ්මණය, ඉදින් තරුණ බැව් ඇති, මනාව කළුවූ කෙස් ඇති සොඳුරු යොවුන් වියෙන් සමන්විතවූ, (තෙතිස් වයස් නො ඉක්මවූ) පළමුවෙනි වයසින් යුක්තවූ, තරුණයෙක් වේද, එහෙත් හෙතෙම ද්විවිධ කාමයන් පරිභොග නො කෙරේද, කාමයන් මධ්‍යයෙහි නොවසාද, කාම දැවිල්ලෙන් හාත්පස නොදැවේද, කාම විතර්කයන්ගෙන් කනු (පෙළනු) නොලැබේද,

කාමයන් සෙවීමෙහි උත්සාහවත් නොවේද, එසේ ඇති කල්හි හෙතෙම පණ්ඩිතය, ස්ථවිරය යන කොටසට පැමිණේ”

5. මෙසේ වදාළ කල්හි කණ්ඩරායන නම් බ්‍රාහ්මණතෙම හුනස්නෙන් නැගිට උතුරුසළුව එකාංශකොට පොරවා. ‘තරුණවූ, භික්ෂූන්ගේ ‘පාදයන් හිසින් වඳී. පින්වතුන් වහන්සේලා වෘද්ධයෝය. වෘද්ධභූමියෙහි සිටියෝය, අපි තරුණයෝ වම්හ. තරුණභූමියෙහි සිටුම්හ.

“භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, ඉතාම යහපත. භවත් කාත්‍යායනයෙහි, මුව යටිකුරු කොට තබනලද්දක් යම්සේ මුව උඩුකුරුකොට තබන්නේද, වසන ලද්දක් යම්සේ විවෘත කරන්නේද, මංමුළාවූවෙකුට යම්සේ මාර්ගය කියන්නේද, ඇස් ඇත්තාහු රූපයන් දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් යම්සේ දල්වන්නේද එපරිද්දෙන්ම භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය දෙශනා කරණ ලද්දේය. භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, මේ මම භවත් ගෞතමයන් වහන්සේද, ධර්මයද භික්ෂු සංඝයාද සරණයෙමි. භවත් කාත්‍යායන ස්ථවිරතෙමේ අද පටන් දිවිහිම්කොට සරණ ගියාවූ උපාසකයෙකු කොට මා දරණසේක්වා.”

8. **චොරබල සූත්‍රයඃ-** “මහණෙනි, යම් කාලයෙක්හි සොරු බලවත් වූවාහුවෙත්ද, ඒකාලයෙහි රජවරු දුර්වලවූවාහු වෙත්. මහණෙනි, එකල්හි රජුට (ඇතුළු නුවරට සිතු කෙණෙහි) පිවිසෙන්නට හෝ (ඇතුළු නුවරින්) නික්ම යාමට හෝ පසල් දනව්වෙහි කටයුතු දේ පාලනය කිරීමට හෝ පහසු නොවේ. ඒ කාලයෙහි බ්‍රාහ්මණ ගෘහපතියන්ටද යන්නට හෝ පිටත්ව යන්නට හෝ බාහිර කර්මාන්තයන් පරීක්ෂා කිරීමට හෝ පහසු නොවෙයි.

2. “මහණෙනි, එපරිද්දෙන්ම යම් කාලයෙක්හි පාප භික්ෂූහු බලවත් වූවාහු වෙත්ද, ඒ කාලයෙහි ප්‍රියශිලී භික්ෂූහු දුර්වල වූවාහු වෙත්. මහණෙනි, එකල්හි ප්‍රියශීලී භික්ෂූහු නිශ්ශබ්දවූවාහු සඟමැද තුෂ්ණිම්භූතව දුර්මුඛව සිටිත්. පසල් දනව් හෝ සොයා යත්. මහණෙනි, ඒ මේ කාරණය බොහෝදෙනාට අහිත පිණිස,

බොහෝදෙනාට නොසැප පිණිස, බොහෝදෙනාට අනර්ථය පිණිස, දෙව්මිනිසුන්ට අවැඩ පිණිස, දුක් පිණිස වේ.”

**9. රජබල සූත්‍රය:-** “මහණෙනි, යම් කලෙක්හි රජවරු බලවත් වූවාහු වෙත්ද, එකල සොරු දුර්වල වූවාහු වෙත්. ඒ කාලයෙහි රජුට පිවිසෙන්නට හෝ නික්ම යන්නට හෝ පසල් දනව්වෙහි කටයුතු දේ පාලනය කිරීමට හෝ පහසු වේ. ඒ කාලයෙහි බමුණු ගැහැවියන්ටද පිවිසෙන්නට හෝ නික්මෙන්නට හෝ කර්මාන්තයන් පරීක්ෂා කරන්නට හෝ පහසු වෙයි.

2. “මහණෙනි, එපරිද්දෙන්ම යම් කාලයෙක්හි ප්‍රියශීලී භික්ෂූහු බලවත්වූවාහු වෙත්ද, ඒ කාලයෙහි පාප භික්ෂූහු දුර්වල වූවාහු වෙත් මහණෙනි, ඒ කාලයෙහි පාප භික්ෂූහු සඟමැද අතිශයින් නිශ්ශබ්දව තුෂ්ණිම්භූතව දුර්මුඛව සිටිත්. කොතැන්හි හෝ පලා යෙත්. මහණෙනි, ඒ මේ කාරණය බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස බොහෝ දෙනාට යහපත පිණිස, දෙව් මිනිසුන්ගේ හිත පිණිස සැප පිණිස වේ”

**10. මිච්ඡාපටිපත්ති සූත්‍රය-** “මහණෙනි, මම දෙදෙනෙකුන්ගේ මිථ්‍යා ප්‍රතිපත්තිය වර්ණනා නොකරමි. (එනම්)ඃ ගිහියාගේ හෝ පැවිද්දාගේ හෝ යනදෙදෙනාගේයි. මහණෙනි, ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ වරදවා පිළිපන්නේවේද, හෙතෙම වරදවා පිළිපන්නේවේද, හෙතෙම වරදවා පිළිපැදීමේ කාරණය හේතුකොටගෙණ කුසල්වූ න්‍යාය ධර්මය (විදර්ශනා සහිත ආර්‍ය්‍ය මාර්ගය) සම්පාදනය කරන්නෙක් නොවේ.”

**11. සම්මාපටිපත්ති සූත්‍රය:-** “මහණෙනි, මම දෙදෙනකුන්ගේ සම්‍යක් ප්‍රතිපත්තිය වර්ණනා කරමි. (එනම්;) ගිහියා ගේ හෝ පැවිද්දාගේ හෝ යන දෙදෙනාගේයි. මහණෙනි, ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ මනාකොට පිළිපන්නේවේද, හෙතෙම මනාකොට පිළිපැදීම් හේතුකොටගෙණ කුසල්වූ න්‍යාය ධර්මය (විදර්ශනා සහිත ආර්‍ය්‍ය මාර්ගය) සම්පාදනය කරන්නෙක් වේ.”

**12. ධම්මපටිබාහන සූත්‍රය:-** “මහණෙනි, යම් භික්ෂූහු වරදවා ගන්නා ලද්දාවූ, අකුරෙන් පමණක් සමානවූ, අර්ථයෙන්

අසමානවූ සූත්‍රාන්තයන් කරණකොටගෙන අර්ථයත් පාළි ධර්මයත් ඉවත දමත්ද, මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ දෙනාට අහිත පිණිස, බොහෝ දෙනාට නොසැප පිණිස බොහෝ දෙනාට අනර්ථය පිණිස දෙව් මිනිසුන්ට අවැඩ පිණිස දුක් පිණිස පිළිපන්නාහු වෙත් මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ අකුසල්ද රැස් කරත්. ඔව්හු මේ සද්ධර්මයද අතුරුදහන් කරන්නාහු වෙත්."

13. **ධම්මානුලොමක සූත්‍රයඃ-** "මහණෙනි, යම් භික්ෂූහු මනාකොට ගන්නාලද්දාවූ, ව්‍යඤ්ජනයෙන්ම නොව අර්ථයෙන්ද සමානවූ සූත්‍රාන්තයන් කරණකොට ගෙණ, අර්ථ කථාවද පාළි ධර්මයද සුදුසුසේ තබත්ද, මහණෙනි, ඒ භික්ෂූහු තුමූ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝදෙනාට සැප පිණිස බොහෝ දෙනාට අර්ථය පිණිස දෙව් මිනිසුන්ට හිත පිණිස, සැප පිණිස පිළිපන්නාහු වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු බොහෝවූ කුසල්ද රැස්කරත්. ඔව්හු මේ සද්ධර්මය පිහිටුවත්.'

**(සතරවෙනි සමචිත්ත වර්ගය නිමි.)**

---

## 5. පිරිස් වර්ගය.

1. **උත්තානපරිස සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ පිරිස්හු දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්ඃ ප්‍රකටවූ (මතුපිට පෙණෙන) පිරිසද ගැඹුරුවූ පිරිසද (යන දෙකයි)

2. "මහණෙනි, ප්‍රකටවූ පිරිස කවරේද?

"මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු උඩඟු වූවාහු, උද්ගතවූ හිස් මාන නමැති නළ ඇත්තාහු, චපල වූවාහු කෲර වචන ඇත්තාහු, ප්‍රලාප වචන ඇත්තාහු, මුළාසිහි ඇත්තාහු, සම්‍යක් ප්‍රඥාව නැත්තාහු, එකඟ සිත් නැත්තාහු, විශෙෂයෙන් කලබල සිත් ඇත්තාහු, සංවරයට නොපැමිණි ඉඳුරන් ඇත්තාහු වෙත්ද, මහණෙනි, මේ වනාහි මතුපිටවූ (නොගැඹුරුවූ) පිරිසයයි කියනු ලැබේ.

3. "මහණෙනි, ගැඹුරුවූ පිරිස කවරීද?

"මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු උඩඟු නොවූවාහු, උද්ගතවූ හිස් මාන නමැති නළ නැත්තාහු, චපල නොවූවාහු, රළුබස් නැත්තාහු, ප්‍රලාප වචන නැත්තාහු, එළඹ සිටි සිහි ඇත්තාහු, සම්‍යක් ප්‍රඥා ඇත්තාහු, තැන්පත් සිත් ඇත්තාහු එකඟවූ සිත් ඇත්තාහු, සංවරණය කරණලද ඉන්ද්‍රිය ඇත්තාහු වෙත්ද, මහණෙනි, මේ ගැඹුරු පිරිස යයි කියනු ලැබේ.

4. "මහණෙනි, මේ වනාහි පිරිස්හු දෙදෙන වෙති. මහණෙනි, මේ පිරිස් දෙදෙන අතුරෙන් යම් මේ ගැඹුරුවූ පිරිසක්වේද, මේ පිරිස ශ්‍රෙෂ්ඨයි."

2. **වග්ගාපරිස සූත්‍රයː-** 1. "මහණෙනි, මේ පිරිස්හු දෙදෙනෙක් වෙත්, කවර දෙදෙනෙක්ද යත්, වර්ගවූ අසමගි පිරිසද, සමගිවූ පිරිසද (යන දෙදෙනයි).

2. "මහණෙනි, වර්ගවූ පිරිස කවරීද?

"මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු තුමූ හටගත් ඩබර ඇත්තාහු, හටගත් කෝලාහල ඇත්තාහු, විරුද්ධ වාදයට පැමිණියාහු, එකිනෙකා වචන නමැති සැත්වලින් විදිමින් වාසය කෙරෙත්ද, මහණෙනි, මේ වර්ගවූ පිරිසයයි කියනු ලැබේ.

3. "මහණෙනි, සමගි පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු තුමූ සමගි වූවාහු, (එක්ව) සතුටු වූවාහු විරුද්ධ වාද නොකරන්නාහු, කිරි හා ජලය මෙන් එක්වූවාහු, ඔවුනොවුන් ප්‍රිය ඇස්වලින් බලමින් වාසය කෙරෙත්ද, මහණෙනි, මේ සමගි පිරිසයයි කියනු ලැබේ.

4. "මහණෙනි, මේ වනාහි පිරිස්හු දෙදෙන වෙත්. මහණෙනි, මේ පිරිස් දෙදෙන අතුරෙන් යම් මේ සමගි පිරිසක් වේද, එය ශ්‍රෙෂ්ඨයි."

3. **අග්ගවතිපරිස සූත්‍රයː-** 'මහණෙනි, මේ පිරිස්හු දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්ː උත්තම පුද්ගලයන් ඇත්තාවූ පිරිසද උතුම්වූ පුද්ගලයන් නැත්තාවූ පිරිසද (යන දෙකයි).

2. "මහණෙනි, උත්තම පුද්ගලයන් නැත්තාවූ (නිකෘෂ්ට) පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි ස්ථවිර භික්ෂූහු බහුල භාවය පිණිස පිළිපන්නාහු, (ශාසනය) ලිහිල්කොට ගන්නාහු, ශික්ෂා ගරුක නොව පසුබැසීම් නම් පඤ්චනීවරණ ධර්මපූරණයෙහි පූර්වාංගම (පෙරදැරි) වූවාහු, නිර්වාණයෙහි බහා තබනලද, හරණලද, උත්සාහ ඇත්තාහු වෙත්ද, ඔව්හු පෙර නොපැමිණෙන ලද්දට පැමිණීම පිණිසත් අනධිගත (අවබොධ නෙ කරණලද) ධ්‍යානාදීන්ගේ අවබොධය පිණිසත් (කායික චෛතසික) වීර්‍ය්‍යය පටන් නොගණිත්."

3. "පශ්චිම ජන සමූහයා ද, තමන් දුටු දේ අනුව පිළිපැදීමට පැමිණේ (සැරසේ). ඕතොමෝද (ඒ පශ්චිම ජනතාවද), (ප්‍රත්‍ය) බාහුල්‍යාදියෙන් යුක්තවූවා, සස්න ලිහිල් කොට ගත්තී, පහත බැසීම් නම් පඤ්චනීවරණ ධර්මපූරණයෙහි පෙරටුව යන්නී නිර්වාණයෙහි බහා තබනලද උත්සාහ ඇත්තී, පෙර නොපැමිණෙන ලද ගුණයන්ට පැමිණීම පිණිස හා අවබොධ නොකළ ගුණ විශෙෂයන්ගේ අවබොධය පිණිසද, ප්‍රත්‍යක්ෂ නොකළ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද (කායික චෛතසික) වීර්‍ය්‍යය පටන් නොගණී. මහණෙනි, මේ අග්‍ර නොවූ පුද්ගලයන් ඇති පිරිසයයි කියනුලැබේ.

4. "මහණෙනි, උතුම් පුද්ගලයන් ඇති පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි ස්ථවිර භික්ෂූහු (ප්‍රත්‍ය) බාහුල්‍යයෙන් යුක්ත නොවෙත්ද, ශාසනය ලිහිල් කොට නොගන්නේ (ශික්ෂාගරුකයෝ) වෙත්ද, පසුබැසීම් නම් පඤ්චනීවරණ ධර්මයෙහි හරණ ලද වීර්‍ය්‍යය ඇත්තෝ වෙත්ද, නිර්වාණ ධර්මයෙහි පූර්වංගම (පෙරදැරි) වූවෝ වෙත්ද, ඔවුහු නොලැබූ ගුණයන් ලැබීම පිණිසද, අවබොධ නොකරණ ලද ධර්මයන් අවබොධ කිරීම පිණිසද ප්‍රත්‍යක්ෂ නොකරණලද ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද වීර්‍ය්‍යය පටන් ගණිති.

5. "පශ්චිම ජනසමූහයාද ඔවුන්ගේ දෘෂ්ටිය (තමන් දුටුදේ) අනුව යාමට සැරසේ. ඕ තොමෝද ප්‍රත්‍ය බාහුල්‍යයෙන් යුක්ත නොව සස්න ලිහිල්කොට නොගත්තී පහත බැසීම් නම් පඤ්ච

නීවරණ ධර්මපූරණයෙහි පෙරටුව නොයන්නී නිර්වාණයෙහි බහා නොතබන ලද උත්සාහ ඇත්තී පෙර නොපැමිණෙන ලද ගුණයන්ට පැමිණීම පිණිස හා අවබොධ නොකළ ගුණ විශෙෂයන්ගේ අවබොධය පිණිසද, ප්‍රත්‍යක්ෂ කළ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද (කායික චෛතසික) වීර්‍ය්‍යය පටන්ගණී. මහණෙනි, මේ අග්‍රවතී (උතුමන් ඇති) පිරිසයයි කියනු ලැබේ.

6. "මහණෙනි, මේ වනාහි පිරිස් දෙකකි. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් මේ අග්‍රවතී පිරිසක් වේද මෙය උතුම් වේ."

4. **අරිය සූත්‍රයඃ-** "මහණෙනි, මේ පිරිස්හු දෙදෙනෙක් වෙත් කවර දෙදෙනෙක්ද යත්, ආර්‍ය්‍යවූ පිරිසද අනාර්‍ය්‍ය (පෘථග්ජන) වූ පිරිසද (යන දෙදෙනයි.)

2. "මහණෙනි, අනාර්‍ය්‍ය (පෘථග්ජන) පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු මේ (පඤ්චස්කන්ධය) දුක් යයි ඇතිසැටියෙන් නොදනිත්ද, මේ (තෘෂ්ණාව) දුක් හටගැණීමේ හේතුවයයි ඇතිසැටියෙන් නොදනිත්ද, මේ (තෘෂ්ණා නිරොධය) දුක් නැසීමයයි ඇති සැටියෙන් නොදනිත්ද, මේ (ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය) දුක් නිරුද්ධ කිරීමට පමුණුවන පිළිවෙතයයි ඇතිසැටියෙන් නොදනිත්ද, මහණෙනි, මේ ආර්‍ය්‍ය නොවූ පිරිසයයි කියනු ලැබේ

3. "මහණෙනි, ආර්‍ය්‍ය පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු තුමූ මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනිත්ද, මේ දුක් උපදින හේතුවයයි තතුසේ දනිත්ද, මේ දුක් නැතිකිරීමයි තතුසේ දනිත්ද, මේ දුක් නැති කිරීමේ පිළිවෙත යයි තතුසේ දනිත්ද, මහණෙනි, මේ ආර්‍ය්‍ය පිරිසයයි කියනු ලැබේ.

4. "මහණෙනි, මේ වනාහි පිරිස් දෙකකි. මහණෙනි මේ පිරිස් දෙක අතුරෙන් යම් මේ ආර්‍ය්‍ය පිරිසක් වේද, ඒ අග්‍ර වේ.

5. **කසට සූත්‍රයඃ-** "මහණෙනි, මේ පිරිස්හු දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, කසට (හිස්) පිරිසද මණ්ඩ (සාර) පිරිසද (යන දෙදෙනයි.)

2. "මහණෙනි, කසට (බොල් හෙවත් නිස්සාර) පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු ඡන්දයෙන් අගතියට යෙත්ද, ද්වෙෂයෙන් අගතියට යෙත්ද, මොහයෙන් අගතියට යෙත්ද, භයින් අගතියට යෙත්ද, මහණෙනි, මේ කසට (හිස්) පිරිස යයි කියනු ලැබේ.

3. "මහණෙනි, ප්‍රසන්න (සාර) වූ පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු ඡන්දයෙන් අගතියට නොයත්ද, ද්වෙෂයෙන් අගතියට නොයත්ද, මොහයෙන් අගතියට නොයත්ද, භයින් අගතියට නොයත්ද, මහණෙනි, මේ ප්‍රසන්නවූ පිරිස යයි කියනු ලැබේ.

4. "මහණෙනි, මේ වනාහි පිරිස් දෙකකි. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් මේ ආයෲ පිරිසක් වේද, ඒ අග්‍රයි."

6. **උක්තා සූත්‍රය**:- 1 "මහණෙනි, මේ පිරිස් දෙකක් වෙත් කවර දෙකක්ද යත්, හික්මවන්නට නොහැකිවූ ධර්මය අසා දැනනොගෙන නොහික්මුනාවූ පිරිසද, ධර්මය අසා දැන ගෙන හික්මුනාවූ, සුවිනීතවූ පිරිසද වෙත්.

2. "මහණෙනි, හික්මවන්නට නොහැකිවූ ධර්මය අසා දැනනොගෙන නොහික්මුනාවූ පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ගැඹුරුවූ, ගැඹුරු අර්ථ ඇත්තාවූ, ලොකොත්තරාර්ථ දක්වන්නාවූ, ශූන්‍යතාප්‍රතිසංයුක්තවූ යම් ඒ සූත්‍රාන්තයෝ වෙත් නම් ඒ සූත්‍රාන්තයන් කියනු ලබන කල්හි සතුටින් නොඅසත්ද, කන් යොමු නොකරත්ද, දැනගැණීම පිණිස සිත එළවා නොතබද්ද, ඒ ධර්මයන් ඉගෙණ ගතයුතුය. පුහුණු කළ යුතුයයි නොහඟිද්ද, (බාහිර) කවීන් විසින් කරන ලද, කවීන් පිළිබඳ විසිතුරු අකුරු ඇත්තාවූ, විසිතුරු ව්‍යඤ්ජනයන් ඇත්තාවූ, ශාසනයෙන් බැහැරවූ බාහිරක ශ්‍රාවකයන් විසින් කියන ලද්දාවූ යම් ඒ සූත්‍රාන්තයෝ වෙත් නම් ඒ සූත්‍රාන්තයන් කියනු ලබන කල්හි සතුටින් අසත්ද, කන් යොමු කරත්ද, දැනගැණීම පිණිස සිත එළවා තබත්ද, ඒ ධර්මයන් ඉගෙණගතයුතුයයි ප්‍රගුණ කටයුතුයයි හඟිත්ද, ඔව්හු ඒ ධර්මය ප්‍රගුණ කොට කෙසේද,

මේ පද වචනාදිය කුමක්ද? මෙහි අර්ථය කවරේදැ?යි” ඔවුනොවුන්ගෙන් නොවිචාරත්ද, (එසේ විචාරීම පිණිස) ඔබමොබ නොහැසිරෙත්ද, ඔව්හු තුමූ වැසුණාවූ අර්ථ විවෘත නොකෙරෙත්ද, නොයෙක් ආකාරවූ සැකයට කරුණුවූ ධර්මයන් කෙරෙහි සැකය පහනොකෙරෙත්ද, මහණෙනි, මේ (පිරිස) දුර්විනීතවූ (අසා දැනගැනීමෙන්) නොහික්මුණාවූ පිරිස යයි කියනු ලැබේ.

3. “මහණෙනි, අසා දැනගැනීමෙන් හික්මුනාවූ, සුවිනීතවූ පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහිවූ යම් පිරිසෙක්හි භික්ෂූහු කවීන් විසින් කරණ ලද, කවීන්ට හිතවූ (කවීන් පිළිබඳවූ) විසිතුරු අකුරු හා විසිතුරු පද වචනාදිය ඇත්තාවූ, බාහිරක ශ්‍රාවකයන් විසින් කියන ලද්දාවූ යම් ඒ සූත්‍රාන්තයෝ වෙත් නම් ඒ සූත්‍රාන්තයන් කියනු ලබන කල්හි සතුටින් නොඅසත්ද, කන් යොමු නොකරත්ද, දැනගැණීම පිණිස සිත එළවා නොතබත්ද, ඒ ධර්මයන් ඉගෙණ ගතයුතු යයි ප්‍රගුණ කටයුතු යයි නොහඟිත්ද, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ගැඹුරුවූ ගැඹුරු අර්ථ ඇත්තාවූ ලොකොත්තරාර්ථ දක්වන්නාවූ ශූන්‍යතා ප්‍රතිසංයුක්තවූ යම් ඒ සූත්‍රාන්තයෝ වෙත් නම් ඒ සූත්‍රාන්තයන් කියනු ලබන කල්හි සතුටින් අසත්ද, කන් යොමු කරත්ද, දැනගැණීම පිණිස සිත එළවා තබත්ද, ඒ ධර්මයන් උද්ග්‍රහණය කටයුතුය ප්‍රගුණ කටයුතුයයි හඟිත්ද, ඔව්හු ඒ ධර්මය ප්‍රගුණ කොට මේ පද වචනාදිය කුමක්ද මෙහි අර්ථය කවරේදැයි ඔවුනොවුන් විචාරත්ද, ඔබමොබ හැසිරෙත්ද ඔව්හු වැසුණාවූ අර්ථ විවෘත කෙරෙත්ද, ප්‍රකට නොවූවක් (ගැඹුරුවූවක්) ප්‍රකට කෙරෙත්ද, නොයෙක් ආකාරවූ සැකයට කරුණුවූ ධර්මයන් කෙරෙහි සැකය පහකෙරෙත්ද, මහණෙනි, මේ පිරිස පිළිවිසීමෙන් හික්මුනාවූ හික්මවන්ට හැකිවූ පිරිස යයි කියනු ලැබේ.

4. “මහණෙනි, මේ වනාහි පිරිස්හු දෙකකි. මේ පිරිස් දෙක අතුරෙන් යම් මේ පිළිවිසීමෙන් හික්මුනාවූ සුවිනීතවූ පිරිසක් වේද මේ පිරිස අග්‍ර වේ.”

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**7. ආමිසගරු සූත්‍රය-** 1. "මහණෙනි, මේ පිරිස් දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, සිවුපසය ගරු කොට ඇත්තාවූ දහම් ගරුකොට නැත්තාවූ පිරිසද, දහම් ගරුකොට ඇත්තාවූ ආමිෂය (සිවුපසය) ගරුකොට නැත්තාවූ පිරිසද වෙත්.

2. "මහණෙනි, සිවුපසය ගරුකොට සලකන්නාවූ සදහම් ගරුකොට නොසලකන්නාවූ පිරිස කවරීද? මහණෙනි මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු සුදුවත් හඳින්නාවූ ගිහීන් ඉදිරියෙහි එකිනෙකාගේ ගුණ දොස් කියමින් 'අසවල් මහණතෙම (විස්කම්භන සමුච්ඡේද යන) දෙකොටසින් මිදුණේය, අසවල් මහණතෙම ප්‍රඥාවෙන් විමුක්තය, අසුවලා කයින් ධ්‍යාන ස්පර්ශකොට පසුව නිවන් ප්‍රත්‍යක්ෂ කෙළේය. අසුවලා මාර්ග දෘෂ්ටියට පැමිණියේය. අසුවලා ශ්‍රද්ධාව නිසා මිදුනේය, අසුවලා ධර්මය අනුව සිහිකරන ස්වභාවය, අසුවලා ශ්‍රද්ධානුසාරීය, අසුවලා සිල්වත්ය, අසුවලා කල්‍යාණ ස්වභාව ඇත්තේය, අසුවල් මහණතෙම ලාමකවූ ස්වභාව ඇත්තේය. දුශ්ශීලයයි කියත්. ඔව්හු තුමූ ඒ ගුණාගුණ කීමෙන් සිවුපසය ලබත්. ඔව්හු ඒ ලාභයෙහි (තෘෂ්ණාවෙන්) ගැටගැසුනාහු මූර්ඡා වූවාහු ගැලී සිටියාහු ආදීනව (වරද) නොදක්නා ස්වභාව වූවාහු ඡන්දරාගය දුරුකරණ ප්‍රඥාවෙන් තොර වූවාහු (සිවුපසය) පරිභොග කෙරෙත්. මහණෙනි, මේ ආමිසය ගරු කොට ඇත්තාවූ සදහම් ගරුකොට නැත්තාවූ පිරිස යයි කියනු ලැබේ

3. මහණෙනි, දහම ගරුකොට ඇත්තාවූ සිවුපසය ගරුකොට නැත්තාවූ පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු සුදුවත් හඳින්නාවූ ගිහීන්ගේ ඉදිරියෙහි එකිනෙකාගේ ගුණ නොකියන්නේ අසවල් මහණ තෙම (විස්කම්භන සමුච්ඡේද යන) දෙකොටසින් විමුක්තය, අසවල් භික්ෂුතෙම ප්‍රඥාවෙන් විමුක්තය, අසවල් මහණතෙම කයින් ධ්‍යාන ස්පර්ශකොට පසුව නිවන් පසක් කෙළේය. අසවල් මහණතෙම මාර්ගදෘෂ්ටියට පැමිණීයේය, අසවල් මහණ තෙම ශ්‍රද්ධාවිමුක්තිය, අසවල් මහණතෙම ධර්මානුසාරීය, අසවල් මහණතෙම ශ්‍රද්ධානුසාරීය, අසවල් මහණතෙම සිල්වත්ය,

යහපත් ස්වභාව ඇත්තේය. අසවල් මහණතෙම දුශ්ශීලය පාප ස්වභාව ඇත්තේයයි නොකියත්ද, ඔව්හු තුමූ සිවුපසය ලැබීමෙහි (තෘෂ්ණාවෙහි) ගැට නොගැසුනාහු මුසපත් නොවූවාහු ගැලී නොසිටියාහු ආදීනව දක්නාසුලු වූවාහු නිස්සරණ ප්‍රඥාවෙන් යුක්තවූවාහු (සිවුපසය) පරිභොග කරත්. මහණෙනි, මේ සද්ධර්මය ගරුකරන්නාවූ ආමිෂය ගරුනොකරන්නාවූ පිරිසයයි කියනු ලැබේ. මහණෙනි, මේ වනාහි පිරිස් දෙකකි.

4. "මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් මේ සද්ධර්මය ගරුකරන්නාවූ ආමිෂය ගරුනොකරන්නාවූ පිරිසක් වේද, මේ පිරිස අග්‍රවේ."

8. **විසමපරිස සූත්‍රයː-** 1. "මහණෙනි, මේ පිරිස්හු දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, විසමවූ (පැකිලීම් ඇති) පිරිසද, සමවූ (නොපැකිලෙන) පිරිසද (යන දෙක) වෙත්. මහණෙනි, විසම පිරිස කවරීද?

2. "මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි අධර්ම කර්මයෝ පවතිත්ද, ධර්ම කර්මයෝ නොපවතිත්ද, විනයට විරුද්ධ කර්මයෝ පවතිත්ද, විනය කර්මයෝ නොපවතිත්ද, අධර්ම කර්මයෝ බබලත්ද, ධර්ම කර්මයෝ නොබබලත්ද, විනයට විරුද්ධවූ කර්මයෝ දීප්තියට පැමිණෙත්ද, විනය කර්මයෝ දීප්තියට නොපැමිණෙත්ද, මහණෙනි, මේ විෂමවූ පිරිස යයි කියනු ලැබේ. මහණෙනි, පිරිස විසම බැවින් අධර්ම කර්මයෝ පවතිත්, ධර්ම කර්මයෝ නොපවතිත්. විනයට විරුද්ධ කර්මයෝ පවතිත්. විනය කර්මයෝ නොපවතිත්. අධර්ම කර්මයෝ දීප්තියට පැමිණෙත්. ධර්ම කර්මයෝ නොබැබලෙත්. විනය විරුද්ධ කර්මයෝ දීප්තියට පැමිණෙත්. විනය කර්මයෝ දීප්තියට නොපැමිණෙත්.

4. 'මහණෙනි, සමවූ පිරිස කවරීද?

5. "මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි ධර්ම කර්මයෝ පවතිත්ද, අධර්ම කර්මයෝ නොපවතිත්ද, විනය කර්මයෝ පවතිත්ද, අවිනය කර්මයෝ නොපවතිත්ද, ධර්ම කර්මයෝ බැබලෙත්ද, අධර්ම කර්මයෝ නොබැබලෙත්ද, විනය කර්මයෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බැබලෙත්ද, විනය විරුද්ධ කර්මයෝ නොබැබලෙත්ද, මහණෙනි, මේ සමපිරිසයයි කියනු ලැබේ. මහණෙනි, පිරිස සම බැවින් ධර්ම කර්මයෝ පවතිත්, අධර්ම කර්මයෝ නොපවතිත්. විනය කර්මයෝ පවතිත්, අවිනය කර්මයෝ නොපවතිත්. ධර්ම කර්මයෝ බැබලෙත්, අධර්ම කර්මයෝ නොබැබලෙත්, විනය කර්මයෝ බැබලෙත්, විනය විරුද්ධ කර්මයෝ නොබැබලෙත්.

**6.** "මහණෙනි, මේ වනාහි පිරිස් දෙකකි. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් මේ සමවූ පිරිසක් වේද, එය අග්‍රයි.

**9. අධම්මක සූත්‍රයː-** "මහණෙනි, මේ පිරිස්හු දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, අධාර්මික පිරිසද ධාර්මික පිරිසද (යන දෙක) වෙත්.

**2.** "මහණෙනි, අධාර්මික පිරිස කවරීද?

(මේ වර්ගයේ 8 සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

**3.** "මහණෙනි, ධාර්මික පිරිස කවරීද? (මේ ඡේදය මේ වර්ගයේ 8 සූත්‍රයේ 5 ඡේදය මෙනි)

**4.** "මහණෙනි, මේ පිරිස් දෙකක්වේ. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් මේ ධාර්මික පිරිසක් වේද, මෙය අග්‍රවේ

**10. ධම්මිය සූත්‍රයː-** 1 "මහණෙනි, මේ පිරිස්හු දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, මහණෙනි, අධර්මවාදි පිරිසද ධර්මවාදි පිරිසද (යන දෙක) වෙත්.

**2.** "මහණෙනි, අධර්මවාදී පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු ධාර්මිකවූ හෝ අධාර්මිකවූ හෝ විවාද ආදි විනිශ්චය කළයුතු කරුණක් ගනිත්ද, ඔව්හු ඒ අධිකරණය ගෙණ එකිනෙකාට ඒ බව නොමදන්වත්ද, දැන්වීම සඳහා රැස්නොවෙත්ද, නොදක්වත්ද, දැක්වීමට නොඑළඹෙත්ද, ඔව්හු තුමූ අසඤ්ඤත්තිය (නොදැන්වීම) බලය කොට ගත්තාහු නොදැක්වීම බලයකොට ගත්තාහු විවාදය අත්හැරීමට අදහස් නැත්තාහු ඒ අධිකරණයම ශක්තියෙන් අල්වාගෙන ඒ දෘෂ්ටිය සිතෙහි ඇතුල්කොට (මෙසේ) ප්‍රකාශ කෙරෙත්ද, මේ (අපගේ

වචනය) ම සත්‍යය මෙයින් අන්‍යවූ වචන තුච්ඡය'යි කියායි. මහණෙනි, මෙබඳුවූ පිරිස අධර්මවාදි පිරිස යයි කියනු ලැබේ.

3. "මහණෙනි, ධර්මවාදි පිරිස කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු ධාර්මිකවූ හෝ අධාර්මිකවූ හෝ (විවාද ආදි) අධිකරණයක් ගණිත්ද, ඔව්හු තුමූ මේ අධිකරණය ගෙණ එකිනෙකාට මේ ගැණ දන්වත්ද දැන්වීම් පිණිස රැස්වෙත්ද, දක්වත්ද, දැක්වීම පිණිස පැමිණෙත්ද, ඔව්හු තුමූ දැන්වීම් බලයකොට ඇත්තාහු, දැක්වීම බලයකොට ඇත්තාහු, බැහැරලීමෙහි අදහස් ඇත්තාහු, ඒ අධිකරණයම ශක්තියෙන් අල්වාගෙන ඒ හැඟීම (සිතෙහි) ඇතුල්කොට මෙසේ ප්‍රකාශ නොකෙරෙත්ද, (කෙසේද?) 'මේ අපගේ වචනයම සත්‍යය, අන්‍යයන්ගේ වචනය තුච්ඡය'යි කියායි. මහණෙනි, මෙබඳු පිරිස ධර්මවාදී පිරිස යයි කියනුලැබේ.

4. "මහණෙනි, මෙසේ මේ පිරිස්හු දෙදෙනෙක් වෙත්. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් මේ ධර්මවාදී පිරිසක් වේද, මේ පිරිස අග්‍රය."

**(පස්වෙනි වර්ගය නිමි.)**

පළමුවෙනි පණ්ණාස නිමි.

---

## දෙවෙනි පණ්ණාස

# 6. පුද්ගල වර්ගය

1. ද්වෙ පුග්ගල සූත්‍රය:- "මහණෙනි, මේ පුද්ගලයෝ දෙදෙනෙක් ලොකයෙහි උපදින්නාහු බොහෝදෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස බොහෝ ජනයාට වැඩ පිණිස දෙව් මිනිසුන්ට හිත පිණිස සැප පිණිස උපදිත්. කවර දෙදෙනෙක්දයත්, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේද සක්විති රජතෙමේද (යනදෙදෙන) වෙත්. මහණෙනි, මේ පුද්ගලයෝ දෙදෙන වනාහි ලොව උපදින්නාහු බොහෝ දෙනාට හිත පිණිස බොහෝදෙනාට සැප පිණිස බොහෝ

ජනයාට වැඩ පිණිස දෙව් මිනිසුන්ට හිත පිණිස සැප පිණිස උපදිත්."

**2. අච්ඡරිය මනුස්ස සූත්‍රයඃ-** "මහණෙනි, මේ පුද්ගලයෝ දෙදෙනෙක් ලොව උපදින්නාහු ආශ්චර්‍ය්‍ය මනුෂ්‍යයෝව උපදිත්. කවර දෙදෙනෙක්ද යත්, තථාගතවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේද සක්විති රජ තෙමේද වෙත්. මහණෙනි, මේ පුද්ගලයෝ දෙදෙන වනාහි ලොව උපදින්නාහු ආශ්චර්‍ය්‍ය මනුෂ්‍යයෝව උපදිත්."

**3. කාලකිරිය සූත්‍රයඃ-** "මහණෙනි, පුද්ගලයන් දෙදෙනෙක්හුගේ කාලක්‍රියාව මහජනයාට සිත් තැවුල් වේ. කවර දෙදෙනෙකුන්ගේද යත්, තථාගතවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේද සක්විති රජහුගේද වෙත්. මහණෙනි මේ පුද්ගලයන් දෙදෙනෙක්හුගේ කාලක්‍රියා තොමෝ මහජනයා හට සිත් තැවුල්වේ."

**4. ථූපාරහ සූත්‍රයඃ-** "මහණෙනි, මේ දෙදෙනෙක් චෛත්‍යයට සුදුස්සෝ වෙත්. කවර දෙදෙනෙක්ද යත්. තථාගතවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේද සක්විති රජ තෙමේද වෙත්. මහණෙනි, මේ දෙදෙන ථූපයට සුදුස්සෝ වෙත්."

**5. ද්වෙ බුද්ධ සූත්‍රයඃ-** "මහණෙනි, මේ බුදුවරයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද? තථාගතවූ අර්හත්වූ සම්මා සම්බුද්ධ තෙමේද පසේබුදු තෙමේද යන දෙදෙනයි. මහණෙනි, මේ දෙදෙන බුදුවරයෝ වෙත්."

**6. අසනි සූත්‍රයඃ-** "මහණෙනි, මේ දෙදෙනෙක් හෙන පුපුරණ කල්හි තැති නොගනිත්. කවර දෙදෙනෙක්ද යත්, ක්ෂීණාශ්‍රව (රහත්) භික්ෂු තෙමේද අජානීය අශ්ව තෙමේද වෙති. මහණෙනි, මේ දෙදෙන වනාහි හෙන පුපුරණ කල්හි තැතිනොගනිත්."

**7. දුතිය අසනි සූත්‍රයඃ-** "මහණෙනි, මේ දෙදෙනෙක් හෙන පුපුරණ කල්හී තැතිනොගනිත්. කවර දෙදෙනෙක්ද යත්, ක්ෂීණාශ්‍රව (රහත්) භික්ෂු තෙමේද අජානීය අශ්ව තෙමේද වෙත්. මහණෙනි, මේ දෙදෙන වනාහි හෙන පුපුරණ කල්හි තැතිනොගනිත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**8. තතිය අසනි සූත්‍රය:-** "මහණෙනි, මේ දෙදෙනෙක් හෙන පුපුරණ කල්හි බිය නොවෙත්. කවර දෙදෙනෙක්ද යත්, ක්ෂීණාශ්‍රව (රහත්) භික්ෂු තෙමේද මෘගරාජවූ සිංහ තෙමේද වෙත්. මහණෙනි, මේ දෙදෙනා වනාහි හෙන පුපුරණ කල්හි බිය නොවෙත්."

**9. කිම්පුරිස සූත්‍රය:-** "මහණෙනි, මේ කරුණු දෙකක් දක්නාවූ (සලකන්නාවූ) කින්නරයෝ මිනිස් බස් නොකියත්. කවර දෙකක්ද යත්, බොරු නොකියමු. අන්‍යයෙකුට බොරුවෙන් නින්දා නොකරමු. මහණෙනි මේ කරුණු දෙක බලමින් කින්නරයෝ මිනිස් බස් නොකියත්."

**10. අතිත්ත මාතුගාම සූත්‍රය:-** "මහණෙනි, කරුණු දෙකක් සම්බන්ධව තෘප්තියට නොපැමිණි පසුබැසීම් නැතිව (සාමාන්‍ය) ස්ත්‍රිය මැරෙයි. කවර කරුණු දෙකක් සම්බන්ධවද යත්, මෛථුන්දම් සෙවීම සම්බන්ධවද; වැදීම සම්බන්ධවද වෙත්. මහණෙනි, මේ දෙයාකාර ධර්මයන් සම්බන්ධව තෘප්ති රහිතවූ පසුබැසීම් නැත්තාවූ ස්ත්‍රිය වනාහි කලුරිය කෙරේ."

**11. සන්නිවාස සූත්‍රය:-** "මහණෙනි, තොපට අසත් පුරුෂයන්ගේ සමාගමයද සත්පුරුෂයන්ගේ සමාගමයද දෙශනා කරන්නෙමි. ඒ අසව්, යහපත්කොට සිත්හි තබා ගනිව්. කියන්නෙමි. "එසේය ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, කෙසේ නම් අසත්පුරුෂයන්ගේ සහ වාසය වේද, කෙසේ නම් අසත්පුරුෂයෝ සමග වෙසෙද්ද? මහණෙනි, මේ ශාසනයෙහි ස්ථවිර භික්ෂු නමකට මෙබඳු සිතක් වෙයි.

3. "ස්ථවිර භික්ෂුවක් මට යමක් නොකියාවා, මධ්‍යම භික්ෂුවක් මට යමක් නොකියාවා, නවක භික්ෂුවක්ද මට යමක් නොකියාවා, මමත් ස්ථවිර භික්ෂුවට නොකියන්නෙමි. මම මධ්‍යම භික්ෂුවටත් නොකියන්නෙමි. මම නවක භික්ෂුවටත් නොකියන්නෙමි. ඉදින් ස්ථවිර තෙමේත් මට අවවාදාදියක්

කියන්නේ නම් මට අවැඩ කැමැතිව කියන්නේය. හිත කැමැතිව නොකියන්නේය. මෙසේ හෙයින් තොපගේ වචනය නොකරන්නෙමියි මම ඕහට කියන්නෙමි. ඕහට වෙහෙසද කරන්නෙමි. ඔහුගේ වචනය (සත්‍යයයි) දන්නේ නමුදු ඊට ප්‍රතිකර්ම නොකරන්නෙමී' යි (කියා මෙබඳු සිතක් උපදී.)

4. "මධ්‍යම භික්ෂු තෙමේත් මට කියන්නේ නම් නවක භික්ෂු තෙමේත් මට කියන්නේ නම් මට අහිතානුකම්පීව කියන්නේය. හිතයෙන් අනුකම්පා ඇතිව නොකියන්නේය. හිත කැමැතිව නොකියන්නේය. (නොපිළිපැදීමෙන්) ඕහට වෙහෙසද කරමි. ඔහුගේ වචනය සත්‍යයයි දන්නේ නමුදු ඊට ප්‍රතිකර්ම නොකරමි.

5. "මධ්‍යම භික්ෂුවටද මෙබඳු සිතක් වෙයි. (මෙහි මේ සූත්‍රයේ 3, 4 ඡේද යොදාගත යුතුයි.)

6. "නවක භික්ෂුවටද මෙබඳු සිතක් වෙයි. (මෙහි මේ සූත්‍රයේ 3, 4 ඡේද යොදා ගත යුතුයි.)

7. "මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂයන්ගේ සහවාසය වෙයි. මෙසේම අසත්පුරුෂයෝ සමග වෙසෙත්.

8. "මහණෙනි, කෙසේනම් සත්පුරුෂයන්ගේ සහවාසය වේද කෙසේ නම් සත්පුරුෂයන් (සමග) වෙසෙද්ද? මහණෙනි මේ ශාසනයෙහි ස්ථවිර භික්ෂුවකට මෙබඳු අදහසක් වෙයි.

9. "ස්ථවිර තෙමේත් මට අවවාදයක් කෙරේවා, මධ්‍යම ස්ථවිර තෙමේත් මට අවවාදාදියක් කෙරේවා, නවක භික්ෂු තෙමේද මට අවවාදාදියක් කෙරේවා, මම ස්ථවිර භික්ෂුවටත් අවවාදාදියක් කියන්නෙමි. මම මධ්‍යම භික්ෂුවටත් අවවාදාදියක් කියන්නෙමි. මම නවක භික්ෂුවටත් අවවාදාදියක් කියන්නෙමි. ඉදින් ස්ථවිර තෙමේත් මට අවවාදාදියක් කරන්නේ නම් මට හිත කැමැත්තෙන් කරන්නේය අහිත කැමැත්තෙන් මට නොකියන්නේය. මම ඕහට මැනව තොප කීයේ යහපතැයි කියන්නෙමි. ඕහට වෙහෙස නොකරන්නෙමි. (මගේ දොෂය) දක්නේ ඊට ප්‍රතිකර්ම කරන්නෙමි'යි කියායි.

10. "මධ්‍යම භික්ෂුතෙමේද මට (අවවාද) කියන්නේ නම් නවක භික්ෂු තෙමේත් මට කියන්නේ නම් මට හිත අනුකම්පාව කියන්නේය. හිතයෙන් අනුකම්පා ඇතිව කියන්නේය. හිත කැමතිව කියන්නේය. (පිළිපැදීමෙන් ඕහට වෙහෙසද නොකරමි ඔහුගේ වචනය සත්‍යයයි දන්නේ ඊට ප්‍රතිකර්ම කරමි. නවක භික්ෂු තෙමේද මට අවවාද වශයෙන් කියන්නේ හිත කැමැත්තෙන්ම කියන්නේය, අහිත කැමැත්තෙන් නොකියන්නේය. මම ඕහට 'මැනව තොප කීසේ යහපතැ'යි කියන්නෙමි. ඕහට වෙහෙස නොකරන්නෙමි, (මගේ දොෂය) දුටුයේ ඊට ප්‍රතිකර්මද කරන්නෙමියි කියායි.

11. "මධ්‍යම භික්ෂුවටද මෙබඳු සිතක් වෙයි. (මෙහි මේ සූත්‍රයේ 9, 10 ඡේද යොදා ගතයුතුයි.)

12. "නවක භික්ෂුවටද මෙබඳු සිතක් වෙයි. (කෙසේද? මෙහි මේ සූත්‍රයේ 9 ඡේදය යොදා ගත යුතුයි.)

13. "මහණෙනි, සත්පුරුෂයන් සහවාසය වනාහි මෙසේ වෙයි. මෙසේම සත්පුරුෂයෝ වාසය කෙරෙත්."

12. **වචීසංසාර සූත්‍රය:-** "මහණෙනි, යම් විනිශ්චයට එළඹි කරුණෙක්හි දෙපසෙහි පවත්නා වචන හුවමාරුවද දෘෂ්ටිය කියා උපන් තදපරුෂ බවද සිතේ කොපයද දොම්නස හා අනුන්ගේ සැපතෙහි නොසතුටුවීම ඇතිවේද (ස්වකීය චිත්තය හා ස්වකීය පිරිස) මනාකොට නොසංසිඳුනේ වේද, මහණෙනි, ඒ විනිශ්චයෙහි මෙබන්දක් අවශ්‍යයෙන් සිදුවන්නේය. (ඒ අධිකරණය) බොහෝකල් පැවැත්ම පිණිසද නපුරුකම හා චණ්ඩභාවය පිණිසද ඇතිවන්නේය (ඊට මැදහත්වූ) භික්ෂූහුද සැපසේ වාසය නොකරන්නාහුය (යනුයි.)

13. **දුතිය වචීසංසාර සූත්‍රය:-** "මහණෙනි, යම් විනිශ්චයෙක්හි වනාහි දෙපාර්ශවයෙහි අක්‍රොශාදි වශයෙන් පවත්නා වචන හුවමාරුවද දෘෂ්ටිය නිසා උපන් තදපරුෂ බවද සිතේ කොපයද, දොම්නසද අනුන්ගේ සැපතෙහි නොසතුටුවීම පවත්නේ නම්, ස්වකීය චිත්තය හා ස්වකීය පිරිස මනාකොට නොසංසිඳුනේ වේද, මහණෙනි, ඒ විනිශ්චය ගැණ මෙසේ බලාපොරොත්තුවිය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

යුතුයි. (කෙසේද?) බොහෝකල් නොපැවැත්ම පිණිසද කෲර භාවය පිණිසද චණ්ඩභාවය පිණිසද පවතින්නේය. (ඊට මැදහත්වූ) භික්ෂූහුද සැපසේ වාසය කරන්නාහුය යන මෙයයි.

(පළමුවන වර්ගය නිමි.)

---

## 7. සුඛ වර්ගය.

1\. **පබ්බජ්ජා සුඛ සූත්‍රය:-** 1 "මහණෙනි, මේ සැපයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්,

2\. "ගිහි සැපයද පැවිදි සැපයද (යන දෙක) වෙත්.

3\. "මහණෙනි, මොහු දෙදෙන වනාහි සැපයෝ වෙත්.

4\. "මහණෙනි, මේ සැපයන් දෙදෙනා අතුරෙන් යම් මේ පැවිදි සැපයක් වේද මේ සැපය අග්‍රය"

(මේ වර්ගයේ සියලු සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

2\. **නෙක්ඛම්ම සුඛ සූත්‍රය:-** 2 "කාමසැපයද නෛෂ්ක්‍රමය සැපයද (යන දෙදෙනා) වෙත්.

4\. "මේ සැපයන් දෙදෙනා අතුරෙන් යම් මේ නෛෂ්ක්‍රමය සැපයක් වේද මේ සැපය අග්‍රයි."

3\. **නිරුපධි සූත්‍රය:-** 2. 'ලෞකික සැපයද ලොකොත්තර සැපයද (යන දෙදෙන) වෙත්.

4\. "මේ ද්විවිධවූ සැපයන් අතුරෙන් යම් මේ ලොකොත්තර සැපයක් වේද මේ සැපය අග්‍රයි."

4\. **අනාසව සුඛ සූත්‍රය:-** 2. ආශ්‍රව සහිතවූ (සංසාර) සැපයද ආශ්‍රව රහිතවූ (නිර්වාණ) සැපයද (යන දෙදෙන) වෙත්. මේ සැපයන් දෙදෙනා අතුරෙන් යම් මේ අනාසව සැපයක් වේද මේ සැපය අග්‍රයි"

5\. **නිරාමිස සුඛ සූත්‍රය:-** 2. "කාමාදී ආශ්‍රව සහිත සැපයද කාම රහිත (නික්ලෙශීවූ) නිවන් සැපයද (යන දෙදෙන) වෙත්.

4. "මේ සැපයන් දෙදෙනා අතුරෙන් යම් මේ නිරාමිස සැපයක් වේද මේ සැපය අග්‍රයි."

**6. අරිය සුඛ සූත්‍රයඃ-** 2. "ආය්‍ර්‍යයන් පිළිබඳ සැපයද අනාය්‍ර්‍ය (පෘථග්ජන) යන් පිළිබඳ සැපයද (යන දෙදෙන) වෙත්.

4. "මේ සැපයන් දෙදෙන අතුරෙන් යම් මේ ආය්‍ර්‍ය සැපයක් වේද මේ සැපය අග්‍රය"

**7. චෙතසික සුඛ සූත්‍රය-** 2 "කය පිළිබඳ සැපයද චෛතසික සැපයද (යන දෙදෙන) වෙත්.

4. "මේ සැපයන් දෙදෙන අතුරෙන් යම් මේ චෛතසික සැපයක් වේද මේ සැපය අග්‍රයි."

**8. නිප්පීතික සුඛ සූත්‍රයඃ-** 2. "ප්‍රීතිසහගත සැපයද ප්‍රීතිරහිත (නිෂ්ප්‍රීතික) සැපයද යන දෙකයි.

4. "මේ විවිධවූ සැපයන් අතුරෙන් යම් මේ ප්‍රීතිසහගත සැපයක් වේද මේ සැපය අග්‍රයි."

**9. උපෙක්ඛා සුඛ සූත්‍රයඃ-** 2 'ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයන් පිළිබඳ සාත සැපයද (චතුර්ථද්ධ්‍යානය පිළිබඳ) උපෙක්ෂා සැපයද (යන දෙදෙන) වෙත්.

4. "මේ සැපයන් දෙදෙන අතුරෙන් යම් මේ (චතුර්ථධ්‍යානය පිළිබඳ) උපෙක්ෂා සැපයක් වේද, මේ සැපය අග්‍රය."

**10. සමාධි සුඛ සූත්‍රයඃ-** 2 සමාධි (සහිත) සැපයද අසමාධි (සහිත) සැපයද යන දෙදෙන වෙත්.

4. "මේ සැපයන් දෙදෙන අතුරෙන් යම් මේ සමාධි සැපයක් වේද, මේ සැපය අග්‍රයි."

**11. නිප්පීතිකාරම්මණ සුඛ සූත්‍රයඃ-** 2 "ප්‍රීතිය අරමුණු කොට උපන් (ප්‍රථම ද්විතීයධ්‍යාන) සැපයද ප්‍රීතියෙන් පහව උපන් (තෘතීය චතුර්ථධ්‍යාන) සැපයද (යන දෙදෙන වෙත්)

4. "මේ සැපයන් දෙදෙන අතුරෙන් යම් මේ ප්‍රීති විරහිත සැපයක් වේද, මේ සැපය අග්‍රය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**12. උපෙක්ඛාරම්මණ සුඛ සූත්‍රයː-** 2 'සාතාරම්මණවූ (ප්‍රථමාදි ත්‍රිවිධ ධ්‍යානයන් අරමුණු කොට උපන්) සැපයද (චතුර්ථධ්‍යානය අරමුණු කොට උපන්) උපෙක්ඛාරම්මණ සැපයද (යන දෙදෙන) වෙත්.

4. "මේ සැපයන් දෙදෙන අතුරෙන් යම් මේ උපෙක්ෂාරම්මණ සැපයක් වේද, මේ සැපය අග්‍රය."

**13. අරූපාරම්මණ සුඛ සූත්‍රයː-** 2. "(රූපාවචර චතුර්ථ ධ්‍යානය අරමුණුකොට) රූපයන් අරභයා උපන් සැපයද (අරූපාවචර ධ්‍යානයන් අරමුණුකොට) අරූපයන් අරභයා උපන් සැපයද (යන දෙදෙන) වෙත්.

4. "මේ සැපයන් දෙදෙනා අතුරෙන් යම් මේ අරූප ධ්‍යානයන් අරමුණුකොට උපන් සැපයක් වේද, මේ අග්‍රය."

**(දෙවෙනි වර්ගය නිමි.)**

---

## 8. සනිමිත්ත වර්ගය.

**1. සනිමිත්ත සූත්‍රයː-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ කරුණු සහිතවම උපදිත්, කරුණු රහිතව නූපදිත්. එම කාරණයාගේ දුරුකිරීමෙන් මෙසේ ලාමකවූ අකුශල ධර්මයෝ නූපදිත්."

**2. සනිදාන සූත්‍රයː-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ නිදාන සහිතවම උපදිත්. නිදාන රහිතව නූපදිත්. ඒ නිදානයාගේම දුරුකිරීමෙන් මෙසේ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්."

**3. සහෙතුක සූත්‍රයː-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ හේතු සහිතවම උපදිත්, හේතු රහිතව නූපදිත්. ඒ හේතුහුගේම දුරුකිරීමෙන් මෙසේ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්."

**4. සසංඛාර සූත්‍රයː-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ සංස්කාර සහිතවම උපදිත්, සංස්කාර රහිතව නූපදිත්. ඒ

සංස්කාරයාගේම දුරුකිරීමෙන් මෙසේ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්."

**5. සප්පච්චය සූත්‍රයඃ-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ ප්‍රත්‍යය සහිතවම උපදිත්, ප්‍රත්‍යය රහිතව නූපදිත්. ඒ ප්‍රත්‍යයාගේම දුරුකිරීමෙන් මෙසේ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්."

**6. සරූප සූත්‍රයඃ-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ රූප (හේතු) සහිතවම උපදිත්. රූප රහිතව නූපදිත්. ඒ කාරණයාගේම දුරුකිරීමෙන් මෙසේ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්."

**7. සවෙදනා සූත්‍රයඃ-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ වේදනා සහිතවම උපදිත්, වේදනා රහිතව නූපදිත්. ඒ වේදනාවන්ගේම දුරුකිරීමෙන් මෙසේ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්."

**8. සසඤ්ඤා සූත්‍රයඃ-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ සංඥා සහිතවම උපදිත්, සංඥා රහිතව නූපදිත්. එම සංඥාවගේම දුරුකිරීමෙන් මෙසේ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්."

**9. සවිඤ්ඤාණ සූත්‍රයඃ-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ විඤ්ඤාණ සහිතවම උපදිත්, විඤ්ඤාණ රහිතව නූපදිත්. එම විඤ්ඤාණයාගේම දුරුකිරීමෙන් මෙසේ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්"

**10. සංඛතාරම්මණ සූත්‍රයඃ-** "මහණෙනි, ලාමකවූ අකුසල ධර්මයෝ සංඛතාරම්මණ සහිතව (ප්‍රත්‍යයෙන් නිපන් සංඛත ධර්මයන් අරමුණුකොට) ම උපදිත්, අසංඛතාරම්මණ සහිතව (අසංඛතවූ නිර්වාණය අරමුණුකොට) නූපදිත්. ඒ සංඛත ධර්මයාගේම දුරුකිරීමෙන් මෙසේ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ නොවෙත්."

**(තුන්වෙනි වර්ගය නිමි)**

---

# 9. ධර්ම වර්ගය

**1 විමුත්ති සූත්‍රය**:- 1. "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්,

2. චිත්ත විමුක්තිය (අර්හත්ඵල සමාධිය) ද ප්‍රඥා විමුක්තිය (අර්හත්ඵල ප්‍රඥාව) ද (යන දෙදෙන) වෙත්.

3 "මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙන වෙත්.

(මේ වර්ගයේ සියලු සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්)

**2. පග්ගාහා සූත්‍රය**:- 2. "ප්‍රග්‍රහය (වීර්‍ය්‍යය) ද අවික්ෂෙපය (සිතෙහි එකඟ බව) ද (යන දෙදෙන) වෙත්.

**3. නාමරූප සූත්‍රය**:- 2. "නාමයද රූපයද (යන දෙදෙන) වෙත්.

**4. විජ්ජාවිමුත්ති සූත්‍රය**:- 2 විද්‍යාව (සතරඵල ඥානයද) විමුක්තියද (යන දෙදෙන) වෙත්.

**5. භවදිට්ඨි සූත්‍රය**:- 2. "භව (ශාශ්වත) දෘෂ්ටියද විභව (උච්ඡෙද දෘෂ්ටියද යන දෙදෙන) වෙත්.

**6. අහිරික සූත්‍රය**:- 2. "පව් කිරීමෙහි ලජ්ජා රහිත බවද පව් කිරීමෙහි බිය නොවන බවද යන දෙදෙන වෙත්.

**7. හිරි සූත්‍රය**:- 2. "පව් කිරීමෙහි ලජ්ජා ඇති බවද පව් කිරීමෙහි බියද (යන දෙදෙන) වෙත්.

**8. දොවචස්ස සූත්‍රය**:- 2 දුර්වච (අකීකරු) බවද පාප මිත්‍රයන් ඇති බවද (යන දෙදෙන) වෙත්.

**9. සොවචස්ස සූත්‍රය**:- 2 "සුවච (කීකරු) බවද කල්‍යාණ මිත්‍රයන් ඇති බවද (යන දෙදෙන) වෙත්.

**10. ධාතුමනසිකාර සූත්‍රය**:- 2. ධාතුකුශලත්වය (ධාතූන් දැකීමෙහි දක්ෂ බව) ද මනසිකාර කුශලත්වය (අනිත්‍යාදී ලක්ෂණ දැකීමෙහි දක්ෂ බව) ද යන දෙදෙන වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

11. **ආපත්ති සූත්‍රයඃ-** 2 "ආපත්ති කුසලත්වය (ඇවැත් දැකීමෙහි දක්ෂ භාවය) ද ආපත්ති උට්ඨාන කුසලත්වය (ඇවතින් නැඟීමෙහි හෙවත් මිදීමෙහි දක්ෂකම) ද යන මේ දෙදෙන වෙත්.

**(සතරවැනි වර්ගය නිමි)**

---

## 10. බාල වර්ගය

1. **අනාගතභාර සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් (තමා වෙත) නොපැමිණි බර උසුලයිද, යමෙක් (තමා වෙත) පැමිණි බර නොඋසුලයිද යන දෙදෙනයි.

2. "මහණෙනි, මේ දෙදෙන වනාහි බාලයෝ (අඥානයෝ) වෙත්."

(මේ වර්ගයේ 3, 5, 7, 9 සූත්‍රවල 2 ඡෙද මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡෙදය මෙන් වෙත්)

2. **ආගතභාර සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් (තමා වෙත) පැමිණියාවූ බර උසුලයිද, යමෙක් (තමාවෙත) නොපැමිණියාවූ බර නොඋසුලයිද (යන දෙදෙනයි.)

2. "මහණෙනි, මේ දෙදෙන වනාහි පණ්ඩිතයෝ වෙත්.

(මේ වර්ගයේ 4, 6, 8, 10 සූත්‍රවල 2 ඡෙද මේ වර්ගයේ 2 සූත්‍රයේ 2 ඡෙදය මෙන් වෙත්)

3. **අකප්පිය සඤ්ඤී සූත්‍රයඃ-** "මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් අකැප වස්තුවෙහි අකැපය යන හැඟීම ඇත්තේද, යමෙක් කැප වස්තුවෙහි අකැපය යන හැඟීම ඇත්තේද (යන දෙදෙනයි)

4. **කප්පිය සඤ්ඤී සූත්‍රයඃ-** "මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් අකැප

වස්තුවෙහි අකැපය යන හැඟීම ඇත්තේද, යමෙක් කැප වස්තුවෙහි කැපය යන හැඟීම ඇත්තේද යන දෙදෙනයි.

**5. අනාපත්ති සඤ්ඤී සූත්‍රය:-** "මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙක් වෙත් කවර දෙදෙනෙක්ද යත්, යමෙක් ඇවැත් (වැරදි) නොවූ දෙයෙහි ඇවැත්ය යන සංඥා ඇත්තේද, යමෙක් ඇවැත්වූ දෙයෙහි ඇවැත් නොවේය යන සංඥා ඇත්තේද (යන දෙදෙනයි)

**6. ආපත්ති සඤ්ඤී සූත්‍රය:-** "මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙක් වෙත් කවර දෙදෙනෙක්ද යත්, යමෙක් ඇවැත් නොවූ දෙයෙහි ඇවැත් නොවේය යන හැඟීම ඇත්තේද, යමෙක් ඇවැත්වූ දෙයෙහි ඇවැත්ය යන හැඟීම ඇත්තේද (යන දෙදෙනයි)

**7. අධම්ම සඤ්ඤී සූත්‍රය:-** "මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් අධර්මයෙහි ධර්මය යන සංඥා ඇත්තේද, යමෙක් ධර්මයෙහි අධර්මය යන සංඥා ඇත්තේද (යන දෙදෙනයි)

**8. ධම්ම සඤ්ඤී සූත්‍රය:-** "මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් අධර්මයෙහි අධර්මය යන සංඥා ඇත්තේද, යමෙක් ධර්මයෙහි ධර්මය යන සංඥා ඇත්තේද (යන දෙදෙනයි.)

**9. අවිනය සඤ්ඤී සූත්‍රය:-** "මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් විනය නොවූවෙහි විනය යන සංඥා ඇත්තේද, යමෙක් විනය වූවෙහි අවිනය යන සංඥා ඇත්තේද, (යන දෙදෙනයි.)

**10. විනය සඤ්ඤී සූත්‍රය:-** "මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් විනය නොවූ දෙයෙහි අවිනය යන සංඥා ඇත්තේද, යමෙක් විනය වූවෙහි විනය යන සංඥා ඇත්තේද (යන දෙදෙනයි.)

**11. කුක්කුච්ච සූත්‍රය:-** "මහණෙනි, දෙදෙනෙකුන්ට ක්ලේශයෝ වැඩෙත්. කවර දෙදෙනෙකුන්ටද යත්, යමෙක් කුකුස්

නොකටයුත්තෙහි කුකුස් කෙරේද, යමෙක් කුකුස් කටයුත්තෙහි කුකුස් නොකෙරේද (යන දෙදෙනාටයි)

2. "මහණෙනි, මේ දෙදෙනාට වනාහි ක්ලේශයෝ වැඩෙත්.

(මේ වර්ගයේ 13, 15, 17, 19 සූත්‍රවල 2 ඡේද මේ සූත්‍රයේ 2 ඡේදය මෙන් වෙත්.)

12. **නකුක්කුච්ච සූත්‍රය**:- "මහණෙනි, දෙදෙනෙකුන් හට ක්ලේශයෝ නොවැඩෙත්. කවර දෙදෙනෙකුන්ටද යත්, යමෙක් කුකුස් නොකටයුත්තෙහි කුකුස් නොකරයිද, යමෙක් කුකුස් කටයුත්තෙහි කුකුස් කරයිද යන දෙදෙනාටයි

2. "මහණෙනි, මේ දෙදෙනාට වනාහි ක්ලේශයෝ නොවැඩෙත්.

(මේ වර්ගයේ 14, 16, 18, 20 සූත්‍රවල 2 ඡේද මේ සූත්‍රයේ 2 ඡේදය මෙන් වෙත්.)

13. **කප්පිය සඤ්ඤී සූත්‍රය**:- "මහණෙනි, දෙදෙනෙකුන්හට ආශ්‍රවයෝ වැඩෙත්. කවර දෙදෙනෙකුන්ටද යත්, යමෙක් කැප නොවූ දෙයෙහි කැපය යන සංඥා ඇත්තේවේද යමෙක් කැපවූ දෙයෙහි අකැපය යන සංඥා ඇත්තේ වේද (යන මේ දෙදෙනාටයි)

14. **අකප්පිය සඤ්ඤී සූත්‍රය**- "මහණෙනි, දෙදෙනෙකුන්හට ආශ්‍රවයෝ නොවැඩෙත්. කවර දෙදෙනෙකුන්ටද යත්, යමෙක් අකැපවූ දෙයෙහි අකැපය යන සංඥා ඇත්තේ වේද, යමෙක් කැපවූ දෙයෙහි කැපය යන සංඥා ඇත්තේ වේද (යන මේ දෙදෙනාටයි)

15. **ආපත්ති සඤ්ඤී සූත්‍රය**:- "මහණෙනි, දෙදෙනෙකුන්හට ආශ්‍රවයෝ වැඩෙත්. කවර දෙදෙනෙකුන්හටද යත්, යමෙක් ඇවැත් නුවූවෙහි ඇවැත්ය යන සංඥා ඇත්තේ වේද යමෙක් ඇවැත් වූවෙහි ඇවැත් නැත යන සංඥා ඇත්තේ වේද (යන දෙදෙනාටයි)

16. **අනාපත්ති සඤ්ඤී සූත්‍රය**:- "මහණෙනි, දෙදෙනෙකුන්හට ආශ්‍රවයෝ නොවැඩෙත්. කවර දෙදෙනෙකුන්ටද යත්. යමෙක්

ඇවැත් නුවූවෙහි ඇවැත් නැත යන සංඥා ඇත්තේ වේද, යමෙක් ඇවැත්වූවෙහි ඇවැත්ය යන සංඥා ඇත්තේ වේද (යන දෙදෙනාටයි)

17. **ධම්ම සඤ්ඤී සූත්‍රයඃ-** "මහණෙනි, දෙදෙනෙකුන් හට ආශ්‍රවයෝ වැඩෙත්. කවර දෙදෙනෙකුන්හටද යත් යමෙක් අධර්ම වූවෙහි ධර්මය යන සංඥා ඇත්තේ වේද, යමෙක් ධර්ම වූවෙහි අධර්මය යන සංඥා ඇත්තේ වේද (යන දෙදෙනාටයි.)

18. **අධම්ම සඤ්ඤී සූත්‍රය-** "මහණෙනි, දෙදෙනෙකුන් හට ආශ්‍රවයෝ නොවැඩෙත්. කවර දෙදෙනෙකුන්ටද යත්, යමෙක් අධර්මවූවෙහි අධර්මය යන සංඥා ඇත්තේ වේද, යමෙක් ධර්ම වූවෙහි ධර්මය යන සංඥා ඇත්තේ වේද යන දෙදෙනාටයි.

19. **විනය සඤ්ඤී සූත්‍රය-** "මහණෙනි, දෙදෙනෙකුන් හට ආශ්‍රවයෝ වැඩෙත්. කවර දෙදෙනෙකුන්ටද යත්, යමෙක් විනය නොවූවෙහි විනය යන සංඥා ඇත්තේ වේද, යමෙක් විනය වූවෙහි විනය නොවේ යන සංඥා ඇත්තේ වේද (යන දෙදෙනාටයි)

20. **අවිනය සඤ්ඤී සූත්‍රය-** "මහණෙනි, දෙදෙනෙකුන්හට ආශ්‍රවයෝ නොවැඩෙත්. කවර දෙදෙනෙකුන්ටද යත්, යමෙක් විනය නොවූවෙහි විනය නොවේ යන සංඥා ඇත්තේ වේද, යමෙක් විනය වූවෙහි විනය යන සංඥා ඇත්තේ වේද (යන දෙදෙනාටයි.)"

**(පස්වෙනි බාල වර්ගය නිමි)**

---

(දෙවෙනි පණ්ණාසකය සමාප්තයි)

---

## තුන්වෙනි පණ්ණාසකය.

## 11. ආසා වර්ගය

1. **ආසා සූත්‍රයඃ-** "මහණෙනි, අත්හැරීමට දුෂ්කරවූ මේ ආසා දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ලාභාසාවද

ජීවිතාසාවද (යන දෙදෙනයි) මහණෙනි, මේ ආසා දෙක වනාහි දුරුකිරීමට දුෂ්කර වෙති."

**2. දුල්ලභ පුග්ගල සූත්‍රය:-** "මහණෙනි, ලොව දුර්ලභවූ මේ පුද්ගලයන් දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් පූර්වකාරී වේද (පළමුව උපකාර කෙරේද) යමෙක් කෘතඥව කෘතවේදි වේද (කළ උපකාර දැන පසුව උපකාර කෙරේද යන දෙදෙනයි.) මහණෙනි, මේ දෙදෙන වනාහි ලොව දුර්ලභ පුද්ගලයෝ වෙත්."

**3. දුල්ලභ පුග්ගල සූත්‍රය:-** "මහණෙනි, ලොව දුර්ලභවූ මේ පුද්ගලයන් දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, (නිර්වාණ ධර්මයෙන්) තෘප්තවූ පුද්ගලයාද, අනුන් තෘප්තකර වන්නාවූ පුද්ගලයාද (යන දෙදෙනයි.) මහණෙනි, මේ දෙදෙන වනාහි ලොව දුර්ලභ පුද්ගලයෝ වෙත්."

**4. දුත්තප්ප සූත්‍රය:-** "මහණෙනි, (තෘප්තියට පැමිණවීමට) දුෂ්කර මේ පුද්ගලයන් දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, යමෙක් ලැබුණු ලැබුණු දේ බහා (සඟවා) තබයිද, යමෙක් ලැබුණු ලැබුණු දේ වියදම් කරයිද (යන දෙදෙනයි) මහණෙනි, මේ දෙදෙන වනාහි සතුටු කිරීමට දුෂ්කර පුද්ගලයෝ වෙත්."

**5. සුතප්ප සූත්‍රය:-** "මහණෙනි, සැපසේ පිනවියහැකි මේ පුද්ගලයන් දෙදෙනෙක් වෙත් කවර දෙදෙනෙක්ද යත්, යමෙක් ලද ලද දේ බහා (සඟවා) නොතබයිද, යමෙක් ලද ලද දේ වියදම් නොකරයිද (යන දෙදෙනයි.) මහණෙනි, මේ දෙදෙන වනාහි සැපසේ පිණවිය හැකි පුද්ගලයෝ වෙත්."

**6. රාගපච්චය සූත්‍රය:-** "මහණෙනි, රාගය ඉපදීමට මේ හේතූන් දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, (ඉෂ්ටාරම්මණ නම්) සුභනිමිත්තය, නුනුවණින් මෙනෙහි කිරීමය (යන දෙදෙනයි) මහණෙනි, මේ දෙදෙන වනාහි රාගය ඉපදීමට ප්‍රත්‍යය වෙත්."

**7. දොසපච්චය සූත්‍රය:-** "මහණෙනි, ද්වෙෂය ඉපදීමට මේ හේතූන් දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, (අනිෂ්ටාරම්මණ සංඛ්‍යාත) ප්‍රතිඝ (ක්‍රොධ) නිමිත්තය නුනුවණින්

මෙනෙහි කිරීමය (යන දෙදෙනයි.) මහණෙනි, මේ දෙදෙන වනාහි ද්වේෂය ඉපදීමට ප්‍රත්‍යය වෙත්."

8. **මිච්ඡාදිට්ඨි පච්චය සූත්‍රයː-** "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය ඉපදීමට මේ හේතූන් දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, අන්‍යයන් වෙතින් අසද්ධර්මශ්‍රවණය හා නුනුවණින් මෙනෙහි කිරීමය (යන දෙදෙනයි.) මහණෙනි, මේ දෙදෙන වනාහි මිථ්‍යාදෘෂ්ටිය ඉපදීමට ප්‍රත්‍යය වෙත්."

9. **සම්මාදිට්ඨි පච්චය සූත්‍රයː-** "මහණෙනි, සම්‍යග්දෘෂ්ටිය ඉපදීමට මේ හේතූන් දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, අන්‍යයන් වෙතින් සද්ධර්මශ්‍රවණය හා නුවණින් මෙනෙහි කිරීමය (යන දෙදෙනයි) මහණෙනි, මේ දෙදෙන වනාහි සම්‍යග්දෘෂ්ටිය ඉපදීමට ප්‍රත්‍යය වෙත්."

10. **ලහුකාපත්ති සූත්‍රයː-** "මහණෙනි, මේ ආපත්තීහු (වරද) දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ලහුක (සැහැල්ලු) ආපත්තියද ගරුක (මහත්වූ) ආපත්තියද (යන දෙදෙනයි.) මහණෙනි, මේ වනාහි ආපත්තීහු දෙදෙන වෙත්.

11. **දුට්ඨුල්ලාපත්ති සූත්‍රයː-** "මහණෙනි, මේ ආපත්තීහු (වරද) දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, පාරාජිකාදී ආපත්තියද (පචිති ආදි) අදුට්ඨුල්ල ආපත්තියද (යන දෙදෙනයි) "මහණෙනි, මේ වනාහි ආපත්තීහු දෙදෙන වෙත්"

12. **සාවසෙසාපත්ති සූත්‍රයː-** "මහණෙනි, මේ ආපත්තීහු (වරද) දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, සාවසෙස (සංඝාදිසෙස) ආපත්තියද අනවසෙස (පාරාජිකා) ආපත්තියද (යන දෙදෙනයි) 'මහණෙනි, මේ වනාහි ආපත්ති දෙදෙන වෙත්."

**(පළමුවෙනි ආසා වර්ගය නිමි.)**

---

## 12. ආයාචන වර්ගය.

1. **තුලා සූත්‍රයː-** "මහණෙනි, මනාව ප්‍රාර්ථනා කරන්නාවූ සැදැහැවත් භික්ෂුවක් වේනම් හෙතෙම මෙසේ ප්‍රාර්ථනා කරයි.

ශාරිපුත්‍ර මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේලා යම්බඳු වෙත් නම් එබඳු වෙමි'යි (කියායි.) මහණෙනි, යම් මේ ශාරිපුත්‍ර මොග්ගල්ලාන ස්ථවිර දෙනමක් වෙද්ද, මාගේ ශ්‍රාවක භික්ෂූන්ට මේ (දෙනම) තුලාව (තරාදිය) යි. මේ (දෙනම) ප්‍රමාණය (මැනීම) යි."

2. **උප්පලවණ්ණා සූත්‍රය**:- "මහණෙනි, මනාව ප්‍රාර්ථනා කරන්නාවූ සැදැහැවත් මෙහෙණක් වේනම් ඕතොමෝ මෙසේ ප්‍රාර්ථනා කරයි. 'ඛෙමා උප්පලවණ්ණා ස්ථවිරීන් වහන්සේලා යම්බඳු වෙත්ද (මමද) එබඳු වෙමි'යි (කියායි) මහණෙනි, යම් මේ ඛෙමා උප්පලවණ්ණා යන භික්ෂුණීන් දෙනමක් වෙද්ද, මාගේ ශ්‍රාවිකාවූ භික්ෂුණීන්ට මේ (දෙනම) තුලාවයි, මේ (දෙනම) ප්‍රමාණයයි."

3. **චිත්තාලවක සූත්‍රය**:- "මහණෙනි, මනාව ප්‍රාර්ථනා කරන්නාවූ සැදැහැවත් උපාසක කෙනෙක් වේනම්, හෙතෙම මෙසේ ප්‍රාර්ථනා කරයි 'චිත්තගහපති, හත්ථක ආලවක දෙදෙනා යම්සේද, මමත් එසේ වෙමි'යි (කියායි.) මහණෙනි, යම් මේ චිත්තගහපති හත්ථක ආලවක යන දෙදෙනෙක් වෙද්ද මාගේ ශ්‍රාවකවූ උපාසකයන්ට මේ (දෙදෙන) තුලාවයි, මේ (දෙදෙන) ප්‍රමාණයි."

4. **උත්තර නන්දමාතා සූත්‍රය**:- "මහණෙනි, මනාව ප්‍රාර්ථනා කරන්නාවූ සැදැහැවත් උපාසිකාවක් වේනම් ඕතොමෝ මෙසේ ප්‍රාර්ථනා කරයි. 'ඛුජ්ජුත්තරා, වෙළුකණ්ටකී (නම් නුවර වැසි) නන්දමාතා යන උපාසිකාවන් යම්සේද, මමත් එසේම වෙමි'යි (කියායි) මහණෙනි, යම් මේ ඛුජ්ජුත්තරා-වෙළුකණ්ටකී නන්දමාතා යන දෙදෙනෙක් වෙද්ද මාගේ ශ්‍රාවිකාවූ උපාසිකාවන්ට මේ (දෙදෙන) තුලාවයි, මේ (දෙදෙන) ප්‍රමාණයි."

5. **වණ්ණභාසන සූත්‍රය**:- "මහණෙනි, කරුණු දෙකකින් යුක්තවූ අව්‍යක්තවූ අසත්පුරුෂවූ අඥානතෙම සාරා දමනලද ගුණ ඇති නසන ලද ගුණ ඇති ආත්මයක් රක්ෂා කෙරෙයි. ප්‍රාඥයන් විසින් වරද පැමිණවිය යුත්තෙක් උපවාද කටයුත්තෙක්ද වේ. බොහෝ අකුසල්ද රැස්කරයි කවර කරුණු දෙකකින්ද යත්,

2. නොමදැන නොම පිවිස (විනිශ්චයෙන් තීරණයට නොපැමිණ) අගුණ කියයුත්තාගේ ගුණ කීමද, නොම දැන නොමපිවිස ගුණ කියයුත්තාගේ අගුණ කීමද (යන කරුණු) දෙකයි

3. "මහණෙනි, මේ කරුණු දෙකින් යුත් අව්‍යක්තවූ අසත්පුරුෂවූ බාලතෙම උදුරා දමන ලද ගුණ ඇති නසන ලද ගුණ ඇති ආත්මයක් පොෂණය කෙරෙයි, ප්‍රාඥයන්ට සදොස් කෙනෙක්ද වේ, උපවාද සහිතවූවෙක්ද වේ. (හෙතෙම) බොහෝ අකුසල්ද රැස්කෙරෙයි"

6. **අවණ්ණභාසන සූත්‍රයː-** 1. "මහණෙනි, දෙකරුණකින් යුක්තවූ ව්‍යක්තවූ සත්පුරුෂවූ ප්‍රාඥතෙම නොම සාරාදමන ලද ගුණ ඇති නොම නසන ලද ගුණ ඇති ආත්මයක් රක්ෂා කරයි. නුවණැතියන්හට උපවාද රහිතවූයේ නිරවද්‍යවූයේද වේ. බොහෝ කුසල්ද රැස් කරයි. කවර දෙකරුණකින්ද යත්,

2. 'දැන විනිශ්චයෙන් තීරණයට බැස අගුණ කීමට සුදුස්සාගේ අගුණ කීමද, එසේ දැන තීරණයට එළඹ ගුණකීමට සුදුස්සාගේ ගුණ කීමද (යන දෙකෙනි.)

3. "මහණෙනි, මේ කරුණු දෙකින් යුක්තවූ ව්‍යක්තවූ සත්පුරුෂවූ ප්‍රාඥතෙම නොම සාරා දමන ලද ගුණ ඇති නොම නසන ලද ගුණ ඇති ආත්මයක් පොෂණය කෙරෙයි, ප්‍රාඥයන්ට උපවාද රහිතවූයේ නිරවද්‍ය වූයේදවේ. (හෙතෙම) බොහෝ කුසල්ද රැස් කෙරේ."

7. **පසාදූපදංසන සූත්‍රයː-** (මේ සූත්‍රයේ 1, 3 ඡෙද මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්)

2. "නොමදැන විනිශ්චයට නොපැමිණ නොපැහැදියයුතු කාරණයෙහි ප්‍රසාදය ඉපදවීමද නොමදැන විනිශ්චයට නොඑළඹ පැහැදිය යුතු කාරණයෙහි අප්‍රසාදය ඉපදවීමද (යන දෙකෙනි)

8. **අප්පසාදූපදංසන සූත්‍රයː-** (මේ සූත්‍රයේ 1, 3 ඡෙද මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

2. "දැන තීරණයට එළඹ නොපැහැදියයුතු කරුණෙහි අප්‍රසාදය ඉපදවීමද, දැන තීරණයට පැමිණ පැහැදිය යුතු කරුණෙහි ප්‍රසාදය ඉපදවීමද (යන දෙකෙනි.)

**9. මාතාපිතු මිච්ඡාපටිපදා සූත්‍ර:-** "මහණෙනි, දෙදෙනකුන් කෙරෙහි වරදවා පිළිපදනාවූ අව්‍යක්තවූ අසත්පුරුෂවූ බාලතෙම සාරා (උදුරා) දමන ලද ගුණ ඇති නසන ලද ගුණ ඇති ආත්මයක් රක්ෂා කෙරෙයි. නුවණැත්තන්හට උපවාද සහිතවූයේ වරද සහිතවූයේද වේ. බොහෝ අකුසල්ද රැස් කෙරෙයි. කවර දෙදෙනෙකුන් කෙරෙහිද යත්,

2. "මව කෙරෙහිද පියා කෙරෙහිද (යන දෙදෙන කෙරෙහිය.)

3. "මහණෙනි, මේ දෙදෙන කෙරෙහි වනාහි වරදවා පිළිපදනාවූ අව්‍යක්තවූ අසත්පුරුෂවූ බාලතෙම සාරා දමන ලද ගුණ ඇති නසන ලද ගුණ ඇති ආත්මයක් පරිහරණය (පොෂණය) කෙරෙයි. ප්‍රාඥයන්හට උපවාද සහිතවූයේ වරද සහිත වූයේද වේ. හෙතෙම බොහෝ අකුසල්ද රැස් කෙරෙයි."

**10. මාතාපිතු සම්මාපටිපදා සූත්‍රය:-** "මහණෙනි, දෙදෙනකුන් කෙරෙහි මනාසේ පිළිපදනාවූ ව්‍යක්තවූ සත්පුරුෂවූ ප්‍රාඥතෙම සාරා නොදමන ලද ගුණ ඇති නොම නසන ලද ගුණ ඇති ආත්මයක් රක්ෂා කෙරෙයි. නුවණැත්තන්හට උපවාද රහිත වූයේ නිර්දොෂවූයේද වේ. බොහෝ කුසල්ද රැස් කෙරෙයි. කවර දෙදෙනකුන් කෙරෙහිද යත්,

2. 'මව කෙරෙහිද පියා කෙරෙහිද (යන දෙදෙන කෙරෙහිය.)

3. "මහණෙනි මේ දෙදෙන කෙරෙහි වනාහි මනාසේ පිළිපදනාවූ ව්‍යක්තවූ සත්පුරුෂවූ ප්‍රාඥතෙම නොම සාරා දමන ලද ගුණ ඇති නොම නසන ලද ගුණ ඇති ආත්මයක් පරිහරණය (පොෂණය) කෙරෙයි, නුවණැත්තන්හට උපවාද රහිතවූයේ නිර්දොෂවූයේද වේ. (හෙතෙම) බොහෝ කුසල්ද රැස් කෙරෙයි.

11. **තථාගත සාවක මිච්ඡාපටිපදා සූත්‍රය:-** (මේ සූත්‍රයේ 1, 3 ඡේද මේ වර්ගයේ 9 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

2. "තථාගතයන් වහන්සේ කෙරෙහිද, තථාගත ශ්‍රාවකයන් වහන්සේ කෙරෙහිද (යන දෙදෙන කෙරෙහිය.)

12. **තථාගත සාවක සම්මාපටිපදා සූත්‍රය:-** (මේ සූත්‍රයේ 1, 3 ඡේද මේ වර්ගයේ 10 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

2. "තථාගතයන් වහන්සේ කෙරෙහිද තථාගත ශ්‍රාවකයන් වහන්සේ කෙරෙහිද (යන දෙදෙන කෙරෙහිය)

13. **වොදාන සූත්‍රය:-** "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ස්වකීය චිත්තයාගේ පිරිසිදු බවද ලොකයෙහි කිසිවක් දැඩි (උපාදාන වශයෙන්) නොගැණීමද (යන දෙදෙනයි) මහණෙනි, මේ වනාහි ධර්ම දෙකකි"

14. **කොධූපනාහ සූත්‍රය:-** "මහණෙනි, මේ ධර්මයෝ (ස්වභාවයෝ) දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්. ක්‍රොධයද බද්ධවෛරයද (යන දෙදෙනයි.) මහණෙනි, මේ වනාහි ධර්ම දෙකකි."

15. **කොධූපනාහ විනය සූත්‍රය:-** "මහණෙනි, මේ ධර්මයෝ (ස්වභාවයෝ) දෙදෙනෙක් වෙත් කවර දෙදෙනෙක්ද යත්, ක්‍රොධය මැඩපැවැත්වීමද බද්ධවෛරය මැඩලීමද (යන දෙදෙනයි) මහණෙනි, මේ වනාහි ධර්ම දෙකකි."

**(දෙවැනි ආයාචන වර්ගය නිමි.)**

---

## 13. දාන වර්ගය

1. **දාන සූත්‍රය:-** "මහණෙනි, මේ දාන දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, සිවුපස දානයද ධර්ම දානයද (යන දෙකයි.) මහණෙනි, මේ දෙක වනාහි දානයෝ වෙත්. මහණෙනි, මේ දාන දෙක අතුරින් යම් මේ ධර්ම දානයක් වේද මෙය අග්‍රවෙයි."

**2. යාග සූත්‍රයː-** "මහණෙනි, මේ යාගයෝ (පිදීම්) දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිස යාගයද ධර්ම යාගයද (යන දෙකයි) මහණෙනි, මේ දෙක වනාහි යාගයෝ වෙත්. මහණෙනි, මේ පිදීම් දෙක අතුරින් යම් මේ ධර්මයෙන් පිදීමක් වේද, මෙය අග්‍රය"

**3. චාග සූත්‍රයː-** "මහණෙනි, මේ තෑගි දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, ආමිස තෑග්ගද ධර්ම තෑග්ගද (යන දෙකයි.) මහණෙනි, මේ දෙක වනාහි තෑගි වෙත්. මහණෙනි, මේ තෑගි දෙක අතුරෙන් යම් මේ ධර්මයෙන් කරණ තෑග්ගක් වේද, මෙය අග්‍රය"

**4. පරිච්චාග සූත්‍රයː-** "මහණෙනි, මේ පරිත්‍යගයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිස පරිත්‍යාගයද ධර්ම පරිත්‍යාගයද (යන දෙකයි) මහණෙනි, මේ දෙක වනාහි පරිත්‍යාගයෝ වෙත්. මහණෙනි, මේ පරිත්‍යාග දෙක අතුරෙන් යම් මේ ධර්ම පරිත්‍යාගයක වේද, මෙය අග්‍රය."

**5. භෝග සූත්‍රයː-** "මහණෙනි, මේ භෝගයෝ (වැළඳීම්) දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිස භොගයද ධර්මභොගයද (යන දෙකයි) මහණෙනි, මේ දෙක වනාහි භෝගයෝ වෙත්. මහණෙනි, මේ වැළඳීම් දෙක අතුරෙන් යම් මේ ධර්ම භොගයක් වේද මෙය අග්‍රය."

**6. සම්භොග සූත්‍රයː-** "මහණෙනි, මේ සම්භොගයෝ (මනා බුදීම්) දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිස සම්භොගයද ධර්ම සම්භොගයද (යන දෙකයි) මහණෙනි මේ දෙක වනාහි සම්භොගයෝ වෙත්. මහණෙනි, මේ සම්භොග (සමගිව වැළඳීම්) දෙක අතුරෙන් යම් මේ ධර්ම සම්භොගයක් වේද, මෙය අග්‍රය."

**7. සංවිභාග සූත්‍රයː-** "මහණෙනි, මේ සංවිභාගයෝ (බෙදාදීම්) දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිස බෙදාදීමද ධර්ම බෙදාදීමද (යන දෙකයි.) මහණෙනි, මේ දෙක වනාහි බෙදාදීම් වෙත්. මහණෙනි, මේ බෙදාදීම් දෙක අතුරෙන් යම් මේ ධර්ම බෙදාදීමක් වේද, මෙය අග්‍රය.'

**8. සංගහ සූත්‍රයː-** "මහණෙනි, මේ සංග්‍රහයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිස සංග්‍රහයද ධර්ම සංග්‍රහයද (යන දෙකයි) මහණෙනි, මේ දෙක වනාහි සංග්‍රහයෝ වෙත්. මහණෙනි, මේ සංග්‍රහ දෙක අතුරෙන් යම් මේ ධර්මයෙන් සංග්‍රහ කිරීමක් වේද, මෙය අග්‍රය."

**9. අනුග්ගහ සූත්‍රයː-** "මහණෙනි, මේ අනුග්‍රහයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිස අනුග්‍රහයද ධර්ම අනුග්‍රහයද (යන දෙකයි) මහණෙනි, මේ දෙක වනාහි අනුග්‍රහයෝ වෙත්. මහණෙනි, මේ දෙක අතුරෙන් යම් මේ ධර්ම අනුග්‍රහයක් වේද, මෙය අග්‍රය."

**10. අනුකම්පා සූත්‍රයː-** "මහණෙනි, මේ අනුකම්පාවෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිස අනුකම්පාවද ධර්ම අනුකම්පාවද (යන දෙකයි.) මහණෙනි මේ දෙක වනාහි අනුකම්පාවෝ වෙත්. මහණෙනි, මේ අනුකම්පා දෙක අතුරෙන් යම් මේ ධර්මයෙන් අනුකම්පා කිරීමක් වේද, මෙය අග්‍රය."

**(තුන්වැනි දාන වර්ගය නිමි.)**

---

## 14. සන්ථාර වර්ගය

**1. සන්ථාර සූත්‍රයː-** "මහණෙනි, මේ ඇතිරීම් (සඳර) දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, ආමිස සන්ථාරයද ධර්ම සන්ථාරයද (යන දෙකයි.) මහණෙනි, මේ දෙක වනාහි ඇතිරීම් වෙත්. මහණෙනි, මේ ඇතිරීම් දෙක අතුරෙන් යම් මේ ධර්ම ඇතිකිරීමක් වේද මෙය අග්‍රය."

**2. පටිසන්ථාර සූත්‍රයː-** "මහණෙනි, මේ පිළිසඳර දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, සිවුපසය පිළිබඳ පිළිසඳරද ධර්මය පිළිබඳ පිළිසඳරද (යන දෙකයි) මහණෙනි, මේ දෙක වනාහි පිළිසඳරයෝ වෙත්. මහණෙනි, මේ පිළිසඳර දෙක අතුරෙන් යම් මේ ධර්මයෙන් කරණු ලබන පිළිසඳරක් වේද, මෙය අග්‍රය."

3. **එසනා සූත්‍රය**:- "මහණෙනි, මේ සෙවීම් දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, සිවුපසය සෙවීමද ධර්මය සෙවීමද (යන දෙකයි.) මහණෙනි, මේ දෙක වනාහි සෙවීම් නම් වෙත්. මහණෙනි, මේ සෙවීම් දෙක අතුරෙන් යම් මේ ධර්ම සෙවීමක් වේද, මෙය අග්‍රය"

4. **පරියෙසනා සූත්‍රය**:- "මහණෙනි, මේ හාත්පස පවත්නා සෙවීම් දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, සිවුපසය පරියෙසනාවද ධර්ම හාත්පස සෙවීමද (යන දෙකයි.) මහණෙනි මේ දෙක වනාහි සෙවීම් නම් වෙත්. මහණෙනි, මේ හාත්පස සෙවීම් දෙක අතුරෙන් යම් මේ ධර්ම හාත්පස සෙවීමක් වේද, මෙය අග්‍රය."

5. **පරියෙට්ඨි සූත්‍රය**:- "මහණෙනි, සම්පූර්ණවූ සෙවීම් දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, සම්පූර්ණ සිවුපසය සෙවීමද සම්පූර්ණ ධර්මය සෙවීමද (යන දෙකයි.) මහණෙනි, මේ දෙක වනාහි සම්පූර්ණවූ සෙවීම් දෙකක් වෙත්. මහණෙනි, මේ සම්පූර්ණ සෙවීම් දෙක අතුරෙන් යම් මේ සම්පූර්ණ ධර්මය සෙවීමක් වේද, මෙය අග්‍රය."

6. **පූජා සූත්‍රය**:- "මහණෙනි, මේ පූජා දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, ආමිස පූජාවද ධර්ම පූජාවද (යන දෙකයි) මහණෙනි, මේ දෙක වනාහි පූජා වෙත්. මහණෙනි, මේ පූජා දෙක අතුරෙන් යම් මේ ධර්ම පූජාවක් වේද, මෙය අග්‍රය."

7. **ආතිථෙය්‍ය සූත්‍රය**:- "මහණෙනි, මේ ආගන්තුක සත්කාරයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිසයෙන් කරණ ආගන්තුක සත්කාරයද ධර්මයෙන් කරණ ආගන්තුක සත්කාරයද (යන දෙකයි) මහණෙනි, මේ දෙක වනාහි ආගන්තුක සත්කාර වෙත්. මහණෙනි, මේ ආගන්තුක සත්කාර දෙක අතුරෙන් යම් මේ ධර්මයෙන් කරණ ආගන්තුක සත්කාරයක් වේද, මෙය අග්‍රය."

8. **ඉද්ධි සූත්‍රය**:- "මහණෙනි, මේ සමෘද්ධිහු දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, ආමිස සමෘද්ධියද, ධර්ම සමෘද්ධියද (යන දෙකයි.) මහණෙනි, මේ දෙක වනාහි සමෘද්ධිහු වෙත්. මහණෙනි,

මේ සමෘද්ධි දෙක අතුරෙන් යම් මේ ධර්ම සමෘද්ධියක් වේද, මෙය අග්‍රය"

**9. වුද්ධි සූත්‍රයඃ-** "මහණෙනි, මේ වැඩීම් දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, ආමිසයෙන් වැඩීමද ධර්මයෙන් වැඩීමද (යන දෙකයි) මහණෙනි, මේ දෙක වනාහි වැඩීම් වෙත් මහණෙනි, මේ වැඩීම් දෙක අතුරෙන් යම් මේ ධර්මයෙන් වැඩීමක් වේද, මෙය අග්‍රය"

**10. රතන සූත්‍රයඃ-** "මහණෙනි, මේ රත්නයෝ (ඇලුම් කරණු ලබන්නෝ) දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිස රත්නයද ධර්මරත්නයද (යන දෙදෙනයි.) මහණෙනි, මේ දෙදෙන වනාහි රත්නයෝ වෙත්. මහණෙනි, මේ රත්න දෙදෙන අතුරෙන් යම් මේ ධර්ම රත්නයක් වේද මෙය අග්‍රය."

**11. සනනිචය සූත්‍රයඃ-** "මහණෙනි, මේ රැස්කිරීම් දෙකක් වෙත්. කවර දෙකක්ද යත්, සිවුපසය රැස්කිරීමද ධර්මය රැස්කිරීමද (යන දෙකයි.) මහණෙනි, මේ දෙක වනාහි රැස්කිරීම් වෙත් මහණෙනි, මේ රැස්කිරීම් දෙක අතුරෙන් යම් මේ ධර්මය රැස්කිරීමක් වේද මෙය අග්‍රය"

**12. වෙපුල්ල සූත්‍රය-** "මහණෙනි, මේ මහත් භාවයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්, ආමිසයෙහි මහත් බවද, ධර්මයෙහි මහත් බවද (යන දෙදෙනයි.) මහණෙනි, මේ දෙදෙන වනාහි මහත්භාවයෝ වෙත්. මහණෙනි, මේ මහත්භාව දෙක අතුරෙන් යම් මේ ධර්ම මහත් භාවයක් වේද මෙය අග්‍රය."

**(සතරවැනි සන්ථාර වර්ගය නිමි.)**

---

## 15. සමාපත්ති වර්ගය.

**1. සමාපත්ති සූත්‍රයඃ-** "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්,

2. 'සමවතට සමවැදීමෙහි දක්ෂ බවද සමවතින් නැගීමෙහි දක්ෂ බවද (යන දෙදෙනයි)

3. මහණෙනි, මේ දෙදෙන වනාහි ධර්මයෝ වෙත්.”

(මේ වර්ගයේ සියලු සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

2. **අජ්ජව සූත්‍රයː-** 2. “ඍජු බවද මෘදු බවද (යන දෙදෙනයි.)

3. **ඛන්තී සූත්‍රයː-** 2. “ඉවසන බවද සුසිල්වත් බවද (යන දෙදෙනයි)

4. **සාඛල්‍ය සූත්‍රයː-** 2 “මොළොක් බස් කීම් වශයෙන් සතුටුවන බවද පිළිසඳර කිරීමද (යන දෙදෙනයි)

5. **අවිහිංසා සූත්‍රයː-** 2 “අවිහිංසාව (කුළුණු සිත් පෙරදැරි බව) ද සුචිභාවය (ශීල වශයෙන් පිරිසුදු බව) ද (යන දෙදෙනයි)

6. **අගුත්තද්වාර සූත්‍රයː-** 2 “ඉන්ද්‍රියෙන්හි නොවසන ලද දොර ඇති බවද භොජනයෙහි පමණ නොදන්නා බවද (යන දෙදෙනයි)

7. **ගුත්තද්වාර සූත්‍රයː-** 2. “ඉන්ද්‍රියයන්හි වසන ලද දොර ඇති බවද භොජනයෙහි පමණ දන්නා බවද (යන දෙදෙනයි.)

8. **පටිසංඛාන සූත්‍රයː-** 2. “පරීක්ෂාකිරීමේ බලයද භාවනා බලයද (යන දෙදෙනයි.)

9. **සතිබල සූත්‍රයː-** 2. “ස්මෘති බලයද සමාධි බලයද (යන දෙදෙනයි.)

10. **සමථවිපස්සනා සූත්‍රයː-** 2. “සමථය (සිතෙහි එකඟ බව) ද විපස්සනාවද (යන දෙදෙනයි.)

11. **විපත්ති සූත්‍රයː-** 2 “සීලවිපත්තිය (දුශ්ශීල බව) ද දිට්ඨිවිපත්තිය (මිථ්‍යාදෘෂ්ටිය) ද (යන දෙදෙනයි.)

12. **සම්පදා සූත්‍රයː-** 2. සීලසම්පත්තිය ද සම්‍යක් දෘෂ්ටියද (යන දෙදෙනයි.)

13. **ශීලවිසුද්ධි සූත්‍රයː-** 2. “සීලවිසුද්ධිය (විශුද්ධියට පමුණුවන ශීලය) ද දිට්ඨිවිසුද්ධිය (විශුද්ධියට පමුණුවන මාර්ග සම්‍යග් දෘෂ්ටිය) ද (යන දෙදෙනයි)

14. **දිට්ඨිවිසුද්ධි සූත්‍රයඃ**- 2. "දෘෂ්ටිවිසුද්ධිය (විශුද්ධියට පමුණුවන මාර්ග සම්‍යග්දෘෂ්ටිය) ද දෘෂ්ටියට අනුරූපවූවහුගේ ප්‍රධාන වීර්‍යයද (යන දෙදෙනයි)

15. **අසන්තුට්ඨිතා සූත්‍රයඃ**- 2. "අර්හත් මාර්ගය හැර සෙසු) කුශල ධර්මයන්හි නොසතුටු බවද ප්‍රධාන වීර්‍යයෙහි නොපසුබස්නා බවද (යන දෙදෙනයි.)

16. **මුට්ඨසච්ච සූත්‍රයඃ**- 2. "මුළාවූ සිහි ඇති බවද සම්‍යක් ප්‍රඥාව නැති බවද (යන දෙදෙනයි)

17. **සතිසම්පජඤ්ඤ සූත්‍රයඃ**- "සිහි ඇති බවද සම්‍යක් ප්‍රඥා ඇති බවද (යන දෙදෙනයි.)"

**(පස්වෙනි සමාපත්ති වර්ගය නිමි)**

**(තුන්වැනි පණ්ණාසකය සමාප්තයි)**

---

## 16. ක්‍රොධ වර්ගය.

1. **කොධූපනාහ සූත්‍රයඃ**- 1 "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්,

2. ක්‍රොධයද බද්ධවෛරයද යන දෙදෙනයි.

3. "මහණෙනි, මේ දෙදෙන ධර්මයෝ වෙති."

(මේ වර්ගයේ 2-10 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

2. **මක්ඛපලාස සූත්‍රය**- 2. "ගුණමකු බවද යුගග්‍රාහය (අනුන් යටත්කොට ගැනීම) ද යන දෙදෙනයි.

3. **ඉස්සාමච්ඡරිය සූත්‍රය**- 2. "ඊර්ෂ්‍යාවද මසුරු බවද යන දෙදෙනයි

4. **මායාසාඨෙය්‍ය සූත්‍රය**- 2 "මායාවද කෛරාටික බවද යන දෙදෙනයි

5. **අහිරිකානොත්තප්ප සූත්‍රය**- 2. "පාපයෙහි (නිර්ලජ්ජී බවද (පාපයෙහි) බය නැති බවද යන දෙදෙනයි.

6. **අක්කොධානුපනාහ සූත්‍රය**- 2. "අක්‍රොධයද බද්ධ වෛරනොකිරීමද යන දෙදෙනයි.

7. **අමක්ඛාපලාස සූත්‍රය**- 2. 'ගුණමකු නොවීමද අයුගග්‍රාහය (අනුන් යටත් නොකරන බව) ද යන දෙදෙනයි.

8. **අනිස්සාමච්ඡරිය සූත්‍රය**- 2. 'ඊෂ්‍යීා නොකිරීමද නොමසුරු බවද යන දෙදෙනයි.

9. **අමායාසාඨෙය්‍ය සූත්‍රයः**- 2. "අමායාව (කළ වරද නොවැසීම) ද අකෛරාටික බවද යන දෙදෙනයි.

10. **හිරිඔත්තප්ප සූත්‍රයः**- 2. "(පාපයෙහි) ලජ්ජාවද (පාපයෙහි) භයද යන දෙදෙනයි.

11. **කොධසමන්නාගත සූත්‍රයः**- "මහණෙනි, කරුණු දෙකකින් යුත් තැනැත්තේ දුකසේ වෙසෙයි.

2. "කවර දෙකකින්ද යත්, ක්‍රොධයෙන් හා බද්ධ වෛරයෙන්ද යන දෙකෙනි.

3. "මහණෙනි, මේ ධර්මයන්ගෙන් යුක්තවූ තැනැත්තේ දුකසේ වාසය කෙරේ."

12. **මක්ඛ සමන්නාගත සූත්‍රයः**- (12-15 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 11 වෙනි සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

2. "ගුණමකු බැවින්ද, යුගග්‍රාහයෙන්ද යන දෙකෙනි.

13. **ඉස්සා සමන්නාගත සූත්‍රයः**- 2 "ඊෂ්‍යීාවෙන් හා මාත්සය්‍යීයෙන්ද යන දෙකෙනි.

14. **මායා සමන්නාගත සූත්‍රයः**- 2. "මායාවෙන්ද කෛරාටික කමින්ද යන දෙකෙනි.

15. **අහිරික සමන්නාගත සූත්‍රයः**- 2 '(පාපයට) නිර්ලජ්ජී බැවින් හා (පාපයෙහි) බය නැති බැවින්ද යන දෙකිනි.

16. **අක්කොධ සමන්නාගත සූත්‍රයः**- "මහණෙනි, කරුණු දෙකකින් යුත් තැනැත්තේ සැපසේ වෙසෙයි. කවර දෙකකින්ද යත්.

2. "අක්‍රොධයෙන්ද බද්ධවෛර නොකිරීමෙන්ද යන දෙකිනි.

3. "මහණෙනි, මේ ධර්ම දෙකින් යුත් තැනැත්තේ සැපසේ වාසය කෙරේ."

17. **අමක්ඛ සමන්නාගත සූත්‍රයඃ**- (17-20 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 16 වැනි සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්)

2. "ගුණමකු නොවීමෙන්ද අයුගග්‍රාහයෙන්ද යන දෙකිනි.

18. **අනිස්සා සමන්නාගත සූත්‍රයඃ**- 2. "ඊර්ෂ්‍යාානොකිරීමෙන්ද මසුරු නොවීමෙන්ද යන දෙකිනි.

19. **අමායාසමන්නාගත සූත්‍රය**- 2. "කළවරද නොවැසීමෙන්ද කෛරාටික නොවීමෙන්ද යන දෙකිනි.

20. **හිරිසමන්නාගත සූත්‍රය**- 2 "(පාපයට) ලජ්ජා වෙන්ද (පාපයට) භයින්ද යන දෙකිනි.'

21. **කොධපරිහානි සූත්‍රය**- 1. "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙන ශෛක්ෂ භික්ෂුවගේ (ගුණ) පිරිහීම සඳහා පවතිත්. කවර දෙදෙනද යත්,

2. "ක්‍රොධයද බද්ධවෛරයද යන දෙදෙනයි.

3. "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙන වනාහි ශෛක්ෂ භික්ෂුවගේ (ගුණ) පිරිහීම සඳහා වෙත්."

22. **මක්ඛපරිහානි සූත්‍රය**- (22-25 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 21 වෙනි සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

2. "ගුණමකු බවද, යුගග්‍රාහයද යන දෙදෙනයි.

23. **ඉස්සාපරිහානි සූත්‍රය**- 2. "ඊර්ෂ්‍යාවද මාත්සර්‍ය්‍යයද යන දෙදෙනයි.

24. **මායාපරිහානි සූත්‍රය**- 2. "මායාවද කෛරාටික බවද යන දෙදෙනයි.

25. **අහිරික පරිහානි සූත්‍රය**- 2. "නිර්ලජ්ජී බවද (පාපයට) බය නැති බවද යන දෙදෙනයි.

**26. අක්කොධ පරිහානි සූත්‍රය**- 1. "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙන ශෛක්ෂ භික්ෂුවගේ ගුණ නොපිරිහීම සඳහා පවතිත්. කවර දෙදෙනද යත්,

2. "අක්‍රොධයද බද්ධවෛර නොකිරීමද යන මේ දෙදෙනයි.

3. "මහණෙනි, මේ ධර්මයෝ දෙදෙන වනාහි ශෛක්ෂ භික්ෂුවගේ (ගුණ) නොපිරිහීම පිණිස වෙත්."

**27. අමක්ඛාපරිහානි සූත්‍රය**- (27-30 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 26 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

2. "ගුණමකු නොවීමද අයුගග්‍රාහයද යන දෙදෙනයි.

**28. අනිස්සාපරිහානි සූත්‍රය**- 2. "ඊර්ෂ්‍යා නොකිරීමද නොමසුරු බවද යන මේ දෙදෙනයි.

**29. අමායාපරිහානි සූත්‍රය**- 2. "අකෛරාටික බවද නොකපටි බවද යන මේ දෙදෙනයි.

**30. හිරිඅපරිහානි සූත්‍රය**- 2. "(පාපයෙහි) ලජ්ජාවද (පාපයෙහි) භයද යන මේ දෙදෙනයි.

**31. කොධනිරයුප්පත්ති සූත්‍රය**- 1. "මහණෙනි, ධර්මයන් දෙදෙනෙකුගෙන් යුක්තවූ තැනැත්තේ ගෙණෙන ලද්දක් බහා තබනු ලබන්නේ යම්සේ නම්, එසේම නරකයෙහි වේ (උපදී.) කවර දෙදෙනකුගෙන්ද යත්,

2. "ක්‍රොධයෙන්ද බද්ධවෛරයෙන්ද යන දෙදෙනා ගෙනි.

3. "මහණෙනි, මේ ධර්ම දෙදෙනාගෙන් යුත් තැනැත්තේ ගෙණෙන ලද්දක් බහාතබනු ලබන්නේ යම්සේද, එසේම නරකයෙහි වේ (උපදී.)

**32. මක්ඛ නිරයුප්පත්ති සූත්‍රය**:- (32-35 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 31 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්)

2. "ගුණමකු බැවින්ද යුගග්‍රාහයෙන්ද යන දෙදෙනා ගෙනි.

**33. ඉස්සානිරයුප්පත්ති සූත්‍රය**:- 2. "කවර දෙදෙනෙකුගෙන්ද යත්, ඊර්ෂ්‍යාවෙන්ද මාත්සර්‍ය්‍යයෙන්ද යන දෙදෙනා ගෙනි.

**34. මායානිරයුප්පත්ති සූත්‍රය**- 2. "කවර දෙදෙනෙකුගෙන්ද යත්, මායාවෙන්ද කෛරාටික බැවින්ද යන දෙදෙනාගෙනි.

**35. අහිරික නිරයුප්පත්ති සූත්‍රය**- 2. "කවර දෙදෙනෙකුගෙන්ද යත්, (පාපයෙහි) නිර්ලජ්ජී බැවින්ද (පාපයෙහි) භය නැති බැවින්ද යන දෙදෙනාගෙනි.

**36. අක්කොධසග්ගුප්පත්ති සූත්‍රය**- 1. "මහණෙනි, ධර්මයන් දෙදෙනෙකුගෙන් යුක්තවූ තැනැත්තේ ගෙණෙන ලද්දක් බහා තබනු ලබන්නේ යම්සේ නම්, එසේම ස්වර්ගයෙහි වේ. (උපදී) කවර දෙදෙනෙකුගෙන්ද යත්,

2. "අක්‍රොධයෙන්ද බද්ධවෛර නොකිරීමෙන්ද යන දෙදෙනාගෙනි.

3 "මහණෙනි, මේ ධර්ම දෙදෙනාගෙන් යුත් තැනැත්තේ ගෙණෙන ලද්දක් බහාතබනු ලබන්නේ යම්සේද, එසේම ස්වර්ගයෙහි වේ (උපදී)

**37. අමක්ඛසග්ගුප්පත්ති සූත්‍රය**- (37-40 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 36 වෙනි සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

2 "කවර දෙදෙනෙකුගෙන්ද යත්, ගුණමකු නොවී මෙන්ද අයුගග්‍රාහයෙන්ද යන දෙදෙනාගෙනි.

**38. අනිස්සාසග්ගුප්පත්ති සූත්‍රය**- 2. "කවර දෙදෙනෙකුගෙන්ද යත්, ඊර්ෂ්‍යානොකිරීමෙන්ද නොමසුරු බැවින්ද යන දෙදෙනාගෙනි

**39. අමායාසග්ගුප්පත්ති සූත්‍රය**- 2 "කවර දෙදෙනෙකුගෙන්ද යත්, කෛරාටික නොවීමෙන්ද නොකපටි බැවින්ද යන දෙදෙනාගෙනි

**40 හිරිසග්ගුප්පත්ති සූත්‍රය**- 2. "කවර දෙදෙනෙකුගෙන්ද යත්, (පාපයෙහි) ලජ්ජාවීමෙන්ද (පාපයට) භයඇති බැවින්ද යන දෙදෙනාගෙනි

**41. කොධඅපායුප්පත්ති සූත්‍රය**- 1. "මහණෙනි, මේ කරුණු දෙකින් යුක්තවූ ඇතැම් පුද්ගලයෙක් තෙම ශරීරයාගේ භෙදයෙන්

මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විවසව පතිතවීම් ඇති නරකයෙහි උපදී. කවර දෙකකින්ද යත්,

2. "ක්‍රොධයෙන්ද බද්ධවෛරයෙන්ද යන කරුණු වලිනි.

3. "මහණෙනි, මෙලොව මේ ධර්ම දෙකින් යුක්තවූ ඇතැම් පුද්ගලයෙක් තෙම ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විවසව පතිතවීම් ඇති නරකයෙහි උපදී"

42. **මක්ඛඅපායුප්පත්ති සූත්‍රය**- (42-45 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 41 වෙනි සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

2. "කවර දෙකින්ද යත්, ගුණමකු බැවින්ද යුගග්‍රාහයෙන්ද යන කරුණුවලිනි.

43. **ඉස්සාඅපායුප්පත්ති සූත්‍රය**- 2. "ඊෂ්‍ර්‍යාවෙන්ද මාත්සයර්‍යයෙන්ද යන කරුණු වලිනි.

44. **මායාඅපායුප්පත්ති සූත්‍රය**- 2. "මායාවෙන්ද කෛරාටිකකමින්ද යන කරුණුවලිනි.

45. **අහිරික අපායුප්පත්ති සූත්‍රය**- 2. "(පාපයෙහි) නිර්ලජ්ජී බැවින්ද (පාපයට) භයනැති බැවින්ද යන කරුණුවලිනි.

46. **අක්කොධ සුගතුප්පත්ති සූත්‍රය**:- 1. "මහණෙනි, මෙලොව මේ කරුණු දෙකින් යුක්තවූ ඇතැම් පුද්ගලයෙක් තෙම ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදී. කවර දෙකකින්ද යත්:

2. "අක්‍රොධයෙන්ද, අබද්ධවෛරයෙන්ද යන දෙකිනි.

3. "මහණෙනි, මෙලොව මේ කරුණු දෙකින් යුක්තවූ ඇතැම් පුද්ගලයෙක් ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදී"

47. **අමක්ඛ සුගතුප්පත්ති සූත්‍රය**:- (47-50 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 46 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

2. "ගුණමකු නැති බැවින්ද අයුගග්‍රාහයෙන්ද යන දෙකිනි."

48. **අනිස්සා සුගතුප්පත්ති සූත්‍රය**:- 2 "ඊර්ෂ්‍යා නොකිරීමෙන්ද, නොමසුරු බැවින්ද යන දෙකිනි."

පටුන



**49. අමායා සුගතුප්පත්ති සූත්‍රය:-** 2. "කෛරාටිකකම් නැති බැවින්ද නොකපටි බැවින්ද යන දෙකිනි."

**50. හිරිසුගතුප්පත්ති සූත්‍රය:-** 2: '(පාපයෙහි) ලජ්ජාවීමෙන්ද (පාපයට) භයින්ද යන දෙකිනි."

3. "මහණෙනි, මේ දෙදෙන වනාහි අකුසල ධර්මයෝ වෙත්."

**52. මක්ඛාකුසල සූත්‍රය:-** (52-55 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 51 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

2. "ගුණමකුවීමද යුගග්‍රාහයද යන මේ දෙදෙනයි.

**53. ඉස්සාකුසල සූත්‍රය:-** 2. ඊර්ෂ්‍යාවද මසුරු බවද යන මේ දෙදෙනයි.

**54. මායාකුසල සූත්‍රය:-** 2. "මායාවද කෛරාටික බවද යන මේ දෙදෙනයි.

**55. අහිරිකාකුසල සූත්‍රය:-** 2. "පාපයට ලජ්ජා නැති බවද පාපයට භය නැති බවද යන මේ දෙදෙනයි.

**56. අක්කොධ කුසල සූත්‍රය:-** 1. "මහණෙනි, මේ කුසල ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්:

2. "අක්‍රොධයද බද්ධවෛර නොකිරීමද යන මේ දෙදෙනයි

3. "මහණෙනි, මේ දෙදෙන වනාහි කුසල ධර්මයෝ වෙත්."

**57. අමක්ඛ කුසල සූත්‍රය:-** 1. (57-60 සූත්‍රවල 1-3 ඡේද මේ වර්ගයේ 56 සූත්‍රයේ 1-3 ඡේද මෙන් වෙත්.)

2. 'ගුණමකු නොවීමද අයුගග්‍රාහයද යන මේ දෙදෙනයි.

**58. අනිස්සා කුසල සූත්‍රය:-** 2. "ඊර්ෂ්‍යා නොකිරීමද නොමසුරු බවද යන මේ දෙදෙනයි.

**59. අමායා කුසල සූත්‍රය:-** 2. "මායා රහිත බවද අකෛරාටික බවද යන මේ දෙදෙනයි.

**60. "හිරි කුසල සූත්‍රය:-** 2 (පාපයට) "ලජ්ජාවද (පාපයට) භයද යන මේ දෙදෙනයි"

**61. සාවජ්ජකොධ සූත්‍රයː-** "මහණෙනි, මේ වැරදි සහිත ධර්මයෝ දෙදෙනෙක් වෙත් කවර දෙදෙනෙක්ද යත්ː

2. "ක්‍රොධයද බද්ධවෛරයද යන මේ දෙදෙනයි"

3. "මහණෙනි, මේ දෙදෙන වනාහි වැරදි සහිත ධර්මයෝ වෙත්"

**62. සාවජ්ජ මක්ඛ සූත්‍රයː-** (62-65 සූත්‍රවල 1-3 ඡේද මේ වර්ගයේ 61 සූත්‍රයේ 1-3 ඡේද මෙන් වෙත්.)

2. "ගුණමකුවීමද තමන් උතුම්කොට සිතන බවද යන මේ දෙදෙනයි"

**63. සාවජ්ජඉස්සා සූත්‍රයː-** 2 "ඊර්ෂ්‍යාවද මසුරු බවද යන මේ දෙදෙනයි."

**64. සාවජ්ජ මායා සූත්‍රයː-** 2 'මායාවද කෛරාටික බවද යන මේ දෙදෙනයි"

**65. සාවජ්ජ අහිරික සූත්‍රයː-** 2. "(පාපයට) ලජ්ජා නැති බවද (පාපයට) භය නැති බවද යන මේ දෙදෙනයි"

**66. අනවජ්ජ අක්කෝධ සූත්‍රයː-** 1. "මහණෙනි, මේ නිවැරදි ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්ː

2. "අක්‍රොධයද බද්ධවෛර නොකිරීමද යන මේ දෙදෙනයි."

3. "මහණෙනි, මේ දෙදෙන වනාහි නිරවද්‍ය ධර්මයෝ වෙත්."

**67. අනවජ්ජ අමක්ඛ සූත්‍රයː-** (67-70 සූත්‍රවල 1-3 ඡේද මේ වර්ගයේ 66 සූත්‍රයේ 1-3 ඡේද මෙන් වෙත්)

2. "ගුණමකු නොවීමද තමන් උතුම්කොට නොසිතන බවද යන මේ දෙදෙනයි."

**68. අනවජ්ජ අනිස්සා සූත්‍රයː-** 2. "ඊර්ෂ්‍යා නොකිරීමද නොමසුරු බවද යන මේ දෙදෙනයි."

**69. අනවජ්ජ අමායා සූත්‍රයː-** 2 "මායා රහිත බවද අකෛරාටික බවද යන මේ දෙදෙනයි."

**70. අනවජ්ජ හිරි සූත්‍රය-** 2. "(පාපයට) ලජ්ජාවද (පාපයට භයද යන මේ දෙදෙනයි.'

**71. ක්‍රොධ දුක්ඛුද්‍රය සූත්‍රය-** 1. 'මහණෙනි, මේ දුක් වඩන්නාවූ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්,

2. "ක්‍රොධයද බද්ධවෛරයද යන මේ දෙදෙනයි."

3. "මහණෙනි, මේ දෙදෙන වනාහි දුක් වඩන්නාවූ ධර්මයෝ වෙත්."

**72. මක්ඛදුක්ඛුද්‍ර සූත්‍රය-** (72-75 සූත්‍රවල 1-3 වෙනි ඡෙද මේ වර්ගයේ 71 සූත්‍රයේ 1-3 ඡෙද මෙන් වෙත්.)

2. "ගුණමකුවීමද තමන් උතුම්කොට සිතන බවද යන මේ දෙදෙනයි."

**73. ඉස්සාදුක්ඛුද්‍රය සූත්‍රය-** 2. "ඊර්ෂ්‍යාවද මසුරු බවද යන මේ දෙදෙනයි."

**74. මායා දුක්ඛුද්‍රය සූත්‍රය-** 2. "මායාවද, කෛරාටික බවද යන මේ දෙදෙනයි."

**75. අහිරික දුක්ඛුද්‍රය සූත්‍රය-** 2. "(පාපයට) ලජ්ජා නැති බවද (පාපයට) භය නැති බවද යන මේ දෙදෙනයි."

**76. අක්කොධ සුඛුද්‍රය සූත්‍රය-** 1 "මහණෙනි, සැප වඩන්නාවූ මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්,

2. "අක්‍රොධයද බද්ධවෛර නොකිරීමද යන මේ දෙදෙනයි."

3. "මහණෙනි, මේ දෙදෙන වනාහි සැප වඩන්නාවූ ධර්මයෝ වෙත්.

**77. අමක්ඛ සුඛුද්‍රය සූත්‍රය-** (77-8) සූත්‍රවල 1-3 ඡෙද මේ වර්ගයේ 76 සූත්‍රයේ 1-3 ඡෙද මෙන් වෙත්.)

2. "ගුණමකු නොවීමද තමන් උතුම්කොට නොසිතන බවද යන මේ දෙදෙනයි."

**78. අනිස්සාසුඛුද්‍රය සූත්‍රය-** 2. "ඊර්ෂ්‍යා නොකිරීමද නොමසුරු බවද යන මේ දෙදෙනයි."

**79. අයාමාසුඛුද්‍රය සූත්‍රය**- 2. "මායා රහිත බවද අකෛරාටික බවද යන මේ දෙදෙනයි."

**80. හිරිසුඛුද්‍රය සූත්‍රය**- 2. "(පාපයට) ලජ්ජාවද (පාපයට) භයද යන මේ දෙදෙනයි."

**81. දුක්ඛ විපාක කොධ සූත්‍රය**- 1. "මහණෙනි, දුක් විපාක ඇති මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්;

2. "ක්‍රොධයද බද්ධවෛරයද යන මේ දෙදෙනයි."

3. "මහණෙනි, මේ දෙදෙන වනාහි දුක් විපාක ඇති ධර්මයෝ වෙත්,

**82. දුක්ඛ විපාක මක්ඛ සූත්‍රය**- (82-85 සූත්‍රවල 1-3 ඡෙද මේ වර්ගයේ 81 සූත්‍රයේ 1-3 ඡෙද මෙනි)

2. "ගුණමකු වීමද තමන් උතුම්කොට සිතන බවද යන මේ දෙදෙනයි'

**83, දුක්ඛවිපාක ඉස්සා සූත්‍රය**:- 2. "ඊර්ෂ්‍යාවද මසුරු බවද යන මේ දෙදෙනයි"

**84. දුක්ඛවිපාක මායා සූත්‍රය**:- 2. "මායාවද කෛරාටික බවද යන මේ දෙදෙනයි"

**85. දුක්ඛවිපාක අහිරික සූත්‍රය**:- 2. "(පාපයට) ලජ්ජා නැති බවද (පාපයට) භය නැති බවද යන මේ දෙදෙනයි"

**86. සුඛවිපාක අක්කොධ සූත්‍රය**:- 1. "මහණෙනි, සැප විපාක ඇති මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්:

2. "අක්‍රොධයද බද්ධවෛර නොකිරීමද යන මේ දෙදෙනයි'

3. "මහණෙනි, මේ දෙදෙන වනාහි සැප විපාක ඇති ධර්මයෝ වෙත්."

**87. සුඛවිපාක අමක්ඛ සූත්‍රය**:- (87-90 සූත්‍රවල 1-3 ඡෙද මේ වර්ගයේ 86 සූත්‍රයේ 1-3 ඡෙද මෙන් වෙත්)

2. 'ගුණමකු නොවීමද තමන් උතුම්කොට නොසිතන බවද යන මේ දෙදෙනයි"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**88. සුඛවිපාක අනිස්සා සූත්‍රය**:- 2 ඊර්ෂ්‍යා නොකිරීමද නොමසුරු බවද යන මේ දෙදෙනයි"

**89. සුඛවිපාක අමායා සූත්‍රය**:- 2. "මායා රහිත බවද අකෛරාටික බවද යන මේ දෙදෙනයි."

**90. සුඛවිපාක හිරි සූත්‍රය**:- 2. "(පාපයට) ලජ්ජාවද (පාපයට) භයද යන මේ දෙදෙනයි."

**91. සව්‍යාපජ්ඣ කොධ සූත්‍රය**:- 1. "මහණෙනි, දුක් සහිතවූ මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්:

2. "ක්‍රොධයද බද්ධ වෛරයද යන මේ දෙදෙනයි

3 මහණෙනි, මේ දෙදෙන වනාහි දුක් සහිතවූ ධර්මයෝ වෙත්."

**92. සව්‍යාපජ්ඣමක්ඛ සූත්‍රය**:- (92-95 සූත්‍රවල 1-3 ඡෙද මේ වර්ගයේ 91 සූත්‍රයේ 1-3 ඡෙද මෙන් වෙත්.)

2. "ගුණමකුවීමද තමන් උතුම්කොට සිතන බවද යන මේ දෙදෙනයි."

**93. සව්‍යාපජ්ඣ ඉස්සා සූත්‍රය**:- 2. "ඊර්ෂ්‍යාවද මසුරු බවද යන මේ දෙදෙනයි."

**94. සව්‍යාපජ්ඣ මායා සූත්‍රය**:- 2. "මායාවද කෛරාටික බවද යන මේ දෙදෙනයි."

**95. සව්‍යාපජ්ඣ අහිරික සූත්‍රය**:- 2 "පාපයට ලජ්ජා නැති බවද පාපයට භය නැති බවද යන මේ දෙදෙනයි."

**96. අව්‍යාපජ්ඣ අක්කොධ සූත්‍රය**:- 1 "මහණෙනි, දුක් රහිතවූ මේ ධර්මයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්:

2. "අක්‍රොධයද බද්ධ වෛර නොකිරීමද යන මේ දෙදෙනයි"

3. "මහණෙනි, මේ දෙදෙන ව්‍යාපාද (දුක්) රහිතවූ ධර්මයෝ වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**97. අව්‍යාපජ්ඣ අමක්ඛ සූත්‍රය**:- (97-100 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 99 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

2. "ගුණමකු නොවීමද තමන් උතුම්කොට නොසිතන බවද යන මේ දෙදෙනයි"

**98. අව්‍යාපජ්ඣ අනිස්සා සූත්‍රය**:- 2. "ඊර්ෂ්‍යානොකිරීමද නොමසුරු බවද යන මේ දෙදෙනයි."

**99. අව්‍යාපජ්ඣ අමායා සූත්‍රය**:- 2. "මායා රහිත බවද අකෛරාටික බවද යන මේ දෙදෙනයි."

**100. අව්‍යාපජ්ඣ හිරි සූත්‍රය**:- 2. "පාපයට ලජ්ජාවද පාපයට භයද යන මේ දෙදෙනයි."

**(සවෙනි ක්‍රොධ වර්ගය නිමි.)**

---

## 17. විනය පෙය්‍යාල හෙවත් ශික්ෂාපද වර්ගය.

**1-10. සික්ඛාපද පඤ්ඤත්ති සූත්‍රය**:- 1. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ශික්ෂාපද පනවනලදී. කවර දෙකක් සඳහාද යත්:

2. 'මැනව, වහන්සැ'යි සංඝයාගේ පිළිගැනීම පිණිසද සංඝයාගේ පහසු බව පිණිසද යන දෙක අනුසස් සඳහායි

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ශික්ෂාපද පනවන ලද්දේය."

(2-10 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 3 ඡේද මෙනි.)

2-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිසද ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසද යන දෙක සඳහායි

3-2 "මේ ආත්මයෙහි කෙලෙසුන්ගේ සංවරය පිණිසද පරලෙව්හි කෙලෙසුන්ගේ වැළැක්ම පිණිසද යන දෙක සඳහායි.

4-2. "මේ ආත්මයෙහි වෛරයන්ගේ සංවරය පිණිසද පරලෙව්හි වෛරයන්ගේ නැසීම පිණිසද යන දෙක සඳහායි.

5-2. "මේ ආත්මයෙහි දොෂයන්ගේ සංවරය පිණිසද පරලෙව්හි දොෂයන්ගේ වැලැක්ම පිණිසද යන දෙක සඳහායි.

6-2. "මේ ආත්මයෙහි භය හේතූන්ගේ සංවරය පිණිසද පරලෙව්හි භය හේතූන්ගේ ප්‍රතිෂෙධය පිණිසද යන දෙක සඳහායි.

7-2. "මේ ආත්මයෙහි අකුසල ධර්මයන්ගේ සංවරය පිණිසද පරලෙව්හි අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසද යන දෙක සඳහායි.

8-2 "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිසද පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසද යන දෙක සඳහායි.

9-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිසද පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසද යන දෙක සඳහායි.

10-2. සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිසද විනයට අනුග්‍රහය පිණිසද යන දෙක සඳහායි

### 11-20. පාතිමොක්ඛ පඤ්ඤත්ති සූත්‍ර.

11-1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පාමොක් පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැ'යි සංඝයාගේ පිළිගැනීම පිණිසද, සංඝයාගේ පහසු බව පිණිසද යන දෙක පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පාමොක් පනවන ලද්දේය.

(12-20 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 11 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

12-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

13-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

14-2. "මේ ආත්මයෙහි වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හි වෛරයන්ගේ නැසීම පිණිසයි.

15-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

16-2. 'මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ ප්‍රතිෂෙධය පිණිසයි.

17-2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

1-2. "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂ බල සිඳීම පිණිසයි.

19-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

20-2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 21-30 පාතිමොක්ඛුද්දේස සූත්‍ර

21-1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පාමොක් උදෙසීම පනවන ලදී. කවර දෙක සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිසද සංඝයාගේ පහසු බව පිණිසද යන දෙක අනුසස් පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පාමොක් උදෙසීම පනවන ලද්දේය

(22-30 මේ සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 21 වෙනි සූත්‍රයේ 1 3 ඡෙද මෙන් වෙත්.)

22-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

23-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**24-2.** 'මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

**25-2.** "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

**26-2.** "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ ප්‍රතිෂෙධය පිණිසයි.

**27-2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි

**28-2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂ බල සිඳීම පිණිසයි.

**29-2.** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

**30-2.** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

**31-40. පාතිමොක්ඛට්ඨාපන සූත්‍රඃ-** 1. 'මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පාමොක් (උපොසථ) තැබීම පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. 'මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිසද සංඝයාගේ පහසු බව පිණිසද යන දෙක අනුසස් පිණිසයි.

3. 'මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පාමොක් (උපොසථ) තැබීම පනවන ලදී.

(32-40 මේ සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 31 වෙනි සූත්‍රයේ 1 3 ඡෙද මෙන් වෙත්.)

**32-2.** "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

**33-2.** "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

**34-2.** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

35-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

36-2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ වැලැක්ම පිණිසයි.

37-2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

38-2. "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

39-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

40-2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

**41-50. පවාරණ පඤ්ඤත්ති සූත්‍ර:-** 1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පවුරුණු පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. 'මැනව වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිසද සංඝයාගේ පහසු බව පිණිසද යන දෙක අනුසස් පිණිසයි.

3. 'මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පවුරුණු පනවන ලදී.

(42-50 මේ සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 41 වෙනි සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

42-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

43-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

44-2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

45-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලක්ම පිණිසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**46-2.** "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ ප්‍රතිෂෙධය පිණිසයි.

**47-2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්‍මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්‍මයන්ගේ වැලැක්ම පිණිසයි.

**48-2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

**49-2.** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බෙහෝ බව (වැඩීම) පිණිසයි.

**50-2.** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

**51-60. පවාරණට්ඨාපන සූත්‍ර:-** 1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්ට පවුරුණු තැබීම පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. මැනව වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පවුරුණු තැබීම පනවන ලදී.

(52-60 මේ සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 51 වෙනි සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

**52-2.** "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

**53-2.** "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

**54-2.** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

**55-2.** "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

**56-2.** "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ ප්‍රතිෂෙධය පිණිසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**57-2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙච්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

**58-2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂ බල සිඳීම පිණිසයි.

**59-2.** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

**60-2.** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

**61-70. තජ්ජනීය කම්ම සූත්‍ර-** "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට තර්ජනීය කර්මය පනවනලදී. කවර දෙකක් සඳහාද යත්:

**2.** "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

**3.** "මහණෙනි, මේ දෙදෙන අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට තර්ජනීය කර්මය පනවනලදී.

(**62-70** මේ සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 61 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්)

**62-2.** දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

**63-2.** "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙච්හි වූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

**64-2.** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙච්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

**65-2.** මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙච්හි වූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

**66-2.** මේ ආත්මයෙහිවූ භය හෙතුන්ගේ සංවරය පිණිස හා පරලෙච්හිවූ භය හෙතුන්ගේ නැසීම පිණිසයි.

**67-2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙච්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

**68-2** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂ බල සිඳීම පිණිසයි.

**69-2** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

**70-2.** සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

**71-80 නියස්සකම්ම සූත්‍ර- 1.** "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (අගොචරස්ථාන ආශ්‍රය වැළැක්වීම පිණිස) නියස්ස කර්මය පනවනලදී. කවර දෙකක් සඳහාද යත්ඃ

2. "මැනව, වහන්සැ' යි සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි

3. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (අගොචර ස්ථාන ආශ්‍රය වැළැක්ම පිණිස) නියස්ස කර්මය පනවන ලදී."

(72-80 මේ සූත්‍රවල 1-3 ඡේද මේ වර්ගයේ 71 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්)

72-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

73-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

74-2. මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හි වූ වෛරයන්ගේ නැසීම පිණිසයි

75-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

76-2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

77-2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

78-2. "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

79-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

80-2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 81-90 පබ්බාජනීය කම්ම සූත්‍ර.

81. මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට නෙරපීම නම් පබ්බාජනීය කර්මය පනවනලදී. කවර දෙකක් සඳහාද යත්:

2. මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. 'මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට නෙරපීම නම් පබ්බාජනීය කර්මය පනවනලදී

(82-90. මේ සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 81 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්)

82-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලි භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

83-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

84-2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

85-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

86-2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භයහේතූන්ගේ නැසීම පිණිසයි.

87-2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

**88-2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

**89-2.** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

**90-2.** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

**91-100. පටිසාරණීය කම්ම සූත්‍ර.**

**91-1.** 'මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පටිසාරණීය කර්මය පනවනලදී. කවර දෙකක් සඳහාද යත්.

**2.** "මැනව, වහන්සැ'යි සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

**3.** "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට පටිසාරණීය කර්මය පනවන ලදී.

(92-100 "මේ සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 91 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්)

**92-2.** "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලි භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

**93-2.** "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

**94-2.** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

**95-2** "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

**96-2** "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

**97-2** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

98-2. 'ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

99-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

100-2 "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 101-110. උක්ඛෙපනීය කම්ම සූත්‍ර

101-1. මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට උක්ෂෙපනීය කර්මය පනවනලදී. කවර දෙකක් සඳහාද යත්:

2. 'මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට උක්ෂෙපනීය කර්මය පනවනලදී."

(101-110. මේ සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 1 1 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්)

102-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලි භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

103. 2 "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

104--2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

105.--2. 'මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

106--2. "මේ ආත්මයෙහිවූ භයහේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

107--2. "මේ ආත්මයෙහිවූ අකුසලධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසලධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

108-2. 'ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

109--2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

110--2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 111-120 පරිවාසදාන කම්ම සූත්‍ර.

111-1 "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (සෝදිසිපිට සිටීමට ඉඩදීම නම්) පිරිවෙස්දීමේ කර්මය පනවනලදී. කවර දෙකක් සඳහාද යත්ඃ

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසුබව පිණිසයි.

3. මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (සෝදිසිපිට සිටීමට ඉඩදීම නම්) පිරිවෙස් දීමේ කර්මය පනවනලදී.

(112-120 මේ සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 111 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

112--2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

113--2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

114--2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

115--2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

116--2. "මේ ආත්මයෙහිවූ භයහේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හෙතුන්ගේ නැසීම පිණිසයි.

117--2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

118--2. 'ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි

119--2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය (වැඩීම) පිණිසයි,

120--2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 121-130. මූලාය පටිකස්සන සූත්‍ර.

121-1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (නැවත නැවත ආරම්භ කිරීම නම්) මූලාය පටිකස්සන කර්මය පනවනලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි" සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසුබව පිණිසයි,

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (නැවත නැවත ආරම්භකිරීම නම්) මූලාය පටිකස්සන කර්මය පනවනලදී.

(122-130 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 121 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්,)

122--2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශිලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

123--2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

124--2. 'මේ ආත්මයෙහි වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හි වෛරයන්ගේ නැසීම පිණිසයි.

125-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

126-2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

127--2 "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

128--2 'ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

129--2 "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

130--2. 'සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

131--141 මානත්තදාන සූත්‍ර.

131--1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (ප්‍රතිච්ඡන්නවූද අප්‍රතිච්ඡන්න සියලු ගරු ඇවැත්හි) මානත්දීම පනවනලදී. කවර දෙකක් සඳහාද යත්:

2. "මැනව, වහන්සැයි" සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසුබව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (ප්‍රතිච්ඡන්නවූද අප්‍රතිච්ඡන්නවූද සියලු ගරු ඇවැත්හි) මානත්දීම පනවනලදී.'

132-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලි භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

133--2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

134-2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

135--2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

136--2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

137--2. "මේ ආත්මයෙහිවූ අකුසලධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

138--2. 'ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

139-2 "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

140-2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

141-150 අබ්භාහන පඤ්ඤත්ති සූත්‍ර.

141. 1 "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (පිරූ මානත් ඇති භික්ෂුව උදෙසා) අබ්භාහන කර්මය පනවනලදී. කවර දෙදෙන සඳහාද යත්,

2. 'මැනව, වහන්සැ'යි සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (පිරූ මානත් ඇති භික්ෂුව උදෙසා) අබ්භාහන කර්මය පනවන ලදී."

(142--150 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 141 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

142--2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

143-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

144-2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

145-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

146-2. 'මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

147-2. මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

148--2. 'ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂ බල සිඳීම පිණිසයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

149-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

150-2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

151-160 ඔසාරණීය සූත්‍ර.

151-1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (මනාකොට පවත්නාවූ භික්ෂුවට කටයුතු) ඔසාරණීය කර්මය පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථගතයන් විසින් ශ්‍රාවකයන්හට (මනාකොට පවත්නාවූ භික්ෂුවට කටයුතු) ඔසාරණීය කර්මය පනවන ලදී.

(152-160 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 151 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

152-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

153-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

154-2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

155-2. මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

156-2. "මේ ආත්මයෙහිවූ භය හේතුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

157 2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසලධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

158--2. 'ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

**159--2.** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි

**160--2.** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි

## 161-170 නිස්සාරණීය සූත්‍ර.

**161--1.** "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (මනාව නොපවත්නා භික්ෂුවට කටයුතු) නිස්සාරණීය කර්මය පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

**2.** 'මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම් පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

**3.** "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (මනාව නොපවත්නා භික්ෂුවට කටයුතු) නිස්සාරණීය කර්මය පනවන ලදී"

(**162-170** සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 161 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

**162--2.** "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

**163--2.** "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

**164--2.** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

**165-2.** "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

**166--2** "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

**167--2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි

**168--2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

**169--2.** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

**170--2.** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි

### 171-180 උපසම්පදා පඤ්ඤත්ති සූත්‍ර.

**171--1.** 'මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (අෂ්ටවිධ) උපසම්පදා කර්මය පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

**2.** "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

**3.** "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට උපසම්පදා කර්මය පනවන ලදී."

(172-180 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 171 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

**172-2.** "දුසිල් පුද්ගලයන්හට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

**173--2.** "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

**174--2.** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

**175--2.** "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

**176-2.** "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

**177-2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

**178-2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි

**179-2.** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

**180-2.** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 181-190 ඤත්තිකම්ම සූත්‍ර.

**181-1.** "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (නවස්ථානිකවූ) ඤත්ති කර්මය පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

**2.** ('මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම) පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

**3.** "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (නවස්ථානිකවූ) ඤත්තිකර්මය පනවනලදී.

(**182--190** මේ සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 181 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්)

**182-2.** "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

**183-2.** "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

**184-2.** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

**185-2.** "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

**186-2.** "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

**187-2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

**188-2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පව්ටු භික්ෂූන්ගේ පක්ෂ බල සිඳීම පිණිසයි.

189-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

190-2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

### 191-200 ඤත්ති දුතිය කම්ම සූත්‍ර.

191-1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ඤත්ති දුතිය කර්මය පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ඤත්ති දුතිය කර්මය පනවන ලදී."

(192-200 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 191 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

192-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

193-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

194-2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

195-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

196-2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

197-2 'මේ ආත්මයෙහිවූ කුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

198-2. "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

199-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

200-2. "සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 201-210 ඤත්ති චතුත්ථ කම්ම සූත්‍ර

201-1. 'මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ඤත්ති චතුත්ථ කර්මය පනවනලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ඤත්ති චතුත්ථ කර්මය පනවනලදී."

(202-210 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 201 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

202-2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

203-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

204-2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

205-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

206-2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

207-2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

208-2. "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

209-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

210-2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

### 211-220 අප්පඤ්ඤත්තෙ පඤ්ඤත්ත සූත්‍ර.

211-1 "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ශික්ෂාපද නොපැනවූ කල්හි (ප්‍රථමපාරාජිකාදී ප්‍රථම) ප්‍රඥප්ති පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ශික්ෂාපද නොපැනවූ කල්හි (ප්‍රථම පාරාජිකාදී ප්‍රථම) ප්‍රඥප්ති පනවන ලදී."

(212-220 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 211 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වේ.

212-2. "දුසිල් පුගුලන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

213-2. "මෙ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

214-2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

215--2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

216--2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

217--2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි

218--2. "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

219--2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

220--2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

### 221-230 අනුපඤ්ඤත්ත සූත්‍ර.

221--2. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ශික්ෂාපද පැනවූ කල්හි අනුප්‍රඥප්ති පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට ශික්ෂාපද පැනවූ කල්හි අනුප්‍රඥප්ති පනවන ලදී."

(222-230 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 221 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

222--2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

223-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

224--2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

225--2 "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

226--2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

227--2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

228--2. "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂ බල සිඳීම පිණිසයි.

229--2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි

230--2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 231-240 සම්මුඛා විනය සූත්‍ර.

231-3. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට සම්මුඛ විනය කර්මය පනවනලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට සම්මුඛ විනය කර්මය පනවන ලදී."

(231-240 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 231 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

232--2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

233--2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

234--2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

235--2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

236--2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

237--2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මන්ගේ වැලැක්ම පිණිසයි.

238--2. "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

239-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

240--2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 241-250 සති විනය සූත්‍ර

241--2 "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (ක්ෂීණාශ්‍රවයාහට චෝදනා නොකිරීම පිණිස) සති විනය කර්මය පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (ක්ෂීණාශ්‍රවයාහට) චෝදනා නොකිරීම පිණිස) සතිවිනය කර්මය පනවන ලදී"

(242-250 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 241 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්)

242--2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

243--2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

244--2. මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

245--2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලක්ම පිණිසයි.

246--2. "මේ ආත්මයෙහිවූ භය හේතුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

247--2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

248--2. 'ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

249--2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

250--2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 251-260 අමූළ්හ විනය සූත්‍ර

251--1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් (උමතු මහණහට සුදුසු) අමූළ්හ විනය කර්මය ශ්‍රාවකයන්හට පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් (උමතු මහණහට සුදුසු) අමූළ්හ විනය කර්මය ශ්‍රාවකයන්හට පනවන ලදී."

(252--260 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 251 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්)

252--2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

253-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

254-2. "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

255-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

256-2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භයහේතූන්ගේ නැසීම පිණිසයි.

257-2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

258-2. 'ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂ බල සිඳීම පිණිසයි.

259-2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

260-2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි

### 261-270 පටිඤ්ඤාතකරණ සූත්‍ර.

261-1 "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් (අප්‍රතිඥාවෙන් චුදිතයාහට ඇවැත් කරණු පිණිස) ප්‍රතිඥාතකරණ කර්මය ශ්‍රාවකයන්හට පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්:

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. 'මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් (අප්‍රතිඥාවෙන් චුදිතයාහට ඇවැත් කරණු පිණිස) ප්‍රතිඥාතකරණ කර්මය ශ්‍රාවකයන්හට පනවනලදී."

(262-270 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 261 සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

262--2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

263-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

264-2 "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

265--2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**266--2.** "මේ ආත්මයෙහිවූ භයහේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භයහේතූන්ගේ නැසීම පිණිසයි.

**267--2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

**268-2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

**269--2.** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

**270-2.** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

### 271-280. යෙභූයාසික සූත්‍ර.

**271--1.** "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (අධිකරණවාපසමනය පිණිස) යෙභූයාසික කර්මය ශ්‍රාවකයන්හට පනවනලදී. කවර දෙකක් සඳහාද යත්:

**2.** "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසුබව පිණිසයි.

**3.** "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් ශ්‍රාවකයන්හට (අධිකරණ වාපසමනය පිණිස) යෙභූයාසික කර්මය පනවනලදී."

(**272--280** සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 271 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

**272-2.** "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

**273-2.** "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි

**274-2** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

**275-2.** "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**276-2.** "මේ ආත්මයෙහිවූ භය හෙතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හෙතූන්ගේ නැසීම පිණිසයි.

**277-2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

**278-2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

**279-2.** 'නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසයි.

**280-2** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 281-290 තස්ස පාපීයසික සූත්‍ර

**281-1** "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් (පාපොත්සන්න පුද්ගලයන්ට නිග්‍රහ කරණ පිණිස) තස්සපාපීය්‍යසිකා කර්මය ශ්‍රාවකයන්හට පනවනලදී. කවර දෙකක් සඳහාද යත්:

**2.** "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසුබව පිණිසයි

**3.** "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් (පාපෝත්සන්න පුද්ගලයන්ට නිග්‍රහ පිණිස) තස්ස පාපීය්‍යසිකා කර්මය ශ්‍රාවකයන්හට පනවනලදී."

(282-290 සූත්‍රවල 1, 3 ඡෙද මේ වර්ගයේ 281 සූත්‍රයේ 1, 3 ඡෙද මෙන් වෙත්.)

**282--2.** "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලි භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

**283-2.** "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

**284-2.** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

285-2. "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

286-2. "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

287-2. "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

288-2. "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පවිටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

289--2. "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

290-2. "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

## 291-300 තිණවත්ථාරක සූත්‍ර

291--1. "මහණෙනි, මේ දෙක අනුසසුන් සඳහා තථාගතයන් විසින් (ගුරු ඇවැත් හා ගිහියන් සම්බන්ධ ඇවැත් හැර සෙසු ඇවතින් පිරිසිදුවීම පිණිස) තිණවත්ථාරක කර්මය ශ්‍රාවකයන්හට පනවන ලදී. කවර දෙකක් සඳහාද යත්,

2. "මැනව, වහන්සැයි' සංඝයාගේ පිළිගැනීම පිණිස හා සංඝයාගේ පහසු බව පිණිසයි.

3. "මහණෙනි, මේ දෙක අනුසස් සඳහා තථාගතයන් විසින් (ගුරු ඇවැත් හා ගිහියන් සම්බන්ධ ඇවැත් හැර සෙසු ඇවතින් පිරිසිදුවීම පිණිස) තිණවත්ථාරක කර්මය ශ්‍රාවකයන්හට පනවන ලදී."

(292-300 සූත්‍රවල 1, 3 ඡේද මේ වර්ගයේ 291 වෙනි සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

292--2. "දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ පිණිස හා ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසයි.

293-2. "මේ ආත්මයෙහිවූ කෙලෙසුන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ කෙලෙසුන්ගේ වැලැක්ම පිණිසයි.

**294-2** "මේ ආත්මයෙහිවූ වෛරයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ වෛරයන්ගේ නැසීම පිණිසයි.

**295--2.** "මේ ආත්මයෙහිවූ දොෂයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ දොෂයන්ගේ වැලැක්ම පිණිසයි.

**296--2.** "මේ ආත්මයෙහිවූ භය හේතූන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ භය හේතූන්ගේ නැසීම පිණිසයි.

**297--2.** "මේ ආත්මයෙහිවූ අකුසල ධර්මයන්ගේ සංවරය පිණිස හා පරලෙව්හිවූ අකුසල ධර්මයන්ගේ වැලැක්ම පිණිසයි.

**298-2.** "ගිහිගෙයි වාසීන්ට අනුකම්පා පිණිස හා පව්ටු භික්ෂූන්ගේ පක්ෂබල සිඳීම පිණිසයි.

**299--2.** "නොපහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය පිණිස හා පහන් පුද්ගලයන්ගේ ප්‍රසාදය බොහෝ බව (වැඩීම) පිණිසයි.

**300-2.** "සද්ධර්මයාගේ (ශාසනයාගේ) චිරස්ථිතිය පිණිස හා විනයට අනුග්‍රහය පිණිසයි.

**301. රාග අභිඤ්ඤා සූත්‍රයː-** "මහණෙනි, රාගයාගේ මනා දැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්.

කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද (අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් විවිධාකාරයෙන් සංස්කාර ධර්මයන් දැකීම කොට ඇති) විදර්ශනාවද යන දෙකයි.

"මහණෙනි, රාගයාගේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**302. රාගපරිඤ්ඤා සූත්‍රයː-** 1 "මහණෙනි, රාගයාගේ පිරිසුදුව දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්, කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද වෙත්. මහණෙනි, රාගයාගේ පිරිසුදුව දැනගැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**303. රාගපරික්ඛය සූත්‍රයː-** "මහණෙනි, රාගයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩියයුතු වෙත්. කවර දෙකක්ද යත්.

සමාධියද විදර්ශනාවද වෙත්. මහණෙනි, රාගයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**304. රාගපහාන සූත්‍රයඃ-** "මහණෙනි, රාගයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත් සමාධියද විදර්ශනාවද වෙත්. මහණෙනි, රාගයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**305. රාගක්ඛය සූත්‍රයඃ-** "මහණෙනි, රාගයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්. සමාධියද විදර්ශනාවද වෙත්. මහණෙනි, රාගයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**306. රාගවය සූත්‍රයඃ-** "මහණෙනි, රාගයාගේ විනාසය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්. සමාධියද විදර්ශනාවද වෙත්. මහණෙනි, රාගයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**307. රාගවිරාග සූත්‍රයඃ-** "මහණෙනි, රාගයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතුවෙත්, කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද වෙත්. මහණෙනි, රාගයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**308. රාග නිරෝධ සූත්‍රයඃ-** "මහණෙනි, රාගයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්, කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද වෙත්. මහණෙනි, රාගයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**309. රාගචාග සූත්‍රයඃ-** "මහණෙනි, රාගයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්, කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද වෙත්. මහණෙනි, රාගයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**310. රාග පටිනිස්සග්ග සූත්‍රයඃ-** "මහණෙනි, රාගයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්, කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද වෙත්. මහණෙනි, රාගයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

311. **දොස අභිඤ්ඤා සූත්‍රය**- "මහණෙනි, ද්වෙෂයාගේ මනා දැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්: සමාධියද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, ද්වෙෂයාගේ මනාදැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

312. **දොසපරිඤ්ඤා සූත්‍රයː**- "මහණෙනි, ද්වෙෂයාගේ පිරිසිදුව දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්ː සමාධියද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ද්වෙෂයාගේ පිරිසිදුව දැනගැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

313. **දොසපරික්ඛය සූත්‍රයː**- "මහණෙනි, ද්වෙෂයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ද්වෙෂයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

314. **දොසපහාන සූත්‍රයː**- "මහණෙනි, ද්වේෂයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්ː සමාධියද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, ද්වේෂයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

315. **දොසක්ඛය සූත්‍රයː**- "මහණෙනි, ද්වේෂයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ද්වේෂයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

316. **දොසවය සූත්‍රයː**- "මහණෙනි, ද්වේෂයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ද්වෙෂයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

317. **දොසවිරාග සූත්‍රයː**- "මහණෙනි, ද්වේෂයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ද්වේෂයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.'

318. **දොස නිරොධ සූත්‍රයː**- "මහණෙනි, ද්වේෂයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද

යත්, සමාධියද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, ද්වේෂයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්”

**319. දොසචාග සූත්‍රයː-** “මහණෙනි, ද්වේෂයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩියයුතු වෙත් කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ද්වෙෂයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

**320. දොසපටිනිස්සග්ග සූත්‍රයː-** “මහණෙනි, ද්වෙෂයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සමාධියද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ද්වෙෂයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

**321. මොහඅභිඤ්ඤා සූත්‍රයː-** “මහණෙනි, මොහයාගේ මනාදැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මොහයාගේ මනාදැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

**322. මොහපරිඤ්ඤා සූත්‍රයː-** “මහණෙනි, මොහයාගේ පිරිසුදුව දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මොහයාගේ පිරිසුදුව දැනගැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්”

**323. මොහපරික්ඛය සූත්‍රයː-** “මහණෙනි, මොහයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මොහයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

**324. මොහපහාන සූත්‍රයː-** “මහණෙනි, මොහයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, මොහයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**325. මොහක්ඛය සූත්‍රය:-** "මහණෙනි, මොහයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මොහයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**326. මොහවය සූත්‍රය:-** "මහණෙනි, මොහයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මොහයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**327. මොහවිරාග සූත්‍රය-** "මහණෙනි, මොහයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මොහයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**328. මොහනිරොධ සූත්‍රය:-** "මහණෙනි, මොහයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මොහයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**329. මොහචාග සූත්‍රය:-** "මහණෙනි, මොහයාගේ අත් හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මොහයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**330. මොහපටිනිස්සග්ග සූත්‍රය:-** "මහණෙනි, මොහයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මොහයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

331. **කොධඅභිඤ්ඤා සූත්‍රය**:- "මහණෙනි, ක්‍රොධයාගේ මනාදැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ක්‍රොධයාගේ මනාදැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

332. **කොධපරිඤ්ඤා සූත්‍රය**:- "මහණෙනි, ක්‍රොධයාගේ පිරිසුදුව දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ක්‍රොධයාගේ පිරිසුදුව දැනගැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

333. **කොධපරික්ඛය සූත්‍රය**:- "මහණෙනි, ක්‍රොධයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ක්‍රොධයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

334. **කොධපහාන සූත්‍රය**:- "මහණෙනි, ක්‍රොධයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත් කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ක්‍රොධයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

335. **කොධක්ඛය සූත්‍රය**:- "මහණෙනි, ක්‍රොධයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ක්‍රොධයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

336. **කොධවය සූත්‍රය**:- "මහණෙනි, ක්‍රොධයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත් කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, ක්‍රොධයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**337. කොධවිරාග සූත්‍රය:-** "මහණෙනි, ක්‍රොධයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ක්‍රොධයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**338. කොධනිරොධ සූත්‍රය:-** "මහණෙනි, ක්‍රොධයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ක්‍රොධයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**339. කොධචාග සූත්‍රය:-** "මහණෙනි, ක්‍රොධයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ක්‍රොධයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**340. කොධපටිනිස්සග්ග සූත්‍රය:-** "මහණෙනි, ක්‍රොධයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ක්‍රොධයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**341. උපනාහ අභිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, බද්ධ වෛරයාගේ මනා දැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. 'මහණෙනි, බද්ධවෛරයාගේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**342. උපනාහ පරිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, බද්ධවෛරයාගේ පිරිසුදුව දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, බද්ධවෛරයාගේ පිරිසුදුව දැනගැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**343. උපනාහ පරික්ඛය සූත්‍රයː-** "මහණෙනි, බද්ධ වෛරයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, බද්ධවෛරයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**344. උපනාහපහාන සූත්‍රයː-** "මහණෙනි, බද්ධවෛරයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, බද්ධවෛරයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**345. උපනාහක්ඛය සූත්‍රයː-** "මහණෙනි, බද්ධවෛරයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, බද්ධවෛරයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**346. උපනාහවය සූත්‍රයː-** "මහණෙනි, බද්ධවෛරයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, බද්ධවෛරයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**347. උපනාහ විරාග සූත්‍රයː-** "මහණෙනි, බද්ධවෛරයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, බද්ධවෛරයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**348. උපනාහනිරොධ සූත්‍රයː-** "මහණෙනි, බද්ධවෛරයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, බද්ධවෛරයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.'

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**349. උපනාහචාග සූත්‍රයː-** "මහණෙනි, බද්ධවෛරයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, බද්ධවෛරයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**350. උපනාහපටිනිස්සග්ග සූත්‍රයː-** "මහණෙනි, බද්ධ වෛරයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතුවෙත් කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, බද්ධවෛරයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**351. මක්ඛඅභිඤ්ඤා සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ මනා දැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ගුණමකුබවගේ මනාදැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**352. මක්ඛපරිඤ්ඤා සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ පිරිසුදු දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, ගුණමකුබවගේ පිරිසුදු දැනගැන්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**353. මක්ඛපරික්ඛය සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ගුණමකුබවගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**354. මක්ඛපහාන සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ගුණමකුබවගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**355. මක්ඛක්ඛය සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකග බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ගුණමකුබවගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**356. මක්ඛවය සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකග බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, ගුණමකුබවගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**357. මක්ඛවිරාග සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකග බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ගුණමකුබවගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**358. මක්ඛ නිරොධ සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකග බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ගුණමකුබවගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**359. මක්ඛචාග සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකග බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ගුණමකුබවගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**360. මක්ඛපටිනිස්සග්ග සූත්‍රයː-** "මහණෙනි, ගුණමකුබවගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත් කවර දෙකක්ද යත්, සිත්හි එකග බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ගුණමකුබවගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**361. පලාස අභිඤ්ඤා සූත්‍රයː-** "මහණෙනි, යුගග්‍රාහයාගේ (එකට එක කිරීමේ) මනා දැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, එකට එක කිරීමේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**362. පලාසපරිඤ්ඤා සූත්‍රයː-** "මහණෙනි, එකට එක කිරීමේ පිරිසුදු දැනගැන්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, එකට එක කිරීමේ පිරිසුදු දැනගැන්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**363. පලාසපරික්ඛය සූත්‍රයː-** "මහණෙනි, එකට එක කිරීමේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, එකට එක කිරීමේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**364. පලාසපහාන සූත්‍රයː-** "මහණෙනි, එකට එක කිරීමේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, එකට එක කිරීමේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**365. පලාසක්ඛය සූත්‍රයː-** "මහණෙනි, එකට එක කිරීමේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, එකට එකකිරීමේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**366. පලාසවය සූත්‍රයː-** "මහණෙනි, එකට එක කිරීමේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, එකට එක කිරීමේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**367. පලාස විරාග සූත්‍රය:-** "මහණෙනි, එකට එක කිරීමේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්, කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, එකට එක කිරීමේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**368. පලාස නිරොධ සූත්‍රය:-** "මහණෙනි, එකට එක කිරීමේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, එකට එක කිරීමේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**369. පලාසචාග සූත්‍රය:-** "මහණෙනි, එකට එක කිරීමේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, එකට එක කිරීමේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**370. පලාස පටිනිස්සග්ග සූත්‍රය:-** "මහණෙනි, එකට එක කිරීමේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, එකට එක කිරීමේ මනා දැනගැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**371. ඉස්සා අභිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ මනා දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ඊර්ෂ්‍යාවගේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**372. ඉස්සා පරිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ පිරිසිඳු දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ඊර්ෂ්‍යාවගේ පිරිසුදු දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**373. ඉස්සා පරික්ඛය සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ඊර්ෂ්‍යාවගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**374. ඉස්සා පහාන සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ඊර්ෂ්‍යාවගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.

**375. ඉස්සාක්ඛය සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ඊර්ෂ්‍යාවගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**376. ඉස්සාවය සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ඊර්ෂ්‍යාවගේ විනාසය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**377. ඉස්සාවිරාග සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්. සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ඊර්ෂ්‍යාවගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**378. ඉස්සානිරොධ සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ඊර්ෂ්‍යාවගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**379. ඉස්සාචාග සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, ඊර්ෂ්‍යාවගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**380. ඉස්සාපටිනිස්සග්ග සූත්‍රය:-** "මහණෙනි, ඊර්ෂ්‍යාවගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ඊර්ෂ්‍යාවගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**381. මච්ඡරිය අභිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ මනා දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත් කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මසුරුබවගේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.

**382. මච්ඡරිය පරිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ පිරිසුදු දැනගැන්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මසුරුබවගේ පිරිසුදු දැනගැන්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**383. මච්ඡරිය පරික්ඛය සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මසුරුබවගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**384. මච්ඡරියපහාන සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, මසුරුබවගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**385. මච්ඡරියක්ඛය සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මසුරුබවගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**386. මච්ඡරියවය සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මසුරුබවගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**387. මච්ඡරිය විරාග සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මසුරුබවගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**388. මච්ඡරිය නිරොධ සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මසුරුබවගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**389. මච්ඡරිය චාග සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මසුරුබවගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**390. මච්ඡරිය පටිනිස්සග්ග සූත්‍රය:-** "මහණෙනි, මසුරුබවගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. 'මහණෙනි, මසුරුබවගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**391. මායාඅභිඤ්ඤා සූත්‍රයː-** "මහණෙනි, මායාවගේ මනා දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මායාවගේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**392. මායාපරිඤ්ඤා සූත්‍රයː-** "මහණෙනි, මායාවගේ පිරිසුදු දැනගැන්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මායාවගේ පිරිසුදු දැනගැන්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.'

**393. මායාපරික්ඛය සූත්‍රයː-** "මහණෙනි, මායාවගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මායාවගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**394. මායාපහාන සූත්‍රයː-** "මහණෙනි, මායාවගේ දුරු කිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, මායාවගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**395. මායාක්ඛය සූත්‍රයː-** "මහණෙනි, මායාවගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මායාවගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**396. මායාවය සූත්‍රයː-** "මහණෙනි, මායාවගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මායාවගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩියයුතු වෙත්."

**397. මායාවිරාග සූත්‍රය:-** "මහණෙනි, මායාවගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මායාවගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**398. මායා නිරොධ සූත්‍රය:-** "මහණෙනි, මායාවගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මායාවගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**399. මායාචාග සූත්‍රය:-** "මහණෙනි, මායාවගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මායාවගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**400. මායා පටිනිස්සග්ග සූත්‍රය:-** "මහණෙනි, මායාවගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මායාවගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**401. සාඨෙය්‍ය අභිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, (නැති ගුණ දක්වන) කෛරාටික භාවයාගේ මනා දැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. "මහණෙනි, කෛරාටික භාවයාගේ මනාදැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**402. සාඨෙය්‍ය පරිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, කෛරාටික භාවයාගේ පිරිසුදු දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්, කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද වෙත්. මහණෙනි, කෛරාටික භාවයාගේ පිරිසුදු දැනගැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**403. සාධ්‍යෛයා පරික්ඛය සූත්‍රයː-** "මහණෙනි, කෛරාටික භාවයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩියයුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද වෙත්. මහණෙනි, කෛරාටික භාවයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**404. සාධ්‍යෛයා පහාන සූත්‍රයː-** "මහණෙනි, කෛරාටික භාවයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත් සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද වෙත්. මහණෙනි, කෛරාටික භාවයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**405. සාධ්‍යෛයාක්ඛය සූත්‍රයː-** "මහණෙනි, කෛරාටික භාවයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත් සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද වෙත් මහණෙනි, කෛරාටික භාවයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**406. සාධ්‍යෛයාවය සූත්‍රයː-** "මහණෙනි, කෛරාටික භාවයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද වෙත් මහණෙනි, කෛරාටික භාවයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**407. සාධ්‍යෛයා විරාග සූත්‍රයː-** "මහණෙනි, කෛරාටික භාවයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද වෙත්. මහණෙනි, කෛරාටික භාවයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්"

**408. සාධ්‍යෛයා නිරෝධ සූත්‍රයː-** "මහණෙනි, කෛරාටික භාවයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද වෙත්. මහණෙනි, කෛරාටික භාවයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**409. සාධෙය්‍ය චාග සූත්‍රය:-** "මහණෙනි, කෛරාටික භාවයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද වෙත් මහණෙනි, කෛරාටික භාවයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**410. සාධෙය්‍ය පටිනිස්සග්ග සූත්‍රය:-** "මහණෙනි, කෛරාටික භාවයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද වෙත්. මහණෙනි, කෛරාටික භාවයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**411. ථම්භ අභිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තද ස්වභාවයාගේ මනා දැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්: සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, තදස්වභාවයාගේ මනාදැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**412. ථම්භ පරිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තද ස්වභාවයාගේ පිරිසිඳු දැනගැන්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්: සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, තදස්වභාවයාගේ පිරිසිඳු දැනගැන්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**413. ථම්භ පරික්ඛය සූත්‍රය:-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තදස්වභාවයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, තදස්වභාවයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**314. ථම්භ පහාන සූත්‍රය:-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තද ස්වභාවයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද

යත්: සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, තදස්වභාවයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**415. ථම්භක්ඛය සූත්‍රය:-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තද ස්වභාවයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, තදස්වභාවයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**416. ථම්භවය සූත්‍රය:-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තද ස්වභාවයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, තදස්වභාවයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**417. ථම්භ විරාග සූත්‍රය:-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තද ස්වභාවයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, තදස්වභාවයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**418. ථම්භ නිරොධ සූත්‍රය:-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තද ස්වභාවයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්, කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, තදස්වභාවයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**419. ථම්භ චාග සූත්‍රය:-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තද ස්වභාවයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩියයුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි,

තදස්වභාවයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**420. ථම්භපටිනිස්සග්ග සූත්‍රයඃ-** "මහණෙනි, (ක්‍රොධ මාන වශයෙන් පැවති අවවාදයට නොනැමෙන) තද ස්වභාවයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, තදස්වභාවයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**421. සාරම්භ අභිඤ්ඤා සූත්‍රයඃ-** "මහණෙනි, (කරණොත්තරියකරණ) පළිගැනීම් ස්වභාවයාගේ මනාදැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත් කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, පළිගැනීම් ස්වභාවයාගේ මනාදැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**422. සාරම්භ පරිඤ්ඤා සූත්‍රයඃ-** "මහණෙනි, (කරණොත්තරියකරණ) පළිගැනීම් ස්වභාවයාගේ පිරිසුදු දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, පළිගැනීම් ස්වභාවයාගේ පිරිසුදු දැනගැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**423. සාරම්භ පරික්ඛය සූත්‍රයඃ-** "මහණෙනි, (කරණොත්තරියකරණ) පළිගැනීම් ස්වභාවයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, පළිගැනීම් ස්වභාවයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**424. සාරම්භ පහාන සූත්‍රයඃ-** "මහණෙනි, (කරණොත්තරියකරණ) පළිගැනීම් ස්වභාවයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි,

පළිගැනීම් ස්වභාවයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

**425. සාරම්භක්ඛය සූත්‍රයː-** “මහණෙනි, (කරණොත්තරිය කරණ) පළිගැනීම් ස්වභාවයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, පළිගැනීම් ස්වභාවයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්”

**426. සාරම්භවය සූත්‍රයː-** “මහණෙනි, (කරණොත්තරිය කරණ) පළිගැනීම් ස්වභාවයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, පළිගැනීම් ස්වභාවයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

**427. සාරම්භවිරාග සූත්‍රයː-** “මහණෙනි, (කරණොත්තරිය කරණ) පළිගැනීම් ස්වභාවයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, පළිගැනීම් ස්වභාවයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

**428. සාරම්භ නිරොධ සූත්‍රයː-** “මහණෙනි, (කරණොත්තරියකරණ) පළිගැනීම් ස්වභාවයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, පළිගැනීම් ස්වභාවයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

**429. සාරම්භචාග සූත්‍රයː-** “මහණෙනි, (කරණොත්තරිය කරණ) පළිගැනීම් ස්වභාවයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, පළිගැනීම් ස්වභාවයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.”

**430. සාරම්භ පටිනිස්සග්ග සූත්‍රයː-** “මහණෙනි, (කරණොත්තරියකරණ) පළිගැනීම් ස්වභාවයාගේ බැහැරලීම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, පළිගැනීම් ස්වභාවයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

431. **මාන අභිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ මනාදැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ මනාදැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

432. **මාන පරිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ පිරිසුදුව දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ පිරිසුදු දැනගැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

433. **මානපරික්ඛය සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

434. **මානපහාන සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

435. **මානක්ඛය සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

436. **මානවය සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද

යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

437. **මානවිරාග සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

438. **මානනිරොධ සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩියයුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

439. **මානචාග සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

440. **මානපටිනිස්සග්ග සූත්‍රය:-** "මහණෙනි, (නවවිධ) මානයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, (නවවිධ) මානයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

441. **අතිමාන අභිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, අධික මානයාගේ මනා දැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. "මහණෙනි, අධිකමානයාගේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

442. **අතිමාන පරිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, අධිකමානයාගේ පිරිසුදු දැනගැන්ම පිණිස දහම් දෙකක් වැඩිය

යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, අධිකමානයාගේ පිරිසුදු දැනගැන්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**443. අතිමාන පරික්ඛය සූත්‍රයː-** "මහණෙනි, අධික මානයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, අධිකමානයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**444. අතිමාන පහාන සූත්‍රයː-** "මහණෙනි, අධික මානයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, අධිකමානයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**445. අතිමානක්ඛය සූත්‍රයː-** "මහණෙනි, අධික මානයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, අධිකමානයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**446. අතිමානවය සූත්‍රයː-** "මහණෙනි, අධික මානයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, අධිකමානයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**447. අතිමාන විරාග සූත්‍රයː-** "මහණෙනි, අධික මානයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, අධිකමානයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**448. අතිමාන නිරොධ සූත්‍රයː-** "මහණෙනි, අධික මානයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්.

කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, අධික මානයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.'

**449. අතිමාන චාග සූත්‍රයඃ-** "මහණෙනි, අධික මානයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි මහණෙනි, අධික මානයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**450. අතිමාන පටිනිස්සග්ග සූත්‍රයඃ-** "මහණෙනි, අධික මානයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, අධිකමානයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**451. මද අභිඤ්ඤා සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ මනා දැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ මනාදැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**452. මදපරිඤ්ඤා සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ පිරිසුදු දැනගැන්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ පිරිසුදු දැනගැන්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**453. මදපරික්ඛය සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**454. මද පහාන සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්,

සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**455. මදක්ඛය සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**456. මදවය සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්.'

**457. මද විරාග සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**458. මද නිරොධ සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**459. මද චාග සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟබව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**460. මද පටිනිස්සග්ග සූත්‍රයඃ-** "මහණෙනි, මදයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, මදයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**461. පමාද අභිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, ප්‍රමාදයාගේ මනා දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ මනා දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**462. පමාද පරිඤ්ඤා සූත්‍රය:-** "මහණෙනි, ප්‍රමාදයාගේ පිරිසුදු දැනගැනීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ පිරිසුදු දැනීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**463. පමාද පරික්ඛය සූත්‍රය:-** "මහණෙනි, ප්‍රමාදයාගේ ගෙවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ ගෙවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**464. පමාද පහාන සූත්‍රය:-** "මහණෙනි, ප්‍රමාදයාගේ දුරුකිරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ දුරුකිරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**465. පමාදක්ඛය සූත්‍රය:-** මහණෙනි, ප්‍රමාදයාගේ නැතිවීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ නැතිවීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**466. පමාදවය සූත්‍රය:-** "මහණෙනි, ප්‍රමාදයාගේ විනාශය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ විනාශය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**467. පමාදවිරාග සූත්‍රය:-** "මහණෙනි, ප්‍රමාදයාගේ නොඇල්ම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ නොඇල්ම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**468. පමාදනිරොධ සූත්‍රය:-** "මහණෙනි, ප්‍රමාදයාගේ නිරුද්ධිය පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ නිරුද්ධිය පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**469. පමාදචාග සූත්‍රය:-** "මහණෙනි, ප්‍රමාදයාගේ අත්හැරීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ අත්හැරීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**470. පමාදපටිනිස්සග්ග සූත්‍රය:-** "මහණෙනි, ප්‍රමාදයාගේ බැහැරලීම පිණිස දහම් දෙකක් වැඩිය යුතු වෙත්. කවර දෙකක්ද යත්, සිත්හි එකඟ බව (සමාධිය) ද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි, ප්‍රමාදයාගේ බැහැරලීම පිණිස මේ දහම් දෙක වැඩිය යුතු වෙත්."

**(සත්වෙනි වර්ගය නිමි)**

**දුක නිපාතය සමාප්තයි.**

---

# තික නිපාතය.

## පඨම පණ්ණාසකය.

## 1. බාල වර්ගය.

1. බාල භය සූත්‍රය:- 1. "මහණෙනි, යම්කිසි භය උපදිත්ද, ඒ සියලු භය බාලයා කෙරෙන් උපදිත්, පණ්ඩිතයා කෙරෙන් නූපදිත්. යම්කිසි විපත්තීහු උපදිත්ද ඒ සියලු විපත්තීහු බාලයා කෙරෙන් උපදිත්. පණ්ඩිතයාගෙන් නූපදිත්. යම්කිසි උවදුරු උපදිත්ද ඒ සියලු උවදුරු බාලයා කෙරෙන් උපදිත්. පණ්ඩිතයාගෙන් නූපදිත්.

2. "මහණෙනි, යම්සේ වනාහි බට සෙවිලි ගෙයක් හෝ තණ සෙවිලි කළ ගෙයක් හෝ ගිනිගන්නා ලද්දේ ඇතුළත පිටත (සුනුපිරියම්) කරණ ලද භිත්ති ඇත්තාවූ මනාව සවිකළ දොරවල් ඇත්තාවූ මනාව යෙදූ වා කවුළු ඇත්තාවූ කූටාගාරයන්ද දවන්නේද, මහණෙනි, එපරිද්දෙන්ම වනාහි යම්කිසි භය කෙනෙක් උපදිත්ද, ඒ සියලු බිය බාලයා කෙරෙන් උපදිත්, පණ්ඩිතයා කෙරෙන් නූපදිත්.

"යම්කිසි විපත්තීහු උපදිත්ද, ඒ සියලු විපත් බාලයා කෙරෙන් උපදිත්, පණ්ඩිතයා කෙරෙන් නූපදිත්. යම්කිසි උපද්‍රව කෙනෙක් උපදිත්ද ඒ සියලු උපද්‍රවයෝ බාලයා කෙරෙන් උපදිත් පණ්ඩිතයා කෙරෙන් නූපදිත්.

3. "මහණෙනි, මෙසේ වනාහි බාලතෙම භය සහිත වේ, පණ්ඩිත තෙම භය සහිත නොවේ. බාලතෙම විපත්ති සහිත වේ, පණ්ඩිත තෙම විපත්ති සහිත නොවේ. බාලතෙම උවදුරු සහිත වේ. පණ්ඩිත තෙම උවදුරු සහිත නොවේ. මහණෙනි, පණ්ඩිතයා කෙරෙන් බියක් නැත්තේය. පණ්ඩිතයාගෙන් විපතක් නැත. පණ්ඩිතයා කෙරෙන් උවදුරක් නැත.

4. "මහණෙනි, එහෙයින් ධර්ම තුනකින් යුක්තවූ පුද්ගලයා බාලයායයි දතයුත්තේද ඒ ධර්ම තුන දුරුකොට යම් ධර්ම තුනකින් යුක්තවූ පුද්ගලයා පණ්ඩිතයායයි දතයුත්තේද, ඒ ධර්ම

තුන සමාදන්ව වාසය කරන්නෙමුයි මෙසේ හික්මිය යුතුයි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයයි" වදාළේය.

**2. කම්ම ලක්ඛණ සූත්‍රය:-** 1. "මහණෙනි, බාලතෙම ක්‍රියාව ලක්ෂණ (හැඳින ගතයුතු කරුණ) කොට ඇත්තේය පණ්ඩිත තෙම ක්‍රියාව ලක්ෂණ කොට ඇත්තේය. ප්‍රඥාව චරිතයෙන් ශෝභමාන වන්නීයයි වදාළේය."

2. "මහණෙනි, ධර්ම තුනකින් යුක්තවූ පුද්ගලයා බාල යයි දත යුතුයි. කවර ධර්ම තුනකින්ද? කාය දුශ්චරිතයෙන්ද, වාග් දුශ්චරිතයෙන්ද, මනෝදුශ්චරිතයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුක්තවූයේ බාලයයි දතයුතු.

3. "මහණෙනි, ධර්ම තුනකින් යුක්තවූයේ පණ්ඩිතයයි දත යුතුයි. කවර තුනකින්ද යත්? කාය සුචරිතයෙන්ද වාග් සුචරිතයෙන්ද, මනෝ සුචරිතයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුක්තවූයේ පණ්ඩිතයයි දත යුතුයි. මහණෙනි, එහෙයින් යම් ධර්ම තුනකින් යුක්තවූයේ බාලයා යයි දතයුත්තේද, ඒ ධර්ම තුන දුරුකොට යම් ධර්ම තුනකින් යුක්තවූයේ පණ්ඩිතයායයි දතයුත්තේද ඒ ධර්ම සමාදන්ව වාසය කරන්නෙමියි මෙසේ හික්මිය යුතුයි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයයි" වදාළේය.

**3. බාල ලක්ඛණ සූත්‍රය:-** 1. "මහණෙනි, බාලයාගේ බාල ලක්ෂණ බාලයා යයි දැනගැනීමට කරුණු බාල චරිත තුනක් වෙත්. කවර තුනක්ද යත්? මහණෙනි, මේ ලෝකයෙහි බාලතෙම නපුරු සිතක්ම සිතන්නේ වෙයි, නපුරු වචනයක්ම කියන්නේ වෙයි, නපුරු ක්‍රියාවක්ම කරන්නේ වෙයි.

2. "මහණෙනි, මේ බාලතෙම ඉදින් නපුරු සිතක් නොසිතන්නේත් වේනම් නපුරු වචන නොකියන්නේත් වේනම්, නපුරු ක්‍රියා නොකරන්නේත් වේනම් පණ්ඩිතයෝ ඔහු මේ පින්වත් තෙම බාලයෙක අසත්පුරුෂයෙකැයි කිනම් කරුණකින් දැනගන්නාහුද,

3. "මහණෙනි, යම් හෙයකින් වනාහි බාලතෙම නපුරු සිතක්ම සිතන්නේ වෙයිද, නපුරු වචනයක්ම කියන්නේ වෙයිද,

නපුරු ක්‍රියාවක්ම කරන්නේ වෙයිද එහෙයින් පණ්ඩිතයෝ ඔහු මේ පින්වත් තෙමේ බාලයෙක පණ්ඩිතයෙකැයි දැනගන්නාහුය. මහණෙනි, මොහු වනාහි බාලයාගේ බාල ලක්ෂණ බාල කරුණු බාල චරිතයෝ වෙත්යයි" වදාළේය.

4. "මහණෙනි, පණ්ඩිතයාගේ පණ්ඩිත ලක්ෂණ, පණ්ඩිත කරුණු පණ්ඩිත චරිත තුනක් වෙති. කවර තුනක්ද? මහණෙනි, මේ ලෝකයෙහි පණ්ඩිත තෙම යහපත් සිතක්ම සිතන්නේ වෙයි, යහපත් වචනයක්ම කියන්නේ වෙයි, යහපත් ක්‍රියාවක්ම කරන්නේ වෙයි. මහණෙනි ඉදින් පණ්ඩිත තෙමේ යහපත් සිතක්ම සිතන්නේත් යහපත් වචනයක්ම කියන්නේත්, යහපත් ක්‍රියාවක්ම කරන්නේත් නොවේ නම් පණ්ඩිතයෝ ඔහු මේ පින්වත් තෙමේ පණ්ඩිතයෙක, සත්පුරුෂයෙකැයි කුමකින් දැනගන්නාහුද,

5. "මහණෙනි, යම් හෙයකින් පණ්ඩිත තෙමේ යහපත් සිතක්ම සිතන්නේ වේද, යහපත් වචනයක්ම කියන්නේ වේද, යහපත් ක්‍රියාවක්ම කරන්නේ වේද එහෙයින් ඥානවන්තයෝ මේ පින්වත් තෙමේ පණ්ඩිතයෙක සත්පුරුෂයෙකැයි දැනගනිත්. මහණෙනි, මොහු පණ්ඩිතයාගේ පණ්ඩිත ලක්ෂණ පණ්ඩිත කරුණු පණ්ඩිත චරිත වෙත්.

6. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

4. **අච්චය පටිකරණ සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම තුනකින් යුත් පුද්ගලයා බාලයායයි දතයුතුයි. කවර තුනකින්ද?

2. "වරද වරද වශයෙන් නොදකියිද වරද වරද වශයෙන් දැක ධර්මයවූ පරිද්දෙන් පිළියම් නොකරයිද අනිකෙකු වරද ප්‍රකාශ කළ කල්හි ධර්මය වූ පරිද්දෙන් නොපිළිගනීද, මහණෙනි මේ කරුණු තුනෙන් යුත් පුද්ගලයා බාලයායයි දතයුතුයි.

3. "මහණෙනි, ධර්ම තුනකින් යුත් පුද්ගලතෙමේ පණ්ඩිතයායයි දතයුතුයි. කවර තුනකින්ද යත්? වරද වරද වශයෙන් දකියිද වරද වරද වශයෙන් දැක ධර්මය වූ පරිදි පිළියම් කරයිද, අනිකෙකු වරද ප්‍රකාශ කළ කල්හි ධර්මය වූ

පරිදි පිළිගනියිද මේ ධර්ම තුනෙන් යුත් පුද්ගලයා පණ්ඩිතයායයි දතයුතු.

4. "(මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 4 ඡෙදය මෙනි.)

**5. අයොගිනිසොපඤ්ඤ සූත්‍රයඃ-** (5-8 මේ සූත්‍රවල 1, 4 ඡෙද මේ වර්ගයේ 4 සූත්‍රයේ 1, 4 ඡෙද මෙන් වෙත්.)

2. නුවණින් ප්‍රශ්න අසන්නේ වේද නුනුවණින් ප්‍රශ්න විසඳන්නේ වේද අනිකෙකු විසින් නුවණින් අර්ථයෙන් හා කාරණයෙන් යුක්තවූ සිලුටුවූ පද ව්‍යඤ්ජනයන්ගෙන් විසඳන ලද ප්‍රශ්න සතුටින් පිළිගන්නේ වෙයිද, මහණෙනි, මේ කරුණු තුනෙන් යුත් පුද්ගලතෙම බාලයායයි දතයුතු.

3. "මහණෙනි, කරුණු තුනකින් යුත් පුද්ගලයා පණ්ඩිතයායයි දතයුතුය. කිනම් කරුණු තුනකින්ද? මහණෙනි නුවණින් ප්‍රශ්න අසන්නේවෙයිද නුවණින් ප්‍රශ්න විසඳන්නේවෙයිද අනිකෙකු විසින් නුවණින් අර්ථයෙන් හා කාරණයෙන් යුත් සිලුටු පද ව්‍යඤ්ජනයන්ගෙන් විසඳන ලද ප්‍රශ්න සතුටින් පිළිගන්නේවෙයිද, මහණෙනි, මේ කරුණු තුනෙන් යුත් පුද්ගලයා පණ්ඩිතයායි දතයුතුය

**6. අකුශල කම්ම සූත්‍රයඃ-** 2. "අකුශල කායකර්මයෙන්ද අකුශල වාක්කර්මයෙන්ද අකුශල මනොකර්මයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් පුද්ගලයා බාලයායයි දතයුතුය.

3. "මහණෙනි, කරුණු තුනකින් යුත් පුද්ගලයා පණ්ඩිතයායයි දතයුතුය. කවර තුනකින්ද? කුශල කාය කර්මයෙන්ද කුශල වාක්කර්මයෙන්ද කුශල මනොකර්මයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් පුද්ගලයා පණ්ඩිතයායි දතයුතුය.

**7. සාවජ්ජ කම්ම සූත්‍රයඃ-** 2. "වරද සහිත කාය කර්මයෙන්ද, වරද සහිත වාක්කර්මයෙන්ද වරද සහිත මනො කර්මයෙන්ද වෙයි. මහණෙනි, මේ කරුණු තුනෙන් යුත් පුද්ගලයා බාලයායයි දතයුතුය.

3. "මහණෙනි, කරුණු තුනකින් යුත් පුද්ගලයා පණ්ඩිතයායයි දතයුතුය. කවර තුනකින්ද නිරවද්‍ය කායකර්මයෙන්ද නිරවද්‍ය වාක්කර්මයෙන්ද නිරවද්‍ය මනොකර්මයෙන්ද වෙයි. මහණෙනි, මේ කරුණු තුනෙන් යුත් පුද්ගලයා පණ්ඩිතයායයි දතයුතුය.

8. **සව්‍යාපජ්ඣ කම්ම සූත්‍රය:-** 2 "අපරාධ සහිත කාය කර්මයෙන්ද අපරාධ සහිත වාක්කර්මයෙන්ද අපරාධ සහිත මනොකර්මයෙන්ද වෙයි මහණෙනි, මේ කරුණු තුනෙන් යුත් පුද්ගලයා බාලයායයි දතයුතුය.

3. "මහණෙනි, කරුණු තුනකින් යුත් පුද්ගලයා පණ්ඩිතයායයි දතයුතුය. කවර තුනකින්ද නිරපරාධ කාය කර්මයෙන්ද නිරපරාධ වාක්කර්මයෙන්ද නිරපරාධ මනො කර්මයෙන්ද වෙයි. මහණෙනි, මේ කරුණු තුනෙන් යුත් පුද්ගලයා පණ්ඩිතයායයි දතයුතුය.

9. **ඛතත්ත සූත්‍රය:-** 1 "මහණෙනි, බාලවූ, අදක්ෂවූ, අසත්පුරුෂවූ, බාල තෙමේ නසාගත් විනාශ කරගත් ආත්මය පරිහරණය කරයි. නුවණැත්තන් විසින් කියයුත්තෙක් චොදනා කටයුත්තෙක් වෙයි. බොහෝ අකුසල්ද රැස්කරයි. කවර තුනකින්ද?

2. "කාය දුශ්චරිතයෙන්ද වාක් දුශ්චරිතයෙන්ද මනො දුශ්චරිතයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් අදක්ෂ අසත්පුරුෂ බාලතෙම නසාගත් විනාසකර ගත් ආත්මයක් පරිහරණය කරයි. නුවනැත්තන් විසින් කිය යුත්තෙක්ද චොදනා කටයුත්තක්ද වෙයි බොහෝ අකුසල්ද රැස්කරයි

3 "මහණෙනි, ධර්ම තුනකින් යුත් දක්ෂවූ සත්පුරුෂවූ පණ්ඩිත තෙමේ නොනසන ලද විනාශ නොකරන ලද ආත්මයක් පරිහරණය කරයි. කවර තුනකින්ද යත් කාය සුචරිතයෙන්ද වාක් සුචරිතයෙන්ද මනො සුචරිතයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් දක්ෂවූ සත්පුරුෂ වූ පණ්ඩිත තෙමේ නොනසන ලද විනාශ නොකරණ ලද ආත්මයක් පරිහරණය

කරයි. නුවණැත්තන් විසින් නොකිය යුත්තෙක් චොදනා නොකළ යුත්තෙක් වෙයි. බොහෝ කුසල්ද රැස් කරයි.”

10. **මලප්පහාණ සූත්‍රය:-** 1. “මහණෙනි, ධර්ම තුනකින් යුත් පුද්ගලයා මලතුනක් දුරුනොකොට ගෙන එන ලද්දක් දැමුවාක් මෙන් නිරයෙහි උපදියි. කවර තුනකින්ද?

2. “දුශ්ශීලවූයේ වෙයිද දුශ්ශීල බව නම් මලය පහ නොකරන ලද්දේ වේද, ඊෂ්‍යා කරන්නෙක් වෙයිද, ඊෂ්‍යා මලය පහනොකරනලද්දේ වෙයිද, මසුරෙක් වෙයිද, මසුරු මල දුරු නොකරනලද්දේ වෙයිද, මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් පුද්ගලයා මේ තුන් මලයන් දුරුනොකොට ගෙනඑනලද්දක් දැමුවාක් මෙන් නිරයෙහි උපදියි.

3. “මහණෙනි, ධර්ම තුනකින් යුත් පුද්ගලයා තුන් මලයන් දුරුකොට ගෙනඑනලද්දක් දැමුවාක් මෙන් ස්වර්ගයෙහි උපදියි. කවර තුනකින්ද? සිල්වතෙක් වෙයිද දුශ්ශීලභාව මලය පහකරනලද්දේ වෙයිද, ඊෂ්‍යා නොකරන්නේ වෙයිද, ඊෂ්‍යා මලය පහකරනලද්දේ වෙයිද, මසුරෙක් නොවෙයිද. මසුරු මල පහකරන ලද්දේ වෙයිද, මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් පුද්ගලයා ගෙනඑන ලද්දක් දැමුවාක් මෙන් ස්වර්ගයෙහි උපදියි”

**(පළමුවෙනි බාල වර්ගය නිමි)**

---

## 2. රථකාර වර්ගය

11. **ඤාතභික්ඛු සූත්‍රය:-** 1 “මහණෙනි, ධර්ම තුනකින් යුත් ප්‍රසිද්ධ භික්ෂුව බොහෝදෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නොසැප පිණිස බොහෝදෙනාට අනර්ථය පිණිස දෙවිමිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නේ වෙයි. කවර තුනකින්ද?

2. “නුසුදුසුවූ කාය කර්මයන්හි සමාදන් කරවයිද, නුසුදුසු වාක් කර්මයන්හි සමාදන් කරවයිද, නුසුදුසු මනො කර්මයන්හි සමාදන් කරවයිද, මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් ප්‍රසිද්ධ භික්ෂුතෙමේ බොහෝදෙනාට අහිත පිණිස බොහෝදෙනාට

නොසැප පිණිස බොහෝදෙනාට අනර්ථය පිණිස දෙව්මිනිසුනට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නේ වෙයි.

3. "මහණෙනි, ධර්ම තුනකින් යුත් ප්‍රසිද්ධ භික්ෂු තෙමේ බොහෝදෙනාට හිත පිණිස බොහෝදෙනාට සැප පිණිස බොහෝදෙනාට අර්ථය පිණිස දෙව්මිනිසුන්ට හිත පිණිස සැප පිණිස පිළිපන්නේ වෙයි. කවර තුනකින් ද, සුදුසුවූ කාය කර්මයන්හි සමාදන් කරවයිද, සුදුසුවූ වාක් කර්මයන්හි සමාදන් කරවයිද, සුදුසුවූ මනො කර්මයන්හි සමාදන් කරවයිද, මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් භික්ෂුතෙමේ බොහෝ දෙනාට හිත පිණිස බොහෝදෙනාට සැප පිණිස බොහෝ දෙනාට අර්ථය පිණිස දෙව්මිනිසුන්ට හිත පිණිස සැප පිණිස පිළිපන්නේ වෙයි."

**12. යාවජීව සරණීය සූත්‍රය:-** 1. "මහණෙනි, ඔටුණු පැළැන්දුවාවූ ක්ෂත්‍රිය රජ විසින් ජීවිතාන්තය දක්වා සිහිකළ යුතු කරුණු තුනක් වෙත්. කවර තුනක්ද?

2. "ඔටුණු පලන් ක්ෂත්‍රිය රජතෙමේ යම් පෙදෙසක උපන්නේ වේද, මහණෙනි, මේ ඔටුණු පලන් ක්ෂත්‍රිය රජ විසින් ජීවිතාන්තය දක්වා සිහි කළයුතු පළමුවැනි කාරණය වෙයි. නැවතද ඔටුණු පළන් ක්ෂත්‍රිය රජ තෙමේ යම් පෙදෙසක ඔටුණු පැලැන්දේ වෙයිද, මහණෙනි, මේ ඔටුණු පළන් ක්ෂත්‍රිය රජ විසින් ජීවිතාන්තය දක්වා සිහි කළයුතු දෙවැනි කාරණය වෙයි මහණෙනි, නැවතද ඔටුණු පළන් ක්ෂත්‍රිය රජ තෙමේ යුද්ධයකින් ජයගෙන දිනන ලද යුද්ධ ඇත්තේ ඒ යුද්ධභූමියට අධිපතිව වාසය කරයිද, මහණෙනි, මේ ඔටුණු පලන් ක්ෂත්‍රිය රජ විසින් ජීවිතාන්තය දක්වා සිහි කළ යුතු තුන්වැනි කාරණය වෙයි මහණෙනි, මේ වනාහි ඔටුණු පලන් ක්ෂත්‍රිය රජ විසින් ජීවිතාන්තය දක්වා සිහි කළයුතු කරුණු තුන වෙත්.

3. "මහණෙනි, එසේම භික්ෂුව විසින් ජීවිතාන්තය දක්වා සිහි කළයුතු මේ කරුණු තුනක් වෙත්. කවර තුනක්ද යත්, මහණෙනි, භික්ෂු තෙමේ යම් පෙදෙසක හිස රැවුල් කපා කසාවත් හැඳ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවූයේද මහණෙනි, මේ භික්ෂුව විසින් ජීවිතාන්තය දක්වා සිහිකළයුතු

පළමුවැනි කාරණය වෙයි නැවතද, මහණෙනි, භික්ෂු තෙමේ යම් පෙදෙසක මෙය දුකයයි තත්වාකාරයෙන් දැනගනියිද, මෙය දුකට හෙතුවයයි තත්වාකාරයෙන් දැනගනියිද, මෙය දුක් නැතිකිරීම යයි තත්වාකාරයෙන් දැනගනීද, මෙය දුක් නැතිකිරීමේ මාර්ගයයි තත්වාකාරයෙන් දැනගනීද, මහණෙනි, මේ භික්ෂුව විසින් ජීවිතාන්තය දක්වා සිහිකළයුතු දෙවැනි කාරණය වෙයි. නැවතද මහණෙනි, භික්ෂු තෙමේ යම් පෙදෙසක ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත් ඵල සමාධියත් අර්හත්ඵල ප්‍රඥාවත් තෙමේම විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට අවබොධ කොට වාසය කරයිද, මහණෙනි, මේ භික්ෂුව විසින් ජීවිතාන්තය දක්වා සිහි කළයුතු තුන්වැනි කාරණය වෙයි. මහණෙනි, මේ භික්ෂුව විසින් ජීවිතාන්තය දක්වා සිහිකටයුතු කරුණු තුනවෙත්"

13. **නිරාස සූත්‍රයː-** 1. "මහණෙනි, ලොකයෙහි පුද්ගලයෝ තුන්දෙනෙක් ඇත්තාහු වෙත්. විද්‍යමාන වෙත්. කවර තුන්දෙනෙක්ද?

2. 'අපෙක්ෂා රහිත පුද්ගලයාද අපෙක්ෂා සහිත පුද්ගලයාද අපෙක්ෂා පහකළ පුද්ගලයාද වෙත්.

3. "මහණෙනි, අපෙක්ෂා රහිත පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් චණ්ඩාල කුලයෙහි හෝ වැදි කුලයෙහි හෝ කුළුපොතු කුලයෙහි හෝ කම්කරු කුලයෙහි හෝ පරමල් ඉවතලන කුලයෙහි හෝ දිළිඳු වූ ස්වල්ප ආහාරපාන ඇති දුක් පැවතුම් ඇති යම් තැනෙක්හි දුකසේ කෑම ඇඳීම ලබයිද එබඳු තැනෙක්හි උපන්නේ වෙයිද, හෙතෙම අවලක්ෂණ වූයේ අප්‍රිය දැකුම් ඇත්තේ මිටිවූයේ බොහෝ ආබාධ ඇත්තේ කණෙක් හෝ කුණෙක් හෝ කොරෙක් හෝ පක්ෂයක් පණනැතියෙක් හෝ වූයේ ආහාර පාන වස්ත්‍ර යානා මල් ගඳ විලවුන් සෙනාසන තෙල් පහන් නොලබන්නේ වෙයිද, හෙතෙම මෙනම් ක්ෂත්‍රිය තෙමේ ක්ෂත්‍රියයන් විසින් ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක කරන ලද්දේයයි අසන්නේය. එහෙත් ඔහුට මාද ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියාභිෂෙකයෙන් කවදා

අභිෂේක කරද්ද යන අපෙක්ෂාව (බලාපොරොත්තුව) ඇති නොවේ. මහණෙනි, මෙතෙම අපෙක්ෂා රහිත පුද්ගලයායයි කියනු ලැබේ.

**4.** 'මහණෙනි, අපෙක්ෂා සහිත පුද්ගලයා නම් කවරේද? මහණෙනි මේ ලොකයෙහි ඔටුණු පලන් ක්ෂත්‍රිය රජකුගේ අභිෂෙකයට සුදුසුවූ සුදුසු වියට පැමිණියාවූ අභිෂෙක නොකරන ලද වැඩිමහලු පුතෙක් වෙයිද හෙතෙම මෙනම් ක්ෂත්‍රිය තෙමේ ක්ෂත්‍රියයන් විසින් ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක කරන ලදැයි අසන්නේ වෙයිද ඔහුට එසේ මාද ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියාභිෂෙකයෙන් කවදා අභිෂෙක කරද්දැයි සිතෙන්නේය. මහණෙනි, මේ තෙමේ අපෙක්ෂාසහිත පුද්ගලයා යයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, පහවූ අපෙක්ෂා ඇති පුද්ගලයා නම් කවරේද? මේ ලොකයෙහි අභිෂෙක කරන ලද්දාවූ ක්ෂත්‍රිය රජෙක් වෙයිද හෙතෙම මෙනම් ක්ෂත්‍රිය තෙමේ ක්ෂත්‍රියයන් විසින් ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක කරන ලද්දේයයි අසන්නේද ඔහුට මෙසේ මාද ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියාභිෂෙකයෙන් කවදා අභිෂෙක කරන්නාහුදැයි නොසිතෙන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, පෙර අභිෂෙක නොකරන ලද්දහුට යම් ආශාවක් වීද ඔහුගේ ඒ ආශාව සංසිඳුනීය. මහණෙනි, මේ පුද්ගල තෙමේ පහකළ අපෙක්ෂා ඇති පුද්ගලයායයි කියනු ලැබේ මහණෙනි, මේ පුද්ගලයෝ තුන්දෙන ලොකයෙහි ඇත්තාහු වෙත්. විද්‍යමාන වෙත්.

**6.** "මහණෙනි, එසේම භික්ෂූන් අතරෙහි පුද්ගලයෝ තුන්දෙනෙක් ඇත්තාහු වෙත්. විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක්ද? අපෙක්ෂා රහිත පුද්ගලයාද අපෙක්ෂා සහිත පුද්ගලයාද පහකළ අපෙක්ෂා ඇති පුද්ගලයාද වෙත්.

**7.** 'මහණෙනි, අපෙක්ෂා රහිත පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීල වෙයිද, පාපධර්ම ඇත්තේ වෙයිද, අපිරිසිදු කාය කර්මාදිය ඇත්තේ වෙයිද, සැක කළයුතු පැවතුම් ඇත්තේ වෙයිද, සැඟවුණු ක්‍රියා

ඇත්තේ වෙයිද, ශ්‍රමණයෙකැයි අඟවන්නාවූ අශ්‍රමණයෙක් වෙයිද, බ්‍රහ්මචාරියෙකැයි අඟවන්නාවූ අබ්‍රහ්මචාරියෙක් වෙයිද, ඇතුළත කුණුවූයේ වෙයිද, රාගාදියෙන් තෙත්වූයේ වෙයිද, හටගත් රාගාදි කුණු කසල ඇත්තේද, හෙතෙමේ මෙනම් භික්ෂුතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව තෙමේ මේ ආත්මයෙහිම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරේයයි අසන්නේද, ඔහුට කවදා නම් මමද ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත් ඵල සමාධියත් අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ වාසය කරන්නෙම්ද යන අපෙක්ෂාව නූපදින්නේය. මහණෙනි, මෙතෙමේ අපෙක්ෂා රහිත පුද්ගලයායයි කියනු ලැබේ.

8. "මහණෙනි, අපෙක්ෂා සහිත පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ සිල්වත් වේද, යහපත් ධර්ම ඇත්තේ වේද, හෙතෙමේ මෙනම් භික්ෂුව ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව තෙමේ මේ ආත්මයෙහිම විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නෙම් දැයි අදහස් වන්නේය. මහණෙනි, මෙතෙමේ අපෙක්ෂා සහිත පුද්ගලයා යයි කියනු ලැබේ.

9. "මහණෙනි, පහවූ අපෙක්ෂා ඇති පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ ආශ්‍රවයන් ක්ෂය කළ රහත් පුද්ගලයෙක් වෙයිද හෙතෙමේ මෙනම් භික්ෂුව ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව තෙමේ මේ ආත්මයෙහිම විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නේයයි අසන්නේය. ඔහුට මම කවදා ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව තෙමේ මේ ආත්මයෙහිම විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නෙමියි' අදහස් නොවන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, රහත් නොවූ ඔහුට රහත්වීමට යම් අපෙක්ෂාවක්

වීද, ඔහුගේ ඒ අපෙක්ෂාව සංසිඳුනී වෙයි. මහණෙනි, මෙතෙමේ පහවූ අපෙක්ෂා ඇති පුද්ගලයායයි කියනු ලැබේ. මහණෙනි, මේ භික්ෂූන් අතරෙහි ඇත්තාවූ විද්‍යමානවූ පුද්ගලයෝ තිදෙන වෙත්."

**14. අරාජක චක්ක සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්මයෙන් යුක්තවූ ධර්මයෙන් රජ කරන්නාවූ යම් සක්විති රජෙක් වේද හෙතෙම රජකු නැතිව අණසක නොපවත්නේයයි වදාළේය.

2. මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි, ධර්මයෙන් යුත් ධර්මයෙන් රජ කරන්නාවූ සක්විති රජහුගේ රජ නම් කවරෙක්දැයි?' කීය.

"මහණ, (දශකුශල) ධර්මයයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. "මහණ, ධර්මයෙන් යුත් ධර්මයෙන් රජ කරන්නාවූ සක්විති රජ තෙමේ දශ කුශල ධර්මය ඇසුරු කොට ධර්මයට සත්කාර කරමින් ධර්මයට ගරු කරමින් ධර්මයට පුදමින් ධර්මය ද්වජයක් කොට ගෙන ධර්මය කොඩියක් කොට ගෙන ධර්මය අධිපතිකොට ගෙන අභ්‍යන්තර ජනයාගේ රැකවරණ පරිස්සම සලසාලයි.

3. "මහණ, නැවතද ධාර්මිකවූ ධර්මයෙන් රජ කරන්නාවූ සක්විති රජ තෙමේ ධර්මයම ඇසුරු කොට ධර්මයට සත්කාර කරමින් ධර්මයට ගරු කරමින් ධර්මයට පුදමින් ධර්මය ධවජයක් කොට ගෙන ධර්මය කොඩියක් කොට ගෙන ධර්මය අධිපතිකොට ගෙන රාජකාර්‍ය්‍යයන්හි නියුක්ත ක්ෂත්‍රියයන් කෙරෙහිද බලසෙනඟ කෙරෙහිද, බ්‍රාහ්මණ ගෘහපතීන් කෙරෙහිද, නියම්ගම් ජනපද වාසීන් කෙරෙයිද ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහිද මෘග පක්ෂීන් කෙරෙහිද රැකවරණ පරිස්සම සලසාලයි.

4. "මහණ, ධාර්මිකවූ ධර්මයෙන් රජ කරන්නාවූ ඒ සක්විති රජ තෙමේ ධර්මයම ඇසුරු කරමින් ධර්මයට සත්කාර කරමින් ධර්මයට ගරු කරමින් ධර්මයට පුදමින් ධර්මය ධජයක් කොට ගෙන ධර්මය කොඩියක් කොට ගෙන ධර්මය අධිපති කොට ගෙන අභ්‍යන්තර ජනයා කෙරෙහි ධාර්මික රැකවරණ පරිස්සම

සලසා රාජකාර්‍ය්‍යයන්හි නියුක්ත ක්ෂත්‍රියයන් කෙරෙහි රැකවරණ පරිස්සම සලස්වා බල සෙනඟ කෙරෙහි බ්‍රාහ්මණ ගෘහපතීන් කෙරෙහි නියම්ගම් ජනපද වාසීන් කෙරෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි මෘග පක්ෂීන් කෙරෙහි රැකවරණ පරිස්සම සලස්වා ධර්මයෙන්ම අණසක පවත්වයි. ඒ අණසක මනුෂ්‍යවූ පරසතුරු කිසි ප්‍රාණියකු විසින් නොවැලැක්විය හැකිවෙයි.

**5.** "මහණ, එමෙන්ම ධර්මයෙන් යුක්තවූ ධර්මරාජවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ ධර්මයම (නවලොකොත්තර ධර්මයම) ඇසුරු කොට ධර්මයට සත්කාර කරමින් ධර්මයට ගරු කරමින් ධර්මයට පුදමින් ධර්මය ධජයක් කොට ගෙන ධර්මය කොඩියක් කොට ගෙන ධර්මය අධිපති කොට ගෙන කාය කර්මයෙහි රැකවරණ පරිස්සම සලසන්නේය. කෙසේද? මෙබඳුවූ කාය කර්ම සෙවනය කළ යුතුය. මෙබඳුවූ කාය කර්ම සෙවනය නොකළ යුතුය කියායි.

**6.** "නැවතද, මහණ, ධාර්මිකවූ ධර්මයට ගරු කරමින් ධර්මයට පුදමින් ධර්මය ධජයක් කොට ගෙන ධර්මය කොඩියක් කොට ගෙන ධර්මය අධිපතිකොට ගෙන වාක් කර්මයෙහි රැකවරණ පරිස්සම සලසන්නේය. කෙසේද? මෙවැනි වාක් කර්ම සෙවනය කළ යුතුය. මෙවැනි වාක් කර්ම සෙවනය නොකළ යුතුය යනුවෙනි

**7.** "නැවතද, මහණ, ධාර්මිකවූ ධර්මයට ගරු කරමින් ධර්මයට පුදමින් ධර්මය ධජයක් කොට ගෙන ධර්මය කොඩියක් කොට ගෙන ධර්මය අධිපතිකොට ගෙන මනො කර්මයෙහි රැකවරණ පරිස්සම සලසන්නේය. කෙසේද මෙවැනිවූ මනො කර්ම සෙවනය කළ යුතුය. මෙවැනිවූ මනොකර්ම සෙවනය නොකළ යුතුය යනුවෙනි.

'මහණ, ඒ ධාර්මිකවූ ධර්මයට ගරු කරමින් ධර්මයට පුදමින් ධර්මය ධජයක් කොට ගෙන ධර්මය කොඩියක් කොට ගෙන ධර්මය අධිපති කොට ගෙන ධර්මයම ඇසුරු කරමින් ධර්මයට ගරු කරමින් ධර්මයට පුදමින් ධර්මය ධජයක් කොට ගෙන ධර්මය කොඩියක් කොට ගෙන ධර්මය අධිපති කොට ගෙන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කාය කර්මයෙහි ධාර්මික රැකවරණ පරිස්සම සලස්වා වාක් කර්මයෙහි කාය කර්මයෙහි මනො කර්මයෙහි රැකවරණ පරිස්සම සලස්වා ධර්මයෙන්ම නිරුත්තර ධර්ම චක්‍රය පවත්වන්නේය. ඒ ධර්ම චක්‍රය ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ බඹකු විසින් හෝ ලොකයෙහි කිසිවකු විසින් හෝ වැළැක්විය නොහැක්කේය."

**15. පචෙතන සූත්‍රය:-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර මිගදායෙහි ඉසිපතනාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට 'මහණෙනියි" අඬගා වදාළ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනියි" භාග්‍යවතුන්වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළෝය.

2. "මහණෙනි, පෙර පචෙතන නම් රජෙක් විය. මහණෙනි එකල්හි ඒ පචෙතන රජතෙමේ රිය සාදන්නාට අඬගසා මෙසේ කීය. යහළු රියකරුව මාහට මෙයින් සමසකට පසු යුද්ධයක් ඇත්තේය. යහළු රියකරුව මට අලුත් රථචක්‍ර දෙකක් කිරීමට හැකිද?'යනුයි. මහණෙනි, දෙවයන්වහන්ස හැක්කෙමි'යි රියකරුතෙමේ පචෙතන රජහට උත්තර දුනි.

3. "මහණෙනි, ඉක්බිති රියකරු තෙමේ සදිනක් අඩු සමසකින් එක් චක්‍රයක් නිමවීය. ඉක්බිති පචෙතන රජ තෙමේ රිය කැඳවිය. 'යහළු රිය කරුව, මෙයින් සදිනකට පසු මට යුද්ධයක් ඇත්තේය. අළුත් චක්‍ර දෙකක් නිමවී දැයි ඇසීය. 'දෙවයන්වහන්ස, මේ සදිනක් අඩු සමසින් එක් චක්‍රයක් නිමියේයයි' කීය. 'යහළු රියකරුව මාහට මේ සදවසින් දෙවැනි රියසක නිමවිය හැකිද? 'දෙවයන්වහන්ස, හැක්කෙමියි, රියකරුතෙමේ පචෙතන රජහට උත්තර දුනි

4. මහණෙනි, ඉක්බිති රියකරුතෙමේ සදිනකින් දෙවැනි රියසක නිමවා අළුත් චක්‍ර දෙක ගෙන පචෙතන රජතෙමේ යම් තැනකද එතැනට ගියේය. ගොස් පචෙතන රජහට දෙවයන්වහන්ස මේ නුඹවහන්සේගේ අලුත් චක්‍ර දෙක

නිම්යේයයි' කීය. 'යහළු රියකරුව මේ සදිනක් අඩු සමසකින් නිමවන ලද රිය සකත් සදිනකින් නිමවන ලද රිය සකත් යන දෙකෙහි වෙනස කුමක්ද? මම වෙනසක් නොදැක්කෙමියි' කීය. 'දෙවයන්වහන්සේ ඔවුන්ගේ වෙනසක් ඇත. දෙවයන්වහන්සේ වෙනස බලනු මැනවයි' කීය.

**5.** 'ඉක්බිති රියකරු තෙමේ යම් චක්‍රයක් සදිනකින් නිමකරන ලද්දේද එය පෙරලා හැරියේය. පෙරලා හරින ලද එය තල්ලු කළ වේගයෙන් යා යුතු තැන යම් පමණද ඒතාක් ගොස් වැනී පොළොවෙහි වැටුණේය. යම් චක්‍රයක් සදිනක් අඩු සමසකින් නිමවීද එය පෙරලා හැරියේය. පෙරලා හරිනලද එය තල්ලුකළ වේගයෙන් යායුතු තැන යම් තැනැක්ද එතැන දක්වා ගොස් අකුරෙහි (අලවංගුවෙහි) ගසනලද්දාක් මෙන් සිටියේය.

**6.** "යහළු රියකරුව, යම් චක්‍රයක් සදවසකින් නිමවන ලද්දේද පෙරලා හරිනලද්දාවූ එය තල්ලු කළ වේගය ඇතිතාක් ගොස් වැනී පොළොවෙහි වැටෙයි. ඊට හෙතුව කාරණය කුමක්ද? යහළු රියකරුව යම් චක්‍රයක් සදිනක් අඩු සමසකින් නිමවන ලදද පෙරලා හරිනලද්දාවූ එය තල්ලුකළ වේගය ඇතිතාක් ගොස් අකුරෙහි ගසන ලද්දාක්මෙන් සිටියි ඊට හේතුව කාරණය කිමදැයි' ඇසීය. 'දේවයන්වහන්ස, යම් චක්‍රයක් සදවසකින් නිමකරන ලද්දේද එහි පට්ටමත් ඇදය, දොස් සහිතය, එළය සහිතය, ගරාදිද ඇදය, දොස් සහිතය, එළය සහිතය, බොස්ගෙඩියද ඇදය, දොස් සහිතය, එළය සහිතය, පට්ටමත් ඇද බැවින් දොස්සහිත බැවින් එළය සහිත බැවින් ගරාදිද ඇද බැවින් දොස්සහිත බැවින් එළය සහිත බැවින් බොස්ගෙඩියත් ඇද බැවින් දොස් සහිත බැවින් එළය සහිත බැවින් පෙරළා යවනලද එය වේගය ඇතිතාක් ගොස් වැනී පොළොවෙහි වැටෙයි. දෙවයන්වහන්ස, යම් චක්‍රයක් සදිනක් අඩු සමසකින් නිමකරන ලද්දේද එහි පට්ටමද නොඇදය, නිදොස්ය, එළයෙන් තොරය. ගරාදිද නොඇදය, නිදොස්ය, එළයෙන් තොරය. බොස්ගෙඩියද නොඇදය, නිදොස්ය, එළයෙන් තොරය. පට්ටමද නොඇද බැවින් නිදොස් බැවින්

එළයෙන් තොර බැවින් ගරාදිද නොඇද බැවින් නිදොස් බැවින් එළයෙන් තොර බැවින් බොස්ගෙඩියද නොඇද බැවින් නිදොස් බැවින් එළයෙන් තොර බැවින් පෙරලා හරිනලද එය වේගය ඇතිතාක් ගොස් අකුරෙහි ගසන ලද්දාක් මෙන් සිටියි."'

7. "මහණෙනි, තොප විසින් එකල්හි ඒ රියකරුතෙම අනිකෙකැයි සිතිය හැකිය. මහණෙනි, එසේ නොසිතිය යුතුය. එකල්හි මම ඒ රියකරු වීමි. මහණෙනි, මම එකල්හි ලීවල ඇදකුද දොස් වැරදි පිළිබඳ දක්ෂයෙක්මි. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ මම දැන් වනාහි ශ්‍රාවකයන්ගේ කායවංක කාය දොස කාය කසටයන් පිළිබඳ දක්ෂවෙමි. වචී වංක වචී දොස වචී කසටයන් පිළිබඳ දක්ෂවෙමි. මනො වංක මනොදොස මනොකසටයන් පිළිබඳ දක්ෂවෙමි.

8. "මහණෙනි, යම්කිසි භික්ෂුවක්හුගේ හෝ භික්ෂුණියකගේ හෝ කායවංක කායදොස කාය කසට පහනොවූයේද වචීවංක වචීදොස වචීකසට පහනොවූයේද මනො වංක මනො දොස මනො කසට පහනොවූයේද මහණෙනි, ඔවුහු ඒ සදිනකින් නිමකරන ලද චක්‍රය යම්සේද එමෙන් මේ ධර්ම විනය සංඛ්‍යාත ශාසනයෙන් වැටෙන්නාහ.

9. "මහණෙනි, යම්කිසි භික්ෂුවක්හුගේ හෝ කායවංක කායදොස කායකසට පහවූයේද වචීවවංක වචීදොස වචීකසට පහවූයේද මනොවංක මනොදොස මනොකසට පහවූයේද ඔව්හු සදිනක් අඩු සමසකින් නිමවන ලද ඒ චක්‍රය යම්සේද එමෙන් මේ ධර්ම විනය සංඛ්‍යාත ශාසනයෙහි පිහිටියාහු වෙති.

10. "මහණෙනි, එහෙයින් කායවංක කායදොස කාය කසට පහකරන්නෙමු. වචීවංක වචීදොස මනොකසට පහකරන්නෙමුයි මෙසේ හික්මිය යුතුය. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයයි' වදාළේය."

**16. අපණ්ණක පටිපදා සූත්‍රය:-** 1. "මහණෙනි, ධර්ම තුනකින් යුක්තවූ මහණ තෙමේ ඒකාන්ත ප්‍රතිපදාවට පිළිපන්නේ වේ. ඔහු විසින් ආශ්‍රවයන් ක්ෂයකිරීම පිණිස පවත්නා හෙතුවද පටන්ගන්නා ලද්දේ වෙයි. කවර තුනකින්ද?

**2.** 'මහණෙනි, මේ සස්නෙහි මහණතෙම ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේද, භෝජනයෙහි පමණ දන්නේ වේද නිදි දුරුකිරීමෙහි යෙදුනේ වේද වෙයි.

**3.** "මහණෙනි, කෙසේ නම් මහණතෙම ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් නොගන්නේද අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ වේද යම් හෙතුවකින් ඇසෙහි අසංවරව වාසය කරන්නහුට ලාමකවූ ලොභ ද්වේෂ අකුසල ධර්මයෝ ගලාඑන්නාහුද ඒ ඇස සංවර කිරීම පිණිස පිළිපදියිද චක්ෂුරෙන්ද්‍රිය රකීද චක්ෂුරෙන්ද්‍රියෙහි සංවරයට පැමිණේද,

"කණින් ශබ්දයක් අසා නිමිති වශයෙන් නොගන්නේද අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ වේද යම් හෙතුවකින් කණෙහි අසංවරව වාසය කරන්නහුට ලාමකවූ ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ ගලාඑන්නාහුද ඒ කණ සංවර කිරීම පිණිස පිළිපදියිද සොතෙන්ද්‍රිය රකීද සොතෙන්ද්‍රියෙහි සංවරයට පැමිණේද,

"නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට නිමිති වශයෙන් නොගන්නේද අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ වේද යම් හෙතුවකින් නාසයෙහි අසංවරව වාසය කරන්නහුට ලාමකවූ ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ ගලාඑන්නාහුද ඒ නාසය සංවර කිරීම පිණිස පිළිපදියිද ඝාණෙන්ද්‍රිය රකීද, ඝාණෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේද,

"දිවෙන් රසයක් දැන නිමිති වශයෙන් නොගන්නේද අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ වේද යම් හෙතුවකින් දිවෙහි අසංවරව වාසය කරන්නහුට ලාමකවූ ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ ගලාඑන්නාහුද ඒ දිව සංවර කිරීම පිණිස පිළිපදියිද දිවෙන්ද්‍රිය රකීද, දිවෙන්ද්‍රියෙහි සංවරයට පැමිණේද,

"කයින් ප්‍රශ්ටව්‍යයක් ස්පර්ශකොට නිමිති වශයෙන් නොගන්නේද අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ වේද යම් හෙතුවකින් කයෙහි අසංවරව වාසය කරන්නහුට ලාමකවූ ලොභ

ද්වෙෂ අකුසල ධර්මයෝ ගලාඑන්නාහුද ඒ කය සංවර කිරීම පිණිස පිළිපදියිද කායෙන්ද්‍රිය රකීද, කායෙන්ද්‍රියෙහි සංවරයට පැමිණේද,

'සිතින් ධර්මාරමුණක් දැන නිමිති වශයෙන් නොගන්නේවේද අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ වේද යම් හෙතුවකින් සිතෙහි අසංවරව වාසයකරන්නහුට ලාමකවූ ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ ගලා එන්නාහුද ඒ සිත සංවර කිරීම පිණිස පිළිපදියිද මනේන්ද්‍රිය රකීද, මනේන්ද්‍රියෙහි සංවරයට පැමිණේද, මහණෙනි, මෙසේ වනාහි ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වෙයි.

4 "මහණෙනි, කෙසේ නම් මහණතෙම භොජනයෙහි පමණ දන්නේ වේද මහණෙනි, මහණතෙම නුවණින් මෙනෙහි කොට ආහාර වළඳන්නේය කෙසේද? ක්‍රීඩා පිණිසද නොවේමය, මද වැඩීම පිණිසද නොවේමය, අඩුතැන් පිරවීම පිණිසද නොවේමය. සැරසීම පිණිසද නොවේමය. මේ ශරීරයාගේ පැවැත්ම යැපීම පිණිසම පීඩා දුරුකර ගැනීම පිණිස බ්‍රහ්මචයර්‍ය්‍යාවට උපකාර පිණිසම වළඳමි. මෙසේ ආහාර වැළඳීමෙන් පුරාණ වෙදනාද ඉවසමි. අලුත් වෙදනාද නොඋපදවන්නෙමි. නිවරද බවද සැප විහරණයද වන්නෙමි යනුවෙනි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම භෝජනයෙහි පමණ දන්නේ වේ.

5. 'මහණෙනි, කෙසේ නම් මහණතෙම නිදි දුරුකිරීමෙහි යෙදුනේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම දවල් කාලයෙහි සක්මන් කිරීමෙන්ද හිඳීමෙන්ද පඤ්ච නීවරණ ධර්මයන් ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රියෙහි පළමුවෙනි යාමයෙහි සක්මන් කිරීමෙන්ද හිඳීමෙන්ද පඤ්ච නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි. රාත්‍රියෙහි මධ්‍යම යාමයෙහි දකුණැලයෙන් පාදයෙහි පාදය මඳක් ඉක්මවා තබා සිහි නුවණින් යුක්තව නැගිටිමි යන සංඥාව මෙනෙහි කොට උතුම්වූ සයනය කරයිද, රාත්‍රියෙහි පශ්චිම යාමයෙහි නැගිට සක්මන් කිරීමෙන්ද හිඳීමෙන්ද පඤ්ච නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි.

6. "මහණෙනි, මෙසේ වනාහි මහණතෙම නිදි දුරු කිරීමෙහි යෙදුනේ වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුක්තවූ මහණතෙම ඒකාන්ත ප්‍රතිපදාවට පිළිපන්නේවේ. ඔහු විසින් ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස පවත්නා කාරණයද පටන්ගන්නා ලද්දේ වෙයි."

**17. ව්‍යාබාධ සංවත්තන සූත්‍රය:- 1.** "මහණෙනි, මේ ධර්මයෝ තුන්දෙනෙක් තමහට දුක් පිණිසද පවතිත්. අනුන්හට දුක් පිණිසද පවතිත්. තමන් අනුන් යන දෙදෙනාටම දුක් පිණිසද පවතිත්. කවර තුන්දෙනෙක්ද යත්, කාය දුශ්චරිතය, වාක් දුශ්චරිතය, මනො දුශ්චරිතය යන මොහුයි මහණෙනි, මේ ධර්මයෝ තුන්දෙන තමාට දුක් පිණිසද අනුන්ට දුක් පිණිසද දෙදෙනාටම දුක් පිණිසද පවතිත්.

2. "මහණෙනි, මේ ධර්මයෝ තිදෙනෙක් තමන්ට දුක් නොපිණිසද අනුන්ට දුක් නොපිණිසද දෙදෙනාටම දුක් නොපිණිසද පවත්නාහුය. කවර තුනක්ද? කාය සුචරිතයද වාක් සුචරිතයද මනො සුචරිතයද වෙත්. මහණෙනි, මේ ධර්මයෝ තිදෙන තමන් දුක් නොපිණිසද, අනුන්ට දුක් නොපිණිසද, දෙදෙනාට දුක් නොපිණිසද පවතිත්."

**18. දෙවලොකුප්පත්ති සූත්‍රය:- 1.** "මහණෙනි, ඉදින් වනාහි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ 'ඇවැත්නි, දෙව්ලොව ඉපදීම පිණිස ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නහුදැයි අසන්නාහු නම් මෙසේ අසන ලද්දාවූ තෙපි හැකිලෙන්නාහු නොවෙත්ද, ලජ්ජාවන්නාහු නොවෙත්ද, පිළිකුල් කරන්නාහු නොවෙත්ද, 'ස්වාමීනි, එසේය මහණෙනි, මෙසේ වනාහි තෙපි දිව්‍ය ආයුෂට හැකිළෙන්නාහු නම් ලජ්ජාවන්නාහු නම් පිළිකුල් කරන්නාහු නම් දිව්‍ය වර්ණයට හැකිලෙන්නාහු නම් ලජ්ජාවන්නාහු නම් පිළිකුල් කරන්නාහු නම් දිව්‍ය සැපට හැකිලෙන්නාහු නම් ලජ්ජා වන්නාහු නම් පිළිකුල් කරන්නාහු නම් දිව්‍ය යසසට හැකිලෙන්නාහු නම් ලජ්ජා වන්නාහු නම් පිළිකුල් කරන්නාහු නම්, දිව්‍ය අධිපති බවට හැකිලෙන්නාහු නම් ලජ්ජාවන්නාහු නම් පිළිකුල් කරන්නාහු නම් මහණෙනි,

පළමුකොට වනාහි තොප විසින් කාය දුශ්චරිතයට හැකිලිය යුතුයි. ලජ්ජාවිය යුතුයි. පිළිකුල් කටයුතුයි. වාක් දුශ්චරිතයට හැකිලිය යුතුයි ලජ්ජා වියයුතුයි. පිළිකුල් කටයුතුයි. මනො දුශ්චරිතයට හැකිලිය යුතුයි. ලජ්ජා විය යුතුයි. පිළිකුල් කටයුතුයි.”

19. **පාපනික සූත්‍රයඃ-** 1. “මහණෙනි, කරුණු තුනකින් යුක්තවූ වෙළඳ තෙම නොලැබූ ධන ලැබීමට හෝ ලැබූ ධනය දියුණු කිරීමට හෝ සුදුසු නොවේ. කවර තුනකින්ද? මහණෙනි, මේ ලෝකයෙහි වෙළඳ තෙම උදය කාලයෙහි මනාව කටයුතු නොකරයිද දවල් කාලයෙහි මනාව කටයුතු නොකරයිද සවස් කාලයෙහි මනාව කටයුතු නොකරයිද, මහණෙනි, මේ අංග තුනෙන් යුත් වෙළඳතෙම නොලැබූ ධන ලැබීමට හෝ ලැබූ ධනය දියුණු කිරීමට හෝ සුදුසු නොවේ.

2. “මහණෙනි, එපරිද්දෙන්ම වනාහි ධර්ම තුනකින් යුක්තවූ මහණතෙම නොලැබූ කුසල් ලබන්ටද ලැබූ කුසල් දියුණු කරන්ටද සුදුසු නොවේ කවර අංග තුනකින්ද? මහණෙනි, මහණතෙමේ උදය කාලයෙහි සමාධි අරමුණු මනාකොට නොවඩයිද දවල් කාලයෙහි මනාකොට සමාධි නිමිත්ත නොවඩයිද සවස් කාලයෙහි මනාකොට සමාධි නිමිත්ත නොවඩයිද, මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් මහණ තෙමේ නොලැබූ කුශල ධර්ම ලැබීමට හෝ ලැබූ කුශල ධර්ම දියුණුකිරීමට හෝ සුදුසු නොවේ

3. “මහණෙනි, කරුණු තුනකින් යුත් වෙළඳ තෙමේ නොලැබූ ධනය ලැබීමටත්, ලැබූ ධනය දියුණු කිරීමටත් සුදුසු වෙයි. කවර තුනකින්ද? මහණෙනි, වෙළඳ තෙමේ උදය කාලයෙහි මනාකොට කටයුතු කරයිද, දවල් කාලයෙහි මනාකොට කටයුතු කරයිද, සවස් කාලයෙහි මනාකොට කටයුතු කරයිද මහණෙනි, මේ අංග තුනෙන් යුත් වෙළඳ තෙමේ නොලැබූ ධනය ලැබීමටද ලැබූ ධනය දියුණුකිරීමටද සුදුසු වෙයි.

4. “මහණෙනි, එසේම ධර්ම තුනකින් යුත් මහණ තෙමේ නොලැබූ කුශල ධර්මයන් ලැබීමටත් ලැබූ කුශල ධර්මයන් දියුණුකිරීමටත් සුදුසුවෙයි. කවර තුනකින්ද මහණෙනි,

මහණතෙමේ උදය කාලයෙහි සමාධි නිමිත්ත මනාකොට වඩයිද දවල් කාලයෙහි සමාධි නිමිත්ත මනාකොට වඩයිද සවස් කාලයෙහි සමාධි නිමිත්ත මනාකොට වඩයිද මහණෙනි, මේ තුන් ධර්මයෙන් යුත් මහණතෙමේ නොලැබූ කුශල ධර්මයන් ලැබීමටත් ලැබූ කුශල ධර්මයන් දියුණු කිරීමටත් සුදුසුවෙයි"

**20. දුතිය පාපණික සූත්‍රයඃ- 1.** "මහණෙනි, අංග තුනකින් යුක්තවූ වෙළඳතෙම නොබෝ කලකින්ම ධනයෙහි මහත් බවටද විපුල බවටද පැමිණේ කවර තුනකින්ද මහණෙනි වෙළඳ තෙම නුවණ ඇත්තේ වේද නුවණින් යුක්තවිය ඇත්තේ වේද, උදව් උපකාර ඇත්තේ වේද, යන මේ තුනෙනි.

2. "මහණෙනි, කෙසේ නම් වෙළඳ තෙම නුවණ ඇත්තේ වේද මහණෙනි වෙළඳ තෙම වෙළඳ බඩු දන්නේ වෙයි. මේ මිලට ගත් බඩුව මේ මිලට විකුණූ කල මෙතරම් ලාභ ඇත්තේයයි දන්නේය. මහණෙනි මෙසේ වනාහි වෙළඳ තෙම නුවණ ඇත්තේ වේ

3. "මහණෙනි, කෙසේ නම් වෙළඳ තෙම නුවණින් යුත් වීර්‍ය්‍යය ඇත්තේ වේද, මහණෙනි වෙළඳතෙම බඩු ගැනීමටද විකිණීමටද දක්ෂ වෙයි. මෙසේ වනාහි වෙළඳ තෙම නුවණින් යුත් වීර්‍ය්‍යය ඇත්තේ වෙයි.

4. "මහණෙනි, කෙසේනම් උදව් උපකාර ඇත්තේ වේද මහණෙනි, ධනයෙන් ආඪ්‍යවූ මහත් ධන ඇත්තාවූ මහත් වස්තුව ඇත්තාවූ යම් ගෘහපතියෝ හෝ ගෘහපති පුත්‍රයෝ වෙත්ද ඔව්හු යම් වෙළඳකු ගැන මේ පින්වත් වෙළඳ තෙමේ නුවණ ඇත්තේය. නුවණින් යුත් වීර්‍ය්‍යය ඇත්තේය. අඹුදරුවන් පොෂ්‍යකරන්ටද අපටද කලින්කල ලාභය දෙන්නටද සමර්ථයයි දැනගන්නාහුය. ඔව්හු ඒ වෙළෙන්දාට 'යහළුව මෙයින් අඹුදරුවන්ද පොෂ්‍ය කරව, අපටද කලින්කල ලාභය දෙවයි' ධනය දෙන්නාහුය. මහණෙනි මෙසේ වනාහි වෙළඳ තෙම උදව් උපකාර ඇත්තෙක් වේ. මහණෙනි මේ කරුණු තුනකින් යුක්තවූ වෙළඳ තෙම නොබෝ කලකින්ම ධනයෙහි මහත් බවටද විපුල බවටද පැමිණේ.

5. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි ධර්ම තුනකින් යුත් මහණතෙමේ ධර්මයන්හි මහත් බවට විපුල බවට පැමිණෙන්නේය. කවර ධර්ම තුනකින්ද මහණෙනි මේ සස්නෙහි මහණතෙම නුවණ ඇත්තේවේද නුවණින් යුත් වීර්‍ය්‍යය ඇත්තේවේද, උදව් උපකාරයන්ගේ පිහිට ඇත්තේ වේද, යන මේ කරුණු තුනය.

6. "මහණෙනි, කෙසේනම් මහණ තෙම නුවණ ඇත්තේවේද මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුතෙම මේ දුකයයි තත්වාකාරයෙන් දනීද මේ දුක් නැතිකිරීමට පැමිණෙන මාර්ගයයි තත්වූපරිද්දෙන් දැනගණීද මහණෙනි මහණ තෙම මෙසේ වනාහි නුවණ ඇත්තේ වෙයි

7. "මහණෙනි, මහණතෙම කෙසේනම් නුවණින් යුත් වීර්‍ය්‍යය ඇත්තේ වේද, මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම අකුශල කර්මයන් පහකරනු පිණිස කුසල ධර්මයන්ගේ දියුණුව පිණිස පටන්ගන්නා ලද වීර්‍ය්‍යය ඇත්තේ වෙයිද කුශල ධර්මයන්හි බලවත් වීර්‍ය්‍යය ඇත්තේ වෙයිද බහා නොතබන ලද වීර්‍ය්‍යය ඇත්තේ වෙයිද මහණෙනි මෙසේ වනාහි මහණතෙම නුවණින් යුත් වීර්‍ය්‍යය ඇත්තේ වෙයි.

8. "මහණෙනි, කෙසේ නම් මහණතෙම පිහිට ඇත්තේ වේද, මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම යම් ඒ භික්ෂූහු බහුශ්‍රැත වෙත්ද ප්‍රගුණ කළ නිකාය ඇත්තාහුද සූත්‍ර පිටකය දරන්නාහුද විනය පිටකය දරන්නාහුද, උභය මාතෘකා දරන්නාහුද, ඒ භික්ෂූන් කරා කලින්කල පැමිණ ස්වාමීනි මෙය කෙසේද මේ ධර්මයාගේ අර්ථය කවරේදැයි අසන්නේය. ඔහුට ඒ ආයුෂ්මත්හු නොවැටහුණ දේ වටහාවත් ප්‍රකටනොවූ දේ ප්‍රකට කෙරෙත්, නොයෙක් සැක කටයුතු ධර්මයන්හි සැක දුරුකරත්, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම පිහිට ඇත්තෙක් වෙයි. මහණෙනි මේ ධර්ම තුනෙන් යුත් මහණ තෙමේ නොබෝ කලකින්ම ධර්මයන්හි මහත් බවට විශාල බවට පැමිණෙයි"

**(දෙවෙනි රථකාර වර්ගය නිමි.)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# 3. පුග්ගල වර්ගය.

## 21. සමිද්ධ (හෝ) සවිට්ඨ සූත්‍රය.

1. "ඉක්බිත්තෙන් වනාහි ආයුෂ්මත්වූ සවිට්ඨ ස්ථවිර තෙමේද ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිර තෙමේද, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියාහ. පැමිණ, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එක් පැත්තක උන්නේය. ශාරිපුත්ත ස්ථවිර තෙම මෙසේ ඇසීය.

2. "ඇවැත්නි, සවිට්ඨය, ලෝකයෙහි මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ඇත්තාහු විද්‍යමාන වන්නාහු වෙත්. කවර තුන්දෙනෙක්ද, කාය සක්ඛි පුද්ගලයාය, දිට්ඨිප්පත්ත පුද්ගලයාය, සද්ධාවිමුත්ත පුද්ගලයාය (යන තුන්දෙන වෙත්) ඇවැත්නි, ලෝකයෙහි මේ පුද්ගලයෝ තුන්දෙන ඇත්තාහු, විද්‍යමාන වන්නාහු වෙත්. ඇවැත්නි, මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් කවර පුද්ගලයෙක් ඔබට කැමතිවන්නේද, වඩා කැමතිවන්නේද අතිශයින් ප්‍රණීත වන්නේද?"

'ඇවැත් සාරිපුත්තය, ලෝකයෙහි මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ඇත්තාහු විද්‍යමාන වන්නාහු වෙත්. කවර තුන් දෙනෙක්ද, කායසක්ඛි පුද්ගලයාය, දිට්ඨිප්පත්ත පුද්ගලයාය, සද්ධාවිමුත්ත පුද්ගලයාය (යන තුන්දෙන වෙත්) ඇවැත්නි, මේ පුද්ගලයන්තුන්දෙනා අතුරෙන් යම් පුද්ගලයෙක්තෙම සද්ධාවිමුත්ත නම් වේද, මේ පුද්ගලතෙම මට කැමැත්තේ වෙයි. වඩා සතුටුවූයේ වෙයි. අතිශයින් ප්‍රණීතවූයේ වෙයි.

'ඊට හේතු කවරේද? ඇවැත්නි, මේ පුද්ගලයාගේ ශ්‍රද්ධෙන්ද්‍රිය අධික වෙයි. එහෙයිනැයි ප්‍රකාශ කෙළේය.

3. "ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම ආයුෂ්මත්වූ මහා කොට්ඨිත ස්ථවිරයන්ට මෙය ප්‍රකාශ කෙළේය. ලෝකයෙහි මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ඇත්තාහු විද්‍යමාන වන්නාහු වෙත්. කවර තුන්දෙනෙක්ද, කාය සක්ඛි පුද්ගලයාය, දිට්ඨිප්පත්ත පුද්ගලයාය, සද්ධාවිමුත්ත පුද්ගලයාය (යන තුන්දෙන වෙත්.

ඇවැත්නි, යම් මේ පුද්ගලයෙක් තෙම කාය සක්ඛි නම් වේද, ඒ පුද්ගල තෙම මට කැමැත්තේ වෙයි, වඩා සතුටුවූයේ වෙයි. ඉතා ප්‍රණීත වෙයි"

"ඊට හේතු කවරේද? ඇවැත්නි, මේ පුද්ගලයාගේ සමාධින්ද්‍රිය අධික වෙයි. (එහෙයිනි) ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම කොට්ඨිත ස්ථවිරයන්ට මෙය ප්‍රකාශ කෙළේය.

"ලෝකයෙහි මේ පුද්ගලයන් තුන්දෙනෙක් ඇත්තාහු විද්‍යමාන වන්නාහු වෙත්. කවර තුන්දෙනෙක්ද, කාය සක්ඛි පුද්ගලයාය, දිට්ඨිප්පත්ත පුද්ගලයාය, සද්ධාවිමුත්ත පුද්ගලයාය (යන තුන්දෙන වෙත්.)

"යම් මේ පුද්ගලයෙක් තෙම දිට්ඨිප්පත්ත නම් වේද, ඒ පුද්ගලතෙම මට කැමැත්තේ වෙයි. වඩා සතුටු වූයේ වෙයි. ඉතා ප්‍රණීත වෙයි. ඊට හේතු කවරේද? ඇවැත්නි, මේ පුද්ගලයාගේ ප්‍රඥෙන්ද්‍රිය අධික වෙයි. (එහෙයිනි)

4. "යලිදු ආයුෂ්මත්වූ ශාරිපුත්‍ර ස්ථවිර තෙම ආයුෂ්මත් සවිට්ඨ ස්ථවිරයන්ටද, ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන්ටද, මෙසේ ප්‍රකාශ කෙළේය. ඇවැත්නි, අප හැම දෙනා විසින්ම ස්වකීය වැටහීම යම්සේ නම් එසේ ප්‍රකාශ කරණ ලද්දේමය, ඇවැත්නි යමු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණෙන්නෙමු. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කියන්නෙමු. භාග්‍යවතුන් වහන්සේ අපට යම්සේ ප්‍රකාශ කරණ සේක්ද, එසේ දරන්නෙමුයි' කියායි.

'ඇවැත්නි එසේ යයි' කියා ආයුෂ්මත් සවිට්ඨ ස්ථවිර තෙමේද ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිර තෙමේද ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේහට පිළිතුරු දුන්හ.

5. "ඉක්බිති ශාරිපුත්‍ර ස්ථවිර තෙමේද ආයුෂ්මත් සවිට්ඨ ස්ථවිර තෙමේද ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිර තෙමේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියෝය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම ආයුෂ්මත්

සවිට්ඨ ස්ථවිරයන් සමගද ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් සමගද කථාසල්ලාපය යම් පමණවීද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළකෙළේය.

**6.** "ශාරිපුත්‍රය, මේතෙම මේ පුද්ගලයින් තුන්දෙනා අතුරෙන් අතිශයින් යහපත්ය කියාද, අතිශයින් ප්‍රණීතයයි කියාද මෙහි ඒකාන්තයෙන් ප්‍රකාශ කිරීම පහසු නොවේමය. ශාරිපුත්‍රය, මේ කාරණය වනාහි විද්‍යමානවේ කුමක්ද? යම් මේ පුද්ගලයෙක් තෙම ශ්‍රද්ධා විමුක්තවේද, හෙතෙම රහත් හෝ වන්නේය. රහත් බැව් පිණිස පිළිපන්නේ හෝ වන්නේය. යම් මේ පුද්ගලයෙක් තෙම කාය සක්ඛි නම් වේද හෙතෙම සකෘදාගාමි හෝ වන්නේය. අනාගාමි හෝ වන්නේය. යම් මේ පුද්ගලයෙක් දිට්ඨිප්පත්ත නම් වේද හෙතෙමේ සකෘදාගාමි හෝ වන්නේය. අනාගාමි හෝ වන්නේය. (යන මෙයයි.)

**7.** "ශාරිපුත්‍රය මේතෙමේ මේ පුද්ගලයන් අතුරෙන් අතිශයින් යහපත්යයි කියාද අතිශයින් ප්‍රණීතයයි කියාද ඒකාන්තයෙන් ප්‍රකාශ කරන්නට පහසු නොවේ.

"ශාරිපුත්‍රය, යම් මේ පුද්ගලයෙක් කාය සක්ඛි වේද හෙතෙම රහතන් වහන්සේ නමක් හෝ රහත් මගට පිළිපන්නේ හෝ වේ. යම් මේ පුද්ගලයෙක් ශ්‍රද්ධා විමුක්තද හෙතෙම සකෘදාගාමි හෝ අනාගාමි හෝ වන්නේය. යම් මේ පුද්ගලයෙක් දිට්ඨිප්පත්තද හෙතෙමේද සකෘදාගාමි හෝ අනාගාමි හෝ වන්නේය. ශාරිපුත්‍රය මෙහි මේ පුද්ගලයන් තුන්දෙනා අතුරෙන් මේතෙමේ අතිශයින් යහපත්යයි කියාද අතිශයින් ප්‍රණීතයයි කියාද ඒකාන්තයෙන් ප්‍රකාශ කිරීමට අපහසුය යන මෙය වනාහි විද්‍යමාන වේ

**8.** "ශාරිපුත්‍රය යම් මේ පුද්ගලයෙක් දිට්ඨිප්පත්තද හෙතෙමේ රහත් හෝ රහත් මාර්ගයට පිළිපන්නේ හෝ වන්නේය. යම් මේ පුද්ගලයෙක් ශ්‍රද්ධා විමුක්තද හෙතෙම සකෘදාගාමි හෝ අනාගාමි හෝ වන්නේය. යම් මේ පුද්ගලයෙක් කාය සක්ඛිද හෙතෙමේද සකෘදාගාමි හෝ අනාගාමි හෝ වන්නේය. ශාරිපුත්‍රය මේතෙමේ මේ තුන් පුද්ගලයන්ගෙන් අතිශයින් යහපත්යයි කියාද

ප්‍රණීතයයි කියාද ඒකාන්තයෙන් ප්‍රකාශ කිරීමට පහසු නොවේය යන මේ කාරණය විද්‍යමානවේ”

**22. ගිලානොපම සූත්‍රය:-** 1-3 “මහණෙනි, මේ ගිලනුන් තුන්දෙනෙක් ලෝකයෙහි ඇත්තාහු, විද්‍යමාන වන්නාහු වෙත්. කවර තුන්දෙනෙක්ද යත්, මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් ගිලනෙක් තෙම හිතවූ භෝජන ලබන්නේ හෝ හිතවූ භෝජන නොලබන්නේ හෝ හිතවූ බෙහෙතක් ලබන්නේ හෝ හිතවූ බෙහෙතක් නොලබන්නේ හෝ සුදුසු සාත්තුකාරයකු ලබන්නේ හෝ සුදුසු සාත්තුකාරයකු නොලබන්නේ හෝ ඒ ආබාධයෙන් නොම නැගිටී.

2. “මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් ගිලනෙක් තෙම හිතවූ භෝජන ලබන්නේ හෝ හිතවූ භෝජන නොලබන්නේ හෝ හිතවූ බෙහෙතක් ලබන්නේ හෝ හිතවූ බෙහෙතක් නොලබන්නේ හෝ සුදුසු සාත්තුකාරයකු ලබන්නේ හෝ සුදුසු සාත්තුකාරයකු නොලබන්නේ හෝ ඒ රෝගයෙන් නැගිටී.

3. “මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් ගිලනෙක් හිතවූ බොජුන් නොලබා නොව ලැබීමෙන්ම හිතවූ ආහාර නොලබන්නෙක් නොවන්නේම හිතවූ බෙහෙත් නොලබා නොව ලබාම සුදුසු සාත්තුකාරයකු නොමලබාම ඒ රෝගයෙන් නැගිටී.

“මහණෙනි, එහි යම් මේ ගිලනෙක් තෙම හිතවූ භෝජනයන් ලබන්නේම නොලබන්නෙක් නොවන්නේම හිතවූ බෙහෙත් නොලබන්නෙක්ව ලබන්නේව, සුදුසු සාත්තුකාරයකු නොලබා නොමලැබෙන්නේව ඒ රෝගයෙන් නැගිටී.

4. “මහණෙනි, මේ ගිලනා නිසා ගිලන්බත අනුදන්නා ලදී. ගිලන් බෙහෙත් අනුදන්නා ලදී. ගිලාන උපස්ථායකයෙක් අනුදන්නා ලදී. මහණෙනි, මේ ගිලනා නිසා සෙසු ගිලන්නුද උපස්ථාන කළයුත්තාහ.

“මහණෙනි, මේ ගිලන්නු තුන්දෙන ලෝකයෙහි ඇත්තාහු, විද්‍යමාන වන්නාහු වෙත්.

**5.** "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි ගිලනුන් උපමා කොට ඇත්තාවූ මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ලෝකයෙහි ඇත්තාහ. විද්‍යමාන වන්නාහ. කවර තුන්දෙනෙක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම තථාගතයන් වහන්සේ දැකීමට ලබන්නේ හෝ තථාගතයන් වහන්සේ දැකීමට නොලබන්නේ හෝ තථාගතයන් විසින් ප්‍රකාශ කරණ ලද ධර්ම විනය ඇසීමට ලබන්නේ හෝ තථාගතයන් විසින් ප්‍රකාශ කරණ ලද ධර්ම විනය ඇසීමට නොලබන්නේ හෝ කුසල ධර්මයන්හි මාර්ග නියාමයයි කියන ලද්දාවූ සම්‍යග් භාවයට නොපැමිණෙයි.

**6.** "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම තථාගතයන් වහන්සේ දැකීමට ලබන්නේ හෝ තථාගතයන් වහන්සේ දැකීමට නොලබන්නේ හෝ තථාගතයන් විසින් ප්‍රකාශ කරණ ලද ධර්ම විනය ඇසීමට ලබන්නේ හෝ තථාගතයන් විසින් ප්‍රකාශ කරණ ලද ධර්ම විනය ඇසීමට නොලබන්නේ හෝ කුසල ධර්මයන්හි මාර්ග නියාමයයි කියන ලද්දාවූ සම්‍යග් භාවයට පැමිණෙයි.

**7.** "මහණෙනි, මේ සස්නෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් තෙම තථාගතයන් දැකීමට ලබන්නේම නොලබන්නේ හෝ තථාගතයන් විසින් ප්‍රකාශ කරණ ලද ධර්මවිනය ඇසීමට ලබන්නේම නොලබන්නේ හෝ කුසල ධර්මයන්හි මාර්ගනියාම යයි කියන ලද්දාවූ සම්‍යග් භාවයට පැමිණෙයි.

**8.** "මහණෙනි, මේ සස්නෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් තෙම තථාගතයන් දැකීමට ලබන්නේම නොලබන්නේ හෝ තථාගතයන් විසින් ප්‍රකාශ කරණ ලද ධර්ම විනය ඇසීමට ලබන්නේම නොලබන්නේ හෝ කුසල ධර්මයන්හි මාර්ගනියාම යයි කියන ලද්දාවූ සම්‍යග් භාවයට පැමිණෙයි. මහණෙනි, මේ පුද්ගලයා නිසා ධර්ම දේශනා තොමෝ අනුදන්නා ලදී. මහණෙනි, මේ පුද්ගලයා නිසා අන්‍යයන්ටද ධර්මය දේශනා කළ යුත්තේය. මහණෙනි, මේ ගිලන්නු තුන්දෙන ලෝකයෙහි ඇත්තාහු, විද්‍යමාන වෙත්යයි" වදාළේය.

23. අභිසංඛරණ සූත්‍රයː- 1 "මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම දුක් සහිතවූ කාය කර්මය රැස් කෙරෙයි. දුක් සහිතවූ වාක් කර්මය රැස් කරයි, දුක් සහිතවූ මනො කර්මය රැස්කරයි. හෙතෙම දුක් සහිතවූ කාය කර්මය රැස්කොට දුක් සහිතවූ වාග් කර්මය රැස්කොට දුක් සහිතවූ මනොකර්මය රැස්කොට දුක් සහිතවූ ලෝකයෙහි උපදී. දුක් සහිතවූ ලෝකයෙහි උපන්නාවූ ඒ ඔහු දුක් සහිතවූ ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්. හෙතෙම දුක් සහිතවූ ස්පර්ශවලින් ස්පර්ශ කරණ ලද්දේම දුක් සහිතවූ ඒකාන්තයෙන් දුක්වූ වේදනාව විඳී. නරකයෙහි සත්වයෝ යම්සේ නම් එසේමයි"

2. "මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම දුක් රහිතවූ කාය කර්මය රැස් කෙරෙයි, දුක් රහිතවූ වාග් කර්මය රැස්කරයි, දුක් රහිතවූ මනොකර්මය රැස්කරයි. හෙතෙම දුක් රහිතවූ කාය කර්ම රැස්කොට දුක් රහිතවූ වාග්කර්ම රැස් කොට දුක් රහිතවූ මනො කර්ම රැස්කොට දුක් රහිතවූ ලෝකයෙහි උපදී. දුක් රහිතවූ ලෝකයෙහි උපන්නාවූ ඒ ඔහු දුක් රහිතවූ ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්. හෙතෙම දුක් රහිතවූ ස්පර්ශවලින් ස්පර්ශ කරණ ලද්දේම දුක් රහිතවූ ඒකාන්තයෙන් සැපවූ වේදනාව විඳී. සුභකිණ්ණ නම් බඹලොව වැසි දෙවියෝ යම්සේ නම් එසේයි

3. "මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම දුක් සහිතවූද දුක් රහිතවූද කායකර්මය රැස්කෙරෙයි. දුක් සහිතවූද දුක් රහිතවූද වාග්කර්මය රැස්කරයි, දුක් සහිතවූද දුක් රහිතවූද මනො කර්මය රැස් කරයි, හෙතෙම දුක් සහිතවූද දුක් රහිතවූද කාය කර්මය රැස්කොට දුක් සහිතවූද දුක් රහිතවූද වාග් කර්මය රැස්කොට, දුක් සහිතවූද දුක් රහිතවූද මනො කර්මය රැස්කොට දුක් සහිතවූද දුක් රහිතවූද ලෝකයෙහි උපදී. දුක් සහිතවූද දුක් රහිතවූද ලෝකයෙහි උපන්නාවූ ඒ ඔහු දුක් සහිතවූද දුක් රහිතවූද ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්. හෙතෙම දුක් සහිතවූද දුක් රහිතවූද ස්පර්ශවලින් ස්පර්ශ කරණ ලද්දේම දුක් සහිතවූද දුක් රහිතවූද මිශ්‍රවූ සැප දුක් ඇත්තාවූ වේදනාව විඳී. මනුෂ්‍යයෝද සමහර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කාමාවචර දෙවියෝද, ඇතැම් වෛමානික ප්‍රේතයෝද යම්සේ නම් එසේයි.

**24. බහුපකාර පුග්ගල සූත්‍රය:-** 1. "මහණෙනි, මේ (ආචාර්‍ය්‍ය) පුද්ගලයෝ තුන්දෙනෙක් අතවැසි පුද්ගලයාට බොහෝ උපකාර ඇත්තෝ වෙත්. මහණෙනි, අතවැසි පුද්ගලයෙක් තෙම යම් ආචාර්‍ය්‍ය පුද්ගලයෙක් වෙත පැමිණ බුදුන් සරණ ගියේ වේද ධර්මය සරණ ගියේ වේද, සංඝයා සරණ ගියේ වේද, මහණෙනි, මේ ආචාර්‍ය්‍ය පුද්ගල තෙම මේ පුද්ගලයාට බොහෝ උපකාර ඇත්තේ වේ.

2. "මහණෙනි, නැවතද අනිකක් කියමි. අතවැසි පුද්ගලයෙක් තෙම යම් ආචාර්‍ය්‍ය පුද්ගලයෙකු කරා පැමිණ මේ දුකයයි තතුසේ දැන ගණීද, මේ දුකට හේතුවයයි තතුසේ දැනගනීද, මේ දුක නැතිකිරීමයයි තතුසේ දැනගනීද, මේ දුක නැතිකිරීමේ මාර්ගයයි තතුසේ දැනගනීද, මහණෙනි, මේ ආචාර්‍ය්‍ය පුද්ගල තෙම මේ පුද්ගලයාට බොහෝ උපකාර ඇත්තේ වේ.

3. "මහණෙනි, නැවතද අනිකක් කියමි. අතවැසි පුද්ගලයෙක් යම් පුද්ගලයෙක් කරා පැමිණ මහණෙනි, මේ ආචාර්‍ය්‍ය පුද්ගලයන් තුන්දෙනාට වඩා මේ අතවැසි පුද්ගලයාට අතිශයින් උපකාර ඇත්තාවූ අන්‍ය පුද්ගලයෙක් නැත්තේයයි කියමි. මහණෙනි, මේ ආචාර්‍ය්‍ය පුද්ගලයන් තුන්දෙනාට මේ අන්තේවාසික පුද්ගලයා විසින් යම් මේ වැඳීමය, නැගිටීමය, ඇඳිලිබැඳීමය, බුහුමන් කිරීමය, සිව්රුය, පිණ්ඩභෝජනය, සෙනසුන්ය, ගිලනුන්ට ප්‍රත්‍යවූ බෙහෙත් හා පිරිකරය යන මේදේ දීමෙන් ප්‍රත්‍යුපකාර කරන්ට නොහැකියි කියමියි" වදාළේය.

**25. අරුකූපම සූත්‍රය:-** 1. "මහණෙනි, මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ලෝකයෙහි ඇත්තාහු විද්‍යමාන වන්නාහු වෙත්. කවර තුන්දෙනෙක්ද යත්, පරණ වනයක බඳු සිත් ඇති පුද්ගලයාද විදුලිඑළියකට බඳු සිත් ඇති පුද්ගලයාද, වජ්‍රයකට (දියමන්තියකට) බඳු සිත් ඇති පුද්ගලයාද වෙත්.

2. "මහණෙනි, පරණ වණයක බඳු පුද්ගලයා නම් කවරෙක්ද, මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ක්‍රොධකරන්නේ වේද, ක්‍රොධය බහුලකොට ඇත්තේ වේද ස්වල්පදෙයක් කියන ලද නමුත් ගැටෙන්නේද කිපේද, ප්‍රකෘතිය අත්හරීද, තද බවට පැමිණේද, කෝපයත්, ද්වෙෂයත්, නොසතුටු බවත් පහළ කෙරේද, යම්සේ වනාහි පුරාණ වණයක් දඬු කොණකින් හෝ කැබිලිත්තකින් හෝ ගටනා ලද්දී බෙහෙවින්ම ලේ වගුරුවාද, මහණෙනි, එසේම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ක්‍රොධ කරණ ස්වභාව ඇත්තේද ස්වල්පයක් කියන ලද්දේම එහි ලැගේද කිපේද, ස්වභාවය අත්හරීද, තද බවට පැමිණේද, කොපයද ද්වෙෂයද නොසතුටු ආකාරයද පහළ කෙරේද, මහණෙනි, මේ පුරාණ වණයකට බඳු සිත් ඇති පුද්ගලයායයි කියනු ලැබේ.

3. "මහණෙනි, විදුලියකට බඳු සිත් ඇති පුද්ගලයා කවරේද, මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් ඉපදීමට හේතුව යයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් වැලකීමයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් වැලැක්මට යන ප්‍රතිපදාවයයි තත්වූ පරිද්දෙන් දනීද, මහණෙනි, යම්සේ වනාහි ඇස් ඇත්තාවූ පුරුෂයෙක් තෙම ඝනාන්ධකාර රාත්‍රියෙක්හි විදුලි එළියෙන් රූපයන් දක්නේ වේද මහණෙනි, එසේම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් නිරොධයට ප්‍රතිපදාවයයි තත්වූ පරිද්දෙන් දනීද, මහණෙනි, මේ විදුලියකට සමාන සිත් ඇත්තාවූ පුද්ගලයායයි කියනු ලැබේ.

4. "මහණෙනි, දියමන්තියකට බඳු සිත් ඇති පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයිද, මහණෙනි, වජ්‍රයට බිඳිය නොහැකිවූ කිසි මිණක් හෝ ගලක් හෝ නැත්තේ වේද, මහණෙනි, එසේම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක්

කෙලෙසුන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්මභාවයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ දියමන්තියකට බඳු සිත් ඇති පුද්ගලයායයි කියනු ලැබේ. මහණෙනි, මේ පුද්ගලයන් තුන්දෙන ලෝකයෙහි ඇත්තාහ. විද්‍යමාන වන්නාහු වෙත්.

"එසේම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයිද, මේ දියමන්තියකට සමාන සිත් ඇත්තාවූ පුද්ගලයායයි කියනු ලැබේ."

**26. නසෙවිතබ්බ සූත්‍රයː- 1.** "මහණෙනි, මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ලෝකයෙහි ඇත්තාහ. විද්‍යාමානවෙත් කවර තුන්දෙනෙක් ද යත්. මහණෙනි සෙවනය නොකටයුතුවූ භජනය නොකළ යුතුවූ ආශ්‍රය නොකළ යුතුවූ පුද්ගලයෙක් ඇත්තේය. මහණෙනි සෙවනය කළ යුතුවූ භජනය කළ යුතුවූ ආශ්‍රය කළ යුතුවූ පුද්ගලයෙක් ඇත්තේය. මහණෙනි සත්කාරකොට ගරුකොට සෙවනය කළ යුතුවූ භජනයකළ යුතුවූ ආශ්‍රය කළ යුතුවූ පුද්ගලයෙක් ඇත්තේය.

**2.** "මහණෙනි, සෙවනය නොකළ යුතුවූ භජනය නොකළ යුතුවූ ආශ්‍රය නොකළ යුතුවූ පුද්ගලයා කවරේද? මහණෙනි මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ශීලයෙන් සිත එකඟකිරීමෙන්ද, ප්‍රඥාවෙන්ද තමන්ට වඩා පහත්ද මහණෙනි මෙබඳු පුද්ගලතෙම කරුණාවෙන් විනා අනුකම්පාවෙන් විනා සෙවනය නොකළ යුතුය. භජනය නොකළ යුතුය. ආශ්‍රය නොකළ යුතුය.

**3.** "මහණෙනි, සෙවනය කළ යුතු භජනය කළ යුතු ආශ්‍රය කළයුතු පුද්ගලයා කවරේද. මහණෙනි මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ශීලයෙන් සිත එකඟ කිරීමෙන් ප්‍රඥාවෙන් තමන් හා සමානවේද? මහණෙනි මෙබඳු පුද්ගල තෙම සෙවනය කළ යුතුය, භජනය කළ යුතුය, ආශ්‍රය කළ යුතුය. ඊට හේතු කවරේද? ශීලයෙන් සමානභාවයට ගියාවූම අපගේ ශීලකථාව වන්නේය.

අපගේ ශීල කථාවද පවත්වන්නේය. අපට ඒ කථාවද පහසු වන්නේය. සිත එකඟ කිරීමෙන් සමානත්වයට ගියාවූම අපගේ සිත එකඟ කිරීම් සම්බන්ධ කථාව වන්නේය. අපගේ ශීලකථාවද පවත් වන්නේය. අපට ඒ කථාවද පහසු වන්නේය. එසේහෙයින් මෙබඳු පුද්ගලතෙම සෙවනය කළ යුතුය. භජනය කළ යුතුය. ආශ්‍රය කළ යුතුය.

4. "මහණෙනි, සත්කාරකොට ගරුකොට සෙවනය කළයුතු භජනය කළයුතු ආශ්‍රය කළයුතු පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ශීලයෙන්, සිත එකඟකිරීමෙන්, ප්‍රඥාවෙන් තමන්ට වඩා උසස් වේද? මහණෙනි, මෙබඳු පුද්ගලතෙම සත්කාරකොට ගරුකොට සෙවනය කළයුතුය, භජනය කළයුතුය, ආශ්‍රය කළයුතුය ඊට හේතු කවරේද? 'මෙසේ ආශ්‍රය කිරීමෙන් සම්පූර්ණ නොවූ හෝ ශීලරාශිය සම්පූර්ණ කරන්නෙමි සම්පූර්ණකර ගත් ශීල රාශියට ඒ ඒ තන්හි උපකාර ධර්ම ආශ්‍රයෙන් ප්‍රඥාවෙන් අනුග්‍රහ කරන්නෙමි. සම්පූර්ණ නොවූ හෝ සමාධි රාශිය සම්පූර්ණ කරන්නෙමි. සම්පූර්ණ වූ හෝ සමාධි රාශියට ඒ ඒ තන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහ කරන්නෙමි. සම්පූර්ණ නොවූ හෝ ප්‍රඥා රාශිය සම්පූර්ණ කරන්නෙමි. සම්පූර්ණවූ හෝ ප්‍රඥා රාශියට ඒ ඒ තන්හි නුවණින් අනුබල දෙන්නෙමියි' කියායි.

"එසේ හෙයින් මෙබඳු පුද්ගලතෙම සත්කාරකොට ගරු කොට සෙවනය කළ යුතුය, භජනය කළ යුතුය. ආශ්‍රය කළ යුතුය. මහණෙනි මේ පුද්ගලයන් තුන්දෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්ය" යි වදාළසේක.

5. "තමන්ට වඩා ගුණයෙන් හීනවූ පුද්ගලයන් සෙවනය කරන්නාවූ පුරුෂතෙම පිරිහෙයි. තමන්ට සමාන ගුණ ඇති පුද්ගලයන් සෙවනය කරන්නාවූ පුද්ගලයා නොපිරිහේ ශ්‍රේෂ්ට පුද්ගලයන්ගේ ගතිගුණ වලට නැමෙන පුද්ගලයා වහා ගුණයෙන් වැඩෙයි. එසේ හෙයින් තමහට වඩා උතුම් කෙනෙකු ආශ්‍රය කරන්නේයයි" වදාළේය.

**27. ජිගුච්ඡිතබ්බ සූත්‍රය:-** 1. "මහණෙනි, මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ලෝකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත් කවර තුන්දෙනෙක්ද යත්. "මහණෙනි පිළිකුල් කටයුතුවූ සෙවනය නොකළ යුතුවූ භජනය නොකළ යුතුවූ ආශ්‍රය නොකළ යුතුවූ පුද්ගලයෙක් ඇත්තේය. මහණෙනි, මැදහත් විය යුතුවූ සෙවනය නොකළ යුතුවූ භජනය නොකළ යුතුවූ ආශ්‍රය නොකළ යුතුවූ පුද්ගලයෙක් ඇත්තේය. මහණෙනි, සෙවනය කළ යුතුවූ භජනය කළ යුතුවූ ආශ්‍රය කළ යුතුවූ පුද්ගලයෙක් ඇත්තේය.

2. "මහණෙනි, පිළිකුල් කටයුතුවූ සෙවනය නොකළ යුතුවූ ආශ්‍රය නොකළ යුතුවූ පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීලවූයේ, ලාමක ස්වභාව ඇත්තේ, අපිරිසිදු වූයේ සැකයෙන් සිහි කළ යුතු පැවතුම් ඇත්තේ, වැසුනු පව්කම් ඇත්තේ, අශ්‍රමණ වූයේ ශ්‍රමණයෙකැයි කියා සිටින්නේ, බ්‍රහ්මචාරී නොවූයේ 'බ්‍රහ්මචාරීයෙමියි' කියා සිටින්නේ, ඇතුලත කුණුවූයේ, අපිරිසිදු වූයේ, හටගත් කෙලෙස් කසල ඇත්තේවේද, මහණෙනි, මෙබඳු පුද්ගලතෙම පිළිකුල් කටයුතුය. සෙවනය නොකළ යුතුය. භජනය නොකළ යුතුය. ආශ්‍රය නොකළ යුතුය.

3. "ඊට හේතු කවරේද? කිසිසේත් මෙබඳු පුද්ගලයාගේ අදහස් අනුව යාමට නොපැමිණියත් පුරුෂ පුද්ගල තෙම පවිටු මිතුරන් ඇත්තෙකි. පවිටු යහළුවන් ඇත්තෙකි, පවිටන් කෙරෙහි නැමෙන්නෙකියි අයහපත්වූ අගුණ කථා ශබ්දයක් පැනනගී. මහණෙනි, යම්සේ වනාහි සර්පයෙක් අශුචියකට පැමිණියේ කිසිසේත් දෂ්ටනොකෙරේද, නැවත ඔහු ඇඟ තවරාද, මහණෙනි එපරිද්දෙන්ම වනාහි කිසිසේත් මෙබඳු පුද්ගලයාගේ අදහස් අනුව නොගියේද, වැලිදු පුරුෂ පුද්ගලතෙම පවිටු මිතුරන් ඇත්තෙකි. පවිටු යහළුවන් ඇත්තෙකි. පවිටන් කෙරෙහි නැමෙන්නෙකියි, අයහපත්වූ අගුණ කථා ශබ්දයක් පැනනගී. එසේ හෙයින් මෙබඳු පුද්ගලතෙම පිළිකුල් කටයුතුය, සෙවනය නොකටයුතුය, ආශ්‍රය නොකටයුතුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, මධ්‍යස්ථවිය යුතුවූ සෙවනය නොකළ යුතුවූ පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් දැඩි ආයාස බහුලකොට ඇත්තේ ක්‍රොධ කරණ ස්වභාව ඇත්තේවේද, ස්වල්පයක් නමුත් කියනලද්දේ එහි ලැගේද, කිපේද, ප්‍රකෘතිය අත්හරීද, තද බවට පැමිණේද, කොපයද ද්වෙෂයද නොසතුටු ආකාරයද, පහළ කෙරේද, මහණෙනි, යම්සේ පුරාණ වණයක් දඬුකඩකින් හෝ කැබිලිත්තකින් හෝ ස්පර්ශකරණ ලද්දේ බොහෝ සෙයින්ම ලේ සැරව වගුරුවාද, මහණෙනි, එසේම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දැඩි ආයාස බහුලකොට ඇත්තේ ක්‍රොධකරණ ස්වභාව ඇත්තේවේද, ස්වල්පයක් නමුත් කියනලද්දේ එහි ලැගේද, කිපේද, ප්‍රකෘතිය අත්හරීද තදබවට පැමිණේද, කොපයද ද්වෙෂයද නොසතුටු ආකාරයද, පහළකෙරේද, මහණෙනි යම්සේ තිඹිරි පෙනෙල්ලක් දඬුකඩකින් හෝ කැබලිත්තකින් හෝ ගටනලද්දේ බොහෝසෙයින්ම චිටිචිටි යන අනුකරණ ශබ්ද පවත්වාද, චිටි චිටි යන අනුකරණ ශබ්ද පවත්වාද මහණෙනි, එසේම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් දැඩි ආයාස බහුලකොට ඇත්තේ ක්‍රොධකරණ ස්වභාව ඇත්තේ වේද, ස්වල්පයක් නමුත් කියනලද්දේ එහි ලැගේද, කිපේද, ප්‍රකෘතිය අත්හරීද, තදබවට පැමිණේද, කොපයද, ද්වෙෂයද නොසතුටු ආකාරයද, පහළකෙරේද, මහණෙනි, යම්සේ අශුචි වලක් දඬුකඩකින් හෝ කැබිලිත්තකින් හෝ ගටනාලද්දේ බොහෝ සෙයින්ම දුගඳ වේද? මහණෙනි, එසේම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දැඩි ආයාස බහුලකොට ඇත්තේ ක්‍රොධකරණ ස්වභාව ඇත්තේවේද ස්වල්පයක් කියන ලද්දේද, එහි ලැගේද, කිපේද, ප්‍රකෘතිය අත්හරීද, තද බවට පැමිණේද, කොපයද, ද්වෙෂයද, නොසතුටු ආකාරයද, පහළකෙරේද, මහණෙනි, මෙබඳු පුද්ගල තෙම මධ්‍යස්ථ කළ යුතුය භජනය නොකළ යුතුය. ආශ්‍රය නොකළ යුතුය.

5. "ඊට හේතු කවරේද? 'මට ආක්‍රොශ කරන්නේ යයිද මට පිරිහෙළා බනින්නේ යයිද, මට අනර්ථයක් කරන්නේයයිද' කියායි. එසේ හෙයින් මෙබඳු පුද්ගලතෙම මධ්‍යස්ථ කළ යුතුය

සෙවනය නොකළ යුතුය, භජනය නොකළ යුතුය, ආශ්‍රය නොකළ යුතුය.

6. "මහණෙනි, සෙවනය කළයුතු භජනය කළයුතු ආශ්‍රය කළයුතු පුද්ගලයා කවරේද? මහණෙනි මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක්, සිල් ඇත්තේද, යහපත් ස්වභාව ඇත්තේද, මහණෙනි මෙබඳු පුද්ගලතෙම සෙවනය කළ යුතුය, භජනය කළයුතුය, ආශ්‍රය කළයුතුය. ඊට හෙතු කවරේද? මහණෙනි කිසිසේත් මෙබඳු පුද්ගලයාගේ ආදර්ශයට නොපැමිණේද, යලිදු ඔහු කරා යහපත්වූ ගුණ කථාවක් උස්ව නගී. කෙසේද? පුරුෂ තෙම යහපත් මිතුරන් ඇත්තෙක. යහපත් යහළුවන් ඇත්තෙක. යහපතුන් කෙරෙහි නැමීම ඇත්තෙක, කියායි. එසේ හෙයින් මෙබඳු පුද්ගලතෙම සෙවනය කළයුතුය, භජනය කළ යුතුය. ආශ්‍රය කළ යුතුය, මහණෙනි, මේ පුද්ගලතෙම ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්

> "තමන්ට වඩා ගුණයෙන් හීනවූ පුද්ගලයන් සෙවනය කරන්නාවූ පුරුෂතෙම පිරිහෙයි. තමන්ට සමාන ගුණ ඇති පුද්ගලයන් සෙවනය කරන්නාවූ පුද්ගලයා නොපිරිහේ. ශ්‍රෙෂ්ට පුද්ගලයන්ගේ ගතිගුණවලට නැමෙන පුද්ගලයා වහා ගුණයෙන් වැඩෙයි. එසේ හෙයින් තමහට වඩා උතුම් කෙනෙකු ආශ්‍රය කරන්නේ යයි" වදාළේය.

28. **ගූථභාණී සූත්‍රයඃ-** 1. මහණෙනි, මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්, කවර තුන්දෙනෙක්ද යත් ගඳගසන කථා කියන පුද්ගලයාය, සුවඳවත් කථා කියන පුද්ගලයාය, මීවැනි මිහිරි කථා කියන පුද්ගලයාය යන තුන්දෙනයි.

2. "මහණෙනි, ගඳගසන කථා කියන පුද්ගලයා කවරේද? මහණෙනි මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සභාවකට ගියේ හෝ පිරිස් මැදට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සේනා මධ්‍යයට ගියේ හෝ රජකුලයන් මැදට ගියේ හෝ ශාක්ෂි විචාරණලද්දේ 'එම්බල පුරුෂය, මෙහි එව, යමක් දන්නෙහි නම්, එය කියවයි අභිමුඛයට පමුණුවන ලද්දේ වේ. හෙතෙම

නොදන්නේ හෝ නොදැනම 'දනිමියි' කියයි. දන්නේ හෝ නොදනිමියි' කියයි. නොදක්නේ හෝ 'දකිමියි' කියයි. දන්නේ හෝ 'නොදනිමියි' කියයි මෙසේ තමා හේතුකොටගෙන හෝ අනුන් හේතුකොට ගෙන හෝ කිසියම් ආමිසයක් හෙතුකොට ගෙන හෝ දැන දැන බොරු, කියන්නේ වේද, මහණෙනි, මේ ගඳගසන කථා කියන පුද්ගලයායයි කියනුලැබේ.

3. "මහණෙනි, සුවඳ වත් කථා කියන පුද්ගලයා කවරේද? මහණෙනි මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් සභාවකට ගියේ හෝ පිරිස් මැදට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සේනා මධ්‍යයට ගියේ හෝ රජකුලයන් මැදට ගියේ හෝ ශාක්ෂි විචාරණලද්දේ 'එම්බල පුරුෂය, මෙහි එව යමක් දන්නෙහි නම්, එය කියවයි' අභිමුඛයට පමුණුවන ලද්දේවේ. හෙතෙම නොදන්නේ හෝ නොදැනම 'නොදනිමියි' කියයි. දන්නේ හෝ 'දනිමියි' කියයි. නොදක්නේ හෝ 'නොදකිමියි' කියයි. දක්නේ හෝ 'දකිමියි' කියයි. මෙසේ තමා හේතුකොට ගෙන හෝ අනුන් හෙතුකොට ගෙන හෝ කිසියම් ආමිසයක් හෙතුකොට ගෙන හෝ දැන දැන බොරු නොකියන්නේ වේද, 'මහණෙනි, මේ සුවඳවත් මල් වැනි සත්‍ය කථා කියන පුද්ගලයාය.

4. "මහණෙනි මීපැනි වැනි කථා කියන පුද්ගලයා කවරේද? මහණෙනි මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඵරුෂවචන අත්හැර ඵරුෂ වචනයෙන් දුරුවූයේවේද? නිර්දොෂවූ, කණට සැපවූ, ප්‍රේමය උපදවන්නාවූ හිතතුළට වැදගන්නාවූ ගුණයෙන් පිරුණාවූ, පුරවාසීන් අතර පැවැත්තාවූ බොහෝදෙනා කැමතිවන්නාවූ යම් වචනයක් වේද එබඳු වචන කියන්නේ වේද? මහණෙනි, මේ මීපැණි වැනි වචන කියන පුද්ගලයායි. මහණෙනි මේ පුද්ගලයෝ තුන්දෙන ලෝකයෙහි ඇත්තාහ. විද්‍යමානවෙත්."

**29. අන්ධෙක චක්ඛු සූත්‍රය:-** 1 "මහණෙනි, මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ලොකයෙහි ඇත. විද්‍යමානවෙත්. කවර තුන්දෙනෙක්ද යත්, අන්ධ පුද්ගලයාය, එක ඇසක් ඇති පුද්ගලයාය, දෑසම ඇති පුද්ගලයාය යන තුන්දෙනයි.

2. "මහණෙනි, අන්ධ පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට යම්බඳුවූ ඇසකින් නොලද්දාවූ හෝ භොගය ලබන්නේද ලබන ලද හෝ භොගය වැඩිදියුණු කරන්නේද, එබඳුවූ ඇසක් නොවේද, යම්බඳුවූ ඇසකින් කුශලාකුශල ධර්මයන් දන්නේද දොස් නිදොස් ධර්මයන් දන්නේද, උස් පහත් ධර්ම දන්නේද කුශලාකුශල ධර්මයන්ට සමාන කොටස් ඇති ධර්මයන් දන්නේද, එබඳුවූ ඇසක්ද ඕහට නොවේද, මහණෙනි, මේ අන්ධ පුද්ගලයායයි කියනු ලැබේ.

3. "මහණෙනි, එක් ඇසක් ඇති පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට යම්බඳුවූ ඇසකින් නොලද්දාවූ භොගය ලබන්නේද ලබන ලද හෝ භොගය වැඩිදියුණු කරන්නේද, එබඳු ඇසක් ඇත්තේය. යම්බඳුවූ ඇසකින් කුශලා කුශල ධර්මයන් දන්නේද, වරද නිවරද ධර්මයන් දන්නේද, උස් පහත් ධර්මයන් දන්නේද කුශලා කුශල ධර්මයන්ට සමාන කොටස් ඇති ධර්මයන් දන්නේද, ඔහුට එබඳු ඇස නැත්තේද, මහණෙනි, මේ එක් ඇසක් ඇති පුද්ගලයායයි කියනු ලැබේ.

3. "මහණෙනි, ඇස් දෙකම ඇති පුද්ගලයා කවරේද? මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට යම්බඳුවූ ඇසකින් නොලද් වස්තු ලබන්නේද ලත් වස්තු වැඩිදියුණු කරන්නේද, එබඳුවූ ඇසද ඇත්තේ වේද, යම්බඳුවූ ඇසකින් කුශලා කුශල ධර්මයන් දන්නේද, වරද නිවරද ධර්මයන් දන්නේද, උස් පහත් ධර්මයන් දන්නේද කුශලා කුශල ධර්මයන්ට සමාන කොටස් ඇති ධර්මයන් දන්නේද, එබඳු ඇසද ඇත්තේ වේද, මහණෙනි, මේ ඇස් දෙකම ඇති පුද්ගලයාය. මහණෙනි, මේ පුද්ගලයන් තුන්දෙන ලොකයෙහි ඇත්තාහ විද්‍යමාන වෙත්."

1. "එබඳුවූ (එතරම්) වස්තුවක් නැත්තේද පින්ද නොකෙරේද, නැසුණාවූ ඇස් ඇති අන්ධයාහට මෙලොව පරලොව දෙක්හිම පරාජය ඇතිවෙයි.

2. "නැවත එක් ඇසක් ඇති පුද්ගලයා කියන ලද්දේ වෙයි. (හෙතෙම) ධර්මයෙන්ද අධර්මයෙන්ද මිශ්‍රව වස්තුව සපයයි.

3. (කෙසේද) කම්සැප විඳින මිනිස්තෙමේ සොරකමින්ද කපටිකමින්ද බොරු කීමෙන්ද සොරකමින්ද යන දෙකින් වස්තුව රැස්කිරීමට දක්ෂයෙක්වේ. ඒ එකැස් ඇත්තාවූ පුරුෂතෙම මෙයින් නරකයට ගොස් වැනසේ.

4. ඇස් දෙකම ඇති පුද්ගලයා ශ්‍රෙෂ්ඨවූ පුරුෂ පුද්ගලයායි කියනු ලැබේද, උතුම් අදහස් ඇත්තාවූ සැක නොකටයුතු සිත් ඇත්තාවූ ඒ මනුෂ්‍යතෙම වීර්‍ය්‍යයෙන් ධර්මයෙන් ලැබූ ධනය දෙයි. යම් තැනෙකට පැමිණ ශෝක නොකෙරේ, නම් ඒ උතුම් ස්ථානයට පැමිණ ශොක නොකෙරෙයි.

5. අන්ධයාද එකැස් ඇත්තාද දුරින්දුරු කරන්නේය. ශ්‍රෙෂ්ඨපුරුෂ පුද්ගලවූ ඇස් දෙකම ඇති පුද්ගලයා සේවනය කරන්නේයයි වදාළේය.

**30. අවකුජ්ජපඤ්ඤ සූත්‍රය**:- 1. "මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්. කවර තුන්දෙනෙක්ද යත්, යටට නැමුණු නුවණ ඇති පුද්ගලයාය, ඔඩොක්කුවට සමාන නුවණ ඇති පුද්ගලයාය, පැතුරුනාවූ නුවණ ඇති පුද්ගලයාය යන තුන්දෙනයි.

2. "මහණෙනි, යටට නැමුණු ප්‍රඥා ඇති පුද්ගලයා කවරේද? මහණෙනි මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නිතර භික්ෂූන්ගේ සමීපයෙහි ධර්මශ්‍රවණය පිණිස ආරාමයට යන්නේ වෙයි, ඔහුට භික්ෂූහු මුල යහපත්වූද, මැද යහපත්වූද අවසන යහපත්වූද ධර්මය අර්ථ සහිතවූ අක්ෂර ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් සම්පූර්ණවූ බ්‍රහ්මචර්‍ය්‍යාව දේශනා කෙරෙද්ද, හෙතෙම ඒ ආසනයෙහි හුන්නේ ඒ කථාවෙහි මුල මෙනෙහි නොකෙරේද, මැද මෙනෙහි නොකෙරේද, අවසානය මෙනෙහි නොකෙරේද, ධර්මය අර්ථ සහිතවූ අක්ෂර ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් සම්පූර්ණවූ බ්‍රහ්මචර්‍ය්‍යාව මෙනෙහි නොකෙරේද, අස්නෙන් නැගිට සිටියේද,

3. "මහණෙනි, යම්සේ වනාහි යටිකුරුකොට තැබූ කලයක් වේද එහි වත්කරන ලද්දාවූ ජලය ඉවත වැටෙයිද, රඳා නොසිටීද

මහණෙනි, එසේම මේ ලොකයෙහි ඇතැම් පුදගලයෙක් (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය ‘නිතර’ යන වචනයේ සිට යොදාගත යුතුයි.) මහණෙනි, මේ යටිකුරුවූ නුවණ ඇති පුද්ගලයායයි කියනු ලැබේ

4. “මහණෙනි, ඔඩොක්කුවට බඳු නුවණ ඇති පුද්ගලයා කවරේද, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය ‘නිතර’ යන වචනයේ සිට යොදාගතයුතුයි.) හෙතෙම ඒ අස්නෙහි හුන්නේ ඒ කථාවෙහි මුල මැද අග මෙනෙහි කරයි. ඒ අස්නෙන් නැගිට්ටේ මෙනෙහි නොකරයි

5. “මහණෙනි, යම්සේ පුරුෂයාගේ ඔඩොක්කුවෙහි තල සහල්, අක්සුණු, ඩෙබර, යන නොයෙක් කැවිලි දාගන්නාහු වෙත්ද, හෙතෙම ඒ ආසනයෙන් සිහිමුළාවෙන් නැගිට්ටේ සිහි මුළාවෙන් ඒ ඛාද්‍යාදිය විසිරෙන්නේය. මහණෙනි, එසේම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක්- (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය ‘නිතර’ යන වචනයේ සිට යොදාගත යුතුයි.) මහණෙනි, මේ ඔඩොක්කුවට බඳු ප්‍රඥා ඇත්තාවූ පුද්ගලයායි.

6. “මහණෙනි, පැතුරුණාවූ ප්‍රඥා ඇති පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක්- (මෙහි මේ සූත්‍රයේ 2 වෙනි ඡෙදය ‘නිතර’ යන වචනයේ සිට යොදාගත යුතුයි)

7. “මහණෙනි, යම්සේ කලයක් මුව උඩුකුරුකොට තබනලද්දේ, එහි වත්කරණ ලද ජලය රැඳීසිටීද නොවැගිරේද, මහණෙනි, එසේම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නිතර භික්ෂූන්ගේ සමීපයෙහි ධර්මශ්‍රවණය පිණිස ආරාමයට යන්නේ වෙයි. ඔහුට භික්ෂූහු මුල යහපත්වූද, මැද යහපත්වූද අවසානය යහපත්වූද ධර්මය අර්ථ සහිතවූ අක්ෂර ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් සම්පූර්ණවූ බ්‍රහ්මචර්‍ය්‍යාව දේශනා කෙරෙද්ද හෙතෙම ඒ ආසනයෙහි හුන්නේ ඒ කථාවෙහි මුල මෙනෙහි කෙරේද, මැද මෙනෙහි කෙරේද, අවසානය මෙනෙහි කෙරේද ධර්මය අර්ථ සහිතවූ අක්ෂර ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් සම්පූර්ණවූ බ්‍රහ්මචර්‍ය්‍යාව මෙනෙහි කෙරේද, මහණෙනි, මේ පැතුරුණාවූ

ප්‍රඥා ඇති පුද්ගලයායි කියනු ලැබේ. මහණෙනි, මේ පුද්ගලයන් තුන්දෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්.

1. "නුවණ නැත්තාවූ විචක්ෂණ නොවූ යටිකුරු කළ ප්‍රඥා ඇත්තාවූ පුරුෂතෙම ඉදින් නිතරද භික්ෂූන් වෙත යන්නේ වේද,

2. "එබඳුවූ පුරුෂතෙම ධර්ම කථාවෙහි මුලද, මැදද, අගද ඉගෙනීමට නොහැකිවේ. ඔහුට නුවණ නැත.

3. "ඇකයට (ඔඩොක්කුවට) සමාන ප්‍රඥාව ඇත්තාවූ පුරුෂතෙම මොහුට වඩා (යටිකුරු ප්‍රඥාව ඇත්තහුට වඩා) උතුම්යයි කියනු ලැබේ. ඉදින් භික්ෂූන් වෙත නිරතුරුද යන්නේ වේද,

4. "එබඳුවූ පුරුෂතෙම ධර්ම කථාවෙහි මුලද මැදද අගද එම අස්නෙහි හුන්නේ ඉගෙන (එම අස්නෙන්) නැඟී සිටියේ නොදනී. ඔහු විසින් ඉගෙණ ගන්නා ලද්දද වැනසේ.

5. "පැතුරුණු ප්‍රඥාව ඇති පුරුෂතෙම මොවුන් දෙදෙනාට වඩා ශ්‍රෙෂ්ඨයයි කියනු ලැබේ. ඉදින් භික්ෂූන් වෙත යන්නේ වේද,

6 7. "එබඳුවූ පුරුෂතෙම ඒ ආසනයෙහි සිට ඒ බණෙහි මුලද මැදද අගද උගෙණ දරයි. උතුම් අදහස් ඇත්තාවූ සැක නොකළයුතු සිත් ඇත්තාවූ මනුෂ්‍යතෙම ධර්මානුධර්ම ප්‍රතිපන්නවූයේ, දුක් කෙළවර කරන්නෙක් වන්නේය."

(තුන්වැනි පුද්ගල වර්ගයයි)

---

## 4. දේවදූත වර්ගය

**31. සබ්‍රහ්මක කුල සූත්‍රයඃ-** 1. "මහණෙනි, ස්වකීය ගෘහයෙහි යම් දූදරුවන් විසින් මවුපියෝ පිදීම කරන ලද්දාහු වෙද්ද ඒ කුලයෝ බ්‍රහ්මයන් සහිත වෙත්, ස්වකීය ගෘහයෙහි යම් දූදරුවන් විසින් මවුපියෝ පුදනලද්දාහු වෙත්ද, ඒ කුලයෝ පූර්වාචාර්‍ය්‍යයන්

සහිත වෙත්. ස්වකීය ගෘහයෙහි දූ දරුවන් මවුපියෝ පුදනලද්දාහු වෙත්ද ඒ කුලයෝ ආහාර පානාදියෙන් පිදියයුත්තන් සහිත වෙත්. මහණෙනි 'බ්‍රහ්ම' යන මෙය මවුපියන්ට නමකි. මහණෙනි, පුබ්බාචරිය' යන මෙය මවුපියන්ට නමකි 'ආහුනෙය්‍ය' යන මෙය මවුපියන්ට නමකි.

2. "ඊට හේතු කවරේද? මවුපියෝ පුත්‍රයන්ට බොහෝ උපකාර ඇත්තෝය. ජීවිතය ආරක්ෂා කරන්නෝද වෙති. පොෂ්‍ය කරන්නෝද වෙති. මේ ලොකය පෙන්වන්නෝද වෙති.

1. "මවුපියෝ පුත්‍රයන්ට බ්‍රහ්මයයිද පූර්වාචාය‍ර්යයයිද ආහුනෙය්‍ය යයිද කියනු ලැබෙත්. පුත්‍ර ප්‍රජාවට අනුකම්පා කරන්නෝය. එහෙයින් වනාහි පණ්ඩිත තෙමේ ඒ මවුපියන් නමස්කාර කරන්නේය.

2. "තවද ආහාරයෙන්ද පානයෙන්ද වස්ත්‍රයෙන්ද සයනයෙන්ද ඇඟ ඉලීමෙන්ද නෑවීමෙන්ද පා සේදීමෙන්ද සත්කාර කරන්නේය.

3. "මව්පියන් කෙරෙහි කරණ ලද ඒ උපස්ථාන හේතුවෙන් පණ්ඩිතයෝ මෙලෙව්හිද, ඔහුට ප්‍රශංසාකරත්. පරලෙව්හි ස්වර්ගයෙහිද සතුටුවේයයි" වදාළසේක

**32. ආනන්ද සමාධි පටිලාභ සූත්‍රය:-** 1. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණිසේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේට "ස්වාමීනි, යම්සේ විඤ්ඤාණ සහිතවූ මේ ශරීරයෙහි මමය යන දෘෂ්ටියද, මගේ යන තෘෂ්ණාවද, මාන නවයද, අනුශය සතද, යන මොහු නොවන්නාහුද පිටත්හිද රූපාදී සියලු ආරම්මණයන්හි මමය යන දෘෂ්ටියද, මගේය යන තෘෂ්ණාවද මාන නවයද, අනුශය සතද, යන මොහු නොවන්නාහුද, යම්බඳුවූ අර්හත්ඵල සමාධියකට අර්හත්ඵල ප්‍රඥාවකට පැමිණ වාසය කරන්නාහට මමය යන දෘෂ්ටිය මගේ යන තෘෂ්ණාව මානානුසය යන මොහු නොවෙද්ද එබඳු අර්හත්ඵල සමාධියකට හා අර්හත්ඵල

ප්‍රඥාවකට පැමිණ වාසය කරන්නේ නම් එබඳු සමාධියක් ලැබීම භික්ෂූහට වන්නේ දැයි?" (ඇසීය).

2. "ආනන්දය, යම්සේ විඥ්ඥාණ සහිතවූ මේ ශරීරයෙහි මමය යන දෘෂ්ටියද, මගේ යන තෘෂ්ණාවද, මාන නවයද, අනුශය සතද, යන මොහු නොවන්නාහුද, පිටත්හිද රූපාදී සියලු ආරම්මණයන්හි මමය යන දෘෂ්ටියද, මගේය යන තෘෂ්ණාවද, මාන නවයද, අනුශය සතද, යන මොහු නොවන්නාහුය. යම්බඳුවූ අර්හත්ඵල සමාධියකට අර්හත්ඵල ප්‍රඥාවකට පැමිණ වාසය කරන්නාහට මමය යන දෘෂ්ටිය මගේ යන තෘෂ්ණාව මානානුසය යන මොහු නොවෙත් එබඳු අර්හත්ඵල සමාධියකට හා අර්හත්ඵල ප්‍රඥාවකට පැමිණ වාසය කරන්නේ නම් එබඳු සමාධියක් ලැබීම භික්ෂූහට වන්නේයයි" වදාළේය.

3. "ස්වාමීනි, කෙසේනම් විඥ්ඥාණ සහිතවූ මේ ශරීරයෙහි මමය යන දෘෂ්ටියද, මගේය යන තෘෂ්ණාවද, මාන නවයද, අනුශය සතද, යම්සේ නොවෙත්ද, පිටත සියලු රූපාදී ආරම්මණයන්හි මමය යන දෘෂ්ටියද, මගේය යන තෘෂ්ණාවද, මාන නවයද, අනුශය සතද, යම්සේ නොවෙත්ද, යම් අර්හත් ඵල සමාධියකටද, අර්හත් ඵල ප්‍රඥාවකටද, පැමිණ වාසයකරන්නහුට මමය යන දෘෂ්ටිය මගේය යන තෘෂ්ණාව මාන නවය, අනුශය සත, නොවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියටද අර්හත් ඵල ප්‍රඥාවටද පැමිණ වාසය කරන්නේ නම් එබඳු සමාධියක් ලැබීම කෙසේ වන්නේදැයි" ඇසීය.

4. "ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂූහට මෙබඳු සිතක් වෙයි. (කෙසේද) මෙය ශාන්තය, මෙය ප්‍රණීතය. එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීමෙක් වේද, කාමාදී සියලු උපධින්ගේ දුරලීමක් වේද, තෘෂ්ණාහුගේ ක්ෂයවීමක් වේද, නොඇලීමක් වේද, දුක්ඛ නිරොධයක් වේද, නිර්වාණයක් වේද, (එයයි).

"ආනන්දය, යම්සේ මේ විඥ්ඥාණ සහිතවූ මේ ශරීරයෙහි මමය යන දෘෂ්ටියද, මගේය යන තෘෂ්ණාවද, මාන නවයද, අනුශය සතද, යම්සේ නොවේද්ද? පිටත සියලු රූපාදී ආරම්මණයන්හි මමය යන දෘෂ්ටියද, මගේය යන තෘෂ්ණාවද,

මාන නවයද, අනුශය සතද, යම්සේ නොවෙත්ද, යම් අර්හත් ඵල සමාධියකටද, අර්හත් ඵල ප්‍රඥාවකටද, පැමිණ වාසය කරන්නහුට මමය යන දෘෂ්ටිය, මගේය යන තෘෂ්ණාව මාන නවය, අනුශය සත, නොවෙත්ද, ඒ අර්හත් ඵල සමාධියටද අර්හත් ඵල ප්‍රඥාවටද පැමිණ වාසය කරන්නේ නම් එබඳු සමාධි ලාභයක් වන්නේය. ආනන්දය මෙයද වනාහි මේ සඳහා පාරායන වර්ගයෙහි පුණ්ණක නම් ප්‍රශ්නයෙහි ප්‍රකාශ කරණ ලද්දේය.”

5. “යමෙකුට ලෝකයෙහි තමාගේද අනුන්ගේද ආත්මභාවයන් නුවණින් දැන ලෝකයෙහි කිසිවක්හි, කම්පාවීමක් නැත්තේද ශාන්තවූ කායදුශ්චරිතාදී දුම් රහිතවූ රාගාදී දුක් නැත්තාවූ තෘෂ්ණා රහිතවූ ඒ රහත් පුද්ගල තෙම ජාතිය හා ජරාව එතර කෙළේයයි කියමියි වදාළේය.”

33. **සංඛිත්ත විත්ථාර දෙශනා සූත්‍රය:-** 1. “ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ ශාරිපුත්‍රයෙනි, මම වනාහි සංක්ෂෙපයෙන්ද ධර්මය දෙශනා කරන්නෙමි. ශාරිපුත්‍රයෙනි, මම විස්තර වශයෙන්ද ධර්මය දේශනා කරන්නෙමි. ශාරිපුත්‍රය, මම සංක්ෂෙප වශයෙන්ද විස්තර වශයෙන්ද ධර්මය දේශනා කරන්නෙමි. අවබෝධ කරන්නෝ දුර්ලභයයි” වදාළේය.

2. “යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ සංක්ෂෙපයෙන්ද ධර්මය දේශනා කරන්නේද විස්තර වශයෙන්ද ධර්මය දේශනා කරන්නේද, සංක්ෂෙප වශයෙන්ද විස්තර වශයෙන්ද ධර්මය දේශනා කරන්නේද, භාග්‍යවතුන්වහන්ස, මීට කල්වන්නේය. සුගතයන් වහන්ස මීට කල්වන්නේය. ධර්මය අවබොධ කරන්නාහු වන්නාහුයයි” (සැළකෙළේය.)

3. “ශාරිපුත්‍රය, එසේනම් මෙහි මෙසේ හික්මිය යුතුයි. (කෙසේද) විඥ්ඥාණය සහිතවූ මේ ශරීරයෙහි මමය යන දෘෂ්ටියද මගේය යන තණ්හාවද මාන අනුශයද යන මොහු

නොවන්නාහුද, බාහිරවූ සියලු නිමිතිවල මමය යන දෘෂ්ටියද මගේය යන තණ්හාවද මාන අනුශයද යන මොහු නොවෙද්ද ඒ අර්හත්ඵල සමාධියට ඒ අර්හත්ඵල ප්‍රඥාවට පැමිණ වාසය කරන්නෙමුයි" (කියායි.)

4. 'ශාරිපුත්‍රය, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයයි (වදාළේය) ශාරිපුත්‍රය යම්තැනක පටන් මහණහුගේ මමය යන දෘෂ්ටියද මගේය යන තණ්හාවද මාන අනුශයද යන මොහු නොවෙද්ද ඒ අර්හත්ඵල සමාධියට ඒ අර්හත්ඵල ප්‍රඥාවට පැමිණ වාසය කෙරෙයිද, ශාරිපුත්‍රය, මේ මහණතෙම තෘෂ්ණාව සින්දේය. සංයෝජන උපුටා දැම්මේය, මානය ප්‍රහාණය කිරීම් වශයෙන් අවබොධකොට වට්ට දුක්ඛයාගේ දුක කෙළවර කෙළේයයි" කියනු ලැබේ.

5. "සාරිපුත්ත, මෙය වනාහි පාරායණයෙහි උදය ප්‍රශ්නයෙහි මේ සඳහා කියන ලදී.

> (1) "කාම සංඥාවගේද, දොමනස්සයාගේද (යන) දෙදෙනාගේ ප්‍රහාණයවූද, ථිනමිද්ධයාගේ දුරුකිරීමවූද, කුක්කුච්චයාගේ වැළැක්මවූද උපෙක්ෂාවෙන් හා සතියෙන් පිරිසිදුවූ සම්‍යක් කල්පනාව ඉදිරියෙහි යන්නාවූ අවිද්‍යාවගේ බිඳීමවූ අර්හත්ඵලය ප්‍රකාශ කරමි."

34. **කම්මනිදාන සූත්‍රයඃ-** 1. "මහණෙනි, වට්ටගාමී කර්මයන්ගේ ඇතිවීම පිණිස මේ හෙතු තුනක් වෙත්. කවර තුනක්ද යත්? කර්මයන්ගේ ඇතිවීම පිණිස ලොභය හෙතු වෙයි. කර්මයන්ගේ ඇතිවීම පිණිස ද්වෙෂය හෙතුවෙයි, කර්මයන්ගේ ඇතිවීම පිණිස මොහය හෙතුවෙයි.

2. "මහණෙනි, ලොභයෙන් කරණ ලද්දාවූ ලොභයෙන් හටගත්තාවූ, ලොභය කරුණු කොට ඇත්තාවූ, ලොභය ප්‍රත්‍යකොට ඇත්තාවූ යම් කර්මයක් වේද, යම්තැනෙක්හි එය කළහුගේ ආත්මභාවය උපදීද, එහි කර්මය විපාක දෙයි, යම්තැනෙක්හි ඒ කර්මය විපාක දෙයිද එහි ඒ කර්මයාගේ විපාකය මේ ආත්මයෙහි හෝ අනතුරු ආත්මභාවයෙහි හෝ එයින් අනික් අනික් භවයක හෝ විපාක දෙයි.

3. "මහණෙනි, ද්වෙෂයෙන් කරණ ලද්දාවූ ද්වෙෂයෙන් හටගත්තාවූ, ද්වෙෂය කරුණු කොට ඇත්තාවූ, ද්වෙෂය ප්‍රත්‍යය කොට ඇත්තාවූ යම් කර්මයක් වේද, යම්තැනෙක්හි එය කළහුගේ ආත්මභාවය උපදීද, එහි ඒ කර්මය විපාක දෙයි. යම් තැනෙක්හි ඒ කර්මය විපාක දෙයිද, එහි ඒ කර්මයාගේ විපාකය මේ ආත්මයෙහි හෝ අනතුරු ආත්මබැව්හි හෝ එයින් අනික් අනික් භවයක හෝ විපාක දෙයි.

4. "මහණෙනි, මොහයෙන් කළ මොහයෙන් හටගත් මොහය කරුණු කොට ඇති මොහය ප්‍රත්‍යයකොට ඇති යම් කර්මයක් වේද, යම්තැනෙක්හි එය කළහුගේ ආත්මභාවය උපදීද එහි කර්මය විපාක දෙයි, යම්තැනෙක්හි ඒ කර්මය විපාක දෙයිද, එහි ඒ කර්මයාගේ විපාකය මේ ආත්මයෙහි හෝ අනතුරු ආත්මභාවයෙහි හෝ එයින් අනික් අනික් භවයක හෝ විපාක දෙයි.

5. "මහණෙනි, යම්සේ නොකැඩුණු කුණු නොවූ අව් සුළඟින් නොනැසුනාවූ නිස්සාර නොවූ බීජයෝ යම්සේ යහපත් කුඹුරක මනාකොට සීසෑම් ආදිය කරණ ලද බිමක ඉසින ලද්දාහු සැපසේ හෝනාහු වෙත්ද, වර්ෂාවද මනාකොට වර්ෂා ධාරාව නැවත නැවත හෙලන්නේද, මහණෙනි, එසේ ඇති කල්හි ඒ බීජයෝ උඩට නැගීමෙන් වෘද්ධියටද මුල් ඇදීමෙන් විරූඪභාවයටද හාත්පස පැතිරීමෙන් විපුලත්වයටද පැමිණෙන්නාහුය."

6. "මහණෙනි, එසේම ලොභයෙන් හටගත් ලොභය නිදානකොට ඇති ලොභය හේතුකොට ඇති ලොභයෙන් කළ යම් කර්මයක් වේද, යම්තැනෙක්හි ඔහුගේ ආත්මභාවය උපදීද ඒ ආත්මභාවයෙහි ඒ ස්කන්ධ පඤ්චකයෙහි විපාකදේ, යම්තැනෙක්හි ඒ කර්මය විපාකදේද, එහි ඒ කර්මයාගේ විපාක විඳී. මේ ආත්මයෙහි හෝ අනතුරු ආත්මභාවයෙහි හෝ අනික් අනික් ආත්මභාවයක හෝ විපාක දෙයි."

7. "මහණෙනි, එසේම ද්වෙෂයෙන් හටගත් ද්වෙෂය නිදානකොට ඇති, ද්වෙෂය හේතුකොට ඇති, ද්වෙෂයෙන් කළ

යම් කර්මයක් වේද, යම්තැනෙක්හි ඔහුගේ ආත්මභාවය උපදීද ඒ ආත්මභාවයෙහි ඒ ස්කන්ධ පඤ්චකයෙහි විපාකදේ, යම්තැනෙක්හි ඒ කර්මය විපාක දේද, එහි ඒ කර්මයාගේ විපාක විඳී. මේ ආත්මයෙහි හෝ අනතුරු ආත්මභාවයෙහි හෝ අනික් අනික් ආත්මභාවයක හෝ විපාක දෙයි.”

“මහණෙනි, එසේම මොහයෙන් හටගත් මොහය නිදානකොට ඇති, මොහය හේතුකොට ඇති, මොහයෙන් කළ යම් කර්මයක් වේද, යම් තැනෙක්හි ඔහුගේ ආත්මභාවය උපදීද, ඒ ආත්මභාවයෙහි ඒ ස්කන්ධ පඤ්චකයෙහි විපාකදේ. යම්තැනෙක්හි ඒ කර්මය විපාකදේද, එහි ඒ කර්මයාගේ විපාක විඳී. මේ ආත්මයෙහි හෝ අනතුරු ආත්මභාවයෙහි හෝ අනික් අනික් ආත්මභාවයක හෝ විපාක දෙයි.” මහණෙනි, කර්මයන්ගේ හටගැනීමට මේ හෙතු තුනයි.

8. “මහණෙනි, නිර්වාණයට යන සුළු කර්මයන්ගේ හට ගැනීම පිණිස මේ හේතු තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක්ද යත්, අලොභය තෙම නිර්වාණගාමී කර්මයන් රැස් කිරීමට කරුණුවේ. අද්වෙෂය නිර්වාණගාමී කර්මයන් රැස් කිරීමට කරුණුවේ. අමොහය නිර්වාණගාමී කර්මයන් රැස් කිරීමට කරුණුවේ.

9. “මහණෙනි, අලොභයෙන් කරණ ලද්දාවූ අලොභයෙන් හටගත්තාවූ අලොභය නිදානකොට ඇත්තාවූ, අලොභය හේතුකොට ඇත්තාවූ යම් කර්මයක් වේද, ලොභය පහව ගිය කල්හි මෙසේ ඒ කර්මය ප්‍රහීන වෙයි. උදුරාහරින ලද මුල් ඇත්තේවේ. මස්තකය කපන ලද තල්ගසක් මෙන් කරණ ලද්දේ වේ. නැවත නොවීම කරණ ලද්දේවේ. මත්තෙහි නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වේ.

10. “මහණෙනි, අද්වෙෂයෙන් කරණ ලද්දාවූ අද්වෙෂයෙන් හටගත්තාවූ, අද්වෙෂය නිදානකොට ඇත්තාවූ, අද්වෙෂය හේතුකොට ඇත්තාවූ යම් කර්මයක් වේද, ද්වෙෂය පහව ගිය කල්හි මෙසේ ඒ කර්මය ප්‍රහීනවෙයි. උදුරා හරින ලද මුල් ඇත්තේ වේ. මස්තකය කපන ලද තල්ගසක් මෙන් කරණ

ලද්දේ වේ. නැවත නොවීම කරණ ලද්දේ වේ. මත්තෙහි නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වේ.

11. "මහණෙනි, අමොහයෙන් කරණ ලද්දාවූ අමොහයෙන් හටගත්තාවූ අමොහය නිදානකොට ඇත්තාවූ, අමොහය හේතුකොට ඇත්තාවූ යම් කර්මයක් වේද, මොහය පහවගිය කල්හි මෙසේ ඒ කර්මය ප්‍රහීනවෙයි. උදුරා හරින ලද මුල් ඇත්තේ වේ. මස්තකය කපන ලද තල්ගසක් මෙන් කරණ ලද්දේ වේ. නැවත නොවීම කරණ ලද්දේ වේ. මත්තෙහි නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වේ.

"මහණෙනි, අද්වෙෂයෙන් කරණ ලද්දාවූ අද්වෙෂයෙන් හටගත් අද්වෙෂය කරුණු කොට ඇති අද්වෙෂය ප්‍රත්‍යයකොට ඇත්තාවූ යම් කර්මයක් වේද, ද්වෙෂය පහවූ කල්හි මෙසේ ඒ කර්මය ප්‍රහීනවේ. උදුරා හරින ලද මුල් ඇත්තේ වේ. මස්තකය කපන ලද තල්ගසක් මෙන් කරණ ලද්දේය. නැවත නොවීම කරණ ලද්දේ වේ.

"මහණෙනි, අමොහයෙන් කරණ ලද්දාවූ අමොහයෙන් හටගත් අමොහය කරුණු කොට ඇති අමොහය ප්‍රත්‍යය කොට ඇත්තාවූ යම් කර්මයක් වේද, මෝහය පහවූ කල්හි මෙසේ ඒ කර්මය ප්‍රහීනවේ. උදුරා හරින ලද මුල් ඇත්තේ වේ. මස්තකය කපන ලද තල්ගසක් මෙන් කරණ ලද්දේය. නැවත නොවීම කරණ ලද්දේවේ.

12. "මහණෙනි, යම්සේ කඩ නොවූ, කුණු නොවූ, අව් සුළඟින් නොනැසුනාවූ, ගන්නාලද හර ඇත්තාවූ, මොනවට තැන්පත් කළ බීජයෝ වෙද්ද ඒ බීජයන් පුරුෂයෙක් තෙම ගින්නෙන් දවන්නේද, ගින්නෙන් දවා හළු කරන්නේද හළු කොට මහා වාතයෙහි හෝ පිඹ හරින්නේද සීඝ්‍රවූ සැඩ පහර ඇති ගඟක හෝ පාකොට හරින්නේද, මහණෙනි, එසේ ඇති කල්හි ඒ බීජයෝ උපුටාහරිනලද මුල් ඇත්තාහු අග සිඳිනලද තල්ගසක් මෙන් කරණ ලද්දාහු නැවත ඇති නොවීම කරණ ලද්දාහු, මත්තෙහි නොඉපදීම ස්වභාවකොට ඇත්තාහු (වෙද්ද)

13. (මේ ඡෙදය මේ සූත්‍රයේ 9 ඡෙදය මෙනි)

**14-15.** (මේ ඡේද සාදාගැනීමට මේ සූත්‍රයේ 9 ඡේදයට 'අලෝභ' වෙනුවට 'අදෝෂ' 'අමෝහ' යන වචන යොදාගත යුතුයි.)

මහණෙනි, මෙ තුන කර්මයන්ගේ ඉපදීමට හේතුය.

(1) 'අඥාන පුද්ගලතෙම ලොභයෙන් උපදනාවූද ද්වෙෂයෙන් උපදනාවූද, මොහයෙන් උපදනාවූද, (කර්ම කෙරේද?) ඔහු විසින් කරණ ලද්දාවූ ස්වල්පවූ හෝ බොහෝ වූ හෝ යම් කර්මයක් වේද ඒ කර්මය ස්වකීය ආත්මභාවයෙහිම ඔහු විසින්ම වින්ද යුතුයි. එය විඳීමට අනික් වස්තුවක් නැත්තේය.

(2) "එහෙයින් ප්‍රඥාවත් පුද්ගලතෙම ලොභයෙන් උපදින්නාවූද, ද්වෙෂයෙන් උපදින්නාවූද, මොහයෙන් උපදින්නාවූද (කර්ම නොකරන්නේය) අර්හත් මාර්ග විද්‍යාව උපදවන්නාවූ ඒ මහණතෙම සියලු දුර්ගතීන් හරින්නේයයි (වදාළේය.)"

**35. හත්ථකාලවක සූත්‍රය:- 1.** එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අලවි රටෙහි ගෙරින් යන මාර්ගයෙහි ඇට්ටේරිය වනයෙහි කොළ ඇතිරියක වැඩවාසය කරණසේක. එකල්හි වනාහි හත්ථක නම් ආලවකතෙම සක්මන් කරනුයේ ඇවිදිනුයේ ගෙරින් යන මඟෙහි ඇට්ටේරිය වනයෙහි කොළ ඇතිරියෙහි වැඩහුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ හත්ථක නම් ආලවකතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය.

2. "ස්වාමීනි, කිමෙක්ද භාග්‍යවතුන් වහන්සේ සැපසේ සයනය කෙළේදැයි" ඇසීය.

"කුමාරය, එසේය. සැපසේ සයනය කෙළෙමි. ලෝකයෙහි යමෙක් වනාහි සැපසේ සයනය කෙරේනම් මම ඔවුනතුරෙන් එක්තරා කෙනෙක් වෙමියි" (වදාළේය)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "ස්වාමීනි හෙමන්ත ඍතුවෙහි රාත්‍රිය ශීතලය. නවන් මැදින් දෙමස අතරෙහිවූ අට දවස පිණිවැටෙන කාලයයි. ගොනුන්ගේ කුරවලින් කැඩීගියාවූ භූමිය රළුය, කොළ ඇතිරිය තුනීය. ගසේ කොළ අඩුය. කශාවස්ත්‍රද ශිතලය. සතර දිගින් ශීත සුළඟද හමයි. එසේ නමුත් භාග්‍යවතුන් වහන්සේ මෙසේ කියයි. (කෙසේද?) කුමාරය, එසේය. සැපසේ සයනය කෙළෙමි. ලෝකයෙහි යමෙක් වනාහි සැපසේ සයනය කෙරේද, මම ඔවුන් අතුරෙන් එක්තරාකෙනෙක්වෙමි" කියයි

4. "කුමාරය, එසේ වීනම් තගෙන්ම අසමි. තොපට යම්සේ රුචිවන්නේද, එසේ එය ප්‍රකාශකරව. කුමාරය, ඒ කුමකැයි සිතන්නෙහිද? මේ ලෝකයෙහි ගෘහපතියෙකුට හෝ ගෘහපති පුත්‍රයෙකුට හෝ ඇතුළත පිටත ආලේප කරන ලද භිත්ති ඇත්තාවූ සවිකරන ලද දොර අගුල් ඇත්තාවූ වසන ලද කවුළු ඇත්තාවූ කුළු ගෙයක් වන්නේද, එහි කොඳු පලසින් අතුරන ලද්දාවූ සුදු එළු ලොම් ඇතිරියෙන් අතුරන ලද්දාවූ ඝන මල් ඇතිරියෙන් අතුරන ලද්දාවූ කෙසෙල් මුව සමින් කරණ ලද උතුම් ඇතිරිලි ඇත්තාවූ උඩුවියන් සහිතවූ දෙපාර්ශවයෙහි තබන ලද ලෙහෙවන් කොට්ට ඇත්තාවූ පර්යංකයක් වන්නේද, මෙහි තෙල් පහනක්ද දැල්වෙන්නේය. ස්ත්‍රීන් සතර දෙනෙක්ද මනාප මනාපවූ උපස්ථාන කරමින් සිටින්නාහුද කුමාරය, ඒ කුමකැයි සිතන්නෙහිද, හෙතෙම සැපසේ සයනය කරන්නේ හෝ වේද, එසේ නොවන්නේ හෝ වේද, තට මෙහි කෙසේ හෝ අදහස් වේද?"

"ස්වාමීනි, හෙතෙම සැපසේ සයනය කරන්නේය. යම් කෙනෙක් ලෝකයෙහි සැපසේ සයනය කෙරෙත් නම් හෙතෙම ඔවුන් අතුරෙන් එක්තරා කෙනෙකි."

5. "කුමාරය, ඒ කුමැයි සිතන්නෙහිද, ඒ ගෘහපතියාට හෝ ඒ ගෘහපතිපුත්‍රයාට හෝ රාගයෙන් උපන්නාවූ කායිකවූ හෝ මානසිකවූ හෝ දාහයෝ වෙත්ද, ඒ රාගයෙන් හටගත් දාහයෙන් දැවෙනු ලබන්නාවූ හෙතෙම දුකසේ සයනය කරන්නේද?"

"ස්වාමීනි, එසේය"

6. "කුමාරය, ඒ ගෘහපති තෙමේ හෝ ඒ ගෘහපති පුත්‍ර තෙමේ රාගයෙන් හටගත්තාවූ යම් දාහයකින් දැවෙනු ලබන්නේ දුකසේ සයනය කරන්නේද, තථාගතයන්ගේ ඒ රාගය ප්‍රහීණය, උපුටන ලද මුල් ඇත්තේය. කරටිය කපන ලද තල් ගසක් මෙන් කරණ ලද්දේය. නැවත නූපදිනා පරිදි කරණ ලද්දේය. මත්තෙහි නොඉපදීම ස්වභාවකොට ඇත්තේය. එහෙයින් මම සැපසේ සයනය කෙළෙමි

7. (මේ ඡෙදය මේ සූත්‍රයේ 6. ඡෙදයේ "රාගය" වෙනුවට "ද්වෙෂය" යෙදීමෙන් සාදාගතයුතු)

8. (මේ ඡෙදය මේ සූත්‍රයේ 6. ඡෙදයේ "රාගය" වෙනුවට "මෝහය" යෙදීමෙන් සාදාගත යුතුයි)

1, 2. "ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවියාවූ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ තෙම සියලු කල්හි ඒකාන්තයෙන් සැපසේ සයනය කෙරෙයි. යමෙක් තෙම කාමයන්හි නො ඇලේද සිහිල්වූයේ වේද උපධි රහිත වූයේද, (හෙතෙම) සියලු තෘෂ්ණාවන් සිඳ හෘදයේ දාහය සංසිඳවා චිත්තයාගේ සංසිඳීමට පැමිණ සැපසේ නිදන්නේය."

36. දේවදූත සූත්‍රය- 1. "මහණෙනි, මේ දේවදූතයෝ තුන්දෙනෙක් වෙත්. කවර තිදෙනෙක්ද යත්, මහණෙනි, මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් දුශ්චරිත කෙරෙයිද, වචනයෙන් දුශ්චරිත කෙරෙයිද, සිතින් දුශ්චරිත කෙරෙයිද මහණෙනි ඔහු නිරය පාලයෝ වෙන වෙනම අත්වලින් අල්ලා ගෙණ යමරජහට දක්වත්. (කෙසේද) 'දේවයන්වහන්ස, මේ පුරුෂතෙම, මව කෙරෙහි වරදවා පිළිපැද්දේය, පියාට මනාව නොපිළිපැද්දේය, ශ්‍රමණයන්ට මනාව නොපිළිපැද්දේය රහතන්ට මනාව නොපිළිපැද්දේය, කුලදෙටුවන් නොපිදුවෝය, මොහුට දේවයන්වහන්සේ දඬුවම් කළමැනව' (කියායි) මහණෙනි, ඔහුට යමරජ තෙම පළමුවන දේවදූතයා පැහැදිළි කරන්නේය. කරුණු පිළිගන්වමින් අසන්නේය කරුණු විමසමින් අසන්නේය. (කෙසේද?) 'එම්බල පුරුෂය, තෝ මිනිසුන් අතරෙහි පහළවූ පළමුවන දේවදූතයා නුදුටුයෙහිද?' යනු වෙනි, හෙතෙම

(කෙසේද) 'ස්වාමීනි, නුදුටුයෙමියි' කියයි. මහණෙනි, යමරජ තෙම මෙසේ කියයි, එම්බල පුරුෂය තෝ මනුෂ්‍යයන් අතරෙහි ඉපදීමෙන් අසූ වයස් ඇත්තාවූ හෝ අනූ වයස්වූ හෝ අවුරුදු සියයක් ගියාවූ හෝ ජරාවට ගියාවූ ගොනැස්සක් සේ වක්වූ මැදින් බිඳුනාවූ සැරයටිය පිහිටකොට ඇත්තාවූ වෙවුලමින් යන්නාවූ ජරාවෙන් ආතුරවූ ඉක්මගිය තරුණ වයස් ඇත්තාවූ කැඩුනාවූ (වැටුනාවූ) දත් ඇත්තාවූ පැසුනු කෙස් ඇත්තාවූ ඉදිරීගිය කෙස් ඇත්තාවූ මුඩුවූ හිස ඇති ඇඟ රැළිවැටුණාවූ තල කැලලින් යුත් සිරුර ඇත්තාවූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ නුදුටුයෙහිදැයි' කියායි. හෙතෙම 'ස්වාමීනි දුටුයෙමියි' කියයි.

2. "මහණෙනි, යම රජතෙම ඔහුට මෙසේ කියයි. 'එම්බල පුරුෂය නුවනැත්තාවූම වැඩිවිය පැමිණි තට මේ සිත නොවීද, 'මමද ජරාව ස්වභාවකොට ඇත්තෙක් වෙමි. ජරාව නොඉක්මවූයෙක් වෙමි. එබැවින් මම කයින්ද වචනයෙන්ද සිතින්ද යහපතක් කරමියි' කියායි. ස්වාමීනි, හෙතෙම නොහැකිවූයෙමි. ප්‍රමාද උනෙමියි' කියයි.

3. "මහණෙනි, යමරජ තෙමේ ඔහුට මෙසේ කියයි. 'එම්බල පුරුෂය, ප්‍රමාදවූ බැවින් කයින් වචනයෙන් සිතින් යහපත් ක්‍රියා නොකෙළෙහිය. එම්බා පුරුෂය එහෙයින් ඒ ප්‍රමාදවූවාහුට යම්සේද තට එපරිද්දෙන් කරන්නෙමියි' කියායි. ඒ මේ පාපකර්මය වනාහි මව් විසින් නොකරණ ලද්දේය. පියා විසින් නොකරණ ලද්දේය. සහෝදරයා විසින් නොකරණලද්දේය. නැගණිය විසින් නොකරණ ලද්දේය. මිත්‍රයන් යහළුවන් විසින් නොකරනලද්දේය සහ ලේ නෑයන් විසින් නොකරණ ලද්දේය. දේවතාවන් විසින් නොකරණ ලද්දේය. මහණ බමුණන් විසින් නොකරණලද්දේය. තා විසින්ම මේ පාපකර්මය කරණලද්දේය. මේ පාපකර්මයාගේ විපාකය තෝ විඳින්නෙහිය කියායි.

4. "මහණෙනි, යමරජ තෙම පළමුවන දේවදූතයා දක්වා කරුණු සහිතව පිළිගන්වා කරුණු විමසා කියාදී කරුණු ගන්වා කියාදී දෙවෙනි දේවදූතයා පැහැදිළි කරන්නේය, කරුණු පිළිගන්වමින් අසන්නේය. කරුණු විමසමින් අසන්නේය

'පුරුෂය, තෝ මනුෂ්‍යයන් අතරෙහි පහළවූ දෙවෙනි දෙවදූතයා නොදැක්කෙහිදැයි' අසයි. හෙතෙම 'ස්වාමීනි නැතැයි' කියයි. මහණෙනි, ඔහුට යමරජ තෙම 'එම්බල පුරුෂය තෝ මනුෂ්‍යයන් අතරෙහි ව්‍යාධියෙන් පීඩිතවූ දුකට පැමිණියාවූ දැඩි ගිලන් බැව් ඇත්තාවූ ස්වකීය මළ මූත්‍රයෙහි සයනය කරන්නාවූ අන්‍යයන් විසින් නැගිටුවනු ලබන්නාවූ අනුන් විසින් නිදිකරවන්නාවූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු නුදුටුයෙහිදැයි' අසයි. හෙතෙම 'දුටුවෙමි ස්වාමීනියි' කියයි මහණෙනි, යමරජ තෙම ඔහුට 'එම්බල පුරුෂය, මහළුවූ නුවණැතිවූ, ඒ තොපට මමද ව්‍යාධිය ස්වභාවකොට ඇත්තෙක් වෙමි. ව්‍යාධිය නොඉක්මවූයෙමි. දැන් කයින් වචසින් මනසින් යහපතක් කරමියි මෙබඳු සිතක් නොවූයෙහිදැයි' අසයි. හෙතෙම 'ස්වාමීනි, නොහැකිවූයෙමි ප්‍රමාදවූයෙමියි' කියයි.

**5.** (මේ ඡේදය මේ සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

**6.** "මහණෙනි, යමරජ තෙම ඔහුට දෙවෙනි දෙවදූතයා දක්වා කරුණු සහිතව පිළිගන්වා කරුණු විමසා කියාදී 'තුන් වෙනි දෙවදූතයා නොදැක්කෙහිදැයි' අසයි. හෙතෙම 'ස්වමීනි, නැතැයි' කියයි. මහණෙනි, ඔහුට යමරජ තෙම 'එම්බල පුරුෂය, තෝ මනුෂ්‍යයන් අතරෙහි මැරී එක් දවසක් ගිය මැරී දෙදවසක් ගිය, මැරී තුන් දවසක් ගිය, කැතට ඉදිමුණු, කැතට නිල්වූ, විශෙෂයෙන් සැරව වැගිරෙන, ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ නොදැක්කෙහිදැයි' අසයි. හෙතෙම දුටුවෙමි ස්වාමීනියි' කියයි.

**7.** "මහණෙනි, ඔහුට යමරජ තෙම එම්බල පුරුෂය, මහළුවූ නුවණැතිවූ ඒ තොපට මමද මරණය ස්වභාවකොට ඇත්තෙමි. මරණය නොඉක්මවීමි. දැන් කයින් වචනින් මනසින් යහපතක් කෙරෙමියි මෙබඳු සිතක් නොවූයෙහිදැයි' අසයි. හෙතෙම 'ස්වාමීනි නොහැකිවූයෙමි ප්‍රමාදවූයෙමියි' කියයි.

**8.** (මේ ඡේදය මේ සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

**9.** "මහණෙනි, යමරජ තෙම ඒ තුන්වෙනි දේවදූතයා පැහැදිලිකොට කරුණු පිළිගන්වමින් අසා කරුණු විමසමින් අසා නිශ්ශබ්ද වෙයි.

10. "මහණෙනි, ඔහුට නිරය පාලයෝ පඤ්චවිධ බන්ධනය නම්වූ වධයක් කෙරෙත්. රත්වූ යකඩ හුලක් අතෙහි ගසත්. රත්වූ යකඩ හුලක් දෙවැනි අතෙහි ගසත්. රත්වූ යකඩ හුලක් පයෙහි ගසත්. රත්වූ යකඩ හුලක් දෙවෙනි පයෙහි ගසත්. රත්වූ යකඩ හුලක් උරමැදෙහි ගසත්. එහි හෙතෙම දුක්වූ තියුණුවූ කෘෘරවූ වේදනාවන් විඳී. යම්තාක් ඒ පාපකර්මය විනාශනොවේද, ඒතාක් කළුරිය නොකෙරෙයි. නිරයපාළයෝ ඔහු බිම පෙරලා කෙටේරි වලින් සසිත්.

11. 'මහණෙනි, ඔහු නිරයපාලයෝ පා උඩුකුරුකොට හිස යටිකොට තබා වෑ වලින් සසිත්. ඔහු නිරය පාලයෝ රථයෙහි යොදා ගින්නෙන් දිලිසෙන්නාවූ වෙසෙසින් ඇවිල පවත්නාවූ ගිනි සහිතවූ භූමියෙහි ඉස්සරහට යාමද කරවත්. පස්සට යාමද කරවත්. මහණෙනි, ඔහු නිරය පාලයෝ ගින්නෙන් දිලිසෙන්නාවූ වෙසෙසින් ඇවිල පවත්නාවූ ගිනි සහිතවූ මහත්වූ මහා කුලුගෙයක් පමණවූ අඟුරු පව්වට නැංවීමද කරවත්. බැස්වීමද කරවත්. මහණෙනි, ඔහු නිරය පාලයෝ පා උඩුකුරුකොට හිස යටිකුරුකොට කකියන්නාවූ ලොහො සැලියෙක්හි දමත්. හෙතෙම එහි පෙන නගමින් පැසෙයි. හෙතෙම එහි පෙන නගමින් පැසී වරක් උඩට එයි, වරක් යටට යෙයි, වරක් සරසට යයි. හෙතෙම එහි දුක්වූ දරුණුවූ, කටුකවූ වේදනාවන් විඳියි. යම්තාක් ඒ පාපකර්මය නොගෙවේද, ඒ තාක් කළුරිය නොකරයි. මහණෙනි, යමපල්ලෝ ඔහු මහා නරකයෙහි දමත්. මහණෙනි, ඒ මහා නරකය,

(1) සිව් කොණක් ඇත්තේය. සිව් දොරටුවක් ඇත්තේය, කොටස් වශයෙන් බෙදන ලද්දේය, එසේම ප්‍රමාණ කරණ ලද්දේය, යකඩ ප්‍රාකාරයකින් වට කරණ ලද්දේය, යකඩ පියනකින් වසන ලද්දේය.

(2) ඒ නිරයෙහි බිම යකඩයෙන්ම කරන ලදී. දැල්වෙන ගින්නෙන් යුක්තය. හැමකල්හි හාත්පසින් සියක් යොදුනක් ගින්න පැතිරගෙණ සිටී.

12. "මහණෙනි, පූර්වකාලයෙහි යමරජහට මෙබඳු අදහසක් විය. පින්වත්නි, ලෝකයෙහි යම් කෙනෙක් ලාමකවූ කර්මයන්

කෙරෙද්ද, ඔව්හු තුමූ මෙබඳුවූ නොයෙක් වධ කරණු ලබත් මම මිනිස් බවක් ලබන්නේ නම් අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපදින්නාහු නම් ඒ භාග්‍යවතුන් වහන්සේ පයිරුපාසනය කරන්නෙම් නම් මට ඒ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසත් නම් මමද ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය දැනගන්නෙම් නම් යහපති කියායි. මහණෙනි, මම එය අන්‍යවූ ශ්‍රමණයෙකුගෙන් හෝ බමුණෙකුගෙන් හෝ අසා මෙසේ නොකියමි. මහණෙනි, යමක්ම මා විසින් තමාම අවබෝධ කරණ ලද්දේද, තමාම දක්නා ලද්දේද, තමාම දැනගන්නා ලද්දේද, එයම මම කියමියි” වදාළේය.

(1) දේවදූතයන් විසින් චොදනා කරන ලද යම් මනුෂ්‍ය කෙනෙක් ප්‍රමාද වෙත්ද ලාමකවූ ශරීරයක් ඇති බවට පැමිණ බොහෝ කාලයක් මුළුල්ලෙහි සෝක කෙරෙත්.

2 මේ ලෝකයෙහි දේවදූතයන් විසින් චොදනා කරන ලද්දාවූ පණ්ඩිතවූ යම් සත්පුරුෂ කෙනෙක් වෙත්ද, ඔව්හු කිසිකලෙකත් ආර්‍ය ධර්මයෙහි ප්‍රමාද නොවෙත්.

3 ජාතියට හා ජරා මරණයට කරුණුවූ තෘෂ්ණා දෘෂ්ටීන් දැඩිකොට ගැණීමෙහි බිය දැක ජාති මරණ සංඛ්‍යාත නිර්වාණයෙහි උපාදාන වශයෙන් නොගෙන මිදෙත්.

4. අප්‍රමාද විහරණ ඇත්තාවූ සුවපත්වූ මේ ආත්මයෙහිම නිවුනාවූ සියලු වෛර භය ඉක්මවූ ඒ සත්පුරුෂයෝ වනාහි සියලු දුක් ඉක්මවූවාහුයයි (වදාළේය)”

37. **ලොකානුවිචරණ සූත්‍රයः-** 1 “මහණෙනි, පක්ෂයෙහි අටවෙනි දිනයෙහි සිව්වරම් මහ රජ දරුවන්ගේ පිරිසෙහිවූ ඇමතියෝ

2. මේ ලෝකයෙහි හැසිරෙත්. කිමෙක්ද?

‘මිනිසුන් අතුරෙහි මව් කෙරෙහි මොනවට පිළිපදින්නාවූ පියා කෙරෙහි මොනවට පිළිපදින්නාවූ ශ්‍රමණයන් කෙරෙහි යහපත්සේ පිළිපදින්නාවූ බ්‍රාහ්මණයන් කෙරෙහි මොනවට පිළිපදින්නාවූ කුලදෙටුවන් පුදන්නාවූ උපොසථ සිල් රකින්නාවූ

පෙරගමන් පසුගමන් වශයෙන් උපොසථ සිල් රකින්නාවූ කරන්නාවූ මිනිසුන් බොහෝ වෙත්ද, කියායි.

3. "මහණෙනි, පක්ෂයෙහි තුදුස්වක් දිනයෙහි සිව්වරම් මහරජදරුවන්ගේ පුත්‍රයෝ

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි)

5. "මහණෙනි, එදවස් පැමිණියාවූ පසළොස්වක් පොහෝ දිනයෙහි සිව්වරම් රජවරු තුමූම

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි)

"මහණෙනි, ඉදින් වනාහි මිනිසුන් අතුරෙහි මව් කෙරෙහි මොනවට පිළිපදින්නාවූ පියා කෙරෙහි මොනවට පිළිපදින්නාවූ ශ්‍රමණයන් කෙරෙහි යහපත්සේ පිළිපදින්නාවූ බ්‍රාහ්මණයන් කෙරෙහි මොනවට පිළිපදින්නාවූ කුලදෙටුවන් පුදන්නාවූ උපොසථ සිල්රකින්නාවූ පෙරගමන් පසුගමන් වශයෙන් උපොසථ සිල් රකින්නාවූ කරන්නාවූ මිනිසුන් ස්වල්ප වෙත්ද මහණෙනි, ඒ මේ කරුණු සිව්වරම් මහරජවරු සුධර්මා නම්වූ සභාවෙහි එක්වූ රැස්වූ තව්තිසා දෙවියන්ට ප්‍රකාශ කෙරෙත්. (කෙසේද) 'නිදුකාණෙනි, මනුෂ්‍යයන් අතුරෙහි මව කෙරෙහි යහපත්සේ පිළිපන්නාවූ පියා කෙරෙහි යහපත්සේ පිළිපන්නාවූ ශ්‍රමණයන් කෙරෙහි යහපත්සේ පිළිපන්නාවූ බ්‍රාහ්මණයන් කෙරෙහි යහපත්සේ පිළිපන්නාවූ කුලදෙටුවන් පුදන්නාවූ උපොසථ සිල් රකින්නාවූ පෙරගමන් පසුගමන් වශයෙන් උපොසථ සිල් රකින්නාවූ කරන්නාවූ මිනිසුන් ස්වල්ප වෙත්මය' කියායි. මහණෙනි, ඒ වචනයෙන් තව්තිසා දෙවියෝ නොසතුටු සිත් ඇත්තෝ වෙත්. 'පින්වත්නි, ඒකාන්තයෙන් දිව්‍ය නිකායයෝ පිරිහෙන්නාහුය. අසුරනිකායයෝ සම්පූර්ණ වන්නාහුයයි' කියායි.

7. "මහණෙනි, ඉදින් වනාහි මිනිසුන් අතුරෙහි මව් කෙරෙහි මොනවට පිළිපදින්නාවූ පියා කෙරෙහි මොනවට පිළිපදින්නාවූ ශ්‍රමණයන් කෙරෙහි යහපත්සේ පිළිපදින්නාවූ බ්‍රාහ්මණයන් කෙරෙහි මොනවට පිළිපදින්නාවූ කුලදෙටුවන් පුදන්නාවූ උපොසථ සිල් රකින්නාවූ පෙරගමන් පසුගමන් වශයෙන්

උපොසථ සිල් රකින්නාවූ මිනිසුන් බොහෝ වෙත්ද, මහණෙනි, ඒ මේ කරුණු සිව්වරම් මහරජවරු සුධර්මා නම්වූ සභාවෙහි එක්වූ රැස්වූ තව්තිසා දෙවියන්ට ප්‍රකාශ කෙරෙත්. (කෙසේද) 'නිදුකාණෙනි, මනුෂ්‍යයන් අතුරෙහි මව කෙරෙහි යහපත්සේ පිළිපදින්නාවූ පියා කෙරෙහි යහපත්සේ පිළිපදින්නාවූ ශ්‍රමණයන් කෙරෙහි යහපත්සේ පිළිපදින්නාවූ බ්‍රාහ්මණයන් කෙරෙහි යහපත් සේ පිළිපදින්නාවූ කුලදෙටුවන් පුදන්නාවූ උපොසථ සිල් රකින්නාවූ පෙරගමන් පසුගමන් වශයෙන් උපොසථ සිල් රකින්නාවූ කරන්නාවූ මිනිසුන් බොහෝ වෙත්මය' කියායි. මහණෙනි, ඒ වචනයෙන් තව්තිසා දෙවියෝ සතුටු සිත් ඇත්තෝ වෙත්. 'පින්වත්නි, ඒකාන්තයෙන් දිව්‍ය නිකායයෝ සම්පූර්ණ වන්නාහුය. අසුරනිකායයෝ පිරිහෙන්නාහුයයි" කියායි.

38. **සක්කභාසිත සූත්‍රයː-** 1. "මහණෙනි, පෙර ශක්‍ර දෙවෙන්ද්‍ර තෙම තව්තිසා දෙවියන් අවබෝධ කරවමින් ඒ වේලාවෙහි මේ ගාථාව ප්‍රකාශ කෙළේය.

> 'යම් මනුෂ්‍යයෙක් තෙම මා වැන්නෙක් වන්නේද නොහොත් මා විසින් පැමිණෙන ලද සම්පත්තියට පැමිණෙනු කැමති වන්නේද, හෙතෙම තුදුස්වක් දිනයෙහිද, පසළොස්වක් දිනයෙහිද, පක්ෂයෙහි අටවක් දිනයෙහිද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහිද ගුණාංගයකින් යුක්තවූ උපොසථ සීලයෙහි උපවාසය කරන්නේය.'

2. "මහණෙනි සක්දෙව්රජ විසින් ඒ මේ ගාථා තොමෝ වනාහි නපුරුකොට ගායනා කරණ ලද්දීය, යහපත් කොට ගායනා නොකරණ ලද්දීය, අයහපත් කොට ප්‍රකාශ කරණ ලද්දීය. යහපත් කොට ප්‍රකාශ නොකරණ ලද්දීය, ඊට හේතු කවරේද? මහණෙනි, දේවේන්ද්‍රවූ ශක්‍රතෙම වනාහි පහනොවූ රාග ඇත්තේය, පහනොවූ ද්වේෂ ඇත්තේය, පහනොවූ මෝහ ඇත්තේය."

3. "මහණෙනි, අර්හත්වූ ක්ෂය කරණ ලද කාමාදී ආශ්‍රව ඇත්තාවූ බඹසර වැස නිමකළාවූ කොට නිමවන ලද සිව්මග කටයුතු ඇත්තාවූ බහා තබන ලද ස්කන්ධාදී බර ඇත්තාවූ

පිළිවෙලින් පැමිණියාවූ, අර්හත්වය ඇති ක්ෂය කරණ ලද භව බන්ධන ඇත්තාවූ මනාකොට දැන කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ යම් ඒ මහණෙක් වේද,

"යම් මනුෂ්‍යයෙක් තෙම මා වැනි ක්ෂීණාශ්‍රවකෙනෙක් වන්නේද? හෙතෙම තුදුස්වක් දිනයෙහිද, පසළොස්වක් දිනයෙහිද පක්ෂයෙහි අටවක් දිනයෙහිද, ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහිද ගුණාංගයකින් යුක්තවූ උපොසථ සීලයෙහි උපවාසය කරන්නේය. ඒ භික්ෂුවම වනාහි කීමට සුදුසු වන්නේය කියායි.

"ඊට හේතු කවරේද? මහණෙනි, ඒ මහණතෙම වනාහි පහවූ රාග ඇත්තේ වේද, පහවූ ද්වෙෂ ඇත්තේ වේද පහවූ මෝහ ඇත්තේ වේද? එහෙයිනි,

(මෙහි මේ සූත්‍රයේ 1. ඡේදය යොදාගත යුතුයි.)

"මහණෙනි, බොහෝ පෙර සක්දෙව්රද විසින් මේ ගාථා තොමෝ වනාහි නපුරු කොට ගායනා කරණ ලද්දීය, යහපත් කොට ගායනා නොකරණ ලද්දීය. අයහපත් කොට ප්‍රකාශ කරණ ලද්දීය, යහපත් කොට ප්‍රකාශ නොකරණ ලද්දීය. ඊට හෙතු කවරේද, දෙවේන්ද්‍රවූ ශක්‍රතෙම වනාහි උත්පත්තියෙන්ද, ජරා මරණ දෙකින්ද, ශෝකවලින්ද, වැළපීම්වලින්ද, කායික දුක් වලින්ද චෛතසික දුක් වලින්ද, දැඩි ආයාස වලින්ද නොමිදුනේය. සියලු සංසාර දුකින් නොමිදුනේයයි කියමි.

"මහණෙනි, අර්හත්වූ ක්ෂය කරණ ලද කාමාදී ආශ්‍රව ඇත්තාවූ බඹසර වැස නිමකළාවූ කොට නිමවන ලද සිව්මග කටයුතු ඇත්තාවූ බහා තබන ලද ස්කන්ධාදී බර ඇත්තාවූ පිළිවෙලින් පැමිණියාවූ, අර්හත්වය ඇති ක්ෂය කරණ ලද භව බන්ධන ඇත්තාවූ මනාකොට දැන කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ යම් ඒ මහණෙක් වේද, ඒ භික්ෂුවම වනාහි මෙසේ කීමට සුදුසු වන්නේය. කෙසේද?

'යම් මනුෂ්‍යයෙක් තෙම මා වැනි ක්ෂීණාශ්‍රව කෙනෙක් වන්නේද හෙතෙම තුදුස්වක් දිනයෙහිද, පසළොස්වක් දිනයෙහිද, පක්ෂයෙහි අටවක් දිනයෙහිද, ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහිද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගුණාංගයකින් යුක්තවූ උපොසථ සීලයෙහි උපවාසය කරන්නේය.' කියායි.

"මහණෙනි, ඒ මහණතෙම ජාති, ජරා, මරණ, ශොක පරිදෙව, දුක් දොම්නස්, උපායාසවලින් මිදුනේය. සියලු සසර දුකින් මිදුනේයයි කියමියි" වදාළේය."

**39. සුඛුමාල සූත්‍රයඃ-** 1. "මහණෙනි, මම සිව්මැලි වෙමි. අතිශයින් සිව්මැලි වෙමි. මහණෙනි, මට වනාහි ඒ මාගේ පියාගේ නිවේසනයෙහි පොකුණු කරවන ලද්දාහු වෙත්. මගේ ප්‍රයෝජනය පිණිසම එක පොකුණෙක්හි තිලුපුල් පිපෙයි. එක් පොකුණෙක්හි හෙල පියුම් පිපෙයි. එක් පොකුණෙක්හි රත් පියුම් පිපෙයි. මහණෙනි, මම කසීරට නූපන්නාවූ සඳුනක් නොම දරමි. මහණෙනි, මේ මගේ හිස්වෙලුම කසී සලුවක් වෙයි. සැට්ටය කසී සලුවක් වෙයි. අඳනය කසී සලුවක් වෙයි. උතුරුසළුව කසී සලුවක් වෙයි. මහණෙනි, රෑ දාවල් දෙක්හිම මට ශීතලයක් හෝ උෂ්ණයක් හෝ රජස් හෝ තෘණ හෝ පිණි හෝ ස්පර්ශ නොකෙරේවායි ස්වෙත ඡත්‍රයක් දරනු ලබයි. මහණෙනි, ඒ මට ප්‍රාසාද තුනක් වූහ. එක් ප්‍රාසාදයක් ශීත ඍතුවට සුදුසු වෙයි. එක් ප්‍රාසාදයක් ග්‍රීෂ්ම ඍතුවට වෙයි. එක් ප්‍රාසාදයක් වර්ෂා ඍතුවට සුදුසු වෙයි. මහණෙනි, ඒ මම වනාහි වර්ෂා ඍතුවට සුදුසු ප්‍රාසාදයෙහි වැසි සාර මසෙහි පුරුෂයන් රහිතවූ තුර්‍යයන් ගෙන් විනොදය ලබමින් ප්‍රාසාදයෙන් පහළට නොබසිමි. මහණෙනි, සෙස්සන්ගේ ගෘහයන්හි දැසි කම්කරු පුරුෂයන්ට ඇඹුල් හොදි සමග නිවුඩු සාලේ බත් යම්සේ දෙනු ලැබේද, මහණෙනි, එසේ මාගේ පියාගේ ගෘහයෙහි දැසි කම්කරු පුරුෂයන්ට මස් ව්‍යංජන සහිත ඇල් සාලේ බත් දෙනු ලැබේ. මහණෙනි, මෙවැනි සමෘද්ධියකින්ද මෙවැනි සිව්මැලි බවකින්ද යුත් මට මෙසේ අදහස් විය.

2 "ඇසූ පිරූ තැන් නැත්තාවූ පෘථග්ජනතෙම වනාහි තමා ජරාව ස්වභාවකොට ඇත්තේම ජරාව නොඉක්මවූයේම ජරාවට ගිය අනිකෙකු දැක තමා ඉක්මවා හැකිලෙයි. අප්‍රිය කරයි. පිළිකුල් කරයි. 'මම වනාහි ජරාව ස්වභාවකොට ඇත්තේ වෙමි. ජරාව

නොනික්මවූයේ වෙමි. ජරාව ස්වභාව කොට ඇත්තාවූ ජරාව නොනික්මවූ මම ජරාවට ගියාවූ අනිකෙකු දැක තමා ප්‍රමාණය ඉක්මවා හැකිලෙන්නෙම් නම්, අප්‍රිය කරන්නෙම් නම්, පිළිකුල් කරන්නෙම් නම් එය මට සුදුසු නොවේය' කියායි. මහණෙනි, මෙසේ සිතන්නාවූ ඒ මට යම් තරුණ මදයක් වූයේද එය නැතිවිය.

3. (2 ඡේදයේ 'ජරාව ස්වභාවකොට ඇත්තේ' යන්නට 'ව්‍යාධිය ස්වභාවකොට ඇත්තේ' කියාද, 'තරුණ මදය' යන්නට 'නිරොග මදය' කියාද යොදා තුන්වෙනි ඡේදය සකස් කරගත යුතුයි)

4. (2 ඡේදයේ 'ජරාව ස්වභාවකොට ඇත්තේ' යන්නට 'මරණය ස්වභාවකොට ඇත්තේ' කියාද, 'තරුණ මදය' යන්නට 'ජීවිත මදයත් වේද' යන්න යොදා 4 ඡේදය සකස් කරගත යුතුයි.

**40. යොබ්බන මද සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ මදයෝ (උතුම් බැව්) තුන්දෙනෙක් වෙත්. කවර තුන්දෙනෙක්ද යත්, තරුණ මදය, නිරොග මදය, බොහෝකල් ජීවත්වීම් මදය යන තුන්දෙනයි. මහණෙනි, තරුණ මදයෙන් මත්වූ නූගත් පෘථග්ජනයා කයින් දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි. සිතින් දුසිරිතෙහි හැසිරෙයි. හෙතෙම කයින් දුසිරිත හැසිර වචනයෙන් දුසිරිත හැසිර සිතින් දුසිරිත හැසිර ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපනැති නපුරු ගති ඇති, නපුරුව වැටෙන නරකයෙහි උපදී.

"මහණෙනි, නිරොග මදයෙන් යුත්වූ බොහෝකල් ජීවත්වීම් නැමැති මදයෙන් මත්වූ නූගත් පෘථග්ජන තෙම කයින් වචනින් මනසින් දුසිරිත්හි හැසිරෙයි. කයින් වචනින් මනසින් දුසිරිත්හි හැසිර ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපනැති නපුරු ගති ඇති නපුරුව වැටෙන නරකයෙහි උපදී. මහණෙනි, තරුණ මදයෙන් මත්වූ මහණතෙම සිල් ප්‍රතික්ෂෙපකොට ගිහි බවට පෙරලෙයි. මහණෙනි, නිරොග මදයෙන් මත්වූ මහණතෙම සිල් ප්‍රතික්ෂෙපකොට ගිහි බවට පෙරලෙයි. බොහෝකල්

ජීවත්වන මදයෙන් යුක්තවූ මහණ තෙම සිල් ප්‍රතික්ෂෙපකොට ගිහි බවට පෙරලේයයි වදාළසේක.

1. "ව්‍යාධිය ස්වභාවකොට ඇත්තාවූද ජරාව ස්වභාව කොට ඇත්තාවූද, මරණය ස්වභාවකොට ඇත්තාවූ පෘථග්ජනයෝ තුමූ ඒ ස්වභාවධර්මයෝ ඒවූ පරිද්දෙන් ඇත්තාවූ පෘථග්ජනයෝ අන්‍යයන් පිළිකුල් කරත්.

2. "ඉදින් මම ඒ ස්වභාව ඇත්තාවූ සත්වයන් කෙරෙහි පිළිකුල් කරන්නෙම් නම් එබඳු ස්වභාව ඇත්තාවූ මට එය සුදුසු නොවන්නේමය,

3-4. "ඒ මම එසේ වාසය කරන්නෙම් උපධි රහිත නිර්වාණ ධර්මය අවබොධ කොට නිරොගි භාවයෙහිද, යෞවන භාවයෙහිද, ජීවිතයෙහිද යම් මදයෝ වෙත්ද, ඒ සියලු මදයන් නෛෂ්ක්‍රම්‍යයයි කියන ලද නිර්වාණයෙහි ක්ෂෙමභාවය දැක අභිභවනය කෙළෙම්. නිර්වාණය දක්නාවූ ඒ මට උත්සාහය වූයේය.

5. මම දැන් කාමයන් සේවනය කිරීමට සුදුසු නොවෙමි. මාර්ග බ්‍රහ්මචය්‍ර්‍ය පිහිටකොට ඇත්තේ ප්‍රව්‍ර්‍ජ්‍යාව හා සර්වඥතාඥානය උදෙසා නොපසුබස්නා වීය්‍ර්‍ය ඇත්තෙක් වන්නෙමි."

**41. ආධිපතෙය්‍ය සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ අධිපති භාවයෝ තුන්දෙනෙක් වෙත්. කවර තුන්දෙනෙක්ද යත්, මහණෙනි, තමා අධිපතිකොට ඇති බවද ලෝකයා අධිපති කොට ඇති බවද ධර්මය අධිපතිකොට ඇති බවද වෙත්. මහණෙනි, තමා අධිපති කොට ඇති බව කවරේද?

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආරණ්‍යයකට ගියේ හෝ වෘක්ෂ මූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි. මම වනාහි සිව්රු හේතු කොට ගෙණ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි නොවීමි. ආහාරය හේතුකොටගෙණ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිනුවූයෙමි, සෙනසුන් හේතුකොටගෙණ ගිහිගෙන් නික්ම

ශාසනයෙහි පැවිදි නුවූයෙමි. භවසම්පත් හේතුකොටගෙණ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි නොවීමි. යලිදු වනාහි ඉපදීමෙන්ද ජරාවෙන් හා මරණයෙන්ද ශෝකයෙන්ගෙන්ද වැළපීම්වලින්ද කායික දුක්වලින්ද, චෛතසික දුක්වලින්ද, දැඩි ආයාසවලින්ද වැළඳගත්තේ වෙමි. දුකට බැසගන්නා ලද්දේ වෙමි. දුකින් පීඩිතවූයේ වෙමි. මේ සියලු දුක්ඛයන්ගේ කෙළවර කිරීමක් පෙනේනම් යහපතැයි පැවිදි වූයෙමි.

3. "මම වනාහි යම්බඳුවූ කාමයන් හැර ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවූයෙම් නම් එබඳුවූ හෝ ඊටත් වඩා අතිශයින් ලාමකවූ හෝ කාමයන් සොයන්නෙම් නම් මට එය සුදුසු නොවන්නේයයි සිතයි.

4. "හෙතෙම මෙසේද සිතයි. 'මා විසින් නොහැකිළෙන වීර්‍ය්‍යය පටන්ගන්නා ලදී. සිහිය නොමුළාවිය, කය සංසිඳුනේය. සැහැල්ලුවිය, සිත සමාධියට පැමිණියේය. එකඟවිය' කියායි. මෙසේ හෙතෙම තමන් අධිපතිකොට අකුශලය දුරු කෙරෙයි, කුසලය වඩයි, වරද දුරුකරයි, නිවරද වඩයි. පිරිසුදු ආත්මය පරිහරණය කරයි, මහණෙනි, මේ තමා අධිපති කොට ඇතිබවයයි කියනු ලැබේ

5. "මහණෙනි, ලොකය අධිපතිකොට ඇති බව නම් කවරේද? මහණෙනි, මේශාසනයෙහි මහණතෙම ආරණ්‍යයකට ගියේ හෝ වෘක්ෂ මූලයකට ගියේ හෝ ශුන්‍යාගාරයකට ගියේ හෝ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි. 'මම වනාහි සිවුරු හේතු කොටගෙණ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි නොවීමි. ආහාරය හේතුකොට ගෙණ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිනුවූයෙමි. සෙනසුන් හේතුකොටගෙණ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි නොවූයෙමි. භව සම්පත් හේතුකොට ගෙණ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිනොවීමි. යලිදු වනාහි ඉපදීමෙන්ද ජරාවෙන් හා මරණයෙන්ද ශෝකයන්ගෙන්ද වැළපීම් වලින්ද කායික දුක් වලින්ද චෛතසික දුක් වලින්ද, දැඩි ආයාස වලින්ද වැළඳගත්තේ වෙමි. දුකට බැසගන්නාලද්දේ වෙමි දුකින් පීඩිතවූයේ වෙමි. මේ සියලු දුක්ඛයන්ගේ කෙළවර කිරීමක් පෙනේනම් යහපතැයි මම පැවිදිවූයෙමි.'

**6.** "මෙසේ පැවිදිවූ මම වනාහි කාම විතර්ක හෝ සිතන්නෙම් නම් ව්‍යාපාද විතර්ක හෝ සිතන්නෙම් නම් විහිංසා විතර්ක හෝ සිතන්නෙම් නම් මේ ලෝක සන්නිවාසය මහත්ය. මහත්වූ ලෝක සන්නිවාසයෙහි ඍද්ධි ඇත්තාවූ, දිවැස් ඇත්තාවූ, පරසිත් දන්නාවූ මහණ බමුණෝ ඇත්තාහුය.

**7.** "ඔව්හු දුරදීත් දකිත්. ළඟ සිටියාහුද අන්‍යයන් විසින් දකිනු නොලැබෙත්. සිතින්ද සිත දැනගනිත්. ඔව්හු මෙසේ දැනගන්නාහුය. 'පින්වත්නි, බලව්. මේ කුලපුත්‍රයා ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිව ලාමක අකුශල ධර්මයන්ගෙන් ගැවසීගෙන වාසය කෙරෙයි' කියායි.

**8.** දිවැස් ඇත්තාවූ පරසිත් දන්නාවූ දෙවියෝ ඇත්තාහ.

(මෙහි මේ සූත්‍රයේ 7. ඡෙදය යොදාගත යුතුයි)

හෙතෙම මෙසේද සිතයි. 'මා විසින් නොහැකිළෙන වීර්‍ය්‍යය පටන්ගන්නා ලදී. සිහිය නොමුළාවිය, කය සංසිඳුනේය, සැහැල්ලුවිය, සිත සමාධියට පැමිණියේය, එකඟවිය' කියායි. මෙසේ හෙතෙම ලොකයාම අධිපතිකොට අකුශලය දුරු කෙරෙයි, කුශලය වඩයි, වරද දුරුකරයි, නිවරද වඩයි, පිරිසුදු ආත්මය පරිහරණය කරයි, මහණෙනි, මේ ලොකයා අධිපති කොට ඇති බවයයි කියනු ලැබේ.

**9.** "මහණෙනි, ධර්මය අධිපතිකොට ඇති බව නම් කවරේද? (මෙහි මේ සූත්‍රයේ 5. ඡෙදය යෙදිය යුතුයි.) භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මයතෙම මනාකොට ප්‍රකාශ කරණ ලද්දේය. එකෙණෙහි ලැබියයුතු ඵල ඇත්තේය. දියයුතු විපාක ඇත්තේය. එව බලවයි කීමට සුදුසුය, තමන් වෙත එළවාගතයුතු ගුණ ඇත්තේය නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහිලා දතයුතුයයි කියායි. ඒ ධර්මය දැන දැක වාසය කරන්නාවූ සබ්‍රහ්මචාරීහු වෙසෙත්. මමද මෙසේ මනා කොට ප්‍රකාශ කරණ ලද ධර්ම විනය සංඛ්‍යාත ශාසනයෙහි පැවිදිව කුසීතව ප්‍රමාදව වාසය කරන්නෙම් නම් එය මට සුදුසු නොවන්නේය කියායි.

**10.** "හෙතෙම මෙසේද සිතයි, මා විසින් නොහැකිළෙන වීර්‍ය්‍ය පටන්ගන්නා ලදී. සිහිය නොමුළාවිය, කය සංසිඳුනේය,

සැහැල්ලුවිය, සිත සමාධියට පැමිණියේය, එකඟවිය’ කියායි. මෙසේ හෙතෙම තමන් අධිපතිකොට අකුශලය දුරුකෙරෙයි, කුශලය වඩයි, වරද දුරු කරයි, නිවරද වඩයි, පිරිසුදු ආත්මය පරිහරණය කරයි. මහණෙනි, මේ ධර්මය අධිපතිකොට ඇත්තේ වේ. මහණෙනි, මේ අධිපතිභාවයෝ තුන නම් වෙත්.”

1. “ලෝකයෙහි පව්කම් කරන්නාහට රහසක් නම් නැත්තේය. පුරුෂය, තාගේ සත්‍යය හෝ ඉදින් බොරුව හෝ තෙමේ දනී.

2. පින්වත ඒකාන්තයෙන් යහපත සාක්ෂිවේ. තමා ඉක්මවා සිතන්නෙහිද? යමෙක් තෙම තමා කෙරෙහි ඇත්තාවූ පාපය තමා කෙරෙහි සඟවන්නෙහිද?

3-4. (සත්ව) ලෝකයෙහි විසම සේ හැසිරෙන්නාවූ අඥානයා දෙවියෝද, තථාගතයෝද දකිත්. එහෙයින් තවුස්තෙම තමා අධිපතිකොට ගෙනද, ලෝකයා අධිපති කොට ගෙනද, ප්‍රඥාවෙන් යුක්තවද, ධ්‍යාන කරණ සුලුවද, ධර්මය අධිපතිකොට ගෙනද ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි හැසිරෙණ සුලුවද, ස්ථිර වීර්‍ය්‍යය ඇතිවද, සිහි ඇතිවද හැසිරෙන්නේය. වීර්‍ය්‍යය ඇත්තාවූ යමෙක් තෙම මාරයා පරාජය කොට මාරයා අභිභවනය කොට ජාතිය ක්ෂය කිරීමයයි කියන ලද අර්හත්වය ස්පර්ශ කෙළේද, එබඳුවූ තුන්ලොව දන්නාවූ යහපත් ප්‍රඥා ඇත්තාවූ සියලු ත්‍රෛභූමක ධර්මයන්හි තෘෂ්ණා සංඛ්‍යාත තම්මය රහිතවූ (තෘෂ්ණා නැත්තාවූ) ඒ ක්ෂීණාශ්‍රව මුනිතෙම නොපිරිහෙන්නේයයි” වදාළේය.

(4 වෙනි දේවදූත වර්ගය සමාප්තයි)

---

## 5. චූල වර්ගය

42. **තිණ්ණං සම්මුඛීභාව සූත්‍රය:-** “මහණෙනි කරුණු තුනක් සම්මුඛවීමෙන් ශ්‍රද්ධාවත් කුලපුත්‍රතෙම බොහෝ පින් රැස් කරයි. කවර තුනක්ද යත්, මහණෙනි, ශ්‍රද්ධාව සම්මුඛවීමෙන් ශ්‍රද්ධාවත්

කුලපුත්‍ර තෙම බොහෝ පින් රැස් කරයි. මහණෙනි, දියයුතු දානවස්තුවක් සම්මුඛ වීමෙන් ශ්‍රද්ධාවත් කුලපුත්‍රතෙම බොහෝ පින් රැස්කරයි. මහණෙනි දියයුතු පුද්ගලයන් සම්මුඛවීමෙන් ශ්‍රද්ධාවත් කුලපුත්‍රතෙම බොහෝ පින් රැස්කරයි"

43. **සංලක්ඛණ සූත්‍රයඃ-** "මහණෙනි, කරුණු තුනකින් සැදැහැවත් පැහැදුන පුද්ගලයා දතයුතුයි. කවර තුනකින්ද යත්. සිල්වතුන් දකිනු කැමති වේද, සද්ධර්මය අසනු කැමති වේද පහවූ මසුරු මළ ඇති සිතින් යුක්තවූයේ දීමට මුදනලද අත් ඇත්තේ දන්දීමෙන් පිරිසිදු කරණ ලද අත් ඇත්තේ දානයෙහි ඇලුනේ බෙදාදීමෙහි ඇලුනේ ගිහිගෙයි වාසයකරයිද, මහණෙනි, මේ කරුණු තුනින් සැදැහැවත් පැහැදුන පුද්ගලයා දතයුතුයි.

"සිල්වතුන් දකිනු කැමතිවේද, සද්ධර්මය අසනු කැමතිවේද, මසුරු මළ පහකොට සිටියාවූ හෙතෙම ඒකාන්තයෙන් සැදැහැවත්යයි කියනු ලැබේ."

44. **අලංධම්මදෙශනා සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ කරුණු තුනක් දක්නහු විසින් අනුන්ට ධර්මදෙශනා කරන්ට යුතුමය. කවර තුනක්ද යත්.

2. "යමෙක්තෙම ධර්මය දෙශනා කරයිද, හෙතෙම අර්ථය දන්නේවේද ධර්මය දන්නේවේද, යමෙක්තෙම ධර්මය අසාද හෙතෙම අර්ථය දන්නේ වේද ධර්මය දන්නේවේද, යමෙකුන් දහම් දෙසාද යමෙකුන් දහම් අසාද දෙදෙනම අර්ථය දන්නේවේද ධර්මය දන්නේවේද, මහණෙනි, මේ කරුණු තුන දක්නහු විසින් අනුන්ට දහම් දෙසීමට සුදුසුමය"

45. **කථා පවත්තිට්ඨාන සූත්‍රයඃ-** 1 "මහණෙනි, කරුණු තුනකින් කථාතොමෝ නිවන්කරා පමුණුවන්නී වේ, කවර තුනකින්ද යත්,

2. (මේ ඡේදය 44 වෙනි සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

46. **පණ්ඩිත පඤ්ඤත්ත සූත්‍රයඃ-** 1. පණ්ඩිතයන් විසින් ප්‍රශංසා කරණලද්දාවූ සත්පුරුෂයන් විසින් ප්‍රශංසා කරණලද්දාවූ මේ ධර්ම තුනක් වෙත්. කවර තුනක්ද යත්,

2. "මහණෙනි, දානය පණ්ඩිතයන් විසින් සත්පුරුෂයන්, විසින් ප්‍රශංසාකරන ලද්දේය. මහණෙනි, ප්‍රව්‍රජ්‍යාව පණ්ඩිතයන් විසින් සත්පුරුෂයන් විසින් ප්‍රශංසාකරන ලද්දේය. මහණෙනි, මවුපිය උපස්ථානය පණ්ඩිතයන් විසින් සත්පුරුෂයන් විසින් ප්‍රශංසාකරණ ලද්දේය. මහණෙනි, මේ කරුණු තුන පණ්ඩිතයන් විසින් සත්පුරුෂයන් විසින් ප්‍රශංසාකරණ ලද්දේය."

3. "දානයද අහිංසාවද ශීලසංවරයද, ඉන්ද්‍රිය දමනයද මවුපියන්ට උපස්ථාන කිරීමද සත්පුරුෂයන් විසින් ප්‍රශංසාකරණ ලද්දාහුය. ශාන්තවූ උතුම් හැසිරීම් ඇත්තාවූ සත්පුරුෂයන් හෝ මේ ධර්මයන් පණ්ඩිත තෙම සෙවනය කරන්නේය. ආයර්‍යවූ දැකීමෙන් යුක්තවූ හෙතෙම දෙව්ලොව භජනය කරන්නේය."

47. **ශීලවන්ත සෙවන සූත්‍රයඃ-** "මහණෙනි, සිල්වත්වූ පෘථග්ජනයෝ යම් ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරුකොට වාසය කරන්නාහු වෙත්ද? එහි මනුෂ්‍යයෝ කරුණු තුනකින් බොහෝ පින් රැස්කරත්. කවර තුනකින්ද යත්. කයින් වචනයෙන් සිතින් යන තුනෙනි. මහණෙනි, සිල්වත් පෘථග්ජනයෝ යම් ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට වාසය කරන්නාහු වෙත්ද? එහි මනුෂ්‍යයෝ මේ කරුණු තුනකින් බොහෝ පින් රැස්කරත්"

48. **සංඛත ලක්ෂණ සූත්‍රයඃ-** 1. "මහණෙනි, ප්‍රත්‍යයෙන් සකස්කළ ධර්මයාගේ ප්‍රත්‍යයෙන් සකස්කළ ලක්ෂණයෝ තුන් දෙනෙක් වෙත්, කවර තුන්දෙනෙක්ද යත්. ඉපදීම පෙනේද, විනාශය පෙනේද පවත්නහුගේ අන් ආකාරයක් පෙනේද, මහණෙනි, මේ තුන සංඛතයාගේ ලක්ෂණ තුන වෙත්.

2. "මහණෙනි, ප්‍රත්‍යයෙන් සකස්නොකළ අසංඛතයාගේ නොහොත් නිර්වාණයාගේ මේ ලක්ෂණ තුනක් වෙත්. කවර තුනක්ද යත්. ඉපදීම නොපෙනේද, විනාශය නොපෙනේද, පවත්නහුගේ අන් ආකාරයක් නොපෙනේද, මහණෙනි, මේ තුන අසංඛත සංඛ්‍යාත නිර්වාණයාගේ ප්‍රත්‍යයෙන් සකස් නොකළ ලක්ෂණයෝයි."

**49. පබ්බතරාජ සූත්‍රය:-** 1. "මහණෙනි, හිමාල පර්වතය නිසා මහා වෘක්ෂයෝ වැඩීම් තුනකින් වැඩෙත්. අතු කොළවලින් වැඩෙත්. සිවියෙන් හා පොත්තෙන් වැඩෙත්. ඵලයෙන් හා හරයෙන් වැඩෙත්. මහණෙනි, හිමාල පර්වතයා නිසා මහා වෘක්ෂයෝ මේ වැඩීම් තුනින් වැඩෙත්.

2. "මහණෙනි, එපරිද්දෙන්ම සැදැහැවත්වූ කුල ප්‍රධානියෙකු නිසා ඔහුගේ අභ්‍යන්තර ජනතෙමේ වැඩීම් තුනකින් වැඩෙයි. ශ්‍රද්ධාවෙන් වැඩෙයි. ශීලයෙන් වැඩෙයි. ප්‍රඥාවෙන් වැඩෙයි. මහණෙනි, සැදැහැවත් කුලපුත්‍රයෙකු නිසා ඔහුගේ අතවැසි පිරිස ශ්‍රද්ධාවෙන් වැඩෙයි. ශීලයෙන් වැඩෙයි. ප්‍රඥාවෙන් වැඩෙයි.

1. "ගමින් ඈත්වූ මහා වනයෙහි ශෛලමය පර්වතයක් වේද, එය ආශ්‍රයකොට ඒ මහා වෘක්ෂයෝ යම්සේ වැඩෙත්ද,

2. "එපරිද්දෙන්ම මේ ලොකයෙහි ශීලයෙන් යුක්තවූ ශ්‍රද්ධාවත්වූ කුලපත්‍රයා ආශ්‍රයකොට අඹුදරුවෝද බන්ධුවරයෝද හිතවන්තයෝද ඥාති සමූහයාද යමෙක් තුමූ ඔහු අනුව ජීවත් වන්නාහුද ඔව්හු වැඩෙත්.

3. "යම්කෙනෙක් නුවණැත්තෝ වෙත්ද ඔව්හු සිල්වත්වූ ඔහුගේ ශීලයද ත්‍යාගයද සුචරිතයන්ද බලමින් ඒ අනුව පිළිපදිත්.

4, "මේ ලොකයෙහි සුගතිගාමී මාර්ගයෙහි පිළිපැද කම්සැප කැමති වෙමින් සතුටුවන්නෝ දෙලොව සතුටු වෙත්."

**50. ආතප්පකරණීය සූත්‍රය:-** "මහණෙනි, කරුණු තුනකින් වීර්‍ය්‍යය කටයුතුවේ. කවර තුනකින්ද යත්, නූපන්නාවූ ලාමක අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස වීර්‍ය්‍යය කටයුතුයි. නූපන්නාවූ කුශල ධර්මයන්ගේ ඉපදවීම පිණිස වීර්‍ය්‍යය කටයුතුයි. උපන්නාවූ ශාරීරිකවූ දුක්වූ තියුණුවූ කෘෂරවූ කටුකවූ අමිහිරිවූ අමනාපවූ ප්‍රාණය නැති කරන්නාවූ වේදනාවන් ඉවසීම පිණිස වීර්‍ය්‍යය කටයුතුයි. මහණෙනි, මහණතෙම යම්කලක පටන් නූපන්නාවූ ලාමක අකුශල ධර්මයන්ගේ නොඉපදවීම පිණිස

වීර්‍ය්‍යය කෙරේද, නූපන්නාවූ කුශල ධර්මයන්ගේ ඉපදවීම පිණිස වීර්‍ය්‍යය කෙරේද, උපන්නාවූ ශාරීරිකවූ දුක්වූ තියුණුවූ කෲරවූ කටුකවූ අමිහිරිවූ අමනාපවූ ප්‍රාණය නැති කරන්නාවූ වෙදනාවන් ඉවසීම පිණිස වීර්‍ය්‍යය කෙරේද, මහණෙනි, මේ මනාකොට දුක් කෙළවර කිරීම පිණිස කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ නුවණ ඇත්තාවූ සිහියෙන් යුක්තවූ භික්ෂුවයයි කියනු ලැබේ"

51. **මහාචොර සූත්‍රයː-** 1. "මහණෙනි, අංග තුනකින් යුක්තවූ මහා සොරතෙම ගෙවල් බිඳීමද කරයි. උමංකැපීමද කරයි. එක ගෙයක් වටකර කරණලද පැහැරගැන්මද කරයි. මංපැහැරීමද කරයි. කවර තුනකින්ද යත්. මහණෙනි, මේ ලෙව්හි මහා සොරතෙම විෂම ස්ථානයන් ඇසුරුකොට වසන්නේ හෝ වෙයි. වනලැහැබක් ඇසුරුකොට වසන්නේ හෝ වෙයි. බලවතුන් ඇසුරුකොට වසන්නේ හෝ වෙයි.

2. "මහණෙනි, මහා සොරතෙම කෙසේනම් විෂමවූ තැන් ඇසුරුකොට වාසය කරන්නේද, මහණෙනි, මෙහි මහා සොරතෙම නදී දුර්ගම ස්ථාන හෝ ඇසුරුකොට වාසයකරයි. විෂමවූ පර්වතයන් හෝ ඇසුරුකොට වාසය කරයි. මහණෙනි, මහා සොරතෙම මෙසේ විෂම ස්ථාන ඇසුරුකොට වාසය කරන්නේ වෙයි.

3. "මහණෙනි, කෙසේනම් මහාසොරතෙම වනලැහැබක් ඇසුරුකොට වාසයකරන්නේද, මහණෙනි, මේ මහා සොර තෙම තෘණයන්ගෙන් ගැවසීගත් තැනක් හෝ ඇසුරුකරන්නේ වේ ඝනවූ වනලැහැබක් හෝ ඇසුරුකරන්නේ වේ. මහණෙනි, මෙසේ වනාහි මහ සොරතෙම වනලැහැබක් ඇසුරුකොට වසන්නේ වේ.

4. "මහණෙනි, මහසොරතෙම කෙසේ බලවතුන් ඇසුරු කොට වාසයකරන්නේද? මහණෙනි, මෙහි මහා සොරතෙම රජ හෝ රජමහ ඇමතියන් හෝ ඇසුරුකොට වාසය කරයි. ඔහට මෙසේ අදහස් වෙයි. 'ඉදින් මට කිසිවෙක් කිසිවක් කියාද මගේ මේ රජවරු හෝ රජමහ ඇමතියන් හෝ ඒ ඒ කරුණු දක්වා හිතවත්ව කථාකරන්නාහුය' කියායි ඉදින් ඔහුට කිසිවෙක්

කිසිවක් කියානම් ඔහුගේ ඒ රජදරුවෝ හෝ රජමහ ඇමතියෝ හෝ කරුණු දක්වා හිතවත්ව කථාකරත්. මහණෙනි, මෙසේ මහා සොරතෙමේ බලවතුන් ඇසුරුකොට වාසය කරයි. මහණෙනි, මේ අංග තුනින් යුත් මහා සොර තෙමේ ගෙවල් බිඳීමද කරයි. උමං කැපීමද කරයි. එක ගෙයක් වටකර කරණ පැහැරගැන්මද කරයි. මංපැහැරීමද කරයි.

5. "මහණෙනි, එසේම කරුණු තුනකින් යුත් පව්ටු භික්ෂුව නසනලද විනාශ කරණ ලද තම ආත්මය පරිහරණය කරයි. අපවාද කළ යුත්තෙක්ද වෙයි නුවණැතියන් විසින් කිය යුත්තෙක්ද වෙයි. බොහෝ අකුශල්ද රැස්කරයි. කවර තුනකින්ද යත්

6. "මහණෙනි, මේ 'ශාසනයෙහි පව්ටුභික්ෂුව විෂමස්ථාන ඇසුරු කළේ වේද, වනලැහැබ් ඇසුරු කළේද, බලවතුන් ඇසුරු කළේවේද වේ.

7. "මහණෙනි, කෙසේනම් පව්ටු භික්ෂුව විෂමස්ථාන ඇසුරු කළේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි පව්ටු මහණ තෙම විෂමවූ කායකර්මයෙන් යුක්ත වේද, විෂමවූ වාක් කර්මයෙන් යුක්තවේද, විෂමවූ මනොකර්මයෙන් යුක්තවේද, මහණෙනි, මෙසේ වනාහි පාප භික්ෂුව විෂමස්ථාන ඇසුරු කරන්නේ වේ.

8. "මහණෙනි, කෙසේ නම් පාප භික්ෂුව වනලැහැබ් ඇසුරුකොට වාසය කරන්නේද? මහණෙනි, මේ ශාසනයෙහි පව්ටු මහණතෙම මිථ්‍යාදෘෂ්ටික වේද, දස වස්තුක මිථ්‍යා දෘෂ්ටියෙන් යුක්තවූයේ වේද, මහණෙනි, මෙසේ මහණතෙම වනලැහැබ ඇසුරුකොට වාසයකළේ වේ.

9. "මහණෙනි, කෙසේනම් පව්ටු මහණතෙමේ බලවතුන් ඇසුරුකොට වාසය කරන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි පව්ටු මහණතෙම රජුන් හෝ රජමහ ඇමතියන් හෝ ඇසුරුකොට වසන්නේ වෙයි. ඔහුට මෙසේ අදහස්වෙයි. 'ඉදින් මට කිසිවෙක් කිසිවක් කියන්නේද මට මාගේ රජුන් හෝ රජමහ ඇමතියන් හෝ කරුණු දක්වා හිතවත්ව කථා කරන්නාහුය' කියායි ඉදින් ඔහුට කිසිවෙක් කිසිවක් කියයි නම් රජවරු හෝ

රජමහ ඇමතියන් හෝ කරුණු දක්වා හිතවත් කථා කරත්. මහණෙනි මෙසේ පාප භික්ෂුව බලවතුන් ඇසුරුකළේ වේ.

10. "මහණෙනි, මේ කරුණු තුනින් යුක්තවූ පාප භික්ෂුව නසන ලද විනාශ කරණ ලද ආත්මය පරිහරණය කරයි. නුවණැත්තන් විසින් වරද පෙන්වා කියයුත්තේද අවවාද කට යුත්තේද වේ. බොහෝ අකුශල්ද රැස්කරයි.

(පස්වැනි චූල වර්ගය නිමි.)
(පළමුවැනි පනස සම්පූර්ණයි.)

---

## දුතිය පණ්ණාසකය.

## 6. බ්‍රාහ්මණ වර්ගය.

1. **ජරූපනීය සූත්‍රයː-** 1. ඉක්බිත්තෙන් වනාහි ජරාවට ගියාවූ වයසින් වැඩිවූ මහළුවූ වයස් ඉක්මගියාවූ වයසට පැමිණියාවූ උත්පත්තියෙන් එකසිය විසි වයස් ඇත්තාවූ බමුණෝ දෙදෙනෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූවාහුය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක හුන්නාහුය.

2. එකත්පසෙක හුන් ඒ බමුණෝ භාග්‍යවතුන් වහන්සේට, "භවත් ගෞතමයන් වහන්ස, අපි ජරාවට ගියාවූ වයසින් වැඩිවූ මහළුවූ වයස් ඉක්ම ගියාවූ වයසට පැමිණියාවූ උත්පත්තියෙන් එකසිය විසි වයස් ඇත්තාවූ බමුණෝ වෙමු. ඒ අපි නොකරණ ලද යහපත් ක්‍රියා ඇත්තෝ වෙමු. නොකරණ ලද කුසල් ඇත්තෝ වෙමු. නොකරණ ලද භය ආරක්ෂා ඇත්තෝ වෙමු. යමක් බොහෝ කාලයක් මුළුල්ලෙහි අපට හිත පිණිස සැප පිණිස වන්නේද එවැනි අවවාදයකින් භවත් ගෞතමයන් වහන්සේ අපට අවවාද කරණසේක්වා. භවත් ගෞතමයන් වහන්සේ අපට අනුශාසනා කරණසේක් වායි" සැළකෙළේය.

3. "බ්‍රාහ්මණයෙනි, ඒකාන්තයෙන් තෙපි ජරාවට ගියාවූ වයසින් වැඩිවූ මහළුවූ වයස් ඉක්මගියාවූ වයසට පැමිණියාවූ

උත්පත්තියෙන් එකසිය විසිවයස් ඇත්තෝවූවහුය. ඒ තෙපිද නොකරණ ලද යහපත් ක්‍රියා ඇත්තෝ වන්නහුය, නොකරණ ලද කුශල් ඇත්තාහුය, නොකරණ ලද භය ආරක්ෂා ඇත්තෝ වන්නහුය.

4. "බමුණෙනි, මේ ලොකය ජරාවෙන්ද රෝගයෙන්ද මරණයෙන්ද ගෙනයනු ලැබේ. බමුණෙනි, මෙසේ ජරාවෙන්ද ව්‍යාධියෙන්ද මරණයෙන්ද ගෙනයනු ලබන ලොකයෙහි යමෙක් කයින් හික්මෙයිද, වචනයෙන් හික්මෙයිද, සිතින් හික්මෙයිද, එය පරලොව ගියාවූ ඔහුට ආරක්ෂාවද සැඟවෙන ගුහාවද සරණද පිහිටද වෙයි.

5. (1) "ජීවිතය මරණය කරා ගෙන යනු ලැබේ. ආයුෂය ඉතා ස්වල්පය. ජරාව විසින් මරණය කරා ගෙන යන්නහුට ආරක්ෂාවක් නැත. මරණය පිළිබඳව මේ තුන් භය දකිමින් සැප එළවන්නාවූ පින් කරන්නේය.

(2) මේ ලොකයෙහි ජීවත්වෙන පුද්ගලතෙම යම් හෙයකින් පින් කරයිද ඔහුගේ කයින් වචනයෙන් සහ සිතින් යම් හික්මීමක් වෙයිද, එය පරලොව ගියාවූ ඔහුට සැප පිණිස වෙයි.

2. **අදිත්තාගාර සූත්‍රයඃ-** (මේ සූත්‍රයේ 1, 2, 3 ඡෙද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 2, 3 ඡෙද මෙන් වෙත්.)

4. "බ්‍රාහ්මණයෙනි, මේ ලොකය ජරාවෙන්ද ව්‍යාධියෙන්ද මරණයෙන්ද, ඇවිල ගත්තේය. බමුණෙනි, මෙසේ ඇවිලගත් ලොකයෙහි කයින් වචනයෙන් සිතින් යම් හික්මීමක් වේනම් එය පරලොව ගිය ඔහුට ආරක්ෂාවද සැඟවෙන ගුහාවද සරණද පිහිටද වේයයි' වදාළේය.

(1) "ගෙයක් ගිණිගෙණ දන කල්හි යම්කිසි භාණ්ඩයක් බැහැර කෙළේද එය ඔහුට ප්‍රයෝජනය පිණිස වෙයි. යමක් එහි දැවේද එය ප්‍රයෝජනය පිණිස නොවේ.

(2) "මෙසේ ලොකය ජරාවෙන්ද, මරණයෙන්ද, දල්වන ලද්දේය. (එහෙයින්) දාහයෙන් ඒ ඇවිලගත් දෙය බැහැර

කරන්නේමය. දෙන ලද්ද මොනවට බැහැර කරන ලද්දේවේ.

(3) "මේ ලොකයෙහි ජීවත්වන පුද්ගලතෙම යම් හෙයකින් පින් කරයිද ඔහුගේ කයින් වචනයෙන් සහ සිතින් යම් හික්මීමක් වෙයිද පරලොව ගියාවූ ඔහුට සැප පිණිස වෙයි."

3. **සන්දිට්ඨික ධම්ම සූත්‍රයඃ-** 1. "ඉක්බිති එක්තරා බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සිහිකටයුතුවූ කථාව කොට එකත්පසෙක සිටියේය.

එකත්පසෙක සිටි ඒ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන්වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, ධර්මය තෙම ප්‍රත්‍යක්ෂව දැකිය හැකි ගුණ ඇත්තේයයි කියනු ලැබේ. භවත් ගෞතමයන් වහන්ස, කොපමණකින් ධර්මය තෙම ප්‍රත්‍යක්ෂව දැක්ක යුතු ගුණ ඇත්තේ වේද, කල් නොයවා දෙන ඵල ඇත්තේ වේද, එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේද, තමන්ගේ සිත්හි පමුණුවා ගතයුතු ගුණ ඇත්තේ වේද, නුවණැත්තන් විසින් තමන් කෙරෙහි ලා දතයුතු වේදැයි" ඇසීය.

2. "බ්‍රාහ්මණය, රාගයෙන් මඩනාලද්දාවූ රාගයෙන් විනාශ කරනලද සිත් ඇත්තාවූ ඇලුණාවූ පුද්ගලතෙම,

3. "තමන්ට දුක් පිණිසද සිතයි. අනුන්ට දුක් පිණිසද සිතයි. තමහට හා අනුන්ට දුක් පිණිසද සිතයි. මානසික දුකද විඳියි.

4. "රාගය ප්‍රහීණවූ කල්හි තමාහට දුක් පිණිසද නොසිතයි. අනුන්ට දුක් පිණිසද නොසිතයි. තමන්ට හා අනුන්ට දුක් පිණිසද නොසිතයි,"

5. "මානසික දුකද දොම්නසද නොවිඳී, බ්‍රාහ්මණය, මෙසේද ධර්මය තෙම ප්‍රත්‍යක්ෂව දැකිය හැකි ගුණ ඇත්තේය. කල් නොයවා දෙන ඵල ඇත්තේවේ, එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් සිත්හි පමුණුවා ගතයුතු ගුණ ඇත්තේය. නුවණැත්තන් විසින් තමන් කෙරෙහි ලා දතයුතු වෙයි.

6. "බමුණ, ද්වෙෂයෙන් මඩනාලද්දාවූ, ද්වෙෂයෙන් විනාශ කරණ ලද්දාවූ, සිත් ඇත්තාවූ පුද්ගලතෙම,

7. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

8. "ද්වෙෂය ප්‍රහීණවූ කල්හි තමාහට දුක් පිණිසද, නොසිතයි, අනුන්ට දුක් පිණිසද නොසිතයි. තමන්ට හා අනුන්ටද දුක් පිණිසද නොසිතයි.

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

10. "බමුණ, මෝහයෙන් මඩනාලද්දාවූ මෝහයෙන් විනාශ කරණ ලද්දාවූ සිත් ඇති පුද්ගල තෙම,

11-12. (මේ ඡේද මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

13. "මෝහය ප්‍රහීණවූ කල්හි තමාහට දුක් පිණිසද නොසිතයි, අනුන්ට දුක් පිණිසද නොසිතයි. තමන්ට හා අනුන්ටද දුක් පිණිසද නොසිතයි. (මේ සූත්‍රයේ 5 ඡේදය යොදාගත යුතුයි)"

14. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත්ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත්ය භවත් ගෞතමයන් වහන්ස, යම් සේ යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරණ ලද්දේද, වැසුණු දෙයක් විවෘත කරන්නේද, මංමුළාවූවෙකුට මාර්ගය කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි කියා තෙල් පහනක් දරන්නේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී. ඒ ඇසූ භවත් ගෞතමයන් වහන්සේගේද ධර්මයෙහිද සංඝයාගේද සරණ යමි. අද පටන් දිවිහිම්යෙන් සරණ ගිය උපාසකයකුකොට මා දන්නාසේක්වා"යි කීයේය.

4. **පරිබ්බාජක සන්දිඨික සූත්‍රයː-** 1. ඉක්බිති එක්තරා බ්‍රාහ්මණ පරිබ්‍රාජකයෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ සමග සතුටු විය. සිහිකටයුතුවූ කථාව කොට එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට

2-3. (මේ ඡේද මේ වර්ගයේ 3. සූත්‍රයේ 1 වෙනි ඡේදයේ 2 කොටස හා 2, 3, ඡේද මෙන් වෙත්.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "බමුණ රාගයෙන් මඬනාලද්දේ රාගයෙන් විනාශ කරණ ලද සිත් ඇත්තේ කයින් දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි. සිතින් දුසිරිතෙහි හැසිරෙයි. රාගය ප්‍රහීණවූ කල්හි කයින් දුශ්චරිතයෙහි නොහැසිරෙයි. වචනයෙන් දුශ්චරිතයෙහි නොහැසිරෙයි. සිතින් දුශ්චරිතයෙහි නොහැසිරෙයි. බමුණ, රාගයෙන් මඬනාලද්දේ රාගයෙන් විනාශ කරණ ලද්දේ ආත්මාර්ථයද තත්වූපරිද්දෙන් නොදනී. පරාර්ථයද තත්වූපරිද්දෙන් නොදනී. ආත්මාර්ථ පරාර්ථ දෙකද තත්වූ පරිද්දෙන් නොදනී. රාගය නැති කල්හි ආත්මාර්ථයද තත්වූ පරිද්දෙන් දනී. පරාර්ථයද තත්වූ පරිද්දෙන් දනී. ආත්මාර්ථ පරාර්ථ දෙකද තත්වූ පරිද්දෙන් දනී.

5. "බමුණ, මෙසේ වනාහී ධර්මය ප්‍රත්‍යක්ෂව දැකිය හැකි ගුණ ඇත්තේය. කල් නොයවා දෙන ඵල ඇත්තේවේ. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් සිත්හි පමුණුවා ගතයුතු ගුණ ඇත්තේය.

6. "බමුණ, ද්වෙෂයෙන් මඬනාලද්දේ ද්වෙෂයෙන් විනාශ කරණ ලද සිත් ඇත්තේ කයින් දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි. සිතින් දුසිරිතෙහි හැසිරෙයි. ද්වෙෂය ප්‍රහීණවූ කල්හි කයින් දුශ්චරිතයෙහි නොහැසිරෙයි. වචනයෙන් දුශ්චරිතයෙහි නොහැසිරෙයි. සිතින් දුශ්චරිතයෙහි නොහැසිරෙයි. බමුණ, ද්වෙෂයෙන් මඬනාලද්දේ ද්වෙෂයෙන් විනාශ කරණ ලද්දේ ආත්මාර්ථයද තත්වූ පරිද්දෙන් නොදනී. පරාර්ථයද තත්වූ පරිද්දෙන් නොදනී. ආත්මාර්ථ පරාර්ථ දෙකද තත්වූ පරිද්දෙන් නොදනී. ද්වෙෂය නැති කල්හි ආත්මාර්ථයද තත්වූ පරිද්දෙන් දනී. පරාර්ථයද තත්වූ පරිද්දෙන් දනී. ආත්මාර්ථ පරාර්ථ දෙකද තත්වූ පරිද්දෙන් දනී.

7. (මේ ඡෙදය මේ සූත්‍රයේ 5 ඡෙදය මෙනි)

8. බමුණ, මොහයෙන් මඬනාලද්දේ මෝහයෙන් විනාශ කරණ ලද සිත් ඇත්තේ තමන්ට දුක් පිණිසද සිතයි. අනුන්ට දුක් පිණිසද සිතයි. තමහට හා අනුන්ට දුක් පිණිසද සිතයි. මානසික දුකද දොම්නසද විඳියි. මොහය නැති කල්හි තමන්ට

දුක් පිණිස නොසිතයි. අනුන්ට දුක් පිණිස නොසිතයි. තමහට හා අනුන්ටද දුක් පිණිස නොසිතයි. මානසික දුකත් දොම්නසත් නොවිඳියි.

9. "බමුණ, මොහයෙන් මඬනාලද්දේ මොහයෙන් විනාශ කරණලද සිත් ඇත්තේ කයින් දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි. සිතින් දුසිරිතෙහි හැසිරෙයි. මොහය ප්‍රහීණවූ කල්හි කයින් දුශ්චරිතයෙහි නොහැසිරෙයි. වචනයෙන් දුශ්චරිතයෙහි නොහැසිරෙයි. සිතින් දුශ්චරිතයෙහි නොහැසිරෙයි. බමුණ, මොහයෙන් මඬනාලද්දේ මොහයෙන් විනාශ කරණ ලද්දේ ආත්මාර්ථයද තත්වූ පරිද්දෙන් නොදනී. පරාර්ථයද තත්වූ පරිද්දෙන් නොදනී, ආත්මාර්ථ පරාර්ථ දෙකද තත්වූපරිද්දෙන් නොදනී. මොහය නැති කල්හි ආත්මාර්ථයද තත්වූ පරිද්දෙන් දනී. පරාර්ථයද තත්වූ පරිද්දෙන් දනී. ආත්මාර්ථ පරාර්ථ දෙකද තත්වූ පරිද්දෙන් දනී.

10. (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි)

11. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 14 ඡේදය මෙනි.)

5. **සන්දිට්ඨික නිබ්බාන සූත්‍රයඃ-** 1. ඉක්බිත්තෙන් වනාහි ජානුස්සෝණි බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ජානුස්සොණී බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, නිර්වාණය තමන් විසින් දැක්ක යුතුයි, කියනු ලැබේ. භවත් ගෞතමයන් වහන්ස, කොපමණකින් වනාහි නිර්වාණය තමන් විසින් දැක්කයුතු වේද, කල් නොයවා පැමිණිය යුතු වේද, එව බලවයි පෙන්විය හැකි වේද ප්‍රතිපත්තියෙන් පැමිණිය යුතු වේද, පණ්ඩිතයන් විසින් තමන් කෙරෙහි ලා දතයුතු වේදැයි" ඇසූයේය.

2.-13. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 2 සිට 13 ඡේද මෙනි. මේ ඡේදවල 'ධර්මය' යන්නට 'නිර්වාණය' කියා යොදාගත යුතුය.)

14. "බමුණ, මෙසේ වනාහි නිර්වාණය තමන් විසින් දැක්ක යුතුය. බමුණ යම් කලක පටන් මේ නිරවශෙෂ වශයෙන් තෘෂ්ණාව ක්ෂය කිරීමයයි කියන ලද නිර්වාණ රසය විඳීද, නිරවශෙෂ වශයෙන් ද්වෙෂය ක්ෂයකිරීමයයි කියනලද නිර්වාණ රසය විඳීද, නිරවශෙෂ වශයෙන් මොහය ක්ෂයකිරීමයයි කියනලද නිර්වාණ සැපය විඳීද, බ්‍රාහ්මණය මෙසේ වනාහි නිර්වාණය තමන් විසින් දැකියයුතු වෙයි. කල් නොයවා පැමිණිය යුතු වෙයි. එව බලවයි පෙන්විය හැකි වෙයි. ප්‍රතිපත්තියෙන් පැමිණිය යුතු වෙයි. පණ්ඩිතයන් විසින් තමන් කෙරෙහිලා දතයුතු වෙයි.

15. (මේ ඡෙදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 14 ඡෙදය මෙනි)

6. **අධම්මරාග සූත්‍රය**:- 1. ඉක්බිති වනාහි එක්තරා මහාසාර බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ මහාසාර බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, පෙර කාලයෙහිවූ වයොවෘද්ධවූ මහලුවූ ඇදුරන්ගේ ඇදුරුවූ කියන්නාවූ බමුණන් වෙතින් මා විසින් මෙය අසන ලදී. (කුමක්ද යත්) පෙර කාලයෙහි මේ ලෝකය අවීචිය මෙන් මිනිසුන්ගෙන් පිරුණේ වෙයි. ගම් නියම ගම් රාජධානීහු පියස්සෙන් පියස්සට යාහැකි තරම් ගෙවලින් ගහණ වෙත් කියායි.

2. "භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයකින් මිනිසුන්ගේ ක්ෂයවීම වේද, තුනී බව පෙනේද, ගමුත් නොගම් වෙත්ද, නියම්ගමුත් නියම්ගම් නොවෙත්ද, නුවරවලුත් නගර නොවෙත්ද, ජනපදයෝත් ජනපද නොවෙත්ද,

3. ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍ය කවරේදැයි ඇසීය.

4. "බමුණ මේ කාලයෙහි මනුෂ්‍යයෝ අන්සතු දෙයෙහි ඇලීමයයි කියන ලද අධර්ම රාගයෙන් ඇලුනාහු විෂම ලොභයෙන් මඩනා ලද්දාහු නොනිසි වස්තූන්හි ඇලීමයයි කියන ලද මිථ්‍යා ධර්මයෙන් යුක්තවූවාහු වෙත්. අධර්ම රාගයෙන් ඇළුණාවූ විෂම ලෝභයෙන් මඩනා ලද්දාවූ මිථ්‍යා ධර්මයෙන්

යුක්තවූ ඔව්හු තියුණුවූ ආයුධ ගෙණ එකිනෙකා ජීවිතයෙන් තොර කෙරෙත්. ඒ කරණ කොටගෙණ බොහෝ මනුෂ්‍යයෝ මැරෙත්.

5. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි. 'භවත් ගෞතමයන්වහන්ස' වෙනුවට 'බමුණා' කියා යොදාගතයුතුයි)

6. මේ වනාහි ඊට හේතුවයි, මේ ඊට ප්‍රත්‍යයයි. බමුණ, නැවත අනිකක්ද කියමි. දැන් මනුෂ්‍යයෝ අධර්මරාගයෙන් ඇළුණාහු විෂම ලෝභයෙන් මඩනා ලද්දාහු මිථ්‍යා ධර්මයෙන් යුක්තවූවාහු වෙත්. මේ කාලයෙහි මනුෂ්‍යයෝ අන්සතු දෙයෙහි ඇලීමයයි කියන ලද මිථ්‍යා ධර්මයෙන් යුක්තවූවාහු වෙත්. අධර්ම රාගයෙන් ඇලුනාහු විෂම ලෝභයෙන් මඩනා ලද්දාහු නොනිසි වස්තූන්හි ඇලීමයයි කියන ලද මිථ්‍යාධර්මයෙන් යුක්තවූවාහු වෙත්. අධර්ම රාගයෙන් ඇළුණාවූ විෂම ලෝභයෙන් මඩනා ලද්දාවූ මිථ්‍යාධර්මයෙන් යුක්තවූ ඔවුන්ට වර්ෂාව මනාකොට නොවසියි. ඒ හේතුකොට ගෙණ දුර්භික්ෂය වෙයි. ගොවිපලවල් පාළුවෙත්. කරල් පණුවන් විද බොල්වෙත්. නොපූදිත්. ඒ කරණකොටගෙණ බොහෝ මනුෂ්‍යයෝ මැරෙත්.

7. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි. 'භවත් ගෞතමයන් වහන්ස' වෙනුවට 'බමුණ' කියා යොදාගත යුතුයි.) මේ වනාහි ඊට හෙතුවයි. මේ ඊට ප්‍රත්‍යය.

8. "බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි. දැන් මනුෂ්‍යයෝ අන්සතු දෙයෙහි ඇලීමයයි කියන ලද අධර්ම රාගයෙන් ඇලුනාහු විෂම ලෝභයෙන් මඩනා ලද්දාහු නොනිසි වස්තූන්හි ඇලීමයයි කියන ලද මිථ්‍යා ධර්මයෙන් යුක්තවූවාහු වෙත්. අධර්ම රාගයෙන් ඇළුණාවූ විෂම ලොභයෙන් මඩනා ලද්දාවූ මිථ්‍යා ධර්මයෙන් යුක්තවූ මනුෂ්‍යයන් වෙත්. අධිපති යක්ෂයෝ චණ්ඩ අමනුෂ්‍යයන් යවත්. එයින් බොහෝ මිනිසුන් මැරෙත්.

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි. 'භවත් ගෞතමයන් වහන්ස' වෙනුවට 'බමුණ' කියා යොදාගත යුතුයි.) මේ වනාහි ඊට හෙතුය. මේ ඊට ප්‍රත්‍යය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

10. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 14 ඡේදය මෙනි.)

7. **වච්ඡගොත්ත සූත්‍රය:-** 1. එකල්හි වනාහි වච්ඡගොත්ත නම් පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. "භවත් ගෞතමයන් වහන්ස, මා විසින් මේ කාරණය අසන ලදී. (එනම්)

2. ශ්‍රමණ ගෞතම තෙමේ මෙසේ කියයි. කෙසේද, 'මටම දන්දිය යුතුයි. අනුන්ට දන් නොදිය යුතුයි. මගේම ශ්‍රාවකයන්ට දන් දිය යුතුයි. අනුන්ගේ ශ්‍රාවකයන්ට දන් නොදිය යුතුයි. මටම දෙන ලද්ද මහත්වූ ඵලවිපාක ඇති වෙයි. අනුන්ට දෙන ලද්ද මහත්ඵල ඇති නොවෙයි. මගේම ශ්‍රාවකයන්ට දෙන ලද්ද මහත්ඵලයි. අන්‍යයන්ගේ ශ්‍රාවකයන්ට දෙනලද්ද මහත්ඵල නැත්තේය' කියායි.

3. "භවත් ගෞතමයන් වහන්ස, යම් කෙනෙක් මෙසේ කීවාහුද, (කෙසේද) (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යොදාගත යුතුයි.)

"කිමෙක්ද ඔව්හු භවත් ගෞතමයන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නෝ වෙත්ද, භවත් ගෞතමයන් වහන්සේට අසත්‍යයෙන් චොදනා නොකරද්ද කියන ලද්දට අනුකූලවූවක් කියත්ද, හේතු සහිතවූ කිසියම් කීමක් ගැරහිය යුතු බවට නොපැමිණේද, අපි වනාහි භවත් ගෞතමයන් වහන්සේට දොස් කියනු නොකැමැත්තෝ වම්හ."

4. 'වච්ඡය, යම් කෙනෙක් මෙසේ කියද්ද 'මටම දන් දිය යුතුයි, අනුන්ට දන් නොදිය යුතුයි, මගේම ශ්‍රාවකයන්ට දන් දිය යුතුයි, අනුන්ගේ ශ්‍රාවකයන්ට දන් නොදිය යුතුයි. මටම දෙන ලද්ද මහත්වූ ඵලවිපාක ඇති වෙයි. අනුන්ට දෙන ලද්ද මහත්ඵල ඇති නොවෙයි. මගේම ශ්‍රාවකයන්ට දෙනලද්ද මහත්ඵලයි. අන්‍යයන්ගේ ශ්‍රාවකයන්ට දෙනලද්ද මහත්ඵල නැත්තේය' කියායි. ඔවුහු මා විසින් කියනලද්දක් කියන්නෝ නොවෙත්. ඔව්හු අසත්‍යයෙන් දොෂාරොපණය කරත්. යමෙක් වනාහි දන් දෙන්නාවූ අනිකෙකු වළක්වාද, හෙතෙම තුන්දෙනෙකුට අන්තරාය කරන්නෙක්වේ. තුන් දෙනෙකුගේ

මංපහරණ සොරෙක් වැනිවෙයි. කවර තුන් දෙනෙකුන්ගේද, දායකයාගේ පිනට අනතුරු කරන්නෙක් වෙයි, ප්‍රතිග්‍රාහකයන්ගේ ලාභයට අනතුරු කරන්නෙක් වෙයි, පළමුකොටම තමා නසන ලද්දෙක් වෙයි, විනාශකරන ලද්දෙක් වෙයි.

5. "මම වනාහි මෙසේ කියමි. අසූචිමඩවළෙක් හෝ ගම්දොර ගවර වළෙක් හෝ යම් ඒ ප්‍රාණීහු වෙත්ද, එහි ඒ සත්වයෝ මෙයින් ජීවත් වෙත්වායි, සැළි සේදූ වතුරක් හෝ මළ සේදූ වතුරක් හෝ දමත්ද, වච්ඡය මම ඒ හේතුකොට ගෙණද පින්සිදුවීම කියමි. මනුෂ්‍යවූවෙකුට දුන්කල්හි පින් සිදුවීම කියනුම කවරේද?

6. "වච්ඡය, එතෙකුදු වුවත් මම ශීලවන්තයාට දෙන ලද්ද මහත්ඵල ඇත්තේයයි කියමි. දුශ්ශීලයාට දෙනලද්ද එසේ මහත් ඵල ඇත්තේ නොවෙයි. ඒ සිල්වත් තෙමේද අංග පසකින් දුරුවූයේද අංග පසකින් යුක්ත වූයේද වෙයි. කවර අංග පසක් දුරුවූවාහුද කාමච්ඡන්දය ප්‍රහීණවූයේ වෙයිද ව්‍යාපාදය ප්‍රහීණවූයේ වෙයිද, ථිනමිද්ධය ප්‍රහීණවූයේ වෙයිද, උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණවූයේ වෙයිද, විචිකිච්ඡාව ප්‍රහීණ වූයේ වේද, මේ පඤ්චාංගයෝ ප්‍රහීණවූවාහු වෙත්.

7. "කවර නම් අංග පසකින් යුක්තවූයේ වෙයිද, අශෛක්ෂවූ ශීල ස්කන්ධයෙන් සමන්විතවූයේ වෙයිද, අශෛක්ෂවූ සමාධි ස්කන්ධයෙන් සමන්විතවූයේ වෙයිද, අශෛක්ෂවූ ප්‍රඥා ස්කන්ධයෙන් සමන්විතවූයේ වෙයිද, අශෛක්ෂවූ විමුක්ති ස්කන්ධයෙන් සමන්විතවූයේ වෙයිද, අශෛක්ෂවූ ප්‍රත්‍යවෙක්ෂා ඥාන සමූහයෙන් යුක්තවූයේ වෙයිද මේ අංගපසින් යුක්තවූයේ වෙයි. මෙසේ පඤ්චාංගයක් ප්‍රහීණ කළාවූ පඤ්චාංගයකින් සමන්විතවූ ක්ෂීණාශ්‍රවයන් කෙරෙහි දෙන ලද්ද මහත්ඵල ඇත්තේයයි කියමියි" වදාළේය.

8. (1) "මෙසේ කළුපාටවූ හෝ සුදුපාටවූ හෝ රතුපාටවූ හෝ රන්වන්වූ හෝ කබරවූ හෝ තමන්ගේ වස්සන් හා සමාන වර්ණ ඇත්තාවූ හෝ පරෙවි වර්ණ ඇත්තාවූ හෝ දෙනුන් කෙරෙහිද,

**(2)** යම් ඒ කවර දෙනුන් කෙරෙහි හෝ බර ඉසිලිය හැකිවූ ශක්තිසම්පන්නවූ යහපත්වූ ජවයෙන් යුක්තවූ දැමුනාවූ වෘෂභයෙක් තෙම උපදීද.

ඔහුම බරෙහි යොදත්. ඔහුගේ ශරීර වර්ණය පරීක්ෂා නොකෙරෙත්, එපරිද්දෙන්ම මිනිසුන් අතුරෙහි යම් කිසි කුල සමූහයෙක්හි,

**(3) (4)** එනම්, ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ වෛශ්‍යකුලයෙහි හෝ ශුද්‍රකුලයෙහි හෝ සැඩොල් කුලයෙහි හෝ මල්ඉවතලන කුලයෙහි හෝ යම්කිසි ජාතියෙක්හි ධර්මයෙහි පිහිටියාවූ ශීලයෙන් යුක්තවූ සත්‍යය කියන්නාවූ පාපයෙහි ලජ්ජා ඇත්තාවූ ප්‍රහීණ කරණ ලද ජාතිය හා මරණය ඇත්තාවූ සම්පූර්ණවූ බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තාවූ,

**(5) (6)** බහා තබනලද ස්කන්ධාදි බර ඇත්තාවූ සතර යොගයෙන් බැහැරවූ සතර මාර්ගයෙන් කරණලද කෘත්‍ය ඇත්තාවූ සසරින් පරතෙරට ගියාවූ තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් අල්වානොගෙන කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවියාවූ මනා පැවතුම් ඇති දැමුණාවූ පුද්ගලයෙක් උපදීද,

**(7) (8) (9)** රාගාදී රජස් රහිතවූ එම කෙතෙහි වපුරන ලද දක්ෂිණාව මහත්වූ ඵල ඇත්තී වෙයි. කෙත නොදන්නාවූ නුවණ නැත්තාවූ ක්ෂත්‍ර විනිශ්චය නොඇසූ අඥානයෝ වනාහි මේ සස්නෙන් පිටත්හි දානයෙන් දෙත්. සත්පුරුෂයන් වෙත නොඑලඹෙත්. යම්කෙනෙක් ප්‍රඥාසම්පන්නවූ පණ්ඩිතයයි සම්මත කරණ ලද සත්පුරුෂයන් කරා එළඹෙත්ද-ඔවුන්ගේ ශ්‍රද්ධාවද සුගතයන්වහන්සේ කෙරෙහි හටගත් මුල් ඇත්තී පිහිටියාවන්නීය. ඒ පණ්ඩිතයෝ දෙව්ලොවටද පැමිණෙත්, මේ මිනිස්ලෙව්හි උතුම් කුලයෙක්හි හෝ උපදිත්. පිළිවෙළින් නිර්වාණයටද පැමිනෙත්යයි" (වදාළසේක).

8. **තිකණ්ණ සූත්‍රයː-** 1. එකල්හි තිකණ්ණ නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්ද එහි පැමිණියේය

පැමිණ භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එක් පසෙක හුන්නාවූ තිකණ්ණ නම් බමුණුතෙම වනාහි භාග්‍යවතුන්වහන්සේ ඉදිරියෙහි ත්‍රිවේදය දන්නාවූ බමුණාගේ ගුණ කියයි. ත්‍රිවේදය දන්නාවූ බමුණෝ මෙසේත් පණ්ඩිතයහ. ත්‍රිවේදය දන්නාවූ බ්‍රාහ්මණයෝ මෙසේත් බහුශ්‍රැතයහ.” කියායි

2. (i) “බ්‍රාහ්මණය, බ්‍රාහ්මණයකු ත්‍රිවිද්‍යා දන්නෙකැයි කෙසේ නම් පනවද්ද” 2. (ii) “භවත් ගෞතමයන් වහන්ස, මෙහි බමුණුතෙම මව් පසින්ද පිය පසින්ද (යන) දෙපසින් මොනවට උපන්නේ වේද. සුපිරිසිදු මව්කුස ඇත්තේවේද, හත්වෙනි මුතුන් පරම්පරාව දක්වා ජාතිවාදයෙන් (හෙවත්) මේ තෙම හීන ජාතියෙකැයි යන වචනයෙන් අත්හැර නොදමන ලද්දේ වේද, ආක්‍රොෂ නොකරණ ලද්දේ වේද, වේදමන්ත්‍ර හදාරන්නේවේද, වේදමන්ත්‍ර දරන්නේ වේද ක්‍රියා, කල්ප විකල්ප සහිතවූ ‘අක්ෂර ප්‍රභේද සහිතවූ (හෙවත්) ශික්ෂා නිරුක්ති ශාස්ත්‍ර සහිතවූ ඉතිහාසය පස්වෙනිකොට ඇත්තාවූ ත්‍රිවේදයෙහි පරතෙරට පැමිණියේ වේද පද හදාරන්නේ වේද ව්‍යාකරණ දන්නේවේද විතණ්ඩවාද ශාස්ත්‍ර ලක්ඛණ දීපන ශාස්ත්‍රයන්ගෙන් සම්පූර්ණ වේද, භවත් ගෞතමයන්වහන්ස, බමුණෝ මෙසේ වනාහි, ත්‍රිවිද්‍යා දත් බ්‍රාහ්මණයා පණවත්යයි” කීයේය.

3. (i) “බමුණ, බමුණෝ ත්‍රිවිද්‍යා දත් බ්‍රාහ්මණයා අන් ආකාරයකින් පනවත්. ආර්‍ය්‍ය විනයෙහි අන් ආකාරයකින් ත්‍රිවිද්‍යා ඇත්තෙක් වේයයි” වදාළේය.

(ii) “භවත් ගෞතමයන් වහන්ස, කෙසේනම් ආර්‍ය්‍ය විනයෙහි ත්‍රිවිද්‍යා ඇත්තෙක් වේද එසේ මට භවත් ගෞතම තෙමේ ධර්මදේශනා කරණසේක් නම් මැනවැයි” කීය.

(iii) ‘බමුණ, එසේ නම් අසව, යහපත්ව මෙනෙහි කරව, කියන්නෙමි”යි වදාළසේක “පින්වතුන් වහන්ස, එසේය”යි තිකණ්ණ බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මේ වදාළසේක. “බමුණ, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවෙකයෙන්

හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම් ඇති සිත හා එකට පහළවූ විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතිය පහව යාමෙන් උපෙක්ෂා ඇතිව වාසය කරයි. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ කයින් සැපක් විඳියි. උපෙක්ෂා ඇති සිත් ඇති සැප විහරණයකැයි' යමක් ආර්‍යයෝ කියත්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපදුක් දෙක නැතිවීමෙන් සොම්නස දොම්නස දෙක අස්තවීමට පෙරම දුක් නැති සැප නැති උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදුකම ඇති සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි.

3. (iv) හෙතෙම මෙසේ සිත සමාධියට පැමිණිකල්හි, පිරිසිදුවූ කල්හි, පවිත්‍රවූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවූ ක්ලේශයන් ඇති කල්හි මොළොක්වූ කල්හි කර්මණ්‍යව සිටි කල්හි ස්ථිරවූ කල්හි, පෙරවිසූ ස්කන්ධ පිළිවෙළ දක්නා ඥානය පිණිස සිත නමයි. හෙතෙම නන් වැදෑරුම්වූ පෙර ස්කන්ධ සිහිකරයි. ඒ කෙසේද?

4. "එක් ජාතියක්ද ජාති දෙකක්ද ජාති තුනක්ද ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් නැසෙන කල්පයන්ද, නොයෙක් වැඩෙන කල්පයන්ද නොයෙක් නැසෙන හා වැඩෙන කල්පයන්ද සිහිකෙරෙයි. (කෙසේද) 'මම අසවල් තැන උපන්නෙමි.

5. 'මෙබඳු නම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේ වීමි. මෙබඳු ශරීර වර්ණ ඇත්තෙක් වීමි. මෙබඳු ආහාර ඇත්තෙක් වීමි. මෙසේ සැප දුක් වින්දෙක් 'වීමි. මෙබඳු ආයුෂයක් කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුත වූයෙමි. අසවල් තැන උපනිමි.

6. "එහිද (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) ඒ මම එයින් චුතවූයෙම් මෙහි උපන්නෙක් වෙමියි, මෙසේ ආකාර සහිතවූ නාම ගෝත්‍ර වශයෙන් දැක්වීම් සහිතවූ නොයෙක් පෙර

විසූ ස්කන්ධයන් සිහිකෙරෙයි. ඔහු විසින් මේ පළමුවෙනි විද්‍යාව ලදී. 7 "අවිද්‍යාව නසනලදී. විද්‍යාව උපන්නීය අන්ධකාරය නසනලදී. ආලෝකය උපන්නේය. සිහි නුමුළාවෙන් යුක්තව කෙලෙස් තවන වීය්‍ර්‍යයෙන් යුක්තව, හරණලද ආත්ම ආශාව ඇතිව වාසය කරන්නහුට යම්සේ නම් එසේයි. (මෙහි මේ සූත්‍රයේ 3 (iv) ඡේදය යෙදිය යුතුයි.) මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින් සත්වයින් දකී. සත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිතනමයි.

8. හෙතෙම පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පවත්නාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීත වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණ ඇත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, කම්වූ පරිද්දෙන් පැමිණියාවූ සත්වයන් දැනගණී. කෙසේද?

9. "පින්වත්නි, මේ සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාග් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, බුද්ධාදී ආය්‍ර්‍යයන්ට උපවාද කරන්නේය. මිථ්‍යාදෘෂ්ටිකයෝය. මිසදිටුකම් සමාදන් වන්නෝය. ඔව්හු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුර්ගති නම්වූ විනාශව වැටෙන්නාවූ නිරයෙහි උපන්නාහුය. පින්වත්නි, මේ සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්තවූවාහු, වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු, මනෝ සුචරිතයෙන් යුක්ත වූවාහු බුද්ධාදී ආය්‍ර්‍යයන්ට උපවාද (ගර්හා) නොකරන්නාහුය. කාය සුචරිතයෙන් යුක්තවූවාහු, වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු, මනෝ සුචරිතයෙන් යුක්තවූවාහු, සම්‍යක්දෘෂ්ටි ඇත්තාහුය. සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන්වන්නාහුය. ඔව්හු කායයාගේ බිඳීමෙන් මරණින් පසු මනාගති ඇත්තාවූ සැපතින් ස්වර්ග ලෝකයෙහි උපන්නාහු කියායි. මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින්, චුතවන්නාවූද උපදින්නාවූද, හීනවූද, උසස්වූද, මනාවූ (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය පරිදි මිය පරලොව ගියාවූ සත්වයන් දැනගනිත්. ඔහු විසින් මේ දෙවෙනි විද්‍යාවලදී 10. (මෙහි මේ සූත්‍රයේ 7 ඡේදය

යෙදිය යුතුයි. එහිද 'චුතී උත්පත්තියන්ට' 'ආශ්‍රවක්ෂය' කියාද යෙදිය යුතුයි) මේ දුකයයි තත්වූ පරිද්දෙන් දැනගනී. මේ දුක් ඇතිවීමේ හේතුවයයි තත්වූපරිදි දැනගනිත්. මේ දුක් නැතිකිරීමයයි තත්වූ පරිදි දැනගනී. මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තත්වූ පරිදි දැනගනී.

11. මේ ආශ්‍රවයෝයයි තත්වූ පරිද්දෙන් දැනගනී. මේ ආශ්‍රවයන්ගේ හටගැන්මයයි තත්වූ පරිද්දෙන් දැනගනී. මේ ආශ්‍රවයන්ගේ නැතිවීමයයි තත්වූ පරිද්දෙන් දනී. මේ ආශ්‍රවයන් නැතිකිරීමට යන ප්‍රතිපදාව (මාර්ගයයි තත්වූ පරිද්දෙන් දනී මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඔහුගේ සිත කාම නැමැති කෙලෙසුන්ගෙන් මිදෙයි, භව නැමැති කෙලෙසුන්ගෙන් මිදෙයි. අවිද්‍යා නැමැති කෙලෙසුන්ගෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන නුවණවේ. ඉපදීම ක්ෂයවිය, බඹසර වැස නිමවන ලදී. කටයුතු කරණ ලදී. මත්තට යමක් නැතැයි දනී. ඔහු විසින් මේ තුන්වෙනි විද්‍යාව ලබන ලද්දීය. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදයේ 'අවිද්‍යා' යන තැන සිට 'එසේය' යන්නට යෙදිය යුතුයි)

12. 1. "උසස් පහත් වන ස්වභාවයක් නැති ශීලයෙන් යුක්තවූද ප්‍රඥාවෙන් යුක්තවූද ධ්‍යාන ඇත්තාවූද, යම් ක්ෂීණාශ්‍රව පුද්ගලයෙකුගේ සිත වශීභාවප්‍රාප්ත වූයේද එකඟවූයේද, අරමුණෙහි මොනවට පිහිටියේවේද,

2. "ක්ලෙශාන්ධකාරය නැසුවාවූ වීර්‍ය්‍යයෙන් යුත් මාරයා නැසුවාවූ දෙව්මිනිසුන්ට හිත වූ සියළු පව් දුරු කළාවූ ඒ පුද්ගලයා ත්‍රිවිද්‍යාවෙන් යුක්තයයි කීහු.

3. "ඒ ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූ නොමුළාව වාසය කරන්නාවූ චතුස්සත්‍යය අවබොධ කළාවූ අන්තිම ශරීරය දරන්නාවූ ගෞතම බුදුන්ගේ ශ්‍රාවක රහත්හු වඳිත්.

4. "යම් ක්ෂීණාශ්‍රවයෙක් තෙම පෙර විසූ කඳ පිළිවෙළ දන්නේද ස්වර්ගය හා අපාය දක්නේද තවද මනාව අවබොධකොට කටයුතු නිමවූයේ ජාතිය ක්ෂය කිරීමෙන් අර්හත් ඵලයට පැමිණියේද,

5. "මේ ත්‍රිවිද්‍යාවෙන් බ්‍රාහ්මණතෙම ත්‍රිවිද්‍යා ඇත්තේ ඔහු මේ ත්‍රිවිද්‍යා ඇත්තේයයි කියමි. අන්‍යයන් විසින් කියන ලද වචන මාත්‍රයක් ඇති අනිකෙකු ත්‍රිවිද්‍යා ඇත්තෙකැයි නොකියමි. බමුණ, මෙසේ වනාහි ආර්‍ය්‍ය විනයෙහි ත්‍රිවිද්‍යා ඇත්තෙක්වේයයි" වදාළේය.

13. "භවත් ගෞතමයන්වහන්ස අන්පරිද්දකින් බමුණන්ගේ ත්‍රිවිද්‍යාඇත්තෙක් වෙයි. ආර්‍ය්‍ය ජනයෙහි අන් පරිද්දෙකින් ත්‍රිවිද්‍යා ඇත්තෙක් වෙයි. භවත් ගෞතමයන් වහන්ස, ආර්‍ය්‍යවනයෙහි ත්‍රිවිද්‍යා ඇත්තා හා බමුණන්ගේ ත්‍රිවිද්‍යා ඇත්තා සොළොස්වන කලාවෙන් කලාවකුදු නොඅගියි.

14. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 14 ඡේදය මෙනි.)

9. **ජානුස්සොණි තෙවිජ්ජ සූත්‍රයඃ-** ඉක්බිති ජානුස්සොණි බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ජානුස්සොණි බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, යමෙකුහට යාගයක් හෝ මතක බතක් හෝ සැළි බතක් හෝ දානවස්තුවක් හෝ ඇත්තේ නම් ත්‍රිවිද්‍යා ඇති බ්‍රාහ්මණයන්ටම දෙන්නේයයි" කීය. "බ්‍රාහ්මණය, බමුණෝ කෙසේ නම් ත්‍රිවිද්‍යා ඇති බ්‍රාහ්මණයා පනවත්ද?

2. (මේ ඡේදය මේ වර්ගයේ 8 සූත්‍රයේ 2 (ii) 3 (i) (ii) ඡේද මෙන් වෙත්.) 3. "බමුණ එසේ නම් අසව, මනා කොට මෙනෙහි කරව, කියන්නෙමියි වදාළසේක. පින්වතුන් වහන්ස එසේයයි" ජානුස්සොණි බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්නේය.

4. "භාග්‍යවතුන් වහන්සේ බමුණ මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන් ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සංසිඳී මෙන් තමා තුළ පැහැදීම් ඇති සිතේ

එකඟකම ඇති විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතියගේ වෙන්වීමෙන් උපෙක්ෂා ඇතිව වාසය කරයි. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ කයින් සැපක් විඳියි. උපෙක්ෂා ඇති සිහි ඇති සැප විහරණයකැයි යමක් ආර්‍ය්‍යයෝ කියත්ද, ඒ තුන් වෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැප පහවීමෙන්ද දුක පහවීමෙන්ද සොම්නස දොම්නස දෙක අස්තවීමට පෙර දුක් නැති සැප නැති උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසුදුකම ඇති සතරවැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි.

**5. 6, 7, 8.** (මේ ඡෙද මේ වර්ගයේ 8 සූත්‍රයේ 3 (ii) 4 5 සහ 6 ඡෙදයේ 'එසේය' යන තැනට යොදාගත යුතුයි.)

**9.** හෙතෙම මෙසේ සිත සමාධියට පැමිණි කල්හි, පිරිසිදුවූ කල්හි, පවිත්‍රවූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇති කල්හි මොළොක්වූ කල්හි කර්මණ්‍යව සිටිකල්හි ස්ථිරවූ කල්හි ආශ්‍රවක්ෂය ඥාණය පිණිස හිත යොදයි. හෙතෙම මෙය දුකයයි තතුසේ දැනගනී. මෙය දුකට හේතුවයයි තතුසේ දැනගනියි. මෙය දුක නැති කිරීමයයි තතුසේ දැනගනියි. මේ දුක් නැතිකිරීමට පැමිණෙන ප්‍රතිපදාවයයි තතුසේ දැනගනී. මේ ආශ්‍රවයෝයි. තත්වූ පරිද්දෙන් දනී. මේ ආශ්‍රවයන් පහළවීමයයි තත්වූ පරිද්දෙන් දැනගනී. මේ ආශ්‍රවයන්ගේ නැතිවීමයයි තත්වූ පරිද්දෙන් දැනගනී. මේ ආශ්‍රවයන්ගේ නැතිවීමයයි තත්වූ පරිද්දෙන් දැනගනී. ආශ්‍රවයන් නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවයයි තතුසේ දැන ගනී. මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ ඒ භික්ෂුවගේ සිත කාමාශ්‍රවයෙන්ද මිදෙයි. භවාශ්‍රවයෙන්ද, අවිද්‍යාශ්‍රවයෙන්ද මිදෙයි. (ආශ්‍රවයන් කෙරෙන් සිත) මිදුන කල්හි මිදුනේයයි යන ඥාණය ඇතිවේ ජාතිය ක්ෂයවිය, බඹසර වැස නිමවන ලද්දේය, කටයුතු කරණ ලද්දේය. මෙයින් පසු අන් භවයක් නැත්තේයයි දැනගනී. මොහු විසින් මේ තුන්වෙනි (සෙස්ස 9 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය '1 වෙනි විද්‍යාව' යන්නට 'තුන්වෙනි' කියා යොදා 'එසේයි' යන තැන දක්වා යොදාගත යුතුයි.)

1. යමෙක් තෙම සීලව්‍රත දෙකින් සමන්විතවූයේ වේද, හරණ ලද ආත්මාලය ඇත්තේ වේද, සන්සිඳුනේ වේද, යමෙකුගේ සිත තමහට වසඟවූයේ වේද, එකඟවූයේ වේද, මොනවට අරමුණෙහි තබන ලද්දේ වේද,

(තිකණ්ණ සූත්‍රයේ ගාථාවල 4, 5, ඡේද මෙනි.)

10. (මේ ඡේදය මේ වර්ගයේ 8 සූත්‍රයේ 13 ඡේදය මෙනි)

11. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 14 ඡේදය මෙනි)

**10. සංගාරව සූත්‍රයː-** 1. ඉක්බිත්තෙන් වනාහි සංගාරව නම් බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක හුන්නාවූ සංගාරව නම් බ්‍රාහ්මණතෙම, "භවත් ගෞතමයන් වහන්ස අපි බමුණෝ වෙමු. යාග කරන්නෝද වෙමු. යාග කරවන්නෝද වෙමු. භවත් ගෞතමයන් වහන්ස, එහි යමෙක් යාග කරයිද යමෙක් යාග කරවයිද ඒ සියල්ලෝම මේ යාගය හේතුකොට ගෙණ නොයෙක් ශරීරයන්ගෙන් උපදනාවූ පුණ්‍ය ප්‍රතිපදාවට පිළිපන්නේ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, මේ යමෙක් තෙම යම් ඒ කුලයකින් ගිහිගෙයින් නික්ම, ශාසනයෙහි පැවිදිව එක්කෙනකුවූ තමාම දමනය කෙරෙයිද, එක්කෙනකුවූ තමාම සමනය කෙරේද, එක්කෙනෙක් වූ තමාම නිවී කෙලෙස් නිවීම කෙරේද, මෙසේ හෙතෙම යම් මේ ප්‍රව්‍රජ්ජාව හේතුකොටගෙණ එකම ශරීරයෙන් උපදනා පුණ්‍ය ප්‍රතිපදාවට පිළිපන්නේ වේය"යි කීයේය.

2. "බමුණ, එසේ වී නම් මේ කාරණයෙහි ලා තගෙන්ම අසන්නෙමි. තට යම්සේ කැමති වන්නේද එසේ එය ප්‍රකාශ කරන්නෙහිය. බ්‍රාහ්මණය, ඒ කුමකැයි හඟින්නෙහිද? අර්හත්වූ සම්මා සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තවූ ශෝභන ගමන් ඇත්තාවූ, ලෝකය දත්තාවූ, පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු වැනිවූ දෙව් මිනිසුන්ගේ ගුරුවූ, චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධකළාවූ, භාග්‍යවත්වූ, තථාගතතෙමේ මේ ලෝකයෙහි උපදියි. හෙතෙම මෙසේ කියයි. 'මෙහි එව්, මේ මාර්ගය වන්නේය, මේ ප්‍රතිපදාව වන්නේය.

යම් සේ එම මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට ප්‍රතිෂ්ඨාවවූ නිර්වාණය තෙමේම විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරෙම්ද' තෙපිද 'එව්, යම්සේ පිළිපන්නාවූ තෙපිද නිරුත්තරවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට ප්‍රතිෂ්ඨාවවූ නිර්වාණය තෙමේ ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඊට පැමිණ වාසය කරන්නාහුද, එසේ ඒ මාර්ගයෙන් පිළිපදිව්යයි' කියායි. එසේම මේ ශාස්තෘ තෙමේද ධර්ම දේශනා කෙරෙයි. අන්‍යයන්ද ඒ පිණිස පිළිපදිත්ද ඔව්හු වනාහි නොයෙක් සිය ගණන්ද වෙත්. නොයෙක් දහස් ගණන්ද වෙත්. නොයෙක් ලක්ෂ ගණන්ද වෙත්. බමුණ ඒ කුමකැයි හඟින්නෙහිද? මෙය මෙසේ ඇති කල්හි ප්‍රව්‍රජ්ජාව හෙතුකොටගෙන මෙය එක සිරුරකින් හටගන්නාවූ පුණ්‍ය ප්‍රතිපදාවක් වේද, නොයෙක් සිරුරුවලින් හටගන්නා ප්‍රතිපදාවක් වේදැ"යි වදාළේය.

3. "භවත් ගෞතමයන් වහන්ස, මෙසේ ඇති කල්හි මෙයද ප්‍රව්‍රජ්ජාව හෙතුකොටගෙන නොයෙක් ශරීරයෙන් හටගන්නාවූ පුණ්‍ය ප්‍රතිපදාවක් වේයයි" කීය. මෙසේ කී කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම සංගාරව බ්‍රාහ්මණයාට මෙසේ කීය.

4. "බ්‍රාහ්මණය, මේ ප්‍රතිපදා දෙක අතුරෙන් කවර නම් ප්‍රතිපදාවක් අඩු කටයුතු ඇත්තේද අඩු හිරිහැර ඇත්තේද වැඩි මහත් ඵල ඇත්තේද වැඩි මහත් ආනිසංස ඇත්තේද වේයයි හඟින්නෙහිද?" යනුයි.

5. "මෙසේ කී කල්හි සංගාරව බ්‍රාහ්මණ තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්සේද භවත් ආනන්දයන් වහන්සේ යම්බඳු වෙත්ද එබඳු උත්තමයෝ මා විසින් පිදිය යුත්තෝය, මා විසින් ප්‍රශංසා කටයුත්තෝය" යනුයි.

6. දෙවනුවත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ සංගාරව බ්‍රාහ්මණයාට මෙසේ කීවේය. (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) දෙවනුවත් සංගාරව බ්‍රාහ්මණ තෙමේ (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) තුන්වෙනුවත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ බ්‍රාහ්මණය කවරෙකු තොප විසින්

පිදිය යුතුද කවරෙකු තොප විසින් පැසසිය යුතුදැයි මෙසේ නොවිචාරමි. බ්‍රාහ්මණය මම තොපගෙන් මෙසේද විචාරමි. (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) තුන්වෙනුවත් සංගාරව බ්‍රාහ්මණ තෙමේ (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

7. ඉක්බිති වනාහි භාග්‍යවතුන් වහන්සේට මේ සිත වීය. 'තුන්වෙනි වර දක්වාත් සංගාරව නම් බ්‍රාහ්මණ තෙම ආනන්දයන් විසින් කරුණු සහිතව ප්‍රශ්න විචාරණ ලද්දේ නවත්වයි නො විසඳයි. මම ඔවුන් වෙහෙසීමෙන් මුදන්නෙම් නම් යහපත' කියායි භාග්‍යවතුන් වහන්සේ සංගාරව බ්‍රාහ්මණයාට මෙසේ කීය. "බමුණ අද රජ ගෙදර, රජ පිරිසෙහි එක්ව රැස්වූවන්ගේ අනිකුදු කථා අතර කවර නම් කථාවක් පහළවීදැයි" අසා වදාළේය.

8. "භවත් ගෞතමයන් වහන්ස, රජ ගෙදර රජ පිරිසෙහි එක්ව රැස්වූවන් අතර අද මේ කථාව පහළ විය.

9. "එනම් පූර්වකාලයෙහි වනාහි භික්ෂූහු ඉතා ස්වල්ප වූහ. එහෙත් බොහෝ දෙනෙක් මනුෂ්‍ය ධර්මයන්ට වඩා උසස්වූ ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය දැක්වූහ. දැන් වනාහි භික්ෂූහු ඉතා බොහෝද වෙත්. එහෙත් ස්වල්ප දෙනෙක්ම මනුෂ්‍ය ධර්මයන්ට වඩා උසස්වූ ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය දක්වත්ය යනුයි.

10. (මේ ඡේදය මේ සූත්‍රයේ 8 ඡේදය මෙනි.)

11. "බමුණ, මේ ප්‍රාතිහාර්‍ය්‍යයෝ තුන් දෙනෙක් වෙත්. කවර තුන්දෙනෙක්ද ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය, ආදේශනා ප්‍රාතිහාර්‍ය්‍ය, අනුශාසනීය ප්‍රාතිහාර්‍ය්‍ය (යන මේයි.) කුමක් ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය නම් වෙයිද? බමුණ, මෙහි ඇතැම් කෙනෙක් නන් වැදෑරුම්වූ ඍද්ධි දක්වත්. කෙසේද?

12. "එකෙක්ව බොහෝ දෙනෙක් වෙත්. බොහෝ දෙනෙක්ව එකෙක් වෙයි. ප්‍රකට බවටද මුවා වීමටද භිත්තිය සරසටද පවුර සරසටද පර්වත සරසටද අහසෙහි මෙන් නොගැටෙමින් යෙයි. ජලයෙහි මෙන් පොළවෙහිද කිමිදීම මතුවීම කෙරෙයි. පොළවෙහි මෙන් ජලයෙහිද දිය නොබෙදමින්

යයි. පියාපත් ඇති පක්ෂියෙකු මෙන් අහසෙහිද පයඅිංකයෙන් ගමන් කෙරෙයි. මෙසේ මහත් ඍද්ධි ඇත්තාවූ මෙසේ මහත් ආනුභාව ඇත්තාවූ මේ සඳ හිරු දෙදෙනද අතින් පිරිමදී. බඹලොව දක්වාත් කයින් වසඟයෙහි පවත්වයි. “බමුණ මේ ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යයයි කියනු ලැබේ.

13. ‘බමුණ ආදේශනා ප්‍රාතිහාර්‍ය්‍යය නම් කවරේද? මෙහි ඇතැම් කෙනෙක් දක්නට ලැබෙන ලකුණුවලින් තාගේ සිත මෙසේද වෙයි. තාගේ සිත මේ ආකාරයන්ද වෙයි. තාගේ සිත මෙසේද මෙසේද වේයයි ප්‍රකාශ කරයි. හෙතෙම ඉදින් බොහොමයක් කියාද එය එසේම වෙයි. අන් පරිද්දකින් නොවෙයි. බමුණ, මෙහි සමහර කෙනෙක් ලකුණුවලින් නොකියයි. එහෙත් මිනිසුන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ ශබ්ද අසා තාගේ සිත මෙසේද වේ. තාගේ සිත මේ ආකාරයෙන්ද වේ. තාගේ සිත මෙසේ මෙසේද වේයයි ප්‍රකාශ කරයි. හෙතෙම බොහොමයක් කියයි ඒ එසේම වෙයි. අන් ආකාරයකින් නොවෙයි. බ්‍රාහ්මණය මෙහි ඇතැම් කෙනෙක් ලකුණු වලින්ද නොකියයි. මිනිසුන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ ශබ්ද අසාද ප්‍රකාශ නොකරයි. එහෙත් කල්පනා කරන්නවුන්ගේ සලකා බලන්නවුන්ගේ දොඩවන ශබ්ද අසා තගේ සිත මෙසේය. තගේ සිත මේ ආකාරය තගේ සිත මෙබඳු යයි ප්‍රකාශ කරයි. හෙතෙම බොහොමයක් කියයි. එය එසේම වෙයි. අන් ආකාරයකින් නොවෙයි. බ්‍රාහ්මණය, මෙහි ඇතමෙක් සලකුණු වලින්ද ප්‍රකාශ නොකරයි. මිනිසුන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ ශබ්ද අසාද, ප්‍රකාශ නොකරයි. කල්පනා කරන්නවුන්ගේ කරුණු සලකන්නවුන්ගේ දොඩවන ශබ්ද අසාද ප්‍රකාශ නොකරයි. එහෙත් විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියට සමවැදුණහුගේ සිතින් සිත පිරිසිඳ මේ පින්වත්හුගේ චිත්ත සංඛාරයෝ මෙසේ පිහිටුවන ලදහ. මේ සිතට අනතුරුව අසවල් කල්පනාව කල්පනා කරන්නේයයි ප්‍රකාශ කරයි. හෙතෙම බොහොමයක් ප්‍රකාශ කරයි. එය එසේම වෙයි. අන් පරිද්දෙකින් නොවෙයි. බ්‍රාහ්මණය මේ ආදේසනා ප්‍රාතිහාර්‍ය්‍ය යයි කියනු ලැබේ.

14. "බ්‍රාහ්මණය, අනුශාසනා ප්‍රාතිහාර්‍ය්‍ය නම් කවරේද? බ්‍රාහ්මණය, මෙහි ඇතැමෙක් 'මෙසේ කල්පනා කරව්, මෙසේ කල්පනා නොකරව් මෙසේ මෙනෙහි කරව්, මෙසේ මෙනෙහි නොකරව්, මෙය දුරු කරව්. මීට පැමිණ වාසය කරව්යයි' මෙසේ අනුශාසනා කරයි. බ්‍රාහ්මණය මේ අනුසාසනා ප්‍රාතිහාර්‍ය්‍යයයි කියනු ලැබේ.

15. "බමුණ මේ ප්‍රාතිහාර්‍ය්‍යයෝ තුන්දෙන වෙත්. බමුණ තට මේ ප්‍රාතිහාර්‍ය්‍ය තුන අතුරින් කවර නම් ප්‍රාතිහාර්‍ය්‍යයක් වඩා යහපත් යයි කියාද වඩා ප්‍රණීතයයි කියාද, කැමති වේද?"

16. "භවත් ගෞතමයන් වහන්ස ඔවුන් අතුරෙන් යම් මේ ප්‍රාතිහාර්‍ය්‍යයක් වේද (එනම්) මෙහි ඇතැමෙක් නන් වැදෑරුම්වූ ඍද්ධි දක්වයිද. කෙසේද

(17 මේ ඡේදය මේ සූත්‍රයේ 12 ඡේදය මෙනි.)

18. "භවත් ගෞතමයන් වහන්ස, මේ ප්‍රාතිහාර්‍ය්‍යය යමෙක් කෙරේ නම් හෙතෙමේම එය විඳී. යමෙක් කෙරේ නම් එය ඔහුටම වේ. භවත් ගෞතමයන් වහන්ස මට මේ ප්‍රාතිහාර්‍ය්‍යය මායාවක් මෙන් වැටහෙයි.

19. භවත් ගෞතමයන් වහන්ස, යම් මේ ප්‍රාතිහාර්‍ය්‍යයක් වේද (එනම්) මෙහි ඇතැමෙක් තොපගේ සිත මෙසේද වේ. තොපගේ සිත මේ ප්‍රකාරයෙන් වේ. තොපගේ මනස මෙසේද වේ. හෙතෙම බොහෝද කියයි. මෙය මෙසේ මේ අන් පරිද්දෙකින් නොවේ. භවත් ගෞතමයන් වහන්ස, මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් නිමිත්තෙන් නොකියයි. එතකුදු මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ ශබ්දය අසා කියයි. තොපගේ සිත මෙසේය. තොපගේ සිත මේ ප්‍රකාරයෙනි. තොපගේ සිත මෙසේය කියායි. හෙතෙම බොහෝ කීවත් එසේම වේ නොවරදී. භවත් ගෞතමයන් වහන්ස මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් නිමිත්තෙන් නොකියයි. මනුෂ්‍යයන්ගේ අමනුෂ්‍යයන්ගේ දෙවියන්ගේ ශබ්දය අසා කියයි. නැවතද තර්ක කර කල්පනා කර නිදිගත්තවුන්ගේ හා මත්වූවන්ගේ ශබ්ද අසා කියයි. එසේත් නොකියයි එතකුදු වුවත්

විතර්ක රහිත විචාර රහිත ධ්‍යානයට සමවැදුනහුන්ගේ සිත දැන කියයි. මේ පින්වත්හුගේ සිත යම්සේද මේ සිතට පසුව අසවල් සිත උපදීයයි හෙතෙම බොහෝ කීවත් වෙනස් නොවේ, භවත් ගෞතමයන් වහන්ස මේ ප්‍රාතිහාර්‍ය්‍යයකි, යමෙක් එය කරයිද, හෙතෙම එය දනී. යමෙක් එය කරයිද ඔහුට එයම වේ. භවත් ගෞතමයන් වහන්ස මේ ප්‍රාතිහාර්‍ය්‍යද මායාවක් සේ පෙනේ.

**20.** භවත් ගෞතමයන් වහන්ස, යම් මේ ප්‍රාතිහාර්‍ය්‍යයක් වේද, එනම් මෙහි ඇතැම් කෙනෙක් මෙසේ කල්පනා කරව්. මෙසේ කල්පනා නොකරව් මෙසේ මෙනෙහි කරව්. මෙසේ මෙනෙහි නොකරව්. මෙය අත්හරිව් මීට පැමිණ වාසය කරව්ය කියායි.

**21.** "භවත් ගෞතමයන් වහන්ස මේ ප්‍රාතිහාර්‍ය්‍ය තුන අතුරින් මේ ප්‍රාතිහාර්‍ය්‍යම ඉතා යහපත්ය, ඉතා ප්‍රණීතයයි රුචිවෙයි. භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්‍ය්‍යයයි. අද්භූතයි, භවත් ගෞතමයන් විසින් මෙය ඉතා මනාකොට වදාරණ ලද්දේය. අපි මේ ප්‍රාතිහාර්‍ය්‍ය තුනින් යුක්තවූ භවත් ගෞතමයන් වහන්සේ දරාගණිමු. භවත් ගෞතමයන් වහන්සේ නානාප්‍රකාර ඍද්ධි පායි. කෙසේද එකෙක්ව බොහෝ දෙනෙක් වේ. බොහෝව සිට එකෙක් වෙයි. පෙනෙන බවට සරස් බවට බිත්ති සරසට පවුර සරසට පර්වත සරසටද අහසෙහි මෙන් පොළොවෙහි නොගැටෙමින් යයි. ජලයෙහි මෙන් පොළොවෙහිත් මතුවීම කිමිදීම කරයි. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබෙදමින් යයි. අහසෙහි පලඟින් ගමන් කෙරෙයි. මෙසේ මහත් ඍද්ධි ඇත්තාවූ මහත් ආනුභාව ඇත්තාවූ මේ සඳ හිරු දෙදෙන අතින් පිරිමදියි. බඹලොව දක්වා කයින් වසඟයට පමුණුවයි.

**22.** "භවත් ගෞතමයන් වහන්සේ විතර්ක රහිත විචාර රහිත සමාධියට සමවැදුනහුගේ සිතින් සිත දනියි. මේ පින්වත්හුගේ සිත යම්සේ පිහිටුවන ලද්දේද මේ සිතට පසුව මෙනම් විතර්කයක් සිතන්නාහුයයි කියායි භවත් ගෞතමයන් වහන්සේ, මෙසේ සිතව් මෙසේ නොසිතව් මෙසේ මෙනෙහි

කරව්. මෙසේ මෙනෙහි නොකරව්, මෙය අත්හරිව්, මෙයට පැමිණ වාසය කරව්, මෙසේ අනුශාසනා කරයි.

23. "බමුණ, ඒකාන්තයෙන්ම තා විසින් මාගේ ගුණ සමීපයට ගෙන මේ වචනය ප්‍රකාශ කරණ ලද්දීය. එසේ නමුත් තට මම ප්‍රකාශ කරන්නෙමි. බමුණ මම වනාහි නානාප්‍රකාර ඍද්ධි කරමි. කෙසේද,

24. ("මේ ඡෙදය මේ සූත්‍රයේ 12 ඡෙදය මෙනි)

25. "බමුණ මම වනාහි විතර්ක රහිත විචාර රහිත සමාධියට පැමිණි මා මේ පින්වත්හුගේ සිත යම්සේ පිහිටුවීද මේ සිතට පසුව මෙනම් විතර්කයක් සිතන්නේයයි ඔහුගේ සිත මා විසින් දැන ප්‍රකාශ කරමි. බමුණ මම වනාහි මෙසේ අනුශාසනා කරමි. මෙසේ සිතව. මෙසේ නොසිතව. මෙසේ මෙනෙහි කරව මෙසේ මෙනෙහි නොකරව. මෙය අත් හරිව්. මීට පැමිණ වාසය කරව් යයි" කියායි.

23 "බමුණ, ඒකාන්තයෙන්ම තා විසින් මාගේ ගුණ සමීපයට ගෙන මේ වචනය ප්‍රකාශ කරණ ලද්දීය. එසේ නමුත් තට මම ප්‍රකාශ කරන්නෙමි. බමුණ මම වනාහි නානාප්‍රකාර ඍද්ධි කරමී. කෙසේද,

24. ("මේ ඡෙදය මේ සූත්‍රයේ 12 ඡෙදය මෙනි)

25. "බමුණ මම වනාහි විතර්ක රහිත විචාර රහිත සමාධියට පැමිණි මා මේ පින්වත්හුගේ සිත යම්සේ පිහිටුවීද මේ සිතට පසුව මෙනම් විතර්කයක් සිතන්නේයයි ඔහුගේ සිත මා සිතින් දැන ප්‍රකාශ කරමි. බමුණ මම වනාහි මෙසේ අනුශාසනා කරමි. මෙසේ සිතව. මෙසේ නොසිතව. මෙසේ මෙනෙහි කරව මෙසේ මෙනෙහි නොකරව. මෙය අත් හරිව්. මීට පැමිණ වාසය කරව් යයි" කියායි.

26. "භවත් ගෞතමයන් වහන්ස, මේ ප්‍රාතිහාර්‍ය්‍ය තුනින් යුක්තවූ භවත් ගෞතමයන් වහන්සේ හැර යම් අන්‍යවූ එක භික්ෂුවකුත් ඇත්තේද "බමුණ සීයක්ද නොවෙයි. දෙසීයක්ද නොවෙයි. තුන් සීයක්ද නොවෙයි. සාර සීයක්ද නොවෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පන් සීයක්ද නොවෙයි. යලිදු මේ ප්‍රාතිහාර්‍ය්‍යය තුනින් තුනින් යුත් භික්ෂූහු බොහෝවෙත් යයි' වදාළේය. "භවත් ගෞතමයන් වහන්ස ඒ භික්ෂූහු දැන් කොතැන්හි වෙසෙද්ද" "බමුණ මේ භික්ෂු සංඝයා අතරෙහිම යයි" (වදාළේය)

27. මේ ඡෙදය මේ වර්ගයෙහි 3 සූත්‍රයේ 14 ඡෙදය මෙනි.)

**පළමුවැනි බ්‍රාහ්මණ වර්ගය නිමි.**

---

## 7. මහා වර්ගය.

**11. (මහා) තිත්ථායතන සූත්‍රය:-** 1. "මහණෙනි, පණ්ඩිතයින් විසින් කරුණු ඇසිය යුත්තාවූ හෙතු විමසිය යුත්තාවූ අනුශාසනා කළ යුත්තාවූ යම් ඒ තීර්ථකයන්ගේ දෘෂ්ටි කෙනෙක් පරම්පරා වශයෙන් (අතීතයට) ගොස් අක්‍රියා මාත්‍රයක පිහිටක්ද තීර්ථකයන්ගේ එබඳුවූ මේ මිථ්‍යා දෘෂ්ටි තුනක් වෙත්.

2. කවර තුනක්ද? "මහණෙනි, මේ පුරුෂ පුද්ගලතෙම යම් කිසි සැපයක් හෝ දුකක් හෝ නොදුක් නො සැපවූ යමක් හෝ විඳීද ඒ සියල්ල පූර්වකර්ම හෙතුවෙන්ම වේයයි කියන්නාවූ මෙසේ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ.

"මහණෙනි, මේ පුරුෂ පුද්ගල තෙම යම්කිසි සැපයක් හෝ දුකක් හෝ නොදුක් නො සැපවූ යමක් හෝ විඳීද ඊශ්වරයා විසින් මවන ලද බැවින් යයි මෙසේ කියන්නාවූ මෙසේ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. මේ පුරුෂ පුද්ගල තෙම යම්කිසි සැපයක් හෝ දුකක් හෝ නොදුක් නො සැපවූ යමක් හෝ විඳීද හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීයයි. මෙසේ කියන්නාවූ මෙසේ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ.

3. "මහණෙනි, ඔවුනතුරෙන් මේ පුරුෂ පුද්ගල තෙම යම්කිසි සැපයක් හෝ දුකක් හෝ මැදහත් බවක් හෝ විඳීද ඒ සියල්ල පෙර කරණ ලද කර්මය හේතුකොටගෙණ යයි මෙසේ කියන්නාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ යම් ඒ මහණ බමුණෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වෙද්ද ඔවුන් වෙත පැමිණ මෙසේ කියමි. (කෙසේද) 'ආයුෂ්මතුනි, තෙපි මේ පුරුෂ පුද්ගල තෙම යම්කිසි සැපයක් හෝ දුකක් හෝ නොදුක් නොසැපවූ යමක් විඳීද, පෙර කරණ ලද කර්මය හේතුකොට ගෙණ යයි මෙබඳු වාද ඇත්තාහුය, මෙබඳු දෘෂ්ටි ඇත්තාහුය යනු සැබෑද? කියායි.

4. "මෙසේ මා විසින් අසන ලද්දාවූ ඔව්හු ඉදින් එසේ යයි කියත් නම් මම ඔවුන්ට මෙසේ කියමි. (කෙසේද) 'ආයුෂ්මතුනි, එසේවීනම් පෙර කරණ ලද කර්මය හේතු කොට ගෙන, ප්‍රාණඝාත කරන්නෝ වන්නාහුය. පෙර කරන ලද කර්මය නිසා සොරකම් කරන්නෝ වන්නාහුය. පෙර කරන ලද කර්මය නිසා බඹසර නැත්තෝ වන්නාහුය. පෙර කරනලද කර්මය නිසා බොරු කියන්නෝ වන්නාහුය. පෙර කරන ලද කර්මය නිසා කේළාම් කියන්නෝ වන්නාහුය. පෙර කරන ලද කර්මය නිසා පරුෂ වචන කියන්නෝ වන්නාහුය. පෙර කරන ලද කර්මය නිසා ප්‍රලාප කියන්නෝ වන්නාහුය. පෙර කරන ලද කර්මය නිසා අභිධ්‍යාව බහුල කොට ඇත්තෝ වන්නාහුය පෙර කරණ ලද කර්මය නිසා ව්‍යාපාද සිත් ඇත්තෝ වන්නාහුය. පූර්වකෘත කර්ම හේතුවෙන් මිථ්‍යාදෘෂ්ටි ඇත්තෝ වන්නාහුයයි' කියායි.

5. "මහණෙනි, පෙර කරණ ලද්ද වනාහි සාරවශයෙන් ගන්නාවුන්ට මෙය කටයුතුයි කියා හෝ මෙය නොකටයුතුය කියා හෝ කැමැත්තක් හෝ උත්සාහයක් හෝ නැත්තේය. මෙසේ කටයුතු නොකටයුතු දෙක වනාහි සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් නොලබන කල්හි මුළාවූ සිහියෙන් ආරක්ෂා රහිතව වාසයකරන්නවුන්ට තම තමන්ගේ කරුණු සහිතවූ ශ්‍රමණ වාදයක් නැත. මහණෙනි, මේ වනාහි මෙබඳු වාද ඇත්තාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඒ මහණ බමුණන් කෙරෙහි මාගේ කරුණු සහිතවූ පළමුවැනි නිග්‍රහය වේ.

6. "මහණෙනි, මේ පුරුෂ පුද්ගල තෙම යම්කිසි සැපයක් හෝ දුකක් හෝ නොදුක් නොසැපවූ යමක් හෝ විඳීද ඒ සියල්ල ඊශ්වරයා විසින් මඪන ලද බැවින් යයි මෙසේ කියන්නාවූ මෙසේ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. මෙබඳු

දෘෂ්ටි ඇත්තාවූ යම් ඒ මහණ බමුණෝ වෙත්ද ඔවුන් වෙත පැමිණ මෙසේ කියමි. "ආයුෂ්මතුනි, තෙපි මේ පුරුෂ පුද්ගලතෙම යම් කිසි සැපයක් හෝ දුකක් හෝ නොදුක් නොසැපවූ යමක් හෝ විඳීද ඊශ්වරයා විසින් මවනලද බැවින්යයි මෙබඳු වාද ඇත්තහුය. මෙබඳු දෘෂ්ටි ඇත්තාහුය යනු සැබෑද?' කියායි.

"මෙසේ මා විසින් අසනලද්දාවූ ඔව්හු ඉදින් එසේ යයි කියත් නම් මම ඔවුන්ට මෙසේ කියමි. (කෙසේද) 'ආයුෂ්මතුනි එසේවීනම් ඊශ්වරයා විසින් මැවීම නිසා ප්‍රාණඝාත කරන්නෝ වන්නාහුය, ඊශ්වරයා විසින් මැවීම නිසා සොරකම් කරන්නෝ වන්නාහුය. ඊශ්වරයා විසින් මැවීම නිසා බඹසර නැත්තෝ වන්නාහුය. ඊශ්වරයා විසින් මැවීම නිසා බොරුකියන්නෝ වන්නාහුය. ඊශ්වරයා විසින් මැවීම නිසා කේළාම් කියන්නෝ වන්නාහුය. ඊශ්වරයා විසින් මැවීම නිසා එරුෂ වචන කියන්නෝ වන්නාහුය. ඊශ්වරයා විසින් මැවීම නිසා ප්‍රලාප කියන්නෝ වන්නාහුය. ඊශ්වරයා විසින් මැවීම නිසා අභිධ්‍යාව බහුලකොට ඇත්තෝ වන්නාහුය. ඊශ්වරයා විසින් මැවීම නිසා ව්‍යාපාද සිත් ඇත්තෝ වන්නාහුය. ඊශ්වරයා විසින් මැවීම නිසා මිථ්‍යාදෘෂ්ටි ඇත්තෝ වන්නාහු යයි' කියායි.

7. "මහණෙනි, ඊශ්වරයා විසින් මැවීම වනාහි සාර වශයෙන් ගන්නවුන්ට මෙය කටයුතුය කියා හෝ මෙය නොකට යුතුය කියා හෝ කැමැත්තක් හෝ උත්සාහයක් හෝ නැත්තේය. මෙසේ කටයුතු නොකටයුතු දෙක වනාහි සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් නොලබන කල්හි මුළාවූ සිහියෙන් ආරක්ෂා රහිතව වාසය කරන්නවුන්ට තමතමන්ගේ කරුණු සහිතවූ ශ්‍රමණ වාදයක් නැත. මහණෙනි, මේ වනාහි මෙබඳු වාද ඇත්තාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඒ මහණ බමුණන් කෙරෙහි මාගේ කරුණු සහිතවූ දෙවැනි නිග්‍රහය වේ

8. "මහණෙනි, මේ පුරුෂ පුද්ගල තෙම යම්කිසි සැපයක් හෝ දුකක් හෝ නොදුක් නොසැපවූ යමක් හෝ විඳීද ඒ සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීය යයි මෙසේ කියන්නාවූ මෙසේ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. මෙබඳු

දෘෂ්ටි ඇත්තාවූ යම් ඒ මහණ බමුණෝ වෙත්ද ඔවුන් වෙත පැමිණ මෙසේ කියමි. 'ආයුෂ්මතුනි, තෙපි මේ පුරුෂ පුද්ගලතෙම යම්කිසි සැපයක් හෝ දුකක් හෝ නොදුක් නොසැපවූ යමක් හෝ විඳීද ඒ සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීයයි මෙබඳු වාද ඇත්තාහුය, මෙබඳු දෘෂ්ටි ඇත්තාහුය යනු සැබෑද?' කියායි.

"මෙසේ මා විසින් අසනලද්දාවූ ඔවුහු ඉදින් එසේයයි කියත් නම් මම ඔවුන්ට මෙසේ කියමි. (කෙසේද?) 'ආයුෂ්මතුනි, එසේවීනම් සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා ප්‍රාණඝාත කරන්නෝ වන්නාහුය. සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා සොරකම් කරන්නෝ වන්නාහුය. සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා බඹසර නැත්තෝ වන්නාහුය. සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා බොරුකියන්නෝ වන්නාහුය. සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා කේළාම් කියන්නෝ වන්නාහුය. සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා ඵරුෂ වචන කියන්නෝ වන්නාහුය. සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා ප්‍රලාපකියන්නෝ වන්නාහුය. සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා අභිධ්‍යාව බහුලකොට ඇත්තෝ වන්නාහුය. සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා ව්‍යාපාද සිත් ඇත්තෝ වන්නාහුය. සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම නිසා මිථ්‍යාදෘෂ්ටි ඇත්තෝ වන්නාහු යයි' කියායි.

**9.** "මහණෙනි, සියල්ල හේතුවක් ප්‍රත්‍යයක් නැතිව වීම වනාහි සාරවශයෙන් ගන්නවුන්ට මෙය කටයුතුය කියා හෝ මෙය නොකටයුතුය කියා හෝ කැමැත්තක් හෝ උත්සාහයක් හෝ නැත්තේය. මෙසේ කටයුතු නොකටයුතු දෙක වනාහි සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් නොලබන කල්හි මුළාවූ සිහියෙන් ආරක්ෂා රහිතව වාසයකරන්නවුන්ට තමතමන්ගේ කරුණුසහිතවූ ශ්‍රමණ වාදයක් නැත. මහණෙනි, මේ වනාහි මෙබඳු වාද ඇත්තාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඒ මහණ බමුණන් කෙරෙහි මාගේ කරුණු සහිතවූ තුන්වැනි නිග්‍රහය වේ."

**10.** (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

11. "මහණෙනි, ශ්‍රමණයන් විසින්ද, බමුණන් විසින්ද, සෙසු නැණවතුන් විසින්ද, නිග්‍රහ නොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ මේ ධර්මය මා විසින් දෙශනා කරණ ලද්දේය. මහණෙනි, නිග්‍රහනොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ කවර නම් ධර්මයක් මා විසින් දෙශනා කරන ලද්දේද? මහණෙනි, මේ ධාතු සයයයි නිග්‍රහ නොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ ධර්මය මා විසින් දේශනා කරණ ලද්දේය, මේ ඵස්සායතන සයයයි නිග්‍රහනොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළහැක්කාවූ පිළිකුල් නොකළහැක්කාවූ ධර්මය මා විසින් දෙශනා කරණ ලද්දේය. මේ අටළොස් මනොප විචාරයයි. නිග්‍රහ නොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ මේ ධර්මය මා විසින් දෙශනා කරන ලදී. මේ සතර ආර්‍ය්‍ය සත්‍යයයි. නිග්‍රහ නොකොට හැක්කාවූ කිලුටු නොකළහැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ ධර්මය මා විසින් දේශනා කරණ ලද්දේය.

12. "මහණෙනි, මා විසින් නිග්‍රහ නොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ මේ ධාතු සයයයි ධර්මය දෙශනා කරන ලදැයි මෙසේ කියන ලද්දේය. මෙය කුමක් නිසා කියන ලද්දේද? මහණෙනි, මේ ධාතුහු සයක් වෙත්. එනම්, පඨවි ධාතුය, අපොධාතුය, තේජෝධාතුය, වායොධාතුය, ආකාශ ධාතුය යන මේයි.

13. "මහණෙනි, මේ ධාතු සයයයි. නිග්‍රහ නොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ ධර්මය මා විසින් දෙශනා කරන ලදි.

14. "මහණෙනි, මේ ඵස්සායතනයෝ සදෙනෙක් වෙත්ය, යන නිග්‍රහ නොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ

චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ ධර්මය දෙශනා කරන ලදැයි මා විසින් කියන ලදී. එය කුමක් පිණිස කියන ලද්දේද මහණෙනි, ඵස්සායතනයෝ මේ සදෙනෙක් වෙත්. චක්ඛු ඵස්සායතනයද, සොත ඵස්සායතනයද, ඝාන ඵස්සායතනයද, ජිව්හා ඵස්සායතනයද, කාය ඵස්සායතනයද, මනොසම්ඵස්සායතනයද වෙත්. මහණෙනි, නිග්‍රහ නොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ මේ ඵස්සායතන සයයයි මා විසින් නිග්‍රහ නොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ ධර්මය දෙශනා කරන ලදැයි යමක් කියන ලද නම් එය මේ සඳහා කියන ලදී.

15. "මහණෙනි, මා විසින් මේ අටළොස් මනොපවිචරයයි නිග්‍රහ නොකට හැක්කාවූ කිලුටු නොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ මා විසින් කියන ලදැයි මෙසේ යමක් කියන ලද්දේද එය කුමක් සඳහා කියන ලද්දේද? ඇසින් රූපයක් දැක සොම්නසට කරුණුවූ රූපයෙහි සිත හසුරුවයි. දොම්නසට කරුණුවූ රූපයෙහි සිත හසුරුවයි. උපෙක්ෂාවට කරුණුවූ රූපයෙහි සිත හසුරුවයි.

"කණින් ශබ්දයක් අසා සොම්නසට කරුණුවූ ශබ්දයෙහි සිත හසුරුවයි, දොම්නසට කරුණුවූ ශබ්දයෙහි සිත හසුරුවයි උපෙක්ෂාවට කරුණුවූ ශබ්දයෙහි සිත හසුරුවයි.

"නාසයෙන් ගඳක් ආඝ්‍රානයකොට සොම්නසට කරුණුවූ ගන්ධයෙහි සිත හසුරුවයි, දොම්නසට කරුණුවූ ගන්ධයෙහි සිත හසුරුවයි, උපෙක්ෂාවට කරුණුවූ ගන්ධයෙහි සිත හසුරුවයි.

"දිවෙන් රසයක් විඳ සොම්නසට කරුණුවූ රසයෙහි සිත හසුරුවයි, දොම්නසට කරුණුවූ රසයෙහි සිත හසුරුවයි, උපෙක්ෂාවට කරුණුවූ රසයෙහි සිත හසුරුවයි.

"කයින් ස්පර්ශයක් ස්පර්ශකොට සොම්නසට කරුණුවූ ස්පර්ශයෙහි සිත හසුරුවයි, දොම්නසට කරුණුවූ ස්පර්ශයෙහි සිත හසුරුවයි, උපෙක්ෂාවට කරුණුවූ ස්පර්ශයෙහි සිත හසුරුවයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"සිතින් ධර්මයක් දැන සොම්නසට කරුණුවූ ධර්මයෙහි සිත හසුරුවයි, දොම්නසට කරුණුවූ ධර්මයෙහි සිත හසුරුවයි, උපෙක්ෂාවට කරුණුවූ ධර්මයෙහි සිත හසුරුවයි. මහණෙනි, මේ සිත හැසිරෙන අටළොස් තැනයයි ශ්‍රමණයන් විසින් හෝ බ්‍රාහ්මණයන් විසින් හෝ නුවණැත්තන් විසින් හෝ නිග්‍රහ නොකට හැක්කාවූ කිලිටිනොකළ හැක්කාවූ චොදනා නොකළ හැක්කාවූ පිළිකුල් නොකළ හැක්කාවූ ධර්මය මා විසින් දෙශනා කරණ ලදී.

**16.** "මහණෙනි, සවැදෑරුම් ධාතූන් නිසා ගර්භයාගේ පහළවීමවේ. දරුගැබ පහළවීම ඇතිකල්හි නාමය හා රූපය පහළ වේ. නාමය හා රූපය ප්‍රත්‍යවීමෙන් ආයතන සය ඇතිවේ ආයතනය සය ප්‍රත්‍යයවීමෙන් ස්පර්ශය ඇති වේ. ස්පර්ශය ප්‍රත්‍යවීමෙන් වේදනා ඇතිවේ. මහණෙනි, මම විඳීම ලබන්නට දුකයයි පණවමි. මේ දුක් ඉපදීමට හෙතුවයයි පනවමි. මේ දුක් නැතිවීමයයි පනවමි. මේ දුක් නිරොධයට යන ප්‍රතිපදාවයයි පනවමි. මහණෙනි, දුක්ඛායර්‍ය සත්‍යය කවරේද?

"ඉපදීම දුකය, ජරාව දුකය, ව්‍යාධිය දුකය, මරණය දුකය ශොකය වැලපීම, දුක් දොම්නස දැඩි ආයාස දුක්ය, බලාපොරොත්තු යමක් නොලැබීමද දුකය සංක්ෂෙපයෙන් උපාදාන ස්කන්ධ පසම දුකය. මහණෙනි, මෙය දුක්ඛායර්‍ය සත්‍යයයි කියනු ලැබේ.

මහණෙනි, දුක්ඛසමුදයායර්‍ය සත්‍යය කවරේද? අවිද්‍යාව ප්‍රත්‍යයවීමෙන් සංස්කාර උපදී. සංස්කාර ප්‍රත්‍යය වීමෙන් විඤ්ඤාණය උපදී. විඤ්ඤාණය ප්‍රත්‍යවීමෙන් නාම රූප උපදී, නාම රූප ඉපදීමෙන් ෂඩායතන උපදී. ෂඩායතන ප්‍රත්‍යයවීමෙන් ස්පර්ශය උපදී, ස්පර්ශය ප්‍රත්‍යය වීමෙන් වේදනාව උපදී, වේදනාව ප්‍රත්‍යය වීමෙන් තණ්හාව උපදී, තණ්හාව ප්‍රත්‍යය වීමෙන් දැඩිකොට ගැනීම උපදී, දැඩිකොට ගැනීමෙන් භවය උපදී, භවය ප්‍රත්‍යවීමෙන් ඉපදීමවේ. ඉපදීම ප්‍රත්‍යවීමෙන් ජරා, මරණ, ශොක වැලපීම දුක් දොම්නස් දැඩි ආයාසයෝ පහළ වෙත්. මෙසේ මේ සම්පූර්ණ දුක් රාශිය පහළවීම වේ. මහණෙනි, මේ දුක්ඛසමුදයායර්‍ය සත්‍යයයි කියනු ලැබේ.

17. "අවිද්‍යාහුගේම වනාහි නිරවශෙෂ වශයෙන් දුරුකිරීම් වශයෙන් නිරෝධයෙන් සංස්කාරයන්ගේ නිරෝධය වේ. සංස්කාරයන්ගේ නිරෝධයෙන් විඥ්ඥානයාගේ නිරෝධය වේ. විඥ්ඥාණයන්ගේ නිරෝධයෙන් නාමරූපයන්ගේ නිරොධය වේ. (6 ඡෙදයේ තුන්වෙනි කොටසේ නාමරූප ඉපදීමෙන් 'යන්නට' 'නාම රූප නිරොධයෙන්' කියාද උපදී යන්නට නිරොධය වේ කියාද යොදා දැඩි ආයාසයෝ නිරුද්ධවෙත් යන්න දක්වා යොදා ගන්න.) මෙසේ මේ සම්පූර්ණ දුක් රාශිය නැතිවීම වේ. මහණෙනි, මේ දුක්ඛනිරොධායර්‍ය සත්‍යයයි කියනු ලැබේ.

18. "මහණෙනි, දුක් නිරුද්ධවීමය යන ප්‍රතිපදාවවූ ආයර්‍ය සත්‍යය කවරේද? මේ ආයර්‍ය අෂ්ටාංගික මාර්ගයමය, එනම් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා සම්මාකම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මාසති, සම්මා සමාධි යන අටයි. මහණෙනි, මේ දුක් නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවවූ ආයර්‍ය සත්‍යයයි කියනු ලැබේ.

19. "මහණෙනි, මා විසින් ශ්‍රමණයන් විසින්ද බ්‍රාහ්මණයන් විසින්ද සෙසු නැනවතුන් විසින්ද නිග්‍රහ නොකට හැක්කාවූ පිරිසිදුවූ, දොස් නොකියහැකිවූ අවනම්බු නොකරණ ලද්දාවූ මේ සතර ආයර්‍ය සත්‍යයෝ දේශනා කරණ ලදීයයි යමක් වදාරණ ලද්දේ නම් එය මේ සඳහා වදාරන ලදී.

12. **අමාතා පුත්තික භය සූත්‍රය:-** 1. "මහණෙනි, මවට පුතා නැත්තාවූද පුතාට මව නැත්තාවූද භය තුනක් අශ්‍රැතවත් පෘථග්ජන තෙම ප්‍රකාශ කරයි. කවර තුනක්ද? මහණෙනි, මහ ගින්නක් උපදින්නාවූ කාලයක් වෙයි. මහණෙනි ඒ මහ ගින්නක් උපන් කල්හි එයින් ගම්ද දැවෙත්. නියම් ගම්ද දැවෙති. නගරද දැවෙති. ගම්ද දැවෙන කල්හි නියම් ගම්ද දැවෙන කල්හි නගරද දැවෙන කල්හි එහි මවද පුතා නොලබයි. පුතාද මව නොලබයි. මහණෙනි මේ මවට පුතා නැත්තාවූ පුතාට මව නැත්තාවූ පළමුවැනි භයයයි අශ්‍රැතවත් පෘථග්ජන තෙම ප්‍රකාශ කරයි.

2. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණෙනි, මහා වර්ෂා වසින්නාවූ කාලයක් වෙයි. මහණෙනි, මහා වර්ෂාවක්

වට කල්හි මහත් ජල ගැල්මක් ඇතිවෙයි. මහණෙනි, මහා ජල ගැල්මක් වූ කල එයින් ගම්ද යට වෙයි. නියම් ගම්ද යට වෙයි. නගරද යට වෙයි. ගම්ද යටවූ කල්හි නියම් ගම්ද යටවූ කල්හි නගරද යටවූ කල්හි මවුද පුතා නොලබයි. පුතාද මව නොලබයි. මහණෙනි මේ දෙවැනිවූ මවට පුතා නැත්තාවූද පුතාට මව නැත්තාවූද භය යයි දෙවෙනි අශ්‍රැතවත් පෘථග්ජනයා කියයි.

3. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණෙනි, යම් හෙතුවක් භයක් හටගනීද. පල් හොරුන් ගම් වැද ගම් පැහැරීමේ භයින් ජනපද වාසීහු යානවාහනාදියෙහි නැඟී ඔබ මොබ යද්ද පල් හොරුන් ගම් වැද ගම් පැහැරීමේ භයින් යාන වාහනාදියෙහි නැඟී ජනපදවාසීන් ඔබ මොබ යන කල්හි මව පුතා නොලබයි. පුතා මව නොලබයි. මහණෙනි මේ මවට පුතා නැත්තාවූ පුතාට මව නැත්තාවූ තුන්වැනි භය යයි අශ්‍රැතවත් පෘථග්ජනයා කියයි.

4. "මහණෙනි, මේ මවට පුතා නැත්තාවූ පුතාට මව නැත්තාවූ භය තුන යයි අශ්‍රැතවත් පෘථග්ජනයා කියයි. මහණෙනි මවට පුතා ඇත්තාවූද පුතාට මව ඇත්තාවූද ඒ භය තුන මවට පුතා නැත්තාවූද පුතාට මව නැත්තාවූද භය තුනයයි අශ්‍රැතවත් පෘථග්ජනයා කියයි.

"කවර තුනක්ද? මහණෙනි, මහා ගින්නක් හට ගන්නා කැලයක් වන්නේය. මහණෙනි මහා ගින්නක් හටගත් කල්හි එයින් ගම්ද දැවෙන්නේය. නියම් ගම්ද දැවෙති. නගරද දැවෙති. ගම්ද දැවෙන කල්හි නියම් ගම්ද දැවෙන කල්හි නගරයන්ද දැවෙන කල්හි කිසිවිටෙක මවට පුතා ලැබෙන්නාවූද පුතාට මව ලැබෙන්නාවූ කාලයක්ද වන්නේය. මහණෙනි මේ පළමුවැනි මවට පුතා ඇත්තාවූද පුතාට මව ඇත්තාවූද භය අශ්‍රැතවත් පෘථග්ජනයා මවට පුතා නැත්තාවූ පුතාට මව නැත්තාවූද භය යයි කියයි.

5. "මහණෙනි, නැවත අනිකක්ද කියමි, මහණෙනි, මහා වැස්සක් වසින්නාවූ කාලයක් වන්නේය. මහා වැස්සක් වට කල්හි මහ ගංවතුරක් වන්නේය. මහ ගංවතුරක් වූ කල්හි ගම්ද යටවෙත්. නියම් ගම්ද යට වෙයි. නගරද යට වෙයි. ගම්ද යටවූ

කල්හි නියම් ගම්ද යටවූ කල්හි නගරයන්ද යටවූ කල්හි යම් හෙයකින් කිසි කලෙක මව පුතා ලබන්නේය. පුතා මව ලබන්නේය මහණෙනි, මේ දෙවැනිවූ මවට පුතා ඇත්තාවූද පුතාට මව ඇත්තාවූද භය අශ්‍රැතවත් පෘථග්ජනයා මවට පුතා නැත්තාවූද පුතාට මව නැත්තාවූ භයයයි කියයි.

**6.** "නැවත අනිකක්ද කියමි. මහණෙනි, පල්හොරු ගම් පැහැරීමෙන් ජනපද වාසීහු යානවාහනාදියෙන් ඔබ මොබ යන්නාවූ භය උපදින්නාවූ කාලයක් වෙයි. පල්හොරු ගම් පැහැරීමේ භයින් ජනපද වාසී යානවාහනාදියෙන් ඔබ මොබ යන කල්හි යම් හෙයකින් කිසිවිටෙක මවද පුතා ලබන්නේය. පුතාද මව ලබන්නේය. මහණෙනි මේ වනාහි තුන්වැනිවූ මවට පුතා ඇත්තාවූද පුතාට මව ඇත්තාවූද භය අශ්‍රැතවත් පෘථග්ජනයා මවට පුතා නැත්තාවූද පුතාට මව නැත්තාවූද භය යයි කියයි.

**7.** "මහණෙනි, මවට පුතා නැත්තාවූද, පුතාට මව නැත්තාවූද මේ භය තුනක් වෙත්. කවර තුනක්ද ජරා භය ව්‍යාධි භය මරණ භය යන මේ තුනයි. මහණෙනි මව දිරන්නාවූ පුතා පිළිබඳව 'මම දිරමි. මගේ පුතා නොදිරත්වා' යන මෙය නොලබයි. පුතා හෝ දිරන්නාවූ මව පිළිබඳ 'මම දිරමි. මගේ මවු නොදිරාවා' යන මෙය නොලබයි. මහණෙනි මවු ලෙඩ වන්නාවූ පුතා පිළිබඳව 'මම ලෙඩ වෙමි. මගේ පුතා ලෙඩ නොවේවා' යන මෙය නොලබයි. පුතා හෝ ලෙඩ වන්නාවූ මව පිළිබඳව 'මම ලෙඩ වෙමි. මගේ මවු ලෙඩ නොවේවා' යන මෙය නොලබයි මහණෙනි, මවු මැරෙන්නාවූ පුතා පිළිබඳව 'මම මැරෙමි මගේ පුතා නොමැරේවා' යන මෙය නොලබයි. පුතා හෝ මැරෙන්නාවූ මව පිළිබඳව 'මම මැරෙමි. මගේ මවු නොමැරේවා' යන මෙය නොලබයි. මහණෙනි මේ වනාහි මවට පුතා නොලැබෙන්නාවූද පුතාට මව නොලැබෙන්නාවූද භය තුනයි.

**8.** "මහණෙනි, මේ මවට පුතා ලැබෙන්නාවූත් පුතාට මව ලැබෙන්නාවූත් භය තුනද මවට පුතා නොලැබෙන්නාවූත් පුතාට

මව නොලැබෙන්නාවූත් භය තුනද පහ කිරීම පිණිස ඉක්මවීම පිණිස මාර්ගයක් ප්‍රතිපදාවක් ඇත්තේය. මහණෙනි, මේ සමාතා පුත්තික සහ අමාතා පුත්තික භය පහ කරනු පිණිස ඉක්මවීම පිණිස පවත්නාවූ ඒ මාර්ගය ප්‍රතිපදාව කවරේද? මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය මැයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය සම්‍යක් සංකල්පනාව සම්‍යක් වචනය සම්‍යක් කර්මාන්තය සම්‍යක් ආජීවය සම්‍යක් ව්‍යායාමය සම්‍යක් ස්මෘතිය සම්‍යක් සමාධිය යන මෙයයි. මහණෙනි මේ මාර්ගය මේ ප්‍රතිපදාව මේ සමාතා පුත්තික භය තුනද අමාතා පුත්තික භය තුනද පහ කරනු පිණිස ඉක්මවනු පිණිස පවත්නේ වෙයි."

13. **වෙනාගපුර සූත්‍රයඃ-** 1 "එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු සංඝයා හා කොසොල් ජනපදයෙහි චාරිකාවෙහි වඩිනුයේ වේනාගපුර නම් කොසොල් දනව් වාසීන්ගේ බමුණුගම යම් තැනෙක්හිද එහි පැමිණියේය වේනාගපුර වාසීවූ බ්‍රාහ්මණ ගෘහපතීහු මෙසේ ඇසුවාහුය. කෙසේද?

2. "ශාක්‍ය පුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ ගෞතම තෙමේ වනාහි වේනාග පුරයට පැමිණියේය. ඒ භවත් ගෞතමයන් පිළිබඳව ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්යහ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නය, සුගතය, ලෝකවිදූය, අනුත්තර පුරිසධම්ම සාරථිය, දෙව් මිනිසුන්ට ශාස්තෘය, චතුස්සත්‍ය අවබොධ කළසේක, භගවත්යයි මෙසේ යහපත්වූ කීර්තිශබ්දය උස්ව පැනනැංගේය. හෙතෙම දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ප්‍රජාව, තෙමේම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ගෙණ ප්‍රකාශ කෙරෙයි. හෙතෙම මුල යහපත්වූ මැද යහපත්වූ අග යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිත සියල්ලෙන් සම්පූර්ණවූ ධර්මය දෙශනා කෙරෙයි. පිරිසිදුවූ ශාසන බ්‍රාහ්මචරිය ප්‍රකාශ කෙරෙයි. එබඳුවූ රහතන් වහන්සේලාගේ දැකීම යහපත් වේය' යනුයි.

3. ඉක්බිති වේනාගපුර බ්‍රාහ්මණ ගෘහපතීහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ

ඇතැම් අය භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නාහුය. සමහරු භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූහ. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක හුන්නාහුය. ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ යම් දිශාවෙක්හිද ඒ දිශාවට ඇඳිලි බැඳ නමස්කාර කොට එකත්පසෙක හුන්නාහුය. ඇතැම්හු නාම ගොත්‍ර කියා එක්පසෙක හුන්නාහුය. ඇතැම්හු නිශ්ශබ්දව එකත් පසෙක හුන්නාහුය.

4. එකත්පසක හුන් වේනාගපුර වාසීවූ වච්ඡගොත්ත බ්‍රාහ්මණ තෙම "භවත් ගෞතමයන් වහන්ස, ආශ්චය්‍ය්‍යීයකි භවත් ගෞතමයන් වහන්ස පුදුමයකි. භවත් ගෞතමයන් වහන්සේගේ ඉන්ද්‍රියයෝ විශෙෂයෙන් ප්‍රසන්නයහ ශරීරවර්ණය පිරිසිදුය, පැහැපත්ය, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ වනාහි සරත් කාලයෙහි හටගත්තාවූ වඩා නොපැසුනු ඬෙබර ඵලයක් පිරිසිදු වේද, පැහැපත් වේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන්ගේ ඉන්ද්‍රියයෝ විශෙෂයෙන් ප්‍රසන්නයහ. ඡවි වර්ණය, පිරිසිදුය, පැහැපත්ය, එකෙණෙහි නටුවෙන් ගිලිහුණු තල්ගෙඩියක් යම්සේ පිරිසිදු වේද, පැහැපත් වේද එසේම භවත් ගෞතමයන් වහන්සේගේ ඉන්ද්‍රියයෝ විශෙෂයෙන් ප්‍රසන්නයහ, ඡවිවර්ණය, පිරිසිදුය, පැහැපත්ය භවත් ගෞතමයන්වහන්ස, දක්ෂවූ කර්මාර පුත්‍රයෙකු විසින් මනාකොට පරිකර්ම කරණ ලද්දාවූ කෝවෙහි දමා මනාකොට මට්ටම් කරන ලද්දාවූ රත් පලසක තබන ලද්දාවූ ජාම්බොනද රත්රනක් යම්සේ බබලන්නේද දිලිසෙන්නේද එලිය වැටෙන්නේද එපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේගේ ඉන්ද්‍රියයෝ විශෙෂයෙන් ප්‍රසන්නයහ, ඡවිවර්ණය, පිරිසුදුය, පැහැපත්ය. භවත් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් යම් ඒ උච්චාසයන මහාසයනයෝ වෙද්ද,

5. "ඒ නම් දික්හගලාපුටුය, පය්‍යීංකය දිග් ලොම් ඇති මහ කොඳු පලස්ය එළුලොම් ඇතිරිය සුදු එලු ලොම් ඇතිරිය ඝන පුප් ඇතිරිය, පුලුනින් කළ ඇතිරිය සිංහ ව්‍යාඝ්‍රාදී රූපයෙන් විසිතුරුවූ එළුලොම් ඇතිරිය, දෙදාවලු ඇති එළුලොම් ඇතිරිය, එක්දාවලු ඇති එළු ලොම් ඇතිරිය, රත්න මිශ්‍රව කළ කොසෙය්‍ය

ඇතිරිය, කොසෙයය නූලින් කළ ඇතිරිය, නාටක ස්ත්‍රීන් සොළොස් දෙනෙකුට නැටීමට සුදුසු එළුලොම් ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, රථයන්හි අතුරණ ඇතිරිය, ඇඳුම් දිවිසම්ය, කෙසෙල් මුව සමින් කළ උතුම් පසතුරුණුය, උඩුවියන් සහිතවූ දෙපාර්ශවයෙහි රතු කොට්ට ඇති අසුන්ය යන මේයි.

**6.** "භවත් ගෞතම තෙමේ ඒකාන්තයෙන් මෙබඳුවූ උච්චාසයන මහාසයන කැමතිසේ ලබන්නේය. පහසුවෙන් ලබන්නේය. නොවෙහෙසී ලබන්නේයයි" කීය.

**7.** "බමුණ යම් ඒ උච්චාසයන මහාසයනයෝ වෙද්ද, (මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි) ඒ උච්චාසයන මහාසයන පැවිද්දන්ට දුර්ලභයහ. ලබන ලද්දාහුද, කැප නොවෙත් බමුණ යම් උච්චාසයන මහාසයනයක් මම දැන් කැමතිසේ ලබන්නෙම්ද පහසුවෙන් ලබන්නෙම්ද නිදුකින් ලබන්නෙම්ද එබඳු උච්චාසයන මහාසයන තුනක් වෙත්. කවර තුනක්ද, දිව්‍ය උච්චාසයන මහාසයනය, බ්‍රහ්ම උච්චාසයන මහාසයනය, ආර්‍ය්‍ය උච්චාසයන මහාසයනය යන මේයි. බමුණ මම යම් උච්චාසයන මහාසයනයක් දැන් කැමතිසේ ලබන්නෙම්ද පහසුවෙන් ලබන්නෙම්ද නිදුකින් ලබන්නෙම්ද මේ තුන වෙත්"

**8.** "භවත් ගෞතමයන්වහන්ස, භවත්ගෞතම තෙමේ යම් උච්චාසයන මහාසයනයක් කැමතිසේ ලබන්නේද පහසුවෙන් ලබන්නේද නිදුකින් ලබන්නේද ඒ දිව්‍ය උච්චාසයන මහාසයනය කවරේද?

**9.** "බමුණ, මෙහි මම යම්බඳුවූ ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට වෙසෙම්ද ඒ මම පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාසිවුරු ගෙණ එම ගමට හෝ නියම් ගමට හෝ පිඬු පිණිස ප්‍රවිෂ්ටවෙමි. ඒ මම සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ වනයටම ප්‍රවිෂ්ට වෙමි. ඒ මම එහි තෘණ හෝ කොළ හෝ යමක් ඇත්තේද ඒවා එකතු කොට පර්‍ය්‍යංක බැඳ කය ඍජුකොට තබා සිහිය අරමුණට අභිමුඛ කොට තබා හිඳිමි

'ඒ මම කාමයන්ගෙන් වෙන්වම අකුසලයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා

සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරමි. විතර්ක විචාරයන් සංසිඳවීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම් ඇති සිත හා එකඟ කරන්නාවූ විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරමි. ප්‍රීතියෙහිද නොඇල්මෙන් ධ්‍යාන උපෙක්ෂාවෙන් යුක්තව සිහියෙන් යුක්තව ප්‍රඥාවෙන් යුක්තව කයින් සුව විඳීද යම් ධ්‍යානයක් උපෙක්ෂාවෙන් යුක්තව සිහියෙන් යුක්තව සැප විහරණ ඇත්තේයයි ආර්‍යයෝ කියත්. මම ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරමි. සැපය පහකිරීමෙන්ද දුක නැති කිරීමෙන්ද ධ්‍යානය ලැබීමට පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරුකිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂා සති දෙකින් පිරිසිදුවූ චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරමි.”

10. “බමුණ, එසේවූ මම ඉදින් සක්මන් කෙරෙම්ද ඒ කාලයෙහි මාගේ මේ සක්මන් කිරීම දිව්‍ය සක්මන් කිරීමකි. බමුණ එසේවූ මම ඉදින් ඒ මම සිටිම්ද ඒ කාලයෙහිදී මාගේ මේ සිටීම දිව්‍ය සිටීමක් වේ. එසේවූ මම ඉදින් හිඳිනෙම්ද එකල්හි එය මාගේ ඒ දිව්‍ය ආසනයක් වෙයි. බමුණ එසේවූ මම සයනය කෙරෙම්ද එකල්හි ඒ මාගේ දිව්‍ය උච්චාසයනය මහාසයනය වෙයි. බමුණ මම දැන් යම් උච්චාසයන මහාසයනයක් කැමතිසේ ලබන්නෙම්ද පහසුවෙන් ලබන්නෙම්ද නිදුකින් ලබන්නෙම්ද බ්‍රාහ්මණය මේ වනාහි ඒ දිව්‍ය උච්චාසයන මහාසයනය වෙයි

11. “භවත් ගෞතමයන් වහන්ස ආශ්චර්‍ය්‍යයි, භවත් ගෞතමයන් වහන්ස අද්භූතයි, භවත් ගෞතමයන් වහන්සේ හැර මේ උච්චාසයන මහාසයනයක් කැමැතිසේ ලබන්නාවූ පහසුවෙන් ලබන්නාවූ නිදුකින් ලබන්නාවූ අන් කවරෙක් ඇත්තේද, භවත් ගෞතමයන් වහන්ස, දැන් භවත් ගෞතම තෙමේ යම් බ්‍රහ්ම උච්චාසයන මහාසයනය කැමති පරිදි ලබන්නේවේද පහසුවෙන් ලබන්නේ වේද නිදුකින් ලබන්නේවේද ඒ බ්‍රහ්ම උච්චාසයන මහාසයනය කවරේද?

12. “බ්‍රාහ්මණය, මම යම් ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට වාසය කෙරෙම්ද, ඒ මම පෙරවරු කාලයෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හැඳ පාත්‍ර සිවුරු ගෙන එම ගමට නියම් ගමට හෝ පිඬු පිණිස යන්නෙමි. ඒ මම සවස් කාලයෙහි පිණ්ඩ පාතයෙන් වැළකුණේ එම වනයටම ප්‍රවිෂ්ට වෙමී ඒ මම එහි යම් තෘණ හෝ කොළ වෙද්ද ඒවා එකතුකොට එහි පය්‍යීංක බැඳ කය ඍජුව තබා සිහිය ඉදිරිපත්කොට තබා හිඳ ගනිමි.

13. ඒ මම මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරමි.

14. එසේම දෙවෙනි දිශාවද එසේම තුන්වැනි දිශාවද එසේම හතරවැනි දිශාවද, මෙසේ උඩද යටද සරසද සැම තන්හි හීන මධ්‍යාදී සියල්ල ඇති බැවින් සියලු සත්වයන් ඇත්තාවූ ලෝකය මහත්වූ මහත් බවට ගියාවූ අවෛරීවූ, ව්‍යාපාද රහිතවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරමි.

15. (මේ ඡේදය මේ සූත්‍රයේ 12 ඡේදය මෙනි.)

16. "කරුණා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරමි.

17. (මේ ඡේදය මේ සූත්‍රයේ 12 ඡේදය මෙනි.)

18. "මුදිතා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරමි.

19. (මේ ඡේදය මේ සූත්‍රයේ 12 ඡේදය මෙනි.)

20. "උපෙක්ෂා සහගත සිතින් එක්දිශාවක් පතුරුවා වාසය කරමි.

21. (මේ ඡේදය මේ සූත්‍රයේ 12 ඡේදය මෙනි.)

22. "එසේවූ මම ඉදින් සක්මන් කරම්ද, එකල්හි ඒ මාගේ සක්මන බ්‍රහ්ම සක්මනක් වෙයි. බ්‍රාහ්මණය, එකල්හි එසේවූ මම ඉදින් සිටිම්ද, හිදීම්ද, සයනය කෙරෙම්ද එකල්හි එය මාගේ බ්‍රහ්ම උච්චාසයන මහාසයනය වෙයි. බ්‍රාහ්මණය, මම දැන් යම් උච්චාසයන මහාසයනයක් කැමති පරිදි ලබන්නෙම්ද පහසුවෙන් ලබන්නෙම්ද නිදුකින් ලබන්නෙම්ද ඒ මාගේ උච්චාසයන මහාසයනය වෙයි.

23. "භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්‍ය්‍යයකි, භවත් ගෞතමයන් වහන්ස, අද්භූතයකි. මෙවැනි බ්‍රහ්ම උච්චාසයන මහාසයනයක් කැමැති පරිදි ලබන්නාවූ පහසුවෙන් ලබන්නාවූ නිදුකින් ලබන්නාවූ භවත් ගෞතමයන් හැර අන් කවරෙක් ඇත්තේද? භවත් ගෞතමයන් වහන්ස, භවත් ගෞතම තෙමේ දැන් යම් ආර්‍ය්‍ය උච්චාසයන මහාසයනයක් කැමතිසේ ලබන්නේ නම් පහසුවෙන් ලබන්නේ නම් නිදුකින් ලබන්නේ නම් ඒ ආර්‍ය්‍ය උච්චාසයන මහාසයනය කුමක්ද?

24. "බ්‍රාහ්මණය මම ගමකට හෝ නියම් ගමකට හෝ ඇසුරුකොට වෙසෙම්ද (මේ සූත්‍රයේ 12 ඡේදය යොදා ගතයුතුයි) ඒ මම මාවිසින් රාගය පහකරන ලදී, මුල් සිඳින ලදී, කරටිය කැපූ තල්ගසක් මෙන් කරන ලදී. විනාශ කරන ලදී, නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලදැයි මෙසේ දැනගනිමි.

25. 'මා විසින් ද්වේෂය පහකරන ලදී, මුල් සිඳින ලදී, කරටිය කැපූ තල්ගසක් මෙන් කරන ලදී, විනාශ කරන ලදී, නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලදැයි මෙසේ දැන ගනිමි.

26. "මා විසින් මොහය පහකරන ලදී, මුල් සිඳිනලදී. කරටිය කැපූ තල් ගසක්මෙන් කරන ලදී. විනාශ කරන ලදී. නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලදැයි මෙසේ දැන ගනිමි.

බ්‍රාහ්මණය, මෙසේවූ ඒ මම ඉදින් සක්මන් කෙරෙම්ද එකල්හි ඒ මාගේ ආර්‍ය්‍ය සක්මන වෙයි. බ්‍රාහ්මණය ඒ මම ඉදින් සිටිම්ද හිඳිම්ද සයනය කෙරෙම්ද එකල්හි එය මාගේ ආර්‍ය්‍ය උච්චාසයන මහාසයනය වෙයි. බ්‍රාහ්මණය, දැන් මම යම් උච්චාසයන මහාසයනයක් කැමති පරිදි ලබම්ද පහසුවෙන් ලබම්ද නිදුකින් ලබම්ද බ්‍රාහ්මණය මේ ඒ ආර්‍ය්‍ය උච්චාසයන මහාසයනය වෙයි.

27. "භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්‍ය්‍යයකි. භවත් ගෞතමයන් වහන්ස, අද්භූතයෙකි. භවත් ගෞතමයන් වහන්ස, මෙවැනි ආර්‍ය්‍ය උච්චාසයන මහාසයනක් ලබන්නාවූ භාග්‍යවතුන් වහන්සේ හැර අන් කවරෙක් ඇත්තේද?

"භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති, භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති, භවත් ගෞතමයන් වහන්ස යම්සේ යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරණ ලද්දේද, වැසුණු දෙයක් විවෘත කරන්නේද, මංමුළාවූවෙකුට මාර්ගය කියන්නේද, ඇස් ඇත්තෝ රූපදකිත්වායි කියා තෙල් පහනක් දරන්නේද එසේම ධර්මය ප්‍රකාශ කරන ලදී. ස්වාමීනි ඒ අපි භවත් ගෞතමයන් වහන්සේද ධර්මයද භික්ෂු සංඝයාද සරණ යමු. භවත් ගෞතමයන්වහන්සේ අද පටන් අප දිවිහිම් කොට උපාසකයන් කොට දරන සේක්වා."

**14. සරභ (පරිබ්බාජක) සූත්‍රයː-** 1. එක් සමයක භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර ගිජ්ඣකූට පර්වතයෙහි වාසයකරන සේක. එකල්හි සරභ නම් පරිබ්‍රාජික තෙම මේ ශාසනයෙන් ඉවත්ව ගොස් නොබෝකල් ඇත්තේ විය. හෙතෙම රජගහනුවර පිරිස් මැද මේ වචනය කියයි. කුමක්ද "මා විසින් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය දැනගන්නා ලදී. මම ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය දැනගෙන මෙසේ ඒ ධර්ම විනයෙන් අස්වූයෙමි"යනුයි.

2. "ඉක්බිති බොහෝ භික්ෂූහු හැඳ පාත්‍ර සිවුරු ගෙන රජගහනුවරට පිඬු පිණිස වැඩියහ. ඒ භික්ෂූහු 'මා විසින් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්ම දැනගන්නා ලදී. මම ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය දැන ඒධර්ම විනයෙන් අස්වූයෙමි' යන රජගහනුවර පිරිස් මැද කියන්නාවූ, ඒ සරභ පරිබ්‍රාජකයාගේ වචනය ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු රජගහ නුවර පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන්වහන්සේට වැඳ එක් පසෙක උන්හ. එක්පසක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීහ.

3. ස්වාමීනි, මේ ධර්මවිනය සංඛ්‍යාත ශාසනයෙන් නික්ම ගොස් නොබෝකල් ඇති සරභ පරිබ්‍රාජක තෙමේ රජගහනුවර පිරිස් මැද මේ වචනය කියයි. 'මා විසින් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය දැනගන්නා ලදී. මම ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය

දැනගෙන ඒ ධර්ම විනයෙන් අස්වූයෙමි’ යනුයි. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ සප්පිනිකා නම් ගංඉවුර යම් තැනෙකද පරිබ්‍රාජකාරාමය යම් තැනකද සරභ පරිබ්‍රාජකයා යම් තැනකද එහි වඩින සේක් නම් මැනවි” කියායි.

4. භාග්‍යවතුන්වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූසේක. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සවස්භාගයෙහි විවෙකයෙන් නැඟී සිටියේ සප්පිනිකා ගංඉවුර යම් තැනෙක්හිද පරිබ්‍රාජිකාරාමය යම් තැනෙක්හිද සරභ පරිබ්‍රාජිකයා යම් තැනෙක්හිද එහි වැඩියහ. වැඩමවා පනවන ලද අසුනෙහි වැඩහුන්නේය. වැඩහිඳ භාග්‍යවතුන්වහන්සේ සරභ පරිබ්‍රාජකයාට මෙසේ වදාළේය.

5. “සරභය, ඔබ මෙසේ කියන්නෙහි යනු ඇත්තක්ද? කෙසේද? ‘ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය මා විසින් දැනගන්නාලදී. මම ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය මෙසේ දැන ඒ ධර්ම විනයෙන් අස්වූයෙමී’ යනුයි.” මෙසේ කීකල්හි සරභ පරිබ්‍රාජක තෙමේ නිශ්ශබ්ද විය. දෙවනුවද භාග්‍යවතුන්වහන්සේ (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යොදගත යුතුයි) සරභ පරිබ්‍රාජකයාහට මෙසේ වදාළේය. සරභය කියව තොප විසින් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය කුමකැයි දැනගන්නා ලද්දේද? ඉදින් තොපගේ යම් අඩුවක් වන්නේ නම් මම එය සම්පූර්ණ කරන්නෙමි. ඉදින් තොපගේ දැනීම සම්පූර්ණ නම් මම අනුමෝදන් වන්නෙමියි” වදාළේය. දෙවනුවද සරභ පරිබ්‍රාජක තෙමේ නිශ්ශබ්ද විය.

6. තුන්වෙනුවත් භාග්‍යවතුන්වහන්සේ සරභ පරිබ්‍රාජකයාහට මෙසේ වදාළේය. කෙසේද? “සරභය කියව, තොප විසින් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය කුමකැයි දැනගන්නා ලද්දේද? ඉදින් තොපගේ අඩුවක් වෙයිනම් එය මම සම්පූර්ණ කරමි ඉදින් තොපගේ දැනීම සම්පූර්ණ නම් එයම අනුමෝදන් වන්නෙමි” කියයි. තුන්වෙනුවත් සරභ පරිබ්‍රාජික තෙමේ නිශ්ශබ්ද විය.

7. ඉක්බිත්තෙන් වනාහි ඒ පරිබ්‍රාජකයෝ සරභ නම් පරිබ්‍රාජකයාට මේ වචනය කීවාහුය. “ඇවත් සරභයෙනි, නුඹ

යමක් ශ්‍රමණ ගෞතමයන් ඉල්වන්නෙහි නම් එයම තට ශ්‍රමණ ගෞතම තෙමේ පවරයි. ඇවත් සරභයෙනි කියව තා විසින් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය කුමකැයි කියා දැනගන්නා ලද්දේද, ඉදින් තොපගේ අඩුවක් වෙයිනම් ශ්‍රමණ ගෞතම තෙමේ එය සම්පූර්ණ කරන්නේය. ඉදින් තොපගේ දැනීම සම්පූර්ණ නම් ශ්‍රමණ ගෞතම තෙමේ අනුමොදන්වන්නේය" යනුයි.

8. මෙසේ කීකල්හි සරභ පරිබ්‍රාජක තෙම ඔද බිඳී ගොස් කරනමා බිම බලා නිහඬව කල්පනා කරමින් වැටහීමක් නැතිව හුන්නේය.

9. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සරභ නම් පරිබ්‍රාජකයා නිශ්ශබ්දව ඔද බිඳී කරනමා බිම බලාගෙන නිහඬව කල්පනා කරමින් වැටහීමක් නැතිව හුන්නාහු දැන පරිබ්‍රාජකයන්ට (මෙසේ) වදාළහ. "පරිබ්‍රාජකයෙනි, යමෙක් වනාහි මට මෙසේ කියන්නේද 'මම සම්‍යක් සම්බුද්ධ වෙමියි ප්‍රතිඥා කරන්නාවූ ඔබ විසින් මේ ධර්මයෝ අවබොධ නොකරණ ලද්දාහුය' කියායි. මම ඔහුගෙන් කරුණු මනාකොට විචාරන්නෙමි. හෙතු යුක්ති විමසන්නෙමි කරුණු කියන්නෙමි.

10. "මා විසින් කරුණු විචාරනු ලබන්නාවූ හෙතු යුක්ති විමසනුලබන්නාවූ කරුණු කියනු ලබන්නාවූ හෙතෙම කරුණු තුනකින් එක්තරා කරුණකට පැමිණේය යන මීට හෙතු නැත්තේය. කවර තුනක්ද යත් අන් වචනයකින් අන් වචනයක් වසන්නේය. කථාව අන් අතකට යොමුකරන්නේය. කෝපයද ද්වේෂයද නොසතුටු බවද පහළ කරන්නේය. නිශ්ශබ්දව තෙදබිඳී කර පාත්කොට මුහුණ යට හෙළා කල්පනා කරමින් කරුණු නොවැටහී සරභ පරිබ්‍රාජකයා මෙන් හිඳන්නේය යන කරුණු තුනය."

11. "පරිබ්‍රාජකයෙනි යමෙක් වනාහි මට මෙසේ කියන්නේද මම ක්ෂීණාශ්‍රව වෙමියි ප්‍රතිඥාකරන්නාවූ ඔබ විසින් මේ ආශ්‍රවයෝ ක්ෂය නොකරන ලද්දාහුය' කියායි. පරිබ්‍රාජකයෙනි, යමෙක් මට ක්ෂීණාශ්‍රවයෙකැයි ප්‍රතිඥාකරන ඔබ විසින් මේ ආශ්‍රවයෝ ක්ෂය නොකරන ලදහ' කියායි.

12. (මේ ඡේදය මේ සූත්‍රයේ 10 ඡේදය මෙනි.)

13. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සප්පිනිකා ගංඉවුරෙහිවූ පරිබ්‍රාජකාරාමයෙහි තුන්වරක් අභීත නාදය කොට අහසින් වැඩියේය. ඉක්බිති ඒ පරිබ්‍රාජකයෝ භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් සරභ නම් පරිබ්‍රාජකයා හට හාත්පසින් වචන නැමති කෙවිටෙන් නිරතුරුවම ඇන්නාහුය.

'ඇවැත්නි සරභයෙනි, යම්සේ වනාහි මහ වනයෙහි ජර සිවලෙක් සිංහනාද කරන්නෙමියි සිවල් හඬම කෙරේද අප්‍රිය හඬම කෙරේද ඇවත් සරභයෙනි, එමෙන්ම නුඹ ශ්‍රමණ ගෞතමයන් හැර සිංහනාද කරන්නෙමියි සිවල් හඬම කෙරෙහිය. අප්‍රිය හඬම කෙරෙහිය, ඇවැත්, සරභයෙනි යම්සේ වනාහි කුකුල් පැටියෙක් මහ කුකුළ් හඬ කරන්නෙමියි කුඩා කුකුළ් හඬම කෙරේද, ඇවත් සරභයෙනි, යම්සේ වනාහි කුකුළ් පැටියෙක් වැනි ඔබ ශ්‍රමණ ගෞතමයන් හැර මහ කුකුළ් හඬ කරන්නෙමියි කුකුළ් පැටියෙකුගේ හඬම කෙරෙහිය. ඇවැත් සරභයෙනි, යම්සේ වනාහි ගොනෙක් තෙම වෘෂභයන්ගෙන් හිස්වූ ගව ගාලෙක වෙත්හි ගැඹුරු කොට නාදකළ යුතුයයි. හඟීද ඇවැත් සරභය එමෙන්ම ඔබ ශ්‍රමණ ගෞතමයන් හැර ගැඹුරු කොට නාදකළ යුතුයයි හඟින්නෙහිය" කියායි. ඉක්බිති පරිබ්‍රාජකයෝ සරභ පරිබ්‍රාජකයා හට හාත්පස වර්ධන නමැති කෙවිටෙන් නිරතුරු ඇන්නාහුය.

15. **කාලාම සූත්‍රයː**- 1 එක් සමයක භාග්‍යවතුන්වහන්සේ කොසොල් ජනපදයන්හි මහත් භික්ෂු සංඝයා සමග චාරිකාවෙහි වඩිනුයේ කාලාම නම් ක්ෂත්‍රියන්ගේ කෙසපුත්ත නම් නියම්ගම යම්තැනෙක් හිද එහි වැඩිසේක. කෙසපුත්ත නියම්ගම් වැසි කාලාම නම් ක්ෂත්‍රියයෝ මේ කාරණය ඇසුවාහුය. කුමක්ද? ශාක්‍ය පුත්‍රවූ ශාක්‍ය කුලයෙන් පැවිදිවූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ කේසපුත්ත නම් නියම්ගමට පැමිණියහ.

2. "ඒ භාග්‍යවත් ගෞතමයන් පිළිබඳව මෙවැනි යහපත් කීර්ති ශබ්දයක් පැනනැංගේය. (13 වෙනි සූත්‍රයේ 2 ඡේදයේ 'ඒ

යන තැනසිට මෙසේ' යන තැනට එබඳු රහතුන්ගේ දැකීම යහපත් වෙය කියායි.

3. "ඉක්බිති කෙසපුත්ත ගම්වැසි කාලාම ශාක්‍යයෝ භාගවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. පැමිණ සමහරෙක් භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හිඳගත්හ, සමහරෙක් භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූහ. සතුටුවිය යුතු සිහිකටයුතු කථාව කොට එක්පසෙක හිඳගත්හ. සමහරෙක් භාග්‍යවතුන්වහන්සේ දෙසට ඇදිලිබැඳ එක්පසෙක හිඳගත්හ. සමහරෙක් නාමගොත්‍ර අස්වා එක්පසෙක හිඳගත්හ. සමහරෙක් නිශ්ශබ්දව එක් පසෙක හිඳගත්හ.

4. එක් පසෙක හිඳ ගත්තාවූ ඒ කෙස පුත්ත නියම් ගම් වැසි කාලාම ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි, මේ කෙස පුත්ත ගමට එන්නාවූ සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු තමන්ගේ වාදයම දක්වත්. ප්‍රකාශ කරත්. අනික් වාදයන්ට ගරහත්, නින්දා කරත්, බැහැර කරත්. ස්වාමීනි, අනික් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙස පුත්ත ගමට එත්. ඔව්හුද තමන්ගේ වාදයම කෙනෙක්ද දක්වත්, ප්‍රකාශ කරත්. අනික් වාදයන්ට ගරහත්, නින්දා කරත්, බැහැර කරත්. ස්වාමීනි ඔවුන්ගේ කථා පිළිබඳව මේ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතුරෙන් කවරෙක් නම් සැබවක් කියයිද, කවරෙක් බොරු කියාදැයි අපට සාංකා ඇතිවන්නේ සැක ඇතිවන්නේය. කියායි.

5. "කාලාමයෙනි, තොප විසින් සැක සාංකා ඉපදවීමට සුදුසුය. සැක කිරීමට සුදුසුය. තොපට සාංකා කළයුතු තන්හිම සැක උපන්නේය. කාලාමයෙනි, තෙපි අනුන් කියනු ඇසීමෙන් නොපිළිගනිව්. පරම්පරායෙහි ආ හෙයින් නොපිළිගනිව්. මෙය මෙසේ විය හැකියයිද නොපිළිගනිව්. අපගේ පිටක පාළිය යනු සමාන වේයයිද නොපිළිගනිව්. තර්කානුකූලයයිද නොපිළිගනිව්. න්‍යායට අනුකූලයයිද නොපිළිගනිව්. මේ කාරණය යහපතැයි කල්පනා කිරීමෙන්ද නොපිළිගත යුතුයි. අප නුවණින් තීරණය කොට ගන්නා ලද දෘෂ්ටියට සමානයයිද නොපිළිගනිව්. මේ මහණ තෙමේ යහපත් කෙනෙකි. ඔහුගේ කීම පිළිගත යුතුයයිද

නොපිළිගනිව්. මේ ශ්‍රමණ තෙම අපගේ ගුරු යයිද නොපිළිගනිව්. කාලාමයෙනි යම් කලෙක්හි තෙපි මේ ධර්මයෝ අකුසල්ය. මේ ධර්මයෝ වරද සහිතය, මේ ධර්මයෝ නුවණැත්තන් විසින් ගර්හා කරනලදහ. පුරන ලද්දාවූ සමාදන් වන ලද්දාවූ මේ ධර්මයෝ අහිත පිණිස දුක් පිණිස පවතිත් යයි තුමූම දන්නාහුද එසේ ඇති කල්හි, කාලාමයෙනි තෙපි ඒ අකුශල ධර්මයන් දුරු කරන්නහුය.

**6.** "කාලාමයෙනි, තොපි ඒ කුමකැයි හගින්නාහුද? පුරුෂයා තුළ උපදින්නාවූ ලොභය හිත පිණිස හෝ අහිත පිණිස හෝ උපදීද?"

"ස්වාමීනි, අහිත පිණිසය."

"කාලාමයෙනි ලොභයෙන් යුක්තවූ මේ පුරුෂ පුද්ගල තෙම වනාහි ලෝභය විසින් මඩනා ලද්දේ හාත්පසින් විනාශ කරන ලද සිත් ඇත්තේ සතුන්ද මරයි. සොරකම්ද කරයි. පරදාරාවන් කරාද යෙයි. බොරුද කියයි. යමකුට දීර්ඝ කාලයක් අහිත පිණිස දුක් පිණිස වේද අන්‍යයාද ඒ බැව් පිණිස සමාදන් කෙරේද?"

"ස්වාමීනි, එසේය."

**7.** (මේ සූත්‍රයේ 6 ඡේදයෙහි 'ලොභය' වෙනුවට 'ද්වෙෂය' යෙදීමෙන් මේ ඡේදය සකස් කර ගත යුතුයි)

**8.** (මේ සූත්‍රයේ 6 ඡේදයෙහි 'ලොභය' වෙනුවට 'මෝහය' යෙදීමෙන් මේ ඡේදය සකස් කරගත යුතුයි)

**9.** "කාලාමයෙනි, ඒ කුමකැයි සිතන්නහුද මේ ධර්මයෝ කුසල් හෝ වෙද්ද අකුසල් හෝ වෙද්ද?"-

"ස්වාමීනි, අකුසල්ය."

"වරද වෙද්ද නිවරද වෙද්ද?"-"ස්වාමීනි, වරද වෙත්."

"නුවණැත්තන් විසින් ගර්හා කරන ලද්දාහු හෝ වෙද්ද නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාහු හෝ වෙත්ද?"- "ස්වාමීනි, නුවණැත්තන් විසින් ගර්හා කරණ ලද්දාහු වෙත්."

"සම්පූර්ණ කරණ ලද්දාහු සමාදන් වන ලද්දාහු අහිත පිණිස දුක් පිණිස පවතිද්ද නොවෙද්ද, මෙහි තොපට කෙසේ අදහස් වේද?"-"ස්වාමීනි, පුරන ලද සමාදන් වන ලද මේ ධර්මයෝ අහිත පිණිස දුක් පිණිස පවතිත් යනු මෙහි අපගේ අදහස වෙයි."

10. "කාලාමයෙනි, යම්හෙයකින් මෙසේ යමක් කීයෙමුද? (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි) එකල්හි තෙපි දුරුකරන්නහුයයි මෙසේ ඒ යමක් කියන ලද්දේ නම් එය මේ සඳහා කියන ලදී. (මෙහි මේ සූත්‍රයේ 6, 7, 8, 9 ඡේද යෙදිය යුතුයි.) එකල්හි තෙපි ඊට පැමිණ වාසය කරන්නාහුය

11. "කාලාමයෙනි, ඒ කුමැයි සිතන්නහුද? පුරුෂයා තුළ උපදින්නාවූ අලොභය හිත පිණිස හෝ අහිත පිණිස හෝ උපදින්නේද?"-"ස්වාමීනි, හිත පිණිස වේ."

"කාලාමයෙනි, ඒ කුමකැයි සිතන්නහුද? පුරුෂයා තුළ උපදින්නාවූ අලොභය හිත පිණිස හෝ අහිත පිණිස හෝ උපදින්නේද?"-"ස්වාමීනි හිත පිණිසය."

"කාලමයෙනි, ලොභයෙන් නොඇලුණාවූ ලොභයෙන් නොමවඩනා ලද්දාවූ විනාශ නොවූ සිත් ඇත්තාවූ පුරුෂ පුද්ගලතෙම සතුන් නොමරයි, සොරකම් නොකරයි, පරදාරාවන් කරා නොයයි, බොරු නොකියයි. යමක් ඔහුට බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස සැප පිණිස වෙයි නම් එහි අන්‍යයාද සමාදන් කරවයිද?"-"ස්වාමීනි, එසේය."

12. (මේ සූත්‍රයේ 11 ඡේදයේ 'අලොභය' වෙනුවට 'අද්වෙෂය' යෙදීමෙන් මේ ඡේදය සකස්කර ගතයුතුයි.)

13. (මේ සූත්‍රයේ 11 ඡේදයේ 'අලොභය' වෙනුවට 'අමොහය' යෙදීමෙන් මේ ඡේදය සකස් කරගතයුතුයි.)

14. "කාලාමයෙනි, ඒ කුමකැයි සිතන්නහුද? මේ ධර්මයෝ කුසල් හෝ අකුසල් හෝ වෙත්ද?"-"ස්වාමීනි, කුසල්ය."

"වරද හෝ නිවරද හෝ වෙත්ද?"-"ස්වාමීනි, නිවරද වෙත්."

"නුවණැත්තන් විසින් ගර්හා කරන ලද්දාහු හෝ නුවණැත්තන් විසින් ප්‍රශංසා කරණ ලද්දාහු හෝ වෙත්ද?"-"ස්වාමීනි, නුවණැත්තන් විසින් ප්‍රශංසාකරන ලද්දාහු වෙත්."

"පුරන ලද්දාහු සමාදන් වන ලද්දාහු හිත පිණිස හෝ පවතිත්ද හිත පිණිස හෝ නොපවතිත්ද? මේ කාරණයෙහි අදහස කෙසේද?"-"පුරනලද්දාහු සමාදන්වන ලද්දාහු හිත පිණිස සැප පිණිස පවතිත් යනු මෙහි අපගේ අදහස වෙයි."

15. "කාලාමයෙනි, මෙසේ කාලාමයෙනි, (මෙහි මේ සූත්‍රයේ 5, 11 ඡේද යෙදිය යුතුයි.)

16. "කාලාමයෙනි, මෙසේ පහකළ ලොභය ඇති පහකළ ද්වෙෂය ඇති මුළා නොවූ යහපත් නුවණ ඇත්තාවූ සිහියෙන් යුක්තවූ ඒ ආය්‍ය‍්‍ය ශ්‍රාවක තෙම මෛත්‍රී සහගත සිතින් (මෙහි වෙනාගපුර වර්ගයේ 3 සූත්‍රයේ 13, 14 ඡේද යෙදාගතයුතුයි) කරුණා සහගත සිතින් (මෙහි වෙනාගපුර වර්ගයේ 3 සූත්‍රයේ 13, 14 ඡේද යොදාගත යුතුයි.) උපෙක්ෂා සහගත සිතින් (මෙහි වෙනාගපුර වර්ගයේ 3 සූත්‍රයේ 13, 14 ඡේද යොදාගත යුතුයි.)

17. "කාලාමයෙනි, ආය්‍ය‍්‍ය ශ්‍රාවක තෙම මෙසේ අවෛර සිත් ඇත්තේ වේද මෙසේ ව්‍යාපාද සිත් ඇත්තේවේද මෙසේ නොකිලුටු සිත් ඇත්තේ වේද මෙසේ පිරිසිදු සිත් ඇත්තේ වේද, ඔහු විසින් මේ ආත්මයෙහි අස්වැසීම් සතරක් ලබන ලද්දාහු වෙත්.

18. "ඉදින් පරලොවක් ඇත්තේ නම් කරන ලද හොඳ නොහොඳ කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේ නම්, 'කය බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නෙමි' යන මේ පළමුවැනි අස්වැසීම ඔහු විසින් ලබන ලද්දේ වෙයි.

19. "ඉදින් පරලොවක් නැත්තේ නම් කරන ලද හොඳ නොහොඳ කර්මයන්ගේ ඵලවිපාක නැත්තේ නම්, මේ ආත්මයෙහිම වෛර නැතිව ව්‍යාපාද නැතිව දුක් නැතිව සුවසේ ආත්මය පරිහරණය කරන්නෙමි" යන මේ දෙවන අස්වැසීම ඔහු විසින් ලබන ලද්දේ වෙයි.

20. "ඉදින් වනාහි 'පව් කරන්නාහට විපාක දෙනු ලැබේ නම් මම වනාහි කිසිවෙකුට වරදක් නොසිතමි. පව් නොකරන්නාවූ මට කෙසේ නම් දුකක් පැමිණෙන්නේද?

නොපැමිණෙන්නේද’ යන මේ තුන්වැනි අස්වැසීම ඔහු විසින් ලබන ලද්දේ වෙයි.

21. “ඉදින් පව් කරන්නාහට විපාක නොදෙනු ලැබේ නම් ‘දැන් මම වනාහි පවෙන්ද විපාකයෙන්ද යන දෙකින් පිරිසිදුවූ තමා දක්නෙමි’ යන මේ සතරවැනිවූ අස්වැසීම ලබන ලද්දේ වෙයි.

22. “කාලාමයෙනි, මෙසේ වෛර සිත් නැත්තාවූ මෙසේ ව්‍යාපාද සිත් නැත්තාවූ මෙසේ නොකිලිටු සිත් ඇත්තාවූ මෙසේ පිරිසිදු සිත් ඇත්තාවූ ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයා විසින් මේ ආත්මයෙහිම මේ අස්වැසීම් සතර ලබන ලද්දාහු වෙත්යයි වදාළේය.

23. “භාග්‍යවතුන් වහන්ස, එය එසේමය, සුගතයන් වහන්ස, එය එසේමය, ස්වාමීනි ඒ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මෙසේ අවෛර සිත් ඇත්තේ වේද, අව්‍යාපාද සිත් ඇත්තේ වේද, නොකිලුටු සිත් ඇත්තේ වේද, පිරිසිදු සිත් ඇත්තේ වේද, ඔහු විසින් මේ ආත්මයෙහි අස්වැසීම් සතරක් ලබන ලද්දාහු වෙත්.

24. (මේ ඡේදය මේ සූත්‍රයේ 18 ඡේදය මෙනි.)

25. (මේ ඡේදය මේ සූත්‍රයේ 19 ඡේදය මෙනි.)

26. (මේ ඡේදය මේ සූත්‍රයේ 20 ඡේදය මෙනි.)

27. (මේ ඡේදය මේ සූත්‍රයේ 21 ඡේදය මෙනි)

28. “ස්වාමීනි, මෙසේ අවෛර සිත් ඇත්තාවූ අව්‍යාපාද සිත් ඇත්තාවූ නොකිලුටු සිත් ඇත්තාවූ පිරිසිදු සිත් ඇත්තාවූ ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයා විසින් මේ අස්වැසීම් සතර ලබන ලද්දාහු වෙත්.”

29. (මේ ඡේද බ්‍රාහ්මණ වර්ගයේ 3 සූත්‍රයේ 14 ඡේදය මෙනි.)

**16. නන්දකත්ථෙර සූත්‍රයː-** 1. එක් සමයෙක්හි ආයුෂ්මත් නන්දක ස්ථවිර තෙමේ සැවැත්නුවර මිගාරමාතුප්‍රසාද නම්වූ පූර්වාරාමයෙහි වාසය කරයි. එකල්හි මිගාර සිටුහුගේ මුනුපුරුවූ සාළ්හ තෙමේද පෙඛුනිය සිටුහුගේ මුනුපුරුවූ රොහණ තෙමේද

ආයුෂ්මත් නන්දක ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියාහ. පැමිණ ආයුෂ්මත් නන්දක ස්ථවිරයන්ට වැඳ එක්පසෙක හුන්හ.

2. එක්පසෙක හුන් මිගාර සිටුහුගේ මුනුපුරුවූ සාළ්හට මෙසේ කීය. කෙසේද? "සාළ්හයෙනි, (මෙහි මේ වර්ගයේ 15 වෙනි සූත්‍රයේ 5 වෙනි ඡේදයේ 'තෙපි' යන වචනයේ සිට යොදාගැනීමේදී 'කාලාමයෙනි' වෙනුවට 'සාළ්හයෙනි' යොදා ගත යුතුයි.)

3. "සාළ්හයෙනි, ඒ කුමකැයි හඟින්නහුද? ලොභය ඇත්තේද?"-"ස්වාමීනි එසේය."

"සාළ්හයෙනි, මම අභිධ්‍යා යනුද මේ සඳහාම කියමි. සාළ්හයෙනි, ලොභයෙන් ඇලුණාවූ අභිධ්‍යා බහුල කොට ඇත්තාවූ මෙතෙමේ සතුන්ද මරයි.

4. "සොරකම්ද කරයි, පරදාරාවන් කරාද යයි, බොරුද කියයි, ඔහුට යමක් බොහෝකලක් අහිත පිණිස දුක් පිණිස වෙයි නම්, අන්‍යයාද එහි යොදවයිද?"-"ස්වාමීනි එසේය."

5. "සාළ්හයෙනි, ඒ කුමකැයි සිතන්නාහුද? ද්වේෂය ඇත්තේද?"-"ස්වාමීනි එසේය."

"සාළ්හයෙනි, මම ව්‍යාපාද යනුද ඒ සඳහාම කියමි. සාළ්හයෙනි, ව්‍යාපාදයෙන් යුත් සිත් ඇති මෙතෙමේ සතුන් මරයි. (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුය)

6. 'සාළ්හයෙනි, ඒ කුමකැයි සිතන්නාහුද? මොහය ඇත්තේද?"-"ස්වාමීනි එසේය."

"සාළ්හයෙනි, මම අවිද්‍යා යනුද ඒ සඳහාම කියමි. සාළ්හයෙනි, මුළාවූ අවිද්‍යාවෙන් යුක්තවූ මෙතෙමේ සතුන්ද මරයි. (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යොදාගත යුතුයි.)

"සාළ්හයෙනි, ඒ කුමකැයි සිතන්නහුද? මේ ධර්මයෝ කුසල් හෝ වෙත්ද අකුසල් හෝ වෙත්ද?"- "ස්වාමීනි අකුසල්ය."

"වරද හෝ නිවරද හෝ වෙත්ද?"-"වරද වෙත්."

"නුවණැත්තන් විසින් ගර්හා කරන ලද්දාහු හෝ වෙත්ද? නුවණැත්තන් විසින් ප්‍රශංසා කරනලද්දාහු හෝ වෙත්ද?"- "ස්වාමීනි, නුවණැත්තන් විසින් ගර්හා කරන ලද්දාහු වෙත්"

"පුරන ලද්දාහු සමාදන්වන ලද්දාහු අහිත පිණිස දුක් පිණිස පවතිත්ද? නොපවතිත්ද? මෙහි තොපගේ අදහස කෙසේද?"- "ස්වාමීනි පුරනලද්දාහු සමාදන් වන ලද්දාහු අහිත පිණිස දුක් පිණිස පවතිත්. මෙහි අපගේ අදහස මෙසේ වේයයි" කීය. සාළ්හයෙනි, (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය මෙන් 15 සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි)

"සාළ්හයෙනි, එකල්හි තෙපි අකුසල පහකරන්නාහුයයි යමක් කීයෙමුද මෙසේ යමක් කියන ලද්දේද එය මේ සඳහාම කියනලදී.

7. "සාළ්හයෙනි (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය මෙන් 15 සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) සාළ්හයෙනි, එකල්හි තෙපි කුසලයන්ට පැමිණ වාසයකරව්.

"සාළ්හයෙනි, ඒ කුමකැයි සිතන්නාහුද? ආලොභය ඇත්තේද?"-"ස්වාමීනි, එසේය."

'සාළ්හයෙනි, මම අනභිධ්‍යා යනුද ඒ සඳහාම කියමි සාළ්හයෙනි, ලොභයෙන් නො ඇලුණාවූ අනභිධ්‍යාව බහුල කොට ඇත්තාවූ මෙතෙමේ සතුන් නොමරයි.

8. "සොරකම්ද නොකරයි. පරදාරාවන් කරාද නොයයි. බොරුද නොකියයි. ඔහුට යමක් බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වෙයි නම් අන්‍යයාද යොදවයිද?-"ස්වාමීනි, එසේය.

9. "සාළ්හයෙනි, අද්වෙෂය ඇත්තේද?"-"ස්වාමීනි, එසේය. "සාළ්හයෙනි, මම අව්‍යාපාද යනුද ඒ සඳහාම කියමි. සාළ්හයෙනි, ද්වේෂයෙන් දූෂ්‍යනොවූ අව්‍යාපාද සිත් ඇත්තාවූ මෙතෙමේ සතුන්ද නොමරයි. (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

10. "සාළ්හයෙනි, ඒ කුමකැයි සිතන්නාහුද? අමොහය ඇත්තේද?-"ස්වාමීනි, එසේය."

"සාළ්හයෙනි, මම අවිද්‍යා යනුද මේ සඳහාම කියමි. සාළ්හයෙනි, නොමුළාවූ විද්‍යාවෙන් යුක්තවූ මෙතෙමේ සතුන්ද නොමරයි. (මෙහි මේ සූත්‍රයේ 8 ඡෙදය යෙදිය යුතුයි.)

11. "සාළ්හයෙනි, ඒ කුමකැයි සිතන්නහුද? මේ ධර්මයෝ කුශලයෝ හෝ වෙත්ද? අකුශලයෝ හෝ වෙත්ද? "ස්වාමීනි, කුශලයෝය."

"වරද හෝ නිවරද හෝ වෙත්ද?"-"ස්වාමීනි, නිවරදය"

"නුවණැත්තන් විසින් ගර්හාකරන ලද්දාහු හෝ වෙත්ද? නුවණැත්තන් විසින් ප්‍රශංසා කරනලද්දාහු හෝ වෙත්ද?- "ස්වාමීනි, නුවණැත්තන් විසින් ප්‍රශංසාකරන ලද්දාහු වෙත්"

"පුරනලද්දාහු සමාදන්වන ලද්දාහු හිත පිණිස සැප පිණිස පවතිත්ද නොපවතිත්ද? මෙහි තොපගේ අදහස කුමක්ද?"- "ස්වාමීනි, පුරනලද්දාහු සමාදන්වන ලද්දාහු හිත පිණිස සැප පිණිස පවතිත් යනු මෙහි අපගේ අදහස වේයයි" කීය.

12. 'සාළ්හයෙනි, මෙසේ (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය මෙන් 15 සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.)

(මෙහි මේ සූත්‍රයේ 8 වෙනි ඡෙදය යෙදිය යුතුයි)

"සාළ්හයෙනි, එකල්හි තෙපි ඊට පැමිණ වාසය කරව් යයි යම් වචනයක් කීයෙමුද, මෙසේ යම් වචනයක් කියන ලද්දේද එය මේ සඳහා කියනලදී.

13. "සාළ්හයෙනි, මෙසේ දුරුකළ අභිධ්‍යා ඇත්තාවූ දුරුකළ ව්‍යාපාද ඇත්තාවූ නොමුළාවූ යහපත් නුවණින් යුක්තවූ සිහියෙන් යුක්තවූ ඒ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මෛත්‍රී සහගත සිතින් කරුණාසහගත සිතින් (මෙහි මේ වර්ගයේ 13, සූත්‍රයේ 13, 14, 16, 14, 18, 14, 20, 14, ඡෙදය යොදාගතයුතුයි)

හෙතෙමේ මේ දුක්ඛ සත්‍ය ඇතැයිද මේ හීනවූ සමුදය සත්‍ය ඇතැයිද මේ ප්‍රණීතවූ මාර්ගසත්‍ය ඇතැයිද මේ විදර්ශනා ඥානයෙන් මතුයෙහි නිශ්ශරණයවූ නිරොධසත්‍ය ඇත්තේයයි දැනගනියි. මෙසේදන්නාවූ මෙසේ දක්නාවූ ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන්ද මිදෙයි. භවාශ්‍රවයන් කෙරෙන්ද සිත

මිදෙයි. අවිද්‍යාශ්‍රවයෙන් කෙරෙන්ද සිත මිදෙයි. මිදුණු කල්හි මිදුණේය යන ඥානය පහළවෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවනලදී. කළයුත්ත කරනලදී. මෙයින් පසු ආත්ම භාවයක් නැතැයි දැනගනියි.

14. "හෙතෙම මෙසේ දැනගනියි. පෙර ලොභය විය. එය අකුසලයක් විය. එය දැන් නැත. එය යහපති පෙර ද්වෙෂය විය. එය අකුසලක් විය. එය දැන් නැත. එය යහපති. පෙර මොහය විය. එය අකුසලකි. එය දැන් නැත. එය යහපති කියායි. හෙතෙම මෙසේ මේ ආත්මයෙහිම අවිද්‍යා වැස්ම දුරුවූයේ නිවීගියේ සිසිල්වූයේ සැපය විඳින්නේ බ්‍රහ්මවූ ආත්මයෙන් (ස්කන්ධයෙන්) යුක්තව වාසය කරන්නේයයි" කීය.

17. **තිකථාවත්ථු සූත්‍රයః-** 1. "මහණෙනි කථාවට වස්තු වන කරුණු මොහු තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක්ද? මහණෙනි අතීතයෙහි මෙසේ වීයයි අතීත කාලය පිළිබඳවද කථා කරන්නේය. අනාගත කාලයෙහි මෙසේ වන්නේයයි අනාගත කාලය පිළිබඳවද කථා කරන්නේය. මේ වර්තමාන කාලය මෙසේ වේයයි වර්තමාන කාලය අරබයාද කථා කරන්නේය.

2. "මහණෙනි, එක්ව කථා කරන්නවුන් විසින් ඉදින් කථා කළ යුත්තෙක්ද ඉදින් කථා නොකළ යුත්තෙක් දැයි පුද්ගලයා දැනගත යුතුය. මහණෙනි ඉදින් යම් පුද්ගලයෙක් ප්‍රශ්න අසන ලද්දේ ඒකාන්තයෙන් නිශ්වය කොට විසඳිය යුතු ප්‍රශ්නය ඒකාන්තයෙන් නිශ්වය කොට නොවිසඳයිද, බෙදා කොටස් කර විසඳිය යුතු ප්‍රශ්නය බෙදා කොටස් කර නොවිසඳයිද, කුමක් හෙයින් අසන්නෙහිදැයි හෙතුව පිළිවිස විසඳිය යුතු ප්‍රශ්නය හෙතුව පිළිවිස නොවිසඳයිද, නොවිසඳා තැබිය යුතු ප්‍රශ්න නොවිසඳා නොතබයිද, මෙසේ ඇති කල්හි මෙතෙමේ කථා නොකළ යුතු පුද්ගලයා වෙයි,

3. "මහණෙනි, ඉදින් යම් පුදගලයෙක් තෙමේ ප්‍රශ්න අසන ලද්දේ ඒකාන්තයෙන් විනිශ්වය කොට විසඳිය යුතු ප්‍රශ්නය ඒකාන්තයෙන් විනිශ්වය කොට විසඳයිද බෙදා කොටස් කර විසඳිය යුතු ප්‍රශ්නය බෙදා කොටස් කර විසඳයිද, හෙතුව පිළිවිස

විසඳිය යුතු ප්‍රශ්නය හෙතුව පිළිවිස විසඳයිද, නොවිසඳා තැබිය යුතු ප්‍රශ්නය නොවිසඳා තබයිද, මහණෙනි, මෙසේ ඇති කල්හි මෙතෙමේ කථා කළ යුතු පුද්ගලයා වෙයි.

**4.** "මහණෙනි, කථාවට එක්වන්නවුන් විසින් ඉදින් කථා කළ යුත්තෙක්ද ඉදින් කථා නොකළ යුත්තෙක් දැයි පුද්ගලයා දැනගත යුතුය. මහණෙනි ඉදින් මේ පුද්ගල තෙමේ ප්‍රශ්න අසන ලද්දේ කාරණ අකාරණයන්හි නොපිහිටයිද කල්පනා කරන ලද්දෙහි නොපිහිටයිද, අනික් වාදයෙක්හි නොපිහිටයිද, ප්‍රතිපත්තියෙහි නොපිහිටයිද, මහණෙනි, මෙසේ ඇති කල්හි මේ පුද්ගල තෙමේ කථා නොකළ යුතු පුද්ගලයා නම්. මහණෙනි, ඉදින් වනාහි මේ පුද්ගල තෙමේ කාරණ අකාරණයන්හි පිහිටයිද, කල්පනා කරන ලද්දෙහි පිහිටයිද, අන්‍ය වාදයෙහි පිහිටයිද ප්‍රතිපත්තියෙහි පිහිටයිද, මහණෙනි මෙසේ ඇති කල්හි මේ පුද්ගල තෙමේ කථා කළ යුතු පුද්ගලයා නම් වෙයි.

**5.** "මහණෙනි, කථාවට එක්වන්නවුන් විසින් ඉදින් කථා කළ යුත්තෙක්ද, ඉදින් කථා නොකළ යුත්තෙක්දැයි පුද්ගලයා දැනගත යුතුය. මහණෙනි, ඉදින් මේ පුද්ගල තෙමේ ප්‍රශ්න අසන ලද අනික් කථාවකින් අනික් කථාවක් වසයිද, වෙන අතකට කථාව යොමු කරයිද, කොපය දොසය නොසතුට පහළ කරයිද, මහණෙනි මෙසේ ඇති කල්හි මෙතෙමේ කථා නොකළ යුතු පුද්ගලයා වෙයි.

**6.** "මහණෙනි, මේ පුද්ගල තෙමේ ඉදින් ප්‍රශ්න අසන ලද්දේ අනික් කථාවකින් අනික් කථාවක් නොවසයිද, කථාව අන් අතකට යොමු නොකරයිද කොපය දොසයද නොසතුටද පහළ නොකරයිද මහණෙනි, මෙසේ ඇති කල්හි මෙතෙමේ කථා කළයුතු පුද්ගලයා නම් වෙයි.

**7.** "මහණෙනි, කථාවෙහි යෙදෙන්නවුන් විසින් ඉදින් කථා කළ යුත්තෙක්ද, ඉදින් කථා නොකළ යුත්තෙක්දැයි, පුද්ගලයා දැනගත යුතුය. මහණෙනි ඉදින් මේ පුද්ගල තෙමේ ප්‍රශ්න අසන ලද්දේ සූත්‍ර ගෙන හැර දක්ව දක්වා යටපත් කරයිද. කරුණු ගෙන හැර දක්වා මඩීද, මහසිනා පහළ කෙරේද, සුලු

වැරදීමක් දැක එය අල්වා ගනීද, මහණෙනි, මෙසේ ඇති කල්හි මෙතෙමේ කථා නොකළ යුතු පුද්ගලයා නම් වෙයි.

8. "මහණෙනි, ඉදින් මේ පුද්ගල තෙමේ ප්‍රශ්න අසන ලද්දේ සූත්‍ර ගෙනහැර දක්වමින් යටපත් නොකරයිද, කරුණු ගෙනහැර දක්වා නොමඩීද, මහසිනහ පහළ නොකරයිද සුලු වරදක් දැක අල්ලා නොගනියිද, මහණෙනි, මෙසේ ඇති කල්හි මෙතෙමේ කථා නොකළ යුතු පුද්ගලයා නම් වෙයි.

9. "මහණෙනි, කථාවෙහි යෙදෙන්නවුන් විසින් ඉදින් හෙතු සම්පත් ඇත්තෙක්ද ඉදින් හෙතු සම්පත් නැත්තෙක් දැයි පුද්ගලයා දැනගත යුතුය. මහණෙනි, කන් යොමු නොකරන්නා හෙතු සම්පත් නැති පුද්ගලයා නම් වෙයි. කන් යොමු කරන්නා හෙතු සම්පත් ඇති පුද්ගලයා නම් වෙයි. ඒ හෙතු සම්පත් ඇති පුද්ගල තෙමේ එක් ධර්මයක් (මාර්ග සත්‍ය) අවබොධ කරයි. එක් ධර්මයක් (දුක්ඛ සත්‍ය) පිරිසිඳ දැනගනියි. එක් ධර්මයක් (සමුදය සත්‍ය) පහ කරයි. එක් ධර්මයක් (අර්හත් ඵලය හෝ නිර්වාණය) ප්‍රත්‍යක්ෂ කරයි එක් ධර්මයක් අවබොධ කරන්නාවූ එක් ධර්මයක් පිරිසඳ දැන ගන්නාවූ එක් ධර්මයක් පහකරන්නාවූ එක් ධර්මයක් ප්‍රත්‍යක්ෂ කරන්නාවූ හෙතෙමේ අර්හත් ඵල විමුක්තිය ස්පර්ශ කරයි. මහණෙනි උපාදානයන් කෙරෙන් චිත්තයාගේ යම් ඒ මිදීමක් වෙයිද කථාව ඒ අර්ථය පිණිස වන්නීය. මන්ත්‍රණය ඒ අර්ථය පිණිස වන්නේය. හෙතු සම්පත්තිය ඒ අර්ථය පිණිස වන්නීය. කන් යොමු කිරීම ඒ අර්ථය පිණිස වන්නේය."

1. "කොපයෙන් විරුද්ධවූ බැස ගත්තාවූ මානයෙන් ඔසවන ලද්දාවූ ඔවුනොවුන්ගේ සිදුරු සොයන්නාවූ යම් කෙනෙක් අනුන්ගේ ගුණ මකා අනාර්‍ය්‍ය කථා කරද්ද,

2. "ඔවුනොවුන්ගේ නපුරු වචනයටද වැරදීමෙන් කියවුණ වචනයටද ප්‍රමාද දෝෂයටද පරාජයටද සතුටු වෙත්. ආර්‍ය්‍යතෙම ඒ කථාව නොකියන්නේය.

3. "ඉදින් පණ්ඩිත තෙම සුදුසු කාලය දැන කථා කරනු කැමති වන්නේද ධර්මයෙන් හා අර්ථයෙන් යුක්තවූ ආර්‍ය්‍යයන්ගේ යම් චරිත කථාවක් වන්නීද,

4. "කොපයෙන් විරුද්ධ නොවූ මානයෙන් නොඔසවන ලද්දාවූ යුගග්‍රහ වශයෙන් නොගන්නාවූ සාහසික නොවූ පණ්ඩිත තෙම නොවිසිර ගිය සිතින් ඒ කථාව කියන්නේය.

5. "ඊෂ්‍යා නොකරන්නාවූ හෙතෙම මනාව දැන කියයි. යහපත් වචනය අනුමෝදන් වන්නේය. අයහපත් වචනයෙහි නොගැලෙන්නේය.

6. "එකට එක කිරීමට නුපුරුදු වන්නේය. පැකුලුණු වචනය වරද කොට නොගන්නේය. කාරණය යටපත් නොකරන්නේය, මර්දනය නොකරන්නේය. සැබෑ බොරු දෙකින් යුක්තවූ වචනය නොකියන්නේය.

7. "සත්පුරුෂයන්ගේ කථාව එකාන්තයෙන් දැන ගැනීම පිණිසද පැහැදීම පිණිසද වෙයි. මෙසේ ආර්‍ය්‍යයෝ කථා කෙරෙත්. මෙය ආර්‍ය්‍යයන්ගේ කථාවයි. ප්‍රඥ තෙම මෙය දැන මානයෙන් උඩඟු නොවී කථා කරන්නේය.

18. **තිර්ථය පුච්ඡා සූත්‍රය**:- 1. "මහණෙනි, ඉදින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ ඇවැත්නි, මේ ධර්මයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක්ද? රාගයද දොසයද මොහයද යන තුනයි. ඇවැත්නි, මේ ධර්මයෝ තිදෙන වෙත්. ඇවැත්නි, මේ තුන් ධර්මයන්ගේ විශෙෂය කුමක්ද අභිප්‍රාය කුමක්ද වෙනස කුමක්දැයි, ඉදින් අසන්නාහුද, මහණෙනි මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට කුමකැයි ප්‍රකාශ කරන්නාහුද?

2. "ස්වාමීනි, අපහට ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නායක කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. මේ වදාරණ ලද කාරණයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේම ප්‍රකට කරන සේක්නම් මැනවි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරා ගන්නාහුයයි" කීහ.

3. "මහණෙනි, එසේ නම් අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි." භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

5. "මෙසේ අසන ලද්දාවූ තෙපි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරව් කෙසේද? 'ඇවැත්නි රාගය වනාහි ස්වල්ප වරද ඇත්තේය. දුරුවීමට කල් ගතවන්නේය. ද්වෙෂය මහත් වරද ඇත්තේය, වහා දුරු වන්නේය. මොහය මහත් වරද ඇත්තේය. දුරුවීමට කල් ගතවන්නේය.

6. ඇවැත්නි, යමක් හෙතුකොට ගෙන නූපන්නාවූ රාගය උපදීද උපන්නාවූ රාගය බහුලවීම පිණිස වැඩීම පිණිස පවතියිද ඊට හෙතුව කුමක්ද කාරණය කුමක්ද? සුභ ආරම්මණ යයි කිය යුතු වන්නේය. සුභාරම්මණය නුනුවණින් මෙනෙහි කරන්නාවූ ඔහුට නූපන්නාවූ රාගය උපදියි. උපන්නාවූ රාගය බහුලවීම පිණිස වැඩීම පිණිස පවතියි. යම් හෙතුවකින් නූපන්නාවූ රාගය උපදියිද, උපන්නාවූ රාගය බහුලවීම පිණිස වැඩීම පිණිස පවතියි. මේ ඊට හෙතුවයි කාරණයයි.

7. "ඇවැත්නි, යම් හෙතුවකින් නූපන්නාවූ දොෂය උපදියිද උපන්නාවූ දොෂය බහුලවීම පිණිස වැඩීම පිණිස පවතියිද ඊට හෙතුව කුමක්ද? කාරණය කුමක්ද? ඇවැත්නි, ක්‍රොධය උපදින අරමුණ යයි කිවයුතුය. ඇවැත්නි ක්‍රොධය උපදින අරමුණ නුනුවණින් මෙනෙහි කරන්නාවූ ඔහුට නූපන්නාවූ දොෂය උපදියි. උපන්නාවූ දොෂය බහුලවීම පිණිස වැඩීම පිණිස පවතියි. ඇවැත්නි යම් හෙතුවකින් නූපන්නාවූ ද්වෙෂය උපදියිද උපන්නාවූ ද්වෙෂය බහුලවීම පිණිස වැඩීම පිණිස පවතියි. මේ ඊට හෙතුවයි කාරණයයි.

8. "ඇවැත්නි, යම් හෙතුවකින් නූපන්නාවූ මොහය උපදීද, උපන්නාවූ මෝහය බහුලවීම පිණිස වැඩීම පිණිස පවතියිද, ඊට හෙතුව කුමක්ද කාරණය කුමක්ද? ඇවැත්නි, නුනුවණින් මෙනෙහි කිරීමයයි කිව යුතුය. නුනුවණින් මෙනෙහි කරන්නාවූ ඔහුට නූපන්නාවූ මොහය උපදියි. උපන්නාවූ මොහය බහුලවීම පිණිස වැඩීම පිණිස පවතියි. යම් හෙතුවකින් නූපන්නාවූ මොහය උපදියිද උපන් මොහය බහුලවීම පිණිස වැඩීම පිණිස පවතියි. මේ ඊට හෙතුවයි කාරණයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

9. "ඇවැත්නි, යම් හෙතුවකින් නූපන්නාවූ රාගය නූපදියිද උපන්නාවූ රාගය දුරුවෙයිද ඊට හෙතුව කවරේද කාරණය කවරේද? අසුභාරම්මණයයි කියයුතුය. අසුභාරම්මණය නුවණින් මෙනෙහි කරන්නාවූ ඔහුට නූපන් රාගය නූපදියි. උපන් රාගය, දුරුවෙයි. යම් හෙතුවකින් නූපන් රාගය නූපදීද, උපන්නාවූ රාගය දුරු වෙයිද මේ ඊට හෙතුවයි කාරණයයි.

10. "ඇවැත්නි, යම් හෙතුවකින් නූපන් ද්වෙෂය නූපදියිද, උපන් ද්වෙෂය දුරු වෙයිද, ඊට හෙතුව කුමක්ද? කාරණය කුමක්ද? මෛත්‍රී සමාධියයි කිය යුතුය. මෛත්‍රී සමාධිය නුවණින් මෙනෙහි කරන්නාවූ ඔහුට නූපන් ද්වෙෂය නූපදියි. උපන් ද්වෙෂය දුරු වෙයි. ඇවැත්නි, යම් හෙතුවකින් නූපන් ද්වෙෂය නූපදීද උපන්නාවූ ද්වෙෂය දුරු වෙයිද, මේ ඊට හෙතුවයි කාරණයයි.

11. ඇවැත්නි, යම් හෙතුවකින් නූපන් මොහය නූපදියිද, උපන් මොහය දුරු වෙයිද, ඊට හෙතුව කුමක්ද? කාරණය කුමක්ද නුවණින් මෙනෙහි කිරීම යයි කියයුතුය. නුවණින් මෙනෙහි කරන්නාවූ ඔහුට නූපන් මොහය නූපදියි. උපන් මොහය දුරු වෙයි. ඇවැත්නි, යමක් හෙතුකොට ගෙන නූපන් මොහය නූපදීද උපන්නාවූ මොහය දුරු වෙයිද මේ ඊට හෙතුවයි කාරණයයි."

19. **කුසලාකුසල මූල සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ අකුසල මූලයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක්ද ලොභය අකුසල් මුලකි. දොෂය අකුසල් මුලකි, මොහය අකුසල් මුලකි.

2. "මහණෙනි, යම් ලොභයක් වේද, එයද අකුශලයකි. ලොභයෙන් ඇලුණාවූ පුද්ගල තෙමේ කයින් වචනයෙන් සිතින් යමක් රැස්කරයිද එයද අකුසල් වෙයි. ඇලුණාවූ ලොභයෙන් මඩනා ලද්දාවූ විනාශ කරන ලද සිත් ඇත්තාවූ පුද්ගල තෙමේ 'මම බලවතෙක්මි. බලය ප්‍රයෝජන කොට ඇත්තෙක් වෙමියි' වධ කිරීමෙන් හෝ බන්ධනයෙන් හෝ ධනය විනාශ කිරීමෙන් හෝ ගර්හා කිරීමෙන් හෝ රටින් නෙරපීමෙන් හෝ අසත්‍යයෙන් අන්‍යයාට දුක් උපදවාද, එයද අකුසල් වන්නේය. මෙසේ ඔහුට ලොභයෙන් හටගන්නාවූ ලොභය නිදාන කොට ඇත්තාවූ

ලොභය නිසා පහළ වන්නාවූ ලොභය ප්‍රත්‍යකොට ඇත්තාවූ නොයෙක් ලාමක අකුසල ධර්මයෝ හටගනිත්.

3. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදයේ 'ලොභය' වෙනුවට 'ද්වෙෂය' යොදා සකස් කර ගත යුතුයි.)

4. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදයේ 'ලොභය' වෙනුවට මොහය යොදා ඡෙදය සකස් කර ගත යුතුයි.)

5. "මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ අකාලවාදීයයිද අභූතවාදීයයිද, අනර්ථවාදීයයිද අධර්මවාදීයයිද අවිනයවාදීයයිද කියනු ලැබේ. මහණෙනි, කුමක් හෙයින් මේ පුද්ගල තෙමේ අකාලවාදීයයිද අභූතවාදීයයිද අනර්ථවාදීයයිද අධර්මවාදීයයිද අවිනයවාදීයයිද කියනුලැබේද මහණෙනි, යම්සේ මේ පුද්ගල තෙමේ 'මම බලවත් වෙමි. බලයෙන් ප්‍රයෝජන ඇත්තේ වෙමියි' වධකිරීමෙන් හෝ හිර කිරීමෙන් හෝ ධනය විනාශ කිරීමෙන් හෝ නෙරපීමෙන් හෝ අසත්‍යයෙන් අන්‍යයාට දුක් උපදවයිද සත්‍යවූ පරිදි කියනු ලැබූ කල්හි හෙතෙමේ අවමන් කරයි, නොපිළිගනියි. අසත්‍යයෙන් කියනු ලබන කල්හි එය මෙසේත් අසත්‍යයයි මෙසේත් අභූතයයි එය පැටලුම් හැරීම පිණිස උත්සාහ නොකරයි, එහෙයින් මෙබඳු පුද්ගල තෙමේ අකාලවාදීයයිද, අභූතවාදීයයිද, අනර්ථවාදීයයිද, අධර්මවාදීයයිද, අවිනයවාදීයයිද කියනු ලැබේ. මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ ලොභයෙන් හටගන්නාවූ අකුසල ධර්මයන්ගෙන් මඩනා ලද්දේ විනාශ කරන ලද සිත් ඇත්තේ මේ ආත්මයෙහිම දුක් සහිතවූ ශොකයෙන් හටගන්නාවූ වෙහෙස සහිතවූ දාහ සහිතවූ දුක් විඳිමින් වාසය කරයි. කය බිඳීමෙන් මරණින් පසු දුර්ගතිය කැමති විය යුත්තීය.

ද්වෙෂයෙන් උපන්-මොහයෙන් උපන් ලාමක අකුසල ධර්මයන්ගෙන් මඩනා ලද්දේ යටකොට ගත් සිත් ඇත්තේ මෙලොවම වෙහෙස සහිතව දැඩි ආයාස සහිතව දැවිලි සහිතව දුකසේ වාසය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු දුගතිය කැමතිවිය යුතුයි.

6. "මහණෙනි, යම්සේ මාලුවා වැල් තුනක් විසින් උඩට නගින ලද්දාවූ හාත්පස වෙලාගන්නා ලද්දාවූ, සල් රුකක් හෝ දඹ රුකක් හෝ කොළොම් රුකක් හෝ නොවැඩීමට පැමිණෙයිද, විනාශයට පැමිණෙයිද, නොවැඩීමට හා විනාශයට පැමිණෙයිද,

7. "මහණෙනි, එපරිද්දෙන්ම මෙබඳු පුද්ගල තෙමේ ලොභයෙන් හටගත් ලාමක අකුශල ධර්මයන්ගෙන් මඩනා ලද්දේ විනාශ කරන ලද සිත් ඇත්තේ මේ ආත්මයෙහි පීඩා සහිතවූ වෙහෙස සහිතවූ දාහ සහිතවූ දුක් විදිමින් වාසය කරයි, කය බිඳීමෙන් මරණින් පසු දුර්ගතිය කැමතිවිය යුත්තීය

8. (මේ සූත්‍රයේ 7 ඡේදයේ 'ලොභයෙන්' වෙනුවට 'ද්වෙෂයෙන්' යන වචනය යොදාගත් කල මේ ඡේදය වෙයි.

9. (මේ සූත්‍රයේ 7 ඡේදයේ 'ලොභයෙන්' වෙනුවට 'මෝහයෙන්' යන වචනය යොදාගත් කල මේ ඡේදය වෙත්. මහණෙනි, මේ තුන අකුශල මූලයෝ නම් වෙත්.

10. "මහණෙනි, මේ කුශල මූලයෝ තුනක් වෙත්. කවර තුනක්ද? මහණෙනි, අලොභය අකුසල මූලයකි. අදොසය අකුසල මූලයකි, අමොහය අකුසල මූලයකි.

11. "මහණෙනි, යම් අලොභය වෙයිද එයද කුසලයකි. අලොභී පුද්ගල තෙමේ කයින් වචනයෙන් සිතින් යමක් රැස් කරයිද එයද කුසලයකි. ලොභි නොවූ ලොභයෙන් නොමඩනා ලද විනාශ නොකරන ලද සිත් ඇත්තාවූ පුද්ගල තෙමේ 'මම බලවත් වෙමි බලයෙන් ප්‍රයෝජන ඇත්තෙමියි' හිංසා කිරීමෙන් හෝ බන්ධනයෙන් හෝ ධනය විනාශ කිරීමෙන් හෝ ගර්හා කිරීමෙන් හෝ රටින් නෙරපීමෙන් හෝ අසත්‍යයෙන් අන්‍යයාට දුක් නූපදවයිද එයද කුසලයකි. මෙසේ ඔහුට අලොභයෙන් උපන් අලොභය නිදානකොට ඇත්තාවූ ලොභය නිසා පහළ වන්නාවූ අලොභය ප්‍රත්‍යකොට ඇත්තාවූ නොයෙක් කුසල් ධර්මයෝ හටගනිත්.

12. (මේ සූත්‍රයේ 11 ඡේදයේ 'අලොභය' වෙනුවට 'අද්වෙෂය යොදා ඡේදය සකස් කර ගත යුතුයි.)

13. (මේ සූත්‍රයේ 11 ඡේදයේ 'අලොභය' වෙනුවට 'අමොහය යොදා ඡේදය සකස්කර ගත යුතුය.)

14. "මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ කාලවාදීයයිද භූතවාදීයයිද අර්ථවාදීයයිද ධර්මවාදීයයිද විනයවාදීයයිද කියනු ලැබේ. මහණෙනි, කුමක් හෙයින් මෙබඳු පුද්ගලතෙම කාලවාදීයයිද භූතවාදීයයිද අර්ථවාදීයයිද ධර්මවාදීයයිද විනයවාදීයයිද කියනු ලැබේද? මහණෙනි, යම්සේ වනාහි මේ පුද්ගල තෙම 'මම බලවත් වෙමි. බලයෙන් ප්‍රයෝජන ඇත්තෙමියි' හිංසාකිරීමෙන් හෝ බන්ධනයෙන් හෝ ධනය විනාශ කිරීමෙන් හෝ ගර්හා කිරීමෙන් හෝ රටින් නෙරපීමෙන් හෝ අසත්‍යයෙන් අන්‍යයාට දුක් නූපදවයිද, සත්‍යයෙන් කියනු ලබන්නාවූ හෙතෙම පිළිගනියිද, අවමන් නොකරයිද, අසත්‍යයෙන් කියනු ලබන කල්හි මෙය මෙසේද අසත්‍යය මෙය මෙසේද අභූතයයි එය පැටලුම් හැරීම පිණිස උත්සාහ කරයිද එහෙයින් මෙබඳු පුද්ගල තෙමේ කාලවාදීයයිද, භූතවාදීයයිද අර්ථවාදීයයිද, ධර්මවාදීයයිද, විනයවාදීයයිද කියනු ලැබේ.

15. "මහණෙනි, මෙබඳු පුද්ගලයාගේ ලොභයෙන් හට ගන්නාවූ ලාමක අකුශල ධර්මයෝ ප්‍රහීනවූහ. සිඳින ලද මුල් ඇත්තාහ. කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරනලදහ. නැවත නූපදින ස්වභාවය ඇත්තාහ. මේ ආත්මයෙහිම පීඩා රහිතවූ දැඩි වෙහෙස රහිතවූ දාහ රහිතවූ සැප විඳිමින් වාසය කරයි.

මේ ආත්මයෙහිම ද්වේෂයෙන් උපන්-මොහයෙන් උපන් ලාමක අකුශල ධර්මයෝ ප්‍රහීනවූවාහු සිඳින ලද මුල් ඇත්තාහු මස්තකය කපන ලද තල්ගසක් මෙන් කරන ලද්දාහු අභාවයට යවන ලද්දාහු මතු නූපදින සංඛ්‍යාවට කරණ ලද්දාහු මෙලොව විඩා නැතිව දැඩි ආයාස නැතිව දැවිලි නැතිව සැපසේ වසයි. මේ ආත්මයෙහිම කෙලෙස් පිරිනිවෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**16.** 'ලොභයෙන්' වෙනුවට 'ද්වෙෂයෙන්' යයි 15 ඡෙදයට යෙදීමෙන් මේ ඡෙද සෑදේ.)

**17.** ('ලොභයෙන්' වෙනුවට 'මොහයෙන්' යයි 15 ඡෙදයට යෙදීමෙන් මේ ඡෙදය සෑදේ.)

**18.** "මහණෙනි, යම්සේ මාලුවා වැල් තුනකින් උඩට නගින ලද්දාවූ හාත්පස වෙළන ලද්දාවූ සල් ගසක් හෝ දැව ගසක් හෝ කොළොන්ගසක් වේද ඉක්බිති උදැල්ලක් ගෙන පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඒ මාලුවා වැල මුලින් සිඳින්නේය මුලින්සිඳ හාත්පස සාරන්නේය, හාත්පස සාරා අන්තිම වශයෙන් සැවැන්ද මුල් තරම් මුල්ද උදුරන්නේය. හෙතෙම ඒ මාලුවා වැල කඩ කඩ කොට සිඳින්නේය, කඩ කඩ කොට සිඳ පලන්නේය, පලා තීරු තීරු ඉරන්නේය. තීරු තීරු ඉරා අව්වෙහි වියලන්නේය. අව්වෙහි වියලා ගින්නෙන් දවන්නේය. ගින්නෙන් දවා අළු කරන්නේය. අළුකොට මහා වාතයෙහි හෝ ගසා හරින්නේය. ශීඝ්‍ර ජල පාර ඇති ගඟක හෝ පාකර හරින්නේය. මහණෙනි, මෙසේ ඒ මාලුවා වැල සිඳින ලද මුල් ඇත්තී වන්නීය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දීය. නොවැඩෙන බවට පමුණුවන ලද්දීය. නැවත නූපදින ස්වභාවය ඇත්තීය.

**19.** "මහණෙනි, එසේම මෙබඳු පුද්ගලයාගේ ලොභයෙන් හටගන්නාවූ අකුශලයෝ ප්‍රහීණවූහ. සිඳින ලද මුල් ඇත්තාහ. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහ. නොවැඩෙන බවට පමුණුවන ලද්දාහ. නැවත නූපදින ස්වභාවය ඇත්තාහ. මේ ආත්මයෙහිම පීඩා රහිතවූ දැඩි වෙහෙස රහිතවූ දාහ රහිතවූ සැපය විඳිමින් වාසය කරයි. මේ ආත්මයෙහිම පිරිනිවෙයි.

**20.** (මේ සූත්‍රයේ 19 ඡෙදයේ 'ලොභයෙන්' වෙනුවට 'ද්වෙෂයෙන්' යයි යෙදීමෙන් මේ ඡෙදය සෑදේ)

**21.** (මේ සූත්‍රයේ 19 ඡෙදයේ 'ලොභයෙන්' වෙනුවට මෝහයෙන්යයිද යෙදීමෙන් මේ ඡෙදයසෑදේ)

"මහණෙනි, මේ වනාහි කුසල මූලයෝ තුන වෙත්."

**20. විසාඛුපොසථ සූත්‍රය:- 1.** "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර මිගාරමාතු පාසාද නම්වූ පූර්වාරාමයෙහි වැඩවසන සේක. එකල්හි මිගාර මාතාවූ විශාඛා උපාසිකා තොමෝ එදවස් පොහෝ දිනයෙහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාය පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නීය.

2. "එක් පසෙක හුන් මිගාර මාතා විශාඛා උපාසිකාවට භාග්‍යවතුන් වහන්සේ "විශාඛාවෙනි, මේ දවල් කාලයෙහි කොහි සිට එන්නෙහි දැයි?" වදාළේය.

"ස්වාමීනි, මම අද පෙහෙවස් සමාදන්ව වෙසෙමියි" කීය.

"විශාඛාවෙනි, මේ උපොසථතුනක් වෙත්. කවර තුනක්ද ගොපාලක උපොසථය නිගණ්ඨ උපොසථය අරිය උපොසථය යන මේ තුනය.

3. 'විශාඛාවෙනි, කෙසේ නම් ගොපාලක උපොසථ ශීලය වන්නේද? විශාඛාවෙනි, යම්සේ ගොපලු තෙම සවස් කාලයෙහි ගවයන් ස්වාමියන්ට බාර දී මෙසේ සිතන්නෙහිද? කෙසේද? 'අද ගවයෝ අසවල් අසවල් තන්හි හැසුරුණාහ. අසවල් අසවල් තන්හි පැන් පූහ. හෙට ගවයෝ අසවල් අසවල් තන්හි හැසිරෙන්නාහ. අසවල් අසවල් තන්හි පැන් බොන්නාහ' කියායි. විශාඛාවෙනි, එපරිද්දෙන්ම මේ ලොකයෙහි පෙහෙවස් සමාදන්වූ ඇතැමෙක් මෙසේ සිතයි. කෙසේද 'අද මම මේ මේ කෑ යුතු දෙය කෑවෙමි. මේ මේ පානය කළ යුතු දේ පානය කෙළෙමි. මම හෙට මේ මේ කෑ යුතු දේ කන්නෙමි. මේ මේ පානය කළ යුතු දේ බොන්නෙමි' කියායි. හෙතෙම ඒ ලොභයෙන් අභිධ්‍යා සහගත සිතින් දවස ඉක්මවයි. විශාඛාවෙනි මෙසේ ගොපාලක උපෝසථය වේ.

4. "විශාඛාවෙනි, මෙසේ වසන ලද ගොපාලක උපොසථය මහත් ඵල ඇත්තේ නොවෙයි. මහානිසංස ඇත්තේ නොවෙයි. මහත් බැබලීම් ඇත්තේ නොවෙයි. මහත්වූ පැතිරීම් ඇත්තේ නොවෙයි.

**5.** "විශාඛාවෙනි, කෙසේ නම් නිගණ්ඨ උපොසථය වේද, විශාඛාවෙනි, නිගණ්ඨ නම්වූ ශ්‍රමණ වර්ගයක් ඇත. ඔව්හු ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවත් කෙසේද? 'පින්වත, මෙහි එව පූර්ව දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම් ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව. පශ්චිම දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම් ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව. උතුරු දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම් ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව. දකුණු දිශාවෙහි යොදුන් සියයකින් එපිට යම් සත්වයෝ වෙත් නම් ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව' කියායි. මෙසේ සමහර සතුන් කෙරෙහි කරුණාව පිණිස අනුකම්පාව පිණිස සමාදන් කරවත්. සමහර සත්වයන් කෙරෙහි අකරුණාව පිණිස අනනුකම්පාව පිණිස සමාදන් කරවත්. ඔවුහු පොහෝ දිනයෙහි ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවත්. කෙසේද? 'පින්වත් පුරුෂය, මෙහි එව සියලු වස්ත්‍ර බහා තබා මම කිසි තැනක කිසිවෙකුට පළිබොධ නොවෙමි. මට කිසි තැනෙක්හි කිසියම් දෙයෙක්හි පළිබොධක් නැතැයි' කියව. (එහෙත්) ඔහුගේ මවුපියෝ මේ අපගේ පුත්‍රයා යයි දනිත්. ඔහුද මේ මගේ මවුපියෝ යයි දනිත්. ඔහුගේ අඹු දරුවෝද මේ අපගේ පොෂ්‍ය කරන්නා යයි දනිත්. ඔහුද මේ මගේ අඹු දරුවෝ යයි දනිත්. ඔහුගේ දැසි දස් කම්කරුවෝද මේ අපගේ ස්වාමියායයි දනිත්. ඔහුද මේ මගේ දැසි දස් කම්කරුවෝයයි දනිත්. මෙසේ යම් කලෙක සත්‍යයෙහි සමාදන් කරවිය යුත්තාහුද එකල බොරුවෙහි සමාදන් කරවත්. මේ ඔහුගේ මුසාවාදයයි කියමි. හෙතෙම ඒ රාත්‍රිය ගෙවීමෙන් පසු නුදුන්නාවූම ඇඳ පුටු කැඳ බත් ආදි පරිභොග කරයි. මේ ඔහුගේ අදින්නාදානය (සොරකම) යයි කියත්. විශාඛාවෙනි නිගණ්ඨ උපොසථය වෙයි.

**6.** විශාඛාවෙනි, "මෙසේ වසනලද නිගණ්ඨ උපොසථය මහත් ඵල ඇත්තේ නොවෙයි. මහත් ආනිසංස ඇත්තේ නොවෙයි මහත් බැබලීම් ඇත්තේ නොවෙයි. පැතුරුණු විපාක ඇත්තේ නොවෙයි.

7. "විශාඛාවෙනි, කෙසේ අරිය උපොසථය වේද? විශාඛාවෙනි, කෙලෙසුන්ගෙන් කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. විශාඛාවෙනි, කිලුටුව සිත කෙසේ උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයිද?

8. "විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවක තෙම ඒ භාග්‍යවත් තෙමේ මෙසේද අර්හත්ය, සම්‍යක් සම්බුද්ධය, විජ්ජාචරණ සම්පන්නය, සුගතය, ලොකවිදූය අනුත්තර පුරිසදම්ම සාරථීය, දෙව් මිනිසුන්ට ශාස්තෘය, බුද්ධය, භාග්‍යවත්යයි තථාගතයන් සිහි කරයිද, තථාගතයන් සිහි කරන්නාවූ ඔහුගේ සිත පහදියි. සතුට උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලෙශයෝ වෙත්ද ඒ ක්ලෙශයෝ පහ වෙත්.

9. "විශාඛාවෙනි, කිළුටුවූ හිස උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. විශාඛාවෙනි කිලුටුවූ හිස උපක්‍රමයෙන් කෙසේ පිරිසිදු වේද? තෙල්ලි කල්කය නිසාත් මැටි නිසාත් ජලය නිසාත් ඊට සුදුසුවූ පුරුෂයාගේ උත්සාහය නිසාත්ය. විශාඛාවෙනි, මෙසේ කිලුටුවූ හිස උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. විශාඛාවෙනි, එපරිද්දෙන්ම කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි.

10. (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

11. "විශාඛාවෙනි, මේ ආර්‍යශ්‍රාවක තෙමේ බ්‍රහ්ම උපොසථය වන්නේ වෙයි. තථාගතයන් නමැති බ්‍රහ්මයා හා සමඟ වසන්නේ වෙයි. තථාගතයන් නමැති බ්‍රහ්මයා අරබයා සිත පහදවයි. ප්‍රීතිය උපදවයි. ඔහුගේ සිතේ යම් ක්ලෙශයෝ වෙත් නම් ඒ ක්ලෙශයෝ පහ වෙත්.

12. "විශාඛාවෙනි, කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. විශාඛාවෙනි, කෙසේ කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයිද?

13. "විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවක තෙමේ භාග්‍යවතුන් විසින් ධර්මය මනාව දෙශනා කරන ලදී. සන්දිට්ඨිකය අකාලිකය, එහිපස්සිකය, ඔපනයිකය නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුතුයයි ධර්මය සිහි කරයිද, ධර්මය සිහි කරන්නාවූ ඔහුගේ සිත පහදියි. සතුට උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලෙශයෝ වෙත් නම් ඒ ක්ලෙශයෝ පහවෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14. "විශාඛාවෙනි, කිලිටුවූ ශරීරය උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි' විශාඛාවෙනි, කිලුටුවූ ශරීරය කෙසේ උපක්‍රමයෙන් පිරිසිදු කරන්නේද? කුරුවින්දක ගල් සුණු වලින් සාදන ලද ඇඟ උලන ගල නිසාත් ඇඟ ගාන සුණු නිසාත් ජලය නිසාත් ඊට සුදුසුවූ පුරුෂයාගේ උත්සාහය නිසාත්ය. විශාඛාවෙනි, මෙසේ කිලුටුවූ කය උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. විශාඛාවෙනි, කෙසේ කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයිද?

15. (මේ ඡේදය මේ සූත්‍රයේ 13 ඡේදය මෙනි.)

16. "විශාඛාවෙනි, මේ ආයර්‍ය ශ්‍රාවක තෙමේ ධර්ම උපොසථයෙහි වසයි. ධර්මය හා සමඟ වාසය කරයි. ධර්මය අරබයා ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලෙශයෝ වෙත් නම් ඒ ක්ලෙශයෝ පහවෙත්. විශාඛාවෙනි, මෙසේ වනාහි කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි.

17. "විශාඛාවෙනි, කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. විශාඛාවෙනි, කෙසේ නම් කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වේද?

18. "විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආයර්‍යශ්‍රාවක තෙමේ භාග්‍යවත්හුගේ ශ්‍රාවක සංඝ තෙම සුපටිපන්නය. භාග්‍යවත්හුගේ ශ්‍රාවක සංඝතෙම උජුපටිපන්නය. භාග්‍යවත්හුගේ ශ්‍රාවක සංඝ තෙම ඤායපටිපන්නය. භාග්‍යවත්හුගේ ශ්‍රාවක සංඝ තෙම සාමීචිපටිපන්නය. යම් ඒ පුරිස යුග සතරක්ද පුරුෂ පුද්ගලයෝ අට දෙනෙක්ද ඇත්තාහුද භාග්‍යවත්හුගේ ඒ ශ්‍රාවක සංඝ තෙම ආහුණෙය්‍ය වෙයි. පාහුනෙය්‍ය වෙයි. දක්ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලි කරණීය වෙයි. ලොකයාගේ අනුත්තර පුන්‍යක්ෂෙත්‍රය වේයයි, සංඝයා සිහි කරයිද සංඝයා සිහි කරන්නාවූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලෙශයෝ වෙත් නම් ඒ ක්ලෙශයෝ පහ වෙත්.

19. "විශාඛාවෙනි, යම්සේ අපිරිසිදුවූ වස්ත්‍රය උපක්‍රමයෙන් පිරිසිදු වේද, විශාඛාවෙනි, කෙසේ කිලිටුවූ වස්ත්‍රය උපක්‍රමයෙන් පිරිසිදු වේද, උනුසුම නිසාද, අලු කාරම් නිසාද, ගොම නිසාද,

ජලය නිසාද, පුරුෂයාගේ ඊට සුදුසු වෑයම් නිසාද විශාඛාවෙනි, මෙසේ වනාහි කිලිටුවූ වස්ත්‍රය උපක්‍රමයෙන් පිරිසිදු වේ.

**20.** (මේ ඡේදය මේ සූත්‍රයේ 18 ඡේදය මෙනි.)

**21.** "විශාඛාවෙනි, ඒ ආයඞීශ්‍රාවක තෙමේ සංඝ උපොසථයෙහි වාසය කරයි. සංඝයා හා සමග වාසය කරයි. සංඝයා අරබයා ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලෙශයෝ වෙත් නම්, ඒ ක්ලෙශයෝ පහවෙත්. විශාඛාවෙනි, මෙසේ කිලුටුසිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි.

**22.** "විශාඛාවෙනි, කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. විශාඛාවෙනි, කිලුටුවූ සිත උපක්‍රමයෙන් කෙසේ පිරිසිදු වෙයිද?

**23.** "විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආයඞීශ්‍රාවක තෙම කඩ නොවූ සිදුරු නොවූ කබර නොවූ කැලැල් නොවූ තෘෂ්ණාවට යටත් නොවූ නුවණැතියන් විසින් ප්‍රශංසා කරන ලද තෘෂ්ණා දෘෂ්ටීන් විසින් අල්වා නොගන්නා ලද සමාධිය පිණිස පවත්නා තමාගේ ශීලය සිහි කරයිද, සීලය සිහි කරන්නාවූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලෙශයෝ වෙත් නම් ඒ ක්ලෙශයෝ පහවෙත්.

**24.** "විශාඛාවෙනි, කිලුටුවූ කැඩපත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. විශාඛාවෙනි, කිලුටුවූ කැඩපත උපක්‍රමයෙන් කෙසේ පිරිසිදු වෙයිද? තෙල් නිසාත් අලු නිසාත් බුරුසුව නිසාත් පුරුෂයාගේ ඊට සුදුසුවූ උත්සාහය නිසාත්ය. විශාඛාවෙනි, මෙසේ කිලුටුවූ කැඩපත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. විශාඛාවෙනි, මෙසේ කිලිටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදුවීම වේ.

"විශාඛාවෙනි, කෙසේ නම් කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයිද?

**25.** "(මේ ඡේදය මේ සූත්‍රයේ 23 ඡේදය මෙනි.)

**26.** "විශාඛාවෙනි, මේ ආයඞීශ්‍රාවක තෙම සීල උපොසථයෙහි වසන්නේය. සීලය හා සමග වාසය කරයි. ඔහුගේ

සීලය අරබයා සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලෙශයෝ වෙත් නම් ඒ ක්ලෙශයෝ පහ වෙත්. විශාඛාවෙනි, මෙසේ කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි.

27. "විශාඛාවෙනි, කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. විශාඛාවෙනි, කෙසේ කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයිද?

28. "විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවක තෙම චාතුර්මහාරාජික දෙවියෝ ඇත්තාහ. තව්තිසා දෙවියෝ ඇත්තාහ. යාම දෙවියෝ ඇත්තාහ. තුසිත දෙවියෝ ඇත්තාහ. නිර්මානරතී දෙවියෝ ඇත්තාහ. පරනිර්මිත වසවර්ති දෙවියෝ ඇත්තාහ. එයින් මත්තෙහි බ්‍රහ්ම කායික දෙවියෝ ඇත්තාහ. යම්බඳුවූ ශ්‍රද්ධාවකින් යුක්තවූ ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහුද මාහටද එබඳුවූ ශ්‍රද්ධාවක් ඇත. යම් බඳුවූ සීලයකින් යුක්තවූ ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහුද එබඳුවූ සීලයක් මටද ඇත. යම්බඳුවූ ශ්‍රැතයකින් යුත් ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහුද මට ද එබඳුවූ ශ්‍රැතයක් ඇත. යම්බඳුවූ ත්‍යාගයකින් යුත් ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහුද, මටද එබඳුවූ ත්‍යාගයක් ඇත. යම් බඳුවූ ප්‍රඥාවකින් යුත් ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහුද මටද එබඳුවූ ප්‍රඥාවක් ඇත. තමාගේද ඒ දෙවියන්ගේද ශ්‍රද්ධාවද ශීලයද ශ්‍රැතයද ත්‍යාගයද ප්‍රඥාවද සිහි කරන්නාවූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලෙශයෝ වෙත් නම් ඒ ක්ලෙශයෝ පහ වෙත්.

29. "විශාඛාවෙනි කිලුටුවූ කාසියක් උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. විශාඛාවෙනි, කිලුටුවූ කාසියක් කෙසේ උපක්‍රමයෙන් පිරිසිදු වන්නේද? විශාඛාවෙනි, කොව නිසාත් ලුණු නිසාත් ගෙරුක චූර්ණය නිසාත් පිඹින නලය හා අඬුව නිසාත් ඊට සුදුසුවූ උත්සාහය නිසාත්ය. විශාඛාවෙනි, මෙසේ වනාහි කිලුටු සිත උපක්‍රමයෙන් පිරිසිදුවීම වෙයි. විශාඛාවෙනි එපරිද්දෙන්ම කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදුවීම වෙයි.

30. "විශාඛාවෙනි, කෙසේ කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වේද?

31. "(මේ ඡේදය මේ සූත්‍රයේ 28 ඡේදය මෙනි.)

32. "විශාඛාවෙනි, මේ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ දෙවතා උපොසථයෙහි වසායයිද දෙවියන් සමඟ වාසය කෙරේයයිද, කියනු ලැබේ. ඔහුගේ සිත දෙවියන් අරබයා පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලෙශයෝ වෙත් නම්, ඒ ක්ලෙශයෝ පහ වෙත්. විශාඛාවෙනි, මෙසේ කිලුටුවූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි.

33. "විශාඛාවෙනි, ඒ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ සිතයි. කෙසේද? රහත්හු දිවි ඇතිතාක් ප්‍රාණඝාතය දුරු කොට ප්‍රාණඝාතයෙන් වෙන්ව බහා තබනලද දඬු ඇතිව බහා තැබූ ආයුධ ඇතිව ලජ්ජා ඇතිව දයාවෙන් යුක්තව සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇතිව, වාසය කරත්. 'මම ද මේ රාත්‍රියද මේ දවාලද ප්‍රාණඝාතය දුරුකොට ප්‍රාණ ඝාතයෙන් වැළකී බහා තැබූ දඬු ඇතිව බහා තැබූ ආයුධ ඇතිව ලජ්ජා ඇතිව දයා ඇතිව සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරමි. මම මේ අංගයෙන්ද රහතුන්ට අනුව පිළිපදිමි. එසේ කරන්නාවූ මා විසින් උපොසථයද වසන ලද්දේ වෙයි.

34. "රහත්හු දිවි ඇතිතාක් නුදුන් දෙය ගැනීම දුරු කොට නුදුන් දෙය ගැනීමෙන් වෙන්ව දුන් දෙයක්ම ගනිමින් දුන් දෙයක්ම කැමති වෙමින් සොර නොවූ පිරිසිදුවූ ආත්ම භාවයෙන් වාසය කරයිද 'මමද මේ රාත්‍රියත් මේ දවාලත් නුදුන් දෙය ගැනීම දුරුකොට නුදුන් දෙය ගැනීමෙන් වෙන්ව දුන් දෙයම ගනිමින් දුන් දෙයම කැමති වෙමින් සොර නොවූ පිරිසිදුවූ ආත්ම භාවයෙන් වාසය කරමි. මම මේ අංගයෙන්ද රහතුන්ට අනුව පිළිපදිමි. එසේ කරන්නාවූ මා විසින් උපොසථය වසන ලද්දේද වන්නේය.

35. "රහත්හු දිවි ඇතිතාක් අබ්‍රහ්මචර්‍ය්‍යාව දුරුකොට බ්‍රහ්මචාරීව අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් ඈත්ව මෛථුන සංඛ්‍යාත ග්‍රාම ධර්මයෙන් වෙන්ව වාසය කරත්. 'මමද මේ රාත්‍රියත් මේ දවාලත් අබ්‍රහ්මචර්‍ය්‍යාව පහකොට බ්‍රහ්මචාරීව, අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් දුරුව

මෛථුන සංඛ්‍යාත ග්‍රාම ධර්මයෙන් වෙන්ව වාසය කරමි. මම මේ අංගයෙන්ද රහතුන්ට අනුව පිළිපදිමි. මෙසේ කරන්නාවූ මා විසින් උපොසථය වසන ලද්දේද වන්නේය.

**36.** "රහත්හු දිව ඇතිතාක් මුසාවාදය හැර මුසාවාදයෙන් වැළක සත්‍යය කියමින් සත්‍යයෙන් සත්‍යය ගළපමින් ස්ථිර වචන කියමින් ඇදහිය හැකි වචන කියමින් ලොකයා වංචා නොකරත්ද, 'මමද අද මේ රාත්‍රියද මේ දවාලද බොරුව අත්හැර බොරුවෙන් වැලැක්කේ ඇත්ත කියමින් ඇත්තෙන් ඇත්ත ගලපමින් ස්ථිර වචන කියමින් ඇදහිය හැකි වචන කියමින් ලොකයා වංචා නොකරමි. 'මම මේ අංගයෙන්ද රහතුන් අනුව පිළිපදිමි. එසේ කරන්නාවූ මා විසින් උපොසථයද වසන ලද්දේ වෙයි.

**37.** "රහත්හු දිවිඇතිතාක් මදයට හා ප්‍රමාදයට හෙතුවූ රහමෙර පීම හැර මදටය හා ප්‍රමාදයට හෙතුවූ රහමෙර පීමෙන් වැලැක්කාහුය. 'මමද අද මේ රාත්‍රියද මේ දවාලද මදයට හා ප්‍රමාදයට හෙතුවූ රහමෙර පීමෙන් වෙන්වෙමි. මම මේ අංගයෙන්ද රහතුන්ට අනුව පිළිපදිමි. එසේ කරන්නාවූ මා විසින් උපොසථයද වසන ලද්දේ වෙයි.

**38.** "රහත්හු දිවිඇතිතාක් එකවේලේ වළඳන බත් ඇත්තාහ. රාත්‍රි අනුභවයෙන් වැළැක්කාහ. නොකල් බොජුනෙන් වැලැක්කාහ. 'මමද අද මේ දවාලද මේ රාත්‍රියද එක බතක් ඇත්තෙම් රාත්‍රි භොජනයෙන් වැලකී නොකල්හි බොජුනෙන් වැලකීමි. 'මම මේ අංගයෙන්ද රහතුන්ට අනුව පිළිපදිමි. එසේ කරන්නාවූ මා විසින් උපොසථයද වසන ලද්දේ වෙයි.

**39.** "රහත්හු දිවි ඇතිතාක් නැටීම, නැටවීම, ගී කීම, කියවීම, බෙර ආදිය ගැසීම, ගැස්සවීම, නැටුම් වැයුම් ආදී විහිළු දැකීම, මල් සුවඳද විලවුන් පාවිච්චිය සැරසීම අලංකාර කරගැනීම යන මෙයින් වෙන්වූවාහුද 'මමද අද මේ රාත්‍රියද දවාලද නැටීම නැටවීම ගී කීම කියවීම බෙර ආදිය ගැසීම ගැස්සවීම නැටුම් වැයුම් ආදී විහිළු දැකීම මුල් සුවඳ විලවුන් පාවිච්චිය සැරසීම අලංකාර කරගැනීම යන මෙයින් වෙන් වෙමි. මම මේ

අංගයෙන්ද රහතුන්ට අනුව පිළිපදිමි. එසේ කරන්නාවූ මා විසින් උපොසථයද වසන ලද්දේ වෙයි.

40. "රහත්හු දිවි ඇතිතාක් උස් ආසන මහා ආසන හැර උස් ආසන මහා ආසනයෙන් වෙන්වූවාහු මිටි රියන් පමණ ඇඳෙහි හෝ තණ ඇතිරියෙහි හෝ මිටි අස්නෙක හොවිත්. 'මමද අද මේ රාත්‍රියද දවාලද උස් ආසන මහා ආසන හැර මිටි රියනක් පමණ ඇඳෙහි හෝ තණ ඇතිරියක හෝ හොවීමි. මම මේ අංගයෙන්ද රහතුන්ට අනුව පිළිපදිමි. එසේ කරන්නාවූ මා විසින් උපොසථයද වසන ලද්දේ වෙයි.'

41. "විශාඛාවෙනි, මෙසේ විසූ ආර්‍ය්‍ය උපොසථය මහත්ඵල වේ. මහත් ආනිසංස වේ. මහත් බැබලීම් ඇත්තේය. මහත් පැතිරීම් ඇත්තේය. කොපමණ මහත් ඵල මහත් ආනිසංස, මහත් බැබලීම් මහත් පැතිරීම් ඇත්තේද,

42. විශාඛාවෙනි, යම්සේ බොහෝ සත්රුවන් ඇති මේ සොළොස් ජනපදයන් ඇති දඹදිව ඓශ්චර්‍ය්‍යයෙන් අධිපතිවූ චක්‍රවර්ති රජ වන්නේද, ඒ සොළොස් ජනපදය කවරේද? අඞ්ග, මගධ, කාශි, කොශල, වජ්ජි, මල්ල, චෙතිය, වංග, කුරු, පඤ්චාල මච්ඡ, සූරසේන, අස්සක, අවන්ති, ගන්ධාර, කාම්බොජ යන මෙයයි. මේ සක්විතිරාජ්‍යය අංග අටකින් යුක්ත උපොසථයාගේ දහසයට බෙදූ කොටසක් පමණවත් නොවන්නේය. ඊට හෙතු කවරේද? විශාඛාවෙනි, දිව්‍ය සැපය හා සමකර බැලූ කල චක්‍රවර්ති රාජ්‍යය ස්වල්ප දෙයකි.

43. "විශාඛාවෙනි, මනුෂ්‍ය වර්ෂ පනසක් වේද මෙය චාතුර්මහාරාජික දෙවියන්ට එක් රෑ දවාලකි. ඒ රාත්‍රියෙන් තිස් රැයක් මාසයකි. ඒ මසින් දොළොස් මසක් සංවත්සරයකි. ඒ සංවත්සරයෙන් දිව්‍ය වර්ෂ පන්සියයක් චාතුර්මහාරාජික වැසි දෙවියන්ගේ ආයු ප්‍රමාණයයි.

44. "විශාඛාවෙනි, මේ ලොකයෙහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අංග අටකින් යුත් උපෝසථය වැස ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් අතර උපදින්නේය. යන මේ කාරණය විද්‍යමානවේ. විශාඛාවෙනි දිව්‍ය සැපය හා

සමකර බැලූ කල මනුෂ්‍ය සක්විති රජ කම ස්වල්පයයි මේ සඳහා කියන ලදී.

**45.** "විශාඛාවෙනි, මනුෂ්‍ය වර්ෂ සියයක් වේද, මෙය තව්තිසා වැසි දෙවියන්ට (43 වෙනි ඡේදයේ "එක්" යන පදයේ සිට "දිව්‍ය වර්ෂ" යන පදය දක්වා යොදාගත යුතුයි.) දහසක් තව්තිසා වැසි දෙවියන්ගේ ආයු ප්‍රමාණයයි.

**46.** (44 වෙනි ඡේදය යොදාගත යුතුයි. 'චාතුර්මහාරාජික' වෙනුවට 'තව්තිසා' යොදන්න.)

**47.** "විශාඛාවෙනි, මනුෂ්‍ය වර්ෂ දෙසියයක් වේද මෙය යාම දෙව්ලෝ වැසි දෙවියනට (43 වෙනි ඡේදයේ "එක්" යන පදයේ සිට "දිව්‍ය වර්ෂ" යන පදය දක්වා යොදාගත යුතුයි.) දෙදාහක් යාම දෙව්ලොව වැසි දෙවියන්ගේ ආයුප්‍රමාණයයි.

**48.** (44 වෙනි ඡේදය යොදාගත යුතුයි. 'චාතුර්මහාරාජික' වෙනුවට 'යාම' යොදන්න.)

**49.** "විශාඛාවෙනි, මනුෂ්‍ය වර්ෂ සාරසියයක් වේද, මෙය තුසිත දෙව්ලොව වැසි දෙවියනට (43 වෙනි ඡේදයේ "එක්" යන පදයේ සිට "දිව්‍යවර්ෂ" යන පදය දක්වා යොදාගත යුතුයි) හාරදාහක් තුසිත දෙව්ලොව වැසි දෙවියන්ගේ ආයුප්‍රමාණයයි

**50.** (44 වෙනි ඡේදය යොදාගත යුතුයි. 'චාතුර්මහාරාජික' වෙනුවට 'තුසිත' යොදන්න.)

**51.** "විශාඛාවෙනි, මනුෂ්‍ය වර්ෂ අටසියයක් වේද මෙය නිර්මාණරතී දෙවියන්ට (43 වෙනි ඡේදයේ "එක්" යන පදයේ සිට "දිව්‍ය වර්ෂ" යන පදය දක්වා යොදාගත යුතුයි.) අටදාහක් නිර්මාණරතී දෙවියන්ගේ ආයුප්‍රමාණයයි.

**52.** (44 වෙනි ඡේදය යොදාගත යුතුයි. 'චාතුර්මහාරාජික' වෙනුවට 'නිර්මාණරති' යොදන්න.)

**53.** විශාඛාවෙනි, මනුෂ්‍ය වර්ෂ දහසයසීයක් වේද, මෙය පරනිර්මිත වසවර්තී දෙව්ලොව වැසි දෙවියන්ට (43 ඡේදයේ "එක්" යන පදයේ සිට "දිව්‍යවර්ෂ" යන පදය දක්වා යොදාගත

යුතුයි.) දහසයදාහක් පරනිර්මිත වසවර්ති දෙව්ලොව දෙවියන්ගේ ආයු ප්‍රමාණයයි.

**54.** (44 වෙනි ඡේදය යොදාගත යුතුයි. 'චාතුර්මහාරාජික' වෙනුවට 'පරනිර්මිත වසවර්ති' යොදන්න.)

**55. (1)** "සතුන් නොමැරීම, අන්සතු වස්තුව නොගැනීම, බොරු නොකීම, මත්පැන් නොබීම කරන්නෙකු විය යුතුයි. මෛථුන සංඛ්‍යාත ශ්‍රේෂ්ඨ නොවන හැසිරීමෙන් වැලකීම, රෑ කෑම සංඛ්‍යාත නොකල්හි කෑම නොකළ යුතුයි

**(2)** මල්මාලා දැරීම, සුවඳ පාවිච්චිය නොකළ යුතුයි. මිටිරියන් ඇඳෙහි හෝ බිම තණ ඇතිරියෙහි හෝ සයනය කළයුතුයි. මේ අංග අටකින්යුත් උපොසථයයි දුක් කෙළවර කළ බුදුන් විසින් වදාරණලදී.

3. "යහපත් දැකුම් ඇති අඳුරු දුරු කරණ චන්ද්‍රයාද සූර්‍ය්‍යයාද යන දෙදෙන බැබලෙමින් හැසිරෙත්ද, අහසෙහි සැරිසරණ ඒ දෙදෙන දිශා බබුළුවමින් අහසෙහි හැසිරෙත්ද,

4. "මේ අතර මුතුද මැණික්ද යහපත්වූ වෛඩූර්‍ය්‍ය මැණික්ද අං හැඩය ඇති සිංගී නම් රුවන්ද නොහොත් පර්වතවල ඇතිවන රුවන්ද යන යම් ධනයක් ඇත්ද යම් රුවනක් රුවන්ම වේද කුහුඹූ විසින් මැත් කරණ ලද්දේද,

5. "ඒ මුතු මැණික් අංග අටකින් යුත් උපොසථයාගේ දහසයෙන් කොටසක්වත් නොඅගනේය. චන්ද්‍ර රශ්මියට සෙසු තාරකා මෙනි. එසේ හෙයින් සීලයෙන් යුත් ස්ත්‍රී පුරුෂයන්

6. "අංග අටෙන් යුත් උපොසථ වැස සැප විපාක ඇති පින්කොට කිසිකෙනෙකුගෙන් නින්දා නොලබා දිව්‍ය ලොකයට පැමිණෙත්."

**(දෙවෙනි මහාවර්ගය නිමි)**

---

# 8. ආනන්ද වර්ගය.

21. ඡන්නපරිබ්බාජක සූත්‍රයː- 1. "මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක ආනන්ද ස්ථවිරයෝ සැවැත්නුවර අසල අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩසිටියෝය. එකල්හි ඡන්න පරිබ්‍රාජක තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එක්පසෙක හිඳගත්තේය.

2. "එක්පසෙක හිඳගත් ඡන්න පරිබ්‍රාජක තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේට මෙසේ කීය. "ඇවැත් ආනන්දයෙනි, ඔබවහන්සේලාද රාගය පහකිරීම පනවන්නාහුය, ද්වෙෂය පහකිරීම පනවන්නහුය, මොහය පහකිරීම පනවන්නාහුය. ඇවැත්නි, අපිද රාගය පහකිරීම පනවන්නෙමු ද්වෙෂය පහකිරීම පනවන්නෙමු, මොහය පහකිරීම පනවන්නෙමු. ඇවැත්නි, නුඹවහන්සේලා රාගයෙහි කිනම් ආදීනවයක් දැක රාගය පහකිරීම පනවන්නහුද, ද්වෙෂයෙහි කිනම් ආදීනවයක් දැක ද්වෙෂය පහකිරීම පනවන්නහුද මොහයෙහි කිනම් ආදීනවයක් දැක මොහය පහකිරීම පනවන්නහුද?"

3. "ඇවැත්නි, රාගයෙන් ඇලුණාවූ රාගයෙන් මඩනා ලද්දාවූ රාගයෙන් විනාශ කළ සිත් ඇත්තාවූ පුද්ගලතෙම තමහට දුක් පිණිසද සිතයි. අනුන්ට දුක් පිණිසද සිතයි. දෙදෙනාටම දුක් පිණිසද සිතයි. මානසිකවූද දුකක් දොම්නසක් විඳියි.

"රාගය පහවූ කල්හි තමහට දුක් පිණිසද නොසිතයි. අනුන්ට දුක් පිණිසද නොසිතයි. දෙදෙනාටම දුක් පිණිසද නොසිතයි.

"ඇවැත්නි, රාගයෙන් ඇලුණාවූ රාගයෙන් මඩනා ලද රාගයෙන් විනාශ කළ සිත් ඇත්තේ කයින් දුශ්චරිත කරයි, වචනයෙන් දුශ්චරිත කරයි, සිතින් දුශ්චරිත කරයි. රාගය පහවූ කල්හි කයින් දුශ්චරිත නොකරයි. වචනයෙන් දුශ්චරිත නොකරයි, සිතින් දුශ්චරිත නොකරයි.

4. "ඇවැත්නි, රාගයෙන් ඇලුනාවූ රාගයෙන් මඩනා ලද්දාවූ රාගයෙන් විනාශ කළ සිත් ඇත්තේ තමාගේ අර්ථයද තත්වූ පරිදි නොදනියි, පරාර්ථයද තත්වූ පරිදි නොදනියි, අත්මාර්ථ පරාර්ථ දෙකමද තත්වූ පරිදි නොදනියි.

"රාගය පහවූ කල්හි තමාගේ අර්ථයද තත්වූ පරිදි දනියි, පරාර්ථයද තත්වූ පරිදි දනියි, ආත්මාර්ථ පරාර්ථ දෙකමද තත්වූ පරිදි දනියි.

5. "ඇවැත්නි, රාගය සත්වයා අන්ධ කරන්නෙකි, නුවණැස නැති කරන්නෙකි. නොදැනීම ඇතිකරන්නෙකි. ප්‍රඥාව නිරුද්ධ කරන්නෙකි. දුක්ඛ පක්ෂයෙහි සිටියේය. නිවන් පිණිස නොපවත්නේය.

6, 7, 8. ('රාගයෙන්' වෙනුවට 'ද්වෙෂයෙන්' යන වචනය මේ සූත්‍රයේ 3, 4, 5 ඡේදයන්හි යෙදීමෙන් 6, 7, 8 ඡේද සෑදෙත්.)

9, 10, 11ඨ ('රාගයෙන්' වෙනුවට 'මෝහයෙන්' යන වචනය 3, 4, 5 ඡේදයන්හි යෙදීමෙන් 9, 10, 11 ඡේද සෑදෙත්.)

12. "ඇවැත්නි, අපි රාගයෙහි මේ ආදීනව දැක රාගය පහකිරීම පනවමු. දේවෙෂයෙහි මේ ආදීනව දැක ද්වෙෂය පහකිරීම පනවමු. මොහයෙහි මේ ආදීනව දැක මොහය පහ කිරීම පනවමු.

13. "ඇවැත්නි, මේ රාගය ද්වෙෂය මොහය පහකිරීම පිණිස මාර්ගයක් ඇත්තේද? ප්‍රතිපදාවක් ඇත්තීද?"-"ඇවැත්නි, මේ රාගය ද්වෙෂය මොහය පහකිරීම පිණිස මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තීය."

14. "ඇවැත්නි, මේ රාගය ද්වේෂය මොහය පහකිරීම පිණිස පවත්නාවූ මාර්ගය කුමක්ද, ප්‍රතිපදාව කුමක්ද?"

"මේ ආයඊ අෂ්ටාංගික මාර්ගයමැයි. ඒ කෙසේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේය. ඇවැත්නි, මේ රාගය

ද්වෙෂය මොහය පහකිරීම පිණිස මේ මාර්ගය වෙයි, මේ ප්‍රතිපදාව වෙයි."

15. "ඇවැත්නි, මේ රාගය ද්වෙෂය මොහය පහකිරීම පිණිස පවත්නාවූ මාර්ගය යහපත්ය, ප්‍රතිපදාව යහපත්ය ඇවැත්නි, අප්‍රමාදවීමට සුදුසුයයි" කීය.

**22. ආජීවක සාවක සූත්‍රය:-** 1 එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම කොසඹෑ නුවර ඝොසිතාරාමයෙහි වාසය කරයි. එකල්හි ආජීවකයන්ගේ ශ්‍රාවකයෙක්වූ එක්තරා ගෘහපතියෙක් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වැඳ එක්පසෙක හිඳ ගත්තේය.

2. එක්පසෙක හිඳ ගත් ඒ ආජීවකයන්ගේ ශ්‍රාවක ගෘහපතිතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගෙන් මෙය ඇසීය. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, කවරකුන්ගේ ධර්මය මනාකොට දෙශනා කරන ලද්දේද? ලොකයෙහි කවරහු මනාව පිළිපන්නාහුද? කවරහු ලොකයෙහි යහපත් මාර්ගයෙහි ගියාහුද?" යනුයි.

3. "ගෘහපතිය, එසේ නම් මේ කාරණය ඔබගෙන්ම අසමි. ඔබට යම් විදියකින් වැටහේ නම් එය එසේ ප්‍රකාශ කරව. ගෘහපතිය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම්කෙනෙක් රාගය පහකිරීම පිණිස දහම් දෙසත්ද, ද්වෙෂය පහකිරීම පිණිස දහම් දෙසත්ද මොහය පහකිරීම පිණිස දහම් දෙසත්ද ඔවුන්ගේ ධර්මය මනාකොට දෙශනා කරන ලද්දක් වේද නොවේද? මෙහි ඔබගේ අදහස කුමක්ද?"

4. 'ස්වාමීනි, යම්කෙනෙක් රාගය පහකිරීම පිණිස දහම් දෙසත් නම් ද්වෙෂය පහකිරීම පිණිස දහම් දෙසත් නම් මොහය පහකිරීම පිණිස දහම් දෙසත් නම් ඔවුන්ගේ ධර්මය මනාකොට දෙශනා කරන ලද්දක් වෙයි. යනු මෙහි මගේ අදහසයි."

5. "ගෘහපතිය, ඒ කුමකැයි සිතන්නෙහිද? යම් කෙනෙක් රාගය පහකිරීම පිණිස පිළිපන්නාහුද, ද්වෙෂය පහකරනු පිණිස

පිළිපන්නාහුද, මොහය පහකරනු පිණිස පිළිපන්නාහුද ලොකයෙහි ඔව්හු මනාකොට පිළිපන්නාහු වෙත්ද නොවෙත්ද? මෙහි ඔබගේ අදහස කුමක් වෙයිද?"

**6.** "ස්වාමීනි, යම් කෙනෙක් ලොකයෙහි රාගය පහ කිරීම පිණිස පිළිපන්නාහු වෙත්ද, ද්වෙෂය පහකිරීම පිණිස පිළිපන්නාහු වෙත්ද, මොහය පහකිරීම පිණිස පිළිපන්නාහු වෙත්ද ඔව්හු ලොකයෙහි මනාව පිළිපන්නාහු වෙත් යනු මගේ අදහස වෙයි."

**7.** "ගෘහපතිය, ඒ කුමකැයි සිතන්නෙහිද? යමෙකුන්ගේ රාගය පහවූයේ වෙයිද සිඳින ලද මුල් ඇත්තේ වෙයිද සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේ වෙයිද නැවත නූපදින ස්වභාවය ඇත්තේ වෙයිද යමෙකුන්ගේ ද්වෙෂය පහවූයේ වෙයිද සිඳින ලද මුල් ඇත්තේ වෙයිද සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේ වෙයිද නැවත නූපදින ස්වභාවය ඇත්තේ වෙයිද,

යමෙකුගේ මොහය පහවූයේ වෙයිද සිඳින ලද මුල් ඇත්තේ වෙයිද සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දේ වෙයිද නැවත නූපදින ස්වභාවය ඇත්තේ වෙයිද ඔව්හු ලොකයෙහි යහපත් මාර්ගයෙහි ගියාහු වෙත්ද නොවෙත්ද, මෙහි ඔබගේ අදහස කුමක්ද?"

**8.** "ස්වාමීනි, යමෙකුන්ගේ රාගය පහවූයේ වෙයිද සිඳින ලද මුල් ඇත්තේ වෙයිද, සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දේ වෙයිද නැවත නූපදින ස්වභාවය ඇත්තේ වෙයිද යමෙකුන්ගේ ද්වෙෂය පහවූයේ වෙයිද සිඳින ලද මුල් ඇත්තේ වෙයිද සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේ වෙයිද නැවත නූපදින ස්වභාවය ඇත්තේ වෙයිද යමෙකුගේ මොහය පහවූයේ වෙයිද සිඳින ලද මුල් ඇත්තේ වෙයිද, සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේ වෙයිද නැවත නූපදින ස්වභාවය ඇත්තේ වෙයිද, ඔව්හු ලොකයෙහි යහපත් මාර්ගයෙහි ගියාහු වෙත් යනු මාගේ අදහස වෙයි."

**9.** "ගෘහපතිය, මෙසේ ඔබ විසින්ම 'ස්වාමීනි, යම් කෙනෙක් රාගය පහකිරීම පිණිස දහම් දෙසත්ද, ද්වෙෂය පහකිරීම පිණිස

දහම් දෙසත්ද, මොහය පහකිරීම පිණිස දහම් දෙසත්ද ඔවුන්ගේ ධර්මය යහපත් කොට දෙශනා කරන ලද්දකැයි' ප්‍රකාශ කරන ලදී."

10. 'ස්වාමීනි, යම් කෙනෙක් රාගය පහකිරීම පිණිස පිළිපන්නාහු වෙත්ද, ද්වෙෂය පහකිරීම පිණිස පිළිපන්නාහු වෙත්ද, මොහය පහකිරීම පිණිස පිළිපන්නාහු වෙත්ද ඔව්හු ලොකයෙහි මනාව පිළිපන්නාහු වෙත්යයි' ඔබ විසින්ම ප්‍රකාශ කරන ලදී."

11. 'ස්වාමීනි, යමෙකුන්ගේ රාගය පහවූයේද සිඳිනලද මුල් ඇත්තේද සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දේද නැවත නූපදින ස්වභාවය ඇත්තේද, ද්වෙෂය පහවූයේද සිඳින ලද මුල් ඇත්තේද සිඳිනලද තල් ගසක් මෙන් කරන ලද්දේද නැවත නූපදින ස්වභාවය ඇත්තේද, මොහය පහවූයේද සිඳින ලද මුල් ඇත්තේද සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේද නැවත නූපදින ස්වභාවය ඇත්තේද ඔව්හු ලොකයෙහි යහපත් මාර්ගයෙහි ගියාහු වෙත්යයි' ඔබ විසින්ම ප්‍රකාශ කරනලදී."

12. "ස්වාමීනි, ආශ්චර්‍ය්‍යය, අද්භූතය. තමන්ගේ ලබ්ධිය උසස් කොට දැක්වීමක්ද නොවන්නේය. අනුන්ගේ ලබ්ධිය පහත්කොට දැක්වීමක්ද නොවන්නේය. කාරණයෙන්ම ධර්ම දෙශනාව විය, මා විසින් අසන ලද ප්‍රත්‍යයාගේ අර්ථයද ප්‍රකාශ කරන ලදී. අපි මෙබන්දෝ වෙමුයයි තමන් ගැනද නොදක්වන ලදී.

13. "ස්වාමීනි, නුඹවහන්සේලා රාගය පහකිරීම පිණිස දහම් දෙසන්නාහු නම් ද්වෙෂය පහකිරීම පිණිස දහම් දෙසන්නාහු නම්, මොහය පහකිරීම පිණිස දහම් දෙසන්නාහු නම්, ස්වාමීනි, ඔබවහන්සේලාගේ ධර්මය මනාව දෙසන ලද්දකි.

14. "ස්වාමීනි, නුඹවහන්සේලා රාගය පහකිරීම පිණිස පිළිපන්නාහු නම්, ද්වෙෂය පහකිරීම පිණිස පිළිපන්නහු නම් මොහය පහකරනු පිණිස පිළිපන්නහු නම් ඔබවහන්සේලා ලොකයෙහි මනාව පිළිපන්නෝ වෙත්.

15. "ස්වාමීනි, ඔබවහන්සේලාගේ රාගය පහවූයේ නම් මුල් සිඳින ලද්දේ නම් සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේ

නම් විනාශ කරන ලද්දේ නම් නැවත නූපදින ස්වභාවය ඇත්තේ නම් ඔබවහන්සේලාගේ ද්වෙෂය පහවූයේ නම් මුල් සිඳින ලද්දේ නම් සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේ නම් විනාශ කරන ලද්දේ නම් නැවත නූපදින ස්වභාවය ඇත්තේ නම් මොහය පහවූයේ නම් මුල් සිඳින ලද්දේ නම් සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේ නම් විනාශ කරන ලද්දේ නම් නැවත නූපදින ස්වභාවය ඇත්තේ නම් ඔබවහන්සේලා ලොකයෙහි යහපත් මාර්ගයෙහි ගියාහු වෙත්.”

**16.** “ස්වාමීනි, ඉතා යහපති, ස්වාමීනි, ඉතා යහපති, ස්වාමීනි, යම්සේ යටිකුරු කරන ලද්දක් හෝ උඩුකුරු කෙළේද වැසුවක් හෝ විවෘත කෙළේද මංමුළාවූවෙකුට මාර්ගය හෝ කියන්නේද ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් හෝ දරන්නේද එසේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් විසින් නොයෙක් අයුරින් ධර්මය දෙශනා කරන ලදී. ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, ඒ මම ඒ භාග්‍යවතුන්වහන්සේද ධර්මයද සංඝයාද සරණ යමි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මා අද පටන් දිවිහිමියෙන් සරණගිය උපාසකයකු කොට දරන සේක්වා.”

**23. මහානාම (සමාධිඤාණ) සූත්‍රය:-** **1.** එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ කිඹුල්වත් පුරයෙහි නිග්‍රොධාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි භාග්‍යවතුන්වහන්සේ ගිලන්භාවයෙන් නැඟී සිටියෝ වෙත්. ගිලන්කමින් නැගිට නොබෝකල් ඇත්තෝ වෙත්. එකල්හි මහානාම ශාක්‍යතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේට වැඳ එක්පසෙක හිඳගත්තේය.

**2.** එක් පසෙක හිඳගත් මහානාම ශාක්‍යතෙමේ භාග්‍යවතුන්වහන්සේට මෙසේ කීය.

“ස්වාමීනි, මම බොහෝ කලක පටන් භාග්‍යවතුන්වහන්සේ විසින් සමාධියෙන් යුක්තවූවහුට ඥානය වෙයි. සමාධියෙන් යුක්ත නොවූවහුට ඥානය නොවේයයි මෙසේ ධර්ම දෙශනා කරන ලද බව දනිමි. ස්වාමීනි, පළමුකොට සමාධිය ඇතිවේද

පසුව ඥානය ඇතිවේද? නොහොත් පළමුකොට ඥානය ඇතිවේද පසුව සමාධිය ඇතිවේද? යනුයි.”

3. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේට මෙබඳු සිතක් විය. ‘භාග්‍යවතුන්වහන්සේ ගිලන්කමින් නැගී සිටියෝ වෙත්. ගිලන්කමින් නැගිට නොබෝකල් ඇත්තේ වෙත්. මේ මහානාම ශාක්‍යතෙමේ ඉතා ගැඹුරු ප්‍රශ්නයක් අසයි. මම මහානාම ශාක්‍යයා එක් පසකට ඉවත්කොට ධර්ම දෙශනා කරන්නෙම් නම් මැනවි’ කියායි.

4. ඉක්බිති, ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙම මහානාම ශාක්‍යයාගේ දකුණු බාහුවට ඇඟිල්ලෙන් සංඥාකොට එක් පසෙකට කැඳවා මහානාම ශාක්‍යයාහට මෙසේ කීය. “මහානාමය, භාග්‍යවතුන්වහන්සේ විසින් සෙඛ සීලයද වදාරණලදී. අසෙඛ සීලයද වදාරණ ලදී. සෙඛ සමාධියද වදාරණ ලදී. අසෙඛ සමාධියද වදාරණ ලදී. ශෛක්ෂ ප්‍රඥාවද වදාරණ ලදී. අශෛක්ෂ ප්‍රඥාවද වදාරණ ලදී.

5. මහානාමය, අසෙඛ සීලය නම් කුමක්ද? මහානාමය මේ ශාසනයෙහි මහණ තෙමේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව ආචාර ගොචර දෙකින් සමන්විතව ශික්ෂාපදයන්හි දැඩි සමාදානයෙන් යුක්තව වාසය කෙරේද, මහානාමය, මේ සෙඛ සීලයයයි කියනු ලැබේ.

6. “මහානාමය, සෙඛ සමාධිය නම් කුමක්ද? මහානාමය, මේ ශාසනයෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම (8 වෙනි සූත්‍රයේ 3. (iii) විතර්ක සහිත යන තැන සිට සතරවෙනි යන තැන දක්වා යොදාගත යුතුය) චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහානාමය මේ සෙඛ සමාධියයයි කියනු ලැබේ.

7. “මහානාමය, කුමක් ශෛක්ෂප්‍රඥාව නම් වේද, මහානාමය, මේ ශාසනයෙහි මහණ තෙම මෙය දුකයයි තත්වූ පරිදි දනියිද, මෙය දුකට හෙතුව යයි තත්වූ පරිදි දනියිද මෙය දුක නැති කිරීමයයි තත්වූපරිදි දනියිද මෙය දුක නැතිකිරීමට

පැමිණෙන මාර්ගයයි තත්වූ පරිදි දනියිද මහානාමය, මෙය ශෛක්ෂප්‍රඥාවයයි කියනුලැබේ.

8. "මහානාමය, මේ සීලයෙන් යුත් මේ සමාධියෙන් යුත් මේ ප්‍රඥාවෙන් යුත් ඒ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියද අර්හත් ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහිම තෙමේ විශෙෂයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසයකරයි. මහානාමය, මෙසේ වනාහි භාග්‍යවතුන්වහන්සේ විසින් සෙඛ සීලයද වදාරණ ලදී. අසෙඛ සීලයද වදාරණ ලදී. සෙඛ සමාධියද වදාරණ ලදී. අසෙඛ සමාධියද වදාරණ ලදී. ශෛක්ෂප්‍රඥාවද වදාරණලදී. අශෛක්ෂ ප්‍රඥාවද වදාරණ ලදී."

24. "අභය (ලිච්ඡවී) සූත්‍රයඃ- 1. එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ විශාලානුවර මහවනයෙහි කූටාගාර ශාලාවෙහි වාසය කරති. එකල්හි අභය නම් ලිච්ඡවි තෙමේද පණ්ඩිත කුමාර නම් ලිච්ඡවි තෙමේද ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියෝය. පැමිණ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වැඳ එක්පසෙක හිඳගත්හ.

2. "එක්පසෙක හිඳගත් අභය නම් ලිච්ඡවි තෙමේ ආනන්දස්ථවිරයන්ට මෙසේ කීය, "ස්වාමීනි, නිගණ්ඨනාතපුත්‍ර තෙමේ යන්නාවූද සිටින්නාවූද, නිදන්නාවූද, මාහට සියලු කල්හි සර්වඥතාඥානය එළඹ සිටියේයයි' සර්වඥ බව සියල්ල දක්නා ඥානය ඇතිබව නිරවශෙෂ ඥානයක් ඇති බව ප්‍රතිඥා කරයි. හෙතෙම තපස්කිරීමෙන් පුරාණ කර්ම ක්ෂය කරන බව ප්‍රකාශ කරයි. අලුත් කර්ම නොකිරීමෙන් හෙතු නැති කරන බව ප්‍රකාශ කරයි. 'මෙසේ කර්ම ක්ෂය කිරීමෙන් දුක් ක්ෂය කිරීමද, දුක් ක්ෂය කිරීමෙන් වෙදනා ක්ෂය කිරීමද, වෙදනා ක්ෂය කිරීමෙන් සියලු දුක් දිරා යන්නේය, මෙසේ තමා විසින්ම ප්‍රත්‍යක්ෂ කරගත යුතුවූ කෙලෙසුන් දිරවීමයයි කියනලද විශුද්ධියෙන් සියලු දුක්ඛයන්ගේ ඉක්මවීම වේයයි' කියයි.

"ස්වාමීනි, මේ කාරණයෙහි භාග්‍යවතුන්වහන්සේ කුමක් ප්‍රකාශ කරද්ද?" යනුයි.

3. "අභය, දන්නාවූ දක්නාවූ ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන්වහන්සේ විසින් සත්වයන්ගේ පිරිසිදුවීම පිණිස සොක පරිදෙවයන් ඉක්මවීම පිණිස ආයර්‍යමාර්ගය අවබොධ කිරීම පිණිස නිවන් ප්‍රත්‍යක්ෂ කරනු පිණිස මේ ජරාව නැති කරන්නාවූ පිරිසිදු වීම් තුනක් වදාරන ලදහ.

4. "අභය, මෙහි මහණතෙම සිල්වත් වේද ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් යුක්තව ආචාර ගොචර දෙකින් සමන්විතව ශික්ෂා පදයන්හි දැඩි සමාදනයෙන් යුක්තව වාසය කරයිද, හෙතෙමේ අලුත් කර්ම නොකරයි. පුරාණ කර්ම විඳ විඳ කෙළවර කරයි.

5. "මෙයද තමන් විසින්ම දැක්ක යුතුවූ කල් නොයවාම ඵලදෙන 'එව බලවයයි' පෙන්විය හැකි තමන්වෙත එළවාගත යුතුවූ නුවණැතියන් විසින් වෙන වෙනම ප්‍රත්‍යක්ෂ කළ යුතුවූ නිර්ජර විශුද්ධියයි.

6. "අභය, මෙසේ ශීලයෙන් යුක්තවූ ඒ මහණ තෙමේ කාමයන්ගෙන් වෙන්වම, අකුසලයන්ගෙන් වෙන්වම (8 වෙනි සූත්‍රයේ 3, (iii) විතර්ක සහිත යන තැන සිට සතර වෙනි තැන දක්වා යොදාගත යුතුයි.) චතුර්ථද්ධ්‍යානයට පැමිණ වාසයකරයි. හෙතෙම අලුත් කර්ම නොකරයි පුරාණ කර්ම විඳ විඳ කෙළවර කරයි.

7. (මේ ඡෙදය මේ සූත්‍රයේ 5 වෙනි ඡෙදය මෙනි.)

8. "අභය, මෙසේ ශීලයෙන් යුක්තවූ මෙසේ සමාධියෙන් යුක්තවූ ඒ මහණ තෙමේ ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් තෙමේම විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි. හෙතෙමේ අලුත් කර්ම නොකරයි. පුරාණ කර්ම විඳ විඳ කෙළවර කරයි.

9. (මේ ඡෙදය මේ සූත්‍රයේ 5 ඡෙදය මෙනි.)

**10.** "අභය, මේ නිර්ජර විශුද්ධි තුන දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන්වහන්සේ විසින් සත්වයන්ගේ පිරිසිදුවීම පිණිස සොකපරිදෙවයන් ඉක්මවීම පිණිස දුක් දොම්නස් දුරුකිරීම පිණිස මාර්ගය අවබොධ කිරීම පිණිස නිවන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස මනාකොට වදාරන ලදහයි" කීය.

**11.** "මෙසේ කී කල්හි පණ්ඩිත කුමාර ලිච්ඡවී තෙමේ අභය ලිච්ඡවී කුමාරයන්ගෙන් යහලු අභය, කිමෙක්ද ඔබ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ විසින් මනාකොට කියන ලද්ද මනාකොට කියන ලද්දක් වශයෙන් සතුටින් නොපිළිගන්නෙහිදැයි?" ඇසීය.

**12.** "යහලුව, මම කුමක් හෙයින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ විසින් මනාව කියනලද්ද මනාව කියන ලද්දක් වශයෙන් සතුටින් නොපිළිගන්නෙම්ද? යමෙක් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ විසින් මනාව කියන ලද්ද මනාව කියනලද්දක් වශයෙන් සතුටින් නොපිළිගන්නේ නම් ඔහුගේ හිසද පැලෙන්නේයයි" කීය.

**25. සමාදපෙතබ්බ සූත්‍රයः-** 1. එකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේට වැඳ එක්පසක හිඳගත්තේය. එක්පසෙක හිඳගත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළහ.

**2.** "ආනන්දය, සත්වයෙකුට අනුකම්පා කරන්නහුද, මිත්‍රයන් හෝ යහළුවන් හෝ නෑයන් හෝ සහ ලේ නෑයන් හෝ යම් කෙනෙකුන් ඇසියයුත්තන් කොට හඟින්නාහුද ආනන්දය ඔවුහු කරුණු තුනෙක්හි සමාදන් කරවිය යුත්තාහ. ඇතුළත්කරවිය යුත්තාහ. පිහිටුවිය යුත්තාහ. කිනම් කරුණු තුනෙක්හිද?

**3.** "ඒ භාග්‍යවතුන්වහන්සේ මේ කාරණයෙන්ද අර්හත්යහ. (විශාඛ පොසත සූත්‍රයෙහි 8 වෙනි ඡෙදයේ සම්‍යක් යන තැන සිට භාග්‍යවත්යයි යන තැන දක්වා යෙදිය යුතුයි.) භාග්‍යවත්හයයි

බුදුන් කෙරෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙහි සමාදන් කරවිය යුත්තාහ. ඇතුල්කරවිය යුත්තාහ. පිහිටුවිය යුත්තාහ.

4. "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාව දෙශනා කරන ලදී. (වීශාඛුපොසත සූත්‍රයෙහි 13 වෙනි ඡේදයෙහි භාග්‍යවතුන් යන තැන සිට ඕපනයිකය යන තැන දක්වා යෙදිය යුතුයි) නුවණැතියන් විසින් වෙන වෙනම දතයුත්තේයයි ධර්මය කෙරෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙහි සමාදන් කරවිය යුත්තාහ. ඇතුල්කරවිය යුත්තාහ. පිහිටුවිය යුත්තාහ.

5. "භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම මනාව පිළිපන්නේය. (විශාඛු පොසත සූත්‍රයෙහි 18 ඡේදයේ භාග්‍යවත්හුගේ යන තැනසිට කරණීය වෙයි දක්වා යෙදිය යුතුය.) ලොකයාගේ අනුත්තර පුන්‍යක්ෂෙත්‍රය වන්නේයයි සංඝයා කෙරෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙහි සමාදන් කරවිය යුත්තාහ. ඇතුල්කරවිය යුත්තාහ. පිහිටුවිය යුත්තාහ.

6. "ආනන්දය, පඨවී ධාතු, ආපො ධාතු, තෙජො ධාතු, වායො ධාතු යන සතරමහා භූතයන්ගේ පෙරලීමක් වුවත් බුදුන් කෙරෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුත් ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ පෙරලීමක් නොවන්නේය. එනම් ආනන්දය බුදුන් කෙරෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුක්තවූ ඒ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ නිරයෙහි හෝ තිරිසන් යොනියෙහි හෝ ප්‍රෙත විෂයෙහි හෝ උපදින්නේය යන මීට හෙතු නැත්තේය.

7. "ආනන්දය, පඨවී ධාතු ආපෝ ධාතු තෙජො ධාතු වායෝ ධාතු යන සතරමහා භූතයන්ගේ පෙරලීමක් වුවත් ධර්මයෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ පෙරලීමක් නොවන්නේය. එනම් ධර්මයෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම නිරයෙහි හෝ තිරිසන් යොනියෙහි හෝ ප්‍රෙතවිෂයෙහි හෝ උපදින්නේය යන මීට හෙතු නැත්තේය.

8. "ආනන්දය, පඨවී ධාතු ආපෝ ධාතු තෙජො ධාතු වායො ධාතු සතරමහා භූතයන්ගේ පෙරලීමක් වුවත් සංඝයා කෙරෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ පෙරලීමක්

නොවන්නේය. එනම් සංඝයා කෙරෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුත් ආයඝ්‍ය ශ්‍රාවකයා නිරයෙහි හෝ තිරිසන් යොනියෙහි හෝ ප්‍රෙතවිෂයෙහි හෝ උපදින්නේය යන මීට හේතු නැත්තේය.

**9.** "ආනන්දය, යමෙකුට අනුකම්පා කරන්නහුද? මිත්‍රයන් හෝ යාලුවන් හෝ නෑයන් හෝ සහ ලේ නෑයන් හෝ ඇසිය යුත්තන් කොට හඟින්නාහුද.

**10.** "ආනන්දය, ඔව්හු තොප විසින් මේ කරුණු තුනෙහි සමාදන් කරවිය යුත්තාහ. ඇතුල් කරවිය යුත්තාහ. පිහිටුවිය යුත්තාහු යයි" වදාළේය.

**26. භව පඤ්හ සූත්‍රය**:- **1.** "එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්ට මෙසේ සැළ කෙළේය. "ස්වාමීනි, භවය භවය යයි කියනු ලැබේ. ස්වාමීනි, කෙතෙක් කරුණකින් භවය වේද? යනුයි."

**2.** "ආනන්දය, කාම ධාතුයයි කියනලද කාම ලොකයෙහි පැසෙන්නාවූ-විපාක බවට පැමිණෙන්නාවූ කර්මයක් නැත්නම් කාම භවයක් පෙනේද?" "ස්වාමීනි, එසේ නොවේමය."

**3.** "ආනන්දය, මෙසේ වනාහි කර්මය ක්ෂෙත්‍රය වෙයි. විඤ්ඤාණය බීජය වෙයි. තණ්හාව ස්නෙහය-ජලය-වෙයි

**4.** "අවිද්‍යාවෙන් වැසුණාවූ තෘෂ්ණාවෙන් බැඳුණාවූ සත්වයන්ගේ විඤ්ඤාණය හීන ධාතුයයි කියනලද කාම ලොකයෙහි පිහිටියේ වෙයිද, මෙසේ මතු පුනර්භවයාගේ පහළවීම වෙයි.

**5.** "ආනන්දය මධ්‍යම ධාතුයයි කියනලද රූප ලොකයෙහි පැසෙන්නාවූ-විපාක බවට පැමිණෙන්නාවූ කර්මයක් නැත්නම් රූප භවයක් පෙනේද?" "ස්වාමීනි, එසේ නොවේමය."

**6.** (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

**7.** "අවිද්‍යාවෙන් වැසුණාවූ තෘෂ්ණාවෙන් බැඳුණාවූ සත්වයන්ගේ විඤ්ඤාණය මධ්‍යම ධාතුයයි කියන ලද රූප

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ලොකයෙහි පිහිටියේ වෙයිද මෙසේ මතු පුනර්භවයාගේ පහළවීම වෙයි.

8. "ආනන්දය, අරූප ලොකයෙහි පැසෙන්නාවූ කර්මයක් නැත්නම් අරූප භවය පෙනේද?" "ස්වාමීනි, එසේ නෙවේමය."

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

10. "අවිද්‍යාවෙන් වැසුණාවූ තෘෂ්ණාවෙන් බැඳුණාවූ සත්වයන්ගේ විඤ්ඤාණය ප්‍රණීත ධාතුයයි කියනලද අරූප ලොකයෙහි පිහිටියේ වෙයිද, මෙසේ මතු පුනර්භවයාගේ පහළවීම වෙයි. ආනන්දය, මෙසේ වනාහි භවය වේයයි" වදාළේය.

**27. දුතිය භව පඤ්හ සූත්‍රයː-** 1. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. ස්වාමීනි, භවය භවයයි කියනු ලැබේ. ස්වාමීනි, කෙතෙක් කරුණකින් භවය වේද?" යනුයි.

2. "ආනන්දය, කාම ධාතුවෙහි-කාම ලොකයෙහි පැසෙන්නාවූ කර්මයක් නැත්නම් කාම භවයක් පෙනේද?" "ස්වාමීනි, එසේ නොවේමය."

3. "ආනන්දය, මෙසේ කර්මය ක්ෂෙත්‍රය වෙයි. විඤ්ඤාණය බීජය වෙයි. තෘෂ්ණාව ස්නෙහය වෙයි.

4. "අවිද්‍යාවෙන් වැසුණු තෘෂ්ණාවෙන් බැඳුණු සත්වයන්ගේ චෙතනාව හීන ධාතුයයි කියනලද කාම ලොකයෙහි පිහිටියේ වෙයිද ප්‍රාර්ථනාව පිහිටියේ වෙයිද පුනර්භවයාගේ පහළවීම වෙයි.

5. "ආනන්දය, රූප ධාතුවෙහි පැසෙන්නාවූ කර්මයක් නැත්නම් රූප භවයක් පෙනේද?"-"ස්වාමීනි, එසේ නොවේමය."

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

7. "අවිද්‍යාවෙන් වැසුණු තෘෂ්ණාවෙන් බැඳුණු සත්වයන්ගේ චේතනාව මධ්‍යම ධාතුයයි කියනලද රූප ලොකයෙහි පිහිටියේ වෙයිද ප්‍රාර්ථනාව පිහිටියේ වෙයිද මෙසේ මත්තෙහි පුනර්භවයාගේ පහළවීම වෙයි.

8. "ආනන්දය, අරූප ධාතුවෙහි පැසෙන්නාවූ කර්මයක් නැත්නම් අරූප භවයක් පෙනේද?"-"ස්වාමීනි, එසේ නොවේමය."

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

10. "අවිද්‍යාවෙන් වැසුණු තෘෂ්ණාවෙන් බැඳුණු සත්වයන්ගේ චේතනාව ප්‍රණීත ධාතුයෙහි පිහිටියේ වෙයිද, ප්‍රාර්ථනාව පිහිටියේ වෙයිද මෙසේ මත්තෙහි පුනර්භවයාගේ පහළ වීම වෙයි. ආනන්දය, මෙසේ වනාහි භවය වේයයි" වදාළේය.

28. "**සීලබ්බත විභජන සූත්‍රය**:- 1. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය. "ආනන්දය, සාරයයි එළඹ සිටින්නාවූ-(සාරයයි සිතන්නාවූ) සියලු සීලයද ව්‍රතයද දුෂ්කර ක්‍රියාවද බ්‍රහ්මචර්‍ය්‍යාවද ඵල සහිත වෙයිද? යනුයි."-"ස්වාමීනි, ඒකාන්ත වශයෙන්ම ඵල සහිත නොවේ"

2. "ආනන්දය, එසේ නම් බෙදා දක්වනු." "ස්වාමීනි, සාරයයි සිතන්නාවූ යම් ශීලයක් ව්‍රතයක් දුෂ්කර ක්‍රියාවක් බ්‍රහ්මචර්‍ය්‍යාවක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ වැඩෙත් නම් කුශල ධර්මයෝ පිරිහෙත් නම්, සාරයයි සිතන්නාවූ එබඳුවූ ශීලය ව්‍රතය දුෂ්කරක්‍රියාව බ්‍රහ්මචර්‍ය්‍යාව ඵල රහිත වෙයි."

3. "ස්වාමීනි, සාරයයි සිතන්නාවූ යම් සීලයක් ව්‍රතයක් දුෂ්කර ක්‍රියාවක් බ්‍රහ්මචර්‍ය්‍යාවක් සෙවනය කරන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද කුශල ධර්මයෝ වැඩෙත්ද, සාරයයි සිතන්නාවූ එබඳුවූ සීලය ව්‍රතය දුෂ්කර ක්‍රියාව බ්‍රහ්මචර්‍ය්‍යාව ඵල සහිතයයි" කීය.

4. ආනන්ද ස්ථවිර තෙමේ මෙසේ කීය. ශාස්තෘන් වහන්සේ සතුටින් පිළිගත්හ. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ මගේ වචනය භාග්‍යවතුන් වහන්සේ සතුටින් පිළිගත් සේකැයි හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරව කොට ගියේය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් ගිය නොබෝ වේලාවකින් භික්ෂූනට ආමන්ත්‍රණය කළ සේක. "මහණෙනි, ආනන්ද තෙමේ ශෛක්ෂයෙකි. ශෛක්ෂ ප්‍රඥාවෙන් ඔහුට සමවූවෙක් සුලභ නොවේයයි" වදාළේය.

**29. ගන්ධජාත සූත්‍රයඃ- 1.** එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේය. "ස්වාමීනි, යමෙකුන්ගේ සුවඳ යටි සුලඟටම හමයිද, උඩු සුලඟට නොහමයිද, එබඳු සුවඳ වර්ග තුනක් වෙත්. කවර තුනක්ද? මුල් වර්ගවල සුවඳ, අරටු වර්ගවල සුවඳ, මල් සුවඳ යන මෙයි.

2. "ස්වාමීනි, යම් කෙනෙකුන්ගේ සුවඳ යටි සුලඟටම හමාද උඩු සුලඟට නොහමාද මේ ඒ සුවඳ තුන් වර්ගය වෙයි. ස්වාමීනි, යම් කෙනෙකුන්ගේ සුවඳ යටි සුලඟටත් හමයිද උඩු සුලඟටත් හමයිද යටි සුලඟ උඩු සුලඟටත් හමයිද, එබඳු සුවඳ වර්ගයක් ඇත්තේද?" යනුයි.

3. "ආනන්දය, යම් කෙනෙකුන්ගේ සුවඳ යටි සුලඟටත් හමයිද, උඩු සුලඟටත් හමයිද, යටි සුලඟ උඩු සුලඟ යන දෙකටමත් හමයිද, එබඳු සුවඳ වර්ගයක් ඇත්තේය" "ස්වාමීනි, යම් කෙනෙකුන්ගේ සුවඳ යටි සුලඟටත් හමයිද උඩු සුලඟටත් හමයිද යටි සුලඟ උඩු සුලඟ දෙකටමත් හමයිද ඒ සුවඳ කුමක්ද?"

4. "ආනන්දය, යම් ගමෙක හෝ නියම් ගමෙක හෝ.

5. "ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ බුදුන් සරණ ගියේ වේද, ධර්මය සරණ ගියේ වේද, සංඝයා සරණ ගියේ වේද, ප්‍රාණ ඝාතයෙන් වැළකුණේ වෙයිද සොරකමින් වැළකුණේ වෙයිද, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණේ වෙයිද බොරු කීමෙන් වැළකුණේ වෙයිද මත් වීමට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙන් වැළකුණේ වෙයිද, සිල්වත් වේද යහපත් ධර්ම ඇත්තේ වෙයිද ත්‍යාගවත්ව දීමට පිරිසිදු කළ අත් ඇතිව දීමෙහි යෙදුනෙක්ව බෙදා දීමෙහි ඇලුණෙක්ව, දුරුකළ මසුරු මල ඇති සිතින් ගිහිගෙයි, වාසය කරයිද,

6. "අට දිශාවන්හි ශ්‍රමණබ්‍රාහ්මණයෝ ඔහුගේ ගුණ ප්‍රකාශ කරත්. අසවල් ගමෙහි හෝ නියම් ගමෙහි, (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

7. "අමනුෂ්‍යවූ දෙවතාවෝද, ඔහුගේ ගුණ කියත්. අසවල් ගමෙහි හෝ නියම්ගමෙහි හෝ (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) වාසය කරයි කියායි.

8. "ආනන්දය, යමක්හුගේ සුවඳ යටි සුලඟටත් හමයිද උඩු සුලඟටත් හමයිද යටි සුලඟ උඩු සුලඟ යන දෙකටමත් හමයිද ඒ මේ සුවඳ වර්ගය වෙයි.

"දෑ සමන් ආදි මල් සුවඳද සඳුන් තුවරලා බෝලිද්ද මල් සුවඳද උඩු සුලඟට නොහමයි. සත්පුරුෂයන්ගේ සුවඳ උඩු සුලඟටද හමන්නේය. සත්පුරුෂ තෙම සියලු දිශාවන්හි සුවඳ පතුරුවන්නේය."

**30. සහස්ස ලොකධාතු විඤ්ඤාපන සූත්‍රයඃ-** 1. එක් පසෙක හුන් ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේය.

2. "ස්වාමීනි, 'ආනන්දය, සිඛී භාග්‍යවතුන්වහන්සේගේ අභිභූ නම් ශ්‍රාවක තෙම බඹලොව සිට චක්‍රවාළ දහසක ශබ්දයෙන් හැඟෙව්වේය. (ඇසෙන සේ ධර්මදෙශනා කෙළේය.) යන මෙය භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙන් අසනලදී. ස්වාමීනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ භාග්‍යවතුන්වහන්සේ වනාහි කෙතෙක් තැන් ශබ්දයෙන් හැඟවීමට සමර්ථ වන සේක්ද?"

3. "ආනන්දය, හෙතෙම ශ්‍රාවකයෙකි. තථාගතයන් වහන්සේලා ප්‍රමාණ කළ නොහැක්කාහු වෙතියි වදාළේය."

4. "ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම දෙවනුවත් (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි)

5. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි)

6. තුන්වෙනුවත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

7. "ආනන්දය, තොප විසින් චක්‍රවාළ දහසක් වන චුළනී ලොකධාතුව අසනලද්දේද?"-"යමක්, භාග්‍යවතුන් වහන්සේ දෙශනාකරන සේක්නම්, භාග්‍යවතුන්වහන්ස, මේ ඊට කාලය වන්නේය. සුගතයන්වහන්ස, 'මේ ඊට කාලය වන්නේය භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුයයි' කීය

8. 'එසේ නම් ආනන්දය, අසව කියන්නෙමි. ආනන්දය, සඳ හිරු දෙදෙන යම්තාක් ප්‍රදේශයක ගමන්කරද්ද බබලමින් සියලු දිශා ආලොක කරද්ද එබඳු දහසක් චක්‍රවාළ ලොක වෙයිද ඒ දහසක් චක්‍රවාළයන්හි සඳු දහසක් වෙයි. හිරු දහසක් වෙයි. දහසක් මෙරු පර්වතවෙයි. දහසක් ජම්බුද්වීප වෙයි. දහසක් අපරගොයාන වෙයි දහසක් උතුරුකුරු දිවයින් වෙයි. දහසක් පූර්වවිදෙහ වෙයි. මහා සමුද්‍ර සාරදහසක් ඇත වරම් රජවරු සාරදහසක් වෙත්. චාතුර්මහා රාජික දෙව්ලෝ දහසකි. තව්තිසා දෙව්ලෝ දහසකි. යාම දෙව්ලෝ දහසකි. තුසිත දෙව්ලෝ දහසකි. නිර්මාණරතී දෙව්ලෝ දහසකි. පරනිර්මිත වසවර්ති දෙව්ලෝ දහසකි. ආනන්දය, මේ දහසක් සක්වලින් යුත් චූළනී ලොකධාතුවයයි කියනු ලැබේ.

9. "ආනන්දය, යම්තාක් සහශ්‍රී චූලනී ලොකධාතුව වෙයිද එතාක් දහසින් ගුණවූ ලොකයක් වෙයිද ආනන්දය, මෙය (චක්‍රවාළ දශලක්ෂයක්වූ) ද්විසහශ්‍රී මධ්‍යම ලොකධාතුවයයි කියනු ලැබේ. ආනන්දය, යම්තාක් ද්විසහශ්‍රී මධ්‍යම ලොකධාතුව වෙයිද ඒතාක් දහසින් ගුණකළ කෙළ ලක්ෂයක් චක්‍රවාල වෙයිද, ආනන්දය, ත්‍රිසහශ්‍රී මහාසහශ්‍රී ලොකධාතුව යයි කියනු ලැබේ.

10. "ආනන්දය, තථාගත තෙමේ කැමතිවන්නේ නම් ත්‍රිසහශ්‍රී මහා සහශ්‍රී ලොකධාතුවද ශබ්දයෙන් අඟවන්නේය. අනාගත ලොකධාතුන්ගෙන් හෝ යම් පමණ කැමතිවන්නේ නම් ශබ්දයෙන් අඟවන්නේය.

11. "ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ කෙසේ නම් කැමතිවන්නේ නම්, ත්‍රිසහශ්‍රී මහා සහශ්‍රී ලොකධාතුව හෝ යම්තාක් කැමති නම් ඒතාක් හෝ ශබ්දයෙන් අඟවන්නේද?"

12. "ආනන්දය, තථාගත තෙමේ ත්‍රිසහශ්‍රී මහා සහශ්‍රී ලොකධාතුව ශරීරාලොකයෙන් පතුරුවන්නේය. යම් විටක ඒ සත්වයෝ ඒ ආලොකය දැනගන්නාහු නම්, එකල්හි තථාගත තෙම කථාකරන්නේය. ශබ්දය අස්වන්නේය. ආනන්දය, මෙසේ තථාගත තෙම ත්‍රිසහශ්‍රී මහා සහශ්‍රී ලොක ධාතුව ශබ්දයෙන් හඟවන්නේය. යම්තාක් කැමතිනම් ඒතාක් හඟවන්නේය.

13. "මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන්වහන්සේට "යම්බඳුවූ මාගේ ශාස්තෘන්වහන්සේ මෙසේ මහත් ඍද්ධි ඇතිසේක. මෙසේ මහත් ආනුභාව ඇති සේක. මට ඒකාන්තයෙන් ලාභයකි. ඒකාන්තයෙන් මා විසින් මනාකොට ලබන ලද්දකියි" කීය.

14. මෙසේ කී කල්හි ආයුෂ්මත් උදායි ස්ථවිර තෙම ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්ට "ඇවැත් ආනන්දය, ඉදින් ඔබගේ ශාස්තෘන්වහන්සේ මහත් ඍද්ධි ඇතිසේක් නම් මහත් ආනුභාව ඇති සේක් නම් එයින් ඔබට ඇති ප්‍රයෝජනය කිමදැයි" කීය.

15. "මෙසේ කී කල්හි භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට, "උදායි, එසේ නොකියව උදායි, එසේ නොකියව උදායි, ඉදින් ආනන්ද අවීතරාගීව (රාගය පහ නොකෙළෙක්ව) කාලක්‍රියා කරන්නේ වීනම් ඒ සිත පැහැදීමෙන් සත්වරක් දෙව්ලොව දිව්‍ය රාජ්‍ය කරන්නේය. සත්වරක් මේ දඹදිව මහා රාජ්‍යය කරන්නේය. උදායි, එහෙත් ආනන්ද තෙමේ මේ ආත්මයෙහිම පිරිනිවන්පාන්නේයයි" වදාළේය.

(අටවැනිවූ ආනන්ද වර්ගය නිමි.)

---

## 9. සමණ වර්ගය.

31. **සමණ කරණීය සූත්‍රය**:- 1. "මහණෙනි, ශ්‍රමණයාට අයත්වූ ශ්‍රමණයා විසින් කළ යුතුවූ වැඩ තුනකි. අධිශීල ශික්ෂා සමාදානය, අධිචිත්ත ශික්ෂා සමාදානය, අධිප්‍රඥා ශික්ෂා සමාදානය යන මොහුයි. මහණෙනි, මේ වනාහි ශ්‍රමණයාට අයත් ශ්‍රමණයා විසින් කළයුතුවූ වැඩ තුන වෙත්.

2. "මහණෙනි, එහෙයින් 'අධිශීල ශික්ෂා සමාදානයෙහි අපගේ දැඩි කැමැත්ත වන්නේය. අධිචිත්ත ශික්ෂා සමාදානයෙහි අපගේ බලවත් කැමැත්ත වන්නේය. අධිප්‍රඥා ශික්ෂා සමාදානයෙහි අපගේ බලවත් කැමැත්ත වන්නේයයි' මෙසේ හික්මිය යුතුය. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුය.

3. 'මහණෙනි, බූරුවෙක් ගවරැළ පසුපස මමද ගවයෙක්මි මමද ගවයෙක්මියි කියන්නාක් මෙන් 'අහම්පි අම්භා, අහම්පි අම්භායි' හඬනගමින් ගමන් කරන්නේ වෙයිද ඔහුට ගවයන්ගේ වර්ණයට බඳු වර්ණයක් නැත. ගවයන්ගේ හඬට බඳු හඬක් නැත. ගවයන්ගේ පාදයන්ට බඳු පා නැත. එහෙත් හෙතෙම 'අහම්පි අම්භා, අහම්පි අම්භායි' මමද ගවයෙකි, 'මමද ගවයෙකියි කියමින් ගවයන්ගේ පසුපස ගමන් කරන්නේ වෙයි.

4. "මහණෙනි, එසේම මෙහි ඇතැම් භික්ෂුවක් 'මමද භික්ෂුවක් වෙමි, මමද භික්ෂුවක් වෙමියි' කියමින් භික්ෂු සංඝයා පසුපස ගමන්කරන්නේ වෙයි. අනික් භික්ෂූන්ට මෙන් ඔහුගේ අධිශීල ශික්ෂා සමාදානයෙහි කැමැත්තක් නැත. අනික් භික්ෂූන්ට මෙන් ඔහුගේ අධිචිත්ත ශික්ෂා සමාදානයෙහි කැමැත්තක් නැත. අනික් භික්ෂූන්ට මෙන් ඔහුගේ අධිප්‍රඥා ශික්ෂා සමාදානයෙහි කැමැත්තක් නැත. හෙතෙම 'මමත් භික්ෂුවක් වෙමි, මමත් භික්ෂුවක් වෙමියි' භික්ෂු සංඝයාම පසු පස ගමන් කරන්නේ වෙයි.

5. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

32. **පුබ්බකරණීය සූත්‍රයඃ-** 1 "මහණෙනි, ගෘහපති ගොවියා විසින් පළමුව කළයුතු මේ වැඩ තුනකි. කවර තුනක්ද යත්?

2. "මහණෙනි, ගෘහපති ගොවිතෙමේ පළමුකොටම කෙත මනාව සාන ලද්දේ, මනාකොට සමකරන ලද්දේවෙයි. පළමුකොට හා සමකොට සුදුසු කාලයෙහි බීජ වපුරන්නේ වෙයි. සුදුසු කාලයෙහි බීජ වපුරා සුදුසු කාලයෙහි වතුර බඳින්නේද වතුර හරින්නේද වෙයි. මහණෙනි, මේ ගෘහපති ගොවියා විසින් පළමුවම කටයුතු වැඩ තුන වෙත්.

3. "මහණෙනි, එමෙන් භික්ෂුව විසින් පළමුව කටයුතුවූ මේ වැඩ තුනක් වෙත්. කවර තුනක්ද? අධිශීල ශික්ෂා සමාදානය, අධිචිත්ත ශික්ෂා සමාදානය, අධිප්‍රඥා ශික්ෂා සමාදානය යන මොහුයි. මහණෙනි, මේ භික්ෂුව විසින් පළමුව කටයුතු වැඩ තුන වෙත්.

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

33 **වජ්ජිපුත්තක සූත්‍රයː-** 1. මා විසින් මෙසේ අසන ලදී එක් සමයක භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර එක්තරා වජ්ජිපුත්තක භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ඒ වජ්ජිපුත්තක භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. කෙසේද?

2. "ස්වාමීනි, අඩ මසක් පාසා එක්සිය පනසක් ශික්ෂාපද උදෙසීමට පැමිණෙයිද ස්වාමීනි, මම මේ ශික්ෂාපද සමූහයෙහි හික්මීමට නොහැක්කෙමි" යනුවෙනි.

3. "මහණ, ඔබට අධිශීල ශික්ෂාව අධිචිත්ත ශික්ෂාව අධිප්‍රඥා ශික්ෂාව යන මේ ත්‍රි ශික්ෂාවෙහි හික්මිය හැකිද?"

4. "ස්වාමීනි, මම අධිශීල ශික්ෂාව අධිචිත්ත ශික්ෂාව අධිප්‍රඥා ශික්ෂාව යන ත්‍රි ශික්ෂාවෙහි හික්මීමට හැකි වෙමියි" කීය.

5. මහණ, එසේ නම් ඔබ අධිශීල ශික්ෂාව අධිචිත්ත ශික්ෂාව අධිප්‍රඥා ශික්ෂාව යන ත්‍රි ශික්ෂාවෙහි හික්මෙව.

"මහණ, යම්කලෙක පටන් ඔබ අධිශීලයෙහිද හික්මෙන්නෙහි නම් අධිචිත්තයෙහිද හික්මෙන්නෙහි නම් අධිප්‍රඥාවෙහිද හික්මෙන්නෙහි නම් අධිශීලයෙහිද හික්මෙන්නාවූ අධිචිත්තයෙහිද හික්මෙන්නාවූ අධිප්‍රඥාවෙහිද හික්මෙන්නාවූ ඔබගේ රාගය පහවන්නේය. ද්වේෂය පහවන්නේය. මොහය පහවන්නේය.

6. "ඒ ඔබ රාගය පහවීමෙන් ද්වෙෂය පහවීමෙන් මොහය පහවීමෙන් යමක් අකුසල්ද එය නොකරන්නෙහිය, යමක් පාපයද එය සෙවනය නොකරන්නෙහියයි" වදාළේය.

7. "ඉක්බිති ඒ භික්ෂුව පසුකාලයෙහි අධිශීලයෙහිද හික්මුණේය, අධිචිත්තයෙහිද හික්මුණේය, අධිප්‍රඥාවෙහිද හික්මුණේය. අධිශීලයෙහි හික්මුණාවූද අධිචිත්තයෙහි හික්මුණාවූද, අධිප්‍රඥාවෙහි හික්මුණාවූද ඔහුගේ රාගය පහවිය, ද්වේෂය පහවිය, මොහය පහවිය. හෙතෙම රාගය පහ වීම හෙතුකොට ගෙන ද්වේෂය පහවීම හෙතුකොට ගෙන මොහය පහවීම හෙතුකොට ගෙන යමක් අකුසල් නම් එය නොකෙළේය. යමක් පවු නම් එය සෙවනය නොකෙළේය."

34. **සෙඛපඤ්ඤ සූත්‍රයඃ-** 1. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, ශෛක්ෂ ශෛක්ෂයයි කියනු ලැබේ. කෙතෙකින් ශෛක්ෂයෙක් වේද?" යනුයි.

2. "මහණ, හික්මෙයි යන අර්ථයෙන් ශෛක්ෂයයි කියනු ලැබේ. කිමෙක හික්මෙයිද? අධිශීලයෙහිද හික්මෙයි. අධිචිත්තයෙහිද හික්මෙයි, අධිප්‍රඥාවෙහිද හික්මෙයි. මහණ හික්මෙයි හික්මෙයි යන අර්ථයෙන් ශෛක්ෂයයි කියනු ලැබේයයි" වදාළේය.

1 "ආර්‍ය්‍ය මාර්ගයෙහි පිළිපන්නාවූ ත්‍රි ශික්ෂාවෙහි හික්මෙන්නාවූ ශෛක්ෂයාහට ක්ලෙශයන් ක්ෂය කරන්නාවූ මාර්ගය හා යෙදුණාවූ පළමුවැනි ඥානය උපදී. ඉක්බිති සතරවැනි මාර්ගඥානයට අනතුරුව අර්හත්ඵලය උපදී."

2 "ඉක්බිති අර්හත්ඵල විමුක්තියෙන් මිදුණාවූ තාදී ගුණයෙන් යුත් ක්ෂීණාශ්‍රවයාහට භව සංයෝජනයන් ක්ෂය කිරීමෙහි මාගේ අර්හත් ඵල විමුක්තිය කම්පා නොවන්නීය යන ප්‍රත්‍යවෙක්ෂා ඥානයවෙයි."

35. **සික්ඛාත්තය සූත්‍රයඃ-** 1 "මහණෙනි, තමහට හිත කැමැත්තාවූ කුලපුත්‍රයෝ යම් ශික්ෂාවෙක්හි හික්මෙද්ද එබඳුවූ එක්සිය පනසක් ශික්ෂාපද අඩමසක් පාසා උදෙසීමට පැමිණෙයිද, මහණෙනි, ඒ සියලු ශික්ෂාපද ඇතුළත් වන්නාවූ

මේ ශික්ෂා තුනක් වෙත්. කවර තුනක්ද? අධිශීල ශික්ෂාව අධිචිත්ත ශික්ෂාව අධිප්‍රඥා ශික්ෂාව යන මොහුයි. මහණෙනි, මේ ශික්ෂා තුනෙහි ඒ සියලු ශික්ෂාපද ඇතුළත් වෙයි.

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශීලය සම්පූර්ණ කරන්නේ වේද, සමාධිය එක්තරා ප්‍රමාණයකින් කරන්නේ වේද, ප්‍රඥාව එක්තරා ප්‍රමාණයකින් කරන්නේ වේද හෙතෙම යම් කුඩා අනුකුඩා ශික්ෂාපද වෙයිද ඒ ශික්ෂාපදයන්ගේ වරදට පැමිණෙන්නේද වෙයි. වරදින් නැගිටින්නේද වෙයි. ඊට හේතු කවරේද?

3. "මහණෙනි, මෙහි මාර්ගඵලයන්ට නුසුදුසු බව නොකියන ලදී. මහණෙනි, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට සුදුසුවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූ යම් ඒ ශික්ෂාපද කෙනෙක් වෙත්ද, එහි නිත්‍ය සිල් ඇත්තේ වෙයිද, පිහිටි සිල් ඇත්තේ වෙයිද, ශික්ෂා පදයන්හි සමාදන්ව හික්මෙයිද, හෙතෙම සංයෝජන තුනක් ක්ෂය කිරීමෙන් අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ මාර්ග නියාමයෙන් නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන්වූවෙක් වෙයි.

4. (මේ ඡෙදය මේ සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

5. "මහණෙනි, මේ කාරණයෙහි මාර්ගඵලයන්ට නුසුදුසු බව නොකියන ලදී. මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට යොග්‍යවූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූ යම් ශික්ෂාපද කෙනෙක් වෙත්ද එහි නිත්‍ය සිල් ඇත්තේ වෙයිද, පිහිටි සිල් ඇත්තේ වෙයිද ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයිද හෙතෙම තුන් සංයෝජනයන් ක්ෂය කිරීමෙන් රාග ද්වේෂ මෝහයන් තුනීවූ හෙයින් සකෘදාගාමි නම් වෙයි. මේ කාම ලොකයට එක්වරක්ම අවුත් දුක් කෙළවර කරයි.

6. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සීලය සම්පූර්ණ කරන්නේ වෙයිද සමාධිය සම්පූර්ණ කරන්නේ වෙයිද ප්‍රඥාව ප්‍රමාණයකින් සම්පූර්ණ කරන්නේ වෙයිද හෙතෙම යම් කුඩා අනුකුඩා ශික්ෂාපද වෙත්ද ඒ ශික්ෂාපදයන්ගෙන් වරදට පැමිණෙන්නේද වෙයි, නැගිටින්නේද වෙයි. ඊට හෙතු කවරේද?

7. "මහණෙනි, මේ කාරණයෙහි මාර්ගඵලයන්ට නුසුදුසු බව නොකියන ලදී. මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට සුදුසුවූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූ යම් ශික්ෂාපද කෙනෙක් වෙත්ද එහි නිත්‍ය සිල් ඇත්තේ වෙයි, පිහිටි සිල් ඇත්තේ වෙයි. ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයි. හෙතෙම ඔරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බඹලොව ඕපපාතිකයෙක් වෙයි. ඒ බඹලොවින් ආපසු නොඑන ස්වභාවය ඇත්තාවූ එහිම පිරිනිවෙන්නෙක් වෙයි.

8. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සීලය සම්පූර්ණ කරන්නේ වෙයිද සමාධිය සම්පූර්ණ කරන්නේ වෙයිද ප්‍රඥාව සම්පූර්ණ කරන්නේ වෙයිද හෙතෙම යම් කුඩා අනුකුඩා ශික්ෂාපද වෙත්ද ඒ ශික්ෂාපදයන්ගෙන් වරදට පැමිණෙන්නේද වෙයි නැගිටින්නේද වෙයි. ඊට හෙතු කවරේද?

9. "මහණෙනි, එහි මාර්ගඵල ලැබීමට නුසුදුසු බව නොකියන ලදී. මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට යොග්‍යවූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූ යම් ශික්ෂාපද කෙනෙක් වෙත්ද, ඒ ශික්ෂාපදයන්හි නිත්‍ය සිල් ඇත්තේ වෙයිද පිහිටි සිල් ඇත්තේ වෙයිද ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයිද හෙතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ ඥානයෙන් අවබොධකොට ඊට පැමිණ වාසය කරයි.

10. "මහණෙනි, මෙසේ වනාහි කොටසක් පුරන්නාවූ පුද්ගලයා කොටසක් ලබයි. සම්පූර්ණකොට පුරන්නාවූ පුද්ගලයා සම්පූර්ණයෙන් ලබයි. මහණෙනි, මම ශික්ෂාපදයෝ මෙසේ වඳ නොවන්නාහුයයි කියමියි" වදාළේය.

**36. දුතිය සික්ඛාත්තය සූත්‍රය**:- 1. "මහණෙනි, තමහට හිත කැමැත්තාවූ කුලපුත්‍රයෝ යම් ශීලයෙක්හි හික්මෙද්ද, අඩමසක් පාසා උදෙසීමට පැමිණෙන්නාවූ මේ ශීලය ශික්ෂාපද එක්සිය පනසක් වෙයි. මහණෙනි, ඒ සියලු ශික්ෂාපද ඇතුළත්වන්නාවූ මේ ශික්ෂා තුනක් වෙත්. කවර තුනක්ද? අධිශීල ශික්ෂාව, අධිචිත්ත ශික්ෂාව, අධිප්‍රඥා ශික්ෂාව යන මොහුය, මහණෙනි, මේ ත්‍රි ශික්ෂාවෙහි ඒ සියලු ශික්ෂා පද ඇතුළත් වෙයි.

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම සීලය සම්පූර්ණ කරන්නේ වෙයිද, සමාධිය ප්‍රමාණයකින් පුරන්නේ වෙයිද ප්‍රඥාව ප්‍රමාණයකින් පුරන්නේ වෙයිද හෙතෙම යම් කුඩා අනුකුඩා ශික්ෂාපද වෙත්ද ඒ කුඩා අනුකුඩා ශික්ෂාපදයන්ගේ වරදට පැමිණෙන්නේද වෙයි. නැගිටින්නේද වෙයි, ඊට හෙතු කවරේද?

3. "මහණෙනි, මෙහි මාර්ගඵලයන්ට නුසුදුසු බවක් නොකියන ලදී. මාර්ග බ්‍රහ්මචය්‍ර්‍යාවට සුදුසුවූ මාර්ග බ්‍රහ්මචය්‍ර්‍යාවට මුල්වූ යම් ඒ ශික්ෂාපද කෙනෙක් වෙද්ද, එහි නිත්‍ය සිල් ඇත්තේ වෙයිද, පිහිටි සිල් ඇත්තේ වෙයිද, ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයිද, හෙතෙම සංයෝජන තුනක් ක්ෂය කිරීමෙන් සත්වරක් කාමලොකයෙහි ඉපදීම සීමාකොට ඇති සෝවාන් පුද්ගලයෙක්ව සත්වරක් දෙව් ලොවද මිනිස්ලොවද සැරිසරා දුක් කෙළවර කරන්නේය.

4. "හෙතෙම සංයෝජන තුනක් ක්ෂයකිරීමෙන් කෝලං කෝල නම් සෝවාන් පුද්ගලයා වෙයි. භව දෙක තුනක සැරිසරා දුක් කෙළවර කරන්නේය.

5. "හෙතෙම සංයෝජන තුනක් ක්ෂයකිරීමෙන් එකබීජී නම් සෝවාන් පුද්ගලයා වෙයි. මිනිසත් බවක්ම ලබා දුක් කෙළවර කරයි.

6. "හෙතෙම සංයෝජන තුනක් ක්ෂයකොට රාගදොස මොහයන් තුනී වීමෙන් සකෘදාගාමී වෙයි. එක් වරක්ම මේ කාමලොකයට පැමිණ දුක් කෙළවර කරයි

7. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම සීලය සම්පූර්ණ කරන්නේ වෙයිද, සමාධිය සම්පූර්ණ කරන්නේ වෙයිද ප්‍රඥාව ප්‍රමාණයකින් පුරන්නේ වෙයිද, හෙතෙම යම් කුඩා අනුකුඩා ශික්ෂාපද වෙත්ද ඒ ශික්ෂාපදයන්ගේ වරදට පැමිණෙන්නේද වෙයි. නැගිටින්නේද වෙයි. ඊට හේතු කවරේද?

8. "මහණෙනි, එය මාර්ගඵලයන්ට නුසුදුසු බව නොකියන ලදී. මාර්ග බ්‍රහ්මචය්‍ර්‍යාවට යොග්‍යවූ මාර්ග බ්‍රහ්මචය්‍ර්‍යාවට මුල්වූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යම් ශික්ෂාපද කෙනෙක් වෙද්ද, එහි නිත්‍ය සිල් ඇත්තේ වෙයිද, පිහිටි සිල් ඇත්තේ වෙයිද ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයිද හෙතෙම ඔරම්භාගිය සංයොජන පස ක්ෂයකිරීමෙන් උද්ධං සොත අකනිට්ඨගාමී නම් (සුද්ධාවාස භූමියෙහි ඉපිද පිළිවෙළින් අකනිටා බඹලොව දක්වා ගොස් අකනිටා බඹලොවදී පිරිනිවෙන) අනාගාමි පුද්ගලයා වෙයි.

9. "හෙතෙම ඔරම්භාගිය සංයොජන පස ක්ෂයකිරීමෙන් සසංඛාර පරිනිබ්බායී නම් (උත්සාහයෙන් රහත් බවට පැමිණෙන) අනාගාමි පුද්ගලයා වෙයි. හෙතෙම ඔරම්භාගිය සංයොජන පස ක්ෂය කිරීමෙන් අසංඛාර පරිනිබ්බායි නම් (උත්සාහයක් නැතිව රහත්බවට පැමිණෙන) අනාගාමි පුද්ගලයා වෙයි.

10. "හෙතෙම ඔරම්භාගිය සංයොජන පස ක්ෂය කිරීමෙන් උපහච්ච පරිනිබ්බායි නම් (අවිහාදියෙහි ඉපිද එහි ආයුෂයෙන් බාගයක් ඉක්මවා රහත්ව පිරිනිවෙන) අනාගාමි පුද්ගලයා වෙයි. හෙතෙම ඔරම්භාගිය සංයොජන පස ක්ෂය කිරීමෙන් අන්තරා පරිනිබ්බායි නම් (අවිහාදියෙහි ඉපිද ආයුෂ බාගයක් නොයික්මවා රහත්ව පිරිනිවෙන) අනාගාමී පුද්ගලයා වෙයි.

11. "(මේ ඡෙදය මේ සූත්‍රයේ 7 ඡෙදය මෙනි)

12. "මහණෙනි, එහි මාර්ගඵලයන්ට නුසුදුසු බවක් නොකියන ලදී. මාර්ග බ්‍රහ්මචය‍ර්‍යාවට සුදුසුවූ මාර්ග බ්‍රහ්මචය‍ර්‍යාවට මුල්වූ යම් ඒ ශීක්ෂාපද කෙනෙක් වෙද්ද එහි නිත්‍ය සිල් ඇත්තේද වෙයි, පිහිටි සිල් ඇත්තේද වෙයි. ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයි. හෙතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ, අර්හත්ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහි තමාම විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි.

13. "මහණෙනි, මෙසේ වනාහි කොටසක් සම්පූර්ණ කරන්නේ කොටසක් ලබයි. සියල්ල සම්පූර්ණ කරන්නේ සියල්ල ලබයි. මහණෙනි, මෙසේ ශික්ෂාපද නොවඳයයි කියමියි වදාළේය."

**37. තෘතීය සික්ඛාත්තය සූත්‍රයඃ-** 1. "(මේ ඡේදය මේ වර්ගයේ 35 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම සීලය සම්පූර්ණ කරන්නේ වෙයිද, සමාධිය සම්පූර්ණ කරන්නේ වෙයිද, ප්‍රඥාව සම්පූර්ණ කරන්නේ වෙයිද, හෙතෙම යම් ඒ කුඩා අනුකුඩා ශික්ෂාපද කෙනෙක් වෙත්ද ඒ ශික්ෂාපදයන්ගෙන් වරදට පැමිණෙන්නේද වෙයි නැගිටින්නේද වෙයි. ඊට හේතු කවරේද?

3. "මහණෙනි, එහි මාර්ගඵලයන්ට නුසුදුසු බවක් නොකියන ලදී. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට සුදුසුවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූ යම් ශික්ෂාපද කෙනෙක් වෙත්ද, එහි නිත්‍ය සිල් ඇත්තේද වෙයි. පිහිටි සිල් ඇත්තේද වෙයි, ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයි. හෙතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් අර්හත්ඵල සමාධියත් අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේම විශෙෂ නුවණින් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසයකරයි.

4. "ඊට නොපැමිණෙන්නේ එය ප්‍රතිවෙධ නොකරන්නේ ඔරම්භාගිය සංයොජන පස ක්ෂය කිරීමෙන් අන්තරා පරිනිබ්බායි නම් පුද්ගලයා වෙයි.

5. "ඊට නොපැමිණෙන්නේ එය ප්‍රතිවෙධ නොකරන්නේ ඔරම්භාගිය සංයොජන පස ක්ෂයකිරීමෙන් උපහච්ච පරිනිබ්බායි නම් අනාගාමී පුද්ගලයා වෙයි

6. "ඊට නොපැමිණෙන්නේ එය ප්‍රතිවේධ නොකරන්නේ අසංඛාර පරිනිබ්බායී නම් අනාගාමි පුද්ගලයා වෙයි.

7. 'ඊට නොපැමිණෙන්නේ එය ප්‍රතිවෙධ නොකරන්නේ සසංඛාර පරිනිබ්බායී නම් අනාගාමී පුද්ගලයා වෙයි.

8. "ඊට නොපැමිණෙන්නේ එය ප්‍රතිවෙධ නොකරන්නේ උද්ධං සොත අකනිට්ඨාගාමී නම් අනාගාමි පුද්ගලයා වෙයි.

9. ඊට නොපැමිණෙන්නේ එය ප්‍රතිවෙධ නොකරන්නේ සංයොජන තුනක් ක්ෂය කිරීමෙන් රාගදොස බාගයක් තුනීවූ හෙයින් සකෘදාගාමි නම් වෙයි. වරක් මේ කාමලොකයට පැමිණ දුක් කෙළවර කරයි.

10. "ඊට නොපැමිණෙන්නේ එයප්‍රතිවෙධ නොකරන්නේ සංයොජන තුනක් ක්ෂය කිරීමෙන් කෝලංකෝල නම් සෝවාන් පුද්ගලයා වෙයි. භව දෙක තුනක සැරිසරා දුක් කෙළවර කරයි.

11. "ඊට නොපැමිණෙන්නේ එය ප්‍රතිවෙධ නොකරන්නේ, සත්තක්ඛත්තු පරම නම් සොතාපන්නයා වෙයි. සත්වරක් දෙව්ලොවද මිනිස් ලොවද සැරිසරා දුක් කෙළවර කරයි.

12. "මහණෙනි, මෙසේ වනාහි සම්පූර්ණ කරන්නේ සම්පූර්ණයෙන් ලබයි. කොටසක් පුරන්නේ කොටසක් ලබයි. මහණෙනි මෙසේ වනාහි ශික්ෂාපද නොවඳයයි කියමි."

38. **චතුත්ථ සික්ඛත්තය සූත්‍රයː-** 1. "මහණෙනි, මේ ශික්ෂා තුනෙකි. කවර තුනක්ද? අධිශීල ශික්ෂාවද, අධි චිත්ත ශික්ෂාවද, අධි ප්‍රඥා ශික්ෂාවද වෙයි. මහණෙනි, අධි ශීල ශික්ෂාව කවරේද?

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම සිල් ඇත්තේවෙයිද ප්‍රාතිමොක්ෂය සංවර සීලයෙන් සංවරව ආචාර ගොචර දෙකින් සමන්විතව කුඩා වරදෙහි පවා භය දක්නා සුලුව ශික්ෂා පදයන්හි දැඩිව ගෙන හික්මෙයිද, මහණෙනි මෙය අධිශීල ශික්ෂාවයයි කියනු ලැබේ.

3. "මහණෙනි, අධිචිත්ත ශික්ෂාව කවරේද? මහණෙනි, මෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්වම, අකුසලයන්ගෙන් වෙන්වම විතර්ක සහිත, විචාර සහිත, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මෙය අධිචිත්ත ශික්ෂාවයයි කියනු ලැබේ.

4. මහණෙනි, අධි ප්‍රඥා ශික්ෂාව නම් කවරේද? මහණෙනි, මෙහි මහණ තෙම මෙය දුකයයි තත්වූ පරිදි දනීද මේ තෘෂ්ණාව දුක් ඉපදීමට හේතුවයයි තත්වූ පරිද්දෙන් දනී. මේ නිවණ දුක් නැතිවන තැනයයි තත්වූ පරිද්දෙන් දනී. මෙය දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාවයයි තත්වූ පරිදි දනීද, මහණෙනි, මෙය අධිප්‍රඥා ශික්ෂාවයයි කියනු ලැබේ. මහණෙනි, මේ වනාහි ත්‍රි ශික්ෂාව වෙයි.

**39. පඤ්චම සික්ඛාත්තය සූත්‍රය:-** 1-3. (මේ ඡේද මේ සූත්‍රයේ 1, 2, 3 ඡේද මෙන් වෙත්.)

4. "මහණෙනි, අධිප්‍රඥා ශික්ෂාව කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියත් අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහි තමා විශෙෂ ප්‍රඥාවෙන් දැන ඊට පැමිණ වාසය කරයිද, මහණෙනි, මෙය අධිප්‍රඥා ශික්ෂාවයයි කියනු ලැබේ. මහණෙනි, මේ ශික්ෂා තුන වෙති.

1. "දැඩි වීර්‍ය්‍යය ඇත්තාවූද ප්‍රඥා ඇත්තාවූද ධ්‍යාන වඩන්නාවූද සිහි ඇත්තාවූද රක්නාලද ඉන්ද්‍රිය ඇත්තාවූද වීර්‍ය්‍යවත් පුද්ගල තෙමේ අධිශීල ශික්ෂා අධිචිත්ත ශික්ෂා අධි ප්‍රඥා ශික්ෂා යන ශික්ෂා ත්‍රයෙහි හැසිරෙන්නේය.

2. "පළමු යම්සේද පසුවද එසේ පසුව යම්සේද පළමුද එසේ, යටි කයෙහි යම්සේද උඩු කයෙහිත් එසේ, උඩු කයෙහි යම්සේද යටි කයෙහිත් එසේ

3. "දවල් යම්සේද රාත්‍රියෙහිත් එසේ, රාත්‍රියෙහි යම්සේද දවල්ද එසේ, අර්හත්මාර්ග සමාධියෙන් සියලු දිශාවන්හි ආරම්මණයන් මැඩ පවත්වා හැසිරෙන්නේය.

4. "ඔහු ශෛක්ෂ (හික්මෙන්නෙක්) යයිද පිළිපන්නෙකැයිද, පිරිසිදු සිල් ඇත්තෙකැයිද, ලොකයෙහි චතුස්සත්‍ය අවබොධ කළ කෙනෙකැයිද, වීර්‍ය්‍ය ඇත්තෙකැයිද, ප්‍රතිපත්තියේ කෙළවරට පැමිණියෙකැයිද කියත්."

5 "තෘෂ්ණා ක්ෂය විමුක්තියයි කියන ලද අර්හත් ඵල විමුක්තියෙන් යුක්තවූවහුගේ අවසාන විඤ්ඤාණය නිරුද්ධවීමෙන් ප්‍රදීපයාගේ නිවීම මෙන් චිත්තයාගේ මිදීම වන්නේය."

**40. පංකධා සූත්‍රය:-** 1 "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට මහත් භික්ෂු සංඝයා හා සමග චාරිකාවෙහි වඩිනුයේ පංකධා නම් කොසොල් රට වාසීන්ගේ

නියම්ගම යම් තැනෙක්හිද එහි වැඩියහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පංකධා නම් කොසොල් රට වාසීන්ගේ නියම් ගමෙහි වාසය කරත්. එකල්හි කස්සපගොත්ත නම් මහණ තෙමේ ආවාස අලුත්වැඩියා කිරීමෙහි යෙදී වාසය කරයි.

2. "එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට දැහැමි කථාවකින් කරුණු ඉදිරිපත් කොට දක්වන සේක. සමාදන් කරවන සේක. උත්සාහවත් කරවන සේක. සිත් පහදවන සේක. එකල්හි කස්සපගොත්ත භික්ෂුවට ශික්ෂාපදයන්ගෙන් යුත් දැහැමි කථාවකින් භික්ෂූන්ට කරුණු දක්වන්නාවූ සමාදන් කරවන්නාවූ උත්සාහවත් කරවන්නාවූ සිත් තියුණු කරවන්නාවූ සිත් පහදවන්නාවූ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මේ ශ්‍රමණතෙමේ පමණ ඉකමවා හාර හාරා කරුණු කියන්නේයයි' නොඉවසීමක් නොසතුටක් උපන.

3. "ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ කැමතිතාක් පංකධා නියම් ගමෙහි වාසයකොට රජගහනුවර යම් තැනෙක්හිද එහි චාරිකාවෙහි වැඩියහ. පිළිවෙලින් චාරිකාවෙහි වඩිනසේක් රජගහනුවර යම් තැනෙක්හිද එහි පැමිණියහ. පැමිණ, රාජගහේ ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කළසේක.

4. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් 'කස්සපගොත්ත භික්ෂුහුට මෙවැනි සිතක් ඇතිවිය. ශික්ෂාපදයන්ගෙන් යුත් දැහැමි කථාවකින් භික්ෂූන්ට කරුණු දක්වන්නාවූ සමාදන් කරවන්නාවූ උත්සාහවත් කරවන්නාවූ සිත් පහදවන්නාවූ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි 'මේ ශ්‍රමණ තෙමේ පමණ ඉක්මවා හාර හාරා කරුණු දක්වන්නේයයි' මාහට නොඉවසීමක් නොසතුටක් පහළවිය. එය මට අලාභයකි. ඒකාන්තයෙන් එය මට ලාභයක් නොවේ. මා විසින් නපුරුව ලබන ලද්දකි. යහපත් කොට ලබන ලද්දක් නොවේයයි පසුතැවීමක් විපිළිසර බවක් ඇතිවිය 'මම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණෙන්නෙම් නම් පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි වරද වරද වශයෙන් ප්‍රකාශ කරන්නෙම් නම් යහපතැයි' සිතීය.

පටුන



5. "ඉක්බිති කස්සප ගොත්ත භික්ෂුතෙම සෙනසුන තැන්පත්කොට තබා පාත්‍ර සිවුරු ගෙන රජගහනුවර යම් තැනෙක්හිද ගිජ්ඣකූට පර්වතය යම් තැනෙක්හිද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හිඳ ගත්තේය. එක්පසෙක හිඳගත් කස්සපගොත්ත භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

6. "ස්වාමීනි, එක් අවස්ථාවෙක භාග්‍යවතුන් වහන්සේ පංකධා නම් කොසොල් රට වාසීන්ගේ නියම්ගමෙහි වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාපදයන්ගෙන් යුත් දැහැමි කථාවෙන් භික්ෂූන්ට කරුණු දක්වනසේක, සමාදන් කරවන සේක, උත්සාහ කරවන සේක, සිත් පහද වන සේක. ස්වාමීනි, ඒමට භික්ෂූන්ට කරුණු දක්වන්නාවූ සමාදන් කරවන්නාවූ උත්සාහවත් කරවන්නාවූ සිත් පහදවන්නාවූ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි 'මේ ශ්‍රමණතෙම පමණ ඉක්මවා හාර හාරා කියන්නේයයි' නොඉවසීමක් නොසතුටු බවක් පහළවිය.

7. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පංකධා නියම් ගමෙහි කැමතිතාක් වාසය කොට රජගහ නුවර යම්තැනෙක්හිද එහි චාරිකාවෙහි වැඩිසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් මට පසුතැවීමක් විපිළිසර බවක් ඇතිවිය. ශික්ෂාපදයන්ගෙන් යුත් ධර්ම කථාවෙන් භික්ෂූන්ට කරුණු දක්වන්නාවූ සමාදන් කරවන්නාවූ උත්සාහවත් කරවන්නාවූ සිත් පහදවන්නාවූ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි 'මේ ශ්‍රමණ තෙමේ පමණ ඉක්මවා හාර හාරා කියන්නේයයි' නොඉවසීමෙන් නොසතුටු බවක් පහළවිය. එය මට අලාභයකි. ලාභයක් නොවේ. මා විසින් නපුරු ලැබීමක් ලබන ලදී. යහපත් ලැබීමක් නොලබන ලදී" කියායි.

8. "මම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණෙම් නම් පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි වරද වරද වශයෙන් ප්‍රකාශ කරන්නෙම් නම් යහපතැයි' අදහස්වීයයි කීය.

"ස්වාමීනි, ශික්ෂාපදයන්ගෙන් යුත් ධර්ම කථාවෙන් භික්ෂූන්ට කරුණු දක්වන්නාවූ සමාදන් කරවන්නාවූ උත්සාහවත් කරවන්නාවූ සිත් පහද වන්නාවූ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි 'මේ ශ්‍රමණතෙමේ පමණ ඉක්මවා භාර භාරා කියන්නේයයි' නොඉවසීමෙන් නොසතුට පහළකිරීමෙන් බාලයකු මෙන් මෝඩයකු මෙන් අදක්ෂයකු මෙන් අපරාධය තෙම මා ඉක්මවා ගියේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මත්තෙහි සංවරය පිණිස ඒ මාගේ අපරාධය පිළිගන්නාසේක්වායි" කීය.

10. "කස්සපය, ශික්ෂාපදයන්ගෙන්යුත් ධර්ම කථාවකින් භික්ෂූන්ට කරුණු දක්වන්නාවූ සමාදන් කරවන්නාවූ උත්සාහවත් කරවන්නාවූ සිත් පහදවන්නාවූ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි 'මේ ශ්‍රමණ තෙමේ පමණ ඉක්මවා භාර භාරා කියන්නේයයි' නොඉවසීමෙන් නොසතුට පහළකිරීමෙන් අපරාධය තෙමේ බාලයකුසේ මෝඩයකුසේ අදක්ෂයකුසේ ඒකාන්තයෙන් තා ඉක්මගියේය.

11. "කස්සපය, යම්කලෙක පටන් තෝ වරද වරද වශයෙන් දැක ධර්මයවූ පරිදි පිළියම් කෙරෙහි නම් අපි තාගේ වරද පිළිගනිමු.

12. "කස්සපය, යමෙක් වරද වරද වශයෙන් දැක ධර්මයවූ පරිදි පිළියම් කෙරේනම් මත්තෙහි සංවරයට පැමිණේ නම් එය ආර්‍ය්‍ය විනයෙහි අභිවෘද්ධිය වෙයි.

13. "කස්සපය, ස්ථවිරවූ භික්ෂුවක් නමුත් ශික්ෂාකාමී නොවේද, ශික්ෂාපද පිරීමෙහි ගුණ නොකියන්නේ වේද, ශික්ෂාකාමී නොවූ යම් අන්‍ය භික්ෂූහු වෙත්නම් ඔවුන් ශික්ෂා සම්පූර්ණ කිරීමෙහි නොයොදවන්නේ වෙයිද, ශික්ෂාකාමීවූ යම් අන්‍ය භික්ෂූහු වෙත් නම් සුදුසු කාලයෙහි ඔවුන්ගේ ඇති විද්‍යමාන ගුණ ප්‍රකාශ නොකෙරේ නම් කස්සපය, මම එවැනි ස්ථවිර භික්ෂුවගේ ගුණ නොකියමි. ඊට හේතු කවරේද?

14. 'ශාස්තෘතෙම ඔහුගේ ගුණ කියායයි අන්‍ය භික්ෂූහු ඔහු භජනය කරන්නාහුය. යම් කෙනෙක් ඔහු භජනය කරත් නම් ඔව්හු ඔහුගේ ගති පැවතුම් අනුව යන්නාහුය. ඔවුන්ට එය

බොහෝ කාලයක් අහිත පිණිස දුක් පිණිස වන්නේය. කස්සපය, එහෙයින් මම එවැනි ස්ථවිර භික්ෂුවගේ ගුණ නොකියමි.

15. "කස්සපය, මධ්‍යමවූ භික්ෂුවක්ද නවකවූ භික්ෂුවක්ද ශික්ෂාකාමී නොවේද ශික්ෂාපද පිරීමෙහි ගුණ නොකියන්නේ වේද, යම් ඒ අන්‍ය භික්ෂූහු ශික්ෂාව නොපුරත්ද, ඔවුන් ශික්ෂා පිරීමෙහි සමාදන් නොකරවයි නම් යම් ඒ අන්‍ය භික්ෂූහු ශික්ෂාකාමී ඇත්තාවූ විද්‍යමානවූ ඔවුන්ගේ ගුණ සුදුසු කාලයෙහි නොකියයි නම් කස්සපය, මම එවැනිවූ නවක භික්ෂුවගේ ගුණ නොකියමි. ඊට හෙතු කවරේද?

16. "ශාස්තෘ තෙමේ ඔහුගේ ගුණ කියායයි අන්‍ය භික්ෂූහු ඔහු භජනය කරන්නාහුය. යම් කෙනෙක් ඔහු භජනය කරන්නාහුද ඔව්හු ඔහුගේ ගති පැවතුම් අනුව යන්නාහුය. එය ඔවුන්ට බොහෝ කාලයක් අහිත පිණිස දුක් පිණිස වන්නේය. කස්සපය, එහෙයින් මම එවැනි නවක භික්ෂුවගේ ගුණ නොකියමි.

17. "කස්සපය, ස්ථවිර භික්ෂුවක් ශික්ෂාකාමී වෙයිද ශික්ෂා පිරීමෙහි ගුණ කියන්නේ වෙයිද යම් ඒ අන්‍ය භික්ෂූහු ශික්ෂා නුපුරත් නම් ඔවුන් ශික්ෂා පිරීමෙහි යොදවත්ද යම් ඒ අන්‍ය භික්ෂූහු ශීක්ෂාකාමී වෙත්නම් ඇත්තාවූ විද්‍යමානවූ ඔවුන්ගේ ගුණ සුදුසු කාලයෙහි කියන්නේද,

18. "මම ඒ ස්ථවිර භික්ෂුවගේ ගුණ කියමි. කුමක් හෙයින්ද?

19. "ශාස්තෘ තෙමේ ඔහුගේ ගුණ කියායයි අන්‍ය භික්ෂූහු ඔහු භජනය කරන්නාහුය. ඔව්හු ඔහුගේ ගති පැවතුම් අනුව යන්නාහුය. එය ඔවුන්ට බොහෝ කාලයක් හිත පිණිස සැප පිණිස වන්නේය. කස්සපය, එහෙයින් මම එවැනි ස්ථවිර භික්ෂුවගේ ගුණ කියමි.

20. "කස්සපය, මධ්‍යමවූ භික්ෂුවක්ද (මෙහි මේ සූත්‍රයේ 17 ඡෙදය යෙදිය යුතුයි.) කස්සපය, නවක භික්ෂුවක්ද (මෙහි මේ සූත්‍රයේ 17 ඡෙදය යෙදිය යුතුයි)

21. (මේ ඡේදය මේ සූත්‍රයේ 19 ඡේදය මෙනි.)

(නවවැනි ශ්‍රමණ වර්ගය නිමි)

---

## 10. ලෝණඵල වර්ගය

**41. අච්චායික කරණීය සූත්‍රය:** 1. "මහණෙනි, ගෘහපති ගොවියා විසින් ඉක්මනින් කළ යුතුවූ වැඩ තුනක් වෙත්. කවර තුනක්ද යත්? මහණෙනි, ගෘහපති ගොවි තෙමේ කෙත වහ වහා මනාව සාන්නේ වෙයි. වහ වහා මනාව සමතලා කරන්නේ වෙයි. වහ වහා සී සා වහ වහා සමතලා කොට වහ වහා බීජ වපුරන්නේ වෙයි. වහ වහා බීජ වපුරා වහ වහා වතුර බඳින්නේද, වතුර හරින්නේද වෙයි. මහණෙනි, මේ ගොවි ගෘහපතියා විසින් ඉක්මනින් කටයුතුවූ වැඩ තුන වෙත්.

2. "මහණෙනි, ඒ ගෘහපති ගොවියාට 'මාගේ ධාන්‍ය අදම පැළ වෙත්වා, හෙට ගැබ් ගනිත්වා, අනිද්දා පැසෙත්වායි' ඍද්ධියක් හෝ ආනුභාවයක් හෝ නැත. යම් කලෙක ඒ ගෘහපති ගොවියාගේ ඒ ධාන්‍ය ඍතු පරිණාමයට පැමිණ පැළ වන්නේත්, ගැබ් ගන්නේත්, පැසෙන්නේත් වෙයිද එබඳු කාලයක් ඇත්තේය.

3. "මහණෙනි, එසේම භික්ෂුව විසින් ඉක්මනින් කළ යුතුවූ වැඩ තුනක් වෙත්. කවර තුනක්ද? අධිශීල ශික්ෂා සමාදානයද අධිචිත්ත ශික්ෂා සමාදානයද අධිප්‍රඥා ශික්ෂා සමාදානයද වෙයි මහණෙනි මේ භික්ෂුව විසින් ඉක්මනින් කළ යුතු තුන වෙත්.

4. "මහණෙනි, ඒ භික්ෂුවට 'අදම හෝ හෙටම හෝ අනිද්දාම හෝ මාගේ සිත ආශ්‍රවයන් කෙරෙන් මිදේවායි' ඍද්ධියක් හෝ ආනුභාවයක් හෝ නැත.

5. "මහණෙනි, හුදෙක් යම් කලෙක අධිශීලයෙහි හික්මෙන්නාවූද අධිචිත්තයෙහි හික්මෙන්නාවූද අධිප්‍රඥාවෙහි හික්මෙන්නාවූද, ඒ භික්ෂුවගේ සිත ආශ්‍රවයන් කෙරෙන් මිදෙයිද, එබඳු කාලයක් ඇත්තේය.

6. 'මහණෙනි, එහෙයින් අධිශීල ශික්ෂා සමාදානයෙහි මාගේ බලවත් කැමැත්ත වන්නේය. අධිචිත්ත ශික්ෂා සමාදානයෙහි මාගේ බලවත් කැමැත්ත වන්නේය. අධිප්‍රඥා ශික්ෂා සමාදානයෙහි මාගේ බලවත් කැමැත්ත වන්නේයයි මෙසේ හික්මිය යුතුය මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයයි" වදාළේය.

**42. පවිවෙකත්ත සූත්‍රය:-** 1. "මහණෙනි, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ විවෙක තුනක් පනවත්. කවර තුනක්ද යත්? චීවර පවිවෙකය (සිවුරෙහි ආශාවෙන් වෙන්වීම) පිණ්ඩපාත පවිවෙකය (ආහාරයෙහි ආශාවෙන් වෙන්වීම) සෙනාසන පවිවෙකය (සෙනසුනෙහි ආශාවෙන් වෙන්වීම) යන මේ තුනය.

2. "මහණෙනි, එයින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙය චීවර පවිවෙකයෙහි පනවත්. හන වැහැරිද දරත්. හන මිශ්‍ර වස්ත්‍රද දරත්. මල සිරුරුවලින් ඉවත් කරන ලද වස්ත්‍රද දරත්. බිම වීසිකර දමන ලද වස්ත්‍රද රුක් පතුරුද දරත්. දිවි සම්ද දරත්. මැදින් පලන ලද කුර සහිත දිවි සම්ද දරත්. කුසතණ වැහැරිද දරත්. දුහුල් වැහැරිද දරත්. ලෑලි තීරුද දරත්. හිසකේ වලින් කළ වස්ත්‍රද දරත්. අස් ලොමින් කළ වස්ත්‍රද දරත්. බකමූණු පිහාටුද දරත්. මහණෙනි, මෙය අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ චීවර පවිවෙකයෙහි පනවත්.

3. "මහණෙනි, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙය පිණ්ඩපාත විවෙකයෙහි පනවත්. අමුකොළ කන්නාහුද වෙත්. බඩ හමු කන්නාහුද වෙත්. ඉබේට හැදුණ වී වර්ග කන්නාහුද වෙත්. සම් කුඩු කරන්නාහුද වෙත්. රුක් මැලියන් කන්නාහුද වෙත්. වී කුඩු කන්නාහුද වෙත්. දංකුඩ කන්නාහුද වෙත්. පුනක්කු කන්නාහුද වෙත්. තෘණ කන්නාහුද වෙත්. ගොම කන්නාහුද වෙත්. වනමුල් ගෙඩි කන්නාහුද වෙත්. මහණෙනි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙය පිණ්ඩපාත විවෙකයෙහි පනවත්.

4. "මහණෙනි, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙය සෙනාසන විවෙකයෙහි පනවත්. අරණ්‍යය, රුක්මුලය, සොහොනය, ගමට දුර කැලය, එළිමහණ, පිදුරු ගොඩ කමත

යන මේයි. මහණෙනි, මෙය අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ සෙනාසන විවෙකයෙහි පනවත්. මහණෙනි, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මේ විවෙක තුන පනවත්.

**5.** "මහණෙනි, මේ ධර්ම විනය සංඛ්‍යාත ශාසනයෙහි භික්ෂුවට විවෙක තුනක් වෙත්. කවර තුනක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම සිල්වත් වේද, ඔහු විසින් දුස්සීල බව පහකරන ලද්දේ වෙයිද, එයින් වෙන්වූයේ වෙයිද සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද ඔහු විසින් මිථ්‍යාදෘෂ්ටිය පහකරන ලද්දේ වෙයිද, එයින් වෙන්වූයේ වෙයිද, ක්ෂය කරනලද ආශ්‍රව ඇත්තේ වෙයිද, ඔහු විසින් ආශ්‍රවයෝ පහකරන ලද්දාහු වෙත්ද, එයින් වෙන්වූයේ වෙයිද, මහණෙනි, මේ මහණ තෙම සීලයෙන් කෙළවරට පැමිණියේයයිද, සීල සාරයට පැමිණියේ යයිද, පිරිසිදු වූයේ යයිද, සීල සමාධි ප්‍රඥා සාරයෙහි පිහිටියේ යයිද, කියනු ලැබේ.

**6.** "මහණෙනි, ගෘහපති ගොවියාගේ පැසුණාවූ හැල් කෙතක් වේද ගෘහපති ගොවිතෙම වහ වහා සිඳුවන්නේය වහ වහා සිඳුවා වහ වහා එකතු කරවන්නේය. වහ වහා එකතු කරවා වහ වහා කමතෙහි රැස් කරවන්නේය. වහ වහා කමතෙහි රැස් කරවා වහ වහා කොළ ගස්වන්නේය. වහ වහා කොළ ගස්වා මඩවන්නේය. වහ වහා මඩවා මැඩුවන් බාන්නේය. වහ වහා මැඩුවන් බා වහ වහා බොල් පොලා හරින්නේය. වහ වහා බොල් පොලා හැර වහ වහා අටු කොටුවලට ගෙන්වන්නේය. වහ වහා ගෙන්වා වහ වහා කොටවන්නේය. වහ වහා කොටවා වහ වහා පොතු ඉවත් කරන්නේය. මහණෙනි, ඒ ගෘහපති ගොවියාගේ ඒ ධාන්‍ය මෙසේ අග්‍ර බවට පැමිණියාහුද සාර බවට පැමිණියාහුද පිරිසිදුවූවාහුද සාරයෙහි පිහිටියාහුද වෙත්.

**7.** මහණෙනි, එසේ මහණ තෙමේ සිල්වත්වූයේ වෙයිද ඔහු විසින් දුස්සීල බව පහකරන ලද්දේ වෙයිද, එයින් වෙන්වූයේ වෙයිද, සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වේද, ඔහු විසින් මිථ්‍යා දෘෂ්ටිය පහකරන ලද්දේ වෙයිද, එයින් වෙන්වූයේ වෙයිද, ක්ෂය කරනලද ආශ්‍රවයන් ඇත්තේ වෙයිද, ඔහු විසින් ආශ්‍රවයෝ ක්ෂය කරන ලද්දාහු වෙත්ද, එයින් වෙන්වූයේ වෙයිද, මහණෙනි මේ මහණ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

තෙමේ අග්‍ර බවට පැමිණියේයයිද සාර බවට පැමිණියේයයිද, පිරිසිදු වූයේයයිද සාරයෙහි පිහිටියේ යයිද, කියනු ලැබේ.

8. "මහණෙනි, යම් සේ සරත් ඍතුවෙහි අහස පිරිසිදු වූ කල්හි පහවූ වලාකුල් ඇති කල්හි අහස මැදට පැමිණි සූර්‍ය්‍යයා අහසෙහි සියලු අඳුරු දුරුකොට ආලොක කරන්නේද තවන්නේද බබලන්නේද වෙයි "මහණෙනි, එසේම යම් විටෙක ආර්‍ය්‍යශ්‍රාවකයා හට කෙලෙස් රජස් රහිතවූ කෙලෙස් මල දුරුවූ ධර්ම චක්ෂුස (සෝවාන් මාර්ග ඥානය) පහළ වූයේද මහණෙනි, ඒ සෝවාන් මාර්ග ඥානය පහළවීම සමගම ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස යන සංයොජන තුන පහවෙත්.

9. "ඉන් පසුව අභිද්‍යාවෙන් ව්‍යාපාදයෙන්ද යන ධර්ම දෙකින් එතර වෙයි. හෙතෙම කාමයන්ගෙන් වෙන්වම අකුසලයන්ගෙන් වෙන්වම විතර්ක සහිත, විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. එසමයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙම කාලක්‍රියා කරන්නේ නම් යම් සංයොජනයකින් බැඳුණු ආර්‍ය්‍යශ්‍රාවක තෙම නැවත මේ ලොකයට පැමිණෙන්නේ නම් ඔහුට එබඳු සංයොජනයක් නැත්තේය.

**43. අග්ගවතී (හෝ) පරිසත්තය සූත්‍රය:-** 1. "මහණෙනි, මේ පිරිස් තුනකි. කවර තුනක්ද? අග්‍රවූ පිරිසය, වර්ග (භෙද) වූ පිරිසය. සමගි පිරිසය යනුයි.

2. "මහණෙනි, අග්‍රවූ පිරිස නම් කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසක ස්ථවිර භික්ෂූහු ප්‍රත්‍ය බහුලකොට ඇත්තෝ නොවෙත්ද, ශාසනය ලිහිල්කොට ගත්තෝ නොවෙත්ද නීවරණයන්හි බහා තබන ලද බර ඇත්තාහු වෙත්ද, ත්‍රිවිධ විවෙකය පෙරටුකොට ඇත්තාහු වෙත්ද, නොපැමිණ ගුණයන්ට පැමිණීම පිණිසද, අවබොධ නොකළ ගුණයන් අවබොධ කරනු පිණිසද, ප්‍රත්‍යක්ෂ නොකළ ගුණයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද, වීර්‍ය්‍යය කරන්නේ වෙයිද, ඔවුන්ගේ පසු ජනතාව ඔවුන් අනුව යන්නීය. පසු ජනතාවද ප්‍රත්‍ය බහුලකොට ඇත්තී නොවෙයි.

ශාසනය ලිහිල්කොට ගන්නී නොවෙයි. නීවරණයන්හි බහා තබන ලද බර ඇත්තී වෙයි, විවේකය පෙරටුකොට ඇත්තී වෙයි. නොපැමිණි ගුණයන්ට පැමිණීම පිණිසත් අවබොධ නොකළ ගුණයන් අවබොධ කිරිම පිණිසත් ප්‍රත්‍යක්ෂ නොකළ ගුණයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසත් වීර්‍ය්‍යය කරයි. මහණෙනි, මේ අග්‍ර පිරිසයයි කියනුලැබේ.

3. "මහණෙනි, වර්ග පිරිස නම් කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසක් භික්ෂූහු හටගත් ඩබර ඇතිව හටගත් කලහ ඇතිව විරුද්ධ වාදයට පැමිණ ඔවු නොවුන් වචන නමැති ආවුධවලින් විදගනිමින්, වාසය කෙරෙද්ද, මහණෙනි, මේ වර්ග පිරිසයයි කියනුලැබේ.

4. "මහණෙනි, සමගි පිරිස නම් කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි යම් පිරිසක භික්ෂූහු සමගිව සතුටු වෙමින් විවාද නොකරමින් කිරිත් වතුරත් මෙන් එක්ව ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් වාසය කරත්ද, මහණෙනි, මේ පිරිස සමඟි පිරිසයයි, කියනු ලැබේ.

5. "මහණෙනි, යම් කලෙක භික්ෂූහු සමගිව සතුටුව විවාද නොකරමින් කිරිත් වතුරත් මෙන් එක්ව ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් වාසය කරද්ද

6. "මහණෙනි, එකල්හි භික්ෂූහු බොහෝ පින් රැස් කරත්, මහණෙනි, එකල්හි යම් මුදිතා චිත්ත සමාධියක් වේද ඒ මුදිතා චිත්තසමාධියයි කියන ලද බ්‍රහ්ම විහරණයෙන් යුක්තව වාසයකරත්. මුදිතායෙන් සතුටු වූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තාහුගේ නාම කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි. සැපවත් වූවහුගේ සිත සමාධියට පැමිණෙයි.

7. "මහණෙනි, මෙසේ කඳුකරයෙහි මහපොද ඇති වැසි වස්නා කල්හි ජලය පහත් තැන් කරා ගලායන්නේ කඳුරැලි ඇල දොළ පිරීයන්නේද, කඳුරැලි ඇල දොළ පිරී යාමෙන් කුඩා පතස් පිරෙයිද, කුඩා පතස් පිරීමෙන් මහ පතස් පිරෙයිද, මහ පතස් පිරීමෙන් කුඩා ගංගා පිරෙයිද කුඩා ගංගා පිරීමෙන් මහගංගා පිරෙයිද, මහගංගා පිරීමෙන් සමුද්‍රය පිරෙයිද,

මහණෙනි, එපරිද්දෙන් යම් කලෙක භික්ෂූහු සමගිව සතුටුව විවාද නොකරමින් කිරිත් දියත් මෙන් එක්ව ඔවුනොවුන් ප්‍රිය චක්ෂූසින් බලමින් වාසය කරත්ද, මහණෙනි,

8. "එකල්හි භික්ෂූහු බොහෝ පින් රැස් කරත්. මහණෙනි, එකල්හි භික්ෂූහු යම් මුදිතා සමාධියක් ඇත්නම් ඒ මුදිතා බ්‍රහ්මවිහරණයෙන් යුක්තව වාසය කරයි, මුදිතාවෙන් යුක්තවූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීතියෙන් යුක්තවූවහුගේ නාම කාය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට පැමිණෙයි. මහණෙනි, මේ වනාහි තුන්පිරිස වේයයි වදාළේය.

44. **අස්සාජානි සූත්‍රයඃ-** 1. මහණෙනි, අංග තුනකින් යුත් යහපත්වූ රජහුගේ අජානීය අශ්වතෙම රජු විසින් පරිභොග කළ යුත්තේ රජුට සුදුසුවූයේ වෙයි. රජහුගේ අංගයෙක යන සංඛ්‍යාවට පැමිණෙයි.

2. "කවර අංග තුනෙකින්ද? මහණෙනි, මෙහි රජහුගේ යහපත්වූ අජානීය අශ්ව තෙම වර්ණයෙන් යුක්තවූයේ වෙයිද, බලයෙන් යුක්තවූයේ වෙයිද, ජවයෙන් යුක්තවූයේ වෙයිද, මහණෙනි, මේ අංග තුනෙන් යුත් රජහුගේ යහපත් අජානීය අශ්වද තෙම රජු විසින් පරිභොග කළ යුත්තේ රජුට සුදුසු වූයේ වෙයි.

3. "මහණෙනි, එසේම ධර්ම තුනකින් යුත් මහණ තෙමේ ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූයේ වෙයි. දුර සිට ගෙනෙන ලද ප්‍රත්‍යය පිළිගැනීම සුදුසුවූයේ වෙයි. ඇඳිලිබැඳ නමස්කාර කිරීමට සුදුසුවූයේ වෙයි. ලොකයාගේ අනුත්තර පුණ්‍යක්ෂෙත්‍රය වෙයි.

4. "කවර තුනකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම වර්ණයෙන් යුක්ත වූයේද වෙයි. බලයෙන් යුක්ත වූයේද වෙයි. ජවයෙන් යුක්තවූයේද වෙයි.

5. මහණෙනි, කෙසේනම් මහණ තෙම වර්ණයෙන් යුක්තවූයේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම

සිල්වත්වූයේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරවූයේ ආචාර ගොචර දෙකින් යුක්තව වාසය කරයිද, කුඩා වරදෙහිද භය දකිමින් ශික්ෂාපදයන්හි දැඩි සමාදානයෙන් යුක්තව වාසය කරයිද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙමේ වර්ණයෙන් යුක්තවූයේ වෙයි.

6. "මහණෙනි, කෙසේනම් මහණ තෙමේ බලයෙන් යුක්තවූයේ වෙයිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිසත් කුශල ධර්මයන්ගේ වැඩීම පිණිසත් පටන්ගන්නා ලද වීර්‍ය්‍යයෙන් යුක්තව දැඩි වීර්‍ය්‍යයෙන් යුක්තව දෘඪ පරාක්‍රමයෙන් යුක්තව කුසල ධර්මයන්හි බහා නොතබන ලද බර ඇතිව වාසය කරයිද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙමේ බලයෙන් යුක්ත වූයේ වෙයි.

7. "මහණෙනි, කෙසේනම් මහණ තෙමේ ජවයෙන් යුක්ත වූයේ වෙයිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම මෙය දුකයයි තත්වාකාරයෙන් දනීද, මෙය දුකට හෙතුවයයි තත්වාකාරයෙන් දනීද, මෙය දුක නැතිකිරීමයයි තත්වාකාරයෙන් දනීද, මෙය දුක් නැතිකිරීමේ මාර්ගයයි තත්වාකාරයෙන් දනීද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම ජවයෙන් යුක්තවූයේ වෙයි.

8. "මහණෙනි මේ අංගතුනෙන් යුත් මහණ තෙමේ ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූයේ වෙයි. (3 වෙනි ඡෙදයෙහි "දුර සිට" යනතැන සිට "වූයේ වෙයි" යන තැන දක්වා ඇති කොටස මෙ තැනට යෙදියයුතුයි.) ලොකයාගේ අනුත්තර පුණ්‍යක්ෂෙත්‍රය වේයයි" වදාළසේක.

**45. දුතිය අස්සාජානීය සූත්‍රයඃ- 1-6** "(මේ ඡෙද මේ වර්ගයේ 44 සූත්‍රයේ 1-6 ඡෙද මෙන් වෙත්,)

7. "මහණෙනි, කෙසේනම් මහණ තෙමේ ජවයෙන් යුක්ත වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ ඕරම්භාගීය සංයොජන පස ක්ෂයකිරීමෙන් ඒ ලොකයෙන් නොඑන

ස්වභාවය ඇත්තාවූ එහි පිරිනිවෙන්නාවූ ඖපපාතික පුද්ගලයෙක් වෙයිද මහණෙනි, මෙසේ වනාහි මහණ තෙමේ ජවයෙන් යුක්තවූයේ වෙයි.

8. "(මේ ඡේදය මේ වර්ගයේ 44 වෙනි සූත්‍රයේ 8 ඡේදය මෙනි.)

**46. තතිය අස්සාජානීය සූත්‍රයඃ- 1-6** (මේ ඡේද මේ වර්ගයේ 14 සූත්‍රයේ 1-6 ඡේද මෙන් වෙත්.)

7. "මහණෙනි, කෙසේනම් මහණ තෙම ජවයෙන් යුක්ත වූයේ වෙයිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියත්, අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහි තෙමේම විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට දැන ඊට පැමිණ වාසය කරයි. මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම ජවයෙන් යුක්ත වූයේ වෙයි.

8. "මහණෙනි, මේ අංගතුනෙන් යුත් මහණ තෙමේ ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූයේ වෙයි. දුර සිට ගෙනෙන ලද ප්‍රත්‍ය පිළිගැනීමට සුදුසුවූයේ වෙයි. ඇදිලිබැඳ නමස්කාර කිරීමට සුදුසුවූයේ වෙයි. ලෝකයාගේ අනුත්තර පුන්‍යක්ෂෙත්‍රය වේයයි" වදාළේය.

**47. පොත්ථකූපම සූත්‍රයඃ-** 1. 'මහණෙනි, අලුත්වූ වැහැරි වස්ත්‍රයද දුර්වර්ණ වූයේද කෘෂර ස්පර්ශය ඇත්තේද නොවටින්නේද වෙයි. මහණෙනි, මධ්‍යම තරම කල්ගතවූ වැහැරි වස්ත්‍රයද දුර්වර්ණ වූයේත් කෘෂර ස්පර්ශය ඇත්තේත් නොවටින්නේත් වෙයි. මහණෙනි, පරණවූ වැහැරි වස්ත්‍රයද දුර්වර්ණ වූයේත් කෘෂර ස්පර්ශය ඇත්තේත් නොවටින්නේත් වෙයි.

2. "මහණෙනි, පරණවූ වැහැරි වස්ත්‍රය හැළිවළන් පිසින්නක් හෝ කරත්. කසළ ගොඩෙයි හෝ දමත්.

"මහණෙනි, එසේම නවක භික්ෂුතෙමේද,

3. 'දුශ්ශීලවූයේ ලාමක ස්වභාවය ඇත්තේවෙයිද මෙය ඔහුගේ දුර්වර්ණතාව යයි කියමි. මහණෙනි, ඒ වැහැරි වස්ත්‍රය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යම්සේද, මහණෙනි, මම මේ පුද්ගලයාද ඊට උපමා කොට කියමි මහණෙනි, යම් කෙනෙක් ඔහු සෙවනය කරද්ද, භජනය කරද්ද, පයුරුපාසනය කරද්ද, අනුගමනය කරද්ද ඔවුන්ට එය බොහෝ කාලයක් අහිත පිණිස දුක් පිණිස පවතියි. මෙය ඔහුගේ කෲර ස්පර්ශයයි කියමි.

4. "මහණෙනි, යම්සේ වැහැරි වස්ත්‍රය කෲර ස්පර්ශ ඇත්තේද මහණෙනි, මම මේ පුද්ගලයාද ඊට උපමා කොට කියමි යමෙකුන්ගේ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍ය බෙහෙත් පිරිකර පිළිගනියි නම් ඔවුන්ට එය මහත්ඵල ඇත්තේත් නොවෙයි. මහත් ආනිසංස ඇත්තේත් නොවෙයි. මෙය ඔහුගේ නොවටිනා බවයයි කියමි.

5. "මහණෙනි, යම්සේ ඒ වැහැරි වස්ත්‍රය නොවටින්නේ වේද, මහණෙනි, මම මේ පුද්ගලයාද ඊට උපමාකොට කියමි.

6. "මහණෙනි, මධ්‍යම භික්ෂුතෙමේද (මෙහි මේ සූත්‍රයේ 3-4-5 ඡේද යෙදිය යුතුයි)

7. "මහණෙනි, ස්ථවිර භික්ෂුතෙමේද (මෙහි මේ සූත්‍රයේ 3-4-5 ඡේද යෙදිය යුතුයි.

8. "මහණෙනි, මෙබඳුවූ ස්ථවිර භික්ෂුතෙම සංඝයා මධ්‍යයෙහි කථාකරයිද ඔහුට භික්ෂූහු 'බාලවූ අව්‍යක්තවූ ඔබගේ කීමෙන් කිනම් අර්ථයෙක්ද? ඔබත් කියයුත්තෙකු කොට හඟින්නෙහිදැයි' කියන්නාහුය. කිපුණාවූ නොසතුටුවූ සිත් ඇත්තාවූ හෙතෙම යම් වචනයකින් සංඝතෙම වැහැරි වස්ත්‍රය කසලගොඩට දමන්නාක් මෙන් ඔහු බැහැර කරන්නේද එබඳු වචනයක් කියයි.

48. වත්ථොපම සූත්‍රය:- 1. "මහණෙනි, අලුත්වූද කසී වස්ත්‍රය වර්ණයෙන් යුක්ත වූයේද සැප ස්පර්ශයෙන් යුක්ත වූයේද බොහෝ වටින්නේද වෙයි. මහණෙනි, මධ්‍යමවූ කසී වස්ත්‍රයද වර්ණයෙන් යුක්තවූයේද සැප ස්පර්ශයෙන් යුක්ත වූයේද බොහෝ වටින්නේද වෙයි. මහණෙනි, පරණවූ කසී වස්ත්‍රයද වර්ණයෙන් යුක්තවූයේද සැප ස්පර්ශයෙන් යුක්ත වූයේද

බොහෝ වටින්නේද වෙයි. මහණෙනි, පරණවූද කසී සලුව රත්න වෙලන්නක් හෝ කරත්. සුවඳ කරඬුවෙහි හෝ තැන්පත් කරත්.

මහණෙනි, එසේම නවකවූද භික්ෂුව,

2. "සිල්වත් වූයේ යහපත් ස්වභාව ඇත්තේ වෙයිද, මෙය ඔහුගේ යහපත් වර්ණඇති බවයයි කියමි. මහණෙනි, යම්සේ කසී වස්ත්‍රය වර්ණයෙන් යුක්තවූයේද, මහණෙනි, මම මේ පුද්ගලයාද එබඳු උපමා ඇත්තෙකැයි කියමි. මහණෙනි, යම්කෙනෙක් ඔහු සෙවනය කරද්ද භජනය කරද්ද, පයුරුපාසනය කරද්ද, අනුගමනය කරද්ද එය ඔවුන්ට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වෙයි. මහණෙනි, මෙය ඔහුගේ සැප ස්පර්ශය ඇතිබවයයි කියමි.

3. "යම් කෙනෙකුන්ගේ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගනියිද එය ඔවුන්ට මහත්ඵල ඇත්තේ වෙයි. මහානිසංස ඇත්තේ වෙයි. මෙය ඔහුගේ බොහෝ වටිනා බවයයි කියමි.

4, "මහණෙනි, මම මේ පුද්ගලයාද ඊට උපමා ඇත්තෙකැයි කියමි

5. "මහණෙනි, මධ්‍යමවූ භික්ෂුවද (මෙහි මේ සූත්‍රයේ 2-3-4 ඡෙද යෙදිය යුතුයි)

6. "මහණෙනි, ස්ථවිර භික්ෂුතෙමේද (මෙහි මේ සූත්‍රයේ 2-3-4 ඡෙද යෙදිය යුතුයි.

7. "මහණෙනි, මෙබඳුවූ ස්ථවිර භික්ෂුතෙමේ සංඝයා මධ්‍යයෙහි කථා කරයිද, ඔහුට භික්ෂූහු මෙසේ කියත්. කෙසේද 'ආයුෂ්මත්වරුනි, නිශ්ශබ්ද වව් තෙරුන්වහන්සේ ධර්මයත් විනයත් ප්‍රකාශකරත්' කියයි. මහණෙනි, එහෙයින් තොප විසින් කසී වස්ත්‍රයකට උපමා ඇත්තෝ වන්නෙමු. වැහැරි වස්ත්‍රයකට උපමා ඇත්තෝ නොවන්නෙමුයි හික්මිය යුතුය. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයයි වදාළේය."

**49. ලොණ ඵල (හෝ) යථා කම්ම වෙදනිය සූත්‍රය:- 1.** ‘මහණෙනි, යමෙක් ‘මේ පුරුෂ තෙමේ යම් යම් ආහාරයකින් කර්ම කෙරේද, ඒ කර්මය ඒ ඒ ආකාරයෙන් විපාක දෙන්නේයයි’ කියන්නේ නම් මහණෙනි, එසේ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්‍ය්‍ය වාසයක් නොවන්නේය. මනාව දුක් කෙළවර කිරීමට අවකාශයක් නොපෙනෙන්නේය.

2. “මහණෙනි, යමෙක් (දිට්ඨ ධම්මවෙදනීයාදි වශයෙන්) යම් යම් ආකාරයකින් වින්ද යුතුවූ කර්ම කෙරේද ‘ඒ කර්මයාගේ විපාක ඒ ඒ ආකාරයෙන් විඳින්නේයයි කියන්නේ නම් එසේ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්‍ය්‍ය වාසයක් ඇත්තේය. මනාව දුක් කෙළවර කිරීමට අවකාශයක් පෙනෙන්නේය

3. “මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු විසින් ස්වල්පමාත්‍ර පාපයකුදු කරන ලද්දේද ඒ පාප කර්මය ඔහු නිරයට පමුණුවයි. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු විසින් කරනලද එබඳුවූම ස්වලප මාත්‍ර පාපය මේ ආත්මයෙහිම විපාක දෙන කර්මයක් වේ. පරලොව ස්වල්ප විපාකයකුදු නොදෙයි. බොහෝ විපාක ගැන කියනුම කිම?

4. “මහණෙනි කවර පුද්ගලයෙකු විසින් ස්වල්ප මාත්‍ර පාපයකුදු කරන ලද්දේ නම්, ඒ පාප කර්මය ඔහු නිරයට පමුණුවයිද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නොවඩන ලද කය ඇත්තාවූද නොවඩන ලද සිල් ඇත්තාවූද නොවඩන ලද සිත් ඇත්තාවූද වෙයිද, නොවඩන ලද ප්‍රඥාව ඇත්තාවූද ගුණයෙන් කුඩා වූද ගුණ හීන කයක් ඇත්තාවූද සුලු පවකද දුක් විඳින්නෙක් වේද, මහණෙනි, මෙබඳු පුද්ගලයා විසින් සුලු පවක් කරන ලද්දේද එය ඔහු නිරයට පමුණුවයි,

5. “මහණෙනි, කෙබඳුවූ පුද්ගලයකු විසින් කරන ලද එබඳුවූ ස්වල්ප මාත්‍ර කර්මය මේ ආත්මයෙහි විපාක දෙන පරලොව බොහෝවූ විපාක තබා සුලු විපාකයකුදු නොදෙන කර්මයක් වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වඩනලද කය ඇති වඩන ලද සිල් ඇති, වඩන ලද සිත් ඇති, වඩන ලද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රඥාව ඇති, ගුණයෙන් කුඩා නොවූ ගුණ මහත්වයෙන් මහත්වූ රහත් භික්ෂුවක් වෙයිද, මහණෙනි, එබඳු පුද්ගලයා විසින් කරනලද එබඳු ස්වල්ප කර්මය මේ ආත්මයෙහි විපාක දෙන පරලොව බොහෝවූ විපාක තමා සුලු විපාකයකුදු නොදෙන කර්මයක් වෙයි.

**6.** "මහණෙනි, යම්සේ පුරුෂයෙක් කුඩා වතුර භාජනයකට ලුණු කැටයක් දමන්නේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? ඒ කුඩා දිය බඳුනෙහි ඒ ස්වල්ප ජලය ඒ ලුණු කැටයෙන් නොබිය හැකි ලුණු රස වන්නේද?"-"ස්වාමීනි, එසේය."

"ඊට හෙතුව කවරේද?"-"ස්වාමීනි, ඒ දිය බඳුනෙහි ස්වල්ප ජලය ඒ ලුණු ඇටයෙන් නොබිය හැකි ලුණු රස වන්නේය.

**7.** 'මහණෙනි, යම්සේ පුරුෂ තෙමේ ලුණු ඇටයක් ගංගා නම් ගඟෙහි දමන්නේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නෙහිද? ගංගානම් ගඟ ඒ ලුණු ඇටයෙන් නොබිය හැකි ලුණු රස වන්නේද?"-"ස්වාමීනි, එසේ නොවේමය."

"ඊට හෙතු කවරේද?"-"ස්වාමීනි, ඒ ගංගානම් ගඟෙහි මහා දිය කඳ ඒ ලුණු ඇටයෙන් 'නොබිය හැකි ලුණුරස' නොවන්නේය."

**8.** "මහණෙනි, එසේම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකු විසින් කරන ස්වල්පවූ පාපකර්මයද ඔහු නිරයට පමුණුවයි. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු විසින් කරන ලද එබඳු වූම ස්වල්පමාත්‍ර කර්මය මේ ආත්මයෙහි විපාක දෙන්නාවූ පරලො බොහො විපාක තබා සුලු විපාකයකුදු නොදෙන්නාවූ කර්මයක් වෙයි.

**9.** (මේ ඡෙදය මේ සූත්‍රයේ 4 ඡෙදය මෙනි.)

**10.** මේ ඡෙදය මේ සූත්‍රයේ 5 ඡෙදය මෙනි.)

**11.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් අඩ කහවණුවෙනුදු හිර දඬුවමට පැමිණෙයි. කහවණුවෙනුදු හිර දඬුවමට පැමිණෙයි."

"කහවණු සියයකිනුදු හිර දඬුවමට පැමිණෙයි. මහණෙනි මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අඩ කහවණුවෙනුදු හිර දඬුවමට නොපැමිණෙයි. කහවණුවෙනුදු හිර දඬුවමට නොපැමිණෙයි. කහවණු සියයකිනුදු හිර දඬුවමට නොපැමිණෙයි. මහණෙනි, කෙබඳු පුද්ගලයා අඩ කහවණුවෙනුදු කහවණුවෙනුදු කහවණු සියයෙනුදු හිර දඬුවමට පැමිණෙයිද?

"මහණෙනි, මෙහි ඇතැම් පුද්ගලයෙක් ධනය නැත්තාවූ කිසිවක් කරගත නොහැකිවූ දිලින්දෙක් වෙයිද, මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ අඩ කහවණුවෙනුදු සිර දඬුවමට පැමිණෙයි. කහවණු වෙනුදු සිරදඬුවමට පැමිණෙයි. කහවණු සියයකිනුදු සිර දඬුවමට පැමිණෙයි. මහණෙනි, කෙබඳුවූ පුද්ගලතෙමේ අඩ කහවණුවෙනුදු සිර දඬුවමට නොපැමිණෙයිද කහවණුවෙනුදු සිර දඬුවමට නොපැමිණෙයිද කහවණු සියයකිනුදු සිර දඬුවමට නොපැමිණෙයිද?

12. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ධනයෙන් ආඪ්‍යවේද, මහත් ධන ඇත්තේ වේද, මහත් භොග ඇත්තේ වෙයිද මහණෙනි, මෙබඳු පුද්ගලතෙමේ අඩකහවණු වෙනුදු සිර දඬුවමට නොපැමිණෙයි. කහවණුවෙනුදු සිර දඬුවමට නොපැමිණෙයි. කහවණු සියයකිනිදු සිර දඬුවමට නොපැමිණෙයි.

13. "මහණෙනි, එපරිද්දෙන්ම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු විසින් කරන ලද සුලු පාප කර්මයද ඔහු නිරයට පමුණුවයි. මහණෙනි, මෙහි ඇතැම් පුද්ගලයකු විසින් කරන එබඳු ස්වල්පමාත්‍ර කර්මය මේ ආත්මයෙහි විපාක දෙන කර්මයක්ව පරලොව බොහෝ විපාක තබා සුලු විපාකයකුදු නොදෙන කර්මයක් වෙයි.

14. "මහණෙනි, කෙබඳු පුද්ගලයකු විසින් කරන ලද ස්වල්පමාත්‍රවූද කර්මය ඔහු නිරයට පමුණුවයිද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වඩන ලද කය ඇති වඩන ලද සිල් ඇති වඩන ලද සිත් ඇති වඩන ලද ප්‍රඥාව ඇති ගුණයෙන් කුඩා නොවූ ගුණ මහත්වයෙන් මහත්වූ රහත්

භික්ෂුවක් වෙයිද මහණෙනි, එබඳුවූ පුද්ගලයා විසින් කරන ලද ස්වල්පවූද පාප කර්මය ඔහු නිරයට පමුණුවයි.

15. "මහණෙනි, කෙබඳු පුද්ගලයෙකු විසින් කරන ලද පරලොව බොහෝවූ විපාක තබා සුලු විපාකයකුදු නොදෙයි. මහණෙනි, යම්සේ එළුවන් අයිතිකාරයෙක් හෝ එළුවන් මරන්නෙක් හෝ එළුවකු සොරකම් කරන්නාවූ ඇතමෙකු නසන්ට හෝ සිරකරන්ට හෝ ධනයෙන් පිරිහෙවන්ට හෝ කැමැත්තක් කරන්නට හෝ සමර්ථ වෙයි.

16. "එළුවෙකු සොරකම් කරන්නාවූ ඇතමෙකු නසන්නට හෝ සිරකන්නට හෝ ධනයෙන් පිරිහෙවන්නට හෝ කැමැත්තක් කරන්නට හෝ නුපුළුවන් වෙයි. මහණෙනි, එළුවන් අයිතිකාරයෙක් හෝ එළුවන් මරන්නෙක් හෝ එළුවන් සොරකම් කරන්නාවූ කෙබන්දෙකු නසන්ට හෝ සිරකරන්ට හෝ ධනයෙන් පිරිහෙවන්ට හෝ කැමැත්තක් කරන්නට හෝ සමර්ථ වෙයිද?

17. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් ස්වල්ප ධනය ඇත්තාවූ කිසිවක් කරගත නොහැකි දිළින්දෙක් වෙයිද මහණෙනි, එළුවන් අයිතිකාරයෙක් හෝ එළුවන් මරන්නෙක් හෝ එළුවකු සොරකම් කරන්නාවූ මෙබඳු පුද්ගලයා මරන්නට හෝ සිරකරන්නට හෝ ධනයෙන් පිරිහෙවන්නට හෝ කැමැත්තක් කරන්න හෝ සමර්ථ වෙයි.

18. "මහණෙනි, එළුවන් අයිතිකාරයෙක් හෝ එළුවන් මරන්නෙක් හෝ එළුවකු සොරකම් කරන්නාවූ කෙබඳු පුද්ගලයා මරන්නට හෝ සිරකරන්නට හෝ ධනයෙන් පිරිහෙවන්නට හෝ කැමැත්තක් කරන්නට හෝ සමර්ථ නොවේද?

19. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ධනයෙන් ආඪ්‍යවූයේද මහත් ධන ඇත්තේද මහත් භොග ඇත්තේද රජෙක් හෝ වේද රාජමහාමාත්‍යයෙක් හෝ වේද මහණෙනි, එළුවන් අයිතිකාරයෙක් හෝ එළුවන් මරන්නෙක් හෝ එළුවකු සොරකම් කරන්නාවූ එබඳු පුද්ගලයා නසන්නට හෝ සිරකරන්නට හෝ ධනයෙන් පිරිහෙවන්නට හෝ

කැමැත්තක් කරන්නට හෝ සමර්ථ නොවේ. ඒකාන්තයෙන් පින්වත, මාගේ එළුවා හෝ එළුවාගේ වටිනාකම හෝ දෙවයි ඔහුට යාඥා කරන්නේය.

20. "මහණෙනි, එසේම ඇතැම් පුද්ගලයකු විසින් කරන ලද ස්වල්පමාත්‍ර කර්මයද ඔහු නිරයට පමුණුවයි මහණෙනි මෙහි ඇතැම් පුද්ගලයකු විසින් කරනලද එබඳුවූම ස්වල්පමාත්‍ර කර්මය මේ ආත්මයෙහි විපාක දෙන පරලොව බොහෝවූ විපාක තබා සුලු විපාකයකුදු නොදෙන කර්මයක් වෙයි.

21. "මහණෙනි, කෙබඳු පුද්ගලයෙකු විසින් කරන ලද ස්වල්පමාත්‍රවූද කර්මය ඔහු නිරයට පමුණුවයිද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වඩන ලද කය ඇති වඩන ලද සිල් ඇති වඩන ලද සිත් ඇති වඩන ලද ප්‍රඥාව ඇති ගුණයෙන් කුඩා නොවූ ගුණ මහත්වයෙන් මහත්වූ රහත් භික්ෂුවක් වෙයිද,

"මහණෙනි, මේ පුරිසතෙමේ යම් යම් ආකාරයකින් කර්ම කෙරේද ඒ කර්මය ඒ ඒ ආකාරයෙන් විපාකදෙන්නේයයි යමෙක් මෙසේ කියන්නේද, මහණෙනි, එසේ ඇති කල්හි මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවක් නොවන්නේය. මනාකොට දුක් කෙළවර කිරීමෙන් අවකාශය නොපෙනෙන්නේය. මහණෙනි, මේ පුරුෂතෙමේ යම් යම් ආකාරයකින් විඳියයුතු ඒ ඒ ආකාරයෙන් ඔහු විසින් විපාක විඳියයුතු වන්නේයයි යමෙක් කියන්නේද මහණෙනි, එසේ ඇති කල්හි මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව වන්නේය. මනාකොට දුක් කෙළවර කිරීමේ අවකාශය පෙනෙන්නේය.

**50. ජාතරූපධොවන සූත්‍රයː-** 1. "මහණෙනි, ස්වර්ණයාගේ ඖදාරික උපක්ලෙශයෝ ඇත්තාහ. එනම්, පස් වැලි කැටකැබිලිති යන මේවාය.

2. "ඒ ස්වර්ණය පස් සෝදන්නෙක් හෝ පස් සෝදන්නෙකුගේ අතවැසියෙක් හෝ ඔරුවක දමා සෝදයි. මනාව සෝදයි, සොලව සොලවා සෝදයි.

3. "ඒ පස් වැලි පහකළ කල්හි නැතිකළ කල්හි ස්වර්ණයාගේ මධ්‍යමවූ උපක්ලෙශයෝ ඇත්තාහ. එනම් කුඩා ගල් කැට ගොරෝසු වැලි යන මේවාය.

4. "ඒ ස්වර්ණය පස් සෝදන්නා හෝ පස් සෝදන්නාගේ අතවැසියා හෝ සෝදයි, මනාකොට සෝදයි, සොළවමින් සෝදයි.

5. "ඒ කුඩා ගල් වැලිකැට පහවූ කල්හි නැතිව ගිය කල්හි ස්වර්ණයාගේ සියුම් උපක්ලෙශයෝ ඇත්තාහ. එනම් සියුම් වැලි කළු වැලි යන මේවාය.

6. "ඒ ස්වර්ණය පස් සෝදන්නා හෝ පස් සෝදන්නාගේ අතවැසියා හෝ සෝදයි. මනාව සෝදයි, සොලවමින් සෝදයි.

7. "එය පහවූ කල්හි එය නැතිවූ කල්හි රන්කුඩු පමණක් ඉතිරි වෙත්. රන්කරුවා හෝ රන්කරුවාගේ අතවැසියා හෝ එම රන්කුඩු කෝවෙහි දමා ගිනි පිඹියි. මනාව ගිනි පිඹියි, නැවත නැවත ගිනි පිඹියි. ගිනි පිඹින ලද මනාව ගිනි පිඹින ලද නැවත නැවත ගිනි පිඹින ලද ඒ ස්වර්ණය යොග්‍ය නොවූයේ දුරුනොවූ කහපාට ඇත්තේ මෘදුනොවූයේ වැඩට යොග්‍ය නොවූයේ බැබලීමක් නැත්තේ බිඳෙනසුලුවූයේ රන්කමට මනාව නොපැමිණෙයි.

8. "මහණෙනි, රන්කරුතෙමේ හෝ රන්කරු අතවැසි තෙමේ හෝ එම ස්වර්ණයට ගිනි පිඹියි. මනාව ගිනි පිඹියි. නැවත නැවත ගිනි පිඹියි. එසේ ගිනි පිඹින ලද මනාව ගිනි පිඹින ලද නැවත නැවත ගිනි පිඹින ලද ඒ ස්වර්ණය යොග්‍ය වන්නාවූද කහපාට දුරුවූද මෘදුවූද වැඩට යොග්‍යවූද බබලන්නාවූද නොබිඳෙන්නාවූද රන්කමට මනාව පැමිණෙන්නාවූද කාලයක් වන්නේය.

9. "යම් යම් පළඳනා විශෙෂයකින් ඉදින් රන්පටකින් ඉදින් කුණ්ඩලාභරණයකින් ඉදින් ග්‍රීවාභරණයකින් ඉදින් රන් මාලයකින් කැමති වෙයිනම් ඔහුගේ ඒ අර්ථය සම්පූර්ණ වෙයි.

10. "මහණෙනි, එපරිද්දෙන්ම සමථවිදර්ශනා භාවනාවන්හි යෙදෙන්නාවූ භික්ෂුවට ඕළාරික උපක්ලෙශයෝ ඇත්තාහ. එනම්ඃ කාය දුශ්චරිතය, වාක් දුශ්චරිතය, මනො දුශ්චරිතය යන මොහුය.

11. "සමාධියෙන් යුත් නුවණැති ඒ භික්ෂුව ඒ උපක්ලෙශයන් පහකරයි, දුරුකරයි, නැවත නූපදින බවට පමුණුවයි.

12. "එය පහවූ කල්හි දුරුවූ කල්හි සමථවිදර්ශනා භාවනායෙහි යෙදෙන්නාවූ භික්ෂුවට මධ්‍යම උපක්ලෙශයෝ ඇත්තාහ. එනම් කාමවිතර්ක ව්‍යාපාද විතර්ක විහිංසා විතර්ක යන මොහුය.

13. "සමාධියෙන් යුත් නුවණැති ඒ භික්ෂුව එය පහකරයි, දුරුකරයි, නැති කරයි.

14. "එය පහවූ කල්හි දුරුවූ කල්හි නැතිවූ කල්හි සමථවිදර්ශනා භාවනාවෙහි යෙදෙන්නාවූ භික්ෂුවට සියුම්වූ උපක්ලෙශයෝ ඇත්තාහ. එනම් ජාතිවිතර්ක ජනපද විතර්ක මට අන්‍යයෝ අවමන් නොකෙරෙත්වායි සිතන විතර්ක යන මොහුය

15. සමාධියෙන් යුත් නුවණැති ඒ භික්ෂුව එය පහ කරයි. දුරුකරයි නැති කරයි.

16. "එය පහවූ කල්හි දුරුවූ කල්හි නැතිවූ කල්හි ඉන්පසු ධර්මවිතර්කයෝම (දශ විදර්ශනොපක්ලෙශයෝම) ඉතිරි වෙත්. ඒ සමාධිය ශාන්ත නොවේ. ප්‍රණීත නොවේ කෙලෙස් සංසිඳීමෙන් ලබන ලද්දේ නොවෙයි. එකඟ බවට පැමිණියේ නොවෙයි උත්සාහයෙන් ක්ලෙශයන් නිග්‍රහකොට වළක්වන ලද්දේ වෙයි. මහණෙනි, යම් කලෙක්හි තමා කෙරෙහිම සිටීද මොනවට හිඳීද, එකඟ බවට පැමිණෙයිද, අරමුණෙහි මනාව පිහිටයිද, ඒ කාලය වෙයිද, ඒ සමාධිය ශාන්තවෙයි, ප්‍රණීත වෙයි. කෙලෙස් සංසිඳවීමෙන් ලබන ලද්දේ වෙයි. එකඟ බවට පැමිණියේ වෙයි. උත්සාහයෙන් කෙලෙසුන් නිග්‍රහ කොට නොවළක්වන ලද්දේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

17. විශෙෂ ඥානයෙන් දතයුතුවූ යම් යම් ධර්මයකට සිත නමයි නම් කරුණු ඇති ඇති සැටියෙන් විශෙෂ ඥානයෙන් දතයුතුවූ ඒ ඒ ධර්මයන් දතහැකි බවට පැමිණෙයි. හෙතෙම ඉදින් නොයෙක් ඍද්ධිවිධි අනුභව කරන්නෙමැයි කැමති වෙයි නම්

18. (මෙහි බ්‍රාහ්මණ වර්ගයේ 10 සංගාරව සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි. 'බමුණ,..... ලැබේ' යන කොටස් අත් හරින්න) කැමතිවන්නේ නම් කරුණු ඇති ආකාරයෙන් ඒ ඒ දෙයෙහි හැකිබවට පැමිණෙන්නේය.

19. "හෙතෙම ඉදින් මනුෂ්‍යත්වය ඉක්ම සිටියාවූ දිව්‍ය ශ්‍රොතධාතුවෙන් දුරවූද සමීපවූද දිව්‍යවූද මනුෂ්‍යවූද දෙවදෑරුම් ශබ්දයන් අසන්නෙමැයි කැමතිවෙයි නම් කරුණු ඇතිසැටියෙන් ඒ ශබ්ද ඇසියහැකි බවට පැමිණෙයි.

20. ඉදින් හෙතෙම අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත් තමාගේ සිතින් දැනගන්නෙමි. රාග සහිත සිත රාග සහිත සිතයයි දැනගන්නෙමි. රාග රහිත සිත රාග රහිත සිතයයි දැනගන්නෙමි. ද්වෙෂ සහිත සිත ද්වෙෂ සහිත සිතයයි දැනගන්නෙමි. මොහ සහිත සිත මොහ සහිත සිතයයි දැනගන්නෙමි. විසුරුණු සිත වික්ෂිප්ත සිතයයි දැනගන්නෙමි. මහද්ගත සිත මහද්ගත සිතයයි දැනගන්නෙමි. අමහද්ගත සිත අමහද්ගත සිතයයි දැනගන්නෙමි. සඋත්තර සිත සඋත්තර සිතයයි දැනගන්නෙමි. අනුත්තර සිත අනුත්තර සිතයයි දැනගන්නෙමි. සමාහිත සිත සමාහිත සිතයයි දැනගන්නෙමි. අසමාහිත සිත අසමාහිත සිතයයි දැනගන්නෙමි. අවිමුත්ත සිත අවිමුත්ත සිතයයි දැනගන්නෙමි විමුත්ත සිත විමුත්ත සිතයයි දැනගන්නෙමියි කැමැති වෙයි. නම් එහි කරුණු ඇතිසැටියෙන් හැකි බවට පැමිණෙයි.

21. "ඉදින් හෙතෙම නොයෙක් පෙරවිසූ ස්කන්ධයන් සිහි කරන්නෙමියි කැමති වෙයි නම් එනම් (මෙහි බ්‍රාහ්මණ වර්ගයේ (8) තිකණ්ණ සූත්‍රයේ 4, 5 ඡේද යෙදිය යුතුයි) මෙසේ නොයෙක්

පෙරවිසූ ස්කන්ධයන් සිහිකරන්නෙමියි කැමති වේ නම් එය කරුණු ඇතිසැටියෙන් කළ හැකි බවට පැමිණෙයි

22. (මෙහි බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි. "කෙසේද?" යන්න අත්හරින්න) කැමති වේනම් එය කරුණු ඇතිසැටියෙන් කළහැකි බවට පැමිණෙයි.

23. 'ඉදින් හෙතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියත් අර්හත්ඵල ප්‍රඥාවත් මේආත්මයෙහි තෙමේම විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නෙමැයි කැමති වෙයි නම් එය කරුණු ඇති සැටියෙන් කළහැකි බවට පැමිණෙන්නේය.

51. **අර්ධචිත්තානුයොග සූත්‍රයː-** 1 "මහණෙනි, සමථ විදර්ශනාවන්හි යෙදී වාසය කරන්නාවූ භික්ෂුව විසින් කලින් කල කරුණු තුනක් මෙනෙහි කළයුතුය කලින් කල සමාධිය පිළිබඳ කරුණු මෙනෙහි කළ යුතුය. කලින් කල වීර්‍ය්‍ය පිළිබඳ කරුණු මෙනෙහි කළ යුතුය. කලින් කල උපෙක්ෂාව පිළිබඳ කරුණු මෙනෙහි කළ යුතුය.

2. "මහණෙනි, සමථ විදර්ශනාවන්හි යෙදුනාවූ මහණ තෙමේ ඉදින් සමාධිය පිළිබඳ කරුණුම ඒකාන්තයෙන් මෙනෙහි කරන්නේ නම්, එය සිත කුසීත භාවයෙහි වැටීමට ඉඩ ඇත්තේය. මහණෙනි, ඉදින් සමථ විදර්ශනාවන්හි යෙදුනු භික්ෂුව ඉදින් වීර්‍ය්‍යය පිළිබඳ කරුණුම ඒකාන්තයෙන් මෙනෙහි කරන්නේ නම් සිත වික්ෂිප්ත භාවයෙහි වැටීමට ඉඩ ඇත්තේය. මහණෙනි, ඉදින් සමථ විදර්ශනාවන්හි යෙදුණු භික්ෂුව ඒකාන්තයෙන් උපෙක්ෂාව පිළිබඳ කරුණුම මෙනෙහි කරන්නේ නම් සිත ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස මනාව එකඟ නොවීමට හෙතු ඇත්තේය.

3. "මහණෙනි, යම්කලෙක සමථ විදර්ශනාවන්හි යෙදුණාවූ භික්ෂුව කලින් කල සමාධිය පිළිබඳ කරුණු මෙනෙහි කරයි නම් කලින් කල වීර්‍ය්‍ය පිළිබඳ කරුණු මෙනෙහි කරයි නම් කලින් කල උපෙක්ෂාව පිළිබඳ කරුණු මෙනෙහි කරයි නම් ඒ

සිත මෘදුද වෙයි, කර්මන්‍යද වෙයි, බබලන්නේද වෙයි, නොබිඳෙන්නේද වෙයි, ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස මනාව සමාධියට පැමිණෙයි.

4. "මහණෙනි, රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ අඟුරුකබලක් පිළියෙලකරන්නේය. අඟුරුකබලක් පිළියෙල කොට එහි අඟුරු දමා ගිනි දල්වා නළයෙන් පිඹ ගිනිගන්වන්නේය. ගිනිගන්වා අඬුවෙන් රත්රන්ගෙන අඟුරු මැද තබන්නේය. අඟුරු මැද තබා කලින් කල පිඹින්නේය. කලින්කල වතුර ඉසින්නේය. කලින් කල මධ්‍යස්ථ වන්නේය. මහණෙනි, ඉදින් රන්කරුවා හෝ රන්කරු අතවැසියා හෝ ඒකාන්තයෙන් ඉතා වැඩියෙන් පිඹින්නේ නම් ඒ රත්රන් දැවී යන්නට ඉඩ ඇත්තේය. මහණෙනි, ඉදින් ඒ රන්කරුවා හෝ රන්කරු අතවැසියා හෝ ඒකාන්තයෙන් වැඩියෙන් වතුර ඉසින්නේ නම් ඒ රත්රන් නිවීයන්නට ඉඩ ඇත්තේය. මහණෙනි ඉදින් රන්කරුවා හෝ රන්කරු අතවැසියා හෝ වැඩියෙන් මැදහත් වන්නේ නම් ඒ රත්රන් මනාව පැසීමට යන්නේය. මහණෙනි, යම්කලෙක රන්කරුවා හෝ රන්කරු අතවැසියා හෝ කලින් කල පිඹින්නේද කලින් කල වතුර ඉසින්නේද කලින් කල මැදහත් වන්නේද ඒ රත්රන් මෘදුද කර්මන්‍යද බබලන්නේද නොබිඳෙන්නේද වෙයි. යම් යම් පළඳනා විකෘති කැමති වෙයි නම්, ඉදින් රන්පටකින් ඉදින් කුණ්ඩලාභරණයකින්, ඉදින් ග්‍රීවාභරණයකින්, ඉදින් රන්මාලයකින් කැමති වේනම් ඒ ඒ දෙය සම්පූර්ණ වන්නේය.

5. "මහණෙනි, එසේම සමථ විදර්ශනා භාවනාවන්හි යෙදෙන්නාවූ භික්ෂුව විසින් කරුණු තුනක් මෙනෙහි කළ යුතුය කලින් කල සමාධි නිමිත්ත මෙනෙහි කළ යුතුය. කලින් කල පග්ගහ නිමිත්ත (වීර්‍ය්‍යය) මෙනෙහි කළ යුතුය. කලින් කල උපෙක්ඛා නිමිත්ත (මැදහත්වීම) මෙනෙහි කළ යුතුය.

6. "මහණෙනි, සමථ විදර්ශනා භාවනාවෙහි යෙදුනාවූ මහණතෙමේ ඒකාන්තයෙන් සමාධි නිමිත්තම මෙනෙහි

කරන්නේ නම් එය සිත කුසීත බව පිණිස පැවැත්මට හෙතු වන්නේය. මහණෙනි, ඉදින් සමථ විදර්ශනාවෙහි යෙදුණු මහණතෙමේ ඒකාන්තයෙන් පග්ගහ නිමිත්ත (වීර්‍ය්‍යය) මෙනෙහි කරන්නේ නම් එය සිත වික්ෂිප්තභාවය පිණිස පැවැත්මට හෙතු වන්නේය. මහණෙනි, ඉදින් සමථවිදර්ශනා භාවනාවෙහි යෙදුණ මහණතෙමේ උපෙක්ඛා නිමිත්ත මෙනෙහි කරන්නේ නම් එය සිත ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස මනාව සමාධියට නොපැමිණීමට හෙතුවන්නේය.

7. "මහණෙනි, යම්කලෙක සමථ විදර්ශනා භාවනාවෙන් යුත් මහණතෙමේ කලින්කල සමාධි නිමිත්ත මෙනෙහි කරයිද කලින් කල පග්ගහ නිමිත්ත මෙනෙහි කරයිද කලින් කල උපෙක්ඛා නිමිත්ත මෙනෙහි කරයිද ඒ සිත මෘදුද කර්මන්‍යද පිරිසිදුද නොබිඳෙන සුලුදු වෙයි. ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස සිත මනාකොට සමාධියට පැමිණෙයි.

8. "අභිඥාවෙන් දත යුතුවූ යම් යම් ධර්මයකට අභිඥාවෙන් දැනගැනීම පිණිස සිත නමයිද ඒ ඒ දෙයෙහි කරුණු ඇතිසැටියෙන් හැකි බවට පැමිණෙයි. ඉදින් හෙතෙම කැමති වන්නේ නම් නොයෙක් ඍද්ධිවිධි අනුභව කරන්නේය.

"ඉදින් ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියත් අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහි තෙමේම විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නෙම්යයි කැමතිවන්නේ නම් කරුණු ඇතිසැටියෙන් ඒ ඒ දෙයෙහි කළහැකි බවට පැමිණෙන්නේය"

**(දහවෙනි ලොණඵල වර්ගය නිමි)**

**(දෙවැනිවූ මහා පණ්ණාසකය නිමි.)**

## තතිය පණ්ණාසකය.

# 11. සම්බොධි වර්ගය.

1. පුබ්බෙ සම්බොධා සූත්‍රයː- 1. "මහණෙනි, චතුස්සත්‍ය අවබොධ කිරීමට පළමුවම බුදුනොවූ බොධිසත්වවූම මාහට මෙසේ අදහස්විය. ලෝකයෙහි ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද, නිස්සරණය කවරේද? කියායි.

2. "ඒ මට මෙසේ අදහස්විය. ලෝකයෙහි යමක් නිසා සැපක් සොම්නසක් උපදීද මේ ලොකයෙහි ආශ්වාදයයි.

"යමක් ලොකයෙහි අනිත්‍යද දුකද වෙනස්වන ස්වභාවය ඇත්තේද මේ ලොකයෙහි ආදීනවයයි.

"ලොකයෙහි යම් ඡන්ද රාගය දුරුකිරීමක් ඡන්ද රාගය පහකිරීමක් වේද මේ ලොකයෙහි නිශ්ශරණයයි.

"මහණෙනි, මම

3. යම්තාක් කල් මෙසේ ලොකයාගේ ආශ්වාදය ආශ්වාදය වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණය වශයෙනුත්

4. නොදන්නෙම්ද,

5. "මහණෙනි, ඒ තාක් කල් මම දෙවියන් සහිතවූ මරුන් සහිතවූ, බඹුන් සහිතවූ ලොකයෙහි මහණ බමුණන් සහිතවූ, දෙව් මිනිසුන් සහිතවූ සත්ව සමූහයා කෙරෙහිද මම උත්තරීතරවූ සම්‍යක් සම්බෝධිය අවබොධ කෙළෙමියි

6. "ප්‍රතිඥා නොකෙළෙමි.

7. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

8. අවබොධ කෙළෙම්ද මොනවට දැනගත්තෙම්ද

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

10. "ප්‍රතිඥා කෙළෙමි. මගේ අර්හත්ඵල සමාධිය වෙනස්කළ නොහැක. මේ මාගේ අන්තිම ජාතියයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"දැන් උත්පත්තියක් නැතැයි යන ප්‍රත්‍යවෙක්ෂා ඥානය පහළවිය.

11. "මහණෙනි, මම ලෝකයාගේ ආශ්වාදය සොයනු පිණිස හැසුරුණෙමි. ලොකයෙහි යමක් ආශ්වාදය නම් එය අවබොධ කෙළෙමි. ලොකයෙහි යම්තාක් ආශ්වාදය වේද එය මා විසින් ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලදී.

12. "මහණෙනි, මම ලොකයාගේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. යමක් ලොකයෙහි ආදීනව නම් එය අවබොධ කෙළෙමි. ලොකයෙහි යම්තාක් ආදීනව වේනම් එය මා විසින් මොනවට දක්නා ලදී.

13. "මහණෙනි, මම ලොකයාගේ නිස්සරණය සෙවීමෙහි හැසුරුණෙමි. ලොකයෙහි යමක් නිස්සරණය නම් එය අවබොධ කෙළෙමි. ලොකයෙහි යම්තාක් නිස්සරණය වේද එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී.

14. "මහණෙනි, යම්තාක් ලොකයෙහි ආශ්වාදය ආශ්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත්, නිස්සරණය නිස්සරණය වශයෙනුත් තත්වාකාරයෙන් දැනගත්තාහුද, "මහණෙනි, ලොකයෙහි ඉදින් ආශ්වාදයක් නැත්තේ නම් මේ සත්වයෝ ලොකයෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි ලොකයෙහි ආශ්වාදයක් ඇත්තේද එහෙයින් සත්වයෝ ලොකයෙහි ඇලෙත්. මහණෙනි, මේ ලොකයෙහි ඉදින් ආදීනවයක් නැත්තේ නම් මේ සත්වයෝ ලොකයෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් වනාහි ලොකයෙහි ආදිනවය ඇත්තේද, එහෙයින් සත්වයෝ ලොකයෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් ලොකයෙහි නිස්සරණයක් නැත්තේ නම් මේ සත්වයෝ ලොකයෙන් නොනික්මෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි ලොකයෙහි නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ලොකයෙන් නික්මෙත්. මහණෙනි, සත්වයෝ යම්තාක් කල් ආශ්වාදය ආශ්වාදය වශයෙනුත් ආදීනවය ආදීනවය වශයෙනුත්

නිස්සරණය නිස්සරණය වශයෙනුත් තත්වාකාරයෙන් නොදැන ගත්තාහුද මහණෙනි, ඒතාක් කල්

**15.** "දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ සත්වයෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ

**16.** "ප්‍රජාව කෙරෙන් නික්මී නොබැඳී මිදී සීමා කළ සිතින් වාසය නොකළාහුය.

"මහණෙනි, යම් කලෙක පටන් සත්වයෝ ලොකයාගේ ආශ්වාදය ආශ්වාදය වශයෙනුත්, ආදීනවය ආදීනවය වශයෙනුත්, නිස්සරණය නිස්සරණය වශයෙනුත් තත්වාකාරයෙන් දැනගත්තාහුද එකල්හි සත්වයෝ

"දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ ලොකයෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ

**17.** "ප්‍රජාව කෙරෙන් නික්මී නොයෙදී මිදී සීමා කරන ලද සිතින් වාසය කරත්.

**2. අස්සාද පරියෙසන සූත්‍රයः-** 1. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලොකයෙහි ආශ්වාදය ආශ්වාදය වශයෙනුත්, ආදීනවය ආදීනව වශයෙනුත්, නිස්සරණය නිස්සරණය වශයෙනුත්, තත්වාකාරයෙන් නොදනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණයයි සම්මත වූවාහු හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණයයි සම්මතවූවාහු හෝ නොවෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ අර්ථය හෝ බ්‍රාහ්මණ අර්ථය හෝ මේ ආත්මයෙහි තෙමේ විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකරත්.

**2.** "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලොකයෙහි ආශ්වාදය ආශ්වාදය වශයෙනුත්, ආදීනවය ආදීනවය වශයෙනුත්, නිස්සරණය නිස්සරණය වශයෙනුත්, තත්වාකාරයෙන් දැනගනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණයයි සම්මත වූවාහු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණයයි සම්මතවූවාහු වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථයද බ්‍රාහ්මණාර්ථයද මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නාහුයයි" වදාළේය

3. **රුණ්ණම්දං සූත්‍රය**:- 1. "මහණෙනි, යම් ගී කීමක් වේනම් ඒ ගී කීම ආයර්‍ය විනයෙහි හැඬීමකි. මහණෙනි, යම් නැටීමක් වෙයිනම් එය ආයර්‍ය විනයෙහි උමතුකමකි. මහණෙනි, ප්‍රමාණය ඉක්මවා දත් විදහා මහ හඬින් සිනාසීමක් වේද එය ආයර්‍ය විනයෙහි බාලයන්ගේ ක්‍රියාවකි.

2. "මහණෙනි, එහෙයින් ගී කීමෙහි හෙතුව නසව නැටීමෙහි හෙතුව නසව තොපට සතුටු විය යුතු යම්කිසි කරුණක් ඇතිවූ කල දත් අග දක්වා පමණින් සිනාසීම සුදුසුය.

4. **නත්ථිතිත්ති සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු තුනක් සෙවනය කිරීමෙහි තෘප්තියක් නැත. කවර තුනක්හුගේද යත්.

2. "මහණෙනි, නින්ද සෙවනය කිරීමෙහි තෘප්තියක් නැත. මහණෙනි, සුරාපානය සෙවනය කිරීමෙහි තෘප්තියක් නැත. මහණෙනි, මෛථුන ධර්මය සෙවනය කිරීමෙහි තෘප්තියක් නැත. මහණෙනි, මේ කරුණු තුන සෙවනය කිරීමෙහි තෘප්තියක් නැත."

5. **චිත්තරක්ඛණ සූත්‍රය**:- 1. "එකල්හි අනේපිඬු ගෘහපති තෙමේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේ වැඳ එක්පසෙක හිඳගත්තේය. එක්පසෙක හිඳගත් අනේපිඬු ගෘහපති හට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළේය.

2. "ගෘහපතිය, සිත නොරැකි කල්හි කායකර්මයද නොරක්නා ලද්දේය, වාක්කර්මයද නොරක්නා ලද්දේය, මනො කර්මයද නොරක්නා ලද්දේය.

3. "නොරක්නා ලද කාය කර්මය ඇති නොරක්නා ලද වාක් කර්මය ඇති නොරක්නා ලද මනො කර්මය ඇති ඔහුගේ

කාය කර්මයද කෙලෙසුන්ගෙන් තෙත්වූයේ වෙයි. වාක් කර්මයද කෙලෙසුන්ගෙන් තෙත්වූයේ වෙයි. මනො කර්මයද කෙලෙසුන්ගෙන් තෙත්වූයේ වෙයි. ඒ තෙත්වූ කායකර්ම ඇති තෙත්වූ වාක්කර්මය ඇති තෙත්වූ මනොකර්මය ඇති කාය කර්මද කුණුවූයේ වෙයි. වාක් කර්මද කුණු වූයේ වෙයි. මනො කර්මද කුණුවූයේ වෙයි. කුණුවූ කායකර්ම ඇති කුණුවූ වාක්කර්ම ඇති කුණුවූ මනොකර්ම ඇති ඔහුගේ මරණය යහපත් නොවේ. යහපත් කාලක්‍රියාවක් නොවේ.

4. 'ගෘහපතිය, කුළුගෙය මනාව සෙවිලි නොකළ කල්හි මුදුනද නොරැකුණේ වෙයි. පරාලද නොරැකුණාහු වෙති. භිත්තිද නොරැකුණාහු වෙති. මුදුනද තෙත්වූයේ වෙයි. පරාලද තෙත්වූවාහු වෙත්. භිත්තිද තෙත්වූවාහු වෙත් මුදුනද කුණුවූයේ වෙයි. පරාලද කුණුවූවාහු වෙත්. භිත්තිද කුණුවූවාහු වෙත්.

5. "ගෘහපතිය, එසේම සිත නොරැකී කල්හි කාය කර්මද නොරැකුණේ වෙයි. වාක් කර්මද නොරැකුණේ වෙයි. මනොකර්මද නොරැකුණේ වෙයි. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යොදාගත යුතුයි.)

6. "ගෘහපතිය, සිත රැකි කල්හි කායකර්මද රැකුණේ වෙයි. වාක් කර්මද රැකුණේ වෙයි. මනොකර්මද රැකුණේ වෙයි. රැකුණ කායකර්ම ඇති රැකුණ වාක්කර්ම ඇති රැකුණ මනොකර්ම ඇති ඔහුගේ කායකර්මද තෙත් නොවූයේ වෙයි. වාක්කර්මද තෙත් නොවූයේ වෙයි. මනො කර්මද තෙත් නොවූයේ වෙයි. තෙත්නොවූ කායකර්ම ඇති, තෙත් නොවූ වාක්කර්ම ඇති තෙත් නොවූ මනොකර්ම ඇති ඔහුගේ කායකර්මද කුණු නොවූයේ වෙයි. වාක්කර්මද කුණු නොවූයේ වෙයි. මනොකර්මද කුණු නොවූයේ වෙයි. කුණු නොවූ කායකර්ම ඇති, කුණු නොවූ වාක්කර්ම ඇති, කුණු නොවූ මනොකර්ම ඇති ඔහුගේ මරණය යහපත් වෙයි. කාලක්‍රියාව යහපත් වෙයි.

7. "ගෘහපතිය, කුළුගෙය මනාව සෙවිලිකළ කල්හි මුදුණ ද රැකුණේ වෙයි. පරාලද රැකුණේ වෙයි. භිත්තිද රැකුණේ

වෙයි. මුදුනද තෙත් නොවූයේ වෙයි පරාලද තෙත් නොවූයේ වෙයි. භිත්තිද තෙත් නොවූයේ වෙයි. මුදුණද කුණු නොවූයේ වෙයි පරාලද කුණු නොවූයේ වෙයි. භිත්තිද කුණු නොවූයේ වෙයි.

8. ගෘහපතිය එසේම (මෙතැනට මේ සූත්‍රයේ 6 ඡේදය යොදාගත යුතුයි.)

**6. චිත්ත ව්‍යාපාද සූත්‍රයඃ-** 1. එක්පසෙක හුන් අනාථ පිණ්ඩික ගෘහපතිහට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළේය.

2. "ගෘහපතිය, සිත දූෂ්‍යවූ කල්හි කායකර්මද දූෂ්‍ය වූයේ වෙයි. වාක්කර්මද දූෂ්‍යවූයේ වෙයි මනොකර්මද දූෂ්‍යවූයේ වෙයි. දූෂ්‍යවූ කායකර්ම ඇති, දූෂ්‍යවූ වාක්කර්ම ඇති, දූෂ්‍යවූ මනොකර්ම ඇති, ඔහුගේ මරණය යහපත් නොවේ. කාලක්‍රියාව යහපත් නොවේ.

3. "ගෘහපතිය, කූළුගෙය මනාව සෙවිලි නොකළ කල්හි මුදුනද දූෂ්‍යවෙයි. පරාලද දූෂ්‍යවෙත් භිත්තිද දූෂ්‍ය වෙත්.

4. (එසේම මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යොදාගත යුතුයි.)

5. "ගෘහපතිය, සිත දූෂ්‍ය නොවූ කල්හි කායකර්මද දූෂ්‍ය නොවේ. වාක්කර්මද දූෂ්‍ය නොවේ මනොකර්මද දූෂ්‍යනොවේ. දූෂ්‍ය නොවූ කායකර්ම ඇති, දූෂ්‍ය නොවූ වාක්කර්ම ඇති දූෂ්‍යනොවූ මනොකර්ම ඇති ඔහුගේ මරණය යහපත් වෙයි. කාලක්‍රියාව යහපත් වෙයි.

6. "ගෘහපතිය, කූළුගෙය මනාව සෙවිලි කළ කල්හි මුදුනද දූෂ්‍යනොවෙයි, පරාලද දූෂ්‍ය නොවෙත්. භිත්තිද දූෂ්‍යනොවෙත්.

7. එසේම (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යොදාගත යුතුයි)

**7. පඨම කම්මනිදාන සූත්‍රයඃ-** 1. "මහණෙනි, කර්මයන්ගේ රැස්වීමට හෙතු තුනක් වෙත්. කවර තුනක්ද? ලොභය කර්මයන්ගේ රැස්වීමට හෙතුවකි. ද්වේෂය කර්මයන්ගේ රැස්වීමට හෙතුවකි. මොහය කර්මයන්ගේ රැස්වීමට හෙතුවකි.

2. "මහණෙනි, ලොභයෙන් කරනලද ලොභයෙන් උපන් ලොභය නිදානකොට ඇති, ලොභය සමුදයකොට ඇති යම් කර්මයක් වෙයිද ඒ කර්මය අකුසලකි. ඒ කර්මය වරදකි. ඒ කර්මය දුක් විපාක ඇත්තකි. ඒ කර්මය තවත් කර්මයන්ගේ රැස්කිරීම පිණිස පවතියි. ඒ කර්මය කර්ම නැතිකිරීම පිණිස නොපවතියි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදයේ 'ලොභය' වෙනුවට 'ද්වේෂය' කියා යෙදීමෙන් සාදාගත යුතුයි.)

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදයේ 'ලොභය' වෙනුවට 'මොහය' කියා සාදාගත යුතුයි.)

8. **දුතිය කම්මනිදාන සූත්‍රය:-** 1. මහණෙනි, කර්මයන්ගේ රැස්වීම පිණිස හෙතු තුනකි. කවර තුනක්ද? අලොභය කර්මයන්ගේ රැස්වීම පිණිස හෙතුවකි. අද්වෙෂය කර්මයන්ගේ රැස්වීම පිණිස හෙතුවකි. අමොහය කර්මයන්ගේ රැස්වීම පිණිස හෙතුවකි.

2. "මහණෙනි, අලොභයෙන් කරනලද අලොභයෙන් උපන් අලොභය නිදාන කොට ඇති අලොභය සමුදය කොට ඇති යම් කර්මයක් වෙයිද ඒ කර්මය කුසලකි. ඒ කර්මය නිවරදකි. ඒ කර්මය සැපවිපාක ඇත්තකි. ඒ කර්මය කර්ම නැතිකිරීම පිණිස පවතී. කර්ම රැස්කිරීම පිණිස නොපවතී.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදයේ 'ලොභය' වෙනුවට 'ද්වේෂය' කියා සාදාගත යුතුයි.)

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදයේ 'ලොභය' වෙනුවට 'මොහය' කියා යෙදීමෙන් සාදාගත යුතුයි.)

9. **තතිය කම්මනිදාන සූත්‍රය:-** 1. "මහණෙනි, කර්ම රැස් කිරීම පිණිස මේ හෙතු තුනකි. කවර තුනක්ද? මහණෙනි, ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ අතීත කරුණු පිළිබඳව ඡන්දරාගය උපදියි. ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ අනාගත කරුණු පිළිබඳව ඡන්දරාගය උපදියි. ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ වර්තමාන කරුණු පිළිබඳව ඡන්දරාගය උපදියි.

**2.** "මහණෙනි, කෙසේ නම් ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ අතීත කරුණු පිළිබඳව ඡන්ද රාගය උපදියිද? මහණෙනි, ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ අතීත කරුණු අරබයා සිතින් ඒ අනුව කල්පනා කරයි. ඒ අනුව සිත හසුරුවයි. ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ ඒ අතීත කරුණු අරබයා සිතින් ඒ අනුව කල්පනා කරන්නාවූ ඒ අනුව සිත හසුරු වන්නාවූ ඔහුට ඡන්දය (ආශාව) උපදියි. උපන්නේ ඒ ධර්මයන් සමග බැඳුණේ වෙයි. මහණෙනි, චිත්තයාගේ යම් ඇලීමක් වෙයිද එය මම සංයෝජන (රැහැණ) යයි කියමි. මහණෙනි, මෙසේ වනාහි ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ අතීත කරුණු පිළිබඳව ඡන්දය ඇතිවෙයි.

**3.** "මහණෙනි, කෙසේනම් ඡන්දරාගය ඇතිවීමට හෙතුවූ අනාගත කරුණු පිළිබඳව ඡන්දරාගය උපදියිද? මහණෙනි, ඒ ඡන්දරාගය ඇතිවීමට හෙතුවූ අනාගත කරුණු අරබයා සිතින් ඒ අනුව කල්පනා කරයි. ඒ අනුව සිත හසුරුවයි. ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ අනාගත කරුණු අරබයා ඒ අනුව සිතින් කල්පනා කරන්නාවූ ඒ අනුව සිත හසුරුවන්නාවූ ඔහුට ඡන්දය උපදියි. ඡන්දය උපන්නේ ඒ ධර්මයන් හා බැඳුණේ වෙයි. චිත්තයාගේ යම් ඇලීමක් වෙයිද එය මම සංයොජනයයි කියමි. මහණෙනි, මෙසේ වනාහි ඡන්දරාගය ඇතිවීමට හෙතුවූ අනාගත කර්මයන් කෙරෙහි ඡන්දය උපදියි.

**4.** "මහණෙනි, කෙසේ නම් ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ වර්තමාන ධර්මයන් අරබයා ඡන්ද රාගය උපදියිද? මහණෙනි, ඡන්දරාගය ඇතිවීමට හෙතුවූ වර්තමාන ධර්මයන් අරබයා සිතින් ඒ අනුව කල්පනා කරයිද ඒ අනුව සිත හසුරුවයිද ඡන්දරාගය ඇතිවීමට හෙතුවූ වර්තමාන ධර්මයන් අරබයා සිතින් ඒ අනුව කල්පනා කරන්නාවූ ඒ අනුව සිත හසුරුවන්නාවූ ඔහුට ඡන්දය උපදියි.

**5.** "ඡන්දය උපන්නේ ඒ ධර්මයන් හා බැඳුණේ වෙයි. චිත්තයාගේ යම් ඇලීමක් වෙයිද මහණෙනි, මම එය සංයෝජනයයි කියමි. මහණෙනි, මෙසේ වනාහි ඡන්දය රාගය

ඇති වීමට හෙතුවූ වර්තමාන ධර්මයන් අරබයා ඡන්දය උපදියි. මහණෙනි, මේ තුන කර්මයන්ගේ රැස්වීමට හෙතු වෙත්."

**10. චතුත්ථ කම්ම නිදාන සූත්‍රයː- 1.** "මහණෙනි කර්ම රැස් කිරීම පිණිස මේ හේතු තුනකි. කවර තුනක්ද? මහණෙනි, ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ අතීත කරුණු පිළිබඳව ඡන්ද රාගය නූපදියි. ඡන්ද රාගය ඇතිවීමට හේතුවූ අනාගත කරුණු පිළිබඳව ඡන්දරාගය නූපදියි. ඡන්ද රාගය ඇතිවීමට හෙතුවූ වර්තමාන පිළිබඳව ඡන්දය රාගය නූපදී.

2. "මහණෙනි, කෙසේ නම් ඡන්දරාගය ඇතිවීමට හෙතුවූ අතීත කරුණු පිළිබඳව ඡන්ද රාගය නූපදීද,

"මහණෙනි, ඡන්දරාගය ඇතිවීමට හෙතුවූ අතීත කරුණු පිළිබඳව මත්තෙහි විපාකය දනී, මත්තෙහි විපාකය දැන එය බැහැර කරයි. බැහැරකොට සිතින් අත්හැර මාර්ගඥානයෙන් විනිවිද දකී.

"මහණෙනි, මෙසේ වනාහි ඡන්දරාගය ඇතිවීමට හෙතුවූ අතීත කරුණු නිසා ඡන්ද රාගය නූපදී.

"මහණෙනි, කෙසේ වනාහි ඡන්දරාගය ඉපදීමට හෙතුවූ අනාගත කරුණු පිළිබඳව ඡන්දරාගය නූපදීද,

"මහණෙනි, ඡන්දරාගය ඉපදීමට හෙතුවූ අනාගත කරුණු පිළිබඳව මත්තෙහි විපාකය දනී. මත්තෙහි විපාකය දැන එය බැහැර කරයි. බැහැරකොට සිතින් අත්හැර මාර්ගඥානයෙන් විනිවිද දකී. මහණෙනි, මෙසේ වනාහි ඡන්දරාගය ඉපදීමට හෙතුවූ අනාගත කරුණු පිළිබඳව ඡන්දරාගය නූපදී.

"මහණෙනි, කෙසේ නම් ඡන්දරාගය ඉපදීමට හෙතුවූ වර්තමාන කරුණු පිළිබඳව ඡන්දරාගය නූපදීද, මහණෙනි, ඡන්දරාගය ඉපදීමට හෙතුවූ වර්තමාන කරුණු පිළිබඳව මත්තෙහි විපාකය දනී. මත්තෙහි විපාකය දැන එය බැහැර කරයි. බැහැරකොට සිතින් අත්හැර මාර්ග ඥානයෙන් විනිවිද දකී.

"මහණෙනි, මෙසේ වනාහි ඡන්දරාගය ඉපදීමට හෙතුවූ වර්තමාන කරුණු පිළිබඳව ඡන්දරාගය නූපදී.

"මහණෙනි, කර්ම රැස්කිරීම පිණිස මේ තුන හෙතුවේයයි" වදාළසේක.

(එකොළොස්වෙනි සම්බොධි වර්ගය නිමි.)

---

## 12. ආපායික වර්ගය.

**11. ආපායික සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ධර්මතුනක් අත්නොහැර අපායෙහි උපදින්නාවූ නිරයෙහි උපදින්නාවූ මේ සත්වයෝ තුන්දෙනෙක් වෙත්.

2. "කවර තුන්දෙනෙක්ද? බ්‍රහ්මචාරී බව ප්‍රතිඥා කරන්නාවූ යම් අබ්‍රහ්මචාරී පුද්ගලයෙක් වේද, යමෙක් පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නහුට අමූලික අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් අපහාස කරයිද, යමෙක් කාමයෙහි දෝෂයක් නැතැයි මෙසේ කියනසුලු මෙසේ දෘෂ්ටි ඇත්තෙක්ව කාමයන්හි සේවනය කළයුතු බවට පැමිණෙයිද, මහණෙනි, මේ කරුණු තුන දුරු නොකොට අපායෙහි උපදින්නාවූ නිරයෙහි උපදින්නාවූ මොහු තුන්දෙනෙක් වෙත්."

**12. දුල්ලභ පාතුභාව සූත්‍රයඃ-** 1. "මහණෙනි, ලොකයෙහි තිදෙනෙකුන්ගේ පහලවීම දුර්ලභ වන්නේය. කවර තිදෙනෙකුන්ගේද යත්?

2. "මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන්ගේ පහළවීම ලොකයෙහි දුර්ලභය. තථාගතයන් විසින් අවබොධ කරනලද ධර්ම විනය දෙශනාකරන පුද්ගල තෙමේ ලොකයෙහි දුර්ලභය. කළගුණ දන්නාවූ කළගුණ සලකන්නාවූ පුද්ගල තෙමේ ලොකයෙහි දුර්ලභය. මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයන් තිදෙනාගේ පහළවීම දුර්ලභය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

13. අප්පමෙය්‍ය සූත්‍රයː- 1. "මහණෙනි, ලොකයෙහි පුද්ගලයෝ තුන්දෙනෙක් විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක්ද යත්?

2. "පහසුවෙන් මැනිය හැකි පුද්ගලයාද, මැනීමට දුෂ්කර පුද්ගලයාද, නොමැනිය හැකි පුද්ගලයාද වෙත්.

3. "මහණෙනි, පහසුවෙන් මැනිය හැකි පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වික්ෂිප්තවූයේ උඩඟුවූයේ චපලවූයේ මුඛරවූයේ අසංවර වචන ඇත්තේ තැන්පත් සිතක් නැත්තේ, කලබලවූ සිත් ඇත්තේ නොවැසූ ඉන්ද්‍රියයන් ඇත්තේ වෙයිද, මහණෙනි, මෙතෙම වනාහි පහසුවෙන් මැනියහැකි පුද්ගලයායයි කියනු ලැබේ.

4. "මහණෙනි, මැනීමට දුෂ්කර පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වික්ෂිප්ත නොවූයේ උඩඟු නොවූයේ චපල නොවූයේ මුඛර නොවූයේ සංවර වචන ඇත්තේ, තැන්පත් සිත් ඇත්තේ, කලබල නොවූ සිත් ඇත්තේ, වැසූ ඉන්ද්‍රියයන් ඇත්තේ වෙයිද, මෙතෙම වනාහි මැනීමට දුෂ්කර පුද්ගලයායයි කියනු ලැබේ.

5. "මහණෙනි, නොමැනියහැකි පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආශ්‍රවයන් ක්ෂයකළ අර්හත් පුද්ගලයෙක් වෙයිද මහණෙනි, මෙතෙම මැනිය නොහැකි පුද්ගලයායයි කියනු ලැබේ. මහණෙනි, මේ පුද්ගලයෝ තිදෙන ලොකයෙහි විද්‍යමාන වෙත්."

14. අරිය පුථුජ්ජන සූත්‍රයː- 1 "මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයෝ තුන්දෙනෙක් වෙත්. කවර තිදෙනෙක්ද?

2. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සියලු ආකාරයෙන් රූප සංඥා ඉක්මවා ද්වාරාරම්මණ වශයෙන් ගැටීම් ස්වභාවය ඇති රූප සංඥා දුරුකොට නානත්ත සංඥා නොමෙනෙහි කිරීමෙන් ආකාසය අනන්තයයි මෙනෙහි කොට ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම

ඒ ධ්‍යානය ආශ්වාදය කරයි ඊට කැමති වෙයි. එයින් සතුටට පැමිණෙයි. එහි සිට ඒ අදහසින් යුක්තව එය බහුල කොට වාසය කිරීමෙන් ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කරනුයේ ආකාසානඤ්චායතන දෙවියන් හා එක්වීමට පැමිණෙයි. මහණෙනි, ආකාසානඤ්චායතන දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණය මහාකල්ප විසිදහසක් වෙයි. පෘථග්ජන තෙම එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණය යම් තාක්ද ඒ සියල්ල ගෙවා නිරයටද පැමිණෙයි. තිරිසන් අපායටද පැමිණෙයි. ප්‍රෙතවිෂයටද පැමිණෙයි.

"භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක තෙමේ වනාහි එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුෂ යම්තාක්ද ඒ සියල්ල ගෙවා එම භවයෙහිම පිරිනිවෙන්නේය. මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ හා අශ්‍රැතවත් පෘථග්ජනයාගේ ගතියෙහි උත්පත්තියෙහි මේ විශෙෂය වෙයි, මේ අභිප්‍රාය වෙයි. මේ නානත්වය වෙයි.

3. "මහණෙනි, තවද මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සියලු ආකාරයෙන් ආකාශානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි මෙනෙහිකොට විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම එය ආශ්වාදය කරයි. ඊට කැමති වෙයි, එයින් සතුටට පැමිණෙයි. එහි සිට එහි නැමුණු අදහස් ඇතිව එය බහුල කිරීමෙන් විඤ්ඤාණඤ්චායතන දෙවියන් හා එක්වීමට පැමිණෙයි. මහණෙනි, විඤ්ඤාණඤ්චායතන දෙවියන්ගේ ආයුෂප්‍රමාණය මහාකල්ප සතලිස් දහසක් වෙයි. එහි පෘථග්ජන තෙම ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුෂප්‍රමාණය යම්තාක්ද ඒ සියල්ල ගෙවා නිරයටද පැමිණෙයි. තිරිසන් යොනියටද පැමිණෙයි. ප්‍රෙත විෂයටද පැමිණෙයි. භාග්‍යවතුන්ගේ ශ්‍රාවකතෙම එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුෂප්‍රමාණය යම්තාක්ද ඒ සියල්ල ගෙවා ඒ භවයෙහිම පිරිනිවෙන්නේය. මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ හා අශ්‍රැතවත් පෘථග්ජනයාගේ ගතියෙහි උත්පත්තියෙහි මේ වෙනසයි මේ අභිප්‍රායයි මේ නානත්වයයි.

4. "මහණෙනි, තවද මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි මෙනෙහිකොට ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. හෙතෙම එය ආශ්වාදය කරයි, ඊට කැමති වෙයි. එයින් සතුටට පැමිණෙයි. එහි සිට එහි නැමුණු අදහස් ඇතිව එය බහුල කිරීමෙන් ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියාකොට ආකිඤ්චඤ්ඤායතන දෙවියන් හා එක්වීමට පැමිණෙයි මහණෙනි, ආකිඤ්චඤ්ඤායතන දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණය මහාකල්ප සැටදහසකි. එහි පෘථග්ජනතෙම ආයු ඇතිතාක් කල් සිට ඒ දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණය යම්තාක්ද ඒ සියල්ල ගෙවා නිරයටද පැමිණෙයි, තිරිසන් යොනියටද පැමිණෙයි. ප්‍රෙතවිෂයටද පැමිණෙයි. භාග්‍යවතුන්ගේ ශ්‍රාවකතෙම වනාහි එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුෂප්‍රමාණය යම්තාක්ද ඒ සියල්ල ගෙවා ඒ භවයෙහිම පිරිනිවෙන්නේය.

5. "මහණෙනි, ශ්‍රැතවත් ආය්‍ය්‍ශ්‍රාවකයාගේත් අශ්‍රැතවත් පෘථග්ජනයාගේත් ගතියෙහි හා උත්පත්තියෙහි මේ වෙනස මේ අභිප්‍රාය මේ නානත්වය වන්නේය."

15. **සීලවිපත්තිය සූත්‍රය**:- 1. "මහණෙනි, මේ විපත්ති තුනෙකි. කවර තුනක්ද යත්? සීල විපත්තිය චිත්ත විපත්තිය දිට්ඨි විපත්තිය යන මොහුය. මහණෙනි, සීල විපත්තිය නම් කවරීද?

2. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සතුන් මරන්නේ වෙයිද, සොරකම් කරන්නේ වෙයිද, කාමයෙහි වරදවා හැසිරෙන්නේ වෙයිද, බොරු කියන්නේ වෙයිද, කේලාම් කියන්නේ වෙයිද, ඵරුසවචන කියන්නේ වෙයිද, ප්‍රලාප කියන්නේ වෙයිද,

3. "මහණෙනි, මෙය සීල විපත්තියයි කියනු ලැබේ.

"මහණෙනි, චිත්ත විපත්තිය කවරීද?

"මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අභිද්‍යාව බහුලකොට ඇත්තේ ව්‍යාපාද සිත් ඇත්තේ වෙයිද, මහණෙනි, මෙය චිත්ත විපත්තියයි කියනු ලැබේ.

"මහණෙනි, දිට්ඨි විපත්තිය කවරීද?

4. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වෙයිද, විපරීත දැකුම් ඇත්තේ වෙයිද, දීමෙහි පලක් නැත, මහාදානයෙහි පලක් නැත, පිදීමෙහි පලක් නැත, කරනලද හොඳ නරක කර්මයන්ගේ පලවිපාක නැත, මෙලොවක් නැත, පරලොවක් නැත, මවුට හොඳ හෝ නරක කිරීමෙහි විපාක නැත. පියාට හොඳ හෝ නරක කිරීමෙහි විපාක නැත, මැරී නැවත උපදින්නාවූ සත්වයෝ නැත ලොකයෙහි යහපත්මග ගියාවූ මනාව පිළිපදින්නාවූ මෙලොවත් පරලොවත් තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට යම් මහණ බමුණු කෙනෙක් ප්‍රකාශ කෙරෙද්ද, එවැනි මහණ බමුණෝ ලොකයෙහි නැත, යන දෘෂ්ටි ඇත්තේ වෙයිද, මහණෙනි, මේ දිට්ඨි විපත්තියයි කියනු ලැබේ.

5. "මහණෙනි, සීලවිපත්තිය හෙතුකොට ගෙන හෝ සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහවූ නපුරුගති ඇති විනාශයට පැමිණෙත්. නිරයෙහි උපදිත්. මහණෙනි, චිත්ත විපත්තිය හේතුකොට ගෙන හෝ සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විනාශයට පැමිණෙත්. නිරයෙහි උපදිත්. මහණෙනි, දිට්ඨි විපත්තිය හේතුකොට ගෙන හෝ සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විනාශයට පැමිණෙත්. නිරයෙහි උපදිත්. මහණෙනි, මේ වනාහි විපත්ති තුන වෙත්.

16. **සීල සම්පත්ති සූත්‍රයඃ-** 1. "මහණෙනි, සම්පත් තුනකි. කවර තුනක්ද? සීල සම්පත්තිය චිත්ත සම්පත්තිය දිට්ඨි සම්පත්තිය යන මොහුයි. මහණෙනි, සීල සම්පත්තිය නම් කවරේද?

2. "මහණෙනි මේ ලොකයෙහි ඇතැමෙක් සතුන් මැරීමෙන් වැළකුණේ වේද, සොරකම් කිරීමෙන් වැළකුණේ වේද, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණේ වේද, බොරුකීමෙන් වැළකුණේ

වේද, කේලාම් කීමෙන් වැළකුණේ වේද, ඵරුෂවචන කීමෙන් වැළකුණේ වේද, ප්‍රලාප කීමෙන් වැළකුණේ වේද.

3. "මහණෙනි, මේ වනාහි සීල සම්පත්තියයි කියනු ලැබේ. මහණෙනි, චිත්තසම්පත්තිය නම් කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් අභිද්‍යාව බහුල කොට නැත්තේ වේද ව්‍යාපාද සිත් නැත්තේ වේද මහණෙනි, මේ චිත්ත සම්පත්තියයි කියනු ලැබේ. මහණෙනි, දිට්ඨි සම්පත්තිය නම් කවරේද?

4. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුන් දෙයෙහි විපාක ඇත, මහා දානයෙහි විපාක ඇත, පිදීමෙහි විපාක ඇත, කරණලද හොඳ නරක කර්මයන්ගේ විපාක ඇත, මෙලොවක් ඇත, පරලොවක් ඇත, මවුට හොඳ හෝ නරක කිරීමෙහි විපාක ඇත, පියාට හොඳ හෝ නරක කිරීමෙහි විපාක ඇත මැරී නැවත උපදින්නාවූ සත්වයෝ ඇත. යම් කෙනෙක් මෙලොවද පරලොවද තෙමේ විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරද්ද යහපත් මාර්ගයෙහි ගමන්කළාවූ මනාව පිළිපන්නාවූ එවැනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ලොකයෙහි ඇතැයි ගත් සම්‍යක්දෘෂ්ටි ඇත්තෝ වෙයිද, විපරීත නොවූ දෘෂ්ටි ඇත්තේ වෙයිද, මහණෙනි, මෙය දිට්ඨි සම්පත්තියයි කියනු ලැබේ.

5. "මහණෙනි, සීල සම්පත්තිය හෙතුකොට ගෙනද සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු යහපත් පැමිණීම් ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි උපදිත්. මහණෙනි, චිත්ත සම්පත්තිය හෙතුකොට ගෙනද සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි උපදිත්. මහණෙනි, දිට්ඨි සම්පත්තිය හෙතුකොට ගෙනද සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි උපදිත්

6. "මහණෙනි, මේ වනාහි සම්පත් තුන වෙත්.

**17. දුතිය සීල විපත්ති සූත්‍රයː-** 1-4 මේ ඡෙද මේ වර්ගයේ 5 සූත්‍රයේ 1-4 ඡෙද මෙන් වෙත්.)

5. "මහණෙනි, යම්සේ උඩට විසිකරන ලද සය පැත්තක් ඇති දාදු කැටය යම් යම් පැත්තකින් වැටෙයිද ඒ ඒ පැත්තෙන් පොළොවෙහි මනාව පිහිටයිද, එපරිද්දෙන්ම, (මෙහි මේ වර්ගයේ 5 සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි)

18. **දුතිය සීලසම්පත්ති සූත්‍රයඃ-** 1-4 (මේ ඡෙද මේ වර්ගයේ 6 සූත්‍රයේ 1-4 ඡෙදමෙන් වෙත්.)

5. (මේ ඡෙදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 5 ඡෙදය මෙනි.)

6. "මහණෙනි, යම්සේ උඩ වීසිකරන ලද සය පැත්තක් ඇති දාදුකැටය යම් පැත්තකින් බිම වැටෙයිද ඒ ඒ පැත්තෙන් පොළොවෙහි මනාව පිහිටයිද එපරිද්දෙන්ම (මෙහි මේ වර්ගයේ 6 සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.)

19. **තතිය සීලවිපත්ති සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ විපත්ති තුනෙකි. කවර තුනක්ද? කර්මාන්ත විපත්තියද ආජීව විපත්තියද දෘෂ්ටි විපත්තියද වෙත්. මහණෙනි, කර්මාන්ත විපත්තිය නම් කවරේද?

2. (මේ ඡෙදය මේ වර්ගයේ 5 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.) මහණෙනි, මේ කර්මාන්ත විපත්තියයි කියනු ලැබේ,

3. "මහණෙනි, ආජීව විපත්තිය නම් කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් මිථ්‍යාජීවය ඇත්තේ වෙයිද මිථ්‍යා ජීවිකාවෙන් ජීවිකාව කරයිද මහණෙනි, මේ ආජීව විපත්තියයි කියනුලැබේ

4. (මේ ඡෙදය මේ වර්ගයේ 5 සූත්‍රයේ 4 ඡෙදය මෙනි.) මහණෙනි, මෙය දිට්ඨි විපත්තියයි කියනු ලැබේ. මහණෙනි, මේ වනාහි තුන් විපත්තීහු වෙති

5. "මහණෙනි, මේ සම්පත්ති තුනෙකි. කවර තුනෙක්ද? කර්මාන්ත සම්පත්තියද ආජීව සම්පත්තියද දෘෂ්ටි සම්පත්තියද වෙත්. මහණෙනි, කර්මාන්ත සම්පත්තිය කවරේද?

6. (මේ ඡෙදය මේ වර්ගයේ 7-6 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.) මහණෙනි, මේ කර්මාන්ත සම්පත්තියයි කියනු ලැයෙි.

7. "මහණෙනි, ආජීව සම්පත්තිය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් යහපත් ආජීවය ඇත්තේ වෙයිද යහපත් ආජීවයෙන් ජීවිකාව කරන්නේ වෙයිද මහණෙනි, මේ ආජීව සම්පත්තියයි. කියනු ලැබේ.

8. (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 4 ඡේදය මෙනි)

**20. මොනෙය්‍ය සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ පිරිසිදු බැව් තුනක් වෙත්. කවර තුනක්ද? කයේ පිරිසිදු බවද වචනයේ පිරිසිදු බවද සිතේ පිරිසිදු බවද වෙත්. මහණෙනි, කයේ පිරිසිදු බව නම් කුමක්ද?

2. 'මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සතුන් මැරීමෙන් වැළකුණේ වෙයිද සොරකම් කිරීමෙන් වැළකුණේ වෙයිද කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණේ වෙයිද මහණෙනි, මේ කයේ පිරිසිදු බවයයි කියනු ලැබේ.

3. "මහණෙනි, වචනයේ පිරිසිදු බව නම් කුමක්ද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් බොරු කීමෙන් වැළකුණේ වෙයිද කේලාම් කීමෙන් වැළකුණේ වෙයිද ඵරුෂ වචන කීමෙන් වැළකුණේ වෙයිද ප්‍රලාප කීමෙන් වැළකුණේ වෙයිද මහණෙනි, මේ වචනයේ පිරිසිදු බවයයි කියනු ලැබේ.

4. "මහණෙනි, සිතේ පිරිසිදු බව නම් කුමක්ද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් අභිද්‍යාව බහුලකොට නැත්තෙක් වේද, ව්‍යාපාද සිත් නැත්තෙක් වේද, මිත්‍යා දෘෂ්ටි නැත්තෙක් වෙයිද මහණෙනි, මේ සිතේ පිරිසිදු බව යයි කියනුලැබේ මහණෙනි, මේ පිරිසිදු බැව් තුන වෙති.

5. "මහණෙනි, මේ පිරිසිදු බැව් තුනකි. කවර තුනක්ද? කයේ පිරිසිදු බවද වචනයේ පිරිසිදු බවද සිතේ පිරිසිදු බවද වෙත්. මහණෙනි, කයේ පිරිසිදු බව නම් කුමක්ද?

6. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සතුන් මැරීමෙන් වැළකුණේ වෙයිද සොරකම් කිරීමෙන් වැළකුණේ වේද, අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් වැළකුණේ වෙයිද, මහණෙනි, මේ කයේ පිරිසිදු බවයයි කියනු ලැබේ

7. "මහණෙනි, වචනයේ පිරිසිදු බව නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම බොරු කීමෙන් වැළකුණේ වෙයිද, කේලාම් කීමෙන් වැළකුණේ වේද, ඵරුෂ වචන කීමෙන් වැළකුණේ වෙයිද, ප්‍රලාප කීමෙන් වැළකුණේ වෙයිද, මහණෙනි, මේ වචනයේ පිරිසිදු බව යයි කියනු ලැබේ.

8. "මහණෙනි, සිතේ පිරිසිදු බව නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම තමන් තුළ ඇත්තාවූ කාමච්ඡන්දය මා තුළ කාමච්ඡන්දය ඇතැයි දැනගනීද' තමා තුළ නැත්තාවූ කාමච්ඡන්දය 'මා තුළ කාමච්ඡන්දය නැතැයි' දැනගනීද, යම් ආකාරයකින් නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම වේද, යම් ආකාරයකින් උපන්නාවූ කාමච්ඡන්දයන් ප්‍රහාණය වේද එයත් දැනගනීද යම් ආකාරයකින් පහවූ කාමච්ඡන්දයාගේ නැවත නිපදීමක් වේද, එයත් දැන ගනීද තමාතුළ ඇත්තාවූ ව්‍යාපාදය 'මා තුළ ව්‍යාපාදය ඇතැයි දැනගනීද' තමා තුළ නැත්තාවූ ව්‍යාපාදය 'මා තුළ ව්‍යාපාදය නැතැයි' දැනගනීද, යම් ආකාරයකින් නූපන් ව්‍යාපාදය උපදීද එයත් දැනගනීද, යම් ආකාරයකින් උපන් ව්‍යාපාදය පහවේද එයත් දැනගනීද යම් ආකාරයකින් පහවූ ව්‍යාපාදය නැවත නූපදීද, එයත් දැනගනීද, තමා තුළ ඇත්තාවූ ථීනමිද්ධය 'මා තුළ ථීනමිද්ධය ඇතැයි' දනීද, තමා තුළ නැත්තාවූ ථීනමිද්ධය 'මා තුළ ථීනමිද්ධය නැතැයි' දැනගනීද, යම් ආකාරයකින් නූපන් ථීනමිද්ධය උපදීද එයත් දැනගනීද, යම් ආකාරයකින් උපන් ථීනමිද්ධය පහවෙයිද එයත් දැනගනියිද, යම් ආකාරයකින් පහවූ ථීනමිද්ධය නැවත නූපදියිද එයත් දැනගනියිද, තමා තුළ ඇත්තාවූ උද්ධච්ච කුක්කුච්චය මා තුළ උද්ධච්චකුක්කුච්චය ඇතැයි දනීද' තමා තුළ නැත්තාවූ උද්ධච්චකුක්කුච්චය 'මා තුළ උද්ධච්චකුක්කුච්චය' නැතැයි දැනගනීද, යම් ආකාරයකින් නූපන් උද්ධච්චකුක්කුච්චය උපදීද එයත් දැනගනීද යම් ආකාරයකින් උපන් උද්ධච්ච කුක්කුච්චය පහවෙයිද, එයත් දැනගනීද යම් ආකාරයකින් පහවූ උද්ධච්චකුක්කුච්චය නැවත නූපදියිද එයත් දැනගනියිද තමා තුළ ඇත්තාවූ විචිකිච්ඡාව 'මා තුළ විචිකිච්ඡාව ඇතැයි

'දැනගනීද, තමා තුළ නැත්තාවූ විචිකිච්ඡාව 'මා තුළ විචිකිච්ඡාව නැතැයි' දැනගනීද, යම් ආකාරයකින් නූපන් විචිකිච්ඡාව උපදීද, එයත් දැනගනීද, යම් ආකාරයකින් උපන් විචිකිච්ඡාව පහවෙයිද එයත් දැනගනීයිද, යම් ආකාරයකින් පහවූ විචිකිච්ඡාව නැවත නූපදියිද, එයත් දැනගනීද, මහණෙනි, මේ සිතේ පිරිසිදු බවයයි කියනු ලැබේ. මහණෙනි, මේ තුන් පිරිසිදු බැව්ය.

"කායික පිරිසිදු බව වාචසික පිරිසිදු බව මානසික පිරිසිදු බව යන මොහු තුන් පිරිසිදු බැව්ය. ආශ්‍රව රහිත පිරිසිදුභාවයන්ගෙන් යුත් ශුද්ධවන්තයා පාප ධර්මයන් සොධා හළ පුද්ගලයා යයි කීහු.

**9.** "මහණෙනි, යහපත් බැව් තුනකි. කවර තුනක්ද? කයේ යහපත් බවද වචනයේ යහපත් බවද සිතේ යහපත් බවද වෙත්.

මහණෙනි, කයේ යහපත් බව නම් කුමක්ද?

**10.** "(මේ ඡේදය මේ සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

**11.** "(මේ ඡේදය මේ සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

**12.** "මහණෙනි, සිතේ යහපත් බව නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියත් අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහි තෙමේ විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයිද මහණෙනි, මේ සිතේ යහපත් බවයයි. කියනු ලැබේ. මහණෙනි, මේ යහපත් බැව් තුන වෙත්.

"කයේ යහපත් බව වචනයේ යහපත් බව සිතේ යහපත් බව යන මොහු යහපත් බැව් තුනය. ආශ්‍රව රහිතවූ යහපත් භාවයෙන් යුත් භික්ෂුව සියලු කෙලෙසුන් පහකළ රහත් පුද්ගලයා යයි කීහු."

(දොළොස්වැනි අපායික වර්ගය නිමි.)

---

# 13. භාරංඩු (හෝ) කුසිනාරා වර්ගය.

21. බලිහරණ සූත්‍රය:- 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර බලිහරණ නම් වනලැහැබෙහි වාසය කරන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මහණෙනියි' කියා ආමන්ත්‍රණය කළ සේක. එවිට භික්ෂූහු 'ස්වාමීනි' කියා උත්තර දුන්හ.

2. 'මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට වාසය කරයි. ඔහු කරා ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ එළඹ පසුදිනය පිණිස බතින් නිමන්ත්‍රණය කරයි. කැමැත්තාවූ භික්ෂුතෙමේ නිමන්ත්‍රණය ඉවසයි. හෙතෙම ඒ රාත්‍රියෙන් පසු පෙරවරු කාලයෙහි පාත්‍ර සිව්රු ගෙන ඒ ගෘහපතියාගේ හෝ ගෘහපති පුත්‍රයාගේ හෝ ගෙදොර යම් තැනකද එහි පැමිණෙයි. පැමිණ පනවන ලද ආසනයෙහි හිඳගනියි. ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ප්‍රණීතවූ කෑයුතු දෙයින්ද බුදිය යුතු දෙයින්ද සියතින් වළඳවයි 'ඇත, ඇත' කියා ප්‍රතික්ෂෙප කරවයි.

3. "ඒ භික්ෂූවට මෙසේ සිතෙයිද කෙසේද? මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ නැවතද මා මෙබඳු ප්‍රණීත කෑයුතු දෙයින් බුදිය යුතු දෙයින් සියතින් වළඳවන්නේ නම් 'ඇත, ඇත' කියා ප්‍රතික්ෂෙප කරවන්නේ නම් යහපති කියායි. හෙතෙම ඒ පිණ්ඩපාතය තෘෂ්ණාවෙන් ඇලී මුර්ඡාවී තෘෂ්ණාවෙහි ගැලී ආදීනව නොදක්නෙක්ව නික්මීමේ ප්‍රඥාව නැත්තෙක්ව වළඳයි. හෙතෙම එහි කාම විතර්කද කල්පනා කරයි. ව්‍යාපාද විතර්කද කල්පනා කරයි. විහිංසා විතර්කද කල්පනා කරයි.

4. "මහණෙනි, මම මෙබඳු භික්ෂූවට දෙන ලද දානය මහත්ඵල ඇත්තේයයි නොකියමි. කුමක් හෙයින්ද? මහණෙනි, ඒ භික්ෂුව ප්‍රමාදව වාසය කරයි. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**5.** "ඔහුට මෙසේ අදහස් නොවෙයි. කෙසේද? මේ ගෘහපති තෙමේ හෝ ගෘහපති පුත්‍රතෙමේ හෝ පසුව මෙවැනි ප්‍රණීත කෑයුතු දෙයින් හෝ බුදිය යුතුදෙයින් හෝ සියතින් මා වළඳවන්නේ නම් 'ඇත ඇත' කියා ප්‍රතික්ෂෙප කරවන්නේ නම් යහපත්ය කියායි. හෙතෙම ආහාරය තෘෂ්ණාවෙන් නොබැඳී මූර්ඡානොවී තෘෂ්ණාවෙහි නොගිලී ආදීනව දකිමින් නික්මෙන ප්‍රඥාවෙන් යුක්තව වළඳයි. හෙතෙම එහි නෛෂ්ක්‍රම්‍ය විතර්කද කල්පනා කරයි. අව්‍යාපාද විතර්කද කල්පනා කරයි. අවිහිංසා විතර්කද කල්පනා කරයි.

**6.** "මහණෙනි, මම මෙබඳු භික්ෂුවට දෙන ලද දානය මහත්ඵල වන්නේයයි කියමි. කුමක් හෙයින්ද මහණෙනි, මේ මහණ තෙම අප්‍රමාදව වාසය කරයි"

**22. භණ්ඩන ජාත සූත්‍රයඃ-** 1 "මහණෙනි, යම් දිශාවෙක භික්ෂූහු හටගත් ඩබර ඇතිව හටගත් කලහ ඇතිව විවාදයට පැමිණ ඔවුනොවුන් මුඛ නමැති ආයුධවලින් ඇන කොටා ගනිමින් වාසය කරද්ද, මහණෙනි, මා විසින් ඒ දිසාව මෙනෙහි කිරීමටවත් පහසු නොවේ. යාම ගැන කියනුම කිම? මෙහිදී ඒකාන්තයෙන් ඒ ආයුෂ්මත්හු ධර්ම තුනක් අත්හළහ. ධර්ම තුනක් බහුල කළාහුයයි නිශ්චයට පැමිණෙමි.

**2.** "කිනම් ධර්ම තුනක් අත්හැරියාහුද? නෛෂ්ක්‍රම්‍ය විතර්කය අව්‍යපාද විතර්කය අවිහිංසා විතර්කය යන මේ ධර්ම තුන අත්හළහ. කවර ධර්ම තුනක් බහුල කළාහුද? කාම විතර්කය, ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කය යන මේ ධර්ම තුන බහුල කළාහුය.

**3.** (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

**4.** "මහණෙනි, යම් දිශාවෙක භික්ෂූහු සමගිව සතුටු වෙමින් වාද නොකරමින් කිරිත් වතුරත් මෙන් එක්ව ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් වාසය කරද්ද මහණෙනි, මා විසින් ඒ දිශාවට යාමටද පහසුවෙයි. මෙනෙහි කිරීම ගැන කියනුම කිම?

ඒකාන්තයෙන් ඒ ආයුෂ්මත්හු මේ ධර්ම තුන අත්හළහ. මේ ධර්ම තුන බහුල කළහයි නිශ්චයට පැමිණෙමි.

5. "කවර ධර්ම තුනක් අත්හළහුද? කාම විතර්කයද? ව්‍යාපාද විතර්කයද, විහිංසා විතර්කයද යන මේ ධර්ම තුන දුරු කළහ. කවර ධර්ම තුනක් බහුල කළාහුද? නෛෂ්ක්‍රම්‍ය විතර්කයද, අව්‍යාපාද විතර්කයද, විහිංසා විතර්කයද යන මේ ධර්ම තුන බහුල කළහ.

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

**23. ගොතමක සූත්‍රයඃ-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර ගොතමක චෛත්‍යයෙහි වාසය කරයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේය.

2. "මහණෙනි, මම ප්‍රත්‍යක්ෂකොට දැන ධර්මය දෙශනා කරමි. ප්‍රත්‍යක්ෂ වශයෙන් නොදැන නොවේ. මහණෙනි, කරුණු සහිතව ධර්ම දෙශනා කරමි, කරුණු රහිතව නොවේ. විරුද්ධ කරුණු දුරුකරමින්ම ධර්ම දෙශනා කරමි, විරුද්ධ කරුණු දුරු නොකරමින් නොවේ. මහණෙනි, ප්‍රත්‍යක්ෂ නොකොට නොව ප්‍රත්‍යක්ෂ කොටම දැන ධර්මය දෙශනා කරන්නාවූ කරුණු නැතුව නොව කරුණු සහිතවම ධර්ම දෙශනා කරන්නාවූ, විරුද්ධව කරුණු දුරුකොට නොව, විරුද්ධ කරුණු දුරු කොටම ධර්ම දෙශනා කරන්නාවූ, මාගේ අවවාදය කළ යුතුය. මාගේ අනුශාසනය කළ යුතුය.

3. "මහණෙනි, තොපට තුටුවීමට සුදුසුය. සතුටු සිත් ඇතිවීමට සුදුසුය. සොම්නස් වීමට සුදුසුය. භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයහ, ධර්මය ස්වාක්ඛාතය, සංඝයා සුප්‍රතිපන්නය."

24. "භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය. ඒ භික්ෂූහු සතුටු සිත් ඇත්තාහු භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුවූහ. මේ දෙශනාව කරන කල්හි දස දහසක් චක්‍රවාළ කම්පාවිය.

**24. හරණ්ඩුකාලාම සූත්‍රයː- 1.** "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට චාරිකාවෙහි වඩිනාසේක් කිඹුල්වත්පුරයට වැඩිසේක. මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුරයට වැඩිසේකැයි ඇසීය. එකල්හි මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක සිටියේය. එක්පසෙක සිටි මහානාම ශාක්‍යයාහට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

2. "මහානාමය, යම් තැනක අපි අද එක් රැයක් වාසය කරමුද, ඊට සුදුසු ආවාසයක් දැනගනුව" කියායි. මහානාම ශාක්‍ය තෙමේ "ස්වාමීනි, එසේයයි" භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී, කිඹුල්වත්පුරයට පැමිණ මුළු කිඹුල්වත් පුරයෙහි ඇවිද කිඹුල්වත්පුරයෙහි යම්තැනෙක භාග්‍යවතුන් වහන්සේ එක් රැයක් වාසය කරන්නේද ඊට සුදුසු ආවාසයක් නුදුටුවේය.

3. "එකල්හි මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අද යම් තැනෙක එක් රැයක් වාසය කරන්නේද ඊට සුදුසු ආවාසයක් නැත. ස්වාමීනි, මේ භාග්‍යවතුන් වහන්සේගේ පුරාණ එකට විසූ ශ්‍රමණයෙක්වූ හරංඩුකාලාම නම් ශ්‍රමණ තෙම ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ආශ්‍රමයෙහි එක් රැයක් වසන සේක්වායි" කීය.

4. "මහානාමය, යව. ඇතිරියක් අතුරවයි" වදාළේය. මහානාම ශාක්‍ය තෙමේ "ස්වාමීනි, එසේයයි" භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී හරංඩුකාලාමයාගේ ආශ්‍රමය යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ඇතිරියක් අතුට පා සේදීම පිණිස පැන් තබා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ස්වාමීනි, ඇතිරියක් අතුරන ලදී. පා දෙවීම පිණිස පැන් තබන ලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දැන් කාලය දක්නාසේකැයි" කීය.

5. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භරංඩුකාලාමයාගේ ආශ්‍රමය යම් තැනෙක්හිද එහි වැඩිසේක. වැඩ පනවන ලද ආසනයෙහි වැඩහුන්සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ පා සේදූහ. ඉක්බිති මහානාම ශාක්‍යයාහට මෙසේ අදහස් විය. 'අද භාග්‍යවතුන් වහන්සේ පයුරුපාසනය කිරීමට කල් නොවේ. භාග්‍යවතුන් වහන්සේ වෙහෙස වූහ. දැන් මම හෙට භාග්‍යවතුන් වහන්සේ පයුරුපාසනය කරන්නෙමි" කියායි. මෙසේ සිතා භාග්‍යවතුන්වහන්සේට වැඳ ගෞරවකොට ගියේය.

6. "ඉක්බිති මහානාම ශාක්‍යතෙම ඒ රාත්‍රිය ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හිඳ ගත්තේය. එක්පසෙක හිඳගත් මහානාම ශාක්‍යයාහට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

7. "මහානාමය, ලොකයෙහි මේ ශාස්තෘවරයෝ තුන් දෙනෙක් ඇත්තාහුය. කවර තුන්දෙනෙක්ද? මහානාමය, මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් කාමයන්ගේ ඉක්මවීම පනවයි. රූපයන්ගේ ඉක්මවීම නොපනවයි. වෙදනාවන්ගේ ඉක්මවීම නො පනවයි.

8. "මහානාමය, මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් කාමයන්ගේද ඉක්මවීම පනවයි. රූපයන්ගේද ඉක්මවීම පනවයි. වෙදනාවන්ගේ ඉක්මවීම නො පනවයි.

9. "මහානාමය, මෙහි ඇතැම් ශාස්තෘවරයෙක් කාමයන්ගේද ඉක්මවීම පනවයි. රූපයන්ගේද ඉක්මවීම පනවයි, වෙදනාවන්ගේද ඉක්මවීම පනවයි.

10. "මහානාමය, මේ ශාස්තෘවරයෝ තුන්දෙනෙක් ලොකයෙහි ඇත්තාහ. මහානාමය, මේ තුන් ශාස්තෘවරයන්ගේම නිෂ්ටාව එකක්මද නැතහොත් වෙන්වූ නිෂ්ටා වෙත්ද?"

11. මෙසේ වදාළ කල්හි භරංඩුකාලාම තෙමේ "මහානාමය, එකකැයි කියවයි" මහානාම ශාක්‍යයන්හට කීය. මෙසේ කීකල්හි

භාග්‍යවතුන් වහන්සේ "මහානාමය, වෙන් වෙන් වූයේයයි කියවයි" මහානාම ශාක්‍යයන්ට වදාළේය.

12. දෙවනුවත් (මෙහි මේ සූත්‍රයේ 11 ඡෙදය යෙදිය යුතුයි.) තෙවනුත් (මෙහි මේ සූත්‍රයේ 11 ඡෙදය යෙදිය යුතුයි.)

13. "එකල්හි හරංඩුකාලාමයාට මෙබඳු සිතක් විය. 'මහෙශාක්‍යවූ මහානාම ශාක්‍යයා ඉදිරියෙහි මම ශ්‍රමණ ගෞතමයන් විසින් අප්‍රසාදයට පත්කරන ලද්දේ වෙමි. මම කිඹුල්වත්පුරයෙන් ඉවත්ව යන්නෙම් නම් මැනවි' කියායි. ඉක්බිති හරංඩුකාලාම තෙමේ කිඹුල්වත්පුරයෙන් ඉවත්ව ගියේය. යම් හෙයකින් කිඹුල්වත්පුරයෙන් නික්ම ගියේද එසේ ගියේම විය. නැවත නො ආයේය."

**25. හත්ථක දෙවපුත්ත සූත්‍රය**:- 1. "මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි හත්ථක නම් බ්‍රහ්ම දිව්‍ය පුත්‍ර තෙමේ යහපත් රාත්‍රියක ශොභාමත් ශරීර වර්ණ ඇතිව මුළු ජේතවනාරාමය ආලොක කොට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි සිටින්නෙමියි ගිලෙන්නේද මතුවන්නේද වෙයි. පිහිටීමට නොහැකිවෙයි. යම්සේ ගිතෙල් හෝ තෙල් හෝ වැල්ලෙහි ඉසින ලද්දේ ගිලෙන්නේත් මතුවන්නේත් වේද, එමෙන් හත්ථක දෙව පුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි සිටින්නෙමියි ගිලෙන්නේද මතුවන්නේද වෙයි. පිහිටීමට නොහැකි වෙයි.

2. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හත්ථක බ්‍රහ්ම දිව්‍ය පුත්‍රයාට "හත්ථකය, ඖදාරික ආත්මභාවයක් මවා ගනුවයි." වදාළේය. -"ස්වාමීනි, එසේයයි" හත්ථක බ්‍රහ්ම දෙවපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී ඖදාරික ආත්ම භාවයක් මවා භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක සිටියේය. එක්පසෙක සිටියාවූ හත්ථක දිව්‍ය පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

3. "හත්ථක, පෙර මනුෂ්‍යව වාසය කරද්දී ඉගෙන ගත් යම් ධර්ම තොපට වූවාහු නම් ඒ ධර්මයෝ තොපට දැනුදු ධාරණව පවත්නාහුද?" යනුයි.

"ස්වාමීනි, පෙර මනුෂ්‍යවූ මාහට යම් ධර්මයෝ ධාරණව පැවැත්තාහුද ඒ ධර්මයෝ දැනුදු මට ධාරණව ඇත්තාහුය. පෙර මනුෂ්‍යවූ මා හට යම් ධර්මයෝ ධාරණව නොපැවැත්තාහුද ඒ ධර්මයෝ දැන් මාහට ධාරණව ඇත්තාහුය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දැන් භික්ෂූන්ගේ භික්ෂුණීන්ගෙන් උපාසකයන්ගෙන් උපාසිකාවන්ගෙන් රජුන්ගෙන් රාජ මහා මාත්‍යයන්ගෙන් තීර්ථකයන්ගෙන් තීර්ථක ශ්‍රාවකයන්ගෙන් ආකීර්ණව වාසය කරනසේක්ද, ස්වාමීනි, එසේම මම දිව්‍ය පුත්‍රයන්ගෙන් ආකීර්ණව වාසය කරමි. ස්වාමීනි, දුර සිටද දිව්‍ය පුත්‍රයෝ හත්ථක දිව්‍ය පුත්‍රයාගෙන් ධර්මය අසන්නෙමැයි පැමිණෙත්. ස්වාමීනි, මම කරුණු තුනකින් තෘප්තියක් නැතිව සෑහීමක් නැතිව කාලක්‍රියා කෙළෙමි. කවර තුනකින්ද ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ දැකීමෙන් ඇතිවීමක් සෑහීමක් නැතිව කාලක්‍රියා කෙළෙමි. ස්වාමීනි, මම ධර්ම ශ්‍රවණ කිරීමෙහි තෘප්තියක් සෑහීමක් නැතිව කාලක්‍රියා කෙළෙමි. ස්වාමීනි, මම සංඝයාට උපස්ථාන කිරීමෙහි තෘප්තියක් නැතිව ඇතිවීමක් නැතිව කාලක්‍රියා කෙළෙමි. ස්වාමීනි, මම මේ තුන් ධර්මයන්ගේ තෘප්තියක් සෑහීමක් නැතිව කාල ක්‍රියා කෙළෙමි.

"මම භාග්‍යවතුන් වහන්සේගේ දැක්මෙහිද සංඝයාට උපස්ථාන කිරීමෙහිද බණ ඇසීමෙහිද, කිසිකලෙක තෘප්තියට නොපැමිණියෙමි.

"අධිශීලයෙහි හික්මෙන්නාවූ ධර්ම ශ්‍රවණයෙහි ඇලුණාවූ ධර්ම තුනකින් තෘප්තියක් නැත්තාවූ හත්ථක තෙමේ අවිහ බඹලොවට ගියේය."

**26. කටුවිය කත සූත්‍රයඃ-** 1 "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර මිගදාය නම් ඉසිපතනයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පාත්‍රා සිවුරු ගෙන

බරණැස් නුවරට පිඬු පිණිස වැඩියහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ගවයන් විකුණන තැනක හටගත් පුලිල ගසක් සමීපයෙහි පිඬු පිණිස හැසිරෙන සේක් ධ්‍යාන සැපයක් නැති හෙයින්, ස්වල්ප ආශ්වාදයක් ඇති කාම ගුණ සැප වශයෙන් ශාසනයෙන් බාහිර ආශ්වාදයක් ඇති මුළාවූ සිහිය ඇති නුවණ නැති සමාධියෙන් තොරවූ විසිර ගිය සිත් ඇති විවෘත කළ ඉන්ද්‍රියයන් ඇති භික්ෂුවක් දැක ඒ භික්ෂුවට මෙසේ වදාළේය.

2. "මහණ, මහණ, තෝ තමා ඉඳුල් අහරක් මෙන් නොකළ යුතුය. මහණ, ඒ ඉඳුල් අහරක් මෙන් කරන ලද ක්‍රොධය නමැති පිලී ගඳ හමන කෙලෙසුන්ගෙන් තෙත්වූ ඒ තමා ක්ලෙශ නමැති මැස්සෝ ලුහුනොබඳිත්. ලුහුබැඳ නොකත් යන මීට හෙතු නැත්තේය යනුයි.

3. "එකල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අවවාදයෙන් අවවාද කරන ලද ඒ මහණ තෙමේ සෝවාන් ඵලයට පැමිණියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බරණැසෙහි පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක.

4. "මහණෙනි, මම පෙරවරු කාලයෙහි පාත්‍ර සිව්රු ගෙන බරණැසෙහි පිඬු පිණිස පැමිණියෙමි. මහණෙනි, මම ගවයන් විකුණන ස්ථානයෙහි හටගත් පුලිල ගස සමීපයෙහි පිඬු පිණිස හැසිරෙන්නෙම් ස්වල්ප ආශ්වාදය ඇති බාහිර ආශ්වාදය ඇති සිහිමුළාවූ නුවණ නැත්තාවූ සමාධියක් නැත්තාවූ වික්ෂිප්ත සිත් ඇත්තාවූ විවෘත කළ ඉන්ද්‍රිය ඇත්තාවූ එක්තරා භික්ෂුවක් දිටිමි. දැක ඒ භික්ෂුවට මෙසේ කීමි. කෙසේද?

5. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

6. "මහණෙනි, එකල්හි මා විසින් මේ අවවාදයෙන් අවවාද කරන ලද ඒ මහණ තෙම සෝවාන් ඵලයට පැමිණියේයයි වදාළේය.

7. "මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් 'ස්වාමීනි, ඉඳුල් බත යනු කුමක්ද? පිලීගඳ යනු කුමක්ද? මැස්සෝ යනු කුමක්දැ?යි" භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසීය.

8. "මහණ, ඉඳුල් බත නම් අභිද්‍යාවය, පිලීගඳ නම් ව්‍යාපාදයය, මැස්සෝ නම් ලාමක අකුසල විතර්කයෝය. මහණ, ඒ ඉඳුල් බතක් කරන ලද පිලීගඳ හමන්නාවූ කෙලෙසුන්ගෙන් තෙත්වූ තමා අකුශල විතර්ක නමැති මැස්සෝ ලුහුනොබඳිත්. ලුහුබැඳ නොකත් යන මීට හෙතු නැත්තේයයි"

"ඇස් කන් නොරක්නා ලද ඉන්ද්‍රියන්හි සංවර නොවූවහු රාග සහගත විතර්ක නමැති මැස්සෝ ලුහුබඳිත්."

"තමා ඉඳුල් බතක් මෙන් කරන ලද්දාවූ පිලීගඳ හමන්නාවූ කෙලෙසුන්ගෙන් තෙත්වූ මහණ තෙමේ නිර්වාණයෙන් දුරුවූයේ දුකටම භාජනවූවෙක් වන්නේය.'

"ගමෙහි හෝ ආරණ්‍යයෙහි හෝ තමාගේ සංසිඳීමක් නොලත් අඥාන බාල තෙමේ මැස්සන්ගෙන් පෙරටුව ගමන් කරන්නේය."

"යම් කෙනෙක් සීලයෙන් යුක්තව ප්‍රඥාවෙන් සංසිඳීමෙහි ඇලී වෙසෙත්ද ඔව්හු මැස්සන් නසා සංසිඳුනාහු සැපසේ සයනය කරත්."

**27. පඨම අනුරුද්ධ සූත්‍රයː-** එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ අනුරුද්ධ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේය.

2. "ස්වාමීනි, මම මිනිස් බව ඉක්මවූ පිරිසිදු දිවැසින් බොහෝ සෙයින් ස්ත්‍රිය කය බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහවූ අයහපත් ගති ඇති විනාශව වැටෙන්නාවූ නිරයෙහි උපදින බව දකිමි. ස්වාමීනි, කෙතෙක් ධර්මයන්ගෙන් යුත් ස්ත්‍රිය කය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බිඳී මෙන් මරණින් පසු සැපයෙන් පහවූ අයහපත් ගති ඇති විනාශව වැටෙන්නාවූ නිරයෙහි උපදින්නේද?"

3. "අනුරුද්ධය, ධර්ම තුනකින් යුත් ස්ත්‍රිය කය බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහවූ අයහපත් ගති ඇති විනාශව වැටෙන්නාවූ නිරයෙහි උපදියි. කවර තුනකින්ද යත්?

4. "අනුරුද්ධය, මේ ලෝකයෙහි ස්ත්‍රිය උදය වරුවෙහි මසුරු මලයෙන් මඩනා ලද සිතින් ගෙයි වාසය කරත්. දවල් කාලයෙහි ඊර්ෂ්‍යාවෙන් මඩනා ලද සිතින් ගෙයි වාසය කරයි. සවස්කාලයෙහි රාගයෙන් මඩනාලද සිතින් ගෙයි වාසය කරයි.

5. "අනුරුද්ධය, මේ ධර්ම තුනෙන් යුත් ස්ත්‍රිය කය බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහවූ අයහපත් ගති ඇති විනාශවූ වැටෙන්නාවූ නිරයෙහි උපදියි."

28. දුතිය අනුරුද්ධ සූත්‍රයඃ- 1. "ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙමෙ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ හා සතුටුවිය, සතුටු වියයුතු සිහිකටයුතු කථා කොට නිමවා එක් පසෙක හිඳ ගත්තේය. එක් පසෙක හිඳගත් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙමෙ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළේය.

2. "ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මම මිනිසත් බව ඉක්මවූ පිරිසිදුවූ දිවැසින් ලොක දහසක් බලමි. මා විසින් පටන්ගන්නා ලද වීර්‍ය්‍ය නො හැකුළුණේය. සිහිය එළඹ සිටියාය මුළා නොවූවාය. කය සංසිඳුණේය. දාහරහිත වූයේය. සිත එකඟව සමාධියට පැමිණියේය. එවිටද මාගේ සිත තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් අල්වා නොගෙන ආශ්‍රවයන්ගෙන් නොමිදේ යයි' කීය.

3. "ඇවැත් අනුරුද්ධය, තොපට මම මෙසේ මිනිසත් බව ඉක්මවූ පිරිසිදු දිවැසින් දහසක් ලොකයන් බලමි යන යමක්

ඇද්ද මෙය තොපගේ මානය වෙයි. අනුරුද්ධය, තොපට, මෙසේ මා විසින් වීය්‍ය්‍ය පටන් ගන්නා ලදී. වීය්‍ය්‍ය නොහැකුළුණේය. නුමුළාවූ සිහිය එළඹ සිටියාය. කය සංසිඳුණේය. දාහරහිතය. සිත එකඟවිය සමාධියට පැමිණියේය යන යමක් වේද මෙය තොපගේ උද්ධච්චය වෙයි.

4. "අනුරුද්ධය, තොපට මෙසේ එවිටද මාගේ සිත තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් නොමිදේය යන යමක් වේද, මෙය තොපගේ විචිකිච්ඡාව වෙයි. "ආයුෂ්මත් අනුරුද්ධ තෙමේ මේ ධර්ම තුන හැරදමා මේ ධර්ම තුන මෙනෙහි නොකොට නිර්වාණ ධාතුවට හිත එළවන්නේ නම් මැනවියයි" වදාළේය.

5. "එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙමේ තනිව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස්තවන වීය්‍ය්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් වාසය කරන්නේ නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යම් අර්ථයක් පිණිස ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවෙත්ද මාර්ග බ්‍රහ්මචය්‍ය්‍යාව අවසාන කොට ඇති ඒ අනුත්තර ධර්මය මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ ඥානයෙන් දැන ඊට පැමිණ වාසය කෙළේය.

6. "ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචය්‍ය්‍යාව වැස නිමවනලදී. කළයුත්ත කරන ලදී. මෙයින් පසු ආත්මභාවයක් නැතැයි දැන ගත්තේය. අනුරුද්ධ තෙමේ රහතුන් අතුරෙන් එක්තරා රහත් පුද්ගලයෙක් විය."

**29. පටිච්ඡන්නවහන සූත්‍රය:-** 1. "මහණෙනි, වසන ලද්දාවූ තිදෙනෙකුන් දරත්. විවෘතකරන ලදුව නොදරත්. කවර තුනක්ද?

2. "මහණෙනි, මාගම (ස්ත්‍රිය) වසන ලද්දේම දරයි. විවෘත කෙළේ නොදරයි. මහණෙනි, බ්‍රාහ්මණයන්ගේ මන්ත්‍ර වසන ලද්දාහුම දරත්, විවෘතකොට නොදරත්. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය වසනලදුවම දරයි. විවෘතකරන ලදුව නොදරයි. මහණෙනි, මේ කරුණු තුන වසනලදුව දරත්. විවෘතකොට නොදරත්.

3. "මහණෙනි, තිදෙනෙක් විවෘතකරන ලද්දාහුම බබලත්. වසන ලද්දාහුම නොබබලත්. කවර තිදෙනෙක්ද යත්?

4. "මහණෙනි, සඳමඬල විවෘතකරන ලද්දේම බබලයි. වසනලද්දේ නොබබලයි. මහණෙනි, හිරුමඬල විවෘතකරන ලද්දේම බබලයි වසනලද්දේ නොබබලයි. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්මය විවෘතකරන ලද්දේම බබලයි. වසන ලද්දේ නොබබලයි. මහණෙනි, මේ තිදෙන විවෘතකරන ලද්දාහුම බබලත්. වසන ලද්දාහු නොබබලත් යයි" වදාළේය.

**30. ලෙඛුපම සූත්‍රයඃ-** 1. "මහණෙනි, ලොකයෙහි පුද්ගලයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක්ද? ගලේ ඇඳි ඉර වැනි පුද්ගල තෙමේද, පොළොවේ ඇඳි ඉර වැනි පුද්ගල තෙමේද, දියේ ඇඳි ඉර වැනි පුද්ගල තෙමේද වෙයි.

2. "මහණෙනි, ගලේ ඇඳි ඉර වැනි පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නිතර කිපෙයි. හෙතෙම ඒ ක්‍රොධය බොහෝ කාලයක් පවත්වයි. මහණෙනි, යම්සේ ගලේ ඇඳි ඉර වාතයෙන් හෝ ජලයෙන් හෝ වහා නොමැකෙන්නේද, බොහෝ කල් පවත්නේද, මහණෙනි, එසේම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නිතර කිපෙයිද, හෙතෙම ඒ ක්‍රොධය බොහෝ කල් පවත්වයිද, මහණෙනි, මෙතෙම ගලේ ඇඳි ඉරවැනි පුද්ගලයායයි කියමි.

3. "මහණෙනි, පොළොවේ ඇඳි ඉර වැනි පුද්ගලයා නම් කවරේද? මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නිතර කිපෙයි. හෙතෙම ඒ ක්‍රොධය බොහෝ කලක් නොපවත්වයි. මහණෙනි, යම්සේ පොළොවේ ඇඳි ඉර වාතයෙන් හෝ ජලයෙන් හෝ වහා මැකේද, බොහෝකල් නොපවතියිද, මහණෙනි, එසේම ඇතැම් පුද්ගලයෙක් නිතර කිපෙයිද, හෙතෙම ඒ ක්‍රොධය බොහෝකල් නොපවත්වයිද, මහණෙනි, මෙතෙමේ පොළොවේ ඇඳි ඉර වැනි පුද්ගලයායයි කියනු ලැබේ.

4. "මහණෙනි, දියේ ඇඳි ඉර වැනි පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දැඩිකොට කියනු ලබන්නේද, ඵරුෂව කියනු ලබන්නේද, අමනාපයෙන් කියනු ලබන්නේද සම්බන්ධ වන්නේමය, සංසන්දනය වන්නේමය සතුටු වන්නේමය. මහණෙනි, යම්සේ ජලයෙහි ඇඳි ඉර වහා මැකී යන්නේද බොහෝ කල් නොපවත්නේද මහණෙනි, එමෙන්ම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දැඩිව කියනු ලබන්නේද ඵරුෂව කියනු ලබන්නේද අමනාපයෙන් කියනු ලබන්නේද සම්බන්ධ වන්නේමය. සංසන්දනය වන්නේමය. සතුටු වන්නේමය. මහණෙනි, මෙතෙමේ දියේ ඇඳි ඉර වැනි පුද්ගලයායයි කියනු ලැබේ මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයෝ තිදෙනෙක් ඇත්තාහුය."

(දහතුන්වැනි භරංඩු වර්ගය නිමි.)

---

## 14. යොධාජීව වර්ගය

31. **යොධාජීව සූත්‍රයː-** "මහණෙනි, අංග තුනකින් යුත් යුද්ධභට තෙමේ රජුට සුදුසුවූයේ රජුගේ පරිභොගය වූයේ රජුගේ අංගයක යන සංඛ්‍යාවට පැමිණෙයි. කවර තුනකින්ද යත්? මහණෙනි, මෙහි යුද්ධභට තෙමේ දුර විදින්නේ වේද, නොවරදිනසේ විදින්නේ වේද, මහත් ඝන දේ විදින්නේ වේද, මහණෙනි, මේ අංග තුනෙන් යුත් යුද්ධභට තෙමේ රජුට සුදුසුවූයේ රජුගේ පරිභොගයවූයේ රජුගේ අංගය යන සංඛ්‍යාවට පැමිණෙයි.

2. "මහණෙනි, එපරිද්දෙන්ම ධර්ම තුනකින් යුත් මහණ තෙම ආහුනෙය්‍ය වන්නේද පාහුණෙය්‍ය වන්නේද දක්ඛිණෙය්‍ය වන්නේද අඤ්ජලිකරණීය වන්නේද ලොකයාගේ අනුත්තර පුන්‍යක්ෂෙත්‍රය වන්නේද වෙයි. මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම දුර විදින්නේ වෙයි. නොවරදිනසේ විදින්නේ වෙයි. ඝන දෙය විදින්නේ වෙයි.

3. "මහණෙනි, කෙසේ නම් මහණතෙම දුර විදින්නේ වෙයිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම අතීතවූද අනාගතවූද වර්තමානවූද අධ්‍යාත්මවූද බාහිරවූද, ඖළාරිකවූද සුඛුමවූද, හීනවූද, ප්‍රණීතවූද දුරවූද සමීපවූද යම් රූපයක් ඇත්තේද ඒ සියලු රූපය එය මගේ නොවෙයි එය මම නොවෙමි එය මගේ ආත්මය නොවේයයි තත්වාකාරයෙන් කරුණු සහිතව දකියිද,

4. අතීතවූද අනාගතවූද වර්තමානවූද අධ්‍යාත්මවූද බාහිරවූද, ඖළාරිකවූද සුඛුමවූද හීනවූද ප්‍රණීතවූද ඒ සියලු වේදනා ඒ මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි තත්වාකාරයෙන් කරුණු සහිතව දකියිද,

5. "අතීතවූද අනාගතවූද වර්තමානවූද අධ්‍යාත්මවූද බාහිරවූද, ඖළාරිකවූද, සුඛුමවූද හීනවූද ප්‍රණීතවූද ඒ සියලු සංඥා ඒ මාගේ නොවේ ඒ මම නොවෙමි' ඒ මාගේ ආත්මය නොවේයයි තත්වාකාරයෙන් කරුණු සහිතව දකියිද,

6. "අතීතවූද අනාගතවූද වර්තමානවූද අධ්‍යාත්මවූද බාහිරවූද, ඖළාරිකවූද, සුඛුමවූද හීනවූද ප්‍රණීතවූද ඒ සියලු සංස්කාර ඒ මගේ නොවෙයි ඒ මම නොවෙමි ඒ මගේ ආත්මය නොවේයයි තත්වාකාරයෙන් කරුණු සහිතව දකියිද,

7. "මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම දුර විදින්නෙක් වෙයි. මහණෙනි, කෙසේ වනාහි මහණතෙම නොවරදිනසේ විදින්නෙක් වෙයිද?

8. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම මේ දුක යයි තත්වාකාරයෙන් දකියිද මේ දුකට හේතුවයයි තත්වාකාරයෙන් දකියිද මේ දුක නැතිකිරීමයයි තත්වාකාරයෙන් දකියිද මේ දුක නැතිකිරීමේ මාර්ගයයි තත්වාකාරයෙන් දකියිද මහණෙනි, මෙසේ වනාහි මහණතෙම නොවරදින සේ විදින්නෙක් වෙයි.

9. "මහණෙනි, කෙසේ නම් මහණතෙම මහත් දෙයක් පලායන සේ විදින්නෙක් වේද? මහණෙනි, මේ ශාසනයෙහි

මහණතෙම මහත් අවිද්‍යාස්කන්ධය පලන්නේද මහණෙනි, මෙසේ වනාහි මහණතෙම මහත් දෙයක් පලන්නෙක් වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් සමන්විතවූ මහණ තෙමේ ආහුනෙය්‍ය වෙයි. පාහුනෙය්‍ය වෙයි. දක්ඛිණෙය්‍ය වෙයි අඤ්ජලිකරණීය වෙයි. ලොකයාගේ අනුත්තර පුන්‍යක්ෂෙත්‍රය වෙයි."

32. **උක්කාචිත විනීත සූත්‍රයː-** 1. "මහණෙනි, මේ පිරිස් තුනෙකි. කවර තුනක්ද යත්? කරුණු විමසා නොහික්මවන ලද පිරිසය, කරුණු විමසා හික්මවන ලද පිරිසය, අදහස් දැන හික්මුනාවූ පිරිසය යන තුනයි. මහණෙනි, මේ තෙපිරිස වන්නීය."

33. **දුද්දදමිත්ත සූත්‍රයː-** 1. "මහණෙනි, මේ අංග තුනකින් සමන්විතවූ මිත්‍රතෙම සෙවනය කළ යුතුය. කවර තුනකින්ද යත්? දීමට දුෂ්කර දෙය දෙන්නේද, කිරීමට දුෂ්කර දේ කරන්නේද, ඉවසීමට දුෂ්කර දේ ඉවසන්නේද, මහණෙනි, මේ අංග තුනෙන් යුත් මිත්‍රතෙම සෙවනය කළ යුත්තේය."

34. **ධම්ම නියාමතා සූත්‍රයː-** 1. "මහණෙනි, තථාගතයන් උපන්කල හෝ නූපන්කල හෝ සියලු සංස්කාරයෝ අනිත්‍යහ යන ධර්මස්වභාවය ධර්මනියාමය ඇත්තේමය.

2. "ඒ ස්වභාවය තථාගත තෙම අවබොධ කරයි, ප්‍රතිවෙධ කරයි. අවබොධකොට ප්‍රතිවෙධකොට සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යහයි ප්‍රකාශකරයි, දෙශනාකරයි, පනවයි, පිහිටුවයි, විවරණය කරයි, විභජනය කරයි, ප්‍රකට කරයි.

3. "මහණෙනි, තථාගතයන් වහන්සේලා උපන්කල හෝ නූපන්කල හෝ සියලු සංස්කාරයෝ දුකය යන මේ ධර්මස්වභාවය ධර්මනියාමය ඇත්තේය.

4. (මේ ඡෙදය මේ සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

5. "මහණෙනි, තථාගතයන් උපන්කල හෝ නූපන් කල හෝ සියලු සංස්කාරයෝ අනාත්මයහ යන ධර්මස්වභාවය ධර්මනියාමය ඇත්තේමය.

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

35. **කෙසකම්බලූපම සූත්‍රයඃ-** 1. "මහණෙනි, නූල්වලින් වියනලද යම් වස්ත්‍ර වෙද්ද ඒ පොරෝනයන් අතුරෙන් හිසකෙස්වලින් වියනලද කම්බලය ඉතා පහත්යයි කියනු ලැබේද, මහණෙනි, කෙශකම්බලය ශීත කාලයෙහි සීතලය, උෂ්ණ කාලයෙහි උෂ්ණය, දුර්වර්ණය, දුර්ගන්ධය, මහණෙනි, එසේම බොහෝවූ ශ්‍රමණ වාදයන් අතුරෙන් මක්ඛලී වාදය ඉතා පහත්යයි කියනු ලැබේ.

2. "මහණෙනි, මක්ඛලී හිස් පුරුෂතෙමේ මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. කර්මයක් නැත, ක්‍රියාවක් නැත වීර්‍ය්‍යයක් නැත කියායි.

3. "මහණෙනි, අතීත කාලයෙහි යම් ඒ අර්හත්වූ සම්‍යක් සම්බුදුවරයෝ වූවාහුද, ඒ භාග්‍යවතුන් වහන්සේලාද කර්මවාදීහු, ක්‍රියාවාදීහු, විරියවාදීහු වූවාහුය.

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

5. "මහණෙනි, අනාගත කාලයෙහි අර්හත්වූ යම් සම්‍යක් සම්බුදුවරයෝ වන්නාහුද මක්ඛලී හිස් පුරුෂතෙමේ ඒ භාග්‍යවතුන් වහන්සේලාද කර්මයක් නැත, ක්‍රියාවක් නැත, වීර්‍ය්‍යයක් නැතැයි ප්‍රතික්ෂෙප කරයි.

6. "මහණෙනි මේ කාලයෙහි අර්හත් සම්බුද්ධවූ මමද කර්මවාදී වෙමි. ක්‍රියාවාදී වෙමි. වීර්‍ය්‍යවාදී වෙමි. මහණෙනි, මක්ඛලී හිස් පුරුෂතෙම කර්මයක් නැත ක්‍රියාවක් නැත වීර්‍ය්‍යයක් නැතැයි මාද ප්‍රතික්ෂෙප කරයි.

7. "මහණෙනි, යම්සේ ගංගා දොරටුවෙහි කෙමිනක් දමන්නේ නම් බොහෝ මත්ස්‍යයන්ගේ අහිත පිණිස දුක් පිණිස හානිය පිණිස විනාශය පිණිස පවත්නේද, මහණෙනි, එපරිද්දෙන්ම මක්ඛලී හිස් පුරුෂතෙම බොහෝ සත්වයන්ගේ අහිත පිණිස, දුක් පිණිස, හානිය පිණිස, විනාශය පිණිස ලොකයෙහි උපන් මිනිස් කෙමිනකැයි හඟිමි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**36. තිසම්පදා සූත්‍රය**- 1. "මහණෙනි, මේ සම්පත් තුනෙකි. කවර තුනෙක්ද? ශ්‍රද්ධා සම්පත්තියද, සීල සම්පත්තියද, ප්‍රඥා සම්පත්තියද වෙත්. මහණෙනි, මේ ත්‍රිවිධ සම්පත්ති හුය."

**37. වුද්ධිත්තය සූත්‍රය**- 1. "මහණෙනි, මේ අභිවෘද්ධි තුනෙකි. කවර තුනෙක්ද? ශ්‍රද්ධා අභිවෘද්ධියද, ශීල අභිවෘද්ධියද, ප්‍රඥා අභිවෘද්ධියද වෙයි. මහණෙනි, මේ අභිවෘද්ධි තුනයි.

**38. බලුංක සූත්‍රය**- 1. "මහණෙනි, අශ්ව පොතකයන් තිදෙනෙකුත්, පුරුෂ පොතකයන් තිදෙනෙකුත් දෙසනා කරන්නෙමි. එය අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි." "එසේය, ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කළසේක.

2. "මහණෙනි, අශ්වපොතකයන් තිදෙනා නම් කවරහුද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් අශ්ව පොතකයෙක් ජවයෙන් යුක්තවෙයි. වර්ණයෙන් යුක්ත නොවෙයි. උස මහතින් යුක්ත නොවෙයි. මහණෙනි, ලොකයෙහි ඇතැම් අශ්ව පොතකයෙක් ජවයෙන් යුක්තවූයේද වෙයි. වර්ණයෙන් යුක්තවූයේද වෙයි උස මහතින් යුක්තවූයේ නොවෙයි, මහණෙනි, ලොකයෙහි ඇතැම් අශ්ව පොතකයෙක් ජවයෙන් යුක්තවූයේද වෙයි. වර්ණයෙන් යුක්තවූයේද වෙයි උස මහතින් යුක්තවූයේද වෙයි. මහණෙනි, මේ අශ්වපෝතකයෝ තිදෙන වෙත්.

3. "මහණෙනි, පුරුෂ පොතකයෝ තිදෙන කවරහුද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුරුෂපොතකයෙක් ජවයෙන් යුක්තවූයේ වෙයි. වර්ණයෙන් යුක්තවූයේ නොවෙයි. උසමහතින් යුක්තවූයේ නොවෙයි. මහණෙනි මේ ලෝකයෙහි ඇතැම් පුරුෂ පොතකයෙක් ජවයෙන් යුක්තවූයේද වෙයි, වර්ණයෙන් යුක්තවූයේද වෙයි, උසමහතින් යුක්තවූයේ නොවෙයි. මහණෙනි, ලොකයෙහි ඇතැම් පුරුෂ පොතකයෙක් ජවයෙන් යුක්තවූයේද වෙයි. වර්ණයෙන් යුක්තවූයේද වෙයි. උස මහතින් යුක්තවූයේද වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මහණෙනි, කෙසේ නම් පුරුෂ පොතක තෙමේ ජවයෙන් යුක්ත වෙයිද, වර්ණයෙන් යුක්තනොවෙයිද, උස මහතින් යුක්ත නොවෙයිද?

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙය දුක යයි තත්වාකාරයෙන් දනීද, මේ දුකට හේතුවයයි තත්වාකාරයෙන් දනීද, මේ දුක නිරුද්ධකිරීමයයි තත්වාකාරයෙන් දනීද, මෙය දුක නිරුද්ධ කිරීමේ මාර්ගයයි තත්වාකාරයෙන් දනීද' මෙය ඔහුගේ ජවයයි කියමි.

5. "අභිධර්මයෙහි හෝ අභිවිනයෙහි ප්‍රශ්නයක් අසන ලද්දේ පැකිලෙයිද නොවිසඳයිද මෙය ඔහුගේ වර්ණයෙන් යුක්ත නොවීමයයි කියමි. චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්පච්චය හෙසජ්ජ පරික්ඛාරයන්ගේ ලාභියෙක් නොවේද මෙය ඔහුගේ උස මහතින් යුක්ත නොවීමයයි කියමි. මහණෙනි, මෙසේ වනාහි පුරුෂ පොතක තෙම ජවයෙන් යුක්ත වූයේ වෙයි. වර්ණයෙන් යුක්ත නොවුයේද වෙයි. උස මහතින් යුක්ත නොවූයේද වෙයි. මහණෙනි, කෙසේ නම් පුරුෂපොතකතෙම ජවයෙන් යුක්ත වූයේ වේද, වර්ණයෙන් යුක්ත වූයේ වේද, උස මහතින් යුක්ත වූයේ නොවේද?

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

7. "අභිධර්මයෙහි හෝ අභිවිනයෙහි ප්‍රශ්නයක් අසන ලද්දේ විසඳයිද නොපැකිලෙයිද මෙය ඔහුගේ වර්ණයයි කියමි. චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්පච්චය හෙසජ්ජ පරික්ඛාරයන් නොලබන්නේවේද, මෙය ඔහුගේ උස මහතින් යුක්ත නොවීමයයි කියමි. මහණෙනි, මෙසේ වනාහි පුරුෂ පොතකතෙම ජවයෙන් යුක්තවූයේද වෙයි. වර්ණයෙන් යුක්ත වූයේද වෙයි, උසමහතින් යුක්තනොවූයේද වෙයි.

8. "මහණෙනි කෙසේ නම් පුරුෂ පොතකතෙම ජවයෙන් යුක්තවූයේත් වෙයිද, වර්ණයෙන් යුක්තවූයේත් වෙයිද, උසමහතින් යුක්තවූයේත් වෙයිද?

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

10. "අභිධර්මයෙහි හෝ අභිවිනයෙහි හෝ ප්‍රශ්නයක් අසන ලද්දේ විසඳයිද, නොපැකිලෙයිද මෙය ඔහුගේ වර්ණයෙන් යුක්තවීමයයි කියමි. චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරයන් ලබන්නේ වෙයිද, මෙය ඔහුගේ උස මහතින් යුක්තවීමයයි කියමි.

11. "මහණෙනි, මෙසේ වනාහි පුරුෂතෙමේ ජවයෙන් යුක්ත වූයේද, වර්ණයෙන් යුක්ත වූයේද, උස මහතින් යුක්තවූයේද වෙයි"

39. **අස්සදස්සාදස්ස සූත්‍රය**- 1. "මහණෙනි, දැමුණු අශ්වයන් තිදෙනෙකුත් දැමුණු අශ්වයන් බඳු පුරුෂයන් තිදෙනෙකුත් දෙශනා කරමි. එය අසව්.

'මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි." "එසේය, ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දෙශනා කළසේක

2. "මහණෙනි, දැමුණු අශ්වයන් තිදෙන නම් කවරහුද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් දැමුණු අශ්වයෙක් ජවයෙන් යුක්තවූයේ වෙයි, වර්ණයෙන් යුක්ත නොවූයේ වෙයි. උස මහතින් යුක්ත නොවූයේවෙයි. මහණෙනි, ඇතැම් දැමුණු අශ්වයෙක් ජවයෙන් යුක්ත වූයේ වෙයි. වර්ණයෙන් යුක්ත වූයේ වෙයි, උසමහතින් යුක්තවූයේ නොවෙයි.

මහණෙනි, ඇතැම් දැමුණු අශ්වයෙක් ජවයෙන් යුක්තවූයේද වෙයි වර්ණයෙන් යුක්තවූයේද වෙයි, උසමහතින් යුක්තවූයේද වෙයි. මහණෙනි, මේ තිදෙන දැමුණු අශ්වයෝ තිදෙන වෙති.

3. "මහණෙනි, දැමුණු අශ්වයා බඳු පුරුෂයන් තිදෙන නම් කවරහුද? මහණෙනි, මෙහි ඇතැම් දැමුණු අශ්වයාට බඳු පුරුෂයෙක් ජවයෙන් යුක්තවූයේ වෙයි. වර්ණයෙන් යුක්ත නොවූයේ වෙයි. උස මහතින් යුක්ත නොවූයේ වෙයි. මහණෙනි මෙහි ඇතැම් දැමුණු අශ්වයාට බඳු පුරුෂයෙක් ජවයෙන්

යුක්තවූයේ වෙයි, වර්ණයෙන් යුක්ත වූයේද වෙයි, උස මහතින් යුක්ත නොවූයේ වෙයි. මහණෙනි, මෙහි ඇතැම් දැමුණු අශ්වයාටබඳු පුරුෂයෙක් ජවයෙන් යුක්ත වූයේද වෙයි, වර්ණයෙන් යුක්තවූයේද වෙයි, උස මහතින් යුක්ත වූයේද වෙයි.

4. "මහණෙනි, කෙසේ නම් දැමුණු අශ්වයාට බඳු පුරුෂ තෙම ජවයෙන් යුක්තවූයේ වෙයිද, වර්ණයෙන් යුක්ත නොවූයේ වෙයිද, උසමහතින් යුක්ත නොවූයේ වෙයිද?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම පඤ්ච ඔරංභාගිය සංයොජනයන් ක්ෂය කිරීමෙන් එහිම පිරිනිවන් පාන්නාවූ ඒ බඹ ලොවින් ආපසු නොඑන ස්වභාවය ඇත්තාවූ ඖපපාතික අනාගාමී පුද්ගලයෙක් වේද, මෙය ඔහුගේ ජවයයි කියමි. අභිධර්මයෙහි හෝ අභිවිනයෙහි ප්‍රශ්නයක් අසනලද්දේ පැකිලෙයිද නොවිසඳයිද, මෙය ඔහුගේ වර්ණයෙන් යුක්ත නොවීමයයි කියමි. චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්පච්චය භෙසජ්ජ පරික්ඛාරයන් නොලබන්නෙක් වේද, මෙය ඔහුගේ උසමහතින් යුක්ත නොවීමයයි කියමි.

මහණෙනි, මෙසේ වනාහි දැමුණු අශ්වයකුට බඳු පුරුෂ තෙමේ ජවයෙන් යුක්තවූයේ වෙයි, වර්ණයෙන් යුක්ත නොවූයේද, උසමහතින් යුක්ත නොවූයේද වෙයි.

5. "මහණෙනි, කෙසේනම් දැමුණු අශ්වයෙකුට බඳු පුරුෂ තෙම ජවයෙන් යුක්තවූයේ වෙයිද, වර්ණයෙන් යුක්තවූයේ වෙයිද, උසමහතින් යුක්ත නොවූයේ වෙයිද?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම පඤ්චඔරංභාගිය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් එහිම පිරිනිවන්පාන්නාවූ, ඒ ලෝකයෙන් නැවත ආපසු නොඑන්නාවූ ඖපපාතික අනාගාමී පුද්ගලයෙක් වෙයිද, මෙය ඔහුගේ ජවයෙන් යුක්තවීමයයි කියමි.

අභිධර්මයෙහි අභිවිනයෙහි ප්‍රශ්නයක් අසනලද්දේ විසඳයිද, නොපැකිලෙයිද, මෙය ඔහුගේ වර්ණයයි කියමි. චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලානප්පච්චය, භෙසජ්ජපරික්ඛාරයන්

නොලබන්නෙක් වේද, මෙය ඔහුගේ උසමහතින් යුක්ත නොවීමයයි කියමි, මහණෙනි, මෙසේ වනාහි දැමුණු අශ්වයෙකුට බඳු පුරුෂ තෙම ජවයෙන් යුක්තවූයේද වෙයි, වර්ණයෙන් යුක්තවූයේද වෙයි, උසමහතින් යුක්ත නොවූයේ වෙයි.

**6.** "මහණෙනි, කෙසේනම් දැමුණු අශ්වයෙකුටබඳු පුරුෂ තෙම ජවයෙන් යුක්තවූයේත්වෙයිද, වර්ණයෙන් යුක්තවූයේත් වෙයිද, උසමහතින් යුක්තවූයේත් වෙයිද?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම පඤ්චඔරංභාගීය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් එහිම පිරිනිවෙන්නාවූ ඒ ලෝකයෙන් නැවත නොඑන්නාවූ ඖපපාතික අනාගාමී පුද්ගලයෙක් වේද, මෙය ඔහුගේ ජවයෙන් යුක්තවීමයයි කියමි. අභිධර්මයෙහි අභිවිනයෙහි ප්‍රශ්නයක් අසනලද්දේ විසඳයිද, නොපැකිලෙයිද, මෙය ඔහුගේ වර්ණයෙන් යුක්තවීමයයි, කියමි. චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලානප්පච්චය භෛසජ්ජ පරික්ඛාරයන් ලබන්නේ වෙයිද මෙය ඔහුගේ උසමහතින් යුක්තවීමයයි කියමි. මහණෙනි, මෙසේ වනාහි දැමුණු අශ්වයෙකුට බඳු පුරුෂතෙමේ ජවයෙන් යුක්ත වූයේද, වර්ණයෙන් යුක්තවූයේද උස මහතින් යුක්තවූයේද වෙයි.

**7.** "මහණෙනි, මේ වනාහි දැමුණු අශ්වයාටබඳු පුරුෂයන් තිදෙන වෙති.

**40. භද්දාජානීය සූත්‍රය- 1.** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර මොරවාප නම් පරිබ්‍රාජකාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනි' යි ආමන්ත්‍රණය කළහ. භික්ෂූහු 'ස්වාමීනි' යි පිළිතුරු දුන්නේය.

**2.** "මහණෙනි, ධර්මතුනකින් යුත් භික්ෂුව ඒකාන්තයෙන් නිෂ්ටාවට පැමිණියේ, ඒකාන්තයෙන් යොගයන් ක්ෂය කිරීමට පැමිණියේ, ඒකාන්තයෙන් බ්‍රහ්මචාරී වූයේ, ඒකාන්තයෙන්

අවසානයට පැමිණියේ, දෙව් මිනිසුන්ට ශ්‍රෙෂ්ඨ වූයේ වෙයි. කවර ධර්ම තුනකින්ද?

3. "අශෛක්ෂවූ ශීලස්කන්ධයෙන්ද අශෛක්ෂවූ සමාධි ස්කන්ධයෙන්ද අශෛක්ෂවූ ප්‍රඥාස්කන්ධයෙන්ද වෙයි මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් භික්ෂුතෙම ඒකාන්තයෙන් නිෂ්ටාවට පැමිණියේ ඒකාන්තයෙන් යොගයන් ක්ෂයකිරීමට පැමිණියේ ඒකාන්තයෙන් බ්‍රහ්මචාරී වූයේ ඒකාන්තයෙන් අවසානයට පැමිණියේ දෙව්මිනිසුන්ට ශ්‍රෙෂ්ඨවූයේ වෙයි."

41. **මොරනිවාප සූත්‍රය**- 1. "මහණෙනි, ධර්ම තුනකින් යුත් භික්ෂුතෙම ඒකාන්තයෙන් නිෂ්ටාවට පැමිණියේ, ඒකාන්තයෙන් යොගයන් ක්ෂයකළේ, ඒකාන්තයෙන් බ්‍රහ්මචාරීවූයේ, ඒකාන්තයෙන් අවසානයට පැමිණියේ දෙව් මිනිසුන්ට ශ්‍රෙෂ්ඨවූයේ වෙයි. කවර ධර්ම තුනකින්ද?

2. 'ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යයෙන්ද ආදෙසනා ප්‍රාතිහාර්‍ය්‍යයෙන්ද, අනුශාසනා ප්‍රාතිහාර්‍ය්‍යයෙන්ද, වෙයි.

3. "මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් භික්ෂුතෙමේ ඒකාන්තයෙන් යොගයන් ක්ෂය කෙළේ, ඒකාන්තයෙන් බ්‍රහ්මචාරිවූයේ, ඒකාන්තයෙන් අවසානයට පැමිණියේ දෙව් මිනිසුන්ට ශ්‍රෙෂ්ඨවූයේ වෙයි."

**(දසසතර වැනි යොධාජීව වර්ගය නිමි.)**

---

## 15. මංගල වර්ගය.

42. **අකුසල කම්ම සූත්‍රය**:- 1 "මහණෙනි, ධර්ම තුනකින් යුත් පුද්ගල තෙමේ යම්සේ ගෙන එන ලද්දක් බිම හෙලන්නේද, එසේම නිරයෙහි උපදියි. කවර තුනකින්ද?

2. "අකුසලවූ කාය කර්මයෙන්ද, අකුසලවූ වාක්කර්මයෙන්ද, අකුසලවූ මනොකර්මයෙන්ද වෙයි.

3. "මහණෙනි, මේ ධර්මතුනෙන් යුක්තවූ පුද්ගල තෙමේ යම්සේ ගෙන එන ලද්දක් බිම හෙලන්නේද එපරිද්දෙන් නිරයෙහි වැටෙයි.

4. "මහණෙනි, ධර්මතුනකින් යුත් පුද්ගලතෙමේ යම් සේ ගෙන එන ලද්දක් හෙලන්නේද එසේම ස්වර්ගයෙහි උපදියි. කවර තුනකින්ද යත්?

5. කුසල කාය කර්මයෙන්ද, කුසල වාක්කර්මයෙන්ද, කුසල මනොකර්ම යෙන්ද වෙයි.

6. "මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් පුද්ගලතෙම ගෙන එන ලද්දක් හෙලුවාක්මෙන් ස්වර්ගයෙහි උපදියි."

43 **සාවජ්ජ කම්ම සූත්‍රයː-** (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡෙදය මෙනි) කවර තුනකින්ද?

2. "වරද සහිතවූ කාය කර්මයෙන්ද, වරද සහිතවූ වාක්කර්මයෙන්ද, වරද සහිතවූ මනොකර්මයෙන්ද වෙයි.

3, 4. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3, 4 ඡෙදය මෙනි)

5. වරද රහිත කාය කර්මයෙන්ද වරද රහිත වාක් කර්මයෙන්ද වරද රහිත මනොකර්මයෙන්ද වෙයි.

6. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 6 ඡෙදය මෙනි)

44. **විසම කම්ම සූත්‍රයː-** (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡෙදය මෙනි)

විසමවූ කාය කර්මයෙන්ද, විසමවූ වාක් කර්මයෙන්ද, විසමවූ මනොකර්මයෙන්ද වෙයි.

3, 4. මේ ඡෙද මේ වර්ගයේ 1 සූත්‍රයේ 3, 4 ඡෙද මෙන් වෙත්)

5. "සමවූ කාය කර්මයෙන්ද, සමවූ වාක්කර්මයෙන්ද, සමවූ මනොකර්මයෙන්ද වෙයි.

6. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 6 ඡෙදය මෙනි)

**45. අසුචි කම්ම සූත්‍රයː-** 1 (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

**2.** "අපිරිසිදු කාය කර්මයෙන්ද, අපිරිසිදු වාක්කර්මයෙන්ද, අපිරිසිදු මනොකර්මයෙන්ද වෙයි.

**3, 4.** (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3, 4 ඡේද මෙන් වෙත්.)

පිරිසිදු කාය කර්මයෙන්ද, පිරිසිදු වාක්කර්මයෙන්ද, පිරිසිදු මනොකර්මයෙන්ද වෙයි.

මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

**46. අකුසල උපහතත්ත සූත්‍රයː-** **1.** "මහණෙනි, ධර්ම තුනකින් යුක්තවූ අව්‍යක්තවූ අසත්පුරුෂවූ, බාල තෙමේ, ගුණ සාරා දමන ලද විනාශ කරනලද ආත්මයක් පරිහරණය කරයි. වරද සහිතයෙක්ද නුවණැතියන් විසින් ගර්හාකළ යුත්තෙක්ව බොහෝ අකුසල්ද රැස්කරයි. කවර තුනකින්ද?

**2.** "අකුශල කාය කර්මයෙන්ද, අකුශල වාක්කර්මයෙන්ද, අකුශල මනොකර්මයෙන්ද වෙයි.

**3.** "මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් අව්‍යක්තවූ අසත්පුරුෂවූ බාල තෙම ගුණසාරා දමන ලද විනාශ කරන ලද ආත්මයක් පරිහරණය කරයි. වරද සහිතයෙක්ව නුවණැතියන් විසින් ගර්හාකළ යුත්තෙක්ව බොහෝ අකුසල්ද රැස්කරයි.

**4.** "මහණෙනි, ධර්ම තුනකින්යුත් ව්‍යක්තවූ සත් පුරුෂවූ පණ්ඩිත පුරුෂතෙමේ ගුණ නොනසනලද, විනාශ නොකරනලද, ආත්මය පරිහරණය කරයි. නිරවද්‍යවූයේ නුවණැතියන් විසින් ගර්හා නොකළ යුත්තෙක් වෙයි. කවර තුනකින්ද?

**5.** "කුසල කාය කර්මයෙන්ද, කුසල වාක් කර්මයෙන්ද, කුසල මනොකර්මයෙන්ද වෙයි.

**6.** "මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් ව්‍යක්තවූ සත් පුරුෂවූ පණ්ඩිත පුරුෂතෙමේ ගුණ නොනසනලද, විනාශ නොකරනලද

ආත්මය පරිහරණය කරයි. නිරවද්‍යවූයේ නුවණැත්තන් විසින් ගර්හා නොකළ යුත්තෙක්ව බොහෝ පින්ද රැස්කරයි.

**47. සාවජ්ජ උපහතත්ත සූත්‍රයඃ-** 1. මේ ඡෙදය මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡෙදය මෙනි.)

2. වරද සහිත කාය කර්මයෙන්ද, වරද සහිත වාක්කර්මයෙන්ද, වරද සහිත මනොකර්මයෙන්ද වෙයි.

3, 4. (මේ ඡෙද මේ වර්ගයේ 5 සූත්‍රයේ 3, 4 ඡෙද මෙන් වෙත්

5. වරද රහිත කාය කර්මයෙන්ද, වරද රහිත වාක් කර්මයෙන්ද, වරද රහිත මනොකර්මයෙන්ද, වෙයි”

6. (මේ ඡෙදය මේ වර්ගයේ 5 සූත්‍රයේ 6 ඡෙදය මෙනි.)

**48. විසම උපහතත්ත සූත්‍රයඃ-** මේ ඡෙදය මේ වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය මෙනි)

2. විසම කාය කර්මයෙන්ද, විසම වාක්කර්මයෙන්ද, විසම මනොකර්මයෙන්ද වෙයි.

3, 4. (මේ ඡෙදය මේ වර්ගයේ 5 සූත්‍රයේ 3, 4 ඡෙද මෙන් වෙත්)

5. “සමවූ කාය කර්මයෙන්ද, සමවූ වාක් කර්මයෙන්ද, සමවූ මනො කර්මයෙන්ද වෙයි.

6. (මේ ඡෙදය මේ වර්ගයේ 5 සූත්‍රයේ 6 ඡෙදය මෙනි.)

**49. අසූචි උපහතත්ත සූත්‍රයඃ-** 1. (මේ ඡෙදය මේ වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

2. “අපිරිසිදු කාය කර්මයෙන්ද, අපිරිසිදුවූ වාක් කර්මයෙන්ද, අපිරිසිදුවූ මනො කර්මයෙන්ද වෙයි.

3-4. (මේ ඡෙද මේ වර්ගයේ 5 සූත්‍රයේ 3, 4 ඡෙද මෙන් වෙත්.)

5. “පිරිසිදුවූ කාය කර්මයෙන්ද, පිරිසිදුවූ වාක් කර්මයෙන්ද, පිරිසිදුවූ මනො කර්මයෙන්ද වෙයි.

6. (මේ ඡේදය මේ වර්ගයේ 5 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

**50. වන්දනාත්තය සූත්‍රය:-** "මහණෙනි, මේ වැඳුම් තුනකි. කවර තුනක්ද? කයින් වැඳුමද, වචනයෙන් වැඳුමද සිතින් වැඳුමද වෙයි මහණෙනි, මේ වනාහි වැඳුම් තුනය.

**51. සුමංගල (හෝ) සුප්පභාත සූත්‍රය:-** 1 "මහණෙනි, යම් සත්ව කෙනෙක් පෙරවරු කාලයෙහි කයින් සුචරිතයෙහි හැසිරෙද්ද. වචනයෙන් සුචරිතයෙහි හැසිරෙද්ද, සිතින් සුචරිතයෙහි හැසිරෙද්ද මහණෙනි, ඒ සත්වයන්ට යහපත් පෙරවරු කාලයක් වෙයි.

2. "මහණෙනි, යම් සත්ව කෙනෙක් මධ්‍යාහ්ණ කාලයෙහි කයින් සුචරිතයෙහි හැසිරෙද්ද, වචනයෙන් සුචරිතයෙහි හැසිරෙද්ද, සිතින් සුචරිතයෙහි හැසිරෙද්ද මහණෙනි, ඒ සත්වයන්ට යහපත් මධ්‍යාහ්ණ කාලයක් වෙයි.

3. "මහණෙනි, යම් සත්ව කෙනෙක් සවස් කාලයෙහි කයින් සුචරිතයෙහි හැසිරෙද්ද, වචනයෙන් සුචරිතයෙහි හැසිරෙද්ද, සිතින් සුචරිතයෙහි හැසිරෙද්ද ඒ සත්වයන්ට යහපත් සවස් කාලයක් වෙයි.

'(ඔවුන්ට) ශුභ නැකතකි. ශුභ මඟුලකි, ශුභ හිරු උදාවකි. ශුභ පිබිදීමකි. ශුභ ක්ෂණයකි. ශුභ මුහුර්තියකි, බ්‍රහ්මචාරීන් කෙරෙහි මනා දන්දීමකි."

"දියුණුවූ කාය කර්ම වෙයි, දියුණුවූ වාක් කර්ම වෙයි, දියුණුවූ මනො කර්ම වෙයි, දියුණුවූ ප්‍රාර්ථනා වෙත්."

'දියුණුවූ කර්මයන් කොට මෙහි දියුණුව ලබත්. බුද්ධ ශාසනයෙහි වැඩුණාවූ සුඛිතවූ ලබන ලද අර්ථ ඇත්තාවූ ඔව්හු සියලු ඤාතීන් සමග නිරොගිව සැප ඇත්තෝ වව්."

**(පසළොස්වැනි මංගල වර්ගයයි.)**

**(තුන්වැනිවූ බුද්දක පණ්ණාසකය නිමිය නිමි.)**

## 16. අචෙලක වර්ගය.

**1. සතිපට්ඨාන මජ්ඣිම පටිපදා සූත්‍රය:** 1. "මහණෙනි, මේ ප්‍රතිපදා තුනකි. කවර තුනක්ද? ආගාළ්හ පටිපදා (කර්කශ ප්‍රතිදාව) නිජ්ඣාම පටිපදා (දැවීම් සහිත ප්‍රතිපදාව) මජ්ඣිම පටිපදා (මධ්‍යම ප්‍රතිපදාව) යනුයි.

2. "මහණෙනි, ආගාළ්හ පටිපදාව නම් කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කාමයන්හි දොෂයක් නැත යන මේ දෘෂ්ටිය ඇත්තේ වෙයි. හෙතෙම කාම වස්තූන් පරිභොගයට පැමිණෙයි. මහණෙනි, මේ ආගාළ්හ පටිපදාවයි.

3. "මහණෙනි, නිජ්ඣාම පටිපදාව කවරේද? මහණෙනි, මේ ලොකයෙන් ඇතැම් අචෙලකයෙක් (නිර්වස්ත්‍ර තවුසෙක්) ශිෂ්ට පැවතුම් නැත්තේ වෙයි. ආහාර අනුභවකොට අත ලෙවින්නේ හෝ මල පහකොට අතින් සිඹින්නේ හෝ වෙයි. පිණ්ඩයදීමට කැඳවූවිට නොයන්නේ වෙයි. පිණ්ඩය දීමට නවතිනුයි කීවිට නොනවත්නේ වෙයි පළමුව ගෙනෙන ලද ආහාරය නොපිළිගන්නේ වෙයි. උදෙසා පිළියෙල කරන ලද භොජනය නොපිළිගන්නේ වෙයි. කැඳවීම නොඉවසයි, හෙතෙම මුට්ටියකින් බෙදන ලද භොජනය නොපිළිගනියි, සැලියකින් බෙදන ලද භොජනය නොපිළිගනියි. එළිපත්ත අතරට සිටිනසේ සිට දෙන ලද්ද දණ්ඩක් අතර ඇති සිට දෙනලද්ද මොහොලක් අතර කොට අනුභව කරන දෙනලද්ද නොපිළි ගනියි. දෙදෙනෙකුගෙන් ගැබිණියකින් කිරිපොවන්නියකගෙන් විවාහක ස්ත්‍රියකගෙන් නොපිළිගනියි. සම්මාදම් කළ දෙයක් නොපිළිගනියි, යම්තැනෙක බල්ලන් රැස්වූයේද මැස්සෝ සමූහ සමූහව හැසිරෙත්ද එබඳු තැන්වලින් නොපිළි ගනිත්. මත්ස්‍ය මාංස අනුභව නොකරයි. සුරා නොබොයි. මෙරය නොබොයි නොයෙක් ද්‍රව්‍ය දමා සාදන ලද පානය නොබොයි. හෙතෙම එක් ගෙයකින් දෙනලද දෙයින්ද යැපෙයි එක් බත් පිඩකින්ද යැපෙයි. ගෙවල් දෙකකින් දෙන ලද දෙයින්ද යැපෙයි බත් පිඩු දෙකකින්ද යැපෙයි ගෙවල් සතකින් දෙන ලද දෙයින්ද යැපෙයි,

බත් පිඬු සතකින්ද යැපෙයි. එක් කුඩා බත් තැටියකින්ද කුඩා බත් තැටි දෙකකින්ද යැපෙයි. කුඩා බත් තැටි තුනකින්ද යැපෙයි කුඩා බත් තැටි සතකින්ද යැපෙයි, එක් දිනක්ද ආහාර ගනියි. දෙදිනක්ද ආහාර ගනියි, සත් දිනක්ද ආහාර ගනියි, මෙසේ අඩමසක්ද වාර භොජනය අනුභව කිරීමෙහි යෙදී වාසය කරයි. හෙතෙම කොළ කන්නේද වෙයි, බඩ හමු කන්නේද වෙයි, උෟරුහැල් කන්නේද වෙයි, හම් කුඩු කන්නේද වෙයි, මැලියම් කන්නේද වෙයි, වීකුඩුකන්නේද වෙයි, දන්කුඩ කන්නේද වෙයි, පුනක්කු කන්නේද වෙයි, තණ කොළ කන්නේද වෙයි, ගොම කන්නේද වෙයි. වනමුල් ගෙඩි කන්නේද වෙයි, ඉදී වැටුණ ගෙඩි කන්නේද වෙයි.

4. "හණ වැහැරිද අඳියි, මිශ්‍ර වස්ත්‍රද අඳියි, මළමිනියෙන් ඉවත්කළ වස්ත්‍රද අඳියි, පාංශුකූල වස්ත්‍රද අඳියි, ගස් පතුරුද අඳියි, අඳුන් දිවිසම්ද අඳියි, මැදින් පැලූ අඳුන් දිවි සම්ද අඳියි, කුසතණද අඳියි නියද වැහැරිද අඳියි, පට්ටාද අඳියි, ඉසකේ බකමූණු පිහාටුද අඳියි, හිස රැවුල් උදුරන්නේද වෙයි, හිස රැවුල් ඉදිරීමෙහි යෙදුනේද වෙයි.

ආසන ප්‍රතික්ෂෙපකර හිටගෙන සිටින්නේවේ. උක්කුටුකයෙන් සිටින ධ්‍යානයෙහි ඇලී උක්කුටුකයෙන් සිටින්නේවේ, කටුලෑල්ලෙහි හේත්තුවන්නේ හෝ සයනයද කරයි. සවස තුන්වෙනි කොට ජලයෙහි ගිලෙන්නේවේ. මෙසේ මෙබඳු නොයෙක් කය පෙළන තවන පිළිවෙත්හි යෙදී වාසය කරයි, මහණෙනි, මේ නිජ්ඣාම පටිපදාවයයි කියනු ලැබේ

"මහණෙනි, මධ්‍යම ප්‍රතිපදාව නම් කවරීද?

5. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම වීයර්‍යයෙන් යුක්තව මනා නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධලොකයෙහි ලොභ දොසයන් දුරුකොට, කයෙහි කය අනුව බලමින් වාසය කරයි.

6. (මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.) වෙදනා අනුව බලමින් වාසය කරයි.

7. (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) චිත්තයන් අනුව බලමින් වාසය කරයි.

8. (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) ධර්මයන්හි ධර්මයන් අනුව බලමින් වාසය කරයි මහණෙනි, මේ මධ්‍යම ප්‍රතිපදාවයයි කියනු ලැබේ. මහණෙනි, මේ ප්‍රතිපදා තුනය.

2-7. සම්මප්පධාන, ඉද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣංග මග්ගංග සූත්‍රා:- 1-4 (මේ ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1-4 ඡේද මෙන් වෙත්)

5. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් ලාමක අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යය පටන් ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, උපන් ලාමක අකුශල ධර්මයන් පහකිරීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යය පටන් ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, නූපන් කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යය පටන් ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද,

"උපන් කුශල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නුමුළාව පිණිස බොහෝවීම පිණිස මහත්වීම වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද වීර්‍ය්‍යය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයිද, වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයිද, සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයිද, විමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයිද, සද්ධින්ද්‍රිය වඩයිද, විරියින්ද්‍රිය වඩයිද, සතින්ද්‍රිය වඩයිද, සමාධින්ද්‍රිය වඩයිද, පඤ්ඤින්ද්‍රිය වඩයිද, සද්ධා බලය වඩයිද, වීරිය බලය වඩයිද, සතිබලය වඩයිද, සමාධිබලය වඩයිද, පඤ්ඤාබලය වඩයිද, සති සම්බොජ්ඣංගය වඩයිද, ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, විරිය සම්බොජ්ඣංගය

වඩයිද, පීති සම්බොජ්ඣංගය වඩයිද පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද සමාධි සම්බොජ්ඣංගය වඩයිද, උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, සම්මාදිට්ඨිය වඩයිද, සම්මාසංකප්පය වඩයිද, සම්‍යක් වචනය වඩයිද, සම්‍යක් කර්මාන්තය වඩයිද, සම්‍යක් ආජීවය වඩයිද, සම්මාසතිය වඩයිද, සම්මාසමාධිය වඩයිද, මහණෙනි, මේ මධ්‍යම ප්‍රතිපදාවයයි කියනු ලැබේ මහණෙනි, මේ වනාහි ත්‍රිවිධ ප්‍රතිපදාවයි."

## 17. කම්මපථ පෙය්‍යාල වර්ගය

**1. පානාතිපාතති ධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු තුනකින් යුත් පුද්ගලයා ගෙන එනලද්දක් හෙළුවාක් මෙන් නිරයෙහි උපදියි. කවර තුනකින්ද?

2. "තෙමේත් සතුන් මරන්නේ වෙයිද අනුන්ද සතුන් මැරීමෙහි සමාදන් කරවයිද, සතුන් මැරීම අනුමෝදන් වෙයිද,

3. මේ කරුණු තුනෙන් යුත් පුද්ගලයා ගෙන එන ලද්දක් හෙළුවාක් මෙන් නිරයෙහි උපදියි."

4. කරුණු තුනකින් යුත් පුද්ගල තෙමේ ගෙන එන ලද්දක් හෙළුවාක් මෙන් ස්වර්ගයෙහි උපදියි කවර තුනකින්ද?

5. "තෙමේත් ප්‍රාණ ඝාතයෙන් වැළකුණේ වෙයිද, අනුන්ද ප්‍රාණඝාතයෙන් වැළකීමෙහි සමාදන් කරවයිද, ප්‍රාණ ඝාතයෙන් වැළකීම අනුමෝදන් වෙයිද,

6. "මේ ධර්ම තුනෙන් යුත් පුද්ගලතෙම ගෙන එන ලද්දක් හෙළුවාක් මෙන් ස්වර්ගයෙහි උපදියි."

**2. අදින්නාදානති ධම්ම සූත්‍රයඃ-** "(මේ සූත්‍රවල 1, 3 4, 6 ඡේද මේ වර්ගයෙ 1 සූත්‍රයේ 1, 3, 4, 6 මෙන් වෙත්.)

2. "තෙමේත් සොරකම් කරන්නේ වෙයිද අනුන්ද සොරකම් කිරීමෙහි සමාදන් කරවයිද,

5. "කවර තුනකින්ද? තෙමේත් සොරකම් කිරීමෙන් වැළකුණේ වෙයිද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. **කාමමිච්ඡාචාර ධම්ම සූත්‍රය**:- 2. "තෙමේත් කාමයන්හි වරදවා හැසිරෙන්නේද,

5. "තෙමේත් කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණේද,

4. **මුසාවාද ධම්ම සූත්‍රය**:- 2. "තෙමේත් බොරු කියන්නේ වෙයිද,

5. "තෙමේත් බොරු කීමෙන් වැළකුණේ වෙයිද.

5. **පිසුනාවාච ධම්ම සූත්‍රය**:- 2. "තෙමේත් කේළාම් කියන්නේ වෙයිද,

5. "තෙමේත් කේලාම් කීමෙන් වැළකුණේ වෙයිද,

6. **ඵරුෂවාච ධම්ම සූත්‍රය**:- 2. "තෙමේත් ඵරුෂ වචන කියන්නේ වෙයිද,

5. "තෙමේ ඵරුෂ වචන කීමෙන් වැළකුණේ වෙයිද,

7. **සම්ඵප්පලාප ධම්ම සූත්‍රය**:- 2. "තෙමේත් ප්‍රලාප කියන්නේ වෙයිද,

5. "තෙමේත් ප්‍රලාප කීමෙන් වැළකුණේ වෙයිද,

8. **අභිජ්ඣාලු ධම්මා සූත්‍රය**:- 2. "තෙමේත් අභිද්‍යාව බහුලකොට ඇත්තේ වෙයිද,

5. "තෙමේත් අභිද්‍යාව බහුලකොට නැත්තෙක් වෙයිද,

9. **ව්‍යපන්නචිත්ත ධම්ම සූත්‍රය**:- 2. "තෙමේත් ව්‍යාපාද සිත් ඇත්තෙක් වෙයිද,

10. **මිච්ඡාදිට්ඨි ධම්ම සූත්‍රය**:- 2. "තෙමේත් මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වෙයිද,

5. "තෙමේත් සම්‍යක්දෘෂ්ටි ඇත්තෙක් වෙයිද

## 18. රාග පෙය්‍යාල වර්ගය

1-10. රාග අභිඤ්ඤා - රාග පරිඤ්ඤා - රාගපරික්ඛය - රාගපහාණ - රාගක්ඛය - රාගවය - රාගවිරාග - රාගනිරොධ - රාගචාග - රාගපටිනිස්සග්ග - නම් සූත්‍ර දහයයි.

1. "මහණෙනි, රාගය විශෙෂයෙන් දැනීම සඳහා ධර්ම තුනක් වැඩිය යුතුයි. කවරතුනක්ද? සූනපක සමාධියද අනිමිත්ත සමාධියද අප්පණිහිත සමාධියද වෙයි

"මහණෙනි, රාගය විශෙෂයෙන් දැනීම සඳහා මේ ධර්මතුන වැඩිය යුතුය.

2. "මහණෙනි, රාගය පිරිසිඳ දැනීම සඳහා ක්ෂය කිරීම සඳහා, පහකිරීම සඳහා, නැතිකිරීම සඳහා, නොඇලීම සඳහා නිරුද්ධකිරීම සඳහා, දුරුකිරීම සඳහා, අත්හැරීම සඳහා, මේ ධර්මයෝ තිදෙන වැඩිය යුත්තාහ

(රාග සූත්‍රවල 'රාග' වෙනුවට මෙහි පහත දක්වන වචන යෙදීමෙන් එක එක වචනය අනුව සූත්‍ර දහය බැගින් සාදා ගත යුතුයි.)

ද්වෙෂය, මොහය, ක්‍රොධය, උපනාහය, මක්ඛය, පලාසය, ඊෂ්‍යීාව, මච්ඡරිය, මායාව, සාඨෙය්‍ය, ථම්භය, සාරම්භය, මානය, අවමානය, මදය, ප්‍රමාදය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. සතුටු සිත් ඇත්තාහු භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්හ.

**(තික නිපාතය සමාප්තයි.)**

---